බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලාඃ 39

සූත්‍රාන්තපිටකයෙහි

31 වන ග්‍රන්ථය

# අපදානපාළි

ප්‍රථම භාගය

ඛුද්දකනිකායෙහි

තුදුස්වැනි ග්‍රන්ථය

ලංකාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙන්

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි කථිකාචාර්ය්‍ය
දෙමටගොඩ ජයශේඛරාරාමාධිපති

පණ්ඩිත

කලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ

විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 39

The Thirty-first Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (14)**

**31**

# APADĀNA PĀLI (I)

With the Sinhala translation by

**The Venerable Pandita Talalle Dhammānanda Thera**

Lecturer at the Vidyodaya University of Ceylon

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සූත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතෙ කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්ද්‍රිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

- 2557 / 2013 -

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක

වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි

තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉතා සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.

- ❁ පූජ්‍ය අත්තුඩාවේ ඥාණානන්ද නාහිමි
- ❁ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❁ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❁ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤසද්ධාකිත්ති හිමි
- ❁ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ❁ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❁ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❁ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- ❁ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❁ මිලිනා සුමතිපාල මැතිණිය
- ❁ ජගත් සුමතිපාල මැතිතුමා
- ❁ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❁ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❁ සුජිත් මොහොට්ටි මහත්මා
- ❁ රංජිත් අමරසිංහ මහත්මා
- ❁ ගාමිණී කාරියවසම් මහත්මා
- ❁ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❁ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❁ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❁ සිරිසේන හේරත් මැතිතුමා
- ❁ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශීර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායෙ

## චුද්දසමො ගන්ථො

# සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකායෙහි

## තුදුස්වන ග්‍රන්ථය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො." -

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

# CONTENTS


| | |
|---|---|
| සංස්කාරකනිවේදනය ... ... ... ... ... ... | XI |
| සංඥපනය ... ... ... ... ... ... | XIII - XVII |
| සඞ්කේතනිරූපණය - Abbreviations ... ... ... ... | XVIII |
| පාළි හෝඩිය - Pali Alphabet ... ... ... ... ... | XIX |
| විසයසූචි ... ... ... ... ... ... | XXI - XXXIV |
| පෙළ හා පරිවර්තනය ... ... .. ... ... ... | 2 - 629 |
| ගාථාදිපාදසූචි ... ... ... ... ... .. ... | **631 - 661** |

# සංස්කාරකනිවේදනය

සූත්‍රාන්තපිටකයෙහි ඛුද්දකනිකායට ඇතුළත් අපදානපාළියෙහි ප්‍රථමභාගය බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා සඞ්ඛ්‍යාවශයෙන් 36 වැනි - සූත්‍රාන්තපිටකග්‍රන්ථසඞ්ඛ්‍යාවෙන් 30 වැනි ග්‍රන්ථය වෙයි.

ලඞ්කාබෞද්ධමණ්ඩලයෙහි අයැදුමෙන් මේ ග්‍රන්ථය සිංහලභාෂාවට පරිවර්තනය කළ කොළඹ දෙමටගොඩ ජයශේඛරාරාමාධිපති වූ, ශ්‍රී ලඞ්කා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි කථිකාචාර්ය වරයකු ද වූ පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ස්වකාර්ය්‍ය මැනැවින් ඉටු කරණ ලද බව පෙණේ.

කාලාන්තරගත ලිපිදෝෂ හා අපපාඨසංයෝගයෙන් ද යුක්ත ව තුබූ මේ ග්‍රන්ථය යථාස්ථානයට පැමිණවීම සම්බන්ධයෙන් උන්වහන්සේ දරා තිබෙන ප්‍රයත්නය පැසැසිය යුතු වේ. මෙහි ශෝධ්‍යපත්‍ර බැලීමේ දී පරිවර්තක - කර්තෘන් වහන්සේ ද පණ්ඩිත ගලගම ධම්මික ස්ථවිරයන් වහන්සේ ද සහාය වූහ.

බුද්ධ - පච්චෙකබුද්ධ - අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවක, ශ්‍රාවකයන් වහන්සේගේ ස්වාධිකාර සමෘද්ධියෙහි සමර්ථ වූ පුරාකෘතකුශලකර්මවිශේෂයන් ද්‍යුත තමන් විසින් ද අභිමතබෝධියකින් නිවන් පසක් කරණු කැමැති සැදැහැතියන්ට මාර්ගෝදේශක වූ මේ ග්‍රන්ථය මෙසේ මුද්‍රණයෙන් පළ කිරීම සඳහා ස්වායත්ත ක්‍රියා යථාශක්තීන් සිද්ධ කිරීමෙන් ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලීය ස්ථවිරයන් වහන්සේ ද ලඞ්කාරජය පිළිබඳ සාංස්කෘතික කාර්ය්‍යාංශයෙහි අධිකාරීහු ද, මහාබෝධි මුද්‍රණාලයෙහි අධිකාරීන් හා සේවකපිරිස ද තමන් ලත් පුණ්‍යමහිමයට අනුරූප වන පරිදි සාදුගත් සිය අපදානයන් මෙතේ සම්බුදුන් වෙත පහළ කිරීමෙහි පොහොසත් වෙත්වා.


**පරවාහැර වජිරඤාණ ස්ථවිර**
ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද
සම්පාදක.


ශ්‍රී බුද්ධවර්ෂ 2505.
ත්‍රිපිටකකාර්ය්‍යාලය, ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
දෙමටගොඩ, කොළඹ 9.

# සංඥාපත්‍රය.

**අපදානපාළි:**

**නි**කාය විසින් සූත්‍රාන්ත පිටකාන්තර්ගත ඛුද්දකනිකායෙහි එන, පාවචන විසින් පර්යාප්තිධර්මයෙහි වැටෙන, රස (සම්පත්) විසින් විමුක්තිරසයෙහි - සංසාර දුඃඛනිවෘත්තියෙහි යෙදෙන, ශාස්තෘශාසනාඞ්ග විසින් ගාථාඞ්ගයෙහි ලා ගැණෙන, ධර්මාර්ථවිභාග විසින් ජාතක, බුද්ධවංස, පෙතවත්ථු, විමානවත්ථු ආදිය මෙන් කම්මස්සකතාලක්ඛණයෙහි වැටෙන **අපදානපාළිය** ආශය වශයෙන් බුද්ධාපදාන, පච්චෙකබුද්ධාපදාන, ථෙරාපදාන, ථෙරීඅපදාන යි කාණ්ඩ සතරෙකින් යුක්ත වේ. එහි බුද්ධාපදාන, පච්චෙකබුද්ධාපදාන සහිත ථෙරාපදානයෙහි වර්ගසඞ්ඛ්‍යාව පස් පණසෙකි. ථෙරී අපදානයෙහි වර්ග දශයෙකි. මෙසෙසින් වර්ග පන්සැටක් ඇති මෙහි අපදානයෝ පන්සිය අසූසෙකි. ඒ ඒ අපදානයෙහි එන ගාථාවන්ගේ මුළුගණන සත්දහස් සසිය එකුන් විස්සෙකි.

පූර්වකර්මවිපාකයෙන් සැදුනු උදාරචරිතයන් පූර්වේනිවාසඥාන ප්‍රතිසංයුක්ත වෘත්තාන්තකථායෙන් විභාවනා කිරීම **අපදාන** ශබ්දයේ යථාර්ථය වේ.

“අපදානසද්දො කාරණ ගහණ අපගමන පටිපාටි අක්කොසනාදිසු දිස්සති -පෙ- ඉධ පන කාරණෙ දිස්සති. තස්මා බුද්ධානං අපදානානි බුද්ධාපදානානි, බුද්ධකාරණානීති අත්ථො” යි කියූ.

අපදානශබ්දය කාරණ, ග්‍රහණ, අපගමන, පටිපාටි, ආක්‍රොශන ආදි අර්ථයෙහි පෙණේ...මෙතන්හි ‘අපදාන’ශබ්දය කාරණයෙහි දක්වෙයි. එහෙයින් බුදුවරයන්ගේ අපදානයෝ බුද්ධාපදානයෝයි. බුද්ධකාරණ-පැරුම් දම්හ යන අර්ථයි.

මෙසින් සම්බුදු, පසේබුදු, මහරහත් යන ආර්යයන් වහන්සේගේ මූලප්‍රණිධිසිද්ධිකාරණ ‘අපදාන’යි කියූ **සාරිපුත්තත්ථෙරාපදානයෙහි** එකාසඞ්ඛ්‍යකල්පලක්ෂයෙකින් පෙර අනවමදර්ශී සම්‍යක් සම්බුද්ධයන් දවස ගෞතම සම්‍යක් සම්බුද්ධ ශාසනයෙහි අග්‍රශ්‍රාවකපදලාභය පිණිස සරද තාපසයන් තුළ පැවැති කාරණය පැවසෙයි. මෙලෙසින් අපදානපාළියෙහි එන්නේ සම්‍යක්සම්බෝධි, ප්‍රත්‍යෙකබෝධි, ශ්‍රාවකබෝධි යි තුන්බෝධීන් පිණිස ප්‍රාර්ථනා කරමින් ඒ ඒ පුද්ගල විශෙෂයන් විසින් කරණ ලද පූර්වකර්මයන්ගේ වෘත්තාන්තකථා සඞ්ග්‍රහය යි

**විසදෘශතා:**

“පඤ්චෙව අපදානානි පඤ්ච සුත්තානි යස්ස ච
ඉදං බුද්ධාපදානන්ති පඨමං අනුලොමතො” යි -

කියූ පිළිවෙළ අනුව මුල එන බුද්ධාපදානය අපදාන පසෙකින් හා සූත්‍රපසෙකින් හා සමන්වාගත යයි අටුවායෙහි පැවසූහ. බුද්ධාපදානාවසානයෙහි එන ‘ඉත්ථං සුදං භගවා අත්තනො බුද්ධචරියං සම්භාවයමානො බුද්ධාපදානියං නාම ධම්මපරියායං අභාසිත්ථ’ යන පාඨයෙන් බුද්ධාපදානය ‘බුද්ධාපදානිය’ නම් ධර්මදෙශනා වන සෙ දක්වති. **බුද්ධාපදාන**-යෙහි සම්බුදුරජානන් වහන්සේගේ අතීත කුසලකම්මාපදානයන් හා

**පුබ්බකම්මපිලොතිකාපදානයෙහි** උන් වහන්සේගේ අතීත අකුසල-කම්මාපදානය ද දක්වේ. බුද්ධාපදානයේ නිදානය සාවත්ථියෙහි **ජේතවන** විහාරය වෙයි. පුබ්බකම්මපිලොතිකාපදානයෙහි නිදානය **අනොතත්ත**-දහතීරය අසළ පිහිටි ගල්තලායෙකි. මෙසේ මේ අපදාන දෙකට නිදාන දෙකෙක. අපදානලක්ෂණ ද කුශලාකුශල විසින් දෙකෙකි. බොධිසත්ත්වයන් අතීත භවයෙහි කළ අකුශලකර්මයනට ප්‍රවෘත්තිවශයෙන් ඉහාත්මයෙහි දුන් විපාක දොළොස පුබ්බකම්මපිලොතිකාපදානය යි කියැවෙයි.

පච්චෙකබුද්ධාපදානයෙහි **සුත්තනිපාත**යෙහි එන **ඛග්ගවිසාණ** සූත්‍රාගත ගාථා ද එහි ගම්භීර ධර්මාර්ථ සංදීපනය ද ඇත.

අපදානපාළියෙහි එන රහත් තෙරහු බොහෝ දෙනෙක් **ථෙරගාථාපාළි**-යෙහි ද දක්වෙයි. අපදානපාළියෙහි එනුයේ උන් වහන්සේගේ පූර්වචරිතාපදාන ගාථා පමණෙකි. ථෙරගාථායෙහි උන් වහන්සේගේ පච්චුප්පන්න-වත්‍ථුයෙහි වැටෙන උදානගාථා එයි. මෙසෙයින් ගත් කල අපදානපාළි, ථෙර – ථෙරීගාථාපාළි යන ග්‍රන්ථයන්හි අපදාන පිළිබඳ විසදෘශතා පෙණෙයි.

ථෙරාපදානයන්හි-

> "කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
> තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.
> පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ
> ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං."

යන ගාථා ද ඇත. මේ උදානගාථා ෂඩභිඥ මහරහතුන් විසින් ම ගැයූ සේ පෙණේ. එහෙත් ථෙරගාථාට්ඨකථායෙහි දක්වෙන **චක්ඛුපාල** නම් සුක්ඛවිපස්සක රහත්තෙරහු අපදානපාළියෙහි **උම්මාපුප්ඵිය** තෙරහ යි සඳහන් කොට ඇත. සුක්ඛවිපස්සක රහත්නට ෂඩභිඥ මහරහත්නට අයත් ත්‍රිවිද්‍යා, ප්‍රතිසංවිද්, විමොක්ෂ, ෂඩභිඥ යන ගුණවිශෙෂයෝ නැත. එසේ වුව ද **උම්මාපුප්ඵියත්ථෙරාපදාන**යෙහි ෂඩභිඥ ක්ෂීණාස්‍රවයන්ගේ උදානගාථා උක්ත නයින් එයි. ඒ ඒ ඇදුරොල්හි සක්පල් තෙරණුවන් පිළිබඳ මතභෙද පැවැති සේ මෙයින් සිතියැ හෙන්නේ ය.

**විමැසිය යුතුනි:**

අපදානපාළියෙහි එන පුබ්බකම්මපිලොතිකාපදානය වෙසෙසින් විමැසුමට නිස්නැ. එ ද බුද්ධාපදානයෙකි. එහි එන කර්මවිපාකයන් කෙරෙහි:

> "වෙමාතුභාතරං පුබ්බෙ ධනහෙතු හනිං අහං,
> පක්ඛිපිං ගිරිදුග්ගස්මිං සිලාය ච අපිංසයිං
> තෙන කම්මවිපාකෙන දෙවදත්තො සිලං ඛිපි,
> අඞ්ගුට්ඨං පිංසයී පාදෙ මම පාසාණසක්ඛරා" යි

බුදුරජුන්ගේ අකුශලකර්මවිපාකයෙක් එයි. දෙව්දතුන් වුහුටු ගල්කුළ බුදුන් කරා නො අව ද පපටිකායෙක් නැගී ඔබ පයැ ලේ සෙල් වීය. වන-වලායෙහි දී "භගවතො පාදෙ රුහිරං උප්පාදෙසි" යනුයෙන් බුදුන් පයැ ලේ උපන් බව කියූ. අපදානයෙහි දී "අඞ්ගුට්ඨං පිංසයී" යනුයෙන්

මහපට ඇඟිලි තැළු සෙ කියැවෙයි. බුදුන් කය වජ්‍රකාය වන බැවින් පරෝපක්‍රමයෙන් කායභෙදයෙක් නොවියැ හෙන්නේ යැ.

තෙල රුධිරොත්පාදය පූර්වකර්මහෙතුයෙනැ යි අපදානයෙහි දක්වති. එසේ දැක් වූව ද **මිලින්දප්‍රශ්න**යෙහි එන සෙ බලත් ම පරස්පර විරොධයෙක් පැණේ. "අපි ච මහාරාජ, නත්ථි භගවතො කම්මවිපාකජා වෙදනා, නත්ථි විසමපරිහාරජා වෙදනා. අවසෙසෙහි සමුට්ඨානෙහි භගවතො වෙදනා උප්පජ්ජන්ති" යනුයෙන් කර්මවිපාකජ වූත් විෂමපරිහාරජ වූත් වෙදනා බුදුනට නැති සෙය ද, අවශෙෂ සමුත්ථානයෙන් වෙදනා උපදනා සෙය ද දක්වා "න සා සකලිකා පුබ්බ කතෙන භගවතො පාදෙ නිපතිතා," යනුයෙන් ඒ ගල් පහර පූර්වකර්මහෙතුයෙන් නො වූ බව ඍජු කොට කියත්. මිලින්ද ප්‍රශ්නයෙහි එන පරිදි එය ප්‍රත්‍යුත්පන්නහෙතුයෙන් වූ ඖපක්‍රමිකවෙදනායෙකි. **සාරත්ථදීපනී** ටීකා කළ **ශාරිපුත්‍රසඞ්ඝරාජාදීහු** අපදානය ප්‍රමාණ කොට ගෙණ වෙරඤ්ජායෙහි දී යව වැළඳීම් ආදිය පූර්වකර්මවිපාක සේ කියති. **මිලින්දප්‍රශ්නය** ප්‍රමාණ කොට නොගත් සේ ය. මෙය භින්නනිකායික මතභෙදයෙක් දැ යි ධර්මධරයන් විසින් විමැසිය යුතු. මෙබඳු බොහෝ තැන් අපදානපාළියෙහි ඇත ද එක් කරුණක් ගෙණ දිඞ්මාත්‍රයක් දැක්වූම්හ.

**කලපිතමත:**

අපදානපාළිය විවෙචනය කරණ සමහරු ථෙරාපදානයෙහි එන

"අභිධම්මනයඤ්ඤූ'හං කථාවත්ථු විසුද්ධියා
සබ්බෙසං විඤ්ඤාපෙත්වාන විහරාමි අනාසවො."

යන ගාථාව ඇරැ පාමින් "නිසැකයෙන් 'කථාවත්ථුවිසුද්ධියා' යනුවෙන් **කථාවත්ථුප්පකරණය** සඳහන් කෙරෙති"යි කියත්. මෙසෙයින් සාධක තනා **මොග්ගලිපුත්තතිස්ස** මහරහතුන් විසින් ප්‍රණීත **කථාවත්ථුප්පකරණ** නැමැති අභිධර්මප්‍රකරණයෙන් පසු අපදානය සැකැසිනැ යි බෙණෙත්.

පූර්වොක්ත ගාථායෙහි 'කථාවත්ථුවිසුද්ධියා' යන්නෙන් අපෙක්ෂිත වන්නේ කථාවත්ථුප්පකරණය නො වේ. **පුණ්ණමන්තානිපුත්ත** මහරහතුන්ගේ අපදානයෙහි එන තෙල ගාථායෙහි යථාර්ථය නම්:

"ඒ පියුමතුරා බුදුන් කල විජම්නය දත් මම (කථාවස්තුප්‍රවිභාගයෙහි දක්ෂ වූයෙම් දැන් ඒ) කථාවස්තු විශුද්ධිය හැම මහණුන්ට හඟවමින් ක්ෂීණාස්‍රව වූයෙම් වෙසෙමි' යනු යි.

"කථාවත්ථුවිසුද්ධියාති=කථාවත්ථුප්පකරණෙ විසුද්ධියා ඡෙකො; අප්පිච්ඡ-කථා සන්තුට්ඨිකථාදිසු වා දසසු කථාවත්ථූසු ඡෙකො. තාය කථාවත්ථු-විසුද්ධියා" යනු අටුවා යි. මෙය 'කථාවත්ථුවිසුද්ධියා' යන පදයෙහි අර්ථය යි දත්තේ ය.

බුද්ධකාලයෙහි විසූ ධම්මකථික මහතෙරුන් අතුරෙහි **පුණ්ණමන්තානි-පුත්ත** තෙරහු අගතැන්පත් වූහ. උන් වහන්සේ සබඹසරුනට දසකථාවත්ථුයෙන් දම් දෙසූහ. මෙහි ලා මජ්ඣිමනිකායෙහි එන **රථවිනීත** සූත්‍රය ද බලත්තේ ය. පුණ්ණාපදානයෙනුදු එබව ස්ථිර වෙයි. තෙල ගාථාහි එන 'කථාවත්ථු' නම් ප්‍රවිභාගොචිතධර්මකථාවස්තු හෝ ශාසනයෙහි ප්‍රසිද්ධ **'අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා,**

වීරියාරම්භකථා, සීලසම්පදාකථා, සමාධිසම්පදාකථා, පඤ්ඤාසම්පදාකථා විමුත්තිසම්පදාකථා, විමුත්තිඤාණදස්සනසම්පදාකථා, යන දශකථාවස්තූයි.

තවද ඒ වාදීහු අඞ්ගුත්තරනිකායාගත පඤ්චක නිපාතයෙහි යොධාජීව වර්ගයට අයත් නවවැනි අනාගතභය සූත්‍රයෙහි සිවුවැනි කරුණු ගෙණ හැර පාමින් "භික්ෂූන් තථාගතභාෂිත වූ... සූත්‍රයන් පසෙක තබා ශ්‍රාවකභාෂිත වූ කාව්‍යප්‍රබන්ධ ප්‍රගුණ කරති යි වදාළසේක." යි කියමින් අපදානපාළි, ථෙරගාථාපාළි, විමානවත්ථු, පෙතවත්ථු ආදී ඛුද්දකනිකායික පොත්පෙළ ශ්‍රාවකභාෂිතයෙහි තබමින් ඒ හැම පාවචනයට අයත් නොවෙති' යි කියත්. සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙහි ශ්‍රාවකභාෂිත වූ ධර්මස්කන්ධයෝ දෙදහස ද බුද්ධදේශිත ධර්මන්‍යායානුකූල වන බැවින් බුද්ධ භාෂිත **පාවචන** වෙත්. එහෙයින් ඛුද්දකනිකායෙහි එන අපදානපාළිය වැනි ග්‍රන්ථ බුද්ධදේශනා අනුව ගාථාබන්ධයෙන් තැනුනාහු 'කවිකෘති' වෙති යි පෙන්වීමට කරණ යත්නය උත්මාර්ගයෙහි වූ ව්‍යායාමයෙකි. සම්බුදුරජාණන් වහන්සේගෙන් එහිභික්ෂු භාවයෙන් පැවිද් උපසපත් ලද මහරහතුන් වහන්සේ බොහෝදෙනෙක් අපදානයෙහි එත්. සාරිපුත්ත, මහාමොග්ගල්ලාන, අඤ්ඤාකොණ්ඩඤ්ඤ, මහාකස්සප, අනුරුද්ධ, උපාලි, පුණ්ණමන්තානිපුත්ත, පිණ්ඩෝලභාරද්වාජ, ඛදිරවනිය රෙවත, ආනන්ද, රාහුල ආදි ක්ෂීණාස්‍රව මහාශ්‍රාවකයෝ තුමූ ම ස්වකීය පූර්වාපදාන දෙසූහ. තථාගතපරිනිර්වාණයෙන් පසු ධරමාන වූ උන් වහන්සේ අතුරෙන් ඇතැම් දෙනකුන් වහන්සේ **පඨමධම්මසඞ්ගීතියෙහි** දී ස්වකීය අපදාන ද ධර්මසඞ්ගීතියට නැගූහ.

ඇතැම් අපදානයෝ ද්විතීය, තෘතීය ධර්මසඞ්ගීතීන්හි පෙළට ආරොපිත වූහ. අපදානපාළියෙහි **බුද්ධසඤ්ඤකත්ථෙර** නමින් ද, ථෙරගාථා-පාළියෙහි **වීතසොක** නමින් ද එන රහතුන් වහන්සේගේ අපදානය තෘතීයධර්මසඞ්ගීතියෙහි දී පෙළදහමට ඇතුළත් වූ එක් අපදානයෙකි. තෘතීයධර්මසඞ්ගීතියෙන් පසු අපදානපාළියට හෝ ථෙරගාථාපාළියට ඇතුළත් කළ අපදානයෙක් නැත. නිදර්ශන වශයෙන් දක්වත් ම අනාගත සම්බුද්ධශාසනය සුරක්ෂිත කොට තැබීමට මහාපරිශ්‍රම දැරූ **මොග්ගලි-පුත්තතිස්සත්ථෙර, මහාමහින්දත්ථෙර** බඳු මහාක්ෂීණාස්‍රවයන් වහන්සේගේ අපදාන හෝ උදානගාථා අපදානපාළි ථෙරගාථාපාළි ආදියෙහි නැත. මේ පොත් පශ්චාත්කාලීන 'කවිකෘති' නම් උන් වහන්සේගේ ද අපදාන වාර්තා එහි ඇතුළත් කටයුතු ම වෙති යි එහෙත් එබන්දෙක් පෙළපොත්හි නො පැණෙයි. මෙ කරුණෙනුදු ඛුද්දකනිකායාන්තර්ගත ඒ පොත් පශ්චාත්කාලීනකෘති නොවනු පෙණේ. "පාළි අපදානය සංස්කෘතාපදානයට පසුකලෙක සඞ්ග්‍රහ කරණ ලද්දෙක" යන තර්කය ද එයින් ම බිඳේ.

**භාෂාතත්ත්වය හා පද රීති.**

තථාගතයන් වහන්සේගේ ධරමානකාලයෙහි සිට පැවැතෙන අපදානගාථාපාළිය පුරාතනාචාර්යයන් වහන්සේ විසින් සමාදෘතය. රත්නත්‍රය ශරණපරායණ භක්තිමත් ජනයාට ප්‍රසාදජනනය කරවන්නෙකි. පුනර්භවවාදය, කර්මවාදය වැනි සූක්ෂ්මධර්මාර්ථ නිරූපණය කරණ හසත-සාරයෙකි. සරල, සුමධුර, පද්‍යානුචිත භාෂායෙන් සමුද්ගීත අපදාන ගාථාවෝ අසන, කියන, කියවනුවන්ගේ ල ගැන්මෙහි පොහොසත් වෙත්. අර්ථව්‍යඤ්ජන සම්පත්තියෙන් පිරිපුන් අපදාන ගාථා වීර, කරුණා, ශාන්ත, අද්භූත ආදි රස මමත විශෙෂපදඝටනායෙන් ඖචිත්‍ය සම්පන්නය.

**අවදානසාහිත්‍යය:**

භාරතයෙහි උත්තරදේශීයබෞද්ධයන්ගේ අවදානසාහිත්‍යයෙක් ද ඇත. එය අපදානපාළියට වඩා වයසින් දෙවූ තන්හි ලා හැරු පාන්නාහු ද ඇත. ථෙරියනිකායෙන් භින්න වූ සර්වාස්තිවාදී භික්ෂුහු ද අනුක්‍රමයෙන් අවදාන සාහිත්‍යයක් නෙතූහ. සූත්‍රපිටකයෙහි එන පඤ්ච මහාආගමයන් හා විනයපිටකය හා පිටුවහල් කොට ගෙණ ඔවුන්ගේ අපදානසාහිත්‍යය ක්‍රමයෙන් පෘථුලත්වයට ගියේ ය. ශාසනේතිහාසයෙහි අවදාන සාහිත්‍යයට ලැබෙනුයේ අපදාන පාළියට වඩා කනිටු තැනෙකි. සංස්කෘතබෞද්ධ සාහිත්‍යයෙහි ද්වාදශාඞ්ගප්‍රවචනයෙක් එයි:

"සූත්‍රං ගෙයං ව්‍යාකරණං ගාථෝදානාවදානකම්,
ඉතිවෘත්තකං නිදානඤ්ච වෛපුල්‍යඤ්ච සජාතකම්,
උපදේශාද්භූතධර්මෞ ද්වාදශාඞ්ගමිදං වචඃ"

යන ශ්ලෝකයෙහි සඳහන් වනුයේ එ ද්වාදශාඞ්ගප්‍රවචනයි. **අවදානාඞ්ගය** ද ඔවුන් අතුරෙහි එක් අඞ්ගයෙකි. ඒ අවදානාඞ්ගයෙහි වැටෙනුයේ **අවදානශතක, මහාවස්තු, දිව්‍යාවදාන, ජාතකමාලා, කල්පද්‍රුමාවදානමාලා, අවදානකල්පලතා** ආදි ග්‍රන්ථසමූහයයි. මොවුන්තුරෙහි පැරණිම පොත නම් අවදානශතකයයි. එ ද ක්‍රිස්තුපූර්ව ප්‍රථම ශතවර්ෂයට වඩා පැරණි නොවේ. අවදානසාහිත්‍යයෙහි එන හැම ග්‍රන්ථයෙක්හි ඇති බොහෝ චරිතාවදානයෝ පාලිසාහිත්‍යයෙහි ද එති. **මහාවස්තුවදානය** භින්නනිකායික වන අතර **දිව්‍යාවදානය** සර්වාස්තිවාදීන් සතුය. එය ක්‍රිස්තුචතුර්ථශතසංවත්සරයෙහි සඞ්ගෘහීතය. **අවදානකල්පලතාව** කාශ්මීරදේශීය **ක්ෂේමේන්ද්‍රයන්** විසින් එකොළොස් වන සිය වස්හි ලියැවිනි. මෙසේ පාලිසංස්කෘතභාෂායෙන් සඞ්ගෘහීත බෞද්ධග්‍රන්ථපරම්පරායෙහි ඉතිහාසය අනුව සලකන්ම පාලි සාහිත්‍යය ආශ්‍රය කොට ගෙණ සංස්කෘතාවදාන සාහිත්‍යය විකසිත වූ බව සංහේතුක ව පෙණෙයි. එහෙයින් අපදානපාළිය සංස්කෘතාවදාන සාහිත්‍යය ඇසුරින් සඞ්ගෘහීත යයි කීම අනාථය.

**අපදානපාළියේ සිංහලපරිවර්තනය:**

සම්පූර්ණ අර්ථකථා නොමැති ටීකායෙකින් හෝ පැරණි සන්නයෙකින් වහලක් නොලැබිය හෙන **අපදානපාළි** නම් වූ මේ පද්‍යධර්මග්‍රන්ථය හෙළබසට පරිවර්තනය කිරීමේ කාර්යයෙහි තත්පරවූවෝ කොළඹ දෙමටගොඩ ජයශේඛරාරාමාධිපති, ශ්‍රීලඞ්කා විද්‍යෝදයවිශ්වවිද්‍යාලයෙහි ද කථිකාචාර්යයකු වූ **පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද** ස්ථවිරයන් වහන්සේය. ධර්මඥතාය හා භාෂාශාස්ත්‍රඥතාය ඇති ජනප්‍රියධර්මකථික ධර්මානන්ද ස්ථවිරයන් වහන්සේ ස්වකීය කාර්යය මැනැවින් ඉටු කොට ඇත. පර්යාප්තිශාසනසංග්‍රහය පිණිස වූ මේ අධිකාරයෙන් පණ්ඩිත ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ ලත් පුණ්‍යමහිමය ද ප්‍රශස්‍ය අපදානයක් වේවා.

**පරවාහැර පඤ්ඤානන්ද ථෙර.**

ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
දෙමටගොඩ, කොළඹ - 9.

# සඞ්කෙතනිරූපණය

# ABBREVIATIONS

| | | |
|---|---|---|
| මජ්ඣං | —— | මරම්මඡට්ඨසඞ්ගීති - පිටකපොත්ථකං. |
| ස්‍යා | —— | ස්‍යාමක්ඛර - මුද්දිතපොත්ථකං. |
| සීමු | -- | සීහළක්ඛර - මුද්දිතපොත්ථකං. |
| සෙ | —— | සෙළුත්තරාරාම - තාළපණ්ණපොත්ථකං. |
| PTS. | —— | Pali Text Society - Edition. |

# THE PĀLI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංaṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ජ්ඣ jjha | ත්ථ ttha | බ්‍ර bra |
| ක්ඛ kkha | ඤ්ඤ ñña | ත්‍ර tra, ත්ව tva | ම්ප mpa |
| ක්‍ය kya | ඤ්හ, ñha | ද්ද dda | ම්ඵ mpha |
| ක්‍රි kri | ඤ්ච, ඦ ñca | ද්ධ, ධ ddha | ම්බ, ඹ mba |
| ක්ව kva | ඤ්ඡ ඡ, ñcha | ද්‍ර dra | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ජ ජ, ñja | ද්ව ව, dva | ම්ම mma |
| ඛ්ව khva | ඤ්ඣ ñjha | ධ්ව dhva | ම්හ mha |
| ඞ්ක ṅka | ට්ට ṭṭa | න්ත nta | ය්ය, ය්‍ය yya |
| ඞ්ඛ ṅkha | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ය්හ yha |
| ග්ග gga | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්‍ය lya |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna, | ල්හ lha |
| ඞ්ග ṅga | ණ්ට ṇṭa | න්හ nha | ව්හ wha |
| ඞ්ඝ ṅgha | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ස ssa |
| ච්ච cca | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ම sma |
| ච්ඡ ccha | ණ්හ ṇha | බ්බ bba | ස්ව swa |
| ජ්ජ jja | ත්ත tta | බ්භ bbha | හ්ම hma |

හ්ව hva ළ්හ ḷha

ා ā ි i ී ī ු ු u ූ ූ ū ෙ ē ො ō

ඛුද්දකනිකායෙ

# අපදානපාළි

## පඨමභාග - විසයසූචි


| විසයා | පිට්ඨඞ්කා |
|---|---|
| **බුද්ධවග්ගො** | **2 - 96** |
| 1. බුද්ධාපදානං | 2 - 12 |
| 2. පච්චෙකබුද්ධාපදානං | 12 - 22 |
| **ථෙරාපදානං** | |
| 1. සාරිපුත්තත්ථෙරාපදානං | 24 - 56 |
| 2. මහාමොග්ගල්ලානත්ථෙරාපදානං | 56 - 58 |
| 3. මහාකස්සපත්ථෙරාපදානං | 60 - 62 |
| 4. අනුරුද්ධත්ථෙරාපදානං | 62 - 64 |
| 5. පුණ්ණත්ථෙරාපදානං | 64 |
| 6. උපාලිත්ථෙරාපදානං | 66 - 86 |
| 7. අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරාපදානං | 86 - 88 |
| 8. පිණ්ඩොලභාරද්වාජත්ථෙරාපදානං | 90 |
| 9. ඛදිරවනියරෙවතත්ථෙරාපදානං | 92 |
| 10. ආනන්දත්ථෙරාපදානං | 94 - 96 |
| බුද්ධවග්ගො පඨමො. | |
| **2. සීහාසනදායකවග්ගො** | **98 - 116** |
| 11. සීහාසනදායකත්ථෙරාපදානං | 98 |
| 12. එකත්ථම්භිකත්ථෙරාපදානං | 98 - 100 |
| 13. නන්දත්ථෙරාපදානං | 100 - 102 |
| 14. චූළපන්ථකත්ථෙරාපදානං | 102 - 104 |
| 15. පිලින්දිවච්ඡත්ථෙරාපදානං | 106 |
| 16. රාහුලත්ථෙරාපදානං | 108 - 110 |
| 17. උපසෙනත්ථෙරාපදානං | 110 |

| | | | |
|---|---|---|---|
| 18. | රට්ඨපාලත්ථෙරාපදානං | | 112 |
| 19. | සොපාකත්ථෙරාපදානං | | 114 |
| 20. | සුමඞ්ගලත්ථෙරාපදානං | 114 | – 116 |

**සීහාසනදායකවග්ගො දුතියො.**

**3. සුභූතිවග්ගො 118 – 144**

| | | | |
|---|---|---|---|
| 21. | සුභූතිත්ථෙරාපදානං | 118 | – 124 |
| 22. | උපවානත්ථෙරාපදානං | 124 | – 130 |
| 23. | සරණගමනියත්ථෙරාපදානං | 132 | – 134 |
| 24. | පඤ්චසීලසමාදානියත්ථෙරාපදානං | 134 | – 138 |
| 25. | අන්නසංසාවකත්ථෙරාපදානං | | 138 |
| 26. | ධූපදායකත්ථෙරාපදානං | 138 | – 140 |
| 27. | පුලිනපූජකත්ථෙරාපදානං | | 140 |
| 28. | උත්තරියත්ථෙරාපදානං | 140 | – 142 |
| 29. | එකඤ්ජලිකත්ථෙරාපදානං | | 142 |
| 30. | ඛොමදායකත්ථෙරාපදානං | 142 | – 144 |

**සුභූතිවග්ගො තතියො.**

**4. කුණ්ඩධානවග්ගො 144 – 160**

| | | | |
|---|---|---|---|
| 31. | කුණ්ඩධානත්ථෙරාපදානං | 144 | – 146 |
| 32. | සාගතත්ථෙරාපදානං | 146 | – 148 |
| 33. | මහාකච්චානත්ථෙරාපදානං | 148 | – 150 |
| 34. | කාළුදායිත්ථෙරාපදානං | | 152 |
| 35. | මොඝරාජත්ථෙරාපදානං | 156 | – 156 |
| 36. | අධිමුත්තත්ථෙරාපදානං | | 156 |
| 37. | ලසුණදායකත්ථෙරාපදානං | 156 | – 158 |
| 38. | ආයාගදායකත්ථෙරාපදානං | | 158 |
| 39. | ධම්මචක්කිකත්ථෙරාපදානං | 158 | – 160 |
| 40 | කප්පරුක්ඛියත්ථෙරාපදානං | | 160 |

**කුණ්ඩධානවග්ගො චතුත්ථො.**

**5. උපාලිවග්ගො 162 – 182**

| | | | |
|---|---|---|---|
| 41. | භාගිනෙය්‍යඋපාලිත්ථෙරාපදානං | 162 | – 164 |
| 42. | සොණකොටිකණ්ණත්ථෙරාපදානං | 164 | – 168 |
| 43. | කාළිගොධාපුත්තභද්දියත්ථෙරාපදානං | 168 | – 170 |
| 44. | සන්නිට්ඨාපකත්ථෙරාපදානං | | 172 |

45. පඤ්චහත්ථිදායකත්ථෙරාපදානං 172
46. පදුමච්ඡදනියත්ථෙරාපදානං 174
47. සයනදායකත්ථෙරාපදානං 174
48. චඞ්කමදායකත්ථෙරාපදානං 174 - 176
49. සුභද්දත්ථෙරාපදානං 176 - 178
50. චුන්දත්ථෙරාපදානං 180 - 182

උපාලිවග්ගො පඤ්චමො.

වීජනිවග්ගො 182 - 196

51. විධූපනදායකත්ථෙරාපදානං 182
52. සතරංසිකත්ථෙරාපදානං 184
53. සයනදායකත්ථෙරාපදානං 184 - 186
54. ගන්ධොදකියත්ථෙරාපදානං 186
55. ඕපවය්හත්ථෙරාපදානං 186 - 188
56. සපරිවාරාසනත්ථෙරාපදානං 188 - 190
57. පඤ්චදීපකත්ථෙරාපදානං 190
58. ධජදායකත්ථෙරාපදානං 190 - 192
59. පදුමත්ථෙරාපදානං 192 - 194
60. අසනබොධියත්ථෙරාපදානං 194 - 196

වීජනිවග්ගො ඡට්ඨො.

සකචින්තනියවග්ගො 196 - 208

61. සකචින්තනියත්ථෙරාපදානං 196
62. අවොපුප්ඵියත්ථෙරාපදානං 198
63. පච්චාගමනියත්ථෙරාපදානං 198
64. පරප්පසාදකත්ථෙරාපදානං 200
65. භිසදායකත්ථෙරාපදානං 200 - 202
66. සුචින්තිතත්ථෙරාපදානං 202
67. වත්ථදායකත්ථෙරාපදානං 204
68. අම්බදායකත්ථෙරාපදානං 204 - 206
69. සුමනත්ථෙරාපදානං 206
70. පුප්ඵචඞ්ගොටියත්ථෙරාපදානං 206

සකචින්තනියවග්ගො සත්තමො.

නාගසමාලවග්ගො 208 - 220

71. නාගසමාලත්ථෙරාපදානං 208
72. පදසඤ්ඤකත්ථෙරාපදානං 210
73. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං 210

| | | | |
|---|---|---|---|
| 74. | භිසාලුවදායකත්ථෙරාපදානං | | 210 |
| 75. | ඒකසඤ්ඤකත්ථෙරාපදානං | 210 | - 212 |
| 76. | තිණසන්ථරදායකත්ථෙරාපදානං | | 212 |
| 77. | සූචිදායකත්ථෙරාපදානං | 213 | - 214 |
| 78. | පාටලිපුප්ඵියත්ථෙරාපදානං | | 214 |
| 79. | ඨිතඤ්ජලියත්ථෙරාපදානං | 214 | - 216 |
| 80. | තිපදුමියත්ථෙරාපදානං | 216 | - 220 |

නාගසමාලවග්ගො අට්ඨමො.

| | | | |
|---|---|---|---|
| | **තිමිරපුප්ඵියවග්ගො** | **220** | **- 230** |
| 81. | තිමිරපුප්ඵියත්ථෙරාපදානං | 220 | - 222 |
| 82. | ගතසඤ්ඤකත්ථෙරාපදානං | | 222 |
| 83. | නිපන්නඤ්ජලියත්ථෙරාපදානං | 222 | - 224 |
| 84. | අධොපුප්ඵියත්ථෙරාපදානං | | 224 |
| 85. | රංසිසඤ්ඤකත්ථෙරාපදානං | | 226 |
| 86. | දුතියරංසිසඤ්ඤකත්ථෙරාපදානං | | 226 |
| 87. | ඵලදායකත්ථෙරාපදානං | | 226 |
| 88. | සද්දසඤ්ඤකත්ථෙරාපදානං | | 228 |
| 89. | බොධිසිඤ්චකත්ථෙරාපදානං | | 228 |
| 90. | පදුමපුප්ඵියත්ථෙරාපදානං | 228 | - 230 |

තිමිරපුප්ඵියවග්ගො නවමො

| | | | |
|---|---|---|---|
| | **සුධාපිණ්ඩියවග්ගො** | **230** | **- 240** |
| 91. | සුධාපිණ්ඩියත්ථෙරාපදානං | | 230 |
| 92. | සුචින්තිතත්ථෙරාපදානං | | 232 |
| 93. | අඩ්ඪචෙලකත්ථෙරාපදානං | | 232 |
| 94. | සූචිදායකත්ථෙරාපදානං | | 234 |
| 95. | ගන්ධමාලියත්ථෙරාපදානං | | 234 |
| 96. | තිපුප්ඵියත්ථෙරාපදානං | | 236 |
| 97. | මධුපිණ්ඩිකත්ථෙරාපදානං | | 236 |
| 98. | සෙනාසනදායකත්ථෙරාපදානං | | 238 |
| 99. | වෙය්‍යාවච්චකත්ථෙරාපදානං | | 238 |
| 100. | බුද්ධුපට්ඨාකත්ථෙරාපදානං | | 238 |

සුධාපිණ්ඩියවග්ගො දසමො.

| | | |
|---|---|---|
| | **භික්ඛාදායිවග්ගො** | **240 - 252** |
| 101 | භික්ඛාදායකත්ථෙරාපදානං | 240 |
| 102. | ඤාණසඤ්ඤකත්ථෙරාපදානං | 242 |
| 103. | උප්පලහත්ථියත්ථෙරාපදානං | 242 |
| 104. | පදපූජකත්ථෙරාපදානං | 244 |
| 105. | මුට්ඨිපුප්ඵියත්ථෙරාපදානං | 244 |
| 106. | උදකපූජකත්ථෙරාපදානං | 246 |
| 107. | නළමාලියත්ථෙරාපදානං | 246 - 248 |
| 108. | ආසනුපට්ඨාපකත්ථෙරාපදානං | 248 |
| 109. | බිළාලිදායකත්ථෙරාපදානං | 250 |
| 110. | රේණුපූජකත්ථෙරාපදානං | 250 - 252 |

භික්ඛාදායිවග්ගො එකාදසමො.

| | | |
|---|---|---|
| | **මහාපරිවාරවග්ගො** | **254 - 266** |
| 111. | මහාපරිවාරත්ථෙරාපදානං | 254 |
| 112. | සුමඞ්ගලත්ථෙරාපදානං | 254 |
| 113. | සරණගමනියත්ථෙරාපදානං | 254 - 256 |
| 114. | එකාසනියත්ථෙරාපදානං | 256 - 258 |
| 115. | සුවණ්ණපුප්ඵියත්ථෙරාපදානං | 258 |
| 116. | චිතකපූජකත්ථෙරාපදානං | 260 |
| 117. | බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං | 260 - 262 |
| 118. | මග්ගසඤ්ඤකත්ථෙරාපදානං | 262 |
| 119. | පච්චුපට්ඨානසඤ්ඤකත්ථෙරාපදානං | 262 - 264 |
| 120. | ජාතිපූජකත්ථෙරාපදානං | 264 - 266 |

මහාපරිවාරවග්ගො ද්වාදසමො.

| | | |
|---|---|---|
| | **සෙරෙය්‍යකවග්ගො** | **266 - 282** |
| 121. | සෙරෙය්‍යකත්ථෙරාපදානං | 266 - 268 |
| 122. | පුප්ඵථූපියත්ථෙරාපදානං | 268 - 270 |
| 123. | පායාසදායකත්ථෙරාපදානං | 270 - 272 |
| 124. | ගන්ධොදකියත්ථෙරාපදානං | 272 |
| 125. | සම්මුඛාථවිකත්ථෙරාපදානං | 272 - 276 |
| 126. | කුසුමාසනියත්ථෙරාපදානං | 276 |
| 127. | ඵලදායකත්ථෙරාපදානං | 278 |
| 128. | ඤාණසඤ්ඤකත්ථෙරාපදානා | 278 - 280 |
| 129. | ගන්ධපුප්ඵියත්ථෙරාපදානං | 280 |
| 130. | පදුමපූජකත්ථෙරාපදානං | 280 - 282 |

සෙරෙය්‍යකවග්ගො තෙරසමො

| | | |
|---|---|---|
| | **සොභිතවග්ගො** | **282 - 292** |
| 131. | සොභිතත්ථෙරාපදානං | 282 - 284 |
| 132. | සුදස්සනත්ථෙරාපදානං | 284 |
| 133. | චන්දනපූජකත්ථෙරාපදානං | 284 - 286 |
| 134. | පුප්ඵච්ඡදනියත්ථෙරාපදානං | 286 |
| 135. | රහොසඤ්ඤකත්ථෙරාපදානං | 288 |
| 136. | චම්පකපුප්ඵියත්ථෙරාපදානං | 288 |
| 137. | අත්ථසන්දස්සකත්ථෙරාපදානං | 290 |
| 138. | එකපසාදනියත්ථෙරාපදානං | 290 |
| 139. | සාලපුප්ඵදායකත්ථෙරාපදානං | 292 |
| 140. | පියාලඵලදායකත්ථෙරාපදානං | 292 |
| | **සොභිතවග්ගො චුද්දසමො.** | |
| | **ඡත්තවග්ගො** | **294 - 302** |
| 141. | අතිච්ඡත්තියත්ථෙරාපදානං | 294 |
| 142 | ථම්භාරොපකත්ථෙරාපදානං | 294 |
| 143. | වෙදිකාරකත්ථෙරාපදානං | 296 |
| 144. | සපරිවාරියත්ථෙරාපදානං | 296 |
| 145. | උම්මාපුප්ඵියත්ථෙරාපදානං | 296 - 298 |
| 146. | අනුලෙපදායකත්ථෙරාපදානං | 298 |
| 147. | මග්ගදායකත්ථෙරාපදානං | 298 |
| 148. | ඵලදායකත්ථෙරාපදානං | 300 |
| 149. | වටංසකියත්ථෙරාපදානං | 300 |
| 150. | පල්ලඞ්කදායකත්ථෙරාපදානං | 300 - 302 |
| | **ඡත්තවග්ගො පණ්ණරසමො.** | |
| | **බන්ධුජීවකවග්ගො** | **302 - 312** |
| 151. | බන්ධුජීවකත්ථෙරාපදානං | 302 |
| 152. | තම්බපුප්ඵියත්ථෙරාපදානං | 304 |
| 153. | වීථිසම්මජ්ජකත්ථෙරාපදානං | 304 |
| 154. | කක්කාරුපූජකත්ථෙරාපදානං | 306 |
| 155. | මන්දාරවපූජකත්ථෙරාපදානං | 306 |
| 156. | කදම්බපුප්ඵියත්ථෙරාපදානං | 306 |
| 157. | තිණසූලකත්ථෙරාපදානං | 308 |
| 158. | නාගපුප්ඵියත්ථෙරාපදානං | 308 |
| 159. | පුන්නාගපුප්ඵියත්ථෙරාපදානං | 310 |
| 160. | කුමුදදායකත්ථෙරාපදානං | 310 |
| | **බන්ධුජීවකවග්ගො සොළසමො.** | 312 |

සුපාරිචරියවග්ගො 312 - 320

161. සුපාරිචරියත්ථෙරාපදානං 312
162. කණවෙරපුප්ඵියත්ථෙරාපදානං 312
163. බජ්ජදායකත්ථෙරාපදානං 314
144. දෙසපූජකත්ථෙරාපදානං 314
165. කණිකාරච්ඡත්තියත්ථෙරාපදානං 316
166. සප්පිදායකත්ථෙරාපදානං 316
167. යූථිකාපුප්ඵියත්ථෙරාපදානං 316
168. දුස්සදායකත්ථෙරාපදානං 318
169. සමාදපකත්ථෙරාපදානං 318
170. පඤ්චඞ්ගුලියත්ථෙරාපදානං 320

සුපාරිචරියවග්ගො සත්තරසමො.

කුමුදවග්ගො 320 - 328

171. කුමුදමාලියත්ථෙරාපදානං 320 - 322
172. නිස්සෙණිදායකත්ථෙරාපදානං 322
173. රත්තිපුප්ඵියත්ථෙරාපදානං 322 - 324
174. උදපානදායකත්ථෙරාපදානං 324
175. සීහාසනදායකත්ථෙරාපදානං 324
176. මග්ගදත්තිකත්ථෙරාපදානං 326
177. එකදීපියත්ථෙරාපදානං 326
178. මණිපූජකත්ථෙරාපදානං 326
179. තිකිච්ඡකත්ථෙරාපදානං 328
180. සඞ්ඝුපට්ඨාකත්ථෙරාපදානං 328

කුමුදවග්ගො අට්ඨාරසමො.

කුටජපුප්ඵියවග්ගො 328 - 338

181. කුටජපුප්ඵියත්ථෙරාපදානං 328
182. බන්ධුජීවකත්ථෙරාපදානං 328
183. කොටුම්බරියත්ථෙරාපදානං 332
184. පඤ්චහත්ථියත්ථෙරාපදානං 332
135. ඉසිමුග්ගදායකත්ථෙරාපදානං 334
186. බොධිඋපට්ඨාකත්ථෙරාපදානං 334
187. එකචින්තිකත්ථෙරාපදානං 334 - 336
188. තිකණ්ණිපුප්ඵියත්ථෙරාපදානං 336
189. එකචාරියත්ථෙරාපදානං 338
190. තිවණ්ටිපුප්ඵියත්ථෙරාපදානං 338

කුටජපුප්ඵියවග්ගො එකූනවීසතිමො

තමාලපුප්ඵියවග්ගො 340 – 350

191. තමාලපුප්ඵියත්ථෙරාපදානං 340
192. තිණසන්ථරදායකත්ථෙරාපදානං 340
193. ඛණ්ඩඵුල්ලියත්ථෙරාපදානං 342
194. අසොකපූජකත්ථෙරාපදානං 342
195. අඞ්කොලදායකත්ථෙරාපදානං 344
196. කිසලපූජකත්ථෙරාපදානං 344
197. තින්දුකදායකත්ථෙරාපදානං 346
198. මුට්ඨිපූජකත්ථෙරාපදානං 346
199. කිඞ්කිණිපුප්ඵියත්ථෙරාපදානං 348
200. යූථිකාපුප්ඵියත්ථෙරාපදානං 348

තමාලපුප්ඵියවග්ගො වීසතිමො. 350

භික්ඛාවග්ගදසකං.

දුතියසතකං සමත්තං.

කණිකාරපුප්ඵියවග්ගො 350 – 360

201. කණිකාරපුප්ඵියත්ථෙරාපදානං 350
202. මිනෙලපුප්ඵියත්ථෙරාපදානං 350 – 352
203. කිඞ්කිණිකපුප්ඵියත්ථෙරාපදානං 352
204. තරණියත්ථෙරාපදානං 352
205. නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරාපදානං 354
276. උදකදායකත්ථෙරාපදානං 354
207. සළලමාලියත්ථෙරාපදානං 346
208. කොරණ්ඩපුප්ඵියත්ථෙරාපදානං 356
209. ආධාරදායකත්ථෙරාපදානං 358
210. වාතාතපනිවාරියත්ථෙරාපදානං 358

කණිකාරපුප්ඵියවග්ගො එකවීසතිමො. 360

හත්ථිවග්ගො 360 – 368

211. හත්ථිදායකත්ථෙරාපදානං 360
212. පානධිදායකත්ථෙරාපදානං 360
213. සච්චසඤ්ඤකත්ථෙරාපදානං 362
214. එකසඤ්ඤකත්ථෙරාපදානං 362
215. රංසිසඤ්ඤකත්ථෙරාපදානං 364
216. සණ්ඨිතත්ථෙරාපදානං 365
217. තාලවණ්ටදායකත්ථෙරාපදානං 366
218. අක්කන්තසඤ්ඤකත්ථෙරාපදානං 366
219. සප්පිදායකත්ථෙරාපදානං 368
220. පාපනිවාරියත්ථෙරාපදානං 368

හත්ථිවග්ගො බාවීසතිමො.

## ආලම්බනදායකවග්ගො. 170 - 378


221. ආලම්බනදායකත්ථෙරාපදානං 370
222. අජිනදායකත්ථෙරාපදානං 370
223 ද්විරතනියත්ථෙරාපදානං 372
224. ආරක්ඛදායකත්ථෙරාපදානං 372
223. අව්‍යාධිකත්ථෙරාපදානං 374
226 අඞ්කොලපුප්ඵියත්ථෙරාපදානං 374
227. සොවණ්ණවටංසකියත්ථෙරාපදානං 376
228. මිඤ්ජවටංසකියත්ථෙරාපදානං 376
229. සුකතාවෙළියත්ථෙරාපදානං 376 - 378
230. එකවන්දියත්ථෙරාපදානං 378


**ආලම්බනදායකවග්ගො තෙවීසතිමො.**

## උදකාසනවග්ගො 378 - 386


231. උදකාසනදායකත්ථෙරාපදානං 378 - 380
232. භාජනදායකත්ථෙරාපදානං 380
233. සාලපුප්ඵියත්ථෙරාපදානං 380
234. කිලඤ්ජදායකත්ථෙරාපදානං 382
235. වෙදිකාරකත්ථෙරාපදානං 382
236. වණ්ණකාරත්ථෙරාපදානං 382 - 384
237. පියාලපුප්ඵියත්ථෙරාපදානං 384
238. අම්බයාගදායකත්ථෙරාපදානං 384
239. ජගතිකාරකත්ථෙරාපදානං 386
240. වාසිදායකත්ථෙරාපදානං 386


**උදකාසනදායකවග්ගො චතුවීසතිමො.**

## තුවරදායකවග්ගො 386 - 394


241. තුවරදායකත්ථෙරාපදානං 386
242. නාගකෙසරියත්ථෙරාපදානං 388
243. නළිනකෙසරියත්ථෙරාපදානං 388
244. විරවිපුප්ඵියත්ථෙරාපදානං 388 - 390
245. කුටිධූපකත්ථෙරාපදානං 390
246. පත්තදායකත්ථෙරාපදානං 390
247. ධාතුපූජකත්ථෙරාපදානං 390 - 392
248. සත්තලිපුප්ඵපූජකත්ථෙරාපදානං 392
249. බිම්බිජාලියත්ථෙරාපදානං 392
250. උද්දාලදායකත්ථෙරාපදානං 394


**තුවරදායකවග්ගො පඤ්චවීසතිමො.**

**ථොමකවග්ගො 394 - 402**

251. ථොමකත්ථෙරාපදානං 394
252. එකාසනදායකත්ථෙරාපදානං 396
253. චිතකපූජකත්ථෙරාපදානං 396
254. තිචම්පකපුප්ඵියත්ථෙරාපදානං 396 - 398
255. සත්තපාටලියත්ථෙරාපදානං 398
256. උපාහනදායකත්ථෙරාපදානං 398
257. මඤ්ජරිපූජකත්ථෙරාපදානං 400
258. පණ්ණදායකත්ථෙරාපදානං 400
259. කුටිදායකත්ථෙරාපදානං 402
260. අග්ගපුප්ඵියත්ථෙරාපදානං 402

**ථොමකවග්ගො ඡබ්බීසතිමො.**

**ආකාසුක්ඛිපියවග්ගො 404 - 410**

261. ආකාසුක්ඛිපියත්ථෙරාපදානං 404
262. තෙලමක්ඛියත්ථෙරාපදානං 404
263. අඩ්ඪචන්දියත්ථෙරාපදානං 404 - 406
264. පදීපියත්ථෙරාපදානං 406
265. බිළාලිදායකත්ථෙරාපදානං 406
266. මච්ඡදායකත්ථෙරාපදානං 408
267. ජවහංසදායකත්ථෙරාපදානං 408
268. සළලපුප්ඵියත්ථෙරාපදානං 408
269. උපාගතාසයත්ථෙරාපදානං 410
270. තරණියත්ථෙරාපදානං 410

**ආකාසුක්ඛිපියවග්ගො සත්තවීසතිමො.**

**සුවණ්ණබිබ්බොහනවග්ගො 412 - 420**

271. සුවණ්ණබිබ්බොහනියත්ථෙරාපදානං 412
272. තිලමුට්ඨිදායකත්ථෙරාපදානං 412
273. චඞ්ගොටකියත්ථෙරාපදානං 412 - 414
274. අබ්භඤ්ජනදායකත්ථෙරාපදානං 414
275. එකඤ්ජලියත්ථෙරාපදානං 414 416
276. පොත්ථදායකත්ථෙරාපදානං 416
277. චිතකපූජකත්ථෙරාපදානං 416
278. ආලුවදායකත්ථෙරාපදානං 418
279. එකපුණ්ඩරීකත්ථෙරාපදානං 418
280. තරණියත්ථෙරාපදානං 418

**සුවණ්ණබිබ්බොහනවග්ගො අට්ඨවීසතිමො.** 420

**පණ්ණදායකවග්ගො** 420 - 428

| | | |
|---|---|---|
| 281. | පණ්ණදායකත්ථෙරාපදානං | 420 |
| 282. | ඵලදායකත්ථෙරාපදානං | 420 |
| 283. | පච්චුග්ගමනියත්ථෙරාපදානං | 422 |
| 284. | එකපුප්ඵියත්ථෙරාපදානං | 422 |
| 285. | මඝවපුප්ඵියත්ථෙරාපදානං | 424 |
| 286. | උපට්ඨාකදායකත්ථෙරාපදානං | 424 |
| 287. | අපදානියත්ථෙරාපදානං | 426 |
| 288. | සත්තාහපබ්බජිතත්ථෙරාපදානං | 426 |
| 289. | බුද්ධුපට්ඨාකත්ථෙරාපදානං | 426 - 428 |
| 290. | පුබ්බඞ්ගමියත්ථෙරාපදානං | 428 |

**පණ්ණදායකවග්ගො එකූනතිංසතිමො.**

**චිතකපූජකවග්ගො** 430 - 438

| | | |
|---|---|---|
| 291. | චිතකපූජකත්ථෙරාපදානං | 430 |
| 292. | පුප්ඵධාරකත්ථෙරාපදානං | 430 |
| 293. | ඡත්තදායකත්ථෙරාපදානං | 432 |
| 294. | සද්දසඤ්ඤකත්ථෙරාපදානං | 432 |
| 295. | ගොසීසනික්ඛෙපකත්ථෙරාපදානං | 434 |
| 296. | පාදපූජකත්ථෙරාපදානං | 434 |
| 297. | දෙසකිත්තකත්ථෙරාපදානං | 436 |
| 298. | සරණගමනියත්ථෙරාපදානං | 436 |
| 299. | අම්බපිණ්ඩියත්ථෙරාපදානං | 436 |
| 300. | අනුසංසාවකත්ථෙරාපදානං | 438 |

**චිතකපූජකවග්ගො තිංසතිමො.**

**තතියසතකං සමත්තං.**

**පදුමකෙසරියවග්ගො** 440 - 448

| | | |
|---|---|---|
| 301. | පදුමකෙසරියත්ථෙරාපදානං | 440 |
| 302. | සබ්බගන්ධියත්ථෙරාපදානං | 440 |
| 303. | පරමන්නදායකත්ථෙරාපදානං | 440 - 442 |
| 304 | ධම්මසඤ්ඤකත්ථෙරාපදානං | 442 |
| 305. | ඵලදායකත්ථෙරාපදානං | 442 - 444 |
| 306. | සම්පසාදකත්ථෙරාපදානං | 444 |
| 307. | ආරාමදායකත්ථෙරාපදානං | 446 |
| 308. | අනුලෙපදායකත්ථෙරාපදානං | 446 |
| 309. | බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං | 448 |
| 310. | පබ්භාරදායකත්ථෙරාපදානං | 448 |

**පදුමකෙසරියවග්ගො එකතිංසතිමො.**

ආරක්ඛදායකවග්ගො 450 - 458

311. ආරක්ඛදායකත්ථෙරාපදානං 450
312. භොජනදායකත්ථෙරාපදානං 450
313. ගතසඤ්ඤකත්ථෙරාපදානං 450 - 452
314 සත්තපදුමියත්ථෙරාපදානං 452
315. පුප්ඵාසනදායකත්ථෙරාපදානං 452 - 454
316. ආසනත්ථවිකත්ථෙරාපදානං 454
317. සද්දසඤ්ඤකත්ථෙරාපදානං 456
318. තිරංසියත්ථෙරාපදානං 456
319. කන්දලිපුප්ඵියත්ථෙරාපදානං 458
320. කුමුදමාලියත්ථෙරාපදානං 458

ආරක්ඛදායකවග්ගො ද්වත්තිංසතිමො.

උම්මාපුප්ඵියවග්ගො 460 - 476

321. උම්මාපුප්ඵියත්ථෙරාපදානං 460
322. පුලිනපූජකත්ථෙරාපදානං 460
323. හාසජනකත්ථෙරාපදානං 462
324. යඤ්ඤසාමිකත්ථෙරාපදානං 462 - 464
325. නිමිත්තසඤ්ඤකත්ථෙරාපදානං 464
326. අන්නසංසාවකත්ථෙරාපදානං 464 - 466
327. නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරාපදානං 466 - 470

ද්වාදසමභාණවාරං

328. සුමනාවෙලියත්ථෙරාපදානං 470
329. පුප්ඵච්ඡත්තියත්ථෙරාපදානං 472
330. සපරිවාරච්ඡත්තදායකත්ථෙරාපදානං 472 - 476

උම්මාපුප්ඵියවග්ගො තෙත්තිංසතිමො.

ගන්ධධූපියවග්ගො 476 - 498

331. ගන්ධධූපියත්ථෙරාපදානං 476
332. උදකපූජකත්ථෙරාපදානං 478
333. පුන්නාගපුප්ඵියත්ථෙරාපදානං 478
334. එකදුස්සදායකත්ථෙරාපදානං 480 - 482
335. ඵුසිතකම්පියත්ථෙරාපදානං 482 - 484
336. පභඞ්කරත්ථෙරාපදානං 484 - 486
337. තිණකුටිදායකත්ථෙරාපදානං 488 - 490
338. උත්තරෙය්‍යදායකත්ථෙරාපදානං 490 - 492
339. ධම්මසවණියත්ථෙරාපදානං 492 - 494
340. උක්ඛිත්තපදුමියත්ථෙරාපදානං 496

ගන්ධධූපියවග්ගො චතුත්තිංසතිමො. 498

### එකපදුමියවග්ගො 498 - 508


341. එකපදුමියත්ථෙරාපදානං 398
342. තිඋප්පලමාලියත්ථෙරාපදානං 500
343. ධජදායකත්ථෙරාපදානං 500
344. තිකිඞ්කිණිපූජකත්ථෙරාපදානං 502
345. නළාගාරිකත්ථෙරාපදානං 502 - 504
346. චම්පකපුප්ඵියත්ථෙරාපදානං 504
457. පදුමපූජකත්ථෙරාපදානං 504 - 506
348. තිණමුට්ඨිදායකත්ථෙරාපදානං 506
349. තින්දුකඵලදායකත්ථෙරාපදානං 508
350. එකඤ්ජලියත්ථෙරාපදානං 508


එකපදුමියවග්ගො පඤ්චතිංසතිමො.

### සද්දසඤ්ඤකවග්ගො 510 - 516


351. සද්දසඤ්ඤකත්ථෙරාපදානං 510
352. යවකලාපියත්ථෙරාපදානං 510
353. කිංසුකපූජකත්ථෙරාපදානං 512
364. සකොටකකොරණ්ඩකත්ථෙරාපදානං 512
355. දණ්ඩදායකත්ථෙරාපදානං 512
359. අම්බදායකත්ථෙරාපදානං 514
357. සුපුටකපූජකත්ථෙරාපදානං 514
358. මඤ්චදායකත්ථෙරාපදානං 516
359. සරණගමනියත්ථෙරාපදානං 516
360. පිණ්ඩපාතිකත්ථෙරාපදානං 516


සද්දසඤ්ඤකවග්ගො ඡත්තිංසතිමො.

### මන්දාරවපුප්ඵියවග්ගො 518 - 524


361. මන්දාරවපුප්ඵියත්ථෙරාපදානං 518
362. කක්කාරුපුප්ඵියත්ථෙරාපදානං 518
363. භිසමුළාලදායකත්ථෙරාපදානං 518 - 520
364. කෙසරපුප්ඵියත්ථෙරාපදානං 520
365. අඞ්කොලපුප්ඵියත්ථෙරාපදානං 520
366. කදම්බපුප්ඵියත්ථෙරාපදානං 522
367. උද්දාලපුප්ඵියත්ථෙරාපදානං 522
368. එකචම්පකපුප්ඵියත්ථෙරාපදානං 522
369. තිමිරපුප්ඵියත්ථෙරාපදානං 524
370. සලලපුප්ඵියත්ථෙරාපදානං 524


මන්දාරවපුප්ඵියවග්ගො සත්තතිංසතිමො.

**බොධිවන්දකවග්ගො 526 - 536**

371. බොධිවන්දකත්ථෙරාපදානං 526
372. පාටලිපුප්ඵියත්ථෙරාපදානං 526
373. තිඋප්පලමාලියත්ථෙරාපදානං 528
374. පට්ටිපුප්ඵියත්ථෙරාපදානං 528 - 530
375. සත්තපණ්ණියත්ථෙරාපදානං 530
376. ගන්ධමුට්ඨියත්ථෙරාපදානං 530 - 532
377. චිතකපූජකත්ථෙරාපදානං 532
378. සුමනතාලවණ්ටියත්ථෙරාපදානං 532 - 534
379. සුමනදාමියත්ථෙරාපදානං 534
380. කාසුමාරිඵලදායකත්ථෙරාපදානං 534 - 536

**බොධිවන්දකවග්ගො අට්ඨතිංසතිමො.**

**අවණ්ටඵලදායකවග්ගො 536 - 552**

381. අවණ්ටඵලදායකත්ථෙරාපදානං 536
382. ලබුජදායකත්ථෙරාපදානං 538
383. උදුම්බරඵලදායකත්ථෙරාපදානං 538 - 540
384. පිලක්ඛදායකත්ථෙරාපදානං 540
385. ඵාරුසඵලදායකත්ථෙරාපදානං 540
386 වල්ලිඵලදායකත්ථෙරාපදානං 542
387. කදලිඵලදායකත්ථෙරාපදානං 542 - 544
388. පනසඵලදායකත්ථෙරාපදානං 544
389. සොණකොටිවීසත්ථෙරාපදානං 544 - 546
390. පුබ්බකම්මපිලොතිකාපදානං 548 - 552

**අවණ්ටඵලවග්ගො එකූනචත්තාළීසතිමො.**

**පිළින්දිවච්ඡවග්ගො 552 - 628**

391. පිළින්දිවච්ඡත්ථෙරාපදානං 552 - 580
392. සෙලත්ථෙරාපදානං 582 - 594
393. සබ්බකිත්තිකත්ථෙරාපදානං 596 - 600
394. මධුදායකත්ථෙරාපදානං 600 - 602
395 පදුමකූටාගාරියත්ථෙරාපදානං 604 - 608
396. බකුලත්ථෙරාපදානං 608 - 612
397. ගිරිමානන්දත්ථෙරාපදානං 612 - 616
398. සලලමණ්ඩපියත්ථෙරාපදානං 618
399. සබ්බදායකත්ථෙරාපදානං 618 - 622
400. අජිතත්ථෙරාපදානං 622 - 626

**පිළින්දිවච්ඡවග්ගො චත්තාළීසතිමො. 628**


**චතුත්ථසතකං සමත්තං.**

### සුත්තපිටකෙ ඛුද්දකනිකායෙ

# අපදානපාළි

### පඨමො භාගො

## සුත්තපිටකෙ ඛුද්දකනිකායෙ

# අපදානපාළි.

### පඨමො භාගො

---

## නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

## 1

## බුද්ධාපදානං.

---

*1. තථාගතං **ජෙතවනෙ** වසන්තං අපුච්ඡි **වෙදෙහමුනී** නතග්ගො,
“සබ්බඤ්ඤුබුද්ධා කිර නාම හොන්ති භවන්ති තෙ හෙතුභි කෙහි වීර ?[1]”

2. තදා'හ සබ්බඤ්ඤුවරො මහෙසී **ආනන්දභද්දං** මධුරස්සරෙන,
යෙ පුබ්බ[2]බුද්ධෙසු කතාධිකාරා අලද්ධමොක්ඛා ජිනසාසනෙසු.

3. තෙනෙව[3] සම්බොධිමුඛෙන ධීරා අජ්ඣාසයෙනාපි මහාබලෙන,
පඤ්ඤාය තෙජෙන සුතික්ඛපඤ්ඤා සබ්බඤ්ඤුභාවං අනුපාපුණන්ති.

4. අහම්පි පුබ්බබුද්ධෙසු බුද්ධත්තමභිපත්ථයිං,
මනසායෙව හුත්වාන ධම්මරාජා අසඞ්ඛියා. *

5. අථ බුද්ධාපදානානි සුණාථ සුද්ධමානසා;†
තිංසපාරමිසම්පුණ්ණා ධම්මරාජා අසඞ්ඛියා.

6. සම්බොධිං බුද්ධසෙට්ඨානං සසඞ්ඝෙ ලොකනායකෙ,
දසඞ්ගුලී නමස්සිත්වා සිරසා අභිවාදයිං.[4]

7. යාවතා බුද්ධඛෙත්තෙසු රතනා විජ්ජන්ත'සඞ්ඛියා,
ආකාසට්ඨා ච භුම්මට්ඨා මනසා සබ්බමාහරිං.[5]

---

* ආදිතො පට්ඨාය ඉමා චතස්සො ගාථායො P T S. පොත්ථකෙ න සන්ති.
† චතුත්ථගාථාය දුතියද්ධං චෙව පඤ්චමගාථාය පඨමද්ධං ච ස්‍යාමපොත්ථකෙ න සන්ති
1. ධීරා. සෙ. 2. සබ්බ. සෙ. 3. තෙනිධ. සෙ. 4. අභිවාදයෙ. සෙ
5. මාහරෙ. P T S. සෙ

# සූත්‍රපිටකයෙහි – ඛුද්දකනිකායේ

# අපදානපාළිය

## ප්‍රථමභාගය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන්වහන්සේට නමස්කාර වේවා.

# 1

# බුද්ධාපදානය

1 (වැඳුම පිණිස) නැමුනු සිරුරු ඇති **වෙදෙහිපුත්‍ර** (ආනන්දස්ථවිර) තෙමේ **දෙව්රම්** වෙහෙරෙහි වැඩ වසන්නා වූ බුදුරජාණන් වහන්සේගෙන් “වීරයන් වහන්ස, සර්වඥ බුදුවරු ලොව පහළ වෙත්. ඒ බුදුවරු කිනම් හේතුවකින් පහළ වෙත් දැ”යි විචාළේ ය.

2.–3. එකල්හි මහර්ෂි වූ සර්වඥ වූ බුදුරජාණන් වහන්සේ භද්‍ර වූ **ආනන්දස්ථවිරයන්** වහන්සේට “පෙර බුදුවරයන් වෙත කරණ ලද අධිකාර (පින්) ඇති, ඒ බුදුසසුන්හි නො ලැබූ නිවන් ඇති, ඉතා සියුම් නුවණ ඇති, ඒ ප්‍රාඥයෝ ඒ සම්‍යක්සම්බෝධිය ම අරමුණු කොට මහත් ධෛර්‍ය්‍යයෙන් කළ පැතුමින් ද, වඩන ලද ප්‍රඥාවෙන් ද, බලයෙන් ද බුදුබවට පැමිණෙත්” ය යි මිහිරි හඬින් වදාළ සේක.

4. බුදුවරයෝ අසඞ්ඛ්‍ය වෙති. මම ද ඒ පෙර බුදුවරයන් හමුවෙහි සිතින් ම එසේ වී බුදුබව පැතීමි.

5. අනතුරු ව බුද්ධාපදානයන් (බුදුබවට හෙතු කරුණු) පිරිසිදු සිතින් අසවු. සමතිස් පැරුම් පිරූ බුදුවරු අසඞ්ඛ්‍ය ගණන් වෙති.

6. ශ්‍රෙෂ්ඨ බුදුවරයන් වහන්සේලාගේ සර්වඥතාඥානය ද, ශ්‍රාවකසඞ්ඝයා සහිත බුදුවරයන් වහන්සේලා ද, බඳිලි ව නැමැද හිස නමාත් වැන්දෙමි.

7. ඇති තාක් බුද්ධක්ෂෙත්‍රයන්හි අහසෙහි වූ ද පොළොවෙහි වූ ද අනන්තරත්නයන් සිතින් (ඉටා මාගේ ප්‍රාසාදය හාත්පස) රැස් කෙළෙමි.

8. තත්ථ රූපියභූමියං පාසාදං මාපයිං[1] අහං,
නෙකභුම්මං[2] රතනමයං උබ්බිද්ධං නභමුග්ගතං.

9. විභත්තථම්භං සුකතං සුවිභත්තං මහාරහං,
කනකාමයසඞ්ඝාටං[3] තොරණච්ඡත්තමණ්ඩිතං[4].

10. පඨමා වෙළුරියා භූමි විමලාබ්භසමා සුභා,
නළිනී[5] ජලජාකිණ්ණා වරකඤ්චනභූමියා.

11. පවාළංසා[6] පවාළවණ්ණා කාචි ලොහිතකා සුභා,
ඉන්දගොපකවණ්ණාභා භූමි ඔභාසතී දිසා.

12. සුවිභත්තා ඝරමුඛා නිය්‍යූහා සීහපඤ්ජරා,
චතුරො වෙදිකා ජාලගන්ධාවෙළ[7] මනොරමා.

13. නීලා පීතා ලොහිතා ඔදාතා සුද්ධකාළකා,
කූටාගාරවරූපෙතා සත්තරතනභූසිතා.[8]

14. ඔලොකමයා[9] පදුමා වාළ-විහඞ්ගසොභිතා,
නක්ඛත්තතාරකාකිණ්ණා චන්දසූරියෙහි[10] මණ්ඩිතා.

15. හෙමජාලෙන සඤ්ඡන්නා සොණ්ණ-කිඞ්කිණිකායුතා,
වාතවෙගෙන කූජන්ති සොණ්ණමාලා මනොරමා.

16. මඤ්ජෙට්ඨකං ලොහිතකං පීතකං හරිපිඤ්ජරං,
නානාරඞ්ගෙහි සම්පීතං උස්සිතද්ධජමාලිනිං.

17. නානා බහූ නෙකසතා ඵලිකා රජතාමයා,
මණිමයා ලොහිතඞ්කා මසාරගල්ලමයා තථා,
නානාසයනවිචිත්තා සණ්හකාසිකසන්ථතා.

18. කම්බලා දුකූලා චීනා පත්තුණ්ණා පණ්ඩුපාවුරා,
විවිධත්ථරණං[11] සබ්බං මනසා පඤ්ඤපෙස’හං.[12]

19. තාසු තාස්වෙව භූමීසු රතනකූටලඞ්කතා,
මණිවෙරොචනා උක්කා ධාරයන්තා සුතිට්ඨරෙ.

20. සොභන්ති එසිකාථම්භා සුභා කඤ්චනතොරණා,
ජම්බොනදා සාරමයා අථො රජතමයාපි ච.

21. නෙකා සන්ධී[13] සුවිභත්තා කවාටග්ගළචිත්තිතා,
උභතො පුණ්ණඝටා’නෙකා පදුමුප්පලසංයුතා.

22. අතීතෙ සබ්බබුද්ධෙ ච සසංඝෙ ලොකනායකෙ,
පකතිවණ්ණරූපෙන නිම්මිනිත්වා සසාවකෙ.

---

1. මාපයෙ. P T S. සෙ. 2. නෙකභූමිං. P T S. 3. සඞ්ඝාතං. ම.
4. කොණ්ඩච්ඡත්තෙහි මණ්ඩිතං. ම. 5. නළින. ම. 6. පවාළංස. P T S.
7. ගන්ධවෙලා. P T S. 8. විභූසිතා. P T S. 9. ඔලොකියමයා. සෙ.
10. චන්දසූරෙහි. ම. සෙ. 11. විචිත්තත්ථරණං. 12. පඤ්ඤපෙමහං. සෙ. P T S.
13. නෙකාසන්ති. අ මු. සෙ.

8. එහි රිදීමුවාබිම්හි සත්රුවනින් කරණලද්ද වූ අහසෙහි උස් ව නැංගා වූ නොයෙක් මහල් ඇති පහයක් මැවීමි.

9. ඒ ප්‍රාසාදය දිගුපුළුලට සරි ලන සේ මැනවින් කල බෙදුම් ඇති මාහැඟි තොරණින් හා සෙසතින් බබලන රුවන්මුවා දැවවළලු ඇති විසිතුරු කණුවලින් යුතු වි ය.

10. එහි පලමුවැනි මාලය පිරිසිදු වලාකුළක් සේ මනොඥ වෙරළුමිණියෙන් කරණලද බිම ඇත්තේ වි ය. ජලයෙහි හටගන්නා පියුම්වලින් ගැවසීගත් උතුම් රුවන්මුවා භූමියෙන් ද යුතු වි ය.

11. එහි කිසි මහලක් මනහර පබළුයෙන් කල පැති ඇත්තේ පබළුවන් වි ය. අතිකක් රත්පැහැ වි ය. අතිකක් රතිඳුගොව්වන්ගේ පැහැයට බඳු පැහැයෙන් යුතු වූයේ දසදිගුත් බබුළුවයි.

12. මැනැවින් බෙදූ ගෘහද්වාර ද පිටතට නෙරාගිය ප්‍රමුඛශාලා (=පෝටිකෝ) ද වෙන් වෙන් ව තබනලද සීමැදුරු ද මුතුලැලින් මනහර වූ සුවඳමල්දම් ලෙලෙන වෙදිකා සතරක් ද එහි වි ය.

13. (ඒ ප්‍රාසාදය) සත්රුවනින් දිලෙන නිල්, කහ, රතු, සුදු, නො මුසු කළුවන් වූ උතුම් කුළුගෙවලින් ද යුතු වි ය.

14. (එම පහය) පිපුනු (අයුරින් කල) පියුමින් ද, ව්‍යාල මෘගයන්ගේ හා පක්ෂීන්ගේ ද රුවින් බබලන (ඉතා උස් බැවින් පිළිබිඹු වූ) නැකැත්තරුවලින් ගැවසී ගත් සඳහිරුරුවලින් ද ශොභන වි ය.

15. එහි රත්කිකිණියෙන් යුත් රුවන්දැලින් ගැවසුනු මනහර වූ රත්මල්දම්හු වායුවෙගයෙන් නාද කරති.

16. මදටපැහැ, රතු, කහ, පලාවන්, පිඟුවන් යන නන්වැදෑරුම් සායම් පොවනලද ඔසවනලද්ද වූ දදපෙළ ද වෙයි.

17. එය රිදීමුවා වූ ද නිල්මිණිමුවා වූ ද දෑරඟමිණිමුවා වූ ද, එසේ ම මැසිරිමිණිමුවා වූ ද පුවරු ඇති සියුම් කසීසළු අතුල නොයෙක් සියගණන් සයනයන්ගෙන් විසිතුරු වි ය.

18. කම්බිලි ද දුහුල්පට ද චීනපට ද පත්තුණ්ණදෙසයෙහි කල පට ද පඬුවන් පට ද යන මෙයින් කල ප්‍රාවරණයන් ඇති බැවින් විවිධ ඇතිරිලිවලින් යුත් සියලු (අසුන්) මම සිතින් ඉටා පැණවීමි.

19. ඒ ඒ භූමින්හි රුවන්කුළුවලින් අලඞ්කෘත වූ රත්මිණියෙන් කල දඬුවැටපහන් දරන්නෝ සිටිත්.

20. එහි නුවරදෙර හොබවනුවස් සිටවූ ඉන්ද්‍රඛීලයෝ බබලත්. සවර්ණමය වූ ද ජාම්බූනදසවර්ණමය වූ ද ඛදිර(=කිහිරි)දැරුමය වූ ද රජතමය වූ ද තොරන්හු බබලති.

21. මැනවින් බෙදූ බොහෝ සන්ධිහු වෙත්. (ඒ පහය) ජනෙල් වලින් හා අගුළුවලින් විසිතුරු වි ය. පියුම්උපුල් වලින් යුත් දෙපස තැබූ නොයෙක් පුන්කලස්හු ද එහි වෙති.

22. අතීතයෙහි වූ ශ්‍රාවකසඞ්ඝයා සහිත ලොකනායක සම්මා සම්බුදුවරයන් ද එසේ ම ශ්‍රාවකසමූහයා සහිත පසේබුදුවරයන් ද පියවි-සටහනින් මවා.-

23. තෙන ද්වාරෙන පවිසිත්වා සබ්බෙ බුද්ධා සසාවකා,
සබ්බසොවණ්ණයෙ* පීඨෙ නිසින්නා අරියමණ්ඩලා.

24. යෙ ච එතරහි අත්ථි බුද්ධා ලොකෙ අනුත්තරා,
අතීතා[1] වත්තමානා ච භවනං සබ්බෙ සමාරුහුං.[2]

25. පච්චෙකබුද්ධෙ නෙකසතෙ සයම්භූ අපරාජිතෙ,
අතීතෙ වත්තමානෙ[3] ච භවනං සබ්බෙ සමාරුහුං.[4]

26. කප්පරුක්ඛා බහූ අත්ථි යෙ දිබ්බා යෙ ච මානුසා,
සබ්බං දුස්සං සමාහන්ත්වා අච්ඡාදෙමි[5] තිචීවරං.

27. ඛජ්ජං භොජ්ජං සායනීයං සම්පන්නං[6] පානභොජනං,
මණිමයෙ සුභෙ පත්තෙ සම්පූරෙත්වා අදාසහං.

28. දිබ්බචක්ඛුසමා හුත්වා මට්ඨචීවරසංයුතා,[7]
මධූනා සක්ඛරා චෙව තෙලෙන මධුඵාණිතා.

29. තප්පිතා පරමන්නෙන සබ්බෙ තෙ අරියමණ්ඩලා,
රතනගබ්භං පවිසිත්වා කෙසරීව ගුහාසයා.

30. මහාරහම්හි සයනෙ සීහසෙය්‍යමකප්පයුං,
සම්පජානා සමුට්ඨාය සයනෙ පල්ලඞ්කමාභුජුං,
ගොචරං සබ්බබුද්ධානං ඣානරතිසමප්පිතා.

31. අඤ්ඤෙ ධම්මානි දෙසෙන්ති අඤ්ඤෙ කීළන්ති ඉද්ධියා,
අඤ්ඤෙ අභිඤ්ඤා අප්පෙන්ති අභිඤ්ඤාවසිභාවිතා,
විකුබ්බනා විකුබ්බන්ති අඤ්ඤෙ නෙකසහස්සියො.[8]

32. බුද්ධාපි බුද්ධෙ පුච්ඡන්ති විසයං සබ්බඤ්ඤුමාලයං,
ගම්භීරං නිපුණං ඨානං පඤ්ඤාය විනිබුජ්ඣරෙ.

33. සාවකා බුද්ධෙ පුච්ඡන්ති බුද්ධා පුච්ඡන්ති සාවකෙ,
අඤ්ඤමඤ්ඤං ච පුච්ඡන්ති[9] අඤ්ඤොඤ්ඤං[10] බ්‍යාකරොන්ති තෙ.

34. බුද්ධා පච්චෙකබුද්ධා ච සාවකා පරිචාරකා,
එවං සකාය රතියා[11] පාසාදෙ’භිරමන්ති තෙ.

35. ඡත්තා තිට්ඨන්තු රතනා කඤ්චනාවෙළපන්තිකා[12],
මුත්තාජාලපරික්ඛිත්තා සබ්බෙ[13] ධාරෙන්තු[14] මත්ථකෙ.

36. භවන්තු චෙළවිතානා සොවණ්ණතාරකචිත්තිතා,
විචිත්තමාල්‍යවිතානා[15] සබ්බෙ ධාරෙන්තු මත්ථකෙ.

37. විතතා මාල්‍යදාමෙහි ගන්ධදාමෙහි සොභිතා,
දුස්සදාමෙහි පරිකිණ්ණා රතනදාමවිභූසිතා.

1. අතීතෙ. ම. 2. සමාහරිං මු අ. 3. වත්තමානා. ම. 4. සමාහරිං. මු අ.
5. අච්ඡාදෙසිං (?) 6. සබ්බතන. සෙ. ම. 7. මට්ඨා. සෙ. ම. අ.
8. අනෙකසතසහස්සියො. සෙ. අඤ්ඤෙ නෙක සහස්සියො. P T S. 9. පුච්ඡිත්වා. ම.
10. අඤ්ඤමඤ්ඤං. P T S. සෙ. 11 එවං රතිසුරම්මානා. P T S. සෙ.
12. සුවණ්ණජාලාභි සංයුත්තං රජතජාලමණීහි ච P T S.
13. .මුත්තජාලපරික්ඛිත්තං ඡත්තං. P T S. 14. ධාරෙන්ති. සෙ. 15 විචිත්තා මල්‍ය-P T S
* සොණ්ණමයෙ (අට්ඨකථා.)

23. ශ්‍රාවකයන් සහිත ඒ බුදුවරු එකී දොරටුවෙන් (ප්‍රාසාදයට) ඇතුළුව ආයසීසමූහ ව සබ් සොවණ්‍ණිය (=සියල්ල රුවන්මුවා) වූ පුටුවල වැඩහුන්හ.

24. මෙකල ලොකයෙහි අනුත්තර වූ යම් බුදුකෙනෙක් වෙත් ද, එසේ ම අතීතයෙහි වූ ද, වර්තමානයෙහි වූ ද ඒ සියලු බුදුවරයෝ ම මේ ප්‍රාසාදයට නැංගහ.

25. තමන් විසින් ම පරොපදෙශ රහිතව ධර්මය අවබොධ කර ගත් පස්මරුන් දිනූ අතීතයෙහි හා වර්තමානයෙහි වූ නොයෙක් සියගණන් පසේබුදුවරු ද මේ පහයට නැංගහ.

26. දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද කල්පවෘක්ෂයෝ බොහෝ වෙති (එසින්) සියළු වස්ත්‍ර ගෙණවුත් තුන්සිවුරින් (උන්වහන්සේලා) හැඳවීමි.

27. කෑයුතු වූ ද, බිදියයුතු වූ ද, රස විඳගත යුතු වූ ද, සමෘද්ධ වූ ආහාරපානයෙන් මනොඥ වූ මිණිමුවා පාත්‍රයන් පුරවා මම උන්වහන්සේලාට දිනිමි.

28–29. දිවැස් ඇත්තවුන් වැනි වූවාහු මටසිලුටු සිවුරු දරුවා වූ මී සකුරු තලතෙල් මීපැණි යන මෙකී උතුම් ආහාරපානයන්ගෙන් සැහීමට පත් වූ ඒ සියලු ආයසීසමූහයා ගුහාවන්හි සයනය කරණ කෙශරසිංහයන් මෙන් රත්නගර්භයට පිවිස–

30. මාහැඟි සයනයෙහි සිහියෙන් යුතු ව සීහසෙය්‍යාවෙන් දකුණැල යෙන් සැතපුනහ. සිහියෙන් යුතු ව නැගිට සයනයෙහි ම පලක් බැඳ වැඩහිඳ සියලු බුදුවරයනට විෂය වූ ධ්‍යානයට සමවත්හ.

31. (ඒ පසේබුදුවරයන් අතුරෙන්) ඇතැම් කෙනෙක් දහම් දෙසත්. අනික් කෙනෙක් ධ්‍යානයෙන් උපදවාගත් සෘද්ධියෙන් ක්‍රීඩා කෙරෙත්. තව කෙනෙක් පඤ්චවශීන්ගේ වශයෙන් වසග කළ අභිඥවනට සමවදිති ඇතැම්හු නොයෙක් දහස්ගණන් සෘද්ධිවිකුර්වණයන් කෙරෙත්.

32. බුදුවරු සර්වඥතාඥනයට ගොචර වූ කරුණු බුදුවරුන්ගෙන් විචාරත්. ගැඹුරු වූ ද සියුම් වූ ද තැන් ප්‍රඥවෙන් අවබොධ කෙරෙත්.

33. ශ්‍රාවකයෝ බුදුවරුන්ගෙන් විචාරත්. බුදුවරු ශ්‍රාවකයන්ගෙන් විචාරත් ඔවුනොවුනු දු විචාරත්. ඔහු ඔවුනොවුන්ගේ පැණ විසඳත්.

34. සම්‍යක් සම්බුදුවරු ද පසේබුදුවරු ද ශ්‍රාවකයෝ ද පිරිවරජනයා ද මෙසේ සවකීය කැමැත්ත පරිදි ඒ (වෛජයන්ත) ප්‍රාසාදයෙහි ඇලී වෙසෙති.

35. සත්රුවන්මුවා ඡත්‍රයෝ රන්ලැල් සහිත පත්‍ර ඇතිව එල්බෙමින් සිටිත්වා, මුතුලැල් එල්බුනු සියලු ඡත්‍ර මාගේ මුදුනෙහි (හිසට) දරත්වා සි (සිතු කෙණෙහි එසේ පහළ විය.)

36. රුවන්තරුයෙන් බබලන සෙල්වියන් පහළ වේවා! විසිතුරු මල් ගැවසුනු නොයෙක් වියන් මාගේ මස්තකයෙහි දරත්වා!

37. මල්දමින් ගැවසීගත්, සුවඳ දමින් හෙබුනා වූ, දුස්සදාමයන්ගෙන් ආකුල වූ, රත්නදාමයන්ගෙන් අලඞ්කෘත වූ–

38. පුප්ඵාභිකිණ්ණා සුචිත්තා සුරභිගන්ධධූපිතා[1],
ගන්ධපඤ්චඞ්ගුලිකතා[2] හෙමච්ඡදනඡාදිතා.[3]

39. චතුද්දිසා පොක්ඛරඤ්ඤො පදුමුප්පලසන්ථතා,
සොවණ්ණරූපා ඛායන්තු පදුමරෙණුරජුග්ගතා.

40. පුප්ඵන්තු පාදපා සබ්බෙ පාසාදස්ස සමන්තතො,
සයං ච පුප්ඵා මුඤ්චිත්වා ගන්ත්වා[4] භවනමොකිරුං[5]

41. සිබිනො තත්ථ නච්චන්තු දිබ්බහංසා පකූජරෙ,
කරවීකා ච ගායන්තු දිජසංඝා සමන්තතො.

42. භෙරියො සබ්බා වජ්ජන්තු වීණා සබ්බා රවන්තු[6] තා,
සබ්බා සංගීති වත්තන්තු පාසාදස්ස සමන්තතො.

43. යාවතා බුද්ධඛෙත්තම්හි චක්කවාළෙ තතො පරෙ,
මහන්තා ජොතිසම්පන්නා අච්ඡින්නා රතනාමයා.

44. තිට්ඨන්තු සොණ්ණපල්ලඞ්කා දීපරුක්ඛා ජලන්තු තෙ,
භවන්තු එකපජ්ජොතා දසසහස්සිපරම්පරා.

45. ගණිකා ලාසිකා චෙව නච්චන්තු අච්ඡරාගණා,
නානාරඞ්ගා පදිස්සන්තු පාසාදස්ස සමන්තතො.

46. දුමග්ගෙ පබ්බතග්ගෙ වා සිනෙරුගිරිමුද්ධනි
උස්සාපෙමි ධජං සබ්බං විචිත්තං පඤ්චවණ්ණිකං.

47. නරා නාගා ච ගන්ධබ්බා සබ්බෙ දෙවා උපෙන්තු තෙ,
නමස්සන්තා පඤ්ජලිකා පාසාදං පරිවාරයුං.

48. යං කිඤ්චි කුසලං කම්මං කත්තබ්බං කිරියං මම,
කායෙන වාචා මනසා තිදසෙ සුකතං කතං.

49. යෙ සත්තා සඤ්ඤිනො අත්ථි යෙ ච සත්තා අසඤ්ඤිනො,
කතං පුඤ්ඤඵලං මය්හං සබ්බෙ භාගී භවන්තු තෙ.

50. යෙසං කතං සුවිදිතං දින්නං පුඤ්ඤඵලං මයා,
යෙ ච තස්මිං න ජානන්ති දෙවා ගන්ත්වා නිවෙදයුං.

51. සබ්බලොකම්හි[7] යෙ සත්තා ජීවන්තා'හාරහෙතුකා,
මනුඤ්ඤං භොජනං සබ්බං ලභන්තු මම තෙජසා[8].

52. මනසා දානං මයා දින්නං මනසා පාසාදමාවහිං,[9]
පූජිතා සබ්බසම්බුද්ධා පච්චෙකා ජිනසාවකා.

53. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගඤ්ඡහං.

54. දුවෙ භවෙ පජානාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ජානාමි මනසා පත්ථනාඵලං.

1. භූසිතා. සෙ. 2. ගුලඞ්කිතා. සෙ. 3. ඡදනමාලිකා. සෙ. 4. ගන්ධා. P T S.
5. මොතරුං. සෙ. 6. රසන්තු. ම. 7. සබ්බ-. P T S.
8. චෙතසා. P T S. සෙ. 9. මාපයිං. සෙ.

38. විසිතුරු මලින් ගැවසීගත් සුවඳදුම් ගැස්වූ සුවඳ පසඟුල් කළ රන්වහලින් වැසූ-

39. සිවුදිගෙහි වූ පුෂ්කරිණීහු පියුම්උපුල්වලින් ගැවසීගත්තාහු උඩට නැඟි පියුම් රොන් රජස් ඇත්තාහු සුවර්ණමය ව මෙන් වැටහෙත්වා!

40. මාගේ (වෛජයන්ත) ප්‍රාසාදය හාත්පස සියලුගස් පිපේවා! ඒ මල් ඉබේ ම ගිලිහී පහය මතුයෙහි විසිරේවා!

41. එහි මොනරු නටත්වා! දිව්‍යහංසයෝ ශබ්ද කෙරෙත්වා! හාත්පස්හි කොවුලෝ ද පක්ෂි සමූහයෝ ද ගයත්වා!

42. සියලු භෙරීහු වාදනය කරණු ලැබෙත්වා! ඒ සියලු වීණාවෝ රැව් දෙත්වා! පහය හාත්පස සියලු සඞ්ගීතයෝ පවතිත්වා!

43.-44. බුද්ධක්ෂෙත්‍රය හැමතැන ද, එයින් පිටත් සක්වළෙහි ද, මහත් වූ පලුදු නො වූ දිලිසෙන රුවන්මුවා රන්පලඟහු වෙත්වා! ප්‍රදීපවෘක්ෂයෝ දැල්වෙත්වා! දසදහස් ලෝද, පරපුර එකාලොක වෙත්වා!

45. ගණිකාවෝ ද තිළියෝ ද දිව්‍යාප්සරාවෝ ද නටත්වා! පහය අවට නන් රඟමඬුලු පෙණේවා!

46. (එකල්හි මම **තිලොක විජය** නම් සක්විතිරජ ව මුළුසක්වල) ගස් මුදුනෙහි ද පර්වත මුදුනෙහි ද සිනෙරුපර්වතමුදුනෙහි ද, පස්වණින් විසිතුරු වූ සියලු දද එසවීමි.

47. මනුෂ්‍යයෝ ද නාගයෝ ද ගන්ධර්වයෝ ද දෙවියෝ ද යන ඒ සියල්ලෝ එළඹෙත්වා! ඒ මිනිස් ආදීහු නමදින්නාහු බදැඳිළි ඇත්තාහු ඒ ප්‍රාසාදය පිරිවරාගණිත්වා!

(මෙසේ ඒ තුන්ලෝ ජයගත් සක්විති රජතෙම පහයෙහි ද තමාගේ ද අනුභාවය වර්ණනා කොට දන් එය ලැබීමට තමා කළ කුශලය දක්වයි.)

48. තව්තිසාවෙහි ඉපදීමට සුදුසු යම් කුශලයක් කළයුතු වී ද එය කයින් වචනයෙන් හා සිතින් මම මැනවින් කෙළෙමි.

49. (දිව්‍ය මනුෂ්‍යාදි) සංඥී සත්ත්වයෝ ද (අසඤ්ඤසත්තයෙහි වූ) අසංඥී සත්ත්වයෝ ද යම් තාක් වෙත් නම්, ඒ සියල්ලෝ මා විසින් කරණලද එකී පුණ්‍යඵලය අනුමෝදන් වෙත්වා!

50. මා විසින් කරණලද පිණ යම් දිව්‍යමනුෂ්‍යනාගාදි කෙනෙකුන් විසින් මැනැවින් දැනගන්නා ලද ද, ඔවුන්ට මා විසින් පුණ්‍යඵලය දෙනලදී. මා විසින් ඒ කරණලද පිණ දුන් බව යම් කෙනෙක් නො දනිත් නම්, දෙවිවරු ගොස් ඔවුනට එය දන්වත්වා!

51. ආහාර හේතුවෙන් ජීවත් වන සියලු ලොකවාසී සත්ත්වයෝ සියලු ම මනහර බොජුන් මාගේ පුණ්‍යර්ධියෙන් ලබත්වා!

52. පිරිසිදු සිතින් යම් දානයක් මා විසින් දෙනලද නම් එහි අනන්ත චෙතනාවන්ගෙන් සතුට ඉපදවීමි. සියලු සම්බුදුවරයෝ ද පසේ බුදුවරයෝ ද බුදුසව්වෝ ද මා විසින් පුදන ලදහ.

53. මැනවින් කළ ඒ පිණින් ද කරණ ලද ප්‍රාර්ථනාවන්ගෙන් ද මම මිනිස් සිරුර හැර තව්තිසාදෙව්ලොවට ගියෙමි.

54. දෙව් මිනිස් දෙගතිය දනිමි. එයින් පිටත් අනික් ගතියක් ගැණ නොදනිමි. සිතින් කළ පැතුමෙහි මේ ඵලයයි.

55. දෙවානං අධිකො හොමි භවාමි මනුජාධිපො,
රූපලක්ඛණසම්පන්නො පඤ්ඤාය අසමො භවෙ.

56 භොජනං විවිධං සෙට්ඨං රතනඤ්ච අනප්පකං,
නානාවිධානි[1] වත්ථානි නභා ඛිප්පං උපෙන්ති මං.

57. පථබ්‍යා[2] පබ්බතෙ චෙව ආකාසෙ උදකෙ වනෙ,
යං යං හත්ථං පසාරෙමි දිබ්බා භක්ඛා උපෙන්ති මං.[3]

58. පථබ්‍යා[2] පබ්බතෙ චෙව ආකාසෙ උදකෙ වනෙ,
යං යං හත්ථං පසාරෙමි රතනා සබ්බෙ උපෙන්ති මං[3]

59. පථබ්‍යා[2]-පෙ-පසාරෙමි සබ්බෙ ගන්ධා උපෙන්ති මං[3].

60. පථබ්‍යා-පෙ- පසාරෙමි සබ්බෙ යානා උපෙන්ති මං[3].

61. පථබ්‍යා-පෙ-පසාරෙමි සබ්බා මාලා උපෙන්ති මං[3].

62. පථබ්‍යා-පෙ-පසාරෙමි අලඞ්කාරා උපෙන්ති මං[3].

63 පථබ්‍යා-පෙ-පසාරෙමි සබ්බා කඤ්ඤා උපෙන්ති මං[3].

64. පථබ්‍යා-පෙ-පසාරෙමි උපෙන්ති මධුසක්කරා.

65. පථබ්‍යා-පෙ-පසාරෙමි සබ්බෙ ඛජ්ජා උපෙන්ති මං[3].

66. අධනෙ අද්ධිකජනෙ යාචකෙ ච පථාවිනො,
දදාම'හං[4] දානවරං සම්බොධිවරපත්තියා

67. නාදෙන්තො පබ්බතං සෙලං ගජ්ජෙන්තො[5] බහලං ගිරිං,
සදෙවලොකං හාසෙන්තො[6] බුද්ධො ලොකෙ භවාම'හං.

68. දිසා දසවිධා ලොකෙ යායතො නත්ථි අන්තකං,
තස්මිඤ්ච දිසාභාගම්හි බුද්ධක්ඛෙත්තා[7] අසඞ්ඛියා.

69. පභා පකිත්තිතා මය්හං යමකා රංසිවාහනා,
එත්ථන්තරෙ රංසිජාලං ආලොකො විපුලො භවෙ.

70. එත්තකෙ ලොකධාතුම්හි සබ්බෙ පස්සන්තු මං ජනා,
සබ්බෙ ච සුමනා හොන්තු සබ්බෙ මං අනුවත්තරෙ, *
(සබ්බෙ මං අනුවත්තන්තු යාව බ්‍රහ්මනිවෙසනං). †

71. විසට්ඨ[8] මධුනාදෙන අමතං භෙරිමාහනිං[9],
එත්ථන්තරෙ ජනා සබ්බෙ සුණන්තු මධුරං ගිරං.

72. ධම්මමෙඝෙ පවස්සන්තෙ සබ්බෙ හොන්තු අනාසවා,
යෙ'ත්ථ පච්ඡිමකා සත්තා සොතාපන්නා භවන්තු තෙ.

73. දත්වා දාතබ්බකං දානං සීලං පූරෙත්ව'සෙසතො,
නෙක්ඛම්මෙ පාරමිං ගන්ත්වා[10] පත්තො සම්බොධිමුත්තමං.

74. පණ්ඩිතෙ පරිපුච්ඡිත්වා කත්වා විරියමුත්තමං,
ඛන්තියා පාරමිං ගන්ත්වා පත්තො සම්බොධිමුත්තමං,

75. කත්වා දළ්හමධිට්ඨානං[11] පූරෙත්වා සච්චපාරමිං[12],
මෙත්තාය පාරමිං ගන්ත්වා පත්තො සම්බොධිමුත්තමං.

76. ලාභාලාභෙ සුඛෙ දුක්ඛෙ සම්මානෙ චාවමානනෙ[13],
සබ්බත්ථ සමකො හුත්වා පත්තො සම්බොධිමුත්තමං.

1. විවිධානි ච. ම. සෙ. 2. පුථව්‍යා. P T S. 3. මෙ. P T S. 4. යමෙමකතං. P T S.
5. ගවෙජ්ජෙන්තො. ම. 6. සදෙවකා භාසයන්තො. ම. සෙ. 7. ඛෙත්තා. ම.
8. විසිට්ඨ. P T S. 9. මාහනෙ. P T S සෙ. 10. පත්වා. P T S.
11. සච්චමධිට්ඨාන P T S. 12. සච්චපාරමී පූරිය. ම. සෙ.
13. ච විමානනෙ. ම. P T S. * P T S. පොත්ථකෙසු දිස්සති.
† අඩ්ඪචතුක්කමිදං අතිරිත්තකො භාගො මරම්මපොත්ථකෙසු චෙව
සෙළුත්තරාරාමපොත්ථකෙ ච දිස්සති.

55. (දෙව්ලොව උපන් කල්හි) දෙවියන්ට ශ්‍රෙෂ්ඨ වෙමි. (මිනිස් ලොව උපන් කල්හි) මනුෂ්‍යයන්ට ශ්‍රෙෂ්ඨ වූ රජ වෙමි. රූපලක්‍ෂණයෙන් සමන්විත වූයෙම් අසම වූ ප්‍රඥාව ඇත්තේ ද වෙමි.

56. ශ්‍රෙෂ්ඨ වූ නානාප්‍රකාර භොජන ද බොහෝ වූ සත්රුවන් ද නානාප්‍රකාර පට්ටකොසෙය්‍යාදි වස්ත්‍ර ද මා වෙතට අහසින් වහා පැමිණේ.

57. පෘථිවි ය, පර්වත ය, ආකාශ ය, ජල ය, වන ය යන යම් යම් තැනෙක්හි අත දික් කරම් ද, ඒ ඒ හැම තැනකින් ම මා වෙත දිව්‍යබොජුන් පහළ වේ.

58 – 65. පෘථිවිය –පෙ– යම් යම් තැනෙක්හි අත දික්කරම් ද, ඒ හැම තැනකින් ම රුවන් ද සියලු සුගන්ධවර්ග ද යානා මාලා අලඞ්කාරයෝ ද සියලු කන්‍යාවෝ ද මී සකුරු ද කැවිලි ද මා වෙත පැමිණෙත් (පහළ වෙති).

66. ශ්‍රෙෂ්ඨ වූ සම්‍යක්සම්බොධියට පැමිණීම පිණිස දුගී මගී යාචකාදීන්ට මම උතුම් දන් දෙමි.

67. ඝන බහල ශෛලපර්වතයන් ගර්ජනය කරවමින් දෙවියන් සහිත ලොකයා සොම්නස් කරවමින් මම ලෙව්හි බුදු වෙමි.

68. ලෙව්හි ඒ ඒ දිගට ගමන් කරන්නහුට කෙළවරක් දැක ගත නොහැකි දිසා දසයකි. ඒ ඒ දිශාවෙහි ද බුද්ධක්‍ෂෙත්‍රයෝ අනන්ත වෙති.

69. ඒ සක්විතිරජවූ කල්හි චක්‍රරත්නාදීන්ගේ ආලොකය රැස් විහිදුවමින් ප්‍රකට වි ය. මේ දස දහසක් සක්වළ අතුරෙහි රැස්සමූහය ද ආලොකය ද අධික වි ය.

70. මෙපමණ වූ ලොකධාතුන්හි සියලු දෙන මා දකිත්වා! එසේ ම සියළු දෙන සතුටු සිත් ඇත්තෝ වෙත්වා! බඹලොව දක්වා වූ හැම දෙනම මා අනුගමනය කෙරෙත්වා!

71. විසිද වූ මධුරනාදයෙන් අමා බෙරය ගැසීමි. (=දම් දෙසීමි) මේ දස දහසක් සක්වල ඇතුළත සියලු ජනයෝ මිහිරි නාදය අසත්වා!

72. දහම්වැසි වස්නා කල්හි සියල්ලෝ ආශ්‍රවරහිතයෝ (=රහත්හු) වෙත්වා! මේ ජනයා අතුරෙහි යමෙක් පශ්චිමක (=අඩු ගුණ ඇත්තෝ) වෙත් නම්, ඔහු සෝවාන් වෙත්වා!

73. දිය යුතු දන් දී නිරවශෙෂයෙන් සිල් පුරා නෛෂ්ක්‍රම්‍යපාරමීකොටි ප්‍රාප්ත ව සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

74. නැණවතුන් විචාරා උතුම් වීර්‍ය්‍යය කොට ඉවසීමේ කෙළවරට ම ගොස් ක්‍ෂාන්තිපාරමිතාව පුරා බුදුබවට පැමිණියෙමි.

75. දැඩ අධිෂ්ඨානය කොට සත්‍යපාරමිතාව හා මෛත්‍රීපාරමිතාව පුරා සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

76. ලාභ ය, අලාභ ය, සැප ය, දුක ය, සම්මාන ය, අවමාන ය යන මේ සියලු තන්හි සමසිත් ඇත්තේ උපෙක්‍ෂා පාරමිතාව පුරා බුදුබවට පැමිණියෙමි.

77. කොසජ්ජං භයතො දිස්වා විරියඤ්චාපි[1] ඛෙමතො,
ආරද්ධවිරියා හොථ එසා බුද්ධානුසාසනී.

78. විවාදං භයතො දිස්වා අවිවාදඤ්ච ඛෙමතො,
සමග්ගා සඛිලා හොථ එසා බුද්ධානුසාසනී.

79. පමාදං භයතො දිස්වා අප්පමාදං ච ඛෙමතො,
භාවෙථ'ට්ඨඞ්ගිකං මග්ගං එසා බුද්ධානුසාසනී.

80. සමාගතා බහූ බුද්ධා අරහන්තා ච සබ්බසො,
සම්බුද්ධෙ අරහන්තෙ ච වන්දමානා නමස්සථ,

81. එවං අචින්තියා බුද්ධා බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං විපාකො හොති අචින්තියො.

ඉත්ථං සුදං භගවා අත්තනො බුද්ධචරියං[2] සම්භාවයමානො බුද්ධාපදානියං නාම ධම්මපරියායං අභාසිත්ථාති.

**බුද්ධාපදානං සමත්තං.**

---

# 2

# පච්චෙක බුද්ධාපදානං

---

අථ පච්චෙකබුද්ධාපදානං සුණාථ -

82. තථාගතං ජෙතවනෙ වසන්තං අපුච්ඡි **වෙදෙහමුනී** නතඞ්ගො,
"පච්චෙකබුද්ධා කිර නාම හොන්ති, භවන්ති තෙ හෙතුභි කෙහි වීර."

83. තදා'හ සබ්බඤ්ඤුවරො මහෙසී **ආනන්දභද්දං** මධුරස්සරෙන,
යෙ පුබ්බබුද්ධෙසු[3] කතාධිකාරා අලද්ධමොක්ඛා ජිනසාසනෙසු.

84. තෙනෙව සංවෙගමුඛෙන ධීරා විනාපි බුද්ධෙහි සුතික්ඛපඤ්ඤා,
ආරම්මණෙනාපි පරිත්තකෙන පච්චෙකබොධිං අනුපාපුණන්ති.

85. සබ්බම්හි ලොකම්හි මමං ඨපෙත්වා පච්චෙකබුද්ධෙහි සමො'ව නත්ථි,
තෙසං ඉමං වණ්ණපදෙසමත්තං වක්ඛාමහං සාධු මහාමුනීනං.

86. සයමෙව බුද්ධානං මහාඉසීනං[4] සාධූනි වාක්‍යානි මධුංව [5]ඛුද්දං,
අනුත්තරං භෙසජං පත්ථයන්තා සුණාථ සබ්බෙසු පසන්නචිත්තා.

87. පච්චෙකබුද්ධානං සමාගතානං[6] පරම්පරව්‍යාකරණානි යානි,
ආදීනවො යඤ්ච විරාගවත්ථුං යථා ච බොධිං අනුපාපුණිංසු.

---

1. අකොසජ්ජං ච. සෙ. 2 බුද්ධචරිතං. ම. 3. සබ්බබුද්ධෙසු. P T S. ම. සෙ.
4. මහෙසීනං. ම. 5. මධුඤ්ච. P T S. මධුව ම. 6. සහගතානං. ම.

77. කුසීත බව භය වශයෙන් ද වීර්‍ය්‍යය ක්‍ෂෙම (ආරක්‍ෂා ස්ථානය) වශයෙන් ද **දැක** පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තෝ වවු. මෙය බුද්ධානුශාසනයයි.

78. විවාදය භය වශයෙන් ද අවිවාදය ක්‍ෂෙමවශයෙන් ද දැක සමගි ව සිලිටු මෘදුගුණ ඇත්තෝ වවු. මෙය බුද්ධානු ශාසනය යි.

79. ප්‍රමාදය භයවශයෙන් ද අප්‍රමාදය ක්‍ෂෙමවශයෙන් ද දැක අරි අටඟිමග වඩවු. මෙය බුද්ධානුශාසනය යි.

80. නොයෙක් සිය දහස් ගණින් පසේබුදුවරු ද රහත්හු ද රැස් වූහ. ඒ බුදුවරයන් ද රහතුන් ද වඳිමින් නමස්කාර කරවු.

81. මෙසේ බුදුවරයෝ චින්තාවිෂයාතික්‍රාන්තයහ. බුද්ධදෙශිතධර්මය ද චින්තාවිෂයාතික්‍රාන්තය. චින්තාවිෂයාතික්‍රාන්ත වූ බුදුන් කෙරෙහි ද ධර්මය කෙරෙහි ද පහන් වූවන්ට ලැබෙන විපාකය ද චින්තාවිෂයාතික්‍රාන්ත වේ, හෙවත් සිතා අවසන් කළ නොහැකි වේ.

මෙසේ බුදුරජානන් වහන්සේ තමන්වහන්සේගේ බුද්ධචරිතය පවසන සේක් බුද්ධාපදානය නම් වූ ධර්මපර්‍ය්‍යායය වදාළසේක.

**බුද්ධාපදානය සමාප්ත යි.**

---

# 2
# පච්චෙකබුද්ධාපදානය

---

අනතුරු ව පච්චෙකබුද්ධාපදානය අසවු:-

82. (වැඳුම පිණිස) නැමුනු සිරුරු ඇති **වෙදෙහිපුත්‍ර** (ආනන්ද ස්ථවිර) තෙමේ **දෙව්රම්** වෙහෙරෙහි වැඩවසන්නා වූ බුදුරජානන් වහන්සේ ගෙන් "වීරයන් වහන්ස පසේබුදුවරු ලොව පහළ වෙත්. ඒ බුදුවරු කිනම් හේතුවකින් පහළ වෙත් ද ?" යි නැමදුම් පෙරටු ව විචාළේ ය.

83-84. එකල්හි මහර්ෂි වූ සර්වඥ බුදුරජානන් වහන්සේ භද්‍ර වූ **ආනන්ද**ස්ථවිරයන් වහන්සේට "පෙර බුදුවරයන් වෙත කරණලද පුණ්‍යසම්භාර ඇති ඒ බුදුසසුන්හි නො ලබන ලද නිවන් ඇති ඉතා සියුම් නුවණින් යුත් ඒ ප්‍රාඥයෝ එ ම සංවෙගය ම මුල් කොට බුදු-වරුන්ගේ අවවාදනුශාසනාවන් රහිත ව ස්වල්පමාත්‍ර වූ ද අරමුණක් හෙතු කොට ගෙණ පසේබුදුබවට පැමිණෙත් ය" යි මධුරස්වරයෙන් වදාළසේක.

85. සකල ලොකයෙහි (සර්වඥබුද්ධ වූ) මා හැර පසේ බුදුවරයන් සමාන වූ අනිකෙක් නැත්මය. ඒ පසේබුදුවරයන්ගේ ගුණයන් පිළිබඳ කොටසක් පමණක් මම (දැන් තොපට) මැනවින් දෙශනා කරමි.

86. පරොපදෙශරහිත ව තමන් ම අවබෝධ කරගත් පසේබුදු-වරයන්ගේ මිහිරි වූ උදානවාක්‍යයෝ දඹුවෙල් බෑ මීවදයක් මෙන් මිහිරි වෙති. අනුත්තර වූ නිර්වාණ සඞ්ඛ්‍යාත ඖෂධය පතන (තෙපි) සියල්ලෝ ම මනා කොට පහන් වූ සිත් ඇත්තෝ (එය) අසවු.

87. එහි රැස් වූ පසේබුදුබවට පත් උතුමන් පිළිවෙළින් කළ යම් යම් ප්‍රකාශයෝ වෙත් නම්, කාමයන් පිළිබඳ ආදීනව ද නො ඇලීමේ කරුණු ද උන්වහන්සේලා ප්‍රත්‍යෙක සම්බොධියට පත් වූ පරිදි ද, (පවසන ඒ ප්‍රකාශයන්) අසවු.

88. සංරාගවත්ථුසු[1] විරාගසඤ්ඤී රත්තම්හි ලොකම්හි විරත්තචිත්තා,
හිත්වා පපඤ්චෙ[2] විජිය ඵන්දිතානි[3] තථෙව[4] බොධිං අනුපාපුණිංසු.

89. සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං,
මෙත්තෙන චිත්තෙන හිතානුකම්පී එකො චරෙ ඛග්ගවිසාණකප්පො.*

90. සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං,
න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

91. සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,
ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

92. මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථං පටිබද්ධචිත්තො,
එතං භයං සන්ථවෙ පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

93. වංසො විසාලොව යථා විසත්තො පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා,
වංසකළීරොව අසජ්ජමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

94. මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො. යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය,
විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

95. ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච[5] ඨානෙ ගමනෙ චාරිකාය,
අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

96. ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ පුත්තෙසු පෙමං විපුලඤ්ච හොති,
පියවිප්පයොගං[6] විජිගුච්ඡමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

97. චාතුද්දිසො අප්පටිඝො ච හොති සන්තුස්සමානො ඉතරීතරෙන,
පරිස්සයානං සහිතා අඡම්භී එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

---

1. සරාගවත්ථුසු- ම. සෙ. 2 පපඤ්චං. PTS සෙ. 3. ජිත ඵන්දිතානි. PTS.
4. තත්ථෙව. PTS
* අයං ගාථා මරම්මපොත්ථකෙ ච සුත්තනිපාතෙ ච න දිස්සති
5. වාසෙ මු අ. 6. පියබබියොගං. ම.

88. ඇලුම් කට යුතු දෑයෙහි නො ඇලෙන හැඟීම් ඇත්තාහු- ඇලුම් කට යුතු ලොකයෙහි නො ඇලුනු අදහස් ඇත්තාහු රාගාදි කෙලෙස් නසා දෘෂ්ටිවලනයන් දිනා එසේ ම ප්‍රත්‍යෙක බුද්ධත්‍වයට පිළිවෙළින් පැමිණියාහු ය.

89. සියලු සත්‍ත්‍වයන් කෙරෙහි කිසි දඬුවමක් (කායාදි ද්වාරත්‍රයයෙන් කරණ වරදක් නොහොත් පහර දීමක්) නො කර ඒ සත්‍වයන් අතුරෙන් කිසිවකුට හිංසා ද නො කරන්නේ මෙත් සිතින් යුතු ව හිතානුකම්පා ඇතිව ඒ පසේබුදුරජතෙම කගවෙහෙණකුගේ අඟ මෙන් තනි ව හැසිරෙන්නේ ය.

90. සියලු සත්‍ත්‍වයන් කෙරෙහි කිසි දඬුවමක් (කායාදි ද්වාරත්‍රයයෙන් කරණ වරදක් නොහොත් පහර දීමක්) නො කර කිසි දු කෙනෙකුට හිංසා ද නො කරන්නේ පුත්‍රයා ගැණ පවා බලාපොරොත්තුවක් නැත්තේය. සහායයන් ගැණ කියනු ම කිම ? (ඒ පසේ බුදු තෙමේ) කගවෙහෙණකුගේ අඟ මෙන් තනි ව හැසිරෙන්නේ ය.

91. හටගත් සංසර්ග ඇත්තහුට (ඒ හෙතුවෙන්) ස්නේහය ඇති වේ. ඒ ස්නේහය අනු ව යන්නාවූ මේ දුක ඇති වේ. ස්නේහයෙන් හටගත්තා වූ දෙස් දකින්නේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව හැසිරෙන්නේ ය.

92. සුහද මිතුරන්ට අනුකම්පා කරන්නේ මිත්‍රයා හා පිළිබඳ සිත් ඇතිබව හේතු කොට ගෙණ තමාගේ දෙලෝ අභිවෘද්ධිය පිරිහෙළා ගණී. සන්‍ථවයෙහි ඇති මේ භය දක්නේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

93. යම්සේ එකට ගෙතුනා වූ විශාල හුණපඳුරක් මෙන් පුත්‍රදාරාවන් කෙරෙහි යම් ස්නේහයක් වී නම්, (එය ඒ ඒ වස්තූන් හෝ අය ගොතා ගෙණ සිටී. එහි ආදීනව දක්නේ) හුණකිළිලක් මෙන් නො ඇලෙන්නේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

94. යම් සේ තිත්මුවා උයනෙහි රැහැන්ආදියකින් නො බඳනා ලද්දේ කැමැති කැමැති තැනකට ගොදුරු පිණිස යේ ද, නුවණැති මනුෂ්‍ය තෙමේ සෙරි බව ද එසේ ම දක්නේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

95. මිතුරන් මැද සිටින විට සයනයෙහි ද සිටීමෙහි ද ගමනෙහි ද චාරිකාවෙහි ද ('පින්වත, මෙහි එන්න. මාගේ බස් අසන්න. මෙය දෙන්න' යනාදි වශයෙන්) ඇමතීම් ඇති වේ. (නිහීන පුරුෂයන් විසින්) නො පතන්ලද (ප්‍රව්‍රජ්‍යා සඞ්ඛ්‍යාත) සෙවරිභාවයෙහි අනුසස් දක්නේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

96. මිතුරන් අතර සිටිනවිට (කායික වාචසික) ක්‍රීඩාවෝ ද, පඤ්ච-කාමගුණිකරාගයෝ ද වෙති. එසේ ම පුත්‍රයන් කෙරෙහි ප්‍රෙමය ද අධික වේ. එහි ඇතිවන ප්‍රියවිප්‍රයෝගය පිළිකුල් කරණුයේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

97 ලද දෙයින් සතුටු වන තැනැත්තේ ගැටුම් නැති ව හැසිරිය හැකි සිවු දිග ඇත්තේ නොහොත් සිව්දිගෙහි පැතිරවූ මෙත්සිත් ඇත්තේ කිසිවකු හා නො ගැටෙන්නේ වේ. (සිංහාදීන්ගෙන් හා කාමච්ඡන්‍දයෙන් ද වූ) කායචිත්ත උපද්‍රවයන් ඉවසන සුලු ව ලොමුදහගැණීම් නැත්තේ කගවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

98. දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ අථො ගහට්ඨා ඝරමාවසන්තා,
අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

99. ඔරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි සංසීනපත්තො[1] යථා කොවිළාරො,
ඡෙත්වාන වීරො[2] ගිහිබන්ධනානි එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

100. සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිංචරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

101. නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිංචරං සාධුවිහාරි ධීරං
රාජාව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ග 'රඤ්ඤෙ'ව නාගො[3].

102. අද්ධා පසංසාම සහායසම්පදං සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා,
එතෙ අලද්ධා අනවජ්ජභොජී එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

103. දිස්වා සුවණ්ණස්ස පභස්සරානි කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි,
සංඝට්ටමානානි දුවෙ භුජස්මිං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

104 එවං දුතියෙන සහා මම'ස්ස වාචාභිලාපො අභිසජ්ජනා ව,
එතං භයං ආයතිං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

105. කාමා හි චිත්‍රා මධුරා මනොරමා විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

106. ඊතී ච ගණ්ඩො ච උපද්දවො ච රොගො ච සල්ලඤ්ච භයඤ්චමෙතං,
එතං භයං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

107. සීතඤ්ච උණ්හඤ්ච ඛුදං පිපාසං වාතාතපෙ ඩංසසිරිංසපෙ ච,
සබ්බානි පෙ'තානි අභිබ්භවිත්වා[4] එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

1. සංසීනපත්තො. මු අ. 2. ධීරො. සෙ. 3. ඛග්ගවිසාණකප්පො. සු නි.
4. අභිසම්භවිත්වා. සු නි

98. ඇතැම් පැවිද්දෝ ද යළි ගිහිගෙයි වසන ගෘහස්ථයෝ ද සඞ්ග්‍රහ කිරීමෙන් තෘප්ත කළ නො හැක්කෝ වෙත්. (ඒ ගතියට පිළිකුල් කරන්නේ) අන්‍යපුත්‍රයන් කෙරෙහි කළකිරුණේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

99. කොළ වැටුනු කොබෝලීලගසක් මෙන් (මාගී) වීර්යයෙන් යුත් පුද්ගලතෙමේ (කෙස් රැවුල් ආදි) ගිහි ලකුණු හැරදමා කාමාදි ගිහිබැඳුම් සිඳ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

100. ධෛර්යවත් වූ (අර්පණා-උපචාර-සමාධීන්හි යෙදීම් වශයෙන්) යහපත් විහරණ ඇති සමග හැසිරෙන්නා වූ ස්ථානොචිතප්‍රාඥමිත්‍රයකු ඉදින් ලැබේ නම්, සියලු කරදර මැඩ සිහියෙන් යුතු ව ඔහු සමග සතුටු ව හැසිරෙන්නේ ය.

101. ධෛර්යවත් වූ යහපත් විහරණ ඇති සමග හැසිරෙන්නා වූ ප්‍රාඥමිත්‍රයකු ඉදින් නො ලැබේ නම්, යම් සේ රජතෙමේ ජයගත් රට (උවදුරු සහිත ය යි සිතා) හරණේ ද, එසේ ම මහ අරන්හි ඇත් රජකු මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

102. ඒකාන්තයෙන් මිත්‍රසම්පත්තියට පසසමු. තමාට වඩා ගුණධර්ම යන්ගෙන් ශ්‍රේෂ්ඨ වූවෝ ද සම වූවෝ ද සෙවනය කටයුතු මිත්‍රයෝ වෙති. නිවරදබොජුන් ඇත්තේ මෙබඳු මිතුරන් නො ලැබ (කුහන ලප නාදියෙන් උපදවාගත් ආහාරයෙන් නොයැපෙන බැවින්) කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

103. රන්කරුවකු විසින් මැනවින් නිමා කළ දීප්තිමත් රන්වළලු (එක්තැන් වූ කල) දෑතෙහි ගැටෙන අයුරු ද (එසේ එක්තැන් නො වී වෙන ම පවත්නා කල නො ගැටී ශබ්දවිරහිත ව පවත්නා අයුරු ද) දැක කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

104. මෙසේ දෙවැන්නකු සමග සල්ලාපයෙහි යෙදීම ද ඇලීම ද යන දෙක ම මතු (ඇති වන අධිගමයට අන්තරාය කර ය යි) මේ භය දක්නේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

105. වස්තුකාමක්ලේශකාමයෝ විචිත්‍රයහ. මධුරයහ. සිත් අලවන සුල්ලහ. විවිධ ස්වභාව ඇති රූපයන්ගෙන් සිත කලඹත්. කාමගුණයන්හි ඇති මේ ආදීනව දැක කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

106. පඤ්චකාමය නොයෙක් ව්‍යසන එළවන්නකි. ක්ලේශාශුචි වැගිරෙන බැවින් ගඩෙකි. (අවැඩ සිදුකරණ බැවින්) උවදුරකි. (නීරොග බව පැහැරගන්නා බැවින්) රොගයකි (හදවත විදින බැවින්) උලකි. (දෙලොව භය උපදවන බැවින්) බියකි. කාමගුණයන්හි ඇති මේ බිය දැක කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

107. සීතය ද උෂ්ණය ද බඩගින්න ද පවස ද අව් සුළං දෙක ද ඩැහැ ලෙහෙ බොන මැස්සන් හා සර්පයන් ද යන මේ සියල්ල මැඩ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

108. නාගොව යූථානි විවජ්ජයිත්වා සඤ්ජාතඛන්ධො පදුමී උළාරො,
යථාභිරන්තං* විහරං[1] අරඤ්ඤෙ එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

109. අට්ඨාන තං සඞ්ගණිකාරතස්ස යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං,
ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

110. දිට්ඨීවිසූකානි උපාතිවත්තො පත්තො නියාමං පටිලද්ධමග්ගො,
උප්පන්නඤාණො'ම්හි අනඤ්ඤනෙය්‍යො එකො චරෙ
ඛග්ගවිසාණකප්පො.

111. නිල්ලොලුපො නික්කුහො නිප්පිපාසො නිම්මක්ඛ-[2]
නිද්ධන්තකසාවමොහො,
නිරාසයො[3] සබ්බලොකෙ භවිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

112. පාපං සහායං පරිවජ්ජයෙථ අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං,
සයං[4] න සෙවෙ පසුතං පමත්තං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

113. බහුස්සුතං ධම්මධරං භජෙථ මිත්තං උළාරං පටිභාණවන්තං,
අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

114. ඛිඩ්ඩං රතිං කාමසුඛඤ්ච ලොකෙ අනලඞ්කරිත්වා අනපෙක්ඛමානො,
විභූසනට්ඨානා විරතො සච්චවාදී එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

115. පුත්තඤ්ච දාරං පිතරඤ්ච මාතරං ධනානි ධඤ්ඤානි ච බන්ධවානි,
හිත්වාන කාමානි යථොධිකානි[5] එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

116. සඞ්ගො එසො පරිත්තං එත්ථ සොඛ්‍යං අප්පස්සාදො
දුක්ඛමෙවෙත්ථ භීයො,
ගාහො[6] එසො ඉති ඤත්වා මතිමා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

117. සන්දාලයිත්වාන සංයොජනානි ජාලං 'ව භෙත්වා[7] සලිලම්බුචාරී,
අග්ගීව දඩ්ඪං අනිවත්තමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

118. ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො,
අනවස්සුතො අපරිඩය්හමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

---

* යථාභිරන්තං?

1. විහරෙ. සු නි. 2. නිම්මක්ඛො. සෙ. PTS සු නි 3. නිරාසංසො. ම. සෙ.
4. පස්සං. සෙ. 5. යතොධිකානි. සෙ.
6. ගාළ්හො. ම. කණ්ඩො. PTS. ඛණ්ඩො. සෙ. ගලො. සු නි
7. හිත්වා. ම. සෙ. ජාලං පභිත්වා. PTS.

108. මැනවින් හටගත් ග්‍රීවා ඇති ගෝමර ඇත්තා වූ උදාර වූ ඇත් රජෙක් හස්ති සමූහයා හැර දමා කැමැති තාක් කල් අරණෙහි වෙසේ ද, එමෙන් කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

109. යමක් හේතු කොට ගෙණ ලෞකික සමාපත්තියට පැමිණේ නම්, ගණසඞ්ගණිකාවෙහි ඇලුනහුට ඒ සමාපත්තිය සිදු නො වේ. පසේ බුදු-රජානන් වහන්සේගේ මේ වචනය අසා කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

110. මිසදිටු නමැති හුල් ඉක්මවූයේ ගති නියත බවට පැමිණියේ ලබන ලද සෙසු මාර්ග ද ඇත්තේ අනිකෙකුගේ මාර්ගෝපදේශකත්වයක් නො මැති ව ලබනලද ප්‍රත්‍යෙකබොධිඥානය ඇත්තේ වෙම් ද, එහෙයින් කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

111. ලොල් නො වූයේ කුහක නො වූයේ රසතෘෂ්ණා රහිත වූයේ ගුණමකු නො වූයේ නසනලද රාගාදි කසට හා මොහ ඇත්තේ තුන්-ලොව මැඩගෙණ සිටින තෘෂ්ණාවෙන් තොර වූයේ ව කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

112. අවැඩ දක්නාසුලු වූ කායදුශ්චරිතාදියෙහි යෙදෙන පවිටු මිතුරන් දුරු කරන්නේ ය. ඒ ඒ තන්හි ඇලුනා වූ ප්‍රමාදයෙන් යුත් එබඳු මිතුරන් තෙමේ නො සෙව්නේ ය. කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

113. බහුශ්‍රැත වූ පැමිණි අධිගම ඇති වැටහෙනපැණැති උසස් මිතුරකු භජනය කරන්නේ ය. මෙලෝ පරලෝ වැඩ දැන සැක දුරු කොට සිටියේ කඟවෙහෙණකුගේ අඟ මෙන් තනි ව හැසිරෙන්නේ ය.

114. ලෙව්හි ක්‍රීඩාව ද රතිය ද කාමසුඛය ද නො සලකා හැර එහි අපෙක්ෂා නැත්තේ සිරුර සැරසීමෙන් ද තොර වූයේ සත්‍යවාදී වූයේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

115. තමතමනට අයත් අඹුදරුවන් ද දෙමාපියන් ද අධික ලෙසින් වූ ධනධාන්‍ය ද බන්ධූන් ද යන මේ කාමවස්තූන් හැර දමා කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාව ම හැසිරෙන්නේ ය.

116. “මේ පස්කම් සුවය ඇලෙන තැනකි. මෙහි ඇති සැපත ද ස්වල්ප ය. මෙහි ආස්වාදය ටික ය. දුක ම වැඩි ය. නුවණැත්තේ මෙය මත්ස්‍යයන් බඳින්නා වූ බිලියක් මෙනැ”යි සලකා කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

117. දැල පළාගෙණ ගිය මත්ස්‍යයකු මෙන් සංයෝජනයන් සිඳ, දැවීගිය තැන නො නැවතෙන ගින්න යම්සේ ද, එසේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

118. යටට හෙලන ලද බැලුම් ඇත්තේ ගණසඞ්ගණිකාවෙහි ඇලීම සඳහා පිරිස් මැදට යාමෙහි ලොල්බව නැත්තේ රක්නා ලද පසිඳුරන් ඇත්තේ රැකගත් සිත ඇත්තේ අරමුණු විෂයෙහි කෙලෙස් වැගිරෙණ ගතියෙන් තොර වූයේ කෙලෙස්ගින්නෙන් නො දැවෙන්නේ කඟවෙහෙණ-කුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

119. ඔහාරයිත්වා [1] ගිහිබ්‍යඤ්ජනානි සංඡින්නපත්තො යථා පාරිජත්තො,
කාසායවත්ථො අභිනික්ඛමිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

120. රසෙසු ගෙධං අකරං අලොලො අනඤ්ඤපොසී සපදානචාරී,
කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

121. පහාය පඤ්චාවරණානි චෙතසො උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ;
අනිස්සිතො ඡෙජ්ජ සිනෙහදොසං [2] එකො චරෙ ඛග්ගවිසාණකප්පො

122. විපිට්ඨිකත්වාන සුඛං ච දුක්ඛං [3] පුබ්බෙව ච සොමන-දොමනස්සං [4],
ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

123 ආරද්ධවිරියො [5] පරමත්ථපත්තියා අලීනචිත්තො අකුසීතවුත්ති,
දළ්හනික්කමො ථාමබලූපපන්නො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

124. පටිසල්ලානං [6] ඣානමරිඤ්චමානො [7] ධම්මෙසු නිච්චං අනුධම්මචාරී,
ආදීනවං සම්මසිතා භවෙසු එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

125. තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො අනෙලමූගො සුතවා සතීමා,
සඞ්ඛාතධම්මො නියතො පධානවා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

126. සීහොව සද්දෙසු අසන්තසන්තො වාතොව ජාලම්හි අසජ්ජමානො,
පදුමංව තොයෙන අලිප්පමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

127. සීහො යථා දාඨබලී පසය්හ රාජා මිගානං අභිභුය්‍යචාරී,
සෙවෙථ පන්තානි සෙනාසනානි එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

128. මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතඤ්ච කාලෙ,
සබ්බෙන ලොකෙන 'විරුජ්ඣමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො

129. රාගඤ්ච දොසඤ්ච පහාය මොහං සන්දාලයිත්වාන සංයොජනානි,
අසන්තසං ජීවිතසඞ්ඛයම්හි එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

1. ඔහාපයිත්වා. ම. 2. ඡෙත්වා ස්නෙහපදොසං· PTS. 3. දුක්ඛං ච. PTS.
4. සොමනස්ස- PTS. සෙ. සු නි. 5. ආරබ්ධවිරො. ම.
6. පටිසල්ලීන ම. පටිසල්ලාන. PTS. 7. ඣානපරිච්චමානො. ම.

119. කොළ හැලුනු පරසතුරුකක් මෙන් ගිහිසලකුණු හැරදමා කසාවත් හැඳගත්තේ ගිහිගෙන් නික්ම කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

120. ලොල් නො වූයේ රසයෙහි ගිජුබවක් නැත්තේ පොෂණය කළ යුතු අනිකෙකු නැත්තේ ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩිනේ ක්‍ෂත්‍රිය කුලාදි යම් කිසි තැනක කෙලෙස්වසයෙන් නො ඇලුනු සිත් ඇත්තේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

121. පඤ්චනීවරණයන් සිතින් ම හැරදමා සියලු කෙලෙසුන් දුරු කොට දෘෂ්ටිනිශ්‍රිත නො වූයේ කාමරාගසඞ්ඛ්‍යාත තෘෂ්ණාදෙෂය සිඳ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

122. (ප්‍රථමධ්‍යානොපචාරයෙහි දී ම දුක ද තෘතීයධ්‍යානොපචාර-යෙහි දී ම සුඛය ද හරණ බැවින්) පළමු කොට ම සැප ද දුක ද ගැණ නො බලා එසේ ම සොම්නස් දොම්නස් දෙක ද හැර (පඤ්චනීවරණයන් ගෙන් හා විතර්ක විචාර ප්‍රීති සුඛයන්ගෙන්) පිරිසිදු වූ උපෙක්‍ෂාවෙන් යුත් (චතුර්ත්‍ථධ්‍යාන) සමථය ලබා කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

123. නිවණට පැමිණීම සඳහා ඇරඹූ වීර්‍ය්‍යය ඇත්තේ නො ම හැකුළුනු සිත් ඇත්තේ කුසීත පැවැත්මෙන් තොර වූයේ වීර්‍ය්‍යයෙන් ප්‍රතිපක්‍ෂ කෙලෙසුන් කෙරෙන් ඉවත් වූයේ (මාර්ගක්‍ෂණයෙහි) ස්ථිර කාය ශක්තියෙන් හා ඥානශක්තියෙන් ද යුක්ත වූයේ කඟවෙහෙණකුගේ අඟ මෙන් තනි ව හැසිරෙන්නේ ය.

124. කායවිවෙක චිත්තවිවෙක දෙක සිස් නො කරණුයේ නිරතුරු ධර්මයනට අනු ව හැසිරෙන්නේ ත්‍රිවිධ භවයෙහි ආදීනව මෙනෙහි කරන්නේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

125. අප්‍රමාද වූයේ නිවණ පතනුයේ කෙළතොලු නො වූයේ බහුශ්‍රැත වූයේ සිහි ඇත්තේ අවබොධ කරගන්නා ලද ධර්මය ඇත්තේ (ආය්‍ර්‍යමාර්ග යෙන්) ගතිනියත වූයේ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ කඟවෙ-හෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

126. ශබ්දයන් විෂයයෙහි තැති ගැණීමකට පත් නො වන සිංහයකු මෙන් ද, දැලක නො බැඳෙන වාතය මෙන් ද, දිය නො තැවරෙණ පියුම් පතක් මෙන් ද වූයේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

127. දැඩාබලය ඇති මෘගයන් බලාත්කාරකමින් මැඩපවත්වා හැසිරෙණ සුලු කෙශර සිංහයෙකු මෙන් (ගම්න්) දුරු වූ සෙනසුන් සෙවුනේ ය. කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

128. ප්‍රත්‍යනීක කෙලශයන්ගෙන් මිදුනා වූ මෛත්‍රිය ද, උපෙක්‍ෂාව ද කරුණාව ද, මුදිතාව ද ඒ ඒ සුදුසු කල්හි සෙවුනේ සකල ලෝකවාසී සත්ත්වයන් සමග විරුද්ධ නො වන්නේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

129. රාග ද්වෙෂ මොහයන් හැර (මාර්ගයෙන්) දශසංයොජනයන් සිඳ මරණසන්තාසයෙහි තැති නො ගන්නේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

130. භජන්ති සෙවන්ති ච කාරණත්ථා නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා,
අත්තත්ථපඤ්ඤා අසුචී මනුස්සා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

131. විසුද්ධසීලා සුවිසුද්ධපඤ්ඤා සමාහිතා ජාගරියානුයුත්තා,
විපස්සකා ධම්මවිසෙසදස්සී මග්ගඞ්ගබොජ්ඣඞ්ගගතෙ විජඤ්ඤා.

132 සුඤ්ඤතප්පණිහිතඤ්චානිමිත්තං[1] ආසෙවයිත්වා ජිනසාසනම්හි,
යෙ සාවකත්තං න වජන්ති ධීරා භවන්ති පච්චෙකජිනා සයම්භූ.

133. මහන්තධම්මා බහුධම්මකායා චිත්තිස්සරා සබ්බදුක්ඛොඝතිණ්ණා,
උදග්ගචිත්තා පරමත්ථදස්සී සීහොපමා ඛග්ගවිසාණකප්පා.

134. සන්තින්ද්‍රියා සන්තමනා සමාධි පච්චන්තගම්භීරමතප්පචාරා[2]
දීපා පරත්ථං ඉධ විජ්ජලන්තා පච්චෙකබුද්ධා සතතච්චිතා'මෙ.[3]

135 පහීනසබ්බාවරණා ජනින්දා ලොකප්පදීපා ඝනකඤ්චනාභා,
නිස්සංසයං ලොකසුදක්ඛිණෙය්‍යා පච්චෙකබුද්ධා සතතච්චිතා'මෙ.[4]

136. පච්චෙකබුද්ධානං සුභාසිතානි චරන්ති ලොකම්හි සදෙවකම්හි,
සුත්වා තථා යෙ න කරොන්ති බාලා චරන්ති දුක්ඛෙසු පුනප්පුනං තෙ.

137. පච්චෙකබුද්ධානං සුභාසිතානි මධුං යථා ඛුද්දමවස්සවන්තං[5]
සුත්වා තථා යෙ පටිපත්තියුත්තා භවන්ති තෙ සච්චදසා සපඤ්ඤා.

138. පච්චෙකබුද්ධෙහි ජිනෙහි වුත්තා[6] ගාථා[7] උළාරා අභිනික්ඛමිත්වා,
තා සක්‍යසීහෙන නරුත්තමෙන පකාසිතා ධම්මවිජානනත්ථං.

139. ලොකානුකම්පාය ඉමානි තෙසං පච්චෙකබුද්ධාන විකුබ්බිතානි,
සංවෙගා'සඞ්ගමති[8] මතිවඩ්ඪනත්ථං සයම්භුසීහෙන පකාසිතානි.

**පච්චෙක බුද්ධාපදානං සමත්තං.**

---

1. පඤ්ඤප්පණීධිඤ්ච තථානිමිත්තං. P T S. සුඤ්ඤප්පනිධිං-ම.
2. පච්චන්ත සත්තෙසු සතිප්පචාරා. P T S. සෙ. 3. සතතං හිතා මෙ. ම. P T S. සෙ.
4. සතතං හිතා මෙ ම සෙ. 5. ඛුද්දමිව P T S. 6. භාසිතා. ම.
7. ඝාථා. ම. සෙ. 8. සංවෙගසඞ්ගං. මති. මු. අ.

130. මිත්‍රයෝ කිසියම් ලාභයක් සඳහා ම යම් යම් අය භජනය ද සෙවනය ද කෙරෙත්. එසේ ලාභාපේක්‍ෂාවක් නො මැති ව භජනය කරණ මිත්‍රයෝ මෙකල දුර්ලභ වෙති. මිනිස්සු ආත්මාර්ථකාමී කල්පනාවන් ගෙන් හා අපිරිසිදු කායවාඞ්මනඃ කර්මයන්ගෙන් යුක්ත වූවාහු ය. (එබැවින්) කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලා ව ම හැසිරෙන්නේ ය.

131. වෙසෙසින් පිරිසිදු සිල් ඇති එසේ ම අතිපරිශුද්ධ ප්‍රඥාව ද ඇති එකඟ සිත් ඇති නිදි වැරීමෙහි යෙදුනා වූ විදර්ශක වූ (දශකුශල චතුසත්‍ය නවලොකොත්තර) ධර්මයන් වෙසෙසින් දක්නාසුලු වූ මාර්ගාඞ්ග බොධ්‍යඞ්ගයන් හා එක් ව යෙදුනා වූ ආර්‍යධර්මයන් විශෙෂයෙන් දන්නාවූ,

132. සුඤ්ඤත අප්පණිහිත අනිමිත්ත සඞ්ඛ්‍යාත විමොක්‍ෂයන් වඩා ඒ ප්‍රාඥයෝ සර්‍වඥශාසනයෙහි ශ්‍රාවක බවට නො පැමිණෙද්ද ඔහු පරොපදෙශ රහිත ව තුමූ ම (චතුසත්‍යය) අවබොධ කරගත් පසේබුදුවරයෝ වෙත්.

133. පුරණලද මහත් බොධිසම්භාරධර්ම ඇති බොහෝ වූ ධර්මකාය සම්පත් ඇති සිතට අධිපති වූ සකල සංසාරඕඝය තරණය කළා වූ සොම්නස් සිත් ඇති පරමාර්ථ ධර්මයන් දක්නාසුලු වූ සිංහයන් වැනි වූවෝ ද කඟවෙහෙණකුගේ අඟ වැනි වෙති.

134. සන්හුන් ඉඳුරන් ඇති සන්සුන් සිත් ඇති තමා තුළ ම ගැඹුරු වූ ප්‍රඥාවගේ පැතිරීම් ඇති (අනුන් ලවා චතුසත්‍ය ධර්මාවබොධය කරවිය නො හැකි) (අන්‍යයන්ට) ප්‍රතිෂ්ඨාධාර වූ මෙ ලොව අන්‍යයන් පිණිස බබලන්නා වූ මේ පසේබුදුවරයෝ හැමකල්හි ම පුදන ලද්දෝ වෙත්.

135. ජනෙන්ද්‍ර වූ ප්‍රහීණ කරණලද සියලු නීවරණ ඇත්තාවූ ගනරන් පැහැ ඇත්තාහු ලොකයාට අසහාය ප්‍රදීප වූවෝ වෙති. නිසැක ව ම ලොකයෙහි ශ්‍රෙෂ්ඨ දක්ෂිණාර්හ වූ ඒ පසේබුදුවරයෝ හැමකල්හි ම පුදන ලද්දෝ වෙත්.

136. පසේබුදුවරුන්ගේ සුභාෂිත වචනයෝ දෙවියන් සහිත ලොක යෙහි පවතිත්. යමෙක් තුමූ එ ම ධර්මය අසා ඒ වූ පරිදි නො කෙරෙත් නම්, ඔහු සංසාර දුක්ඛයෙහි නැවත නැවත හැසිරෙති.

137. පසේබුදුවරුන්ගේ සුභාෂිත වචනයෝ පැණි වැගිරෙන්නා වූ මීවද වැනි ය. එය අසා යමෙක් තුමූ ඒ වූ පරිදි ප්‍රතිපත්තියෙහි යෙදුනාහු නම්, ඔහු තුමූ චතුසත්‍යය දක්නා වූ සප්‍රාඥයෝ වෙති.

138. ගෘහාභිනිෂ්ක්‍රමණය කොට කෙලෙසුන් දිනූ පසේ බුදුවරයන් විසින් වදාලා වූ ගාථාවෝ උදාර වෙති. ශාක්‍යසිංහ ගෞතම බුදුරජුන් වහන්සේ විසින් ඒ ගාථා (ලොකයාගේ) ධර්මාවබොධය පිණිස දෙශනා කරණ ලද හ.

139. ඒ පසේබුදුවරයන් විසින් දෙශනා කරණලද මේ ගාථාවෝ (නුවණැත්තන්ගේ) සංවේගය හා නො ඇලීම ද ඉතා වැඩීම පිණිස සවයම්භූ ශ්‍රෙෂ්ඨ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් වදාරණ ලදහ.

**ප්‍රත්‍යෙකබුද්ධාපදානය සමාප්තයි.**

---

## 3

## අථ ථෙරාපදානං සුණාථ.

### 1

### (සාරිපුත්තත්ථෙරාපදානං.)

140. හිමවන්තස්ස අවිදූරෙ ලම්බකො නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

141. උත්තානකූලා නදිකා සුපතිත්ථා මනොරමා,
සුසුද්ධ[1]පුලිනාකිණ්ණා අවිදූරෙ මම‘ස්සමා.

142. අසක්ඛරා අප්පබ්භාරා සාදු අප්පටිගන්ධිකා,
සන්දති නදිකා තත්ථ සොභයන්තා මම‘ස්සමං.

143. කුම්භීලා මකරා චෙත්ථ සුංසුමාරා ච කච්ඡපා,
චරන්ති නදියා[2] තත්ථ සොභයන්තා මම‘ස්සමං.

144. පාඨීනා පාවුසා මච්ඡා වලජා[3] මුඤ්ජරොහිතා
මග්ගුරා[4] පපතායන්තා[5] සොභයන්ති මම‘ස්සමං.

145. උභොකූලෙසු නදියා පුප්ඵිනො ඵලිනො දුමා,
උභතො අභිලම්බන්තා සොභයන්ති මම’ස්සමං.

146. අම්බා සාලා ච[6] තිලකා පාටලී සින්දුවාරකා[7]
දිබ්බගන්ධං[8] සම්පවන්ති පුප්ඵිතා මම අස්සමෙ.

147. චම්පකා සළලා නීපා[9] නාගපුන්නාගකෙතකා,
දිබ්බගන්ධං[8] සම්පවන්ති පුප්ඵිතා මම අස්සමෙ.

148 අතිමුත්තා අසොකා ච භගිනිමාලා ච පුප්ඵිතා,
අඞ්කොලා බිම්බිජාලා[10] ච පුප්ඵිතා මම අස්සමෙ.

149. කෙටකා[11] කන්දලි චෙව ගොධුකා[12] තිණසූලිකා,
දිබ්බගන්ධං[8] සම්පවන්ති සොභයන්තා[13] මම‘ස්සමං.

150. කණිකාරා කණ්ණිකා[14] ච අසනා අජ්ජුනා[15] බහූ,
දිබ්බගන්ධං සම්පවන්ති සොභයන්තා[16] මමස්ස‘මං.

151. පුන්නාගා ගිරිපුන්නාගා කොවිළාරා ච පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්ති සොභයන්තා[16] මමස්ස‘මං.

152. උද්දාලකා ච කුටජා කදම්බා වකුලා[17] බහූ,
දිබ්බගන්ධං සම්පවන්ති සොභයන්තා මමස්ස‘මං

153. ආළකා ඉසිමුග්ගා ච කදලි මාතුලුඞ්ගියො,
ගන්ධොදකෙන සංවඩ්ඪා ඵලානි ධාරයන්ති තෙ.

154. අඤ්ඤෙ පුප්ඵන්ති පදුමා අඤ්ඤෙ ජායන්ති කෙසරී,
අඤ්ඤෙ ඔපුප්ඵා පදුමා පුප්ඵිතා තළාකෙ[18] සදා.

---

1. සංසුද්ධ. P T S. 2. සන්දති නදිකා. P T S. සෙ. අ.
3. බලජා. ම. ථෙ. ජලජා. P T S. 4. මද්ගුරා (?) 5. ච පතායන්ති. P T S
6. අම්බා කොලකා. P T S. 7. සින්දුවාරිකා. P T S. අ. සින්ධවාරිකා. ම. සෙ.
8. දිබ්බාගන්ධා. P T S. අ. සෙ. 9 නිම්බා. ථෙ. 10. බිම්බජාලා. ම.
11. කෙතකා. P T S. 12. කෙබුකා. P T S. සෙ.
13. සම්පවන්තා සොභයන්ති. ම. සෙ 14. කණිකා. P T S.
15. අංජනී. P T S. සෙ. අජ්ජනා. ම. ථෙ. අංජනා. අ. 16. සොභමානා. P T S.
17. බහුලා. ම. 18. තදා. ම. P T S. සෙ.

## 3
## යළි ඝෙරවිරාවදානය අසවු.

## 1
## ශාරිපුත්‍රසෙරවිරාවදානය.

140. හිමවතට නුදුරෙහි 'ලම්බක' නම් පර්වතයකි. එහි මට අසපුවක් කරණ ලදී පර්ණශාලාවක් (=පන්සලක්) ද මැනවින් මවන ලදී.

141. නො ගැඹුරු ඉවුරු ඇති මනා වූ කුඩා තොටුපළවල් ඇති මනොඥ වූ සුශ්වේතවැලිතලාවන්ගෙන් ගැවසීගත් කුඩා ගඟක් මාගේ අසපුවට නුදුරෙහි වි ය.

142. බොරළු රහිත වූ ගැඹුරු ඉවුරු නැති මිහිරි ජලයෙන් යුත් දුර්ගන්ධ විරහිත වූ කුඩා ගඟ එහි මාගේ අසපුව හොබවමින් ගලා බසී.

143. කිඹුල්ලු ද මෝරු ද ගැටකිඹුල්ලු ද කැසුබුවෝ ද එහි වූ මාගේ අසපුව හොබවමින් ගඟෙහි හැසිරෙත්.

144. පෙතියෝ ද පූල්ලු ද වලයෝ ද මොද්දු ද රෙහෙරු ද මගුරෝ ද (යන මත්ස්‍යයෝ) පෙරළෙමින් මාගේ අසපුව හොබවත්.

145. එම ගඟ දෙපසෙහි (හැම කල්හි) මල් පිපුනාූ වූ ද පල ගත්තා වූ ද වෘක්ෂයෝ දෙතෙරෙහි නැමුනාහු මාගේ අසපුව හොබවත්.

146. අඹ සල් මදට පළොල් තිඹ යන මේ වෘක්ෂයෝ පිපීගිය මල් ඇත්තාහු මාගේ අසපුවෙහි හාත්පස දිව්‍යමය සුවඳ පතුරුවත්.

147. පිපුනු මල් ඇති සපු සලල කොලොම් නා දෙඹ වැටකේ යන මේ වෘක්ෂයෝ ද මාගේ අසපුව හාත්පස දිව්‍යමය සුවඳ වහනය කරත්.

148. මාගේ අසපුවෙහි යොහොඹු වැල් ද හෝපලු රුක් ද භගිනිමාලා නම් වෘක්ෂයෝ ද මල් පිපී ගියාහු ය. එසේ ම රුකඟුණ රත්කරවූ යන වෘක්ෂයෝ ද සුපුෂ්පිත වූවාහු ය.

149. වැටකේ කඳල ගොඩුක බෝලිද්ද යන මොහු ද මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමවත්.

150. කිණිහිරි ය සිහින් මිදි ය පියා ය කුඹුක් ය යන බොහෝ වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමවත්.

151. දෙඹ ය ගල්දෙඹ ය කොබෝලීල ය යන වෘක්ෂයෝ සුපුෂ්පිත වූවාහු මාගේ අසපුව හොබවමින් දිවසුවඳ වහනය කරත්.

152. ඇසල ය කෙළිඳ ය කොලොම් ය මුහුනමල් ය යන බොහෝ වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමවත්.

153. ආලක ය ඉසිමුගග (වනමුං)ය කෙසෙල් ය ලප්නාරං ය යන මේ ගස් සුවඳ දියෙන් වැඩුනාහු ඵල දරත්.

154. (අසපුව අසල වූ) තඩාගයෙහි හැමකල්හි ඇතැම් පද්මයෝ පිපෙත්. ඇතැම් කෙසරපද්මයෝ හටගණිත්. ඇතැම් පිපුනු පද්මයෝ ගිලිහුනු පත් හා කෙසරු ඇත්තෝ වෙත්.

155. ගබ්භං ගණ්හන්ති පදුමා නිද්ධාවන්ති මුලාලියො,
සිඞ්ඝාටකපත්තමාකිණ්ණා[1] සොභන්ති[2] තලාකෙ සදා.

156. නයිතා අම්බගන්ධී ච උත්තාලා[3] බන්ධුජීවකා,
දිබ්බගන්ධං සම්පවන්ති තලාකෙ පුප්ඵිතා[4] සදා[3].

157. පාඨීනා පාවුසා මච්ඡා වලජා මුඤ්ජ-රොහිතා
සඞ්ගුලා[5] මඞ්ගුරා[6] චෙව වසන්ති තලාකෙ සදා.

158. කුම්භීලා සුංසුමාරා ච තන්තිගාහා ච රක්ඛසා,
ඔගුහා[7] අජගරා[8] ච වසන්ති තලාකෙ සදා.

159. පාරෙවතා රවිහංසා චක්කවාකා නදීචරා,
කොකිලා සුකසාළිකා[9] උපජීවන්ති තං සරං.

160. කුකුත්ථකා කුළීරකා වනෙ පොක්ඛරසාතකා
දින්දිභා සුවපොතා ච උපජීවන්ති තං සරං.

161. හංසා කොඤ්චා මයූරා ච කොකිලා තම්බචූළිකා,
පම්පකා[10] ජීවංජීවා ච උපජීවන්ති තං සරං.

162. කොසිකා පොට්ඨසීසා ච කුරරා[11] සෙනකා බහූ,
මහාකාලා ච සකුණා උපජීවන්ති තං සරං.

163. පසදා ච වරාහා ච චකා[12] භෙරණ්ඩකා[13] බහූ,
රොහිච්චා සුඝපොතා[14] ච උපජීවන්ති තං සරං.

164. සීහ ව්‍යග්ඝා ච දීපී ච අච්ඡකොකතරච්ඡකා,
තිධාපභින්නා මාතඞ්ගා[15] උපජීවන්ති තං සරං.

165. කින්නරා වානරා චෙව අථොපි වනකම්මිකා,
චෙතා ච ලුද්දකා චෙව උපජීවන්ති තං සරං.

166. තින්දුකානි පියාලානි මධුකා කාසුමාරයො[16],
ධුවප්ඵලානි[17] ධාරෙන්ති අවිදූරෙ මම'ස්සමා.

167. කොසුම්භා[18] සළලා නීපා[19] සාදුඵලසමායුතා[20],
ධුවප්ඵලානි ධාරෙන්ති අවිදූරෙ මම'ස්සමා.

168. හරීතකා ආමලකා අම්බා ජම්බුවිභීටකා[21],
කොලා භල්ලාතකා බිල්ලා[22] ඵලානි ධාරයන්ති තෙ.

169. ආලුවා ච කලම්බා ච බිළාලීතක්කලානි[23] ච,
ජීවකා සුතකා[24] චෙව බහුකා මම අස්සමෙ.

---

1. සිඞ්ඝාටි. P T S. සෙ. ම. සඞ්ඝාටි. ථෙ. අ. සිපාටි. මු. අ.
2. සොභෙන්ති. මු. අ. සොභයන්ති. P T S. 3 උතුළසී. P T S. උත්තලී. මු. අ.
4. පුප්ඵිතා තලාසො. ම. ථෙ. 5. සඞ්කුලා. P T S. සෙ.
6. මග්ගුරා. ම. ථෙ. අ. 7. ඔගහා. P T S 8. අජකාරා. මු. අ.
9. සාළී ච. P T S. සෙ. සාළිකා ම. ථෙ. 10. සම්පකා. P T S.
11. කුරුරා. ම. ථෙ. 12. චමරා. ම. ථෙ. ඔකා. සෙ. 13. ගණ්ඩකා. ම ථෙ.
14. සුඝපොතා ම ථෙ. පුඝඝ. සෙ 15. තිධප්පභින්නා. ම. ථෙ.
16. මධුකොකා සුමාරියො. P T S. ථෙ. අ 17. ධුවං. ම. ථෙ. අ.
18 කොසම්බා. ම. ථෙ. 19. නිම්බා ම. ථෙ. 20. සාරඵල. P T S. සෙ. අ.
21. විභෙදකා. ම. ථෙ. සෙ. 22. බෙලා. ම. ථෙ. සෙ. බෙල්ලා. P T S. අ.
23. බිලානි P T S. තකොකාලානි. ථෙ 24. සහකා. P T S සරණා. ථෙ.

155. පද්මයෝ කැකුළු ව හට ගණිත්. නෙළුම්බුඅල (මඩ අතුරින් ඇත්දළ මෙන්) වැඩී යෙත්. පත්‍ර ගැවසුනු 'සිඞ්ඝාටක*' නම් පැළෑටි හැම්කල්හි එම විලෙහි බබලත්.

156. විල අසල පිරීගිය නයිත ය, ආම්‍රගන්ධි ය, උස් වූ බඳුවද ය යන මේ ගස්හු හැම කල්හි දිවසුවඳ හමවත්.

157. පෙපියෝ ය, ලූල්ලු ය, වලයෝ ය, මොද්දු ය, රෙහෙරු ය, අඟුලුවෝ ය, මගුරෝ ය යන මත්ස්‍යයෝ ද හැම කල්හි තඩාගයෙහි වසත්.

158. කිඹුලෝ ය, සුංසුමාරයෝ ය, තන්තිගාහයෝ ය, රක්ඛසයෝ ය, ඔගුහයෝ ය, අජගරයෝ ය යන මොවුහු හැම කල්හි මෙම තඩාගයෙහි වසත්.

159. පරෙවියෝ ය, රවිහංසයෝ ය, සක්වාලිහිණියෝ ය, නදීචර-යෝ ය, කොකිලයෝ ය, ගිරවු ය, සැළලිහිණියෝ ය යන මේ පක්ෂීහු ඒ විල ඇසුරෙන් ජීවත් වෙති.

160. වලිකුකුළෝ ය, රත්වත් කකුළුවෝ ය, පියුම් වෙනෙහි විල්-ලිහිණියෝ ය, කිරල්ලු ය, ගිරාමලිත්තෝ ය යන මේ පක්ෂීහු එම විල ඇසුරෙන් ජීවත් වෙති.

161. හංසයෝ ය, කොස්වා ලිහිණියෝ ය. මොනරු ය, කොවුලෝ ය, කුකුළෝ ය, හුණපුපුලෝ ය, ජීවඤ්ජීවයෝ ය යන මේ පක්ෂීහු එම විල ඇසුරු කොට ජීවත් වෙති.

162. බකමූහුණෝ ය, පොට්ඨසීසයෝ ය, කබරුස්සෝ ය, උකුස්සෝ ය, මහාකාලයෝ ය යන බොහෝ පක්ෂීහු එම විල ඇසුරු කොට ජීවත් වෙති.

163. තිත්මුවෝ ය, වල්ඌරෝ ය, වෘකයෝ ය, සිවල්ලු ය, රේරු-මුවෝ ය, සුගහපොතයෝ ය යන බොහෝ මෘගයෝ එම විල ඇසුරු කොට ජීවත් වෙති.

164. සිංහයෝ ය, ව්‍යාඝ්‍රයෝ ය, දිවියෝ ය, වලස්සු ය, කර බානා වලස්සු ය, තෙතැනකින් මද වැහෙන ඇත්තු ය යන මොහු ඒ විල ඇසුරු කොට වෙසෙත්.

165. කිඳුරෝ ද, වඳුරෝ ද, තවද වනයෙහි කර්මාන්තයන්හි යෙදුනෝ ද, දඩයෝ ද, වැද්දෝ ද එම විල ඇසුරු කොට වෙසෙත්.

166. තිඹිරි ය, පියල් ය, මීගස් ය, ඇද්දෙමට ය යන මේ වෘක්ෂයෝ මාගේ අසපුවට නුදුරෙහි නිරතුරු ව ඵල දරත්.

167. මිහිරි ඵලයන්ගෙන් යුත් කොසුම්භ ය, සලල ය,බක්මී ය යන මේ වෘක්ෂයෝ මාගේ අසපුවට නුදුරු තන්හි නිරතුරු ව ම ඵල දරත්.

168. අරළු ය, නෙල්ලි ය, අඹ ය, ජම්බු ය, බුළු ය, ඩෙබර ය, බඳුලු ය, බෙලි ය යන මෙකී වෘක්ෂයෝ ඵල දරති.

169. ආලු ය, කලම්බ ය, බීලාලී (කිරිබඳු) ය, තක්කල ය, ජීවක ය, සුතක ය යන බොහෝ අලවර්ගයෝ මාගේ අසපුවෙහි වෙති.

---

* 'සිඞ්ඝාටක' යනු කෙකටියගසට නමක් සේ පාළිනිඝණ්ඩුවෙහි දක්වන ලදී සංස්කෘතයෙහි 'ශෘඞ්ගාටක' යන්න පාළියෙහිදී මෙසේ වෙනස් වූ සේ සිතිය හැකි ය 'ශෘඞ්ගාටක' යනු කොහිල ගසැ' යි මේ රටේ වෛද්‍යවරු සලකති. දඹදිව දිය මතු පිට පාවෙමින් වැවෙන, අල සහිත පැළෑටි ජාතියක් 'සිංගඩා' නමින් හැඳින් වේ. 'ශෘඞ්ගාටක' යන්නෙන් ගැණෙන්නේ ද එම වර්ගය යි හඟිමු. ගොකටු ගසට නම් වූ 'සිඞ්ඝාට' ශබ්දයක් ද පාළියෙහි තිබේ.

170. අස්සමස්සාවිදූරම්හි තළාකා'සුං[1] සුනිම්මිතා,
අච්ඡොදකා සීතජලා සුපතිත්ථා මනොරමා.

171. පදුමුප්පලසංඡන්නා පුණ්ඩරීකසමායුතා,
මන්දාලකෙහි[2] සංඡන්නා දිබ්බගන්ධො පවායති.[3]

172. එවං සබ්බඞ්ගසම්පන්නෙ පුප්ඵිතෙ ඵලිතෙ වනෙ,
සුකතෙ අස්සමෙ රම්මෙ විහරාමි අහං තදා[4].

173. සීලවා වතසම්පන්නො ඣායී ඣානරතො සදා,
පඤ්චාභිඤ්ඤාබලප්පත්තො[5] **සුරුචි** නාම තාපසො

174. චතුබ්බීසසහස්සානි සිස්සා මය්හං උපට්ඨහුං,
සබ්බෙව බ්‍රාහ්මණා එතෙ ජාතිමන්තො යසස්සිනො

175. ලක්ඛණෙ ඉතිහාසෙ ච සනිඝණ්ඩුසකෙටුභෙ,
පදකා වෙය්‍යාකරණා සධම්මෙ[6] පාරමිං ගතා.

176. උප්පාතෙසු[7] නිමිත්තෙසු ලක්ඛණෙසු ච කොවිදා,
පථව්‍යා භූම්‍යන්තලික්ඛෙ[8] මම සිස්සා සුසික්ඛිතා.

177. අප්පිච්ඡා නිපකා එතෙ අප්පාහාරා අලොලුපා,
ලාභාලාභෙන සන්තුට්ඨා පරිවාරෙන්ති මං සදා.

178. ඣායී ඣානරතා ධීරා සන්තචිත්තා සමාහිතා,
ආකිඤ්චඤ්ඤං පත්ථයන්තා පරිවාරෙන්ති මං සදා.

179. අභිඤ්ඤාපාරමිප්පත්තා පෙත්තිකෙ ගොචරෙ රතා,
අන්තලික්ඛචරා ධීරා පරිවාරෙන්ති මං සදා.

180. සංවුතා ඡසු ද්වාරෙසු අනෙජා රක්ඛිතින්ද්‍රියා,
අසංසට්ඨා ච තෙ ධීරා මම සිස්සා දුරාසදා.

181. පල්ලඞ්කෙන නිසජ්ජාය ඨාන[9]චඞ්කමනෙන ච,
වීතිනාමෙන්ති තෙ රත්තිං මම සිස්සා දුරාසදා.

182. රජනීයෙ න රජ්ජන්ති දුස්සනීයෙ න දුස්සරෙ,
මොහනීයෙ න මුය්හන්ති මම සිස්සා දුරාසදා.

183. ඉද්ධිං වීමංසමානා තෙ වත්තන්ති නිච්චකාලිකං,
පථවිං තෙ පකම්පෙන්ති සාරම්භෙන දුරාසදා.

1. තළාකාපි. ථෙ. තළාකාසු. P T S.
2. මන්දාරකෙහි. ථෙ. 3. දිබ්බගන්ධා පවායරෙ. ථෙ. 4. තදා අහං. ථෙ.
5. ඵලප්පත්තො. P T S. සෙ. 6. සද්ධම්මෙ. P T S. සෙ.
7. උප්පාදෙසු. P T S. සෙ. 8. භුම්මන්තලික්ඛෙ. ථෙ P T S.
9. ඨානා. P T S. සෙ.

170. අසපුවට නුදුරෙහි මැනවින් මැවූ පිරිසිදු සිසිල් දියඇති මනා තොටින් යුත් මනහර වූ තඩාගයෝ වූහ.

171. සුදුනෙළුම් රතුනෙළුම් හා උපුල් මලින් ආකුල වූ තඩාගයන්ගෙන් දිව්සුවඳ හමයි.

172. මෙසේ සුපුෂ්පිත වූ ඵල දරුවා වූ සර්වාඞ්ගසම්පූර්ණ වනයෙහි මැනවින් කරණලද රම්‍ය වූ ආශ්‍රමයෙහි මම එකල්හි වෙසෙමි.

173. සිල්වත් වූ ව්‍රතසම්පන්න වූ ධ්‍යාන කරණසුලු වූ හැමකල්හි ධ්‍යානයෙහි ඇලුනා වූ පඤ්චාභිඥ බලයට පැමිණියා වූ 'සුරුචි' නම් තවුසෙක් වීමි.

174. සුවිසි දහසක් ශිෂ්‍යයෝ මට උවටැන් කළාහු ය. මේ සියලු ශිෂ්‍යයෝ ජාතිමත් කීර්තිමත් බ්‍රාහ්මණයෝ වූහ.

175. නිඝණ්ඩු කෙටුභ සහිත අඞ්ගලක්ෂණ ශාස්ත්‍රයෙහි ද, ඉතිහාස-යෙහි ද, වේදත්‍රයයෙහි ද, සවකීය බ්‍රාහ්මණධර්මයෙහි ද, පරතෙරට ගියාහු වේදපදපාඨකයෝ වූහ. එසේ ම ව්‍යාකරණයෙහි ද දක්ෂයෝ වූහ.

176. උල්කාපාත භූමිචලනාදිය පිළිබඳ වැඩ අවැඩ දැනගන්නා උත්පාතශාස්ත්‍රයෙහි ද, ශුභාශුභ නිමිති දැනගන්නා ශාස්ත්‍රයෙහි ද, ස්ත්‍රී පුරුෂයන්ගේ හා මහා පුරුෂයන් ගේ ලකුණු දන්නා ශාස්ත්‍රයෙහි ද දක්ෂ වූවාහු ය. එසේ ම පෘථිවිය පිළිබඳ වූ ද අහස පිළිබඳ වූ ද ශාස්ත්‍රයන්හි මාගේ ශිෂ්‍යයෝ දක්ෂයෝ වූහ.

177. අලෝලුප්ත වූ අල්පාහාර වූ ලොල්බව නො මැති මුහුකුරා ගිය නුවණැති ඔහු ලාභ අලාභ දෙකින් ම එක සේ සතුටු වූවාහු හැම කල්හි මා පිරිවරත්.

178. ධ්‍යාන වඩන්නා වූ ධ්‍යානයෙහි ඇලුනා වූ ධෛර්‍ය්‍යසම්පන්න වූ ශාන්ත වූ එකඟ වූ සිත් ඇති අකිඤ්චනභාවය (පළිබෝධ විරහිත බව) කැමැති වන්නා වූ ඒ තවුසෝ හැම කල්හි මා පිරිවරත්.

179. පඤ්චාභිඥාවන්හි පරතෙරට පත් පරම්පරානුගත ගොචරයෙහි ඇලුනාවූ අහසින් යාම් ඊම් කරන්නා වූ ස්ථිරගති ඇති එම තවුසෝ හැමකල්හි මා පිරිවරත්.

180. සදොර සංවරණය කරගත් තෘෂ්ණාවෙන් තොර සුරැකි ඉඳුරන් ඇති ගිහියන් සමග නො ගැටෙන ධෛර්‍ය්‍යවත් ඒ මාගේ ශිෂ්‍යයෝ ළං විය නො හැක්කෝ වෙත්.

181. දුරාසද වූ ඒ මාගේ ශිෂ්‍යයෝ පලඟ බැඳීමෙන් ද, හිඳීමෙන් ද, සිටීමෙන් හා සක්මන් කිරීමෙන් ද රාත්‍රිය ගෙවත්.

182. ළං විය නොහැක්කා වූ මාගේ ඒ ශිෂ්‍යයෝ ඇලිය යුතු දෙයෙහි නො ඇලෙත්. ගැටිය යුතු දෙයෙහි නො ගැටෙත්. මුළා විය යුතු දෙයෙහි මුළා නො වෙත්.

183. ඉද්ධිබල ආදියෙන් කිසිවෙකු විසිනුත් ළං විය නො හැක්කා වූ මාගේ ශිෂ්‍යයෝ නිරතුරු ව ම විකුර්වණඍද්ධිය විමසමින් පවතිත්. පෘථිවිය ද කම්පා කෙරෙත්.

184. කීළමානා ච තෙ සිස්සා කීළන්ති ඣානකීළිතං,
ජම්බුතො ඵලමානෙන්ති මම සිස්සා දුරාසදා.

185. අඤ්ඤෙ ගච්ඡන්ති ගොයානං අඤ්ඤෙ පුබ්බවිදෙහකං[1]
අඤ්ඤෙ ච උත්තරකුරුං එසනාය දුරාසදා.

186 පුරතො ඛාරිං පෙසෙන්ති පච්ඡතො'ව වජන්ති තෙ,
චතුබ්බීසසහස්සෙහි ඡාදිතං හොති අම්බරං.

187. අග්ගිපාකී අනග්ගී ච දන්තොදුක්ඛලිකා පි ච,
අස්මෙන කොට්ටකා[2] කෙචි පවත්තඵලභොජනා.

188. උදකොරොහනා[3] කෙචි සායං පාතො සුචීරතා,
තොයාභිසෙචනකරා[4] මම සිස්සා දුරාසදා.

189. පරූළ්හකච්ඡනඛලොමා පඞ්කදන්තා රජස්සිරා,
ගන්ධිතා සීලගන්ධෙන මම සිස්සා දුරාසදා.

190. පාතොව සන්නිපතිත්වා[5] ජටිලා උග්ගතාපනා,
ලාභාලාභං පකිත්තෙත්වා ගච්ඡන්ති අම්බරෙ තදා.

191. එතෙසං පක්කමන්තානං මහාසද්දො පවත්තති,
අජිනචම්මසද්දෙන මොදිතා[6] හොන්ති දෙවතා.

192. දිසො දිසං පක්කමන්ති අන්තලික්ඛචරා ඉසී,
සකෙ බලෙනුපත්ථද්ධා[7] තෙ ගච්ඡන්ති යදිච්ඡකං.

193. පඨවීකම්පකා එතෙ සබ්බෙව නභචාරිනො,
උග්ගතෙජා දුප්පසහා සාගරො'ව අඛොභියා.

194. ඨානචඞ්කමිනො[8] කෙචි කෙචි නෙසජ්ජිකා ඉසී,
පවත්තභොජනා කෙචි මම සිස්සා දුරාසදා.

195. මෙත්තාවිහාරිනො එතෙ හිතෙසී සබ්බපාණිනං,
අනත්තුක්කංසකා සබ්බෙ න තෙ වම්භෙන්ති කස්සචි.

196. සීහරාජාව'සම්භීතා[9] ගජරාජාව ථාමවා,
දුරාසදා ව්‍යග්ඝාරිව ආගච්ඡන්ති මම'න්තිකෙ.

---

1. පුබ්බවිදෙහනං. ම. P T S සෙ  2 කොට්ඨකා. P T S. කොට්ටිකා මූ. අ.
3. . රොහකා. P T S. සෙ  4. සෙකාචරණා. P T S. සෙ.- සෙචකාරණා. ම.
5. සන්නිපාතෙත්වා. ම. සෙ. අ.  6. මුදිතා. ම. සෙ. අ.  7. සකබලෙ. P T S
8. ඨානචඞ්කමියා. P T S.  9. ච. 'ජම්භිතා. ථෙ

184. ඒ මාගේ ශිෂ්‍යයෝ ඉදින් ක්‍රීඩා කරන්නාහු නම්, ධ්‍යානක්‍රීඩාව ම කෙරෙත්. දුරාසද වූ ඔහු මහ දඹ රුකෙන් ගෙඩි ගෙණෙත්.

185. ලං විය නොහැක්කා වූ ඔවුනතුරෙන් ඇතැම් කෙනෙක් ප්‍රත්‍යය සෙවීම පිණිස අපරගොයානයට යෙත්. ඇතැම් කෙනෙක් පූර්වවිදෙහයට ද ඇතැම් කෙනෙක් උතුරුකුරුදිවයිනට ද යෙත්.

186. අහසින් යන්නා වූ මාගේ ශිෂ්‍යයෝ පළමු කොට (පිරිකර) කද යවති. ඔහු පසු ව යෙත්. සුවිසිදහසක් වූ ඔවුන් විසින් අහස්තලය වසන ලද්දේ වේ.

187. ඔවුනතුරෙන් ඇතැම් කෙනෙක් (ඵලාඵලපත්‍රාදිය) ගින්නෙන් පිස කති. ඇතැම්හු නො පිසා අමුවෙන් ම කති. ඇතැම්හු දත්වලින් ම පොතු ගලවා කති. කිසිකෙනෙක් ගලින් කොටාගෙණ කත්. ඇතැම්හු ස්වයංපතිත ඵලාහාරයෙන් ජීවත් වෙති.

188. ලං විය නො හැක්කා වූ මාගේ ශිෂ්‍යයෝ ශුද්ධිය කැමැති වන්නාහු දියෙන් තමා තෙමීම කරන්නාහු උදුහැන ද සවස ද දියෙහි ගිලෙති.

189. දුරාසද වූ මාගේ ශිෂ්‍යයෝ දික් වූ කිසිලි ලොම් හා නිය ඇත්තාහු මල බැඳුනු දත් ඇත්තාහු දූලි වැකුනු හිස් ඇත්තාහු සීලසුගන්ධයෙන් සුගන්ධවත් වූහ.

190. එකල්හි උග්‍රතපස් ඇති ජටාධර වූ තවුසෝ උදෑසන ම රැස් ව (ඔවුනට ලැබුනු) කුඩුමහත් ලාභයන් ගැණ කථා කොට අහසෙහි යෙති.

191. එසේ යන්නා වූ මොවුන්ගේ (වැහැරි සිවුරුවලින් හටගත්) මහා ශබ්ද පවතී. අඳුන් දිවිසම්හන්දින් දෙවියෝ සොම්නස් වූවාහු වෙති.

192. අහසෙහි හැසිරෙන්නා වූ එම ඍෂිහු දිසානුදිසාවන්ට ගමන් කෙරෙති. ස්වකීය ශරීරබලයෙන් හා ධ්‍යානබලයෙන් යුත් ඔහු යම් යම් තැනකට යනු කැමැත්තාහු නම්, ඒ ඒ තැනට ම යෙති.

193 මේ සියලු තන්හි කැමැති සේ හැසිරෙණ මොහු හැම දෙන ම පෘථිවී කම්පනයෙහි සමත් වූවෝ ද අහසෙහි හැසිරීමෙහි දක්ෂ වූවෝ ද උග්‍ර තේජස් ඇත්තාහු ද අභිභවනය කළ නො හැක්කාහු ද සයුර මෙන් අනුන් විසින් නො කැළඹිය හැක්කෝ ද වෙති.

194. ගුණයන් කරණ කොට ගෙණ ලං විය නො හැක්කා වූ මාගේ ශිෂ්‍ය වූ ඇතැම්හු සිටීම ය සක්මන් කිරීම ය යන ඉරියවු දෙකින් යුක්තයෝ ය. ඇතැම්හු හිඳීම්ඉරියවු පමණක් ඇත්තෝ ය. එසේ ම ඇතැම්හු ස්වයං පතිත ඵල අනුභව කරන්නෝ වෙති.

195. මොහු සර්වසත්‍වනට හිතවත් වූවාහු මෛත්‍රී විහරණ ඇත්තාහු ය. සියල්ලෝ ම තමා හුවා නො දක්වන්නෝ ය. කිසිවෙකු හෙළා දක්නෝ ද නො වෙති.

196. සිංහරජකු මෙන් නිර්භීත වූවෝ ඇත්රජකු මෙන් බලවත් වූවෝ ව්‍යාඝ්‍රයකු මෙන් ලං විය නො හැක්කෝ මාගේ සමීපයට පැමිණෙත්.

197. විජ්ජාධරා දෙවතා ච නාගාගන්ධබ්බරක්ඛසා,
කුම්භණ්ඩා දානවා ගරුළා උපජීවන්ති තං සරං.

198. තෙ ජටාභාරිභරිතා[1] අජිනුත්තරවාසනා[2],
අන්තලික්ඛචරා සබ්බෙ උපජීවන්ති තං සරං.

199. සදානුච්ඡවිකා එතෙ අඤ්ඤමඤ්ඤං සගාරවා,
චතුබ්බීසසහස්සානං ඛිපිතසද්දො[3] න විජ්ජති.

200. පාදෙ පාදං නික්ඛිපන්තා අප්පසද්දා සුසංවුතා,
උපසඞ්කම්ම සබ්බෙ'ව සිරසා වන්දරෙ මමං.

201. තෙහි සිස්සෙහි පරිවුතො සන්තෙහි ච තපස්සිහි,
වසාමි අස්සමෙ තත්ථ ඣායී ඣානරතො අහං.

202. ඉසීනං සීලගන්ධෙන පුප්ඵගන්ධෙන චූභයං,
ඵලීනං ඵලගන්ධෙන ගන්ධිතො හොති අස්සමො

203. රත්තින්දිවං න ජානාමි අරතී මෙ න විජ්ජති,
සකෙ සිස්සෙ ඔවදන්තො භීය්‍යො හාසං ලභාම'හං.

204. පුප්ඵානං පුප්ඵමානානං ඵලානඤ්ච විපච්චතං
දිබ්බා ගන්ධා පවායන්ති සොභයන්තා මම'ස්සමං.

205. සමාධිම්හා වුට්ඨහිත්වා ආතාපී නිපකො අහං,
ඛාරිභාරං ගහෙත්වාන වනං අජ්ඣොගහිං තදා.

206. උප්පාතෙ සුපිනෙ චාපි ලක්ඛණෙසු සුසික්ඛිතො,
පවත්තමානං[4] මන්තපදං ධාරයාමි අහං තදා.[5]

207. **අනොමදස්සී** භගවා ලොකජෙට්ඨො නරාසභො,
විවෙකකාමො සම්බුද්ධො හිමවන්තමුපාගමි.

208. අජ්ඣොගහෙත්වා හිමවන්තං අග්ගො කාරුණිකො මුනි,
පල්ලඞ්කං ආභුජිත්වාන නිසීදි පුරිසුත්තමො.

209. තත්ථ'ද්දසාසිං[6] සම්බුද්ධං සප්පභාසං මනොරමං,
ඉන්දීවරං'ව ජලිතං ආදිත්තං'ව හුතාසනං.

210. ජලන්තං දීපරුක්ඛං'ව විජ්ජුං'ව ගගනෙ[7] යථා,
සුඵුල්ලං සාලරාජා ව අද්දසං ලොකනායකං.

211. අයං නාගො මහාවීරො දුක්ඛස්ස'න්තකරො මුනි,
ඉමං දස්සනමාගම්ම සබ්බදුක්ඛා[8] පමුච්චරෙ.

212. දිස්වාන'හං දෙවදෙවං ලක්ඛණං උපධාරයිං,
බුද්ධො නු ඛො න වා බුද්ධො හන්ද පස්සාමි[9] චක්ඛුමං.

---

1. -භාරිකා. P T S ථෙ. 2. වාසිනො ම. P T S. සෙ.
3. ඛිත්ත සද්දො. P T S. 4. වත්තමානං. ම සෙ. 5. සදා. ම. සෙ.
6. තමද්දසාහං. ථෙ ම. සෙ. 7. විජ්ජුතංගගනෙ. ථෙ විජ්ජුංවබ්භඝනෙ. P T S
8. සබ්බෙ දුක්ඛා. P T S 9. නං නමස්සාමි. ථෙ.

197. විද්‍යාධරයෝ ද, දෙවතාවෝ ද, නාග ගන්ධර්ව රාක්ෂස කුම්භාණ්ඩ අසුර ගුරුළු යන මොහු ද ඒ විල ඇසුරෙන් වෙසෙති.

198. ජටා හා තවුස්පිරිකරකත්හි බර උසුලන්නා වූ අඳුන්දිවිසම් පොරවා ගත් ආකාශචාරී වූ සියලු ම සෘෂිහු ඒ විල ඇසුරෙන් වෙසෙති.

199 හැමකල්හි මනා පැවැතුම් ඇති ඔහු ඔවුනොවුනට ගෞරව සහිත වූවාහු ය. සුවිසිදහසක් වූ ඔවුන්ගේ කිඹිසිලි ශබ්දයකුදු නැත.

200. පියවරින් පියවර තබන්නාහු නිශ්ශබ්දව මනා සංවරයෙන් යුත් ව සියල්ලෝ ම මා වෙත එළඹ හිස නමා වඳිත්.

201. ශාන්ත වූ තපොගුණ ඇති ඒ සිසුන් විසින් පිරිවරණ ලද මම ඒ අසපුවෙහි ධ්‍යාන කරණ සුලු ව ධ්‍යානයෙහි ඇලුනෙම් වෙසෙමි.

202. සෘෂීන්ගේ සිල්සුවඳින් ද මල්සුවඳින් ද යන මේ උභය සුගන්ධයෙන් හා ගස්වල පල සුවඳින් ද අසපුව සුවඳවත් වේ.

203. රෑ දවල් නො දනිමි. මාගේ සිත්හි කුසල් දහම්හි නො ඇලීමක් නැත. සිය සිසුනට අවවාද කරන්නා වූ මම වැඩියක් ම ප්‍රීතිය ලබමි.

204. පිපෙන්නා වූ මල්වල ද පැසෙන්නා වූ ගෙඩිවල ද දිව්‍යමය වූ සුගන්ධයෝ මාගේ අසපුව හොබවමින් හමත්.

205. එකල්හි මම සමාධියෙන් නැගිට කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ සප්‍රාඥ වූයේ තවුස්පිරිකරකද ගෙණ වනයට පිවිසියෙමි.

206. උත්පාතශාස්ත්‍රයෙහි ද ස්වප්නශාස්ත්‍රයෙහිද ලක්ෂණශාස්ත්‍රයෙහි ද මැනවින් හික්මුනේ දඹදිව පවත්නා මන්ත්‍රපද ද දරමි.

207. ලොකජ්‍යෙෂ්ඨ වූ ද නරශ්‍රෙෂ්ඨ වූ ද සියල්ල දන්නා වූ **අනවමදර්ශී** භාග්‍යවතුන් වහන්සේ විවෙක සැප කැමති සේක් හිමවතට එළඹි සේක.

208. පුරුෂොත්තම වූ ශ්‍රෙෂ්ඨ වූ කාරුණික වූ බුදුරජානන් වහන්සේ හිමවතට පිවිස පලඟ බැඳ වැඩහුන් සේක.

209. දිලියෙන මහනෙල්මලක් මෙන් ද ආලොකවත් ගින්නක් මෙන් ද මනහර ප්‍රභා සහිත වූ බුදුරජානන් වහන්සේ එහි දී දිටිමි.

210. දිලියෙන පහන් රුකක් මෙන් ද, අහසෙහි විදුලිය මෙන් ද මනා ව පිපී ගිය සල්රුකක් මෙන් ද බුදුරජානන් වහන්සේ දිටිමි.

211. මේ "අඝ" සඞ්ඛ්‍යාත පව් නැති මහාවීර වූ දුක් කෙළවර කරන්නා වූ බුදුරජානන් වහන්සේ ය. මේ දර්ශනය ලැබ සියල්ලෝ දුකින් මිදෙත්.

212. මම දෙවියනට දෙවි වූ උන්වහන්සේ දැක "බුදු කෙනෙක් ද්‍රෝ! බුදු කෙනෙක් නොවෙත් ද්‍රෝ" යි ලක්ෂණ පරීක්ෂා කෙළෙමි. "ඒකාන්තයෙන් පසැස් ඇති උතුමෙකැ"යි දකිමි.

213. සහස්සාරානි චක්කානි දිස්සන්ති චරණුත්තමෙ,
ලක්ඛණානි'ස්ස දිස්වාන නිට්ඨං ගච්ඡිං තථාගතෙ.

214. සම්මජ්ජනිං ගහෙත්වාන සම්මජ්ජිත්වාන'හං තදා,
අථ[1] පුප්ඵෙ සමානෙත්වා බුද්ධසෙට්ඨං අපූජයිං.

215. පූජයිත්වාන සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං,
එකංසං අජිනං කත්වා නමස්සිං ලොකනායකං

216. යෙන ඤාණෙන සම්බුද්ධො විහරිත්ථ[2] අනාසවො,
තං ඤාණං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

217. සමුද්ධරසි'මං ලොකං සයම්භූ අමිතොදය,
තව දස්සනමාගම්ම කඞ්ඛාසොතං තරන්ති තෙ.

218. තුවං සත්ථා ච කෙතු ච ධජො යූපො ච පාණිනං,
පරායණො පතිට්ඨා ච දීපො ච දිපදුත්තමො.

219. සක්කා සමුද්දෙ උදකං[3] පමෙතුං ආළ්හකෙන වා,
න ත්වෙව තව සබ්බඤ්ඤු ඤාණං සක්කා පමෙතවෙ.

220. ධරෙතුං පථවිං සක්කා ඨපෙත්වා තුලමණ්ඩලෙ,
න ත්වෙව තව සබ්බඤ්ඤුඤාණං සක්කා ධරෙතවෙ.

221. ආකාසං මිනිතුං සක්කා රජ්ජුයා අඞ්ගුලෙන වා,
න ත්වෙව තව සබ්බඤ්ඤුඤාණං සක්කා පමෙතවෙ.

222. මහාසමුද්දෙ උදකං පථවිං චා'ඛිලං ජහෙ[4],
බුද්ධඤාණං උපාදාය උපමාතො[5] න යුජ්ජරෙ.

223. සදෙවකස්ස ලොකස්ස චිත්තං යෙසං[6] පවත්තති.
අන්තොජාලීකතා[7] එතෙ තව ඤාණම්හි චක්ඛුම.

224. යෙන ඤාණෙන පත්තොසි කෙවලං බොධිමුත්තමං,
තෙන ඤාණෙන සබ්බඤ්ඤු මද්දසි පරතිත්ථියෙ.

225. ඉමා ගාථා ථවිත්වාන[8] සුරුචි නාම තාපසො,
අජිනං පත්ථරිත්වාන පථවියං නිසීදි සො.

226. චුල්ලාසීතිසහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ,
අච්චුග්ගතො තාවදෙව ගිරිරාජා පවුච්චති.

1. අථ P T S. සෙ. 2. විහරෙති ම. විහරති. P T S.
3. සමුද්දෙ උදකා සක්කා. ථෙ. 4. පථවි චාඛිලා ජහෙ P T S. පථවි අඛිලා ජටෙ ම.
5 උපමා තෙ. P T S. 6 යෙසං. සෙ. 7. අන්තොජාලගතා. P T S. අ
8. පයිත්වාන P T S.

213. උතුම් ශ්‍රී පාදයෙහි දහසක් දැවි ඇති චක්‍ර ලක්‍ෂණයෝ පෙණෙත්. උන්වහන්සේගේ මහාපුරුෂලක්‍ෂණ දැක තථාගත බැව්හි නිශ්චයට පැමිණියෙමි.

214. එකල්හි මම මුස්න ගෙණ හැමද මල් ගෙණවුත් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

215 චතුරොඝයන් තරණය කලා වූ ආශ්‍රව රහිත වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ පුද, අඳුන්දිවිසම එකස් කොට ලොකනායක වූ තථාගතයන් වහන්සේට නමස්කාර කෙළෙමි.

216. ආශ්‍රව රහිත වූ බුදුරජානන් වහන්සේ යම් ඥණයකින් යුක්ත ව වැඩවිසූ සේක් නම්, ඒ ඥණය කියන්නෙමි. කියන්නා වූ මාගේ ඒ වචනය අසවු.

217. අම්තෝදය වූ හෙවත් අපමණ වූ දියුණුව ඇති බුදුරජානන් වහන්ස, මේ ලොකවාසී සත්‍වයා නගාලුව මැනව. ඔවුහු ඔබවහන්සේගේ දර්‍ශනය නිසා සැකය නැමැති සැඩපහර තරණය කෙරෙත්.

218. ඔබවහන්සේ ලොකයාට ශාස්තෘ වනසේක. උතුම්බැවින් ජයකොඩිය ද වනසේක. (ප්‍රකටාර්‍ථයෙන්) ධවජය ද වනසේක. (යාග) ස්තම්භය ද වනසේක. උතුම් වූ පිහිට ද වනසේක. මොහඳුර නසන ප්‍රදීපය ද වනසේක. දෙපා ඇතියනට උතුම් ද වනසේක.

219. සමුදුරෙහි ජලය නැළියකින් හෝ මිනුමට හැකි වුව ද ඔබ වහන්සේගේ සර්‍වඥතාඥනය මිනුමට නො හැක්කෝ මැයි.

220. පොළොව තරාදිතටුවක තබා දරනු හැකි වුව ද ඔබ-වහන්සේගේ සර්‍වඥතාඥනය දරන්නට නො හැක්කෝ මැ යි.

221. අහස රැහැනකින් හෝ අඟලෙන් හෝ මිනිය හැකි වුව ද ඔබවහන්සේගේ සර්‍වඥතාඥනය පමණ කරණු නො හැක්කෝ මැයි.

222. බුඬඥනය තෙම මහසමුදුරෙහි අපමණ වූ ජලය ද, අපමණ වූ මහ පොළොව ද, ඉක්මවා යයි. බුදු නැණ හා සම කරන්නට උපමාවශයෙන් (කිසිවක්) නො යෙදේ.

223. පසැස් ඇතියානන් වහන්ස, දෙවියන් සහිත ලොකයෙහි යම් පමණ සත්‍වකෙනෙකුන් පිළිබඳ ව සිත පවතී නම් එපමණ වූ මේ සත්‍ව සමූහයා ඔබ වහන්සේගේ නුවණ නමැති දැලෙහි ඇතුළට පිවිසියාහු වෙති.

224. සර්‍වඥයන් වහන්ස, ඔබ වහන්සේ යම් නුවණක් කරණ කොට ගෙණ හුදු උතුම් වූ සම්‍යක්සම්බොධියට පැමිණියාහු ද එම ඥණය කරණ කොට ගෙණ අන්‍ය තීර්‍ථකයන් මඩින්නෙහි ය.

225. ඒ **'සුරුචි'** නම් තවුස් තෙමේ * මෙම ගාථාවන්ගෙන් (උන්-වහන්සේට) ස්තුති කොට පොළොවෙහි අඳුන්දිවිසම එලා හිඳ ගත්තේ ය.

226. මේරු පර්‍වතරාජයා මහසමුදුරෙහි යොදුන් අසූසාරදහසක් ඇතුළට බැසගත්තේ එපමණ ම (යොදුන් අසූසාරදහසක්) සමුදුරෙන් උඩට නැග ඇත්තේ ය යි කියනු ලැබේ.

---

* සෙසු අටුවාවන්හි සරද තවුස්යයි දක්වා ඇත.

227. තාව අච්චුග්ගතො නෙරු ආයතො විත්ථතො ච සො,
චුණ්ණිතො අණුභෙදෙන කොටිසතසහස්සසො[1]

228. ලක්ඛෙ ඨපියමානම්හි පරික්ඛයමගච්ඡථ,
න ත්වෙව තව සබ්බඤ්ඤු ඤාණං සක්කා පමෙතවෙ[2].

229. සුඛුමච්ඡිකෙන ජාලෙන උදකං යො පරික්ඛිපෙ,
යෙ කෙචි උදකෙ පාණා අන්තොජාලීකතා සියුං.

230. තථෙව හි මහාවීර යෙ කෙචි පුථු තිත්ථියා,
දිට්ඨිගහනපක්ඛන්තා[3] පරාමාසෙන මොහිතා.

231. තව සුද්ධෙන ඤාණෙන අනාවරණදස්සිනා,
අන්තොජාලගතා[4] එතෙ ඤාණං තෙ නාතිවත්තරෙ.

232. භගවා තම්හි සමයෙ **අනොමදස්සී** මහායසො,
වුට්ඨහිත්වා සමාධිම්හා දිසං ඔලොකයී ජිනො.

233. **අනොමදස්සිමුනිනො නිසභො** නාම සාවකො,
පරිවුතො සතසහස්සෙහි සන්තචිත්තෙහි තාදිහි.

234. ඛීණාසවෙහි සුද්ධෙහි ඡළභිඤ්ඤෙහි ඣායිහි[5],
චිත්තමඤ්ඤාය බුද්ධස්ස උපෙසි[6] ලොකනායකං.

235. අන්තලික්ඛෙ ඨිතා තත්ථ පදක්ඛිණමකංසු තෙ,
නමස්සන්තා පඤ්ජලිකා ඔතරුං බුද්ධසන්තිකෙ.

236. අනොමදස්සී භගවා ලොකජෙට්ඨො නරාසභො,
භික්ඛුසඞ්ඝෙ[7] නිසීදිත්වා සිතං පාතුකරී ජිනො.

237. **වරුණො** නාමු'පට්ඨාකො සබ්බඤ්ඤුස්ස මහෙසිනො[8],
එකංසං චීවරං කත්වා අපුච්ඡි ලොකනායකං.

238. "කො නු ඛො භගවා හෙතු සිතකම්මස්ස සත්ථුනො?
න හි බුද්ධා අහෙතු හි සිතං පාතුකරොන්ති තෙ."

239. අනොමදස්සී භගවා ලොකජෙට්ඨො නරාසභො,
සඞ්ඝමජ්ඣෙ[9] නිසීදිත්වා ඉමං ගාථමභාසථ.

240. 'යො මං පුප්ඵෙන පූජෙසි ඤාණඤ්චාපි අනුත්ථවි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.'

241. බුද්ධස්ස ගිරමඤ්ඤාය සබ්බෙ දෙවා සමාගතා,
සද්ධම්මං සොතුකාමා තෙ සම්බුද්ධං උපසඞ්කමුං.

1. සහස්සියො ම. P T S 2. ඛයෙන චෙ ථෙ 3 පක්ඛන්ද ම. ථෙ. P T S.
4 ජාලීකතා. ම 5. තාදිහි. P T S. 6. උපෙනි. ථෙ.
7. භික්ඛුමජ්ඣෙ. ථෙ. 8 අනොමදස්සිස්ස සත්ථුනො. ම. ථෙ. සෙ.
9. භික්ඛුමජ්ඣෙ. ථෙ. සෙ

227. දිගුපුළුලින්නුදු එපමණ ම උඩට නැගුනු මේරුපර්වතය කෙළලක්ෂ ගණනින් අණුභෙදයෙන් සුණු කරණ ලද්දේ-

228. (එම අණු) ලක් (=අලගු) තබන කල්හි දු ක්ෂය වීමට පැමිණියයි. ඔබ වහන්සේගේ සර්වඥතාඥනය ප්‍රමාණ කරන්නට නො හැක්කේ මැ යි.

229. යමෙක් සියුම් ඇස් (=සිදුරු) ඇති දැලකින් දිය වට කරන්නේ ද, එවිට ජලයෙහි යම් කිසි ප්‍රාණි කෙනෙක් වෙත් නම්, (ඔහු) එම දැල තුළට වදින්නාහු ය.

230. මහාවීරයන් වහන්ස, එසේ ම යම් කිසි පෘථග්ජන තීර්ථක කෙනෙක් දෙසැට මිසදිටු නමැති දැලට පිවිසියාහු දෘෂ්ටිපරාමර්ශනයෙන් මුළා වූවාහු වෙද්ද.

231. ආවරණයක් නැති ව දක්නාසුලු වූ පිරිසිදු නුවණින් තෙල තීර්ථකයෝ ඔබ වහන්සේගේ නුවණ දැල තුළට පිවිස්වන ලදහ. ඔවුහු ඔබ නැණ නො ඉක්මවත්.

232. පස්මරුන් දිනූ මහා යශස් ඇති **අනවමදර්ශී** නම් භාග්‍ය-වතුන් වහන්සේ එසමයෙහි සමාධියෙන් නැගිට දිශාවලෝකනය කළසේක.

233-234. අනවමදර්ශී නම් බුදුරජානන් වහන්සේගේ **නිසභ** නම් ශ්‍රාවක තෙමේ සන්සිඳුනු සිත් ඇති (අටලෝ දහම්හි නො සැලෙන) තාදිගුණ යුත් ශුද්ධ වූ ෂඩභිඥ ඇති ධ්‍යාන කරණ සුලු වූ ලක්ෂගණන් රහතුන් විසින් පිරිවරණ ලදුයේ බුදුරජානන් වහන්සේගේ සිත දැන ඒ ලොකනායකයන් වහන්සේ වෙත එළඹියේ ය

235. එහි අහසෙහි සිටියා වූ උන්වහන්සේලා (බුදුරජානන් වහන්සේ) ප්‍රදක්ෂිණා කළාහු ය. බද්ධිලි ඇති ව නමදිමින් සර්වඥයන් වහන්සේ වෙතට බැස්සාහු ය.

236. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ පස්මරුන් දිනුවා වූ අනවමදර්ශී භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා අතර වැඩහිඳ සිනා පහළ කළසේක.

237. මහර්ෂි වූ සර්වඥයන් වහන්සේගේ **'වරුණ'** නම් උපස්ථායක තෙමේ සිවුර එකස් කොට ගෙණ ලොකනායක වූ බුදුරජානන් වහන්සේ-ගෙන් මෙසේ විචාළේ ය:-

238. 'භාග්‍යවතුන් වහන්ස, ශාස්තෘ වූ ඔබ වහන්සේගේ සිනා පහළ කිරීමට හේතුව කුමක් ද? ඒ සර්වඥ බුදුවරයෝ කරුණු රහිත ව සිනා පහළ නො කරති.'

239. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ අනවමදර්ශී භාග්‍යවතුන් වහන්සේ සංඝයා මැද හිඳ මෙ ම ගාථාව වදාළසේක:-

240. 'යම් තවුසෙක් තෙම මා මලින් පිදී ද, මාගේ (සර්වඥතා) ඥනයට නැවත නැවත සතුති කෙළේ ද, ඒ තවුසා (කවරෙක් දැයි) මම තොපට පැහැදිලි කරන්නෙමි. පවසන්නා වූ මාගේ වචනය අසවු.'

241. බුදුරජානන් වහන්සේගේ වචනය දැන සියලු දෙවියෝ එක් වූහ. සද්ධර්මය අසනු කැමැත්තා වූ ඔහු බුදුරජානන් වහන්සේ වෙත එළඹියාහු ය.

242. දසසු[1] ලොකධාතූසු දෙවතා යා[2] මහිද්ධිකා,
සද්ධම්මං සොතුකාමා තා සම්බුද්ධං උපසඞ්කමුං.

243. “හත්‍ථී අස්සා රථා පත්ති සෙනා ච චතුරඞ්ගිනී,
පරිවාරෙස්සන්ති ‘මං[3] නිච්චං බුද්ධපූජායිදං ඵලං.

244. සට්ඨිතුරියසහස්සානි භෙරියො සමලඞ්කතා,
උපට්ඨිස්සන්ති’මං[4] නිච්චං බුද්ධපූජායි’දං ඵලං.

245 සොළසිත්‍ථිසහස්සානි නාරියො සමලඞ්කතා,
විචිත්තවත්‍ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

246. අළාරපම්හා හසුලා[5] සුසඤ්ඤා තනුමජ්ඣිමා,
පරිවාරෙස්සන්ති’මං[3] නිච්චං බුද්ධපූජායි’දං ඵලං.

247. කප්පසතසහස්සානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං චක්කවත්ති රාජා රට්ඨෙ භවිස්සති.

248 සහස්සක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

249. පච්ඡිමභවෙ සම්පත්තෙ[6] මනුස්සත්තං ගමිස්සති,
බ්‍රාහ්මණී **‘සාරියා’** නාම ධාරයිස්සති කුච්ඡිනා.

250. මාතුයා නාමගොත්තෙන පඤ්ඤායිස්සත’යං නරො,
**සාරිපුත්තො** ‘ති නාමෙන තික්ඛපඤ්ඤො භවිස්සති.

251. අසීතිකොටී[7] ඡඩ්ඩෙත්වා පබ්බජිස්සත’කිඤ්චනො,
ගවෙසන්තො සන්තිපදං චරිස්සති මහිං ඉමං.

252. අපරිමෙය්‍යෙ[8] ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්‍ථා ලොකෙ භවිස්සති.

253. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
**සාරිපුත්තො** ‘ති නාමෙන හෙස්සති අග්ගසාවකො.

254. අයං භාගීරථී[9] ගඞ්ගා හිමවන්තා පභාවිතා,
මහාසමුද්දමප්පෙති තප්පයන්තී මහොදධිං.

255. තථෙවා ‘යං සාරිපුත්තො සකෙ තීසු[10] විසාරදො,
පඤ්ඤාය පාරමිං ගන්ත්වා තප්පයිස්සති පාණිනො.

256. හිමවන්තං උපාදාය සාගරඤ්ච මහොදධිං,
එත්‍ථ’න්තරෙ යං පුලිනං ගණනාතො අසඞ්ඛියං.

257. තම්පි සක්කා අසෙසෙන සඞ්ඛාතුං ගණනා යථා,
න ත්වෙව සාරිපුත්තස්ස පඤ්ඤාය’න්තො භවිස්සති.

---

1. සබ්බෙසු. ථෙ. 2. දෙවකායා. මු අ. 3. පරිවාරෙන්ති තං. P T S.
4. තං. P T S. 5 ඵාසුලා. P T S. 6. පච්ඡිමෙ භවසම්පත්තෙ. ම. ථෙ
7. කොටිං. ම. ථෙ 8. අප්පමෙය්‍ය. ම. 9. භාගීරසී. ම. P T S.
10. සාකෙ තීසු. ම ථෙ. අ.

242. දසදහස්සක්වල මහර්ධි ඇති යම් දෙවතාවෝ වෙත් ද, ඔහු සද්ධර්මය අසනු කැමැත්තාහු බුදුරජානන් වහන්සේ වෙත එළඹියාහු ය.

243. ඇත්, අස්, රිය, පාබල යන සිවුරඟ සෙනඟ නිතර මොහු පිරිවරාගන්නාහු ය. බුද්ධපූජාවෙහි මේ ඵලය යි.

244. සැට දහසක් තුර්යයෝ ද අලඞ්කාර කළ භෙරීහු ද, මොහුට නිතර (වැයීමෙන්) උවටැන් කරන්නාහු ය. මෙය බුද්ධපූජාවෙහි ඵලය යි.

245-246. මැනවින් අලඞ්කාර කරණලද විසිතුරු අබරණ ඇත්තා වූ එල්බනලද මිණිකොඩොල් ඇත්තා වූ දිග ඇසිපිහාටු ඇත්තා වූ සිනා සහිත වූ මනා වූ ශරීරාවයව ඇති සිහින් කටිප්‍රදෙශ ඇති සොලොස් දහසක් සත්‍රීහු නිරතුරු ව ම මොහු පිරිවරන්නාහු ය. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

247. කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දෙව්ලෙව්හි සිත් අලවා වසන්නේ ය. දහස්වරක් රටෙහි සක්විති රජවන්නේ ය.

248. ශක්‍රදෙවෙන්‍ද්‍ර ව දහස්වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (කරන්නා වූ) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණින් විසින් අපමණ ය.

249. අන්තිම (රහත් වන) භවය පැමිණිකල්හි මිනිසත්බවට පැමිණෙන්නේ ය. "සාරී" නම් බැමිණියගේ කුසින් දරන්නී ය.

250. මේ තැනැත්තේ මවගේ නාමගොත්‍රයෙන් ප්‍රකට වන්නේ ය. නාමයෙන් ශාරීපුත්‍ර නම් වූ තීක්‍ෂණප්‍රඥ ඇත්තෙක් වන්නේ ය.

251. අසූකෙළක් (ධනය) හැරදමා අකිඤ්චන (=ධනය නැත්තෙක්) ව පැවිදි වන්නේ ය. මොක්‍ෂපදය සොයමින් මේ පෘථිවියෙහි හැසිරෙන්නේ ය.

252. මෙයින් එකාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයක් මතුයෙහි 'ඔක්කාක' කුලයෙහි උපදින ගොත්‍රයෙන් 'ගෞතම' නම් වූ ශාස්තෘහු වහන්සේ ලොකයෙහි පහළ වන සේක.

253. උන්වහන්සේගේ ධර්මය දායාද්‍යකොට ඇති ඖරස බුද්ධපුත්‍ර වූ ධර්මයෙන් ම මවාලූවාක් වැනි වූ නමින් ශාරීපුත්‍ර නම් වූ අග්‍රශ්‍රාවක යෙක් වන්නේ ය.

254. හිමවතින් පටන් ගත් මේ 'භාගීරථී' ගඞ්ගා තොමෝ මහ සමුදුර පුරවමින් සයුරට පැමිණෙන්නී ය.

255. එසේ ම මේ ශාරීපුත්‍රතෙමේ සවකීය (කුලපරම්පරාවෙහි පවත්නා වූ) ත්‍රිවෙදයෙහි විශාරද වූයේ ප්‍රඥාවෙන් ශ්‍රාවකපාරමීඥානයෙහි තෙරට ගොස් (සියලු) සත්ත්වයන් සන්තර්පණය කරන්නේ ය.

256. හිමාලයපර්වතයෙහි පටන් මහා ජලස්කන්ධය දරන්නා වූ සයුර තෙක් මේ අතරෙහි යම් පමණ වැලිරැසක් ඇද්ද, එ ද ගණින් වසයෙන් අසඞ්ඛ්‍ය වේ.

257. ඒ වැලිරැස ද සම්පූර්ණයෙන් ගිණීමෙන් මෙ පමණ ය යි ප්‍රමාණ කරන්නට හැකි වන්නේ නුමුදු ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරක් නො වන්නේ ය.

258. ලක්ඛෙ ඨපියමානම්හි හීයෙ ගඞ්ගාය වාලුකා,
න ත්වෙව සාරිපුත්තස්ස පඤ්ඤාය'න්තො භවිස්සති.

259. මහාසමුද්දෙ ඌමියො ගණනාතො අසඞ්ඛියා,
තථෙව සාරිපුත්තස්ස පඤ්ඤාය'න්තො න හෙස්සති.

260. ආරාධයිත්වා සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
පඤ්ඤාය පාරමිං ගන්ත්වා හෙස්සති අග්ගසාවකො

261. පවත්තිතං ධම්මචක්කං සක්‍යපුත්තෙන තාදිනා,
අනුවත්තෙස්සති සම්මා[1] වස්සෙන්තො[2] ධම්මවුට්ඨියො

262. සබ්බමෙතං අභිඤ්ඤාය ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා අග්ගට්ඨානෙ ඨපෙස්සති.

263. අහො මෙ සුකතං කම්මං අනොමදස්සිස්ස සත්ථුනො,
යස්සා'හං කාරං කත්වාන සබ්බත්ථ පාරමිං ගතො.

264. අපරිමෙය්‍යෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයිං අහං.

265. අසඞ්ඛතං ගවෙසන්තො නිබ්බාණං අචලං පදං,
විචිනං තිත්ථියෙ සබ්බෙ තදා'හං සංසරිං භවෙ.

266. යථාපි ව්‍යාධිතො පොසො පරියෙසෙය්‍ය ඔසධං,
විචිනෙය්‍ය වනං[3] සබ්බං ව්‍යාධිතො පරිමුත්තියා.

267. අසඞ්ඛතං ගවෙසන්තො නිබ්බාණං අමතං පදං,
අබ්බොකිණ්ණං[4] පඤ්චසතං පබ්බජිං ඉසිපබ්බජං.

268. ජටාභාරෙන භරිතො අජිනුත්තරනිවාසනො[5]
අභිඤ්ඤාපාරමිං ගන්ත්වා බ්‍රහ්මලොකං අගච්ඡ'හං.

269. නත්ථි බාහිරකෙ[6] සුද්ධි ඨපෙත්වා ජිනසාසනං,
යෙ කෙචි බුද්ධිමා සත්තා සුජ්ඣන්ති ජිනසාසනෙ.

270. අත්තකාරමයං[7] එතං නයිදං ඉතිහීතිහං,[8]
අසඞ්ඛතං ගවෙසන්තො කුතිත්ථෙ සඤ්චරිං අහං.

1. අනුවත්තිස්සති සද්ධම්මං. ම. ඡ. 2. වස්සන්තො. ම. ඡ. PTS. සෙ.
3. ඛනං ම. ඡ. 4. අව්‍යාකිණ්ණං. PTS. 5. නිවාසන. ම. PTS. සෙ.
6. බාහියකෙ. ඡ. 7. අත්තකාමං මමං. PTS සෙ.
8. ඉතිහං තදා. PTS සෙ.

258. අලගු තබන කල්හි ද ගඞ්ගා නම් නදියෙහි වැලි අවසන් වන්නේ ය. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරක් නො වන්නේ මැ යි.

259. මහසයුරෙහි රළ ගණන් වශයෙන් මෙපමණයයි සඞ්ඛ්‍යා කළ හැකි නො වේ. එසේ ම ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරක් නො වන්නේ ය.

260. ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨ වූ ගෞතම සම්මා සම්බුදුරජානන් වහන්සේ සතුටු කොට ප්‍රඥාවෙන් ශ්‍රාවක පාරමීඥානයෙහි තෙරට ගොස් අග්‍රශ්‍රාවක යෙක් වන්නේ ය.

261. තාදිගුණ ඇති (=අටලෝ දහම්හි නො සැලෙන) (සර්වඥ වූ) ශාක්‍යපුත්‍රයන් වහන්සේ විසින් පවත්වනලද ධර්මචක්‍රය දහම්වැසි වස්වමින් මැනවින් ඒ අනු ව පවත්වන්නේ ය

262. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතමබුදුරජානන් වහන්සේ මේ සියල්ල වෙසෙසින් නුවණින් දැන භික්ෂුසංඝයා මධ්‍යයෙහි හිඳ අග්‍රස්ථානයෙහි තබන්නේ ය.

263. **"අනවමදර්ශී"** බුදුරජානන් වහන්සේගේ සමීපයෙහි මා විසින් පුණ්‍යකර්මයක් මැනවින් කරණ ලදි. ආශාවසීයෙකි. යම් ඒ අනවමදර්ශී නම් බුදුවරයෙක් වී ද, උන්වහන්සේ විෂයයෙහි එකී පුණ්‍යසම්භාරය කොට සකලගුණසමූහයෙහි පරතෙරට ගියේ වෙමි.

264. අපමණ කලක් මුළුල්ලෙහි මා විසින් කරණ ලද කුශලකර්ම ඵලය මේ පශ්චිමාත්මභාවයෙහි දී දක්වී ය. දක්ෂ දුනුවායෙකු විදි හීයෙහි වෙගය මෙන් සුමිදුනෙමි. මම කෙලෙස් දැවීමි.

265. හෙතුප්‍රත්‍යයයන්ගෙන් සකස් නො වූ නිශ්චල වූ නිර්වාණපදය සොයන්නෙම් සියලු තීර්ථකයන් පරීක්ෂා කරන්නෙම් එකල්හි මම භවයෙහි සැරිසැරිමි.

266. ලෙඩකින් පෙළෙන්නා වූ පුරුෂයෙක් තෙම ලෙඩින් මිදීම පිණිස ඖෂධයක් සොයන්නේ යම්සේ සියලු වනය පරීක්ෂා කරන්නේ ද,

267. (එසේ) අසංස්කෘත වූ අමෘතපදය වූ නිර්වාණය සොයන්නා වූ මම අච්ඡින්න ව (=නො කඩ කොට පිළිවෙළින්) පන්සියයක් අත්බැව්හි ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වීමි.

268. මම තවුස් දළමඬුලුබරින් බර වූයෙම් අදුත්දිවිසමින් කළ උතුරුසළු පොරවන්නෙම් අභිඥාවන්ගේ පරතෙරට පැමිණ බඹලොවට ගියෙමි.

269. බුදුසසුනෙහි හැර ඉන් පිට සසුනක ශුද්ධියක් නැත. බුද්ධිමත් වූ කිසියම් සත්ත්වකෙනෙක් වෙත් නම් ඔහු සර්වඥශාසනයෙහි දී පිරිසුදු වෙති.

270. එය (=ඒ පිරිසිදු වීම) ම විසින් කරණ ලද්දක් ම ය (= මගේ අත් දැකීමක් ම ය). 'මෙය මෙසේ විය. මෙසේ වී ය' යි කියන ආරාංචියක් නො වේ. මම නිවණ සොයන්නෙම් වැරදි තීර්ථයන්හි හැසුරුනෙමි.

271. යථා සාරත්ථිකො පොසො කදලිං ඡෙත්වාන ඵාලයෙ,
න තත්ථ සාරං වින්දෙය්‍ය සාරෙන රිත්තකො හි සො.

272 තථෙව තිත්ථියා ලොකෙ නානාදිට්ඨී බහුජ්ජනා,
අසඞ්ඛතෙන රිත්තා'සෙ[1] සාරෙන කදලී යථා.

273. පච්ඡිමභවෙ සම්පත්තෙ[2] බ්‍රහ්මබන්ධු අහොස'හං,
මහාභොගං[3] ඡඩ්ඩයිත්වා පබ්බජිං අනගාරියං.

(පඨමභාණවාරං)

274. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
බ්‍රාහ්මණො සඤ්ජයො නාම තස්ස මූලෙ වසාමහං.

275. සාවකො තෙ මහාවීර අස්සජි නාම බ්‍රාහ්මණො,
දුරාසදො උග්ගතෙජො පිණ්ඩාය චරතී තදා.[4]

276. තමද්දසාසිං[5] සප්පඤ්ඤං මුනිං මොනෙ සමාහිතං,
සන්තචිත්තං මහානාගං සුඵුල්ලං පදුමං යථා.

277. දිස්වා මෙ චිත්තමුප්පජ්ජි[6] සුදන්තං සුද්ධමානසං,
උසභං පවරං වීරං අරහා'යං භවිස්සති.

278. පාසාදිකො ඉරියති අභිරූපො සුසංවුතො,
උත්තමෙ දමථෙ දන්තො අමතදස්සී[7] භවිස්සති.

279. යන්නූනා'හං උත්තමත්ථං පුච්ඡෙය්‍යං තුට්ඨමානසං,
සො මෙ පුට්ඨො කථෙස්සති පටිපුච්ඡාම'හං තදා.

280. පිණ්ඩපාතං[8] චරන්තස්ස පච්ඡතො අගමාස'හං,
ඔකාසං පටිමානෙන්තො පුච්ඡිතුං අමතං පදං.

281 වීථන්තරෙ[9] අනුප්පත්තං උපගන්ත්වාන පුච්ඡි'හං,
කථං ගොත්තො'සි ත්වං වීර කස්ස සිස්සො'සි මාරිස?

282. සො මෙ පුට්ඨො වියාකාසි අසම්භීතොව[10] කෙසරී,
බුද්ධො ලොකෙ සමුප්පන්නො තස්ස සිස්සො'ම්හි ආවුසො.

283. කීදිසං තෙ මහාවීර අනුජාත මහායස,[11]
බුද්ධස්ස සාසනං ධම්මං? සාධු මෙ කථයස්සු භො.

1. රිත්තාව. P T S. 2. පච්ඡිමෙ භව. ම. ඡෙ. 3. කොටියො සතං. P T S. 4 සදා. P T S 5. තමද්දසාහං. ම. ඡෙ. තමද්දසාමි. සෙ 6. චිත්තිමුප්පජ්ජි ම. ඡෙ. 7. අනොමදස්සී. ම. 8. පිණ්ඩචාරං. P T S. 9 වීථිත්තරෙ. ම. ඡෙ. 10. අජම්භීතොව. ඡෙ. 11. මහායසො. P T S.

271 යම් සේ හර කැමැත්තා වූ පුරුෂයෙක් තෙම කෙසෙල්ගසක් කපා පළන්නේ ද, හෙතෙම එහි හරයක් නො ලබන්නේ ය. ඒ කෙසෙල්ගස හරයෙන් හිස් වූවක් ම ය.

272. එසේ ම ලෝකයෙහි තීර්ථකයෝ ද නානාදෘෂ්ටි ගත් බොහෝ දෙන ද නිවණින් හිස් වූවෝ ම වෙති. හරයෙන් හිස් වූ කෙසෙල්ගස මෙනි.

273. අනතිමජාතියෙහි මම බ්‍රාහමණකුලයෙහි උපන්නෙක් වීමි. මහත් වූ භොගසකන්ධය හැර අනගාරයයි සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි.

(පළමුවැනි බණවර යි.)

274. වෙද හදාරන්නා වූ මන්ත්‍රධර වූ ත්‍රිවෙදයෙහි පරතෙරට ගිය **සඤ්ජය** නම් බමුණෙක් වි ය. මම ඔහුගේ සමීපයෙහි වසමි.

275 මහාවීරයන් වහන්ස, **"අස්සජි"** නම් බ්‍රාහමණ තෙම ඔබ වහන්සේගේ ශ්‍රාවකයෙක් වි ය. එකල්හි ලං විය නො හැක්කා වූ උග්‍ර වූ තෙජස් ඇති උන්වහන්සේ පිඩු පිණිස හැසිරෙණ සේක.

276. මැනවින් පිපි පියුමක් වැනි වූ අතිශ්‍රෙෂ්ඨ වූ සත්පුන් සිත් ඇති සප්‍රාඥ වූ මෞන ධර්මවිෂයයෙහි එකඟ සිත් ඇති ඒ අස්සජි ස්ථවිරයන් වහන්සේ දුටුවෙමි.

277. මනා ව දැමුනා වූ පිරිසිදු සිත් ඇති ශ්‍රෙෂ්ඨ වූ උත්තම වූ වීර වූ උන්වහන්සේ දැක හෙතෙම රහත් කෙනෙක් වන්නේ ය යි මට සිතක් උපන.

278. දුටුවන් පහදවන්නේ ඉරියවු පවත්වයි. මනා රූ ඇත්තේ ය. සංවරණය කල ඉඳුරන් ඇත්තේ ය. උතුම් දමනයෙන් දැමුනේ ය. නිවන් දක්නාසුලු වූවෙක් වන්නේ ය.

279. මම සතුටු සිත් ඇති උන්වහන්සේගෙන් (තමන් වහන්සේ පැමිණ සිටින) උතුම් ඵලය ගැන විචාරන්නෙම් නම් ඉතා යෙහෙකි. මා විසින් විචාරණ ලද හෙතෙම එය කියන්නේ ය. එකල්හි මම නැවත වචාරමි.

280. මම අමෘතපදය ගැණ විචාරන්නට අවසරයක් බලමින් පිඩු පිණිස හැසිරෙන්නා වූ උන්වහන්සේ පසුපස ගියෙමි.

281. මම වීථිය තුළට පැමිණි උන්වහන්සේ වෙත එළඹ 'වීරයන් වහන්ස, ඔබ වහන්සේ කිනම් ගොත්‍ර ඇති සේක් ද? නිදුකානන් වහන්ස, කවරෙකුගේ ශිෂ්‍යයෙක් වන සේක්ද' යි විචාළෙමි.

282. මා විසින් විචාරණලද උන්වහන්සේ කෙශරසිංහයකු මෙන් නිර්භීත ව මෙසේ ප්‍රකාශ කල සේක:- බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සේකි. ඇවැත්නි, මම උන්වහන්සේගේ ශිෂ්‍යයෙක් වෙමි.'

283. 'අනුජාත (බුද්ධ) පුත්‍රයානෙනි, මහා යශස් ඇත්තානෙනි, මහා වීරයානෙනි, ඔබගේ ඒ බුදුරජානන් වහන්සේගේ ශාසනධර්මය කෙබඳු ද? පින්වත, මට යහපත් ලෙස ශාසනය පවසනු මැනව.'

284. සො මෙ පුට්ඨො කථී[1] සබ්බං ගම්භීරං නිපුණං පදං,
තණ්හාසල්ලස්ස හන්තාරං සබ්බදුක්ඛාපනූදනං.[2]

285. “යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො, එවංවාදී මහාසමණො”

286. සො’හං විස්සජ්ජිතෙ පඤ්හෙ පඨමං ඵලමජ්ඣගං,
විරජො විමලො ආසිං සුත්වාන ජිනසාසනං.

287 සුත්වාන මුනිනො වාක්‍යං පස්සිත්වා ධම්මමුත්තමං,
පරියොගාළ්හසද්ධම්මො ඉමං ගාථං අභාස’හං.

288. “එසෙ’ව ධම්මො යදි තාවදෙව පච්චබ්‍යථා පදමසොකං,
අදිට්ඨං අබ්භතීතං බහුකෙහි[3] කප්පනහුතෙහි.

289. ස්වාහං ධම්මං ගවෙසන්තො කුතිත්ථෙ සඤ්චරිං අහං,
සො මෙ අත්ථො අනුප්පත්තො කාලො මෙ නප්පමජ්ජිතුං”.

290. තොසිතො’හං අස්සජිනා පත්වාන අචලං පදං,
සහායකං ගවෙසන්තො අස්සමං අගමා’සහං.

291. දූරතොව මමං දිස්වා සහායො මෙ සුසික්ඛිතො,
ඉරියාපථසම්පන්නො[4] ඉදං වචනමබ්‍රවී.

292 පසන්නමුඛනෙත්තො’සි මුනිභාවොව දිස්සති
අමතාධිගතො කච්චි නිබ්බාණං අච්චුතං පදං?

293. සුභානුරූපො ආයාසි ආනෙඤ්ජකාරිතො විය,
දන්තොව දන්තදමථෙ[5] උපසන්තොසි බ්‍රාහ්මණ.

294. අමතං මයා අධිගතං සොකසල්ලපනූදනං[6],
ත්වම්පි තං අධිගච්ඡාහි[7] ගච්ඡාම බුද්ධසන්තිකං.

295. ‘සාධූ’ති සො පටිස්සුත්වා[8] සහායො මෙ සුසික්ඛිතො,
හත්ථෙන හත්ථං ගණ්හිත්වා උපාගම්[9] තව’න්තිකං.[10]

1. කථං. ම. 2. දුක්ඛ-ම. ථෙ. 3. බහූහි. ම.
4. අරියාපථං මම. දිස්වා. ම. ථෙ. 5. දන්තොවුත්තමදමථෙ. මු. අ.
6. සල්ල විසොධනං ථෙ. සල්ලවිනොදං P T S. සෙ. 7. අධිගච්ඡසි ම P T S. සෙ
8. සාධූති පටිසුණිත්වා. ම. ථෙ. සෙ 9. උපගම්ම. ම.
10 සප්පුසන්තිකං P T S.

284. මාවිසින් විචාරණලද හෙතෙමේ ගැඹුරු වූ සියුම් වූ තෘෂ්ණා නැමැති හුල නැති කරන්නා වූ සියලු දුක් දුරු කරන්නා වූ අමෘත පද සඞ්ඛ්‍යාත ධර්මය මෙසේ පැවැසී ය:

285. "හෙතුප්‍රභව වූ හෙවත් හේතූන් නිසා ඇති වන්නා වූ යම් ඵලධර්ම කෙනෙක් ඇත් නම්, එම (ඵල) ධර්මයන්ගේ හෙතුධර්ම ද, තථාගතයන් වහන්සේ වදාළසේක. (එසේ ම උන්වහන්සේ) එකී හෙතුධර්මයන්ගේ වැළැක්ම (=නිරෝධය) ද (හෙතු නිරොධයෙන් ඇති වන්නාවූ ඵලනිරොධය ද) වදාළසේක. මහාශ්‍රමණ වූ බුදුරජානන් වහන්සේ මෙබඳු කථා ඇති සේක".

286. ඒ මම ප්‍රශ්නය (මෙසේ) විසඳූ කල්හි ප්‍රථමඵලයට හෙවත් සෝවාන්ඵලයට පත් වීමි. එම බුද්ධානුශාසනය අසා කෙලෙස් රජස් රහිත වූ නිර්මල වූවෙක් වීමි.

287. (අස්සජි) තෙරුන්ගේ වචනය අසා උත්තම වූ ධර්මය (ආර්‍ය්‍ය මාර්ගඥානයෙන්) දැක බැසගන්නාලද බුදුසසුන් ඇත්තෙම් මෙ ම ගාථාව කීමි:-

288. "ඉදින් මෙපමණක් වුවත් ධර්මය මෙය මැ යි. ඔබ නිර්වාණ පදය ප්‍රතිවෙධ කෙළෙහි ය. බොහෝ වූ කල්ප නහුත ගණනක් අප විසින් නො දක්නාලදු ව ඉක්මගිය ඒ නිර්වාණපදය ඔබ වහන්සේ ප්‍රතිවෙධ කළ සේක.

289. ඒ මම ධර්මය සොයන්නෙම් කුතීර්ථයන්හි හැසුරුණෙමි. සෙවිය යුතු ඒ අර්ථය ම විසින් ලබන ලදී. මට පමා නො වන්නට කාලය වේ."

290. මම **අස්සජි** තෙරුන් විසින් සතුටු කරණ ලද්දෙම් වෙමි. මම නිශ්චල වූ අමෘතපදයට (=සෝවාන් ඵලයට) පැමිණ මිත්‍රයා (=**කොලිත**) සොයමින් අසපුවට ගියෙමි.

291. මතා ව හික්මුනා වූ මාගේ මිත්‍ර තෙමේ දුර දී ම සන්හුන් ඉරියව් වලින් යුතු වූ මා දැක මෙ ම වචනය කී ය:-

292. "ඔබ පහන් වූ මුහුණ හා නෙත් ඇත්තේ ය. මුනිභාවය ම පෙණේ. කිම, අමෘතය (=නිවණ) අවබෝධ කෙළේ ද? අච්‍යුත සඞ්ඛ්‍යාත නිර්වාණ පදය අවබොධ කෙළේ ද?

293. බ්‍රාහ්මණය, උත්තම දමථයෙන් (තෙමසක් හෙණ්ඩු ආදියෙන්) හික්මවනලද ඇතකු මෙන් පහන් පැහැයට සුදුසු ව එන්නේ ය. (ඔබ) සන්සිඳුනේ ද?"

294. "ශොකය නැමැති හුල දුරු කරන්නා වූ (ඇද දමන්නා වූ) අමෘතය (නිවණ) මා විසින් අවබොධ කර ගන්නාලදී. ඔබ ද එය අවබොධ කර ගන්න. අපි බුදුරජානන් වහන්සේ සමීපයට යමු".

295. හික්මුනා වූ ඒ මාගේ යහළු තෙමේ මැනවැයි පිළිවදන් දී අතින් අත ගෙණ ඔබවහන්සේගේ සමීපයට පැමිණියේ ය.

296. උභොපි පබ්බජිස්සාම සක්‍යපුත්ත තව'න්තිකෙ[1],
තව සාසනමාගම්ම විහරාම අනාසවා.

297. **කොලිතො** ඉද්ධියා සෙට්ඨො අහං පඤ්ඤාය පාරගො,
උභොව එකතො හුත්වා සාසනං සොභයාමසෙ.

298. අපරියොසිතසඞ්කප්පො කුතිත්ථෙ සඤ්චරිං අහං,
තව දස්සනමාගම්ම සඞ්කප්පො පූරිතො මම.

299. පඨවියං පතිට්ඨාය පුප්ඵන්ති සමයෙ දුමා,
දිබ්බගන්ධා සම්පවන්ති තොසෙන්ති සබ්බපාණිනං[2].

300 තථෙවා'හං මහාවීර සක්‍යපුත්ත මහායස,
සාසනෙ තෙ පතිට්ඨාය සමයෙ'සාමි පුප්ඵිතුං.

301. විමුත්තිපුප්ඵං එසන්තො භවසංසාරමොචනං,
විමුත්තිපුප්ඵලාභෙන තොසෙමි සබ්බපාණිනං.

302 යාවතා බුද්ධඛෙත්තම්හි ඨපෙත්වාන මහාමුනිං,
පඤ්ඤාය සදිසො නත්ථි තව පුත්තස්ස චක්ඛුම.

203. සුවිනීතා ච තෙ සිස්සා පරිසා ච සුසික්ඛිතා,
උත්තමෙ දමථෙ දන්තා පරිවාරෙන්ති තං සදා.

304. ඣායී ඣානරතා ධීරා සන්තචිත්තා සමාහිතා,
මුනී මොනෙය්‍යසම්පන්නා පරිවාරෙන්ති තං සදා.

305. අප්පිච්ඡා නිපකා ධීරා අප්පාහාරා ආලොලුපා,
ලාභාලාභෙන සන්තුට්ඨා පරිවාරෙන්ති තං සදා.

306. ආරඤ්ඤකා ධුතධරා ඣායිනො ලූඛචීවරා,
විවෙකාභිරතා ධීරා පරිවාරෙන්ති තං සදා.

307. පටිපන්නා ඵලට්ඨා ච සෙඛා ඵලසමඞ්ගිනො,
ආසිංසකා[3] උත්තමත්ථං පරිවාරෙන්ති තං සදා.

308. සොතාපන්නා ච විමලා සකදාගාමිනො ච යෙ,
අනාගාමී ච අරහා පරිවාරෙන්ති තං සදා.

309. සතිපට්ඨානකුසලා බොජ්ඣඞ්ගභාවනාරතා,
සාවකා තෙ බහූ සබ්බෙ පරිවාරෙන්ති තං සදා.

1. සක්‍යපුත්තස්ස සන්තිකෙ. ථෙ. 2. (එවං සබ්බත්ථ) 3. ආසිසකා ම. ථෙ.

296. ශාක්‍යපුත්‍රයානන් වහන්ස, ඔබවහන්සේගේ සමීපයෙහි (අපි) දෙදෙන ම පැවිදි වන්නෙමු. ඔබවහන්සේගේ අවවාදය ලැබ ආශ්‍රව රහිත ව වසමු.

297. කොලිතතෙමේ ඍද්ධියෙන් ශ්‍රෙෂ්ඨ ය. මම ප්‍රඥාවේ පරතෙරට ගියෙමි. දෙදෙන ම එක් ව සසුන හොබවමු.

298. කෙළවරට නො පත් බලාපොරොත්තු ඇත්තෙම් කුතීර්ථියන්හි හෙවත් නො යා යුතු මගෙහි හැසුරුණෙමි. ඔබවහන්සේ දැකීම නිසා මාගේ බලාපොරොත්තුව සම්පූර්ණ වි ය.

299. පොළොවෙහි පිහිටා වෘක්ෂයෝ (සුදුසු) කාලයෙහි පිපෙත්. දිව සුවඳ හමත්. සියලු ප්‍රාණීන් සතුටු කරත්.

300. මහාවීරයන් වහන්ස, ශාක්‍යපුත්‍රයන් වහන්ස, මහා යශස් ඇත්තානන් වහන්ස, එසේ ම ඔබ වහන්සේගේ සසුනෙහි පිහිටා (රහත්මග නුවණින්) පිපෙන්නට (සුදුසු) කාලය සොයමි.

301. භවසංසාරයෙන් මුදවන්නා වූ විමුක්තිය නැමැති පුෂ්පය සොයන්නෙම් දැන් එම විමුක්තිපුෂ්පලාභයෙන් සියලු සත්ත්වයන් සතුටු කරමි.

302. පසැස් ඇත්තානන් වහන්ස, බුද්ධක්ෂේත්‍රය යම් පමණ වේ නම්, ඒ සියලු තන්හි (කෝටිලක්ෂයක් සක්වල) සම්මා සම්බුදුරජානන් වහන්සේ හැර ප්‍රඥාවෙන් ඔබවහන්සේගේ පුත්‍රයාට (=ශාරිපුත්‍රයන්ට) සමාන කෙනෙක් නැත.

303. ඔහුගේ ශිෂ්‍යයෝ ද සුවිනීතයෝ ය. පිරිස ද මැනවින් හික්මුනෝ ය. උතුම් ශික්ෂාවෙහි දමනය වූවෝ හැම කල්හි ඔහු ඒ ශාරිපුත්‍රයන් පිරිවරත්.

304. ධ්‍යාන කරණ සුලු වූ ධ්‍යානයෙහි ඇලුනාවූ ධෛර්‍ය්‍යවත් වූ ශාන්ත සිත් ඇති සත්පුරුෂයන් වූ නැණවත් මෞන නම් වූ නුවණින් යුත් භික්ෂූහු හැම කල්හි ඔහු පිරිවරත්.

305. අල්පේච්ඡ වූ ප්‍රාඥ වූ ධෛර්‍ය්‍යවත් වූ සවල්පාහාර ගන්නා වූ ලොල් නො වූ ලාභ අලාභ දෙකෙහි සම ව සතුටු වන්නා වූ භික්ෂූහු ඔහු පිරිවරත්.

306. අරණෙහි වසන්නා වූ (=ආරණ්‍යක) ධුතාඞ්ගධාරී වූ ධ්‍යාන කරන්නා වූ රූක්ෂචීවරධාරී (=පාංශුකූල සිවුරු දරන්නා) වූ විවේක යෙහි ඇලුනා වූ ධෛර්‍ය්‍යවත් වූ (භික්ෂූහු) හැමකල්හි ඔහු පිරිවරත්.

307. සිවුමගට පැමිණියෝ ද රහත්පෙළෙහි සිටියෝ ද යට තුන් පෙළෙන් යුතු වූවෝ ද යන මේ ආර්‍ය්‍ය භික්ෂූහු අටදෙන නිවණ බලාපොරොත්තුවෙන් හැම කල්හි ඔහු පිරිවරත්.

308. යම්, පිරිසිදු වූ සෝතාපත්තිමාර්ගඵලයට පැමිණියෝ ද සකෘදාගාමීහු ද අනාගාමීහු ද රහත්හු ද. වෙත් නම්, ඔහු හැම කල්හි ඔහු පිරිවරත්.

309. (සතර) සතිපට්ඨානයන්හි දක්ෂ වූ ද (සප්ත) බොධ්‍යඞ්ග භාවනාවෙහි ඇලුනාවූ ද, බොහෝ වූ ඒ සියලු ශ්‍රාවකයෝ හැමකල්හි ඔහු පිරිවරත්.

310. ඉද්ධිපාදෙසු[1] කුසලා සමාධිභාවනාරතා,
සම්මප්පධානමනුයුත්තා පරිවාරෙන්ති තං සදා.

311. තෙවිජ්ජා ඡළභිඤ්ඤා ච ඉද්ධියා පාරමිං ගතා,
පඤ්ඤාය පාරමිං පත්තා පරිවාරෙන්ති තං සදා.

312. එදිසා තෙ මහාවීර තව සිස්සා සුසික්ඛිතා,
දුරාසදා උග්ගතෙජා පරිවාරෙන්ති තං සදා.

313. තෙහි සිස්සෙහි පරිවුතො සඤ්ඤතෙහි තපස්සිහි,
මිගරාජාව'සම්භීතො[2] උළුරාජාව සොභසි.

314. පථවියං පතිට්ඨාය රුහන්ති ධරණීරුහා,
වෙපුල්ලතං පාපුණන්ති ඵලඤ්ච දස්සයන්ති තෙ.

315. පථවීසදිසො ත්වං'සි සක්‍යපුත්ත මහායස,
සාසනෙ තෙ පතිට්ඨාය ලභන්ති අමතං ඵලං.

316. සින්ධු සරස්සතී චෙව නදියො චන්දභාගිකා[3],
ගඞ්ගා ච යමුනා චෙව සරභූ ච අථො මහී.

317. එතාසං සන්දමානානං සාගරො සම්පටිච්ඡති,
ජහන්ති පුරිමං නාමං සාගරොත්වෙ'ව ඤායති.

318. තථෙ'විමෙ චතුබ්බණ්ණා[4] පබ්බජිත්වා තව'න්තිකෙ,
ජහන්ති පුරිමං නාමං බුද්ධපුත්තාති ඤායරෙ.

319. යථාපි චන්දො විමලො ගච්ඡං ආකාසධාතුයා,
සබ්බෙ තාරාගණෙ ලොකෙ ආභාය අතිරොචති.

320. තථෙව ත්වං මහාවීර පරිවුතො දෙවමානුසෙ,
එතෙ සබ්බෙ අතික්කම්ම ජලසි සබ්බදා තුවං.

321. ගම්භීරෙ උට්ඨිතා ඌමී න වෙලං අතිවත්තරෙ,[5]
සබ්බාව වෙලං[6] ඵුසන්ති, සඤ්චුණ්ණා විකිරන්ති තා.

322. තථෙව තිත්ථියා ලොකෙ නානාදිට්ඨී බහුජ්ජනා,
ධම්මං වදිතුකාමා[7] තෙ නාතිවත්තන්ති තං මුනිං.

323. සචෙ ච තං පාපුණන්ති පටිවාදෙහි[8] චක්ඛුම,
තවන්තිකං උපාගන්ත්වා සඤ්චුණ්ණාව භවන්ති තෙ.

324. යථාපි උදකෙ ජාතා කුමුදා මන්දාලකා[9] බහූ,
උපලිම්පන්ති තොයෙන කද්දම[10] කලලෙන ච.

325. තථෙව බහුකා සත්තා ලොකෙ ජාතා විරූහරෙ,
අට්ටිතා රාගදොසෙන කද්දමෙ කුමුදං යථා.

326. යථාපි පදුමං ජලජං ජලමජ්ඣෙ විරූහති,
න සො[11] ලිම්පති තොයෙන පරිසුද්ධො[12] හි කෙසරී.

1. ඉද්ධිපාදෙ ච. ම. 2. ජම්භිතො. ථෛ. 3. භාගියො. P T S.
4. චතුවණ්ණා. ම. P T S. 5. අතිවත්තන්ති ම. P T S. සෙ.
6. සබ්බා වෙලං. ම. P T S. ථෛ. 7. වාදිතුකාමා ම. ථෛ. ධාරිතුකාමා. P T S. සෙ.
8. පරිවාරෙසි සෙ. 9. මද්දාලකා. P T S. 10. කද්දමං ම. ථෛ.
11. තං ථෛ. 12. පරිසුද්ධං ථෛ.

310. (සතර වැදෑරුම්) ඍද්ධිපාදයන්හි දක්‍ෂවූවෝ ද, සමාධි භාවනාවෙහි ඇළුනෝ ද (සතර) සම්‍යක් ප්‍රධානයෙහි යෙදුනෝ ද ඔහු හැමකල්හි පිරිවරත්.

311. ත්‍රිවිද්‍යා ඇත්තෝ ද, ෂඩභිඥා ඇත්තෝ ද ඍද්ධියෙන් හා ප්‍රඥාවෙන් පරතෙරට ගියෝ ද ඔහු හැම කල්හි පිරිවරත්.

312. මහාවීර වූ බුදුරජානන් වහන්ස, මැනවින් හික්මුනා වූ ලං විය නො හැක්කා වූ උග්‍ර වූ තෙජස් ඇති ඒ මෙබඳු වූ ඔබවහන්සේගේ ශිෂ්‍යයෝ ඔහු හැමකල්හි පිරිවරත්.

313. සංයත වූ කෙලෙස් තවන ගුණ ඇති එම ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලද්දා වූ ද හෙතෙම බිය රහිත සිහරදකු මෙන් ද චන්‍ද්‍රයා මෙන් ද බබලන්නේ ය.

314. වෘක්‍ෂයෝ පොළොවෙහි පිහිටා වැඩෙත්. මහත්බවට ද පැමිණෙත්. ඒ වෘක්‍ෂයෝ ඵල ද දක්වත් (=ඵල දරත්).

315. (එසේම) ශාක්‍යපුත්‍රයන් වහන්ස, මහා යශස් ඇත්තානන් වහන්ස, ඔබවහන්සේ පොළොව සමාන වනසේක. ඔබවහන්සේගේ සසුනෙහි පිහිටා ඒ උතුමෝ අමෘතඵලය (නිවණ) ලබත්.

316-317. සින්ධු ය, සරසවතී ය, චන්‍ද්‍රභාගී ය, ගඞ්ගා ය, යමුනා ය, සරභූ ය, මහී ය, යන මේ ගඞ්ගාවෝ වෙත් ද, ගලා බස්නා වූ මේ ගඞ්ගාවන්ගේ ජලය සාගරය පිළිගණී. (සයුරට වැටීමෙන් පසු සින්ධු ජලය ගඞ්ගා ජලය යන) පළමු නම් අත්හරියි. සාගරය ලෙස ම ප්‍රකට වේ.

318. එසේ ම මේ කුල සතරට අයත් වූවෝ ඔබවහන්සේගේ සමීපයෙහි පැවිදි ව පළමු නම හරිත්. බුද්ධපුත්‍රයෝ ය යි ප්‍රකට වෙත්.

319. යම් සේ අහසෙහි ගමන් කරන්නා වූ නිර්මල වූ චන්‍ද්‍රයා සියලු තාරකාසමූහය ස්වකීයප්‍රභාවෙන් මැඩ ලෝකයෙහි අතිශයින් බබලා ද,

320. එසේ ම මහාවීරයන් වහන්ස, ඔබවහන්සේ දෙවිමිනිසුන් විසින් පිරිවරණ ලදසේක් මේ සියලු දෙන ඉක්මවා හැම කල්හි ඔබවහන්සේ ම බබලනසේක.

321. ගැඹුරු දියෙහි නැගුනු රළහු වෙරළ නො ඉක්මවත්. ඒ සියලු ම රළහු වෙරළෙහි හැපෙත්. කැඩී ගිය ඒ රළහු (වෙරළෙහි ම) විසිරී යත්.

322. එසේ ම ලොකයෙහි තීර්ථකයෝ ද නොයෙක් ලබ්ධි ඇති තීර්ථක වූ බොහෝ දෙනා ද ධර්මය දෙසනු කැමැත්තාහු ඒ බුදුරජානන් වහන්සේ නො ඉක්මවත්.

323. පසැස් ඇත්තානන් වහන්ස, ඉදින් (යමෙක් ඒ ඒ ලබ්ධි ගෙණ විරුද්ධවාදයෙන් වාද කිරීමට) ඔබ කරා පැමිණෙත් ද, ඔහු ඔබවහන්සේ සමීපයට පැමිණ සුණු විසුණු වෙත්.

324. දියෙහි හටගත් කුමුදු ද මඳලා නම් ජලජපුෂ්ප ද අනිකුත් බොහෝ ජලජපුෂ්පයෝ ද යම් සේ දියෙන් ද මඩින් ද තැවරී පවතිත් ද,

325. එසේ ම ලොකයෙහි උපන්නා වූ බොහෝ සත්ත්වයෝ මඩෙහි කුමුදු මෙන් රාගද්වෙෂයන්ගෙන් පීඩිත වූවෝ වැඩෙත්.

326. යම් සේ ජලයෙහි හටගන්නා වූ පියුම දිය මැද වැඩේ ද, එය දියෙන් නො ම තැවරෙයි. පියුම පිරිසිදු මැයි.

327. තථෙව ත්වං මහාවීර ලොකෙ ජාතො මහාමුනි,
නො පලිම්පසි[1] ලොකෙන තොයෙන පදුමං යථා.

328. යථාපි රම්මකෙ මාසෙ බහූ පුප්ඵන්ති වාරිජා,
නාතික්කමන්ති තං මාසං සමයො පුප්ඵනාය සො.

329. තථෙව ත්වං සක්‍යපුත්ත පුප්ඵිතො තෙ විමුත්තියා,
සාසනං නාතිවත්තන්ති[2] පදුමං වාරිජං යථා.

330. සුපුප්ඵිතො සාලරාජා දිබ්බං ගන්ධං පවායති,
අඤ්ඤසාලෙහි පරිවුතො සාලරාජාව සොභති.

331. තථෙව ත්වං මහාවීර බුද්ධඤාණෙන පුප්ඵිතො,
භික්ඛුසඞ්ඝපරිවුතො සාලරාජාව සොභසි.

332. යථාපි සෙලො හිමවා ඔසධො සබ්බපාණිනං,
නාගානං අසුරානඤ්ච දෙවතානඤ්ච ආලයො.

333. තථෙව ත්වං මහාවීර ඔසධො විය පාණිනං,
තෙවිජ්ජා ඡළභිඤ්ඤා ච ඉද්ධියා පාරමිං ගතා.

334. අනුසිට්ඨා මහාවීර තයා කාරුණිකෙන තෙ,
රමන්ති ධම්මරතියා වසන්ති තව සාසනෙ.

335. මිගරාජා යථා සීහො අභිනික්ඛම්ම ආසයා,
චතුද්දිසා විලොකෙත්වා[3] තික්ඛත්තුං අභිනාදති[4].

336. සබ්බෙ මිගා උත්තසන්ති මිගරාජස්ස ගජ්ජතො,
තථා හි ජාතිමා එසො පසූ[5] තාසෙති සබ්බදා.

337. ගජ්ජතො තෙ මහාවීර වසුධා සම්පකම්පති,[6]
බොධනෙය්‍යං'වබුජ්ඣන්ති තසන්ති මාරකායිකා.

338. තසන්ති තිත්ථියා සබ්බෙ නදතො තෙ මහාමුනෙ[7],
කාකසෙනාව විබ්භන්තා[8] මිගරඤ්ඤා යථා මිගා.

339. යෙ කෙචි ගණිනො ලොකෙ සත්ථාරොති පවුච්චරෙ,
පරම්පරාගතං ධම්මං දෙසෙන්ති පරිසාය තෙ.

340 න හෙ'වං[9] ත්වං මහාවීර ධම්මං දෙසෙසි පාණිනං,
සාමං සච්චානි බුජ්ඣිත්වා කෙවලං බොධිපක්ඛියං.

---

1. ලිම්පති ම. ඡෙ. 2. (එවං සබ්බත්ථ) 3. දිසානුලොකෙත්වා. ම. චතුද්දිසං. ඡෙ.
4. අභිනාදයී. ම. ඡෙ. සෙ. 5. පසුං. ම. 6. වසුධායං පකම්පති. ඡෙ. ම
7. මහාමුනි. ම. ඡෙ. 8. කාකා සෙනාව විබ්භන්ති. ම. ඡෙ.
9. නහෙව. P T S. නහෙවං. ම. ඡෙ.

327. එසේ ම ලොව පහළ වූ මහාවීර වූ බුදුරජානන් වහන්ස, ඔබවහන්සේ පියුමක් මෙන් ලෝකයා හා නො තැවරෙණසේක.

328. යම් සේ ජලජපුෂ්පයෝ බක්මාසයෙහි බෙහෙවින් පිපෙත් ද ඒ මාසය නො ඉක්මවත් ද, (ඒ මස) මල් පිපීමට සුදුසු කාලය වේ.

329. එසේ ම ශාක්‍යපුත්‍රයානන් වහන්ස, ඔබවහන්සේ පුබුදු වූ සේක. ඔබවහන්සේගේ ශිෂ්‍යයෝ (අගීත්ඵලඥනයෙන්) පුබුදු වූවාහු ය. යම් සේ ජලජ වූ පියුම් පිපෙන කාලය නො ඉක්මවා ද, එසේ ම ඔහු අවවාදනු-ශාසනය නො ඉක්මවත්.

330. (යම් සේ) මැනවින් පිපුනා වූ ශාලවෘක්ෂරාජයා දිවසුවඳ වහනය කෙරේ ද, අනික් සල්රුක් විසින් පිරිවරණ ලද ශාලවෘක්ෂරාජයා ම හොබනේ වේ ද,

331. එසේ ම මහාවීරයන් වහන්ස, ඔබ (වහන්සේ) බුදුනැණින් පුබුදු වූ සේක. භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලද සේක් ශාලවෘක්ෂරාජයකු මෙන් ශොභමාන සේක.

332. යම් සේ හිමවත්පර්වතය හැම සතුනට (අවශ්‍ය) ඖෂධ ඇත්තේ වේ ද, නාගයනට ද අසුරයනට ද දෙවතාවනට ද වාසස්ථාන වේ ද,

333. එසේ ම මහාවීරයන් වහන්ස, ඔබ ප්‍රාණීන්ගේ සසර ලෙඩ නැසීමට (අවශ්‍ය) ඖෂධය වනසේක. ත්‍රිවිද්‍ය ඇත්තෝ ද, ෂඩභිඥ ඇත්තෝ ද, ඍද්ධියෙන් පරතෙරට ගියෝ ද ඔබවහන්සේ ඇසුරු කෙරෙත්.

334 මහාවීරයන් වහන්ස, කාරුණික වූ ඔබ වහන්සේ විසින් අනුශාසනා කරණලද ඔහු ධර්මරතියෙන් ඇලෙති. (එසේ ඇලී) ඔබ වහන්සේගේ සසුනෙහි වෙසෙත්.

335. යම් සේ කෙශරසිංහයෙක් ගුහාවෙන් නික්ම සිවුදිග බලා තෙවරක් සිංහනාද කෙරේ ද,

336. කෙශර සිංහයාගේ ගර්ජනයෙන් සියලු සිවුපාවෝ තැති ගණිත්. ඒ එසේ ම ය. ජාතිමත් වූ සිංහ තෙමේ හැම කල්හි සිවුපාවුන් තැති ගන්වයි.

337. මහාවීරයන් වහන්ස, (එසේ) ගර්ජනා කරන්නා වූ ඔබවහන්සේගේ නාදය පෘථිවිය කම්පා කරයි. ඉන් අවබොධයට සුදුස්සෝ ධර්මය අවබොධ කෙරෙත්. මාරපාක්ෂිකයෝ තැති ගණිත්.

338. මහාමුනීන් වහන්ස, නාද කරන්නා වූ (=දහම් දෙසන) ඔබ-වහන්සේගේ නාදයෙන් සියලු තීර්ථකයෝ තැති ගණිත්. (ඒ තීර්ථකයෝ) කවුඩුරළක් මෙන් තැති ගන්නාහු කෙශරසිංහයා කෙරෙන් පලායන සිවුපාවුන් මෙනි.

339. යම් කිසි ගණප්‍රධාන කෙනෙක් ලෙව්හි ශාස්තෘ ය යි කියනු ලැබෙත් ද, ඔහු පිරිසට පරම්පරාගත වූ ධර්මය දෙශනා කෙරෙත්.

340. මහාවීරයන් වහන්ස, ඔබවහන්සේ සත්ත්වයනට එසේ පරම්පරා-ගත ධර්ම දෙශනා නො කරණ සේක හුදෙක් බොධිපාක්ෂික වූ සත්‍යයන් තමන්වහන්සේ ම අවබොධ කොට ගෙණ, -

341. ආසයානුසයං ඤත්වා ඉන්ද්‍රියානං බලාබලං,
භබ්බාභබ්බෙ විදිත්වාන මහාමෙඝොව ගජ්ජසි.

342. චක්කවාළපරියන්තා[1] නිසින්නා පරිසා භවෙ,
නානාදිට්ඨී විවිනෙන්තා[2] විමතිච්ඡෙදනාය තං.

343. සබ්බෙසං චිත්තමඤ්ඤාය ඔපම්මකුසලො මුනි,
එකං පඤ්හං කථෙන්තොව විමතිං ඡින්දසි[3] පාණිනං.

344. උපතිස්සසදිසෙහෙව[4] වසුධා පූරිතා භවෙ,
සබ්බෙව තෙ පඤ්ජලිකා කිත්තයුං ලොකනායකං.

345. කප්පං වා තෙ කිත්තයන්තා නානාවණ්ණෙහි කිත්තයුං,
පරිමෙතුං න සක්කෙය්‍යුං[5] අප්පමෙය්‍යා තථාගතා.

346. යථා සකෙන ථාමෙන කිත්තිතො හි මයා[6] ජිනො,
කප්පකොටිම්පි කිත්තෙන්තා එවමෙව පකිත්තයුං.

347. සචෙ හි කොචි දෙවො වා මනුස්සො වා සුසික්ඛිතො,
පමෙතුං පරිකප්පෙය්‍ය[7] විඝාතං ‘ව ලභෙය්‍ය සො.

348. සාසනෙ තෙ පතිට්ඨාය සක්‍යපුත්ත මහායස,
පඤ්ඤාය පාරමිං ගන්ත්වා විහරාමි අනාසවො.

349. තිත්ථියෙ සම්පමද්දාමි වත්තෙමි ජිනසාසනං,
ධම්මසෙනාපතී අජ්ජ සක්‍යපුත්තස්ස සාසනෙ.

350. අපරිමෙය්‍යෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුඛිත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයිං අහං[8].

351. යො කොචි මනුජො භාරං ධාරෙය්‍ය මත්ථකෙ සදා,
භාරෙන දුක්ඛිතො අස්ස භාරෙහි භරිතො තථා.

352. ඩය්හමානො තීහග්ගීහි භවෙසු සංසරිං අහං,
භරිතො භවභාරෙන නෙරුං උච්චාරිතො[9] යථා.

353. ඔරොපිතො ච මෙ භාරො භවා උග්ඝාටිතා මයා,
කරණීයං කතං සබ්බං සක්‍යපුත්තස්ස සාසනෙ.

354. යාවතා බුද්ධඛෙත්තම්හි ඨපෙත්වා සක්‍යපුඞ්ගවං,
අහං අග්ගොම්හි පඤ්ඤාය සදිසො මෙ න විජ්ජති.

---

1. පරියන්තා. ම ජෙ. සෙ. 2. විවිතෙකන්ති P T S. විචිනන්තා. ජෙ
3. ජින්දි (සබ්බත්ථ.) 4. උපදිස්සසදිසෙහෙව P T S. අ.
5. න පප්පෙය්‍යුං. ජෙ. P T S. නප්පබ්බෙය්‍යුං ම. 6. මහා. P T S සෙ.
7. පූරිතං පරිකඩ්ඪෙය්‍ය. P T S. සෙ. අ. 8. ඣාපයී මම. අ.මු.
9. ගිරිං උච්චාරිතො. මු අ. ගිරිං උද්ධරිතො. ජෙ. සෙ.

341. (සත්ත්වයන්ගේ) අධ්‍යාශයයන් හෙවත් චරියාවන් ද ථාමගත වූ කෙලෙස් ද දැන (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ බලදුබලබව ද (ධර්මාවබොධයට) භව්‍ය අභව්‍ය (=සමත් අසමත්) පුගුලන් ද දැන (සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේ) මහා මෙඝයක් (=සිවුදිගට ම වසින්නා වූ මහ වැසිවලාවක්) මෙන් ධර්මදෙශනා නමැති සිංහනාදයෙන් ගර්ජනා කරණසේක.

342-343. නානාලබ්ධීන්ට ගැති ව වසන්නා වූ සක්වළගල කෙළවර කොට පිරී හුන් පිරිස වන්නී ය. සැක දුරු කිරීම පිණිස ඒ සියලු දෙනාගේ සිත් (මේ මේ ය යි) දැන, (සුදුසු) උපමා කීමෙහි සමත් බුදුරජානන් වහන්ස, (ඔබවහන්සේ) එක ම ප්‍රශ්නයක් (විසඳා) කියමින් ම (සක්වළගැබ පුරා සිටි) ප්‍රාණීන්ගේ සැක සිඳින සේක.

344. **උපතිස්ස** නමැති සැරියුත්මහතෙරුන් වැනියන්ගෙන් මේ පොළොව පිරී තිබේ නම්, ඒ සියල්ලෝ ම බදුදිලි ඇත්තාහු ලොකනායක වූ බුදුරදුන් ගුණ කියන්නාහ.

345. ඔහු කපක් මුළුල්ලෙහි ද නානාප්‍රකාර ලෙස ගුණ කියන්නාහු නමුදු, එම ගුණ පමණ කරන්නට නො හැක්කාහු ය. තථාගතවරයෝ අපමණ ගුණ ඇත්තෝ ය.

346. සවකීයශක්තිය පරිදි මා විසින් බුදුරජානන් වහන්සේ වර්ණනා කරණ ලදහ. කල්පකොටි සඞ්ඛ්‍යාත කාලයක් මුළුල්ලෙහි ගුණ කීර්තනය කරන්නාහු නමුත් මෙසේ ම කීර්තනය කෙරෙත්.

347. ඉදින් මනා ව හික්මුනා වූ කිසියම් දෙවියෙක් හෝ මිනිසෙක් හෝ (එ ම ගුණ) මනින්නට සිතන්නේ නම්, හෙතෙම වෙහෙසට ම පැමිණෙන්නේ ය.

348. මහායශස් ඇත්තානන් වහන්ස, ශාක්‍යපුත්‍රයානන් වහන්ස, (මම) ඔබවහන්සේගේ සසුනෙහි පිහිටා ප්‍රඥාවෙන් පරතෙරට ගොස් ආශ්‍රව රහිත ව වෙසෙමි.

349. තීර්ථකයන් මඩිමි. බුදුසසුන පවත්වමි. අද ශාක්‍යපුත්‍ර වූ බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි ධර්මසෙනාපති වෙමි.

350. ම විසින් අපමණ කලක් මුළුල්ලෙහි කරණලද කර්මය මෙහි දී ඵලය දැක්වී ය. මැනවින් විද හරණා ලද ඊපහරක් මෙන් ඒ කර්මඵලය මාගේ කෙලෙස් දැවී ය

351. යම්කිසි මිනිසෙක් තෙම හැම කල්හි හිසින් බරක් දරන්නේ නම්, (එ ම) බර කරණකොට ගෙණ දුකින් පෙළුනෙක් වන්නේ ය. එසේ ම බරින් බරට පත් වූවෙක් ද වෙයි.

352. මම (රාග - දෙස - මොහ යන) ත්‍රිවිධාග්නියෙන් දැවෙමින් සසරෙහි හැසුරුණෙමි. මහමෙර ඔසොවා ගත්තකු මෙන් භවය නමැති බරින් බර වූයෙම් වෙමි.

353. මා විසින් මාගේ (ඒ භව) භාරය බහා තබන ලදී. සියලු (නව) භවයෝ විධ්වංසනය කරණ ලදහ. ශාක්‍යපුත්‍ර වූ බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි සියලු කටයුතු කරණලදී.

354. සම්පූර්ණ බුද්ධක්ෂෙත්‍රයෙහි බුදුරජානන් වහන්සේ හැර මම ප්‍රඥාවෙන් අග්‍ර වෙමි. මට සමානයෙක් නො පෙණේ.

355. සමාධිම්හි සුකුසලො ඉද්ධියා පාරමිං ගතො,
ඉච්ඡමානො ච'හං අජ්ජ සහස්සං අභිනිම්මිනෙ.

356. අනුපුබ්බවිහාරස්ස වසීභූතො මහාමුනි,
කථෙසි සාසනං මය්හං නිරොධො සයනං මම.

357. දිබ්බචක්ඛු විසුද්ධං මෙ සමාධිකුසලො අහං,
සම්මප්පධානානුයුත්තො බොජ්ඣඞ්ගභාවනාරතො.

358. සාවකෙන හි පත්තබ්බං සබ්බමෙව කතං මයා,[1]
ලොකනාථං ඨපෙත්වාන සදිසො මෙ න විජ්ජති.

359. සමාපත්තිනයකුසලො[2] ඣානවිමොක්ඛානං ඛිප්පලාභී[3],
බොජ්ඣඞ්ගභාවනාරතො සාවකගුණපාරමිං ගතො'ස්මි.[4]

360. සාවකගුණෙනාපි ඵුස්සෙන[5] බුද්ධියා පුරිසුත්තමගාරවා[6],
සද්ධාය සඞ්ගහිතං[7] චිත්තං සදා සබ්‍රහ්මචාරිසු.

361. උද්ධටවිසො'ව[8] සප්පො ඡින්නවිසාණො'ව උසභො,
නික්ඛිත්තමානදප්පො[9] උපෙමි ගරුගාරවෙන ගණං.

362. යදි රූපිනී භවෙය්‍ය පඤ්ඤා මෙ වසුමතී න සමෙය්‍ය,
අනොමදස්සිස්ස භගවතො ඵලමෙතං ඤාණථවනාය.[10]

363. පවත්තිතං ධම්මචක්කං සක්‍යපුත්තෙන තාදිනා,
අනුවත්තෙමහං සම්මා[11] ඤාණථවනායිදං ඵලං.

364. මා මෙ කදාචි පාපිච්ඡො කුසීතො හීනවීරියො,
අප්පස්සුතො අනාචාරො සමෙතො අහු කත්ථචි.

365. බහුස්සුතො ච මෙධාවී සීලෙසු සුසමාහිතො,
චෙතොසමථානුයුත්තො අපි මුද්ධනි තිට්ඨතු.

366. තං වො වදාමි භද්දන්තෙ යාවන්තෙත්ථ සමාගතා,
අප්පිච්ඡා හොථ සන්තුට්ඨා ඣායී ඣානරතා සදා.

367. යමහං පඨමං දිස්වා විරජො විමලො අහුං,
සො මෙ ආචරියො ධීරො **අස්සජී** නාම සාවකො.

368. තස්සාහං වාහසා අජ්ජ ධම්මසෙනාපතී අහුං,
සබ්බත්ථ පාරමිං පත්වා[12] විහරාමි අනාසවො.

369. යො මෙ ආචරියො ආසි **අස්සජී** නාම සාවකො,
යස්සං දිසායං වසති උස්සීසම්හි කරොමහං.

---

1. කතං මම. ම. P T S. සෙ.
2. සමාපත්තීනං කුසලො. ම. ථෙ. සමාපත්තිවිනය සෙ.
3. ඣානවිමොක්ඛපටිලාභී. ථෙ. විමොක්ඛඛිප්පලාභී. ම.
4. සාවකපාරමිං ගතො. ථෙ. සාවකපාරමිං. ම. 5. ඵුසෙන. සෙ. P T S.
6. පරිසුත්තමභාරවා. P T S. සෙ.-ගාරවං. ථෙ.
7. සබ්බෙසං සහිතං. ථෙ. යං සද්ධාසඞ්ගහිතං. ම. 8. උද්ධත. ම. P T S ථෙ.
9. දප්පාව. ම. ථෙ. 10. ඤාණථොමනාය සෙ.
11. අනුවත්තෙසහං සබ්බං. ම. ථෙ 12. පත්තො. සෙ.

355. සමාධියෙහි අතිශයින් දක්‍ෂ වෙමි. ඍද්ධියෙහි පරතෙරට ගියෙම් වෙමි. මම අද කැමැති වන්නෙම් නම්, ඍද්ධිමය රූප දහසක් මවන්නෙමි.

356. අනුපුබ්බවිහාර පිළිබඳ වසඟබව ඇති සව්ඥයෝ මට සසුන වදාළහ. මාගේ සැතපීම නිරෝධය (=නිරෝධසමාපත්තියට සමවැදීම) යි.

357. මාගේ දිවැස පිරිසිදු ය. මම සමාධියෙහි දක්‍ෂ වෙමි. සම්‍යක් ප්‍රදහනයෙහි යෙදුනෙම් බොධ්‍යඞ්ගභාවනාවෙහි ඇලුනෙම් ද වෙමි.

358. ශ්‍රාවකයකු විසින් ලැබියයුතු සියල්ල මා විසින් ලබන ලදී. බුදුරජානන් වහන්සේ හැර මට සමාන වූවෙක් විද්‍යමාන නො වේ.

359. සමාපත්තික්‍රමයන්හි දක්‍ෂ වූයෙම් (ලෞකික) ධ්‍යානයන්ට ද (ලොකොත්තර වූ) විමොක්‍ෂයන්ට ද ශීඝ්‍ර ව සමවදිනෙම් බොධ්‍යඞ්ග භාවනාවෙහි ඇලුනෙම් ශ්‍රාවකගුණයන්ගේ පරතෙරට ගියෙම් වෙමි.

360. පොෂිත වූ හෝ පවිත්‍ර වූ ශ්‍රාවක ගුණයෙන් ද බුද්ධියෙන් ද බුද්ධ ගෞරවයෙන් වූ ශ්‍රද්ධාවෙන් ද යුත් මාගේ සිත හැමකල්හි සබ්‍රම්සරුන් කෙරෙහි යෙදුනේ ය.

361. උදුරා හළ විෂ (දළ) ඇති සර්පයකු මෙන් ද, සිඳුනු අං ඇති ගවයකු මෙන් ද, බැහැර කළ (ගොත්‍රමදාදි) මානදර්ප ඇත්තෙම් සංඝයා වෙත ආදරබහුමානයෙන් එළඹෙමි.

362. ඉදින් මාගේ ප්‍රඥතොමෝ මූර්තිමත් වන්නී නම්, මහපොළොව ඊට සම නො වන්නී ය. **අනවමදර්ශී** බුදුරජානන් වහන්සේගේ නුවණට පැසසීමේ ඵලයයි මේ.

363. තාදිගුණ ඇති **ගෞතම** බුදුරජානන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මචක්‍රය මම මැනැවින් ඒ අනු ව පවත්වමි. (අනවමදර්ශී බුදුරජානන් වහන්සේගේ) නුවණට පැසසීමේ මේ ඵලය යි.

364. කිසි කලෙකත් පවිටෙක් කුසීතයෙක් පසුබට වීර්‍යය ඇත්තෙක් අල්පශ්‍රුතයෙක් ආචාර විරහිතයෙක් මාගේ ආශ්‍රයට නො පැමිණේවා.

365. බහුශ්‍රුත වූ ද, නුවණැති වූ ද, සිවුපිරිසුදුසිල්හි මැනැවින් හික්මුනා වූ ද චිත්තසමථයෙහි යෙදුනා වූ ද පුද්ගලයා මාගේ හිස මත පවා සිටීවා.

366. මෙහි රැස් වූ යම් පමණ කෙනෙක් වෙත් නම්, පින්වත්නි, තෙපි අල්පෙච්ඡයෝ ද, ලද දෙයින් සතුටු වන්නෝ ද, ධ්‍යාන ඇත්තෝ ද, ධ්‍යානයෙහි ඇලුනෝ ද වවු යන (මේ වචනය) තොපට කියමි.

367. මම යම්කෙනකුන් පළමුකොට දැක කෙලෙස්රජස් නැති නිර්මල වූවෙක් වීම් ද, ඒ ධෛර්‍යයවත් වූ මාගේ ආචාර්‍යයතෙමේ **අස්සජි** නම් ශ්‍රාවකයන් වහන්සේ ය.

368. මම උන්වහන්සේගේ බලයෙන් අද ධර්මසෙනාපති වීමි. සියලු ගුණයන්හි පරතෙරට පැමිණියෙම් ආශ්‍රව රහිත ව වෙසෙමි.

369. යම් **අස්සජි** නම් ශ්‍රාවකයෙක් තෙම මාගේ ආචාර්‍යය වී ද, උන්වහන්සේ යම් දිසාවක වෙසෙත් නම්, මම එ දෙසට හිස හරවා නිදමි.

370. මම කම්මං සරිත්වාන ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා අග්ගට්ඨානෙ ඨපෙසි මං.

371. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

372. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.*

373. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා'පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.*

ඉත්ථං සුදං ආයස්මා **සාරිපුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සාරිපුත්තත්ථෙරස්ස අපදානං පඨමං.**

---

## 2. මහාමොග්ගල්ලානත්ථෙරාපදානං

374. **අනොමදස්සී** භගවා ලොකජෙට්ඨො නරාසභො,
විහාසි හිමවන්තම්හි දෙවසඞ්ඝපුරක්ඛතො.

375. **වරුණො** නාම නාමෙන නාගරාජා අහං තදා,
කාමරූපී විකුබ්බාමි[1] මහොදධිනිවාසහං.[2]

376. සඞ්ගණියං[3] ගණං හිත්වා තුරියං පට්ඨපෙසහං,
සම්බුද්ධං පරිවාරෙත්වා වාදෙසුං අච්ඡරා තදා.

377. වජ්ජමානෙසු තුරියෙසු[4] දෙවා තුරියානි[5] වජ්ජයුං,[6]
උභින්නං සද්දං සුත්වාන බුද්ධො'පි[7] සම්පබුජ්ඣථ.

378. නිමන්තයිත්වා සම්බුද්ධං සකං භවනමුපාගමිං,
ආසනං පඤ්ඤපෙත්වාන කාලමාරොචයිං අහං.

379. ඛීණාසවසහස්සෙහි පරිවුතො ලොකනායකො,
ඔභාසෙන්තො දිසා සබ්බා භවනං මෙ උපාගමි.

380. උපවිට්ඨං මහාවීරං දෙවදෙවං නරාසභං,
සභික්ඛුසඞ්ඝං තප්පෙසිං[8] අන්නපානෙන'හං තදා.

381. අනුමොදි මහාවීරො සයම්භූ අග්ගපුග්ගලො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

---

1. විකුප්පාමි. ථෙ. 2. නිවාසයං. ම ථෙ. 3. අඞ්ගිණියං. සෙ. අඞ්ගිනියං. අ.
4. තුරෙසු. ම. ථෙ. 5. තුරානි. ම ථෙ. 6. වජ්ජිංසු. P T S. සෙ. අ
7. සම්බුද්ධො. ථෙ. 8. තප්පෙමි. ථෙ. ම.
* 372-73 ඉමා ද්වෙ ගාථායො - සෙ. P T S. පොත්ථකෙසු න විජ්ජන්ති.

370. ශාක්‍යසිංහ වූ ගෞතම බුදුරජානන් වහන්සේ මාගේ (කුශල) කර්මය පූර්වේනිවාසානුස්මෘතිඥානයෙන් සිහි කොට භික්ෂුසංඝයා මැද හිඳ මා අග්‍රශ්‍රාවකස්ථානයෙහි තැබූසේක.

371. මා විසින් කෙලෙශයෝ දවන ලද්දාහු ය. සියලු භවයෝ සමූහනනය (=විනාශ) කරණ ලද්දාහු ය. හස්තිරාජයකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

372. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ පැමිණීම යහපත් වි ය. ත්‍රිවිද්‍යාවෝ ලබන ලද්දාහු ය. බුදුරජානන් වහන්සේගේ අනුසාසනය කරණලදී.

373. මේ සිව්පිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන ද කරණලදී.

මේ අයුරින් ආයුෂමත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළසේකි.

**පළමුවැනි වූ ශාරීපුත්‍රස්ථවිරාවදානය යි.**

---

## 2. මහාමෞද්ගල්‍යායනස්ථවිරාවදානය

374. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **අනොමදස්සී** භාග්‍යවතුන් වහන්සේ දිව්‍යසමූහයා විසින් පිරිවරණ ලදුව හිමවතෙහි විසූහ.

375. එකල්හි මම නමින් **වරුණ** නම් වූ නාගරාජයෙක් වීමි. කැමැති රූපයන් මවනසුලු වූයෙම් සෘද්ධිවිකුර්වණය කරමි. මම මහසයුර නිවාස කොට ඇත්තේ වීමි.

376. නිතර සිය පිරිවර වූ නාගසමූහයා හැර මම තූර්‍යවාදනයන් පැවැත්වීමි. එකල්හි නාමෙණෙවියෝ (අනොමදස්සී) බුදුරජානන් වහන්සේ පිරිවරා ගෙණ වාදනය කළාහු ය.

377. (මනුෂ්‍ය - නාග) තූර්‍යයන් වාදනය කරණු ලබන කල්හි (චාතුර්මහාරාජික) දේවියෝ ද දිව්‍යතූර්‍යයන් වාදනය කළාහු ය. මේ දෙපිරිස ගේ තූර්‍යශබ්දය අසා බුදුරජානන් වහන්සේ ඒ බව දත් සේක.

378. බුදුරජානන් වහන්සේට ආරාධනා කොට ස්වකීය නාගභවනයට එළඹියෙමි. මම අසුන් පණවා (දානයට සුදුසු) කාලය සැළ කෙළෙමි.

379. රහතුන් දහසක් විසින් පිරිවරණලද බුදුරජානන් වහන්සේ සියලු දිසාවන් බබුළුවමින් මාගේ භවනයට එළඹිසේක.

380. එකල්හි මම (එසේ) වැඩහුන් භික්ෂුසංඝයා සහිත වූ මහාවීර වූ දෙවාතිදෙව වූ නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ ආහාරපානයෙන් සන්තර්පණය කෙළෙමි.

381. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ මහාවීර වූ අග්‍රපුද්ගල වූ බුදුරජානන් වහන්සේ භික්ෂුසංඝයා මැද හිඳ අනුමොදනාව කළසේක. මේ ගාථාවෝ ද වදාරණ ලදහ:-

382. "යො[1] සො සඞ්ඝං අපූජෙසි[2] බුද්ධඤ්ච ලොකනායකං,
තෙන චිත්තප්පසාදෙන දෙවලොකං ගමිස්සති.

383. සත්තසත්තතික්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති,
පථව්‍යා රජ්ජං[3] අට්ඨසතං වසුධං ආවසිස්සති.

384. පඤ්චපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති,
භොගා අසඞ්ඛියා තස්ස උප්පජ්ජිස්සන්ති තාවදෙ.

385. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ **ඔක්කාක**කුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

386. නිරයා සො චවිත්වාන මනුස්සත්තං ගමිස්සති,
**කොලිතො** නාම නාමෙන බ්‍රහ්මබන්ධු භවිස්සති.

387. සො පච්ඡා පබ්බජිත්වාන කුසලමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො දුතියො හෙස්සති සාවකො.

388. ආරද්ධවීරියො පහිතත්තො ඉද්ධියා පාරමිං ගතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො."

389. පාපමිත්තොපනිස්සාය කාමරාගවසං ගතො,
මාතරං පිතරඤ්චාපි ඝාතයිං දුට්ඨමානසො.

390. යං යං යොනුපපජ්ජාමි නිරයං අථ මානුසං,
පාපකම්මසමඞ්ගිතා[5] භින්නසීසො මරාමහං.[6]

391. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
ඉධාපි එදිසං[7] මය්හං මරණකාලෙ භවිස්සති.

392. පවිවෙකමනුයුත්තො සමාධිභාවනාරතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

393. ධරණිම්පි සුගම්භීරං බහලං දුප්පධංසියං,
වාමඞ්ගුට්ඨෙන ඛොභෙය්‍යං[8] ඉද්ධියා පාරමිං ගතො.

394. අස්මිමානං න පස්සාමි මානො මය්හං න විජ්ජති,
සාමණෙරෙ උපාදාය ගරුචිත්තං කරොමහං.

395. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ යං කම්මමභිනීහරිං,
තාහං භූමිමනුප්පත්තො පත්තො'ම්හි ආසවක්ඛයං.

396. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

(396, 397, 398 ගාථා 371, 372, 373 ගාථාහි සමා.)

ඉත්ථං සුදං ආයස්මා **මහාමොග්ගල්ලානො** ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**මහාමොග්ගල්ලානත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1. යං. ම. ථෙ. 2. අභොජෙසි. ථෙ. 3. පථව්‍ය රජ්ජං. මු. අ.
4. ගොත්තෙන. සෙ. 5. සමඞ්ගිතො. ථෙ.- සමඞ්ගීනං P T S.
6. භවාම'හං P T S. සෙ 7. තාදිසො. ථෙ. එදිසො. ම. 8. චලෙය්‍යං. ථෙ.

382. "යමෙක් තෙම ලොකනායක වූ බුදුරජානන් වහන්සේ ද සංඝයා ද පිදී නම්, හෙතෙම ඒ සිත පැහැදවීම් හෙතුවෙන් දෙව්ලොවට යන්නේ ය.

383. තවද සත්සැත්තෑවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. අටසියක් වරෙක පෘථිවිරාජ්‍යය කරමින් පොළොවෙහි වෙසෙන්නේ ය.

384. පස්පණසිවරක් සක්විතිරජ වන්නේ ය. එකල්හි ඔහුට අපමණ භොගයෝ උපදින්නාහු ය.

385. මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි (=එකාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් පසු ව) **ඔක්කාක** කුලයෙහි උපන්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොකයෙහි පහළ වන්නේ ය.

386. හෙතෙම (=වරුණ නාගරාජ තෙම) නිරයෙන් චුත ව මිනිසත් බවට යන්නේ ය. **නමින් කොලිත** නම් වූ බ්‍රාහමණයෙක් වන්නේ ය.

387. හෙතෙමේ පසු ව කුශලමූලයන් විසින් මෙහෙයන ලදුයේ පැවිදි ව **ගෞතම** බුදුරජානන් වහන්සේගේ ද්විතීය ශ්‍රාවකයා වන්නේ ය.

388. පටන් ගන්නා ලද වීය්‍ර්‍යඇත්තේ සෘද්ධියෙහි කෙළ පැමිණියේ සියලු ආශ්‍රවධර්මයන් පිරිසිඳ දැන (දුරු කොට) ආශ්‍රවරහිත ව කෙලශපරිනිර්වාණයෙන් පිරිනිවන් පාන්නේ ය."

389. පාපමිත්‍රයන් ඇසුරෙන් කාමරාගයෙහි වසඟයට ගියේ දුෂ්ට සිත් ඇත්තේ මව ද පියා ද නැසීමි.

390. මම නිරයෙහි හෝ නැතහොත් මිනිසුන් අතර හෝ යම් යම් යොනියක උපදිම් නම්, (එකී) පාපකර්මයෙන් යුක්ත වීම නිසා බිඳීගිය හිස් ඇත්තෙම් මැරෙමි.

391. මෙය මාගේ සසරෙහි අවසානය යි. අන්තිම ආත්මභාවය වේ. මේ ආත්මයෙහි දී ද මැරෙණ කල්හි මට මෙබන්දක් වන්නේ ය.

392. ප්‍රකර්ෂවිවෙකයෙහි යෙදුනේ සමාධිභාවනාවෙහි ඇලුනේ සියලු ආශ්‍රවයන් පිරිසිඳ දැන (දුරු කොට) ආශ්‍රවරහිත ව වෙසෙමි.

393. සෘද්ධියෙහි කෙළ පැමිණියා වූ මම ඉතා ගැඹුරු වූ ඝන වූ නො සෙල්විය හැකි පොළොව ද වම්පය මහපටැඟිල්ලෙන් සොලවන්නෙමි.

394. අස්මිමානය (=මම ය යන හැඟීම) නො දකිමි. මට මානය නැත. මම හෙරණකු පටන් කොට සියලු භික්ෂුසඞ්ඝයා කෙරෙහි ගෞරව සිත (ඇති) කරමි.

395. මෙයින් එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකට (=අපරිමෙය්‍ය කල්පයකට) පෙර (අගසවු බව පිණිස) යම් කර්මයක් රැස් කෙළෙම් ද, මම ඒ ශ්‍රාවක භූමියට පත් වීමි. ආශ්‍රවක්ෂයසඞ්ඛ්‍යාත නිවණට පැමිණියෙමි.

396. මා විසින් කෙලශයෝ දවන ලද්දාහු ය. -පෙ- බුදුරජානන් වහන්සේගේ අනුශාසනය ද කරණ ලදි.

(396 397-398- යන ගාථාවෝ 371-372-373 යන ගාථාවන් හා සමාන වෙති.

මේ අයුරින් ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළ සේක.

**දෙවෙනි වූ මහාමෞද්ගල්‍යායනස්ථවිරාවදානය යි.**

---

## 3. මහාකස්සපත්ථෙරාපදානං

399. **පදුමුත්තරස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
නිබ්බුතෙ ලොකනාථම්හි පූජං කුබ්බන්ති සත්ථුනො.

400. උදග්ගචිත්තා[1] ජනතා ආමොදිතපමොදිතා,
තෙසු සංවෙගජාතෙසු පීති මෙ උපපජ්ජථ[2].

401. ඤාතිමිත්තෙ සමානෙත්වා ඉදං වචනමබ්‍රවිං,
"පරිනිබ්බුතො මහාවීරො හන්ද පූජං කරොමසෙ."

402. සාධූති තෙ පටිස්සුත්වා භීයො හාසං ජනිංසු මෙ.
"බුද්ධස්මිං ලොකනාථස්මිං කාහාම පුඤ්ඤසඤ්චයං."

403. අග්ඝියං සුකතං කත්වා සතහත්ථසමුග්ගතං,
දියඩ්ඪහත්ථපත්ථටං[3] විමානං නභමුග්ගතං.

404. කත්වාන හම්මියං[4] තත්ථ තාලපන්තීහි චිත්තිතං,
සකං චිත්තං පසාදෙත්වා චෙතියං පූජයුත්තමං.

405. අග්ගික්ඛන්ධොව ජලිතො සාලරාජා'ව[5] ඵුල්ලිතො,
ඉන්දලට්ඨී'ව ආකාසෙ ඔභාසෙති චතුද්දිසා.

406. තත්ථ චිත්තං පසාදෙත්වා කත්වාන කුසලං බහුං,
පුබ්බකම්මං සරිත්වාන තිදසං උපපජ්ජහං.

407. සහස්සයුත්තහයවාහිං දිබ්බයානමධිට්ඨිතො,
උබ්බිද්ධං[6] භවනං මය්හං සත්තභූමං[7] සමුග්ගතං.

408. කූටාගාරසහස්සානි සබ්බසොණ්ණමයා[8] අහු,
ජලන්ති සකතෙජෙන දිසා සබ්බා පභාසයං.

409. සන්ති අඤ්ඤෙපි නිය්යූහා ලොහිතඞ්කමයා තදා,
තෙපි ජොතෙන්ති ආභාය සමන්තා චතුරො දිසා.

410. පුඤ්ඤකම්මාභිනිබ්බත්තා කූටාගාරා සුනිම්මිතා,
මණිමයාපි ජොතෙන්ති දිසා දස සමන්තතො.

411. තෙසං උජ්ජොතමානානං ඔභාසො විපුලො අහු,
සබ්බෙ දෙවෙ අභිභොමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

412. සට්ඨිකප්පසහස්සම්හි **උබ්බිද්ධො**[9] නාම ඛත්තියො,
චාතුරන්තො **විජිතාවී** පථවිං[10] ආවසිං අහං.

413. තථෙව[11] භද්දකෙ කප්පෙ තිංසක්ඛත්තුං අහොසහං,
සකකම්මාභිරද්ධොම්හි චක්කවත්තී මහබ්බලො,
සත්තරතනසම්පන්නො චතුදීපම්හි ඉස්සරො.

414. තත්ථාපි භවනං මය්හං ඉන්දලට්ඨී'ව උග්ගතං,
ආයාමතො චතුබ්බීසං[12] විත්ථාරෙන ච ද්වාදසං[13].

---

1. "අග්ගිං මිනන්තා ජනතා"ති සම්බහො අග්ගිං ආදහනත්ථාය මිනන්තා-රාසි කරොන්තා"- අට්ඨකථා.
2. උදපජ්ජථ. ම. PTS.
3. දියඩ්ඪහත්ථසතම්පි PTS. 4. අග්ඝියං PTS. සෙ.
5. කිංසුකො විය. සෙ. 6 උබ්භිදං. ථෛ. 7. සත්තභූමි. PTS. සෙ.
8. සබ්බෙ සොවණ්ණයා PTS. සබ්බෙ. ථෛ., 9. උබ්භිදෙ. ථෛ.
10. පථව්‍යං. ථෛ. 11. තථෙව. ථෛ. 12. චතුබ්බීස. ම ථෛ. සෙ.
13. ද්වාදස සෙ. ම. ථෛ ද්වාදසා. PTS.

# 3. මහාකාශ්‍යපස්ථවිරාවදානය

399. තාදිගුණ (=අටලෝදහම්හි නො සැලෙන ගති) ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ (ශාසනයෙහි) ලොකනාථ වූ ඒ (පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි (දිව්‍ය මනුෂ්‍යයෝ ශාස්තෘන් වහන්සේට) පූජා කෙරෙත්.

400. ජනසමූහයා ඔද වැඩි සිත් ඇත්තාහු අතිශයින් ප්‍රමුදිත වූහ. ඔවුන් සංවේගයට පැමිණ සිටින කල්හි මට ප්‍රීතියක් ඇති වි ය.

401. නෑ මිතුරන් කැඳවා "මහාවීර වූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ සේක. ඒකාන්තයෙන් පූජාවක් කරමු"යි යන මේ වචනය කීමි.

402. ඔහු 'මැනවැ'යි පිළිවදන් දී "ලොකනාථ වූ බුදුරජාණන් වහන්සේ විෂයයෙහි පින් රැස් කරන්නෙමු" ය කියා මාගේ සතුට වැඩියක් ම ඇති කළාහු ය.

403. රියන් සියයක් උස් වූ මොනවට තැනූ ඇඟෑවක් කොට රියන් එක්සිය පණසක් පුළුල් වූ උස් විමානයක් කොට –

404. එහි තල්ගස් පෙළින් විසිතුරු වූ ප්‍රාසාදයක් කොට සිය සිත පහදවා උත්තමචෛත්‍යය පිදුවෙමි.

405. ඇවිළගත් ගිනිකඳක් මෙන් ද, පිපියා වූ සල්රුකක් මෙන් ද, අහසෙහි ඉන්ද්‍රයෂ්ටිය (ඉන්ද්‍රධවජය බඳනා ඉන්ද්‍රකීලය)මෙන් ද (ඒ සතූපය) සිවුදිග බබුළුව යි.

406. මම එහි සිත පහදවා බොහෝ කුසල් කොට පෙර කරණ ලද කුශලකර්මය සිහි කොට තව්තිසා දෙව්ලොව උපනිමි.

407. යෙදූ දහසක් අසුන් විසින් උසුලනලද දිව්‍යයානයට නැඟුනෙම් වෙමි. මාගේ උස් වූ භවනය සත්බුමු වූයේ උඩට නැංගේ ය.

408. දහස් ගණන් කූටාගාරයෝ තනි රණින් කරණ ලද්දෝ වූහ. (එම කූටාගාරයෝ) ස්වකීය දීප්තියෙන් සියලු දිගුන් බබුළුවමින් දිලිසෙත්.

409. පද්මරාග මාණික්‍යමය වූ අන්‍ය වූ පහකුළු ද ඇත. එකල්හි ඒ පහකුළු ද ශොභාවෙන් හාත්පස සිවුදිග ම බබුළුවත්.

410. පුණ්‍යකර්මබලයෙන් හටගත් මැනවින් නිර්මිත වූ මිණිමුවා කුළුගෙවල් හාත්පස දසදිගුන් බබුළුවත්.

411. බබලන්නා වූ ඔවුන්ගේ ආලොකය අධික වි ය. සියලු දෙවියන් ඉක්මවමි. මේ පුණ්‍යකර්මයාගේ ඵලයයි.

412. කල්ප සැටදහසක් මුළුල්ලෙහි **උබ්බිද්ධ** නම් ක්ෂත්‍රියයෙක් ව සිවුමහසයුර හා සිවුමහදිවයින කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූයෙම් සතුරු රජුන් ජය ගන්නා සුලු ව මම විසීමි.

413. එසේ ම **භද්‍රකල්පයෙහි** තිස් වරක් මහත් බල ඇති සක්විති රජ වීමි. ස්වකීය පුණ්‍යකර්මයන්හි ඇලුනෙම් ම වීමි.

414. එහි ද මාහට දිගින් සූවිසි රියන් වූ පුළුලින් දොළොස්රියන් වූ ඉන්ද්‍රකීලයක් වැනි වූ භවනයක් පැන නැංගේ ය.

415. **රම්මකං** නාම නගරං දළ්හපාකාරතොරණං,
ආයාමතො පඤ්චසතං විත්ථාරෙන තදඩ්ඪකං,
ආකිණ්ණං ජනකායෙහි තිදසානං පුරං විය.

416. යථා සූචිඝරෙ සූචි පක්ඛිත්තා පණ්ණවීසති,
අඤ්ඤමඤ්ඤං පඝට්ටෙන්ති ආකිණ්ණං හොති තං තදා[1].

417. එවම්පි නගරං මය්හං හත්ථිස්සරථසඞ්කුලං,
මනුස්සෙහි සදා'කිණ්ණං[2] රම්මකං නගරුත්තමං.

418. තත්ථ භුත්වා පිවිත්වා[3] ච පුන දෙවත්තනං[4] ගතො,
භවෙ පච්ඡිමකෙ මය්හං අහොසි කුලසම්පදා.

419. බ්‍රහ්මඤ්ඤකුලසම්භූතො මහාරතනසඤ්චයො,
අසීතිකොටියො හිත්වා හිරඤ්ඤස්සා'පි පබ්බජිං.[5]

420, 421, 422. කිලෙසා ඣාපිතා මය්හං-පෙ-කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මහාකස්සපො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මහාකස්සපත්ථෙරස්ස අපදානං තතියං.**

---

## 4. අනුරුද්ධත්ථෙරාපදානං

423. **සුමෙධං** භගවන්තාහං ලොකජෙට්ඨං නරාසභං,
වූපකට්ඨං විහරන්තං අද්දසං ලොකනායකං.

424. උපගන්ත්වාන සම්බුද්ධං සුමෙධං ලොකනායකං,
අඤ්ජලිම්පග්ගහෙත්වාන බුද්ධසෙට්ඨමයාච 'හං.

425. "අනුකම්ප[6] මහාවීර ලොකජෙට්ඨ නරාසභ,
පදීපං තෙ පදස්සාමි රුක්ඛමූලම්හි ඣායතො."

426. අධිවාසෙසි සො ධීරො සයම්භූ වදතං වරො,
දුමෙසු විනිවිජ්ඣිත්වා යන්තං යොජෙත්ව 'හං[7] තදා.

427. සහස්සවට්ටිං පාදාසිං බුද්ධස්ස ලොකබන්ධුනො,
සත්තාහං පජ්ජලිත්වාන දීපා වූපසමිංසු මෙ[8].

428. තෙන චිත්තප්පසාදෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං විමානමුපපජ්ජහං.

429. උපපන්නස්ස දෙවත්තං ව්‍යම්හං ආසි සුනිම්මිතං[9],
සමන්තතො පජ්ජලති දීපදානස්සි'දං ඵලං.

430. සමන්තා යොජනසතං විරොචෙසිං[10] අහං තදා,
සබ්බෙ දෙවෙ අතිහොමි දීපදානස්සි'දං ඵලං.

---

1. හොති ලඞ්කතං. ම. ඡ.-ලඞ්කතො සෙ. 2. තදාකිණ්ණං. P T S. සෙ.
3. භුත්වාච පීත්වා. P T S. භුත්වා වසිත්වා ච. සෙ 4. පුනාපි දෙවතං. ම. ඡ.
5 පරිබ්බජිං. P T S. සෙ. 6 අනුකම්පි P T S. 7. යොජීය'හං. ම. ඡ.
8. පදීප වූපසම්මිංසු. P T S. 9. ථෙමෙහා ආසි සුනිම්මිතො. ම. P T S. සෙ.
10 විරොචෙමි. P T S.

415. විශාල පවුරු හා තොරන් ඇති දිගින් (යොදුන්) පන්සියයක් වූ ද, පුළුලින් ඉන් අඩක් වූ ද, තව්තිසාවැසියන්ගේ දෙව්පුරය වැනි ජන සමූහයාගෙන් ගැවසීගත් **රම්මක** නම් නගරයක් වි ය.

416. යම් සේ හිදිකටුගුලාවෙහි බහනලද පස්විස්සක් හිදිකටු ඔවුනොවුන් ගැටෙත් ද, එකල්හි එය ගැවසීගත්තේ වේ ද,

417. එසේ ම මාගේ උතුම් වූ **රම්මක** නගරය ද හස්ති අශ්ව රථයන්ගෙන් පිරී ගියේ මිනිසුන්ගෙන් හැමකල්හි ගැවසීගත්තේ වී ය.

418. එහි කා බී යළි දෙවත්වයට ගියේ මාගේ අන්තිමභවයෙහි ද කුලසම්පත් ඇති වි ය.

419. මහත් වූ රුවන් සමූහ ඇති බමුණුකුලයෙහි උපන්නෙම් අසූකෙළක් රන් හැරදමා පැවිදි වීමි.

420, 421, 422, මා විසින් කෙලශයෝ දවන ලද්දාහු ය. -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන ද කරණලදි.

මේ අයුරින් ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළසේකි.

**තෙවෙනි වූ මහාකාශ්‍යපස්ථවිරාවදානය යි.**

---

## 4. අනුරුද්ධස්ථවිරාවදානය

423. මම ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ විවෙකී ව වාසය කරන්නා වූ ලොකනායක වූ **සුමෙධ** නම් භාග්‍යවතුන් වහන්සේ දිටිමි.

424. මම ලොකනායක වූ **සුමෙධ** සම්බුදුන් වහන්සේ වෙත එළඹ ඇඳිලි බැඳගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් (මෙසේ) අයැදීමි:

425. "මහා වීරයන්වහන්ස, ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, අනුකම්පා කොට වදාළ මැනව. රුක්මුල්හි ධ්‍යාන කරන්නා වූ ඔබවහන්සේට පහනක් දෙමි."

426. සියල්ල තෙමේ ම දන්නාවූ වාදීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ ඒ ප්‍රාඥ වූ බුදුරජතෙම එය ඉවසී ය. එකල්හි මම ගස් විද යන්ත්‍රයක් යොදා -

427. ලොකබන්ධු වූ බුදුරජානන් වහන්සේට දහසක් වැටි දුනිමි. මාගේ පහන්හු සතියක් දල්වී නිවී ගියහ.

428. එම චිත්තප්‍රසාදයෙන් ද, සිත්හි වූ ප්‍රාර්ථනයන්ගෙන් ද, මම මිනිස්සිරුර හැර දෙව්විමනක උපනිමි.

429. දෙව්අත්බැව්හි උපන් මට මැනවින් නිර්මිත විමානයක් වි ය. එය හාත්පසින් දිලෙයි. මේ පහන්පූජාවෙහි විපාකය යි.

430. එකල්හි මම හාත්පස යොදුන් සියයක් බැබළවීමි. සියලු දෙවියන් මැඩපැවැත්වීමි. පහන්පූජාවෙහි මේ විපාකය යි.

431. තිංස කප්පානි දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
න මං කෙච'තිමඤ්ඤන්ති[1] දීපදානස්සි'දං ඵලං.

432. අට්ඨවීසතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොස 'හං,
දිවාරත්තිඤ්ච පස්සාමි සමන්තා යොජනං තදා.

433. සහස්සලොකං ඤාණෙන පස්සාමි සත්ථුසාසනෙ,
දිබ්බචක්ඛුං අනුප්පත්තො දීපදානස්සි'දං ඵලං.

434. **සුමෙධො** නාම සම්බුද්ධො තිංසකප්පසහස්සි'තො,
තස්ස දීපො මයා දින්නො විප්පසන්නෙන චෙතසා.

435. 436; 437. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අනුරුද්ධො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අනුරුද්ධත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

---

## 5. පුණ්ණත්ථෙරාපදානං

438. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
පුරක්ඛතො'මහි සිස්සෙහි උපගච්ඡිං නරුත්තමං.

439. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම කම්මං පකිත්තෙසි සංඛිත්තෙන මහාමුනි.

440. තා'හං ධම්මං සුණිත්වාන අභිවාදෙත්වාන සත්ථුනො,
අඤ්ජලිම්පග්ගහෙත්වාන පක්කාමිං දක්ඛිණාමුඛො.

441. සංඛිත්තෙන සුණිත්වාන විත්ථාරෙන අදෙසයිං,[2]
සබ්බෙ සිස්සා[3] අත්තමනා සුත්වාන මම භාසතො.

442 සකදිට්ඨිං විනොදෙත්වා බුද්ධෙ චිත්තං පසාදයුං,
සංඛිත්තෙනපි දෙසෙමි[4] විත්ථාරෙන තථෙව 'හං.[5]

443. අභිධම්මනයඤ්ඤූ'හං[6] කථාවත්ථුවිසුද්ධියො,
සබ්බෙසං විඤ්ඤාපෙත්වාන විහරාමි අනාසවො.

444. ඉතො පඤ්චසතෙ කප්පෙ චතුරො **සුප්පකාසකා**,
සත්තරතනසම්පන්නා චතුදීපම්හි ඉස්සරා.

445. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා'පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුණ්ණො මන්තානිපුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුණ්ණමන්තානිපුත්තත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

---

1. කෙචිතිමඤ්ඤන්ති. ථෙ. ම. 2 අභාසයිං. ම. 3. පියා. ථෙ.
4. දෙසෙසිං. ම. 5. පි භාසයිං. ම. 6 නයඤ්ඤුහං. ම. P T S.

431. ශක්‍ර ව තිස්කපක් මුළුල්ලෙහි දිව්‍යරාජ්‍යය කරවීමි. කිසිවෙක් මා ඉක්මවා නො සිතත්. (=මට අවමන් නො කරත්). මේ පහන්පූජාවෙහි විපාකය යි.

432. මම අටවිසිවරක් සක්විතිරජ වීමි. එකල්හි හාත්පස යොදුනක් තැන් දිවා රෑ දෙක්හි ම (එක සේ) දකිමි.

433. (ඥාන) චක්ෂුසින් දහසක් සක්වල (ලොක) දකිමි. සම්බුද්ධ ශාසනයෙහි (පැවිදි ව) දිවැස ලැබූයෙමි ද වෙමි. පහන්පූජාවෙහි මේ විපාකය යි.

434. මෙයින් කල්ප තිස්දහසකට පෙර **සුමෙධ** නම් සම්බුදුරජ තෙම වී ය. මා විසින් උන්වහන්සේට පැහැදුනු සිතින් පහනක් දෙනලදී.

435, 436, 437. කෙලශයෝ දවන ලදහ. -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන ද කරණලදී.

මේ අයුරින් ආයුෂ්මත් **අනුරුද්ධ**ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළ සේක.

**සතරවැනි වූ අනුරුද්ධස්ථවිරාවදානය යි.**

---

## 5. පූර්ණස්ථවිරාවදානය

438. වේද හදාරවන්නා වූ මන්ත්‍රධර වූ වෙදත්‍රයයෙහි පරතෙරට ගිය (මම) ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයෙම් මනුෂ්‍යොත්තම වූ බුදුරජානන් වහන්සේ වෙත එළඹියෙමි.

439. පුදසත්කාර පිළිගැණීමට සුදුසු වූ තුන්ලෝ දත් මහා මුනි වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ සංක්ෂිප්තවශයෙන් මාගේ කර්මය කීර්තනය කළ සේක.

440. මම ඒ ධර්මය අසා බුදුරජානන් වහන්සේට ඇඳිලි බැඳ අභිවාදනය කොට දකුණුදිගට මුහුණ ලා ගියෙමි. (=පැදකුණු කෙළෙමි).

441. සංක්ෂිප්ත ව අසා විස්තරවශයෙන් කීමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසා සියලු ශිෂ්‍යයෝ සතුටු වූහ.

442. ඔහු සවකීය දෘෂ්ටිය හැර දමා බුදුන් කෙරෙහි සිත පැහැද-වූහ. මම සංක්ෂිප්ත කොට ද දෙසමි. එසේ ම විස්තරවශයෙන් ද දෙසමි.

443. විජම්භනය (=අභිධර්මක්‍රම) දන්නා වූ මම දශකථාවස්තුවෙහි විශුද්ධීන් සියල්ලනට අවබොධ කරවා ආශ්‍රව රහිත ව වෙසෙමි.

444. මෙයින් කප් පන්සියයකින් පෙර සුතරමහදිවයිනෙහි අධිපති වූ සත්රුවනින් යුත් **සුපසනාසක** නම් සිවුසක්විතිරජකෙනෙක් වූහ.

445. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද (මා විසින්) සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ ශාසනය ද කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පුණ්ණමන්තානිපුත්ත** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළ සේක.

**පස්වැනි වූ පුණ්ණමන්තානිපුත්තස්ථවිරාවදානය යි.**

---

# 6. උපාලිත්ථෙරාපදානං

446. නගරෙ **හංසවතියා සුජාතො** නාම බ්‍රාහ්මණො,
අසීතිකොටිනිචයො පහූතධනධඤ්ඤවා.

447. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
ලක්ඛණෙ ඉතිහාසෙ ච සද්ධම්මෙ[1] පාරමිං ගතො.

448. පරිබ්බාජා එකසිඛා[2] ගොතමා[3] බුද්ධසාවකා,
චරකා[4] තාපසා චෙව චරන්ති මහියා තදා.

449. තෙපි මං පරිවාරෙන්ති බ්‍රාහ්මණො විස්සුතො ඉති,
බහුජ්ජනො මං පූජෙති නාහං පූජෙමි කඤ්චනං.[5]

450. පූජාරහං න පස්සාමි මානත්ථද්ධො අහං තදා,
බුද්ධොති වචනං[6] නත්ථි තාව නුප්පජ්ජතෙ ජිනො.

451. අච්චයෙන අහොරත්තං **පදුමුත්තර**නායකො[7],
සබ්බං තමං විනොදෙත්වා ලොකෙ උප්පජ්ජි චක්ඛුමා.

452. විත්ථාරිතෙ[8] බාහුජඤ්ඤෙ පුථුභූතෙ ච සාසනෙ,
උපාගමි තදා බුද්ධො නගරං හංසසව්හයං.

453. පිතු අත්ථාය සො බුද්ධො ධම්මං දෙසෙසි චක්ඛුමා,
තෙන කාලෙන පරිසා සමන්තා යොජනං තදා.

454. සම්මතො මනුජානං සො[9] **සුනන්දො** නාම තාපසො,
යාවතා බුද්ධපරිසා පුප්ඵෙහ’ච්ඡාදයී තදා.

455. චතුසච්චං පකාසෙන්තෙ සෙට්ඨෙ ච[10] පුප්ඵමණ්ඩපෙ,
කොටිසතසහස්සානං ධම්මාභිසමයො අහු.

456. සත්තරත්තින්දිවං බුද්ධො වස්සෙත්වා[11] ධම්මවුට්ඨියො,[12]
අට්ඨමෙ දිවසෙ පත්තෙ **සුනන්දං** කිත්තයී ජිනො.

457. “දෙවලොකෙ මනුස්සෙ වා සංසරන්තො අයං භවෙ,
සබ්බෙසං පවරො හුත්වා භවෙසු සංසරිස්සති.

458. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

459. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
**මන්තානිපුත්තො** **පුණ්ණො**ති හෙස්සති සත්ථුසාවකො.”

460. එවං කිත්තයි සම්බුද්ධො[13] **සුනන්දං** තාපසං තදා,
හාසයන්තො ජනං සබ්බං දස්සයන්තො සකං බලං.

---

1. සද්ධම්මෙ. P T S. ථෛ. 2. එකාසිඛා. ම. 3. ගොතම. P T S.
4. චරණා. ථෛ. 5. කිඤ්චනං. අ. මු. 6. සවනං. ම. 7 නායකො. ම.
8. විත්ථාරිකෙ. ම. P T S. 9. යො. ම. සෙ. 10. හෙට්ඨා ච. ම. හෙට්ඨතො. ථෛ
11. වස්සිත්වා. ම. P T S. ථෛ. 12 වුට්ඨියො. P T, S. ථෛ.
13. සො බුද්ධො. ම

# 6. උපාලිස්ථවිරාවදානය

446-447. **හංසවතීනගරයෙහි** රැස් කොට තැබූ අසූ කෙළක් ධනය ඇති සමෘද්ධ වූ ධන ධාන්‍ය ඇති වෙද හදුරන්නා වූ මන්ත්‍රධර වූ වෙදත්‍රයයෙහි පරතෙරට ගියා වූ (අත් පා ආදියෙහි ලකුණු බලා අනාගතය පවසන) ලක්ෂණශාස්ත්‍රයෙහි ද ඉතිහාසයෙහි ද ස්වකීය බ්‍රාහ්මණධර්මයෙහි ද පරතෙරට ගියා වූ **සුජාත** නම් බමුණෙක් වි ය.

448. (හිසැ එක් සිළුවක් ඇති) එකසිඛයෝ ද පරිව්‍රාජකයෝ ද ගෞතමසෘෂිශ්‍රාවකයෝ ද (තැනින් තැන හැසිරෙණ) චරකයෝ ද තවුසෝ ද එකල්හි පොළොවෙහි හැසිරෙත්.

449 ඔහු ද ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙකැයි කියා මා පිරිවරත්. බොහෝ දෙන මා පුදත්. මම **කිසිවෙකු** නො පුදමි.

450. යම් තාක් කල් තථාගතයන් වහන්සේ ලොව පහළ නො වනසේක් ද, ඒ තාක් කල් බුද්ධ යන වචනය පවා (ලෙව්හි) නැත. **එකල්හි** මම මානයෙන් තද වූයෙමි පිදිය යුත්තකු නො දකිමි.

451. රුදුවල් (බොහෝ හවුරුදු) ගෙවී යාමෙන් (පසු) පසැස් ඇති **පදුමුත්තර** නම් ලොකනායක බුදුරජතෙම සියලු අඳුරු දුරු කොට ලොව පහළ වි ය.

452. බුදුසසුන පැතුරුණු කල්හි මැනවැයි සම්මත වූ කල්හි අභිවෘද්ධියට පැමිණි කල්හි බුදුරජතෙම **හංසවතී** නගරයට එළඹියේ ය.

453. පසැස් ඇත්තා වූ ඒ බුදුරජාණන් වහන්සේ පියාණන්ට වැඩ පිණිස ධර්මදෙශනා කළසේක. එකල්හි පිරිස ද හාත්පස යොදුනක් (තන්හි පැතුරුනේ) වි ය.

454. මිනිසුන් අතර **සුනන්ද** නමින් සම්මත වූ ඒ තවුස් තෙමේ එකල්හි යම් තාක් බුදුපිරිස ද, ඒ තාක් තැන මල්වලින් වැසී ය.

455. පුෂ්ප මණ්ඩපයෙහි සිටි බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ චතුස්සත්‍යය දෙශනා කරණ කල්හි කෙළලක්ෂයක් (ප්‍රාණීන්ට) ධර්මාභිසමය වි ය.

456. පස්මරුන් දිනූ බුදුරජ තෙම දිවා රූ සතක් (=සතියක්) උතුම් දහම්වැසි වස්වා අටවැනි දිනය පැමිණි කල්හි සුනන්දට මෙසේ පැවැසී ය.

457. ''මෙතෙම සසරෙහි දෙව්ලොවෙහි ද මිනිස්ලොවෙහි ද සැරිසරන්නේ භවයන්හි සියල්ලනට උතුම් ව සැරිසරන්නේ ය.

458. කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

459. ඒ ගෞතම බුදුරජානන් වහන්සේගේ ධර්මයට දායාද (=කොටස් හිමියෙක්) වූ (දහම් අසා සෝවාන් ආදිමාර්ගඵල පිළිවෙළින් රහත් වූ බැවින් බුදුරජුන්ගේ ඖරස පුත්‍ර වූ ධර්මයෙන් ම මවාලූවාක් වැනි වූ **පුණ්ණමන්තානිපුත්ත** නම් බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

460. එකල්හි සම්බුදුරජ තෙම සියලු දෙනා සතුටු කරමින් ස්වකීය බලය ද දක්වමින් **සුනන්ද** තවුසාට මෙසේ පැවැසී ය.

461. කතඤ්ජලී නමස්සන්ති **සුනන්දං** තාපසං ජනා[1],
බුද්ධෙ කාරං කරිත්වාන සොධෙසි[2] ගතිමත්තනො.

462 තත්ථ මෙ අහු සඞ්කප්පො සුත්වාන මුනිනො වචං,
අහම්පි කාරං කස්සාමි යථා පස්සාමි ගොතමං.

463. එවා'හං චින්තයිත්වාන කිරියං චින්තයිං[3] මමං,
ක්‍යාහං කම්මං ආචරාමි පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ?

464. අයඤ්ච **පාඨිකො**[4] භික්ඛු සබ්බපාඨීන[5]සාසනෙ,
විනයෙ ච අග්ගනික්ඛිත්තො තං ඨානං පත්ථයිං[6] අහං.

465 ඉදං මෙ අමිතං භොගං අක්ඛොභං සාගරූපමං,
තෙන භොගෙන බුද්ධස්ස ආරාමං මාපයිං[7] අහං.

466. **සොභනං** නාම ආරාමං නගරස්ස පුරත්ථතො,
කිත්වා[8] සතසහස්සෙන සඞ්ඝාරාමං අමාපයිං.

467. කූටාගාරෙ ච පාසාදෙ මණ්ඩපෙ හම්මියෙ ගුහා,
චඞ්කමෙ සුකතෙ කත්වා සඞ්ඝාරාමං අමාපයිං.

468. ජන්තාඝරං අග්ගිසාලං අථො උදකමාළකං,
නහානඝරං මාපයිත්වා භික්ඛුසඞ්ඝස්ස'දාසහං.

469. ආසන්දියො පීඨකෙ ච පරිභොගෙ ච භාජනෙ,
ආරාමිකඤ්ච භෙසජ්ජං සබ්බමෙතං අදාසහං.

470. ආරක්ඛං පට්ඨපෙත්වාන පාකාරං කාරයිං දළ්හං,
මා නං කොචි විහෙඨෙසි සන්තචිත්තාන තාදිනං.

471. ආවාසං සතසහස්සෙන[9] සඞ්ඝාරාමෙ[10] අමාපයිං,
වෙපුල්ලතං පාපයිත්වා[11] සම්බුද්ධං උපනාමයිං.

472. "නිට්ඨාපිතො මයා 'රාමො සම්පටිච්ඡ තුවං මුනි,
නිය්‍යාදෙස්සාමි[12] තෙ[13] වීර අධිවාසෙහි චක්ඛුම."

473. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම සඞ්කප්පමඤ්ඤාය අධිවාසෙසි නායකො.

474. අධිවාසනමඤ්ඤාය සබ්බඤ්ඤුස්ස මහෙසිනො,
භොජනං පටියාදෙත්වා කාලමාරොචයිං අහං.

475. ආරොචිතම්හි කාලම්හි පදුමුත්තරනායකො,
ඛීණාසවසහස්සෙහි ආරාමං මෙ උපාගමි.

476. නිසින්නං කාලමඤ්ඤාය අන්නපානෙන තප්පයිං,
භුත්තාවිං කාලමඤ්ඤාය ඉදං වචනමබ්‍රවිං:

---

1 තදා. P T S. සෙ. 2 සොධෙති. ථෙ. 3. චින්තයී. ථෙ.
4. පාඨිතො. ම. පාථිකො. ථෙ.
5. සබ්බපාඨිස්ස. ම. සබ්බපාඨීච. ථෙ. සබ්බපාඨීනා. අ මු.
6. පත්ථයෙ. අ මු. 7. මාපයෙ. අ මු 8. කත්වා. P T S ථෙ.
9. සතසහස්සනාවාසං. ම. ආවාසසතසහස්ස. සෙ. ආවාසසතසහස්සෙන. ථෙ
10. සඞ්ඝාරාමං. P T S 11. වෙපුල්ලං තං මාපයිත්වා. ම. ථෙ.
12. නියෙ. ජෙස්සාමි. ථෙ. 13. තං. ම. සෙ. ථෙ.

461. ජනයෝ කරණලද ඇඳිලි ඇත්තාහු "බුදුරජාණන් වහන්සේ කෙරෙහි පුණ්‍යකර්ම කොට තමාගේ ගතිය පිරිසිදු කෙළේ ය" යි **සුනන්ද** තවුසාට නමස්කාර කෙරෙත්.

462. බුදුරජාණන් වහන්සේගේ වචනය අසා එහි දී මට ද (මේ) අදහස විය. යම් පින්කමක් කිරීමෙන් ගෞතම බුදුරජාණන් වහන්සේ දැකිය හැකි වෙම් නම්, මම ද එබඳු පින්කමක් කරන්නෙමි (කියායි).

463. මම මෙසේ සිතා මා විසින් ඒ සඳහා කෙබඳු පිණක් කට යුතු දැ යි සිතීමි. නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රයෙහි (රත්නත්‍රයෙහි) මම කවර පින්කමක් කෙරෙම් ද ?

464. (මධුරස්වරයෙන් සරභඤ්ඤවසයෙන් ග්‍රන්ථයන් හදාරණ හෙයින්) **පාඨික** නම් වූ මේ භික්ෂු තෙමේ බුද්ධශාසනයෙහි සියලු මධුරස්වරපාඨකයන් අතුරෙහි ද විනයයෙහි ද අග්‍රස්ථානයෙහි තබන ලදී. මම ඒ තනතුර පැතීමි.

465. මාගේ මේ අප්‍රමාණ සම්පත් සයුර මෙන් නො සැලඹිය හැකි ය. මම ඒ ධනයෙන් බුදුරජාණන් වහන්සේට ආරාමයක් කරවීමි.

466. නගරයට නැගෙනහිරින් **සොභන** නම් වූ උයනකි. (එය) ලක්‍ෂයකින් විකිණ ගෙණ සංඝාරාමයක් කරවීමි.

467. කුළුගෙවල් ද ප්‍රාසාදයන් ද මණ්ඩපයන් ද සඳලු සහිත ගෙවල් ද දෙර තො ලූ ගුහාවන් ද සක්මන්මළු ද මැනවින් කොට සංඝාරාමය නිමවීමි.

468. උසුමෙන් ඩහ ගන්වන ගෙය ද ගිනිහල ද යලි පැන්කල තබන ගෙය ද නහනගෙය ද කොට මම භික්ෂු සංඝයාට දිනිමි.

469. දික්හලාපුටු ද (කුඩා) පුටු ද පරිභොගභාජන ද ආරාමිකයනට දෙන බෙහෙත් ද යන මේ සියල්ල මම දිනිමි.

470. සන්හුන් සිත් ඇති අකම්ප්‍ය ගුණ ඇත්තවුන්ගේ ඒ ගුණයනට කිසිවෙක් පීඩා නො කෙරේවා යි ආරක්‍ෂා තබවා දැඩි කොට පවුරක් කරවීමි.

471. ලක්‍ෂයක් (ධන) වියදමින් ඒ සංඝාරාමයෙහි ආවාසයක් කරවීමි. එය උසස්බවට පමුණුවා බුදුරජානන් වහන්සේට පිරිනැමීමි.

472. "මා විසින් ආරාමය කොට නිමවන ලදී. තථාගතයන් වහන්ස, ඔබවහන්සේ මෙය පිළිගත මැනවි. වීරයාණන් වහන්ස, මෙය ඔබ වහන්සේට දෙන්නෙමි. පසැස් ඇත්තානන්වහන්ස, මෙය පිළිගත මැනවි" (යි දැන්වීමි).

473. පූජාසත්කාරයන් පිළිගැණීමට සුදුසු වූ ලොකනායක වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ මාගේ අදහස දැන එය ඉවසූසේක.

474. මහර්ෂි වූ සර්වඥයන් වහන්සේගේ ඉවසීම දැන මම භොජනය පිළියෙල කරවා කාලය ආරොචනය කෙළෙමි.

475. කාලය දැන්වූ කල්හි **පදුමුත්තර** ලොකනායකයන් වහන්සේ රහතුන් දහසක් විසින් පිරිවරණ ලදසේක් මාගේ ආරාමයට වැඩිසේක.

476. සුදුසු කාලය දැන වැඩහුන්නාවූ උන්වහන්සේ ආහාර පානයෙන් තෘප්ත කෙළෙමි. (යලි) සුදුසු කලැයි දැන වළඳා අවසන් වූ උන්වහන්සේට මේ වචනය කීමි:

477. "කීතො සතසහස්සෙන තත්තකෙනෙ'ව කාරිතො,
සොභනො නාම ආරාමො සම්පටිච්ඡ තුවං මුනි.[1]

478. ඉමිනා'රාමදානෙන චෙතනාපණිධීහි ච,
භවෙ නිබ්බත්තමානො'හං ලභාමි මම පත්ථිතං."

479. පටිග්ගහෙත්වා සම්බුද්ධො සඞ්ඝාරාමං සුමාපිතං,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉදං වචනමබ්‍රවි:

480 "යො සො බුද්ධස්ස පාදාසි සඞ්ඝාරාමං සුමාපිතං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

481. හත්ථී අස්සා රථා පත්තී සෙනා ච චතුරඞ්ගිනී,
පරිවාරෙස්සන්ති'මං නිච්චං සඞ්ඝාරාමස්සි'දං ඵලං.

482 සට්ඨිතුරියසහස්සානි භෙරියො සමලඞ්කතා,
පරිවාරෙස්සන්ති'මං නිච්චං සඞ්ඝාරාමස්සි'ද ඵලං.

483. ඡළාසීතිසහස්සානි නාරියො සමලඞ්කතා,
විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

484. ආළාරපම්හා හසුලා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
පරිවාරෙස්සන්ති'මං නිච්චං සඞ්ඝාරාමස්සි'දං ඵලං.

485. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

486. දෙවරාජෙන පත්තබ්බං සබ්බං පටිලභිස්සති,
අනූනභොගො හුත්වාන දෙවරජ්ජං කරිස්සති.

487. සහස්සක්ඛත්තුං චක්කවත්තී රාජා රට්ඨෙ භවිස්සති,
පථව්‍යා රජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං

488. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

489. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
**උපාලි** නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

490. විනයෙ පාරමිං පත්වා[2] ඨානාඨානෙ ච කොවිදො,
ජිනසාසනං ධාරයන්තො[3] විහරිස්සත'නාසවො.

491. සබ්බමෙතං අභිඤ්ඤාය ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙස්සති."

492. අපරිමෙය්‍යු'පාදාය පත්ථෙමි තව සාසනං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

1. මුනෙ. ථෙ. 2. පත්තො. P T S. ථෙ.
3. ජොතයන්තො. ථෙ. ධාරෙන්තො. P T S. සෙ.

477. "සොභන නම් වූ (මේ) ආරාමය ලක්‍ෂයක් මිල දී ගන්නා ලදී. එපමණ ම මුදලකින් (සෙසු කටයුතු) කරවන ලදී. බුදුරජාණන් වහන්සේ එය පිළිගන්නා සේක්වා.

478. මෙ ම ආරාමදානයෙන් ද චිත්තප්‍රණිධීන්ගෙන් ද භවයෙහි උපදින්නා වූ මම මා විසින් පතන ලද්ද ලබම්වා."

479. බුදුරජතෙම මැනවින් කොට නිමවන ලද සංඝාරාමය පිළිගෙණ භික්සඟන මැද හිඳ ඒ අරමෙහි අනුසස් දක්වන මෙම වචනය වදාළේ ය.

480. "යමෙක් තෙම මැනැවින් කොට නිමවනලද සංඝාරාමය බුදුරජානන් වහන්සේට පූජා කෙළේ ද, මම ඔහු පිළිබඳ තොරතුරු කියන්නෙමි. එය කියන්නා වූ මාගේ වචනය අසවු.

481. ඇත්සේනාව ද අස්සේනාව ද රථසේනාව ද පාබල සේනාව ද යන මේ සිවුරඟ සේනා නිරතුරු ව ම මොහු පිරිවරන්නාහු ය. මෙය සංඝාරාමදානයෙහි විපාකය යි.

482. සැටදහසක් තූර්‍යයෝ ද මැනවින් අලඞ්කාර කළ භෙරීහු ද නිරතුරු ව ම මොහු පිරිවරන්නාහු ය. මෙය සංඝාරාම දානයෙහි විපාකය යි.

483-484. මැනවින් අලඞ්කාර කරණලද විසිතුරු අබරණ ඇත්තා වූ එල්වනලද මිණිකොඬොල් ඇති මහත් වූ දිගු ඇස් ඇති සතුට උපදවන ලීලා විලාස ඇති මනා වූ ශරීරාවයව ඇති සිහින් ඉඟ ඇති සොළොස් දහසක් සත්‍රීහු නිරතුරු ව ම මොහු පිරිවරන්නාහු ය. සඞ්ඝාරාම පූජාවෙහි මේ විපාකය යි.

485. කල්ප තිස්දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. ශක්‍ර ව දහස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

486. දෙව්රජ විසින් ලැබිය යුතු සියල්ල ලබන්නේ ය. සියලු සම්පත් ඇත්තෙක් ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

487. දහස්වරක් රටෙහි සක්විතිරජ වන්නේ ය. මහත් වූ පෘථිවී-රාජ්‍යය (ලබනවාර) ගණන් වශයෙන් ප්‍රමාණ කළ නො හැක්කේ ය.

488. කල්ප ලක්‍ෂයකින් මත්තෙහි **ඔක්කාක** කුලසම්භව වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

489. උන්වහන්සේගේ ඖරසපුත්‍ර වූ ධර්‍මයෙහි හිමිකම් ඇති ධර්‍මයෙන් නිම කළාක් වැනි වූ නමින් **උපාලි** නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

490. විනයයෙහි කෙළ පැමිණ කටයුතු නො කටයුතු දැනුමෙහි දක්‍ෂ වූයේ බුදුසසුන (=ත්‍රිපිටකධර්‍මය) දරන්නේ ආශ්‍රව රහිත ව වාසය කරන්නේ ය.

491. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ බුදුරජ තෙම මේ සියල්ල දැන භික් සඟන මැද හිඳ මොහු අග්‍රස්ථානයෙහි තබන්නේ ය" (යනුයි).

492. අපමණ කලක පටන් ඔබවහන්සේගේ සසුන (විනය ධාරීන් ගෙන් අග්‍රස්ථානය) පතමි. සියලු සංයෝජනයන් ක්‍ෂය කිරීම වූ ඒ අර්‍ථය මා විසින් ලබන ලදී.

493. යථා සූලාවුතො පොසො රාජදණ්ඩෙන තජ්ජිතො,
සූලෙ සාතං අවින්දන්තො[1] පරිමුත්තිංව ඉච්ඡති.

494. තථෙවා'හං මහාවීර භවදණ්ඩෙන තජ්ජිතො,
කම්මසූලාවුතො සන්තො පිපාසාවෙදනට්ටිතො.[2]

495. භවෙ සාතං න වින්දාමි ඩය්හන්තො තීහි අග්ගිහි,
පරිමුත්තිං ගවෙසාමි යථාපි රාජදණ්ඩිතො

496. යථා විසාදො[3] පුරිසො විසෙන පරිපීළිතො,
අගදං සො ගවෙසෙය්‍ය විසඝාතායුපාලනං.[4]

497. ගවෙසමානො පස්සෙය්‍ය අගදං විසඝාතකං,
තං පිවිත්වා[5] සුඛී අස්ස විසම්හා පරිමුත්තියා.

498. තථෙවා'හං මහාවීර යථා විසහතො[6] නරො,
සම්පීළිතො අවිජ්ජාය සද්ධම්මාගදමෙසිසං.[7]

499. ධම්මාගදං[8] ගවෙසන්තො අද්දක්ඛිං සක්‍යසාසනං,
අග්ගං සබ්බොසධානං තං සබ්බසල්ලවිනොදනං.

500. ධම්මොසධං පිවිත්වාන විසං සබ්බං සමූහනිං,[9]
අජරාමරං සීතිභාවං නිබ්බාණං ඵස්සයිං[10] අහං.

501. යථා භූතට්ටිතො[11] පොසො භූතග්ගාහෙන පීළිතො,
භූතවෙජ්ජං ගවෙසෙය්‍ය භූතස්මා පරිමුත්තියා.

502. ගවෙසමානො පස්සෙය්‍ය භූතවිජ්ජාසු කොවිදං,[12]
තස්ස සො විහනෙ[13] භූතං සමූලඤ්ච විනාසයෙ.

503. තථෙවා'හං මහාවීර තමග්ගාහෙන පීළිතො,
ඤාණාලොකං ගවෙසාමි තමතො පරිමුත්තියා.

504. අථ'ද්දසං සක්‍යමුනිං කිලෙසතමසොධනං,
සො මෙ තමං විනොදෙසි භූතවෙජ්ජොව භූතකං.[14]

505. සංසාරසොතං සංඡින්දිං තණ්හාසොතං නිවාරයිං,
භවං උග්ඝාටයිං සබ්බං භූතවෙජ්ජොව මූලතො.

506. ගරුළො යථා ඔපතති[15] පන්නගං භක්ඛමත්තනො,
සමන්තා යොජනසතං වික්ඛොභෙති මහාසරං.

507. පන්නගං සො ගහෙත්වාන අධොසීසං විහෙඨයං[16],
ආදාය සො පක්කමති යෙන කාමං විහඞ්ගමො.

508. තථෙවාහං[17] මහාවීර යථාපි ගරුළො බලී[18],
අසඞ්ඛතං ගවෙසන්තො දොසෙ වික්ඛාලයිං අහං.

509. දිට්ඨො අහං ධම්මවරං සන්තිපදමනුත්තරං,
ආදාය විහරාමෙතං ගරුළො පන්නගං යථා.

---

1. න වින්දන්තා. P T S. ථෙ. 2. වෙදනද්දිතා. ථෙ. 3. විසාරදො. ථෙ.
4 යුපායනං. ම. සෙ අ. යුපායසො. P T S. 5. පිවිත්වාන. ථෙ.
6. විසතො. ම 7. මෙස'හං. P T S. ථෙ 8. ධම්මොසධ. ථෙ.
9. සමූහතං. ථෙ. 10. ඵස්සයිං. ම. P T S. 11. භූතද්දිතො. ථෙ.
12. භූතවෙජ්ජං සුකොවිදං ථෙ. 13. විහිතෙ ථෙ. 14. භූතිකං. (සබ්බත්ථ.)
5. යථොපතති. ම. ඔපතති. P T S. ඔපතිතං. ථෙ. 16. විපොඨයං. ථෙ.
17. තථෙව හං. ම. P T S 18 බලං. ථෙ.

493. යම් සේ රාජදණ්ඩනයෙන් තැති ගත් පුරුෂ තෙම හුලෙහි ඇමිණුනේ හුලෙහි සැපයක් නොවිඳුනේ (ඉන්) මිදීම ම කැමති වෙයි ද,

494. මහාවීරයන්වහන්ස, මම ද එසේ ම භවදණ්ඩනයෙන් තැති-ගත්තෙම් සාමීය නැමැති හුලෙහි ඇමිණුනෙම් තෘෂ්ණාවෙදනාවෙන් මඩනාලද්දෙමි,

495. (රාග, දෙවෂ, මොහ) යන ත්‍රිවිධ අග්නියෙන් දැවෙන්නෙම් භවයෙහි සැපතක් නො විඳිමි. රාජදණ්ඩනයෙන් තැති ගත්තකු මෙන් මිදීම සොයමි.

496. යම් සේ විෂයෙන් (සර්පයකු විසින්) ඩහනලද පුරුෂයෙක් විෂයෙන් පෙළුනේ විෂ නසන ආයුෂ රකින බෙහෙතක් හෙතෙම සොයන්නේ ද,

497. (එසේ) සොයමින් විෂ නසන්නා වූ බෙහෙතක් දකින්නේ විෂයෙන් මිදීම පිණිස එය බී සුවපත් වන්නේ ද,

498. එසේ ම මහාවීරයන් වහන්ස, මම විෂයෙන් නටුවා වූ පුරුෂයකු මෙන් අවිද්‍යාවෙන් පෙළුනේ සදහම් බෙහෙත සෙවීමි.

499. දහම්බෙහෙත සොයන්නෙම් සියලු ඖෂධයනට අග්‍ර වූ සියලු (රාගාදි) හුල් දුරු කරන්නා වූ ඒ බුද්ධශාසනය දුටුවෙමි.

500. මම දහම්ඔසුව බී සියලු (සසර) විෂ දුරු කෙළෙමි. අජරාමර වූ සිසිල් වූ නිවණ ප්‍රත්‍යක්ෂ කෙළෙමි.

501. යම් සේ භූතයකු විසින් පෙළනලද පුරුෂයෙක් තෙම භූතග්‍රහණයෙන් පීඩිත වූයේ භූතයාගෙන් මිදීම පිණිස භූතවෛද්‍යයකු සොයන්නේ ද,

502. සොයමින් භූත විද්‍යාවෙහි දක්ෂයකු දකින්නේ ය. ඒ වෙද තෙම ඔහුගේ භූතයා නසන්නේ ය. සහමුලින් ම වනසන්නේ ය.

503. මහාවීරයන් වහන්ස, එසේ ම මම කෙලශාන්ධකාරයෙන් පෙළුනෙම් (එම) අඳුරින් මිදීම පිණිස ඥානාලොකය (ප්‍රඥව) සොයමි.

504. ඉක්බිති කෙලෙස්අඳුර දුරු කරන්නා වූ ශාක්‍යමුනීන් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ භූතවෛද්‍යයකු භූතාවෙශය දුරු කරන්නාක් මෙන් මාගේ කෙලශාන්ධකාරය දුරු කළසේක.

505. භූතවෛද්‍යයකු (භූතාවෙශය) මෙන් සසර සැඩපහර සින්දෙමි. තෘෂ්ණාස්‍රොතස වැළැක්වීමි. සියලු භවය මුලින් ම නැසීමි.

506. යම් සේ ගුරුළෙක් තෙම තමාගේ ගොදුර වූ නාගයා වෙත වේගයෙන් බසී ද, මහසමුදුර හාත්පස යොදුන් සියයක් කළඹා ද,

507. ඒ ගුරුළු තෙමේ හිස යටිකුරු කොට නාගයා ගෙණ පෙළන්නේ කැමැති තැනකට ගෙණයේ ද,

508. මහාවීරයන් වහන්ස, එසේ ම මම ගුරුළා බිලි සොයන්නාක් මෙන් අසංස්කෘත සඞ්ඛ්‍යාත නිර්වාණය සොයන්නෙම් (කෙලශ) දෙස් (සමුච්ඡෙද වශයෙන්) මම සෝදා හැරීමි.

509. නිරුත්තරශාන්තපදය වූ උතුම් නිර්වාණධර්මය දක්නාලද මම ගුරුළා නාගයකු මෙන් මෙය (=ධර්මය) ගෙණ වෙසෙමි.

510. **ආසාවතී** නාම ලතා ජාතා චිත්තලතාවනෙ,
තස්සා වස්සසහස්සෙන එකං නිබ්බත්තතෙ ඵලං.

511. තං දෙවා පයිරුපාසන්ති තාව දූරෙ ඵලෙ සති,[1]
දෙවානං සා පියා[2] එවං **ආසාවතීලතුත්තමා**.

512. සතසහස්සුපාදාය තා'හං[3] පරිචරෙ මුනිං,
සායං පාතං නමස්සාමි දෙවා **ආසාවතිං** යථා.

513. අවඤ්ඣා පාරිචරියා අමොඝා ච නමස්සනා,
දූරාගතම්පි මං සන්තං ඛණො මං[4] න විරාධයි.

514 පටිසන්ධිං න පස්සාමි විචිනන්තො භවෙ අහං,
නිරූපධි විප්පමුත්තො උපසන්තො චරාම'හං.

515. යථාපි පදුමං නාම සූරියරංසෙන පුප්ඵති,
තථෙවා'හං මහාවීර බුද්ධරංසෙන පුප්ඵිතො.

516. යථා බලාකායොනිම්හි න විජ්ජති පුමා[5] සදා,
මෙඝෙසු ගජ්ජමානෙසු ගබ්භං ගණ්හන්ති තා සදා.

517. චිරම්පි ගබ්භං ධාරෙන්ති යාව මෙඝො න වස්සති,[6]
භාරතො පරිමුච්චන්ති යදා මෙඝො පවස්සති.

518. පදුමුත්තරබුද්ධස්ස ධම්මමෙඝෙන ගජ්ජතො,
සද්දෙන ධම්මමෙඝස්ස ධම්මගබ්භං අගණ්හි'හං.

519. සතසහස්සුපාදාය[7] පුඤ්ඤගබ්භං ධරෙම'හං,
නප්පමුඤ්චාමි භාරතො ධම්මමෙඝෙ[8] න ගජ්ජති[9].

520. යදා තුවං සක්‍යමුනෙ රම්මෙ **කාපිලවත්ථවෙ**,
ගජ්ජසි[10] ධම්මමෙඝෙන භාරතො පරිමුත්ත'හං[11].

521. සුඤ්ඤතං අනිමිත්තඤ්ච තථාප්පණිහිතම්පි[12] ච,
චතුරො ච ඵලෙ සබ්බෙ ධම්මෙ විජානයිං අහං.[13]

**දුතියභාණවාරං**

---

1. තාව දූරඵලං පති. ථෙ. 2. දෙවානං හාසියා. ථෙ
3. තාහං. ථෙ. 4. යං. ම. 5 පුමො. ම.
6. න වච්ජති. ම. ගජ්ජති PTS. සෙ. ථෙ.අ.
7. සතසහස්සං, උපාදාය. PTS. ථෙ. 8. මෙඝො. ථෙ 9 වච්ජති. ම.
10. වච්ජසි ම ගජ්ජිතො. ථෙ. 11. පරිමුච්ච'හං. සෙ පරිමුඤ්චිහං. ථෙ.
12. අථප්ප. සෙ. ථෙ. 13. ධම්මගබ්භො විජායාහං. ථෙ. ධම්මෙ ච විජායහං. PTS. අ.

510. චිත්‍රලතාවනයෙහි හටගත්තා වූ (දෙවියන් ආසා කරණ හෙයින්) **ආසාවතී** නම් වූ වැලක් වෙයි. ඒ වැලේ හවුරුදු දහසකින් එක මලක්* හටගනී.

511. එතෙක් දිගු කලක් ගොස් මල ඇති වූ කල්හි ඒ වැල දෙවියෝ ඇසුරු කෙරෙත්. ඒ ආසාවතී නම් උතුම් ලතාව මෙසේ දෙවියනට ප්‍රිය වන්නී ය.

512. කල්ප ලක්‍ෂයක පටන් මම ඒ බුදුරජාණන් වහන්සේ ඇසුරු කරමි. උදේ සවස නමදිමි. දෙවියන් ආසාවතී ලතාව ඇසුරු කරන්නාක් මෙනි.

513. පාරිචරියාව (බුදුරජාණන් වහන්සේට වත්පිළිවෙත් කිරීම) නො වඳ ය. නමස්කාරය නො සිස් ය. සසර බොහෝ දුර සිට ආවා වූ මට ඇති වූ මේ බුද්ධොත්පාදක්‍ෂණය මා ඉක්මවා නො ගියේ ය.

514. මම පරීක්‍ෂා කොට බලන්නෙම් භවයෙහි ප්‍රතිසන්‍ධියක් නො දකිමි. (එසේ ම) මම (ස්කන්‍ධ-ක්ලේශ) උපධි විරහිත වූයෙමි (සියලු කෙලෙසුන්ගෙන්) මිදුනෙම් සන්සිඳුනෙම් හැසිරෙමි.

515. පියුම වනාහි යම් සේ හිරුරැසින් පිපේ ද, එසේ ම මහා-වීරයන් වහන්ස, මම ද බුදුරැසින් පිපුනෙම් වෙමි.

516. යම් සේ බලාකායොනියෙහි (=කොක් ජාතියෙහි) හැම කල්හි පිරිමිසත්තු විද්‍යමාන නො වෙද්ද, ඒ කෙකින්නෝ හැම ද මෙඝගජ්නය කරණ කල්හි ගැබ් ගණිත් ද,

517. යම් තාක් කල් වැසි නො වසී ද, (ඒ තාක්) දීර්ඝකාලයක් නමුදු කෙකින්නෝ ගැබ් දරත්. යම් කලෙක් හි වැසි වසී ද, එකල්හි (ගැබ්) බරින් මිදෙත්.

518. ධර්මය නමැති මෙඝයෙන් ගජ්නය කරන්නා වූ **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේගේ ධර්මමෙඝයාගේ ශබ්දය කරණ කොට ගෙණ මම දහම්ගැබ් ගතිමි.

519. කල්ප ලක්‍ෂයක පටන් ම මම (රැස් කළ) පින් නමැති ගැබ් දරමි. ධර්ම නමැති මෙඝය ගජ්නා නො කරණ කල්හි (එම ගැබ්) බරින් නො මිදෙමි.

520. ශාක්‍යමුනීන්‍ද්‍රයන් වහන්ස, යම් කලෙක්හි ඔබ රම්‍ය වූ **කපිලවස්තු** නගරයෙහි ධර්මමෙඝයෙන් ගජ්නය කළසේක් නම්, මම (ඒ පින් ගැබ්) බරින් මිදුනෙම් වෙමි.

521. (ආත්ම දෘෂ්ටි විරහිත බැවින්) ශූන්‍ය වූ, (කෙලශ නිමිති රහිත බැවින්) අනිමිත්ත වූ, (තෘෂ්ණා ප්‍රණිධි රහිත බැවින්) අප්පණිහිත වූ විමොක්‍ෂ ධර්මය ද, චතුර්විධ ශ්‍රාමණ්‍යඵල ද යන මේ සියලු ධර්මයන් මම ඉපදවීමි.

**දෙවෙනි බණවරයි.**

---

*ආසාවතී නාම එකාලතා අත්‍ථි. සා පුප්ඵිස්සතීති,
දෙවා වස්සසහස්සං උපට්ඨානං ගච්ඡන්ති (සාරත්‍ථදීපනී 227. වෙරඤ්ජකණ්ඩ)

ආසාවතී නම් එක් ලියකුදු ඇත. එහි මල් පිපෙන්නේයයි දෙවියෝ දහසක් හවුරුදු උපස්ථානයට යෙති. (බුත්සරණ 47)

522. අපරිමෙය්‍යුපාදාය පත්ථෙමි තව සාසනං,
සො මෙ අත්ථො අනුප්පත්තො සන්තිපදමනුත්තරං.

523. විනයෙ පාරමිං පත්තො යථාපි **පාඨිකො**[1] ඉසි,
න මෙ සමසමො අත්ථි[2] ධාරෙමි සාසනං අහං.

524 විනයෙ ඛන්ධකෙ චාපි තිකච්ඡෙදෙ ච පඤ්චමෙ,
එත්ථ මෙ[3] විමතී නත්ථි අක්ඛරෙ ව්‍යඤ්ජනෙපි වා.

525. නිග්ගහෙ පටිකම්මෙ ච ඨානාඨානෙ ච කොවිදො,
ඔසාරණෙ වුට්ඨාපනෙ සබ්බත්ථ පාරමිං ගතො.

526. විනයෙ ඛන්ධකෙ චාපි නික්ඛිපිත්වා පදං අහං,
උභතො විනිවෙඨෙත්වා රසතො ඔසරෙය්‍ය’හං.

527. නිරුත්තියා සුකුසලො අත්ථානත්ථෙ ච කොවිදො,
අනඤ්ඤාතං මයා නත්ථි එකග්ගො සත්ථුසාසනෙ.

528. රූපදක්ඛො අහං අජ්ජ සක්‍යපුත්තස්ස සාසනෙ,
කඞ්ඛං සබ්බං විනොදෙමි ඡින්දාමි සබ්බසංසයං.

529. පදං අනුපදඤ්චාපි අක්ඛරඤ්චාපි ව්‍යඤ්ජනං[4],
නිදානෙ පරියොසානෙ සබ්බත්ථ කොවිදො අහං.

530. යථාපි රාජා බලවා නිග්ගණ්හිත්වා පරන්තපෙ[5],
විජිනිත්වාන සඞ්ගාමං නගරං තත්ථ මාපයෙ.

531. පාකාරං පරිඛඤ්චාපි එසිකං ද්වාරකොට්ඨකං,
අට්ටාලකෙ ච විවිධෙ කාරයෙ නගරෙ බහූ.

532. සිඞ්ඝාටකං චච්චරඤ්ච[6] සුවිභත්ත’න්තරාපණං,
කාරයෙය්‍ය[7] සභං තත්ථ අත්ථානත්ථවිනිච්ඡයං.

533. නිඝාතත්ථං අමිත්තානං ඡිද්දාඡිද්දඤ්ච ජානිතුං,
බලකායස්ස රක්ඛාය[8] සෙනාපච්චං ඨපෙති[9] සො:

534. ආරක්ඛත්ථාය භණ්ඩස්ස නිධානකුසලං නරං,
මා මෙ භණ්ඩං විනස්සීති භණ්ඩරක්ඛං ඨපෙති[10] සො.

1. පාවිකො. සෙ ථෙ. පාටකො. ම. 2 න මෙසො ඉදනත්ථි. ථෙ. 3. එත්තකො. ථෙ.
4. (එවං සබ්බෙසු) 5. නිහන්ත්වා පරඛත්තියෙ. ථෙ. 6. ඔවරං ච. ථෙ.
7. කාරයෙ සො ම.
8. සමෙතුං බලකායස්ස. ථෙ. රක්ඛාය බලකායස්ස. P T S. සෙ.
9-10. ඨපෙසි. ම. සෙ ථෙ.

522. පමණ කළ නො හැකි කාලයක පටන් ඔබ වහන්සේගේ සසුන පැතීමි. මා විසින් පැමිණෙනලද එම (ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත) අර්ථ ඇත්තෙම් පැමිණෙනලද ශාන්තපදය වූ නිවණ ද ඇත්තෙම් වෙමි.

523. (පදුමුත්තර බුදුසසුනෙහි) පාඨික භික්ෂුහු මෙන් විනයෙහි තෙර පතුයෙමි වෙමි. මට සමාන අනිකෙක් ද නැත. මම සසුන (ඔවාදසාසනය) දරමි.

524. විනයයෙහි (=භික්ෂු භික්ෂුණී විභඞ්ග සඞ්ඛ්‍යාත උභතොවිභඞ්ග-යෙහි) ද, ඛන්ධකයෙහි (=චුල්ලවග්ග මහාවග්ග දෙක්හි) ද, තික සඞ්ඝාදිසෙස-තික පාචිත්තියාදියෙහි ද, පස්වැනි වූ පරිවාරයෙහි ද යන මෙහි (=විනය පිටකයෙහි) අකුරක හෝ ව්‍යඤ්ජනයක හෝ මාගේ සැකයක් නැත.

525. (පාප භික්ෂූන්ට) නිග්‍රහ කිරීමෙහි ද, (සාපත්තික) භික්ෂූන්ට (පරිවාස දානාදියෙන්) ප්‍රතිකර්ම කිරීමෙහි ද, කරුණෙහි හා නො කරුණෙහි ද දක්ෂ වූයෙමි (තජ්ජනීයාදි කර්මයන්ගේ පටිප්පස්සද්ධි වශයෙන් සසුනට ඇතුළු කරගන්නා) ඔසාරණයෙහි ද, ඇවතින් නැගිටුවාලන වුට්ඨාපනයෙහි ද යන මේ සියල්ලෙහි පරතෙරට පැමිණියෙමි වෙමි.

526. (උභතො විභඞ්ග සඞ්ඛ්‍යාත) විනයයෙහි ද, (චුල්ලවග්ග මහාවග්ග සඞ්ඛ්‍යාත) ඛන්ධකයෙහි ද මම සුදුසු පදය බහා (විභඞ්ග ඛන්ධක) දෙකින් නිරවුල් කොට (ක්‍රම දක්වා) කෘත්‍ය වශයෙන් (සුදුසු) අදහස් ඇතුළත් කරමි.

527. නිරුක්තියෙහි (=ව්‍යවහාරවචනයන්හි නියම අර්ථ කීමේ ක්‍රමයෙහි) ඉතා දක්ෂ වූයෙමි අභිවෘද්ධිය පරිහානිය යන මේ දෙක්හි ද ඡේක වූයෙමි වෙමි. (ත්‍රිපිටකයෙහි) මා විසින් දැන නො ගන්නාලද්දක් නැත. බුද්ධ ශාසනයෙහි (මම ම) අසහාය වූ අග්‍රවිනයධරයා වෙමි.

528. මම අද ශාක්‍යපුත්‍ර වූ බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි (විනයවිනිශ්චයදශීන සඞ්ඛ්‍යාත) රූපදශීනයෙහි සියලු සැක දුරු කරමි. සියලු කුකුස් සිඳිමි.

529. පෙර පසු පද (එක එක) අකුරු ද, (සිථිල ධනිතාදි) දශවිධ ව්‍යඤ්ජනවිධානය ද, (තෙන සමයෙන යනාදි) නිදානය ද, නිගමනය ද යන මේ සියල්ලෙහි මම දක්ෂ වෙමි.

530. යම් සේ බලවත් රජෙක් තෙම සතුරු රජුන්ගේ සෙනග පහ කොට සඞ්ග්‍රාමය ජය ගෙණ එහි නුවරක් ඉදි කරන්නේ නම්,

531. පවුර ද දියඅගල ද ඉන්ද්‍රකීලය ද දොරටුව ද විවිධ අටලු ද යන බොහෝ දෙය (මේ) නගරයෙහි කරවන්නේ ය.

532. සිවු මංසන්ධි ද ඇතුළු වීථි ද මැනවින් බෙදනලද ආපණ ශාලාවන් ද (එසේ ම)එහි වරද නිවරද විනිශ්චය කරණ අධිකරණ ශාලාව ද කරවන්නේ ය.

533. හෙතෙම පසමිතුරන් නැසීම පිණිස ද දොස් නිදොස් දැන ගැණීම පිණිස ද භට(සේනා)සමූහය රැකීම පිණිස ද සෙන්පතියකු තබයි.

534. හෙතෙම "මාගේ භාණ්ඩයන් විනාශ නො වේවා යි" රාජ භාණ්ඩයන්ගේ ආරක්ෂාව පිණිස (ධනය) නැත්පත් කිරීමෙහි දක්ෂ වූ පුරුෂයකු භාණ්ඩාගාරරක්ෂකයා කොට තබයි.

535. මාමකො[1] හොති යො රඤ්ඤො වුද්ධිං යසඤ්ච ඉච්ඡති,
තස්සාධිකරණං දෙති මිත්තස්ස පටිපජ්ජිතුං.

536. උප්පාතෙසු නිමිත්තෙසු ලක්ඛණෙසු ච කොවිදං,
අජ්ඣායකං මන්තධරං පොරොහිච්චෙ ඨපෙති[2] සො.

537. එතෙහඞ්ගෙහි සම්පන්නො ඛත්තියොති පවුච්චති,
සදා රක්ඛන්ති රාජානං චක්කවාකොව දුක්ඛිතං[3]

538. තථෙව ත්වං මහාවීර හතාමිත්තොව[4] ඛත්තියො,
සදෙවකස්ස ලොකස්ස ධම්මරාජාති වුච්චති.

539. තිත්ථියෙ නිහනිත්වාන[5] මාරඤ්චාපි සසෙනකං,
තමන්ධකාරං විධමිත්වා ධම්මනගරං අමාපයී.

540. සීලං පාකාරකං[6] තත්ථ ඤාණං තෙ ද්වාරකොට්ඨකං,
සද්ධා තෙ එසිකා ධීර ද්වාරපාලො ච සංවරො.

541. සතිපට්ඨානමට්ටාලං පඤ්ඤා තෙ චච්චරං මුනෙ,
ඉද්ධිපාදඤ්ච සිඞ්ඝාටං ධම්මවීථි සුමාපිතා[7].

542. සුත්තන්තං අභිධම්මො[8] ච විනයො[9] චාපි කෙවලං,
නවඞ්ගං බුද්ධවචනං එසා[10] ධම්මසභා තව.

543. සුඤ්ඤතං අනිමිත්තඤ්ච අප්පණිහිතවිහාරකං[11],
අනෙජං[12] ච නිරොධො ච එසා ධම්මකුටී තව.

544. පඤ්ඤාය අග්ගනික්ඛිත්තො[13] පටිභානෙ ච කොවිදො,
**සාරිපුත්තොති** නාමෙන ධම්මසෙනාපතී තව.

545. චුතූපපාතකුසලො ඉද්ධියා පාරමිඞ්ගතො,
**කොලිතො** නාම නාමෙන මුනෙ තව පුරොහිතො.[14]

546. පොරාණකවංසධරො උග්ගතෙජො දුරාසදො,
ධුතවාදිගුණෙන'ග්ගො[15] අක්ඛදස්සො තවං මුනෙ.

1. මමත්තො. ම. සෙ. මමන්තො අ. සමත්තො. ථෛ. 2. ඨපෙසි. ම. සෙ. ථෛ.
3. දුක්ඛිතං ම. පක්ඛිතං. ථෛ. 4. මහාමිත්තොව. ථෛ. 5. නීහරිත්වාන. සෙ. අ.
6 පාකාරිකං. ම. P T S සෙ. 7. සුමාපිතං. ම. P T S
8. අභිධම්මං. P T S. ම. සෙ 9. විනයං. P T S. ම. සෙ
10. එතෙ. P T S 11. විහාරඤ්චප්පණීහිතං. (සබ්බත්ථ) 12. ආනෙජ්ජං. ථෛ.
13. අග්ගො-ම. P T S 14. පොරොහිච්චො තවං මුනෙ. ම. P T S සෙ ථෛ
15. ගුණෙ අග්ගො. ම. ධුතඞ්ගාදි- ථෛ

535. යමෙක් රජුට මමත්‍වය කරන්නේ වේ ද, යමෙක් ඒ රජුගේ අභිවෘද්ධිය කැමැති වේ ද, ඒ මිත්‍රයාහට (ධර්මානුකූලව ම) පිළිපැදීමට අධිකරණ නායකත්‍වය දෙයි.

536. හෙතෙම (උල්කාපාත දිග්දාහාදි භූතවිකෘතීන් පිළිබඳ වැඩ අවැඩ දන්නා) උත්පාතශාස්ත්‍රයෙහි ද, (මූසිකච්ඡින්න =මීයන් කැපීම ආදියෙහි වැඩ අවැඩ දන්නා) නිමිති ශාස්ත්‍රයෙහි ද, (ස්ත්‍රීපුරුෂයන්ගේ අඞ්ගලක්ෂණ බලා ජීවිතය පිළිබඳ තොරතුරු පවසන) ලක්ෂණශාස්ත්‍ර යෙහි ද දක්ෂ වූ (බොහෝ ශිෂ්‍යයනට) වෙද හදුරවන්නා වූ (වෙදත්‍රය සඞ්ඛ්‍යාත) මන්ත්‍ර දරන්නා වූ පුරුෂයකු පුරෝහිතතනතුරෙහි තබයි.

537. මේ අඞ්ගයන්ගෙන් යුක්ත වූයේ ක්ෂත්‍රියයා ය යි කියනු ලැබේ. (ඒ සේනාවෝ) සවකීය ක්‍ෂුතීන් වූ දුඃඛිතයන් රකින සක්වාලිහිණියා මෙන් හැම කල්හි රජතුමා රකිත්.

538. මහාවීරයන් වහන්ස, එසේ ම ඔබවහන්සේ නසනලද සතුරන් ඇති රජකු මෙන් දෙවියන් සහිත ලෝකයෙහි ධර්මරාජ ය යි කියනු ලබන සේක.

539. තීර්ථකයන් ද සෙනා සහිත වූ මාරයා ද නසා ඝනමොහාන්ධ-කාරය දුරු කොට ධර්මනගරය මැවූ සේක.

540. ප්‍රාඥයන් වහන්ස, ඒ ධර්මනගරයෙහි ප්‍රාකාරය ශීලය යි. දොර කොටුව ඔබවහන්සේගේ ඥානය යි. ඉන්ද්‍රකීලය ඔබවහන්සේගේ ශ්‍රද්ධාව යි. ද්වාරපාලයා නම් සංවරය වෙයි.

541. අටල්ල සතිපට්ඨානය යි. සර්වඥයන් වහන්ස, ඇතුළු වීථිය ඔබවහන්සේගේ ප්‍රඥාව යි. සතර මං සන්ධිය ඍද්ධිපාදය යි. (මේ ධර්මනගරය) සත්තිස්බෝපැකිඳහම් නමැති වීථීන්ගෙන් මැනවින් නිර්මිත කරණ ලදී.

542 සූත්‍රය අභිධර්මය විනයය යන සියලු නවාඞ්ගබුද්ධවචනය ඔබගේ (නගරයෙහි) ධර්මාධිකරණසභාව යි.

543. (අනත්තානුපස්සනාවසයෙන් ලබන ලද) සුඤ්ඤතවිහාරය ද, (අනිච්චානුපස්සනාවසයෙන් ලබන ලද) අනිමිත්ත විහාරය ද, (දුක්ඛානු-පස්සනාවසයෙන් ලබන ලද) අප්පණිහිතවිහාරය ද, (නිශ්චල වූ සතර ශ්‍රාමණ්‍යඵල සඞ්ඛ්‍යාත) අනෙජවිහාරය ද, (සියලු දුක් වැලැක්වීම නම් වූ) නිර්වාණය ද යන මොහු ඔබ වහන්සේගේ ධර්මකුටිහු වෙති.

544. ප්‍රඥාවෙන් අග්‍රස්ථානයෙහි තබන ලද, වැටහීමෙහි ද දක්ෂ වූ, නමින් ශාරීපුත්‍ර වූ (ශ්‍රාවක) තෙමේ ඔබ වහන්සේගේ ධර්මසේනා-පතියා වෙයි.

545. සර්වඥයන් වහන්ස, චුතූපපාතඥාණයෙහි දක්ෂ වූ ඍද්ධියෙහි පරතෙරට පැමිණි නමින් කොලිත (නම් ශ්‍රාවක) තෙමේ ඔබවහන්සේගේ පෙරෙවියා (=පුරෝහිතයා) වෙයි.

546. මුනීන්ද්‍රයන් වහන්ස, පෞරාණිකවංශය දරන්නා වූ උග්‍ර වූ තෙජස් ඇති, (ගුණධර්මයන්ගෙන්) ලං විය නො හැක්කා වූ ධූතවාදී වූ ධූතගුණයෙන් අග්‍ර වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඔබ වහන්සේගේ අක්ඛදස්ස හෙවත් විවාදවිනිශ්චයයෙහි ප්‍රධානයා වේ.

547. බහුස්සුතො ධම්මධරො සබ්බපාඨී ච සාසනෙ,
**ආනන්දො** නාම නාමෙන ධම්මාරක්ඛො තවං මුනෙ.

548. එතෙ සබ්බෙ අතික්කම්ම පමෙසි[1] භගවා මමං,
විනිච්ඡයමෙම පාදාසි විනයෙ[2] විඤ්ඤූදෙසිතං[3].

549. යො කොචි විනයෙ පඤ්හං පුච්ඡති බුද්ධසාවකො,
තත්ථ මෙ චින්තනා නත්ථි තඤ්ඤෙව'ත්ථං කථෙම'හං.

550. යාවතා බුද්ධඛෙත්තම්හි ඨපෙත්වා තං මහාමුනිං,
විනයෙ මාදිසො[4] නත්ථි කුතො භිය්‍යො භවිස්සති.

551. භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එවං ගජ්ජති **ගොතමො**,
**උපාලිස්ස** සමො නත්ථි විනයෙ ඛන්ධකෙසු ච.[5]

552. යාවතා බුද්ධභණිතං නවඞ්ගං සත්ථුසාසනං,
විනයොගධිතං[6] සබ්බං විනයමූලන්ති පස්සතො.[7]

553. මම කම්මං සරිත්වාන ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

554. සතසහස්සුපාදාය ඉමං ඨානමපත්ථයිං,
සො මෙ අත්ථො අනුප්පත්තො විනයෙ පාරමිඞ්ගතො.

555. සක්‍යානං නන්දිජනනො කප්පකො ආස'හං පුරෙ,
විජහිත්වාන[8] තං ජාතිං පුත්තො ජාතො මහෙසිනො.

556. ඉතො දුතියකෙ කප්පෙ **අඤ්ජසො** නාම ඛත්තියො,
අනන්තතෙජො අමිතයසො භූමිපාලො මහද්ධනො.

557. තස්ස රඤ්ඤො අහං පුත්තො **චන්දනො**[9] නාම ඛත්තියො,
ජාතිමදෙනුපත්ථද්ධො යසභොගමදෙන ච.

558. නාගසතසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
තිධා පභින්නමාතඞ්ගා පරිවාරෙන්ති මං සදා.

559. සබලෙහි පරීතො'හං[10] උය්‍යානං ගන්තුකාමකො,
ආරුය්හ **සිරිකං** නාගං නගරා නික්ඛමිං තදා.

560. චරණෙන ච සම්පන්නො ගුත්තද්වාරො සුසංවුතො,
**දෙවලො** නාම සම්බුද්ධො ආගච්ඡි පුරතො මම.

561. පෙසෙත්වා සිරිකං නාගං බුද්ධං ආසාදයිං තදා,
තතො සඤ්ජාතකොපො සො නාගො නුද්ධරතෙ[11] පදං.

562. නාගං දුට්ඨමනං[12] දිස්වා බුද්ධෙ කොපං අකාසහං,
විහෙසයිත්වා[13] සම්බුද්ධං උය්‍යානං අගමාස'හං.

---

1. මහෙසි. ම. ථෛ. පිහෙසි PTS. 2. විනයං ම. 3 විනයඤ්ඤුතදෙසිතං. ථෛ.
4. සදිසො. ම 5. වා. ථෛ. 6. විනයෙ කථිතං. ථෛ.
7. විනය මූලපස්සිනො ම. PTS. මූලකපස්සිනො. සෙ. 8 විජයිත්වාන. ථෛ.
9. සුනන්දො ථෛ 10. පරෙතො හං. ම. PTS. අ. 11. මුඛරතෙ. ථෛ.
12. රුණ්ණමනං. ම. සෙ. ථෛ අ. 13. විහෙඨයිත්වා. (සාත්වි.)

547. බුදුරජාණන් වහන්සේ, ශාසනයෙහි බහුශ්‍රැත වූ ධර්මධර වූ සියලු ධර්ම අධ්‍යයනය කරන්නා වූ නමින් **ආනන්ද** (නම් ශ්‍රාවක) තෙමේ ඔබ වහන්සේගේ ධර්ම(භාණ්ඩාගාර)ආරක්ෂකයා වෙයි.

548. භාග්‍යවතුන් වහන්සේ මේ සියලු ශ්‍රාවකයන් ඉක්මවා මා පමණ කල සේක. විනයයෙහි විනය දත් නැණවතුන් විසින් ප්‍රකාශ කරණලද දෙෂ විචාරණය මට ම පැවරූසේක.

549. යම් කිසි බුද්ධශ්‍රාවකයෙක් තෙම විනය පිළිබඳ ප්‍රශ්නයක් විචාරා ද, එහි මාගේ විමතියක් නැත. මම ඒ විචාල අර්ථය කියමි.

550. බුද්ධක්ෂෙත්‍රය (=ආඥාක්ෂෙත්‍රය) යම් පමණ තන්හි පැතිරේ නම්, එපමණ තන්හි ඒ බුදුරජාණන් වහන්සේ හැර විනය පිටකයෙහි දක්ෂ වූ මා වැනි කෙනෙක් නැත. මට වැඩි කෙනෙක් කොයින් වන්නේ ද ?

551. **ගෞතම** බුදුරජාණන් වහන්සේ භික්ෂුසඞ්ඝයා මැද හිඳ "(උභතො විභඞ්ග සඞ්ඛ්‍යාත) විනයයෙහි ද (චුල්ලවග්ග මහාවග්ග සඞ්ඛ්‍යාත ඛන්ධකයෙහි ද **උපාලි**) භික්ෂුහු හා සම කෙනෙක් නැතැ"යි මෙසේ සිංහනාද කරණ සේක.

552, 553. බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරණ ලද නවාඞ්ග ශාස්තෘශාසනය යම් තාක් නම් ඒ සියල්ල විනයයෙහි ඇතුළත් ය. විනය මුල් කොට ඇත්තේ ය යි දකින්නා වූ මාගේ පූර්වප්‍රාර්ථනාකර්මය ගෞතම නම් වූ ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ සිහි කොට භික්ෂුසඞ්ඝයා මැද වැඩ හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබූසේක.

554. කල්පලක්ෂයක (පමණ කාලයක) පටන් මේ තනතුර පැතීමි. පැමිණෙනලද එම අර්ථ ඇත්තෙම් විනයෙහි පරතෙරට පත් වීමි.

555. මම පෙර ශාක්‍යයනට සොම්නස ඇති කරන්නා වූ කපුවෙක් වීමි. ඒ කුලය හැර මහර්ෂි වූ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෙක් වූයෙම් ශාක්‍යපුත්‍ර වීමි.

556. මෙයින් (=මේ මහාභද්‍රකල්පයෙන්) දෙවෙනි කල්පයෙහි අපමණ තෙද ඇති අනන්ත වූ පිරිවර ඇති මහාධනවත් පෘථිවී පාලක වූ **අඤ්ජස** නම් රජෙක් වී ය.

557. පරිවාරමදයෙන් ද භොගමදයෙන් ද ජාතිමදයෙන් ද මත් වූ මම එම රජුගේ පුත්‍ර වූ **චන්දන** නම් ක්ෂත්‍රියකුමාරයෙක් වීමි.

558. හස්තිකුලයෙහි උපන්නා වූ සියලු ඇත්අබරණින් (සැරසුම්) කරණලද්දා වූ ලක්ෂයක් (පමණ) ත්‍රිමදගලිත ඇත්තු නිතර මා පිරිවරත්.

559. ස්වකීය හටසේනාවන් විසින් පිරිවරණලද මම උයනට යනු කැමැත්තෙම් එකල්හි **සිරික** නම් ඇතුපිට නැඟී නුවරින් නික්මුනෙමි.

560. පසළොස් චරණධර්මයන්ගෙන් යුත් වසනලද (චක්ෂුරාදි) දොරටු ඇති මැනවින් රැකි කායචිත්ත ඇති **දෙවල** නම් පසේබුදු රජාණන් වහන්සේ මාගේ ඉදිරිපසින් පැමිණි සේක.

561. එකල්හි **සිරික** නම් හස්තියා යවා බුදුරජාණන් වහන්සේ ගැටවීමි. ඉන් හටගත් කොප ඇති එම ඇත් තෙමේ පිය නුගුළුවයි. (නිශ්චල ව සිටියි.)

562. මම දූෂ්‍ය සිත් ඇති ඇතු දැක බුදුන් කෙරෙහි කොප කෙළෙමි. බුදුරජාණන් වහන්සේ පෙළා මම උයනට ගියෙමි.

563. සාතං තත්‍ථ න වින්‍දාමි සිරො[1]පජ්ජලිතො යථා,
පරිළාහෙන ඩය්හාමි මච්ඡො'ව බළිසාදකො.

564. සසාගරන්‍තා පඨවී ආදිත්‍තා විය හොති මෙ,
පිතුසන්‍තිකු'පාගම්ම ඉදං වචනමබ්‍රවිං:

565. "ආසීවිසං'ව කුපිතං අග්ගික්ඛන්‍ධං'ව ආගතං,
මත්‍තං'ව කුඤ්ජරං දන්‍තිං යං සයම්භුමසාදයිං.

566. ආසාදිතො මයා බුද්ධො ඝොරො උග්ගතපො ජිනො,
පුරා සබ්බෙ විනස්සාම ඛමාපෙස්සාම තං මුනිං.

567. නො චෙ තං නිජ්ඣපෙස්සාම[2] අත්‍තදන්‍තං සමාහිතං,
ඔරෙන සත්‍තදිවසා[3] රට්ඨං මෙ විධමිස්සති.

568. සුමෙඛලො කොසියො ච සිඞ්ගවො චාපි සත්‍තුකො[4],
ආසාදයිත්‍වා ඉසයො දුග්ගතා තෙ සරට්ඨකා.[5]

569. යදා කුප්පන්‍ති ඉසයො සඤ්ඤතා බ්‍රහ්මචාරිනො[6],
සදෙවකං විනාසෙන්‍ති සසාගරං සපබ්බතං."

570. තියොජනසහස්සම්හි පුරිසෙ සන්නිපාතයිං,
අච්චයං දෙසනත්‍ථාය සයම්භුං උපසඞ්කමිං.

571. අල්ලවත්‍ථා අල්ලසිරා සබ්බෙව පඤ්ජලී කතා,
බුද්ධස්ස පාදෙ නිපතිත්‍වා ඉදං වචනමබ්‍රවුං:[7]

572. "ඛමස්සු ත්‍වං මහාවීර අභියාචති තං ජනො,
පරිළාහං විනොදෙහි මා නො රට්ඨං විනාසය.

573. සදෙවමානුසා සබ්බෙ සදානවසරක්ඛසා,
අයොමයෙන කුටෙන සිරං භින්‍දෙය්‍යු මෙ සදා."

574. "උදකෙ[8] අග්ගි න සණ්ඨාති බීජං සෙලෙ න රූහති,
අගදෙ කිමි න සණ්ඨාති කොපො බුද්ධෙ න ජායති.

575. යථාපි භූමි අචලා අප්පමෙය්‍යො ච සාගරො,
අනන්‍තකො ච ආකාසො එවං බුද්ධා අඛොභියා.[9]

576. සදා ඛන්‍තා මහාවීරා ඛමිතා ච තපස්සිනො,
ඛන්‍තානං ඛමිතානඤ්ච ගමනං තං[10] න විජ්ජති[11]"

1 සිරෙ. අ මු. 2. නික්ඛමෙස්සාමි. ථෙ. 3 සත්‍තාමෙ දිවසෙ. P T S. ථෙ.
4. සත්‍තකො. ම. 5 සසෙනකා. P T S. ථෙ. 6. බ්‍රහ්මචාරයො. සෙ. P T S. ථෙ
7. මබ්‍රවිං. ම. P T S. ථෙ. 8. දකෙ. ම.
9. බුද්ධා අඛොභියො. අ. ම. P T S. 10. ඛමනං වො. ථෙ.
11. යුජ්ජති ?

563. එහි (ඒ කර්මවිපාකයෙන්) හිස ඇවිළ ගත්තකු මෙන් සුවයක් නො විඳිමි. බිළිය ගිලි මසකු මෙන් (පසුතැවිලියෙන්) දැවිල්ලෙන් තැවෙමි.

564. මට සයුර කෙළවර කොට ඇති පෘථිවිය ඇවිළ ගත්තාක් මෙන් විය. (මම) පියාගේ සමීපයට එළැඹ මේ වචනය කීමි:

565. "කිපුනු සර්පයකු මෙන් ද, පැමිණි ගිනිකඳක් මෙන් ද, දළ ඇති මතැතකු මෙන් ද යම් පසේබුදුවරයන් වහන්සේ කෙනෙකුන් ගැටීම් ද,

566. (අනිකකු විසින්) නො ගැටිය හැකි බැවින් ඝොර වූ උග්‍ර තපස් ඇති පස්මරුන් දිනූ පසේබුදුරජතෙම මා විසින් ගටන ලදී. (ඉන්) අප සියලු දෙනා ම වැනසෙන්නට පෙර ඒ පසේබුදුරජාණන් වහන්සේ ක්ෂමා කොට ගණිමු.

567. ඉදින් චිත්තදමනය කළ එකඟසිත් ඇති ඒ පසේබුදු රජාණන් වහන්සේ ක්ෂමා නො කරන්නෙමු නම්, සත් දිනකින් මෙපිට මගේ රට විනාශ වන්නේ ය.

568. **සුමෙඛල** ය, **කොසිය** ය, **සිඟව** ය, **සතතුකා** ය යන මේ (සිවු) රජවරු සෘෂින්ට ගටා (=අනදර කොට) සවකීය රටවල් සමග දුකට පත් වූහ.

569. කායසංයමයෙන් යුත් බ්‍රහ්මචාරි වූ සෘෂිහු යම් කලෙක්හි කිපෙත් ද, (එකල) සාගර පර්වත සහිත වූ දෙවියන් සහිත ලොකය වනසත්."

570. තුන් දහසක් යොදුන් තන්හි පුරුෂයන් රැස් කරවීමි. වරද පැවසීම සඳහා පසේබුදුරජාණන් වහන්සේ වෙත එළැඹියෙමි.

571. තෙත් වූ වස්ත්‍ර ඇති තෙත් වූ කෙස් ඇති සියල්ලෝ ම බඳින ලද ඇඳිලි ඇත්තාහු බුදුරජාණන් වහන්සේගේ පාමුල වැටී මේ වචන කීවාහු ය:

572. මහාවීරයාණෙනි, සමා වනු මැනවි. ජනසමූහයා එය විශෙෂ-යෙන් ආයාචනය කරයි. පරිළාහය (=දැවිල්ල) දුරු කරණු මැනව. අපගේ රට නො නසනු මැනව.

573. දෙව්මිනිසුන් සහිත වූ ද අසුරයන් හා රාක්ෂසයන් සහිත වූ ද සියල්ලෝ හැම කල්හි යකුළින් මාගේ හිස පළන්නාහු ය."

574. "දියෙහි ගිනි නො සිටී. ගලෙහි බිජුවට පැළ නො වේ. බෙහෙතෙහි කෘමියා නො සිටී. (එසේ ම) බුදුරජුන් කෙරෙහි කොපය හට නො ගණී.

575. යම් සේ පොළොව නො සෙල්විය හැකි ද, මහසයුර පමණ කළ නො හැකි ද, අහස කෙළවරක් නැත්තේ ද, එසේ ම බුදුවරයෝ නො කැළඹිය හැක්කෝ ය.

576. මහාවීර වූ බුදුවරයෝ හැම කල්හි කමා කළාහු ය. තපස්වීහු සාමා කරණ ලද්දෝ ද වෙත්. කමා කළවුන්ගේ ද, කමා කරණු ලැබූවන්ගේ ද (ඡන්දාදීන් වූ) එබඳු (අගති) ගමනක් නො වේ." (නොහොත් කමා කිරීමෙක් නො යෙදේ).

577. ඉදං වත්වාන සම්බුද්ධො පරිළාහං විනොදයං[1],
මහාජනස්ස පුරතො නභං අබ්භුග්ගමී තදා.

578. තෙන කම්මෙන'හං ධීර හීනත්තං අජ්ඣුපාගතො,
සමතික්කම්ම තං ජාතිං පාවිසිං අභයං පුරං.

579. තදාපි මං මහාවීර ඩය්හමානං සුසණ්ඨිතං[2],
පරිළාහං විනොදෙසි සයම්භුඤ්ච ඛමාපයි.

580. අජ්ජාපි මං මහාවීර ඩය්හමානං තිහ'ග්ගිහි,
නිබ්බාපෙසි තයො අග්ගී සීතිභාවඤ්ච පාපයි.

581. යෙසං සොතාවධාන'ත්ථි[3] සුණාථ මම භාසතො,
අත්ථං තුම්හං පවක්ඛාමි යථා දිට්ඨං පදං මම.

582. සයම්භුං තං විමානෙත්වා[4] සන්තචිත්තං සමාහිතං,
තෙන කම්මෙන'හං අජ්ජ ජාතො'ම්හි නීචයොනියං.

583. මා වො ඛණං විරාධෙථ ඛණාතීතා හි සොචරෙ,
සදත්ථෙ වායමෙය්‍යාථ ඛණො වො පටිපාදිතො.

584. එකච්චානඤ්ච වමනං එකච්චානං විරෙචනං,
විසං හලාහලං එකෙ[5] එකච්චානං ච ඔසධං.

585. වමනං පටිපන්නානං ඵලට්ඨානං විරෙචනං,
ඔසධං ඵලලාභීනං පුඤ්ඤක්ඛෙත්තං ගවෙසිනං.

586. සාසනෙන විරුද්ධානං විසං හලාහලං යථා,
ආසීවිසො දිට්ඨවිසො එවං ඣාපෙති තං නරං.

587. සකිං පීතං[6] හලාහලං උපරුන්ධති ජීවිතං,
සාසනෙන විරුජ්ඣිත්වා කප්පකොටිම්හි ඩය්හති.

588. ඛන්තියා අවිහිංසාය මෙත්තචිත්තවතාය ච,
සදෙවකං සො තාරෙති[7] තස්මා වො අවිරොධියො[8].

589. ලාභාලාභෙ න සජ්ජන්ති සම්මානන-විමානනෙ,
පථවීසදිසා බුද්ධා තස්මා තෙ න විරොධියා[9].

1. විනොදයී. සෙ. P T S. ථෙ. 2. (එවං සබ්බත්ථ) 3. සොතපථා අත්ථි. ථෙ.
4. ඛමාපෙත්වා. ථෙ. 5. එතෙ. P T S. 6. සකිං භුත්තං. ථෙ.
7. තරති. ම. P T S. සෙ. 8. අවිරාධියා. ම. 9. විරාධියා. P T S. ම.

577. එකල්හි පසේබුදු තෙමේ (ඔවුන්ගේ) සන්තාපය දුරු කරමින් මෙය වදරා මහජනයාගේ ඉදිරියෙහි අහසට නැංගේ ය.

578. ප්‍රාඥයන් වහන්ස, මම ඒ කර්මය හේතු කොට ගෙණ පහත් (කරතැවැම්යකු) බවට එළඹියෙමි ඒ කුලය හැරදමා අභයපුරය (=නිවණ)ට පැමිණියෙමි.

579. මහාවීරයන් වහන්ස, එකල්හි දු දැවෙන්නා වූ (වරද වරද ලෙස පිළිගෙණ) මැනවින් සිටියා වූ මා (දුක) සන්තාපය දුරු කෙළේ ය. ඒ බුදුරජානන් වහන්සේ ද ක්‍ෂමා කොට මා වරද ඉවසූසේක.

580. මහාවීරයන් වහන්ස, අදත් (රාග - ද්වෙෂ - මොහ) ත්‍රිවිධාග්නි-යෙන් දැවෙන්නා වූ මා නිවූ සේක. ඒ ත්‍රිවිධාග්නිය ද සිසිල්බවට පැමිණවූ සේක.

581. යම් බඳු වූ තොපගේ කන් යොමු කිරීමක් ඇත් නම්, (ඒ තෙපි) කියන්නා වූ මාගේ (වචනය) අසවු. නිර්වාණපදය මා දක්නා ලද පරිදි තොපට ද කියමි.

582. ශාන්ත වූ සිත් ඇති එකඟ වූ ඒ පසේබුදුරජානන් වහන්සේට අවමන් කොට මම ඒ කර්මය හෙතුකොට ගෙණ පහත් (කපු) කුලයෙහි උපන්නෙම් වෙමි.

583. තෙපි (මේ බුද්ධොත්පාද) ක්‍ෂණය වරද්දා නො ගණිවු. (බුද්ධොත්පාද)ක්‍ෂණය ඉක්මවූවෝ ශොක කෙරෙත් ම ය. සවකීයාභිවෘද්ධියෙහි වැයම් කරවු. තොප විසින් බුද්ධොත්පාදක්‍ෂණය ලබන ලද්දේ ය.

584. කිසිවෙකුට වමනය ද කිසිවෙකුට විරෙචනය ද එසේ ම කිසිවෙකුට හලාහලවිෂය ද ඖෂධ වේ ය යි ඇතැම්හු කියති.

585. මාර්ගසමඞ්ගීපුද්ගලයනට වමනය (=සංසාරමොචනය) ද ඵලසථයනට විරෙචනය (=සංසාරවිරෙචනය) ද, ඵල ලබා සිටිනවුනට නිර්වාණය ද, (දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සම්පත්) සොයන්නවුනට පුණ්‍ය-ක්‍ෂෙත්‍ර වූ සඞ්ඝයා ද ඖෂධ ය යි වදාළසේක.

586. සසුන හා විරුද්ධවූවනට හලාහල ය යි කියනලද කුතුහලය විෂ ය යි (වදාළහ.) ආශීවිෂ දෘෂටවිෂ සර්පයා යම් සේ ද එසේ (එය)ඒ පවිටු මිනිසා දවයි.

587. වරක් පානය කළ හලාහලවිෂය ජීවිතය විනාශ කෙරෙයි. (එසේ ම) සසුන හා විරුද්ධ වීමෙන් (ඒ පවිටු මිනිසා) කප් කෙළ ගණන් මුළුල්ලෙහි දැවේ.

588. ක්‍ෂාන්තියෙන් ද අවිහිංසාවෙන් ද මෙත් සිත් ඇති බැවින් ද ඒ බුදුරජානන් වහන්සේ දෙවියන් සහිත ලොකයා (සසරසයුරින්) එතෙර කරණසේක. එහෙයින් (උන්වහන්සේ) තොප විසින් විරුද්ධ නො විය යුත්තෝ ය.

589. බුදුවරයෝ මහපොළොව වැනියහ. ලාභ අලාභ දෙක්හි ද සම්මානන අවමානන දෙක්හි ද නො ඇලෙත්. එහෙයින් උන්වහන්සේලා තොප විසින් විරොධ නො කළ යුත්තෝ ය.

590. **දෙවදත්තෙ** ච වධකෙ චොරෙ **අඞ්ගුලිමාලකෙ**,
**ධනපාලෙ රාහුලෙ** ච සබ්බසං සමකො මුනි.

591. එතෙසං පටිඝො[1] නත්ථි රාගො'මෙසං න විජ්ජති,
සබ්බසං සමකො බුද්ධො වධකස්සොරසස්ස ච.

592. පන්ථෙ දිස්වාන කාසාවං ඡඩ්ඩිතං මීළ්හමක්ඛිතං,
සිරස්මිං[2] අඤ්ජලිං කත්වා වන්දිතබ්බං ඉසිද්ධජං[3]

593. අබ්භතීතා ච යෙ බුද්ධා වත්තමානා අනාගතා,
ධජෙනානෙන සුජ්ඣන්ති තස්මා එතෙ නමස්සියා.

594. සත්ථුකප්පං සුවිනයං ධාරෙමි හදයෙන'හං
නමස්සමානො විනයං විහරිස්සාමි සබ්බදා.

595. විනයො ආසයො[4] මය්හං විනයො ඨානචඞ්කමං,
කප්පෙමි විනයෙ වාසං විනයො මය්හ ගොචරො.

596. විනයෙ පාරමිප්පත්තො සමථෙ[5] චාපි කොවිදො,
**උපාලි** තං මහාවීර පාදෙ වන්දති සත්ථුනො.

597 සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරා පුරං,
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං.

598. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා[6] නත්ථි දානි පුනබ්භවො.

(599-600 ගාථා 372, 373 ගාථාහි සමා.)

ඉත්ථං සුදං ආයස්මා **උපාලිත්ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපාලිත්ථෙරාපදානං ඡට්ඨං.**

---

## 7. අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරාපදානං

601. **පදුමුත්තර**සම්බුද්ධං ලොකජෙට්ඨං විනායකං,
බුද්ධභූමිමනුප්පත්තං පඨමං අද්දසං අහං.

602. යාවතා බොධියා මූලෙ යක්ඛා සබ්බෙ සමාගතා,
සම්බුද්ධං පරිවාරෙත්වා වන්දන්ති පඤ්ජලීකතා.

603. සබ්බෙ දෙවා තුට්ඨමනා ආකාසෙ සඤ්චරන්ති තෙ,
"බුද්ධො අයං අනුප්පත්තො අන්ධකාරතමොනුදො."

1. පටිඝං. ම. P T S. සෙ. අ. 2. සිරසා. සෙ. ථෙ.
3. වන්දිතබ්බො ඉසිද්ධජො. ථෙ. 4. ආසයං. P T S. ථෙ. 5. සමයෙ. ථෙ.
6. සබ්බාසවපරික්ඛීණො. ම.

590. බුදුරජානන් වහන්සේ වධක වූ **දෙවදත්තයා** ය, වෛර වූ **අඞ්ගුලිමාලයා** ය (මත් වී ඉදිරියට ආ) **ධනපාල** හස්තියා ය, (ඖරස පුත්‍ර වූ) **රාහුල** තෙර ය යන මේ සියලු දෙනාහට සම මෙත් ඇති සේක.

591. මොවුන්හට පටිඝය(=තරහ)ක් නැත. එසේ ම මොවුන් පිළිබඳ රාගය (=ඇලීමක්) ද නැත. සර්වඥ තෙමේ (තමන් මැරීමට ආ) වධකයාට ද (තමාගේ ම) ඖරසපුත්‍රයාට ද සමමෙත් ඇත්තේ ය.

592. මග අත හැර දමූ අශුචි වැකුනු කසාවත (=සිවුර) ද දක සෘෂිධ්වජය යි මුදුනෙහි ඇඳිලි බැඳ වැඳිය යුතු ය.

593. අතීතයෙහි වූ ද, වර්තමානයෙහි වූ ද, අනාගතයෙහි වූ ද යම් බුදු කෙනෙක් වෙත් නම්, මේ සෘෂිධ්වජයෙන් (=සිවුරෙන්) පිරිසිදු වෙත්. එහෙයින් මේ බුදුවරයෝ වැඳිය යුත්තාහු ය.

594. බුදුරජානන් වහන්සේ වැනි වූ සුන්දර වූ විනයපිටකය මම හදයෙන් දරමි. හැම කල්හි විනයයට නමස්කාර කරමින් වසන්නෙමි.

595. මාගේ වාසගෘහය විනය යි. සිටින තැන ද සක්මන් කරණ තැන ද විනය යි. විනයපිටකයෙහි (දැරීම්, පැවැත්වීම් වශයෙන්) වාසය කරමි. විනය මාගේ ගොචරය යි.

596. විනයපිටකයෙහි පරතෙරට පැමිණියා වූ අධිකරණසමථයෙහි ද දක්ෂ වූ **උපාලි** තෙමේ මහාවීරයන් වහන්ස, ශාස්තෘ වූ ඔබවහන්සේගේ දෙපා වඳියි.

597. ඒ (උපාලි වූ) මම ධර්මය පිළිබඳ සුන්දරබව දන ඒ ධර්මයට ද සම්‍යක්සම්බුදුරජානන් වහන්සේට ද වඳිමින් ගමින් ගමට ද නගරයෙන් නගරයට ද යමි.

598. මා විසින් ක්ලෙශයෝ දවන ලදහ. හැම භවයෝ මනා කොට නසන ලදහ. සියලු ආශ්‍රවයෝ ක්ෂය කරණ ලදහ. දන් නැවත ඉපදීමක් නැත.

599-600 ගාථා *372–373* ගාථාවන් හා සම ය.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උපාලිස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් දෙශනා කළ සේක් යි.

**සවැනි වූ උපාලිස්ථවිරාවදානය යි.**

---

## 7. අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරාවදානය

601. (සකල සත්ත්ව) ලොකයෙහි ජ්‍යෙෂ්ඨ වූ (විශෙෂයෙන් වෛනෙය සත්ත්වයන් සසර සයුරින් එතෙරට පමුණුවන බැවින්) විනායක වූ බුදු-පදවියට පත් **පදුමුත්තර** සම්බුදුරජානන් වහන්සේ මම පළමු කොට දිටිමි.

602. බෝ මුලෙහි යම් පමණ යක්ෂයෝ රැස් වූවාහු ද, ඒ සියල්ලෝ බඳදිලි ඇත්තාහු බුදුරජුන් පිරිවරා වඳිත්.

603. "ගත මොහඳුරු දුරු කරණ මේ සර්වඥ තෙමේ පැමිණියේ ය"යි (කියමින්) සතුටු සිත් ඇති ඒ සියලු දෙවියෝ අහසෙහි හැසිරෙත්.

604. තෙසං හාසපරෙතානං මහානාදො පවත්තථ:
“කිලෙසෙ ඣාපයිස්සාම සම්මාසම්බුද්ධසාසනෙ.”

605. දෙවානං ගිරමඤ්ඤාය වාචාසභිමුදීරිතං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ආදිභික්ඛමදාස’හං.

606. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
දෙවසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

607. “සත්තාහං අභිනික්ඛම්ම බොධිං අජ්ඣගමං අහං,
ඉදං මෙ පඨමං භත්තං බ්‍රහ්මචරියස්ස[1] යාපනං.

608. **තුසිතා** හි ඉධා’ගන්ත්වා යො මෙ භික්ඛං උපානයී,
තම’හං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

609. තිංසකප්පසහස්සානි[2] දෙවරජ්ජං කරිස්සති,
සබ්බෙ දෙවෙ අභිභොත්වා තිදිවං ආවසිස්සති.

610. දෙවලොකා චවිත්වාන මනුස්සත්තං ගමිස්සති,
සහස්සධා චක්කවත්තී තත්ථ රජ්ජං කරිස්සති.

611. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

612. තිදසා සො චවිත්වාන මනුස්සත්තං ගමිස්සති,
අගාරා පබ්බජිත්වාන ඡබ්බස්සානි වසිස්සති.

613. තතො සත්තමකෙ වස්සෙ බුද්ධො සච්චං කථෙස්සති,
**කොණ්ඩඤ්ඤො** නාම නාමෙන පඨමං සච්ඡිකාහිති.”

614. නික්ඛන්තෙනා’නුපබ්බජිං[3] පධානං සුකතං මයා,
කිලෙසෙ ඣාපනත්ථාය පබ්බජිං අනගාරියං.

615. අභිගන්ත්වාන සබ්බඤ්ඤූ බුද්ධො ලොකෙ සදෙවකෙ,
**ඉසිනාමෙ**[4] මිගාරඤ්ඤෙ අමතං භෙරිමාහනි.

616. සො ‘දානි පත්තො අමතං සන්තං පදමනුත්තරං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

617, 618, 619, කිලෙසා ඣාපිතා–පෙ–කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අඤ්ඤා[5]කොණ්ඩඤ්ඤො** ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරස්ස අපදානං සත්තමං.**

---

1. බ්‍රහ්මචාරිස්ස. ම. ථෙ. P T S. බ්‍රහ්මචරිය සෙ.
2. සහස්සෙන. P T S. තිංසමත්තෙ කප්පසහස්සෙ. ම. සෙ.
3. පබ්බජ්ජං. P T S. 4. ඉමිනාමෙ. ම. P T S. සෙ.
5. අඤ්ඤාත. අ මු. අඤ්ඤා. සී ම.

604. "අපි සම්බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි (පිළිවෙත් රැක) කෙලෙස් දවමු" ය යි සතුටින් යුත් ඒ දෙවියන්ගේ මහානාදය පවතී.

605. දෙවියන් විසින් කියනලද ඒ අභීත වචනය අසා මම සතුටු වූයෙමි සතුටු සිතින් ම ප්‍රථම භික්‍ෂාව දුනිමි.

606. ලොකයෙහි අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ මාගේ අදහස දැන දිව්‍යසමූහයා මැද මේ ගාථාවන් වදාළ සේක.

607. "මම අභිනිෂ්ක්‍රමණය කොට සතියකින් සම්‍යක් සම්බොධියට පැමිණියෙමි. බ්‍රහ්මචාරී වූ මාගේ (සිරුර) යැපෙන පමණ වූ මෙය ප්‍රථම ආහාරය යි.

608. යමෙක් **තුසිත** දෙව්ලොවින් මෙහි අවුත් මට භික්‍ෂාව පිළිගැන්වී ද, මම ඔහු (කවරෙක් දැ යි) කියන්නෙමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු:

609. "මෙතෙමේ කල්ප තිස්දහසක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. සියලු දෙවියන් අභිභවනය කොට දෙව්ලොව වසන්නේ ය.

610. දෙව්ලොවින් චුත ව මිනිසත්බවට යන්නේ ය. එහි දහස් වරක් චක්‍රවර්තිරාජ්‍යය කරන්නේ ය.

611. (මෙයින්) කල්පලක්‍ෂයකින් මතුයෙහි **ඔක්කාක** කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන සේක.

612. හෙතෙම දෙව්ලොවින් චුතව මිනිසත් බවට යන්නේ ය. ගිහිගෙන් නික්ම පැවිදි ව සවසක් (දුෂ්කරක්‍රියා කරමින්) වසන්නේ ය.

613. අභිනිෂ්ක්‍රමණයෙන් සත්වැනි වර්ෂයෙහි බුදුරජ තෙම සත්‍යය (=ධර්මය) දෙශනා කරන්නේ ය. නමින් **කොණ්ඩඤ්ඤ** නම් තැනැත්තේ පළමු කොට (ධර්මය) ප්‍රත්‍යක්‍ෂ කරන්නේ ය" (කියායි).

614. (මම අභිනිෂ්ක්‍රමණය කළ) බෝසතුන් අනු ව පැවිදි වීමි. මා විසින් වීර්‍ය්‍යය මැනවින් කරණලදී. කෙලෙස් දැවීම පිණිස සසුනෙහි පැවිදි වීමි.

615. දෙවියන් සහිත ලොකයෙහි (සියලු සත්‍ය අවබොධ කළ සර්වඥ තෙමේ **මිගදාය** නම් වූ ඉසිපතනයට එළඹ (එහි දී) අමාබෙරය ගැසී ය. (හෙවත් දහම් දෙසී ය.)

616. ඒ මම දැන් ශාන්ත වූ නිරුත්තරපදය වූ නිවණට පැමිණියෙමි සියලු ආශ්‍රවයන් (පහාණපරිඤ්ඤාවෙන්) ප්‍රහාණය කොට ආශ්‍රව රහිත ව වෙසෙමි.

617., 618. 619. කෙලෙස් දවනලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළසේක් යී.

**සත්වැනි වූ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරාපදානය යි.**

---

## 8. පිණ්ඩොලභාරද්වාජත්ථෙරාපදානං

620. **පදුමුත්තරො** නාම ජිනො සයම්භූ අග්ගපුග්ගලො,
පුරතො හිමවන්තස්ස **චිත්තකූටෙ** වසී තදා.

621. අභීතරූපො තත්ථා'සිං මිගරාජා චතුක්කමො,
යස්ස සද්දං සුණිත්වාන වික්ඛම්භන්ති බහුජ්ජනා.

622. සුඵුල්ලං පදුමං ගය්හ උපගච්ඡිං නරාසභං,
වුට්ඨිතස්ස සමාධිම්හා බුද්ධස්ස අභිරොපයිං.

623. චතුද්දිසා නමස්සිත්වා බුද්ධසෙට්ඨං නරුත්තමං,
සකං චිත්තං පසාදෙත්වා සීහනාදං නදිං අහං.

624. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
සකාසනෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

625. බුද්ධස්ස ගිරමඤ්ඤාය සබ්බෙ දෙවා සමාගතා,
ආගතො වදතං සෙට්ඨො ධම්මං සොස්සාම තං මයං.

626. තෙසං හාසපරෙතානං පුරතො ලොකනායකො,
මම සද්දං පකිත්තෙසි දීඝදස්සී මහාමුනි.

627. "යෙනි'දං පදුමං දින්නං සීහනාදො ච නාදිතො,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

628. ඉතො අට්ඨමකෙ කප්පෙ චක්කවත්තී භවිස්සති,
සත්තරතනසම්පන්නො චතුදීපම්හි ඉස්සරො.

629. කාරයිස්සති ඉස්සරියං[1] මහියා චතුසට්ඨියා[2],
**පදුමො** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

630. කප්පසතසහස්සම්හි **ඔක්කාක**කුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

631. පකාසිතෙ පාවචනෙ බ්‍රහ්මබන්ධු භවිස්සති,
බ්‍රහ්මඤ්ඤා අභිනික්ඛම්ම පබ්බජිස්සති තාවදෙ.

632. පධානපහිතත්තො සො උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො.

633. විපිනෙ පන්තසෙය්‍යම්හි වාළමිගසමාකුලෙ,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො."

634, 635, 636. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පිණ්ඩොලභාරද්වාජො** ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**පිණ්ඩොලභාරද්වාජත්ථෙරස්ස අපදානං අට්ඨමං.***

---

1. ඉස්සරං. ම. P T S. සෙ. 2. චතුසත්තියා. අ. මු.
* ථෙරගාථට්ඨකථාය න සමෙති'දං අපදානං.

## 8. පිණ්ඩොලභාරද්වාජසථවිරාවදානය

620. අග්‍රපුද්ගල වූ තෙමේ ම සියල්ල අවබොධ කළා වූ **පදුමුත්තර** නම් බුදුරජානන් වහන්සේ එකල්හි හිමවත ඉදිරියෙහි වූ **චිත්‍රකූට** පර්වතයෙහි විසූසේක.

621. බොහෝ සත්‍ත්වයෝ යමෙකුගේ ශබ්දය අසා විශෙෂයෙන් එහි කැලඹෙත් ද, (මම එබඳු) නිර්භයස්වභාව ඇති සිවු දික්හි ම (අභීත ව) යාමට සමත් සිංහයෙක් වීමි.

622. මනා ව පිපුනු පියුමක් ඩැහැගෙණ නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ වෙත එළඹියෙමි. සමාධියෙන් නැගී සිටියා වූ තථාගතයන් වහන්සේට (එය) පිදීමි.

623. මම සිවු දිගෙහි සිට මනුෂ්‍යොත්තම වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට නමස්කාර කොට සිය සිත පහදවා සිංහනාද කෙළෙමි.

624. පූජා සත්කාර පිළිගන්නා වූ (පිළිගැණීමට සුදුසු වූ) **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ සිය අසුනෙහි හිඳ මේ ගාථාවන් වදාළසේක.

625. සියලු දෙවිවරු සර්වඥයන් වහන්සේගේ වචනය හැඳින "('බුදුහු අපි වෙමු' යි) කියන්නවුනට ශ්‍රෙෂ්ඨ වූ බුදුරජ තෙම පැමිණියේ ය. අපි (උන්වහන්සේගේ) ඒ ධර්මය අසමු ය"යි කියමින් රැස් වූහ.

626. ලොකනායක වූ දීඝදර්ශී වූ බුදුරජානන් වහන්සේ ඒ ප්‍රීතියෙන් යුක්ත වූ ඔවුන් ඉදිරියෙහි මාගේ ශ්‍රද්ධාව ප්‍රකාශ කළ සේක:

627. "යමකු විසින් මේ පියුම දෙන ලද ද, සිංහනාදය කරණලද ද, මම ඔහු (පිළිබඳ) තොරතුරු කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවු.

628. මෙතෙම මෙයින් අටවැනි කල්පයෙහි සත්රුවන් සහිත වූ සතර මහදිවයිනෙහි අධිපති වූ සක්විතිරජෙක් වන්නේ ය.

629. සුසැට ජාතියක පෘථිවියෙහි අධිපති වූ (රජ) බව කරන්නේ ය. මහාබල ඇති නමින් **පදුම** නම් වූ සක්විති රජෙක් වන්නේ ය.

630. කල්ප ලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

631. එකල්හි (මෙ තෙම) බ්‍රාහමණයෙක් වන්නේ ය. (හෙතෙම) බුදුරජානන් වහන්සේ දහම් දෙසූ කල්හි බ්‍රාහ්මණ කුලයෙන් නික්ම ඒ භාග්‍යවතුන්වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේ ය.

632. වීර්‍ය්‍යය කිරීම පිණිස මෙහෙයනලද සිත් ඇත්තේ උපශාන්ත වූ (කෙලශ රහිත බැවින්) නිරුපධි වූ හෙතෙම සියලු ආශ්‍රවයන් ප්‍රහීණ කොට ආශ්‍රව රහිත වූයේ පිරිනිවන් පාන්නේ ය.

633. වණ්ඩමෘගයන්ගෙන් ගැවසීගත් ජනසම්බාධ රහිත දුර අරන් සෙනසුන්හි (වැස) සියලු ආශ්‍රවයන් ප්‍රහීණ කොට ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය.

634, 635, 636. කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජානන් වහන්සේගේ අනුශාසනය කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පිණ්ඩොලභාරද්වාජසථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**අටවැනි වූ පිණ්ඩොලභාරද්වාජසථවිරාවදානය යි.**

---

## 9. ඛදිරවනියරෙවතත්ථෙරාපදානං

637. ගඞ්ගා **භාගීරථී**[1] නාම හිමවන්තා පභාවිතා,[2]
කුතිත්ථෙ[3] නාවිකො ආසිං ඔරිමෙ ච තරිං අහං.

638. පුබ්බෙ මය්හං සුතං ආසි **පදුමුත්තරනායකො**[4],
වසීසතසහස්සෙහි ගඞ්ගාසොතං තරිස්සති.[5]

639. බහූ නාවා සමානෙත්වා වඩ්ඪකීහි සුසඞ්ඛතං,
නාවාය ඡදනං කත්වා පතිමානිං නරාසභං.

640. ආගන්ත්වාන ච සම්බුද්ධො ආරුහි තඤ්ච නාවුකං,[6]
වාරිමජ්ඣෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ:

641. "යො සො තාරෙසි සම්බුද්ධං සඞ්ඝඤ්චාපි අනාසවං,
තෙන චිත්තප්පසාදෙන දෙවලොකෙ රමිස්සති.

642. නිබ්බත්තිස්සති තෙ ව්‍යම්හං සුකතං නාවසණ්ඨිතං,
ආකාසෙ පුප්ඵඡදනං ධාරයිස්සති සබ්බදා.

643. අට්ඨපඤ්ඤාසකප්පම්හි **තාරකො**[7] නාම ඛත්තියො,
චාතුරන්තො **විජිතාවී** චක්කවත්තී භවිස්සති.

644. සත්තපඤ්ඤාසකප්පම්හි **චම්පකො** නාම ඛත්තියො,
උග්ගච්ඡන්තොව සූරියො ජොතිස්සති මහබ්බලො.

645. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති

646. තිදසා සො චවිත්වාන මනුස්සත්තං ගමිස්සති,
**රෙවතො** නාම නාමෙන බ්‍රහ්මබන්ධු භවිස්සති.

647. අගාරා නික්ඛමිත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො සාසනෙ පබ්බජිස්සති.

648. සො පච්ඡා පබ්බජිත්වාන යුත්තයොගො විපස්සකො[3],
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො."

649. විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

650. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගො'ව කිලෙසෙ ඣාපයී මම.*

651. තතො මං වනනිරතං[9] දිස්වා ලොකන්තගූ මුනි,
වනවාසිභික්ඛූනග්ගං[10] පඤ්ඤපෙසි මහාමති.*

652. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඛදිරවනියො රෙවතො** ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඛදිරවනියරෙවතත්ථෙරස්ස අපදානං නවමං.**

---

1. භාගිරසී. ම. P T S. සෙ. 2. පභූතා හිමවන්තතො. ථෙ. 3. තිත්ථස්ස. ථෙ.
4. පදුමුත්තරනායකො සම්බුද්ධො දිපදුත්තමො. ම. P T S. අ.
5. ගඞ්ගාතීරමුපාගතො. ම. ථෙ. 6. නාවාලඤ්ජකං P T S. සෙ. ථෙ. අ.
7. තාරණො. ථෙ. සෙ. අ. 8. විපස්සති. ථෙ. 9. ඣානනිරතං. ථෙ.
10. ඣායීනං භික්ඛූනං ථෙ
* ඉමා ද්වෙ ගාථා P T S. සෙ. පොත්ථකෙසු න විජ්ජන්ති.

## 9. ඛදිරවනියරෙවතසථවිරාවදානය

637. හිමවතින් හටගත් **භාගීරථී** නම් ගඞ්ගාවක් වූවා ය. (මම එහි) සැඩ රළවේගයන්ගෙන් යුත් විෂමතීර්ථයක නැවියෙක් වීමි.

638. **පදුමුත්තර** බුදුරජ තෙම රහතුන් දහසක් සමග ගඞ්ගාවෙහි සැඩපහර තරණය කරන්නේ ය යි පෙර මාගේ ඇසීම වි ය.

639 බොහෝ නැව් එක් කොට තැනූ නැවෙහි වඩුවන් ලවා මැනවින් සෙවෙනි කොට බුදුරජාණන් වහන්සේ පිදීමි.

640. බුදුරජ තෙම පැමිණ උතුම් නැවට නැංගේ ය. (නැව් නැඟී) දිය මැද සිටියා වූ බුදුරජානන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක:

641. "යමෙක් තෙම සම්බුදු රජු ද ආශ්‍රව රහිත වූ (රහත්) සඞ්ඝයා ද තරණය කරවී නම්, හෙතෙම ඒ චිත්තප්‍රසාදය හේතුකොට ගෙණ දෙව්ලොවෙහි සිත් අලවා වාසය කරන්නේ ය.

642. ඔබහට මැනවින් කළ නැවෙහි සටහන් ඇති විමානයක් (දෙව්-ලොව) පහළ වන්නේ ය. හැම කල්හි අහසෙහි මල් වියනක් ද දරන්නේ ය.

643. (මෙයින්) අටපණස්කපකින් මත්තෙහි සතර මහදිවයිනට අධිපති වූ දිනනසුළු වූ **තාරක** නම් සක්විති රජෙක් වන්නේ ය.

644. (මෙයින්) සත්පණස්වන කපෙහි මහබල ඇති **චම්පක** නම් ක්‍ෂත්‍රිය තෙමේ උදා වන්නා වූ හිරු මෙන් බබලන්නේ ය.

645. කල්ප ලක්‍ෂයකින් මතුයෙහි **ඔක්කාක**කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන සේක.

646. ඒ චම්පක තෙම (එකල) දෙව්ලොවින් චුත ව මිනිසත්බවට යන්නේ ය. නමින් **රෙවත** නම් වූ බමුණෙක් වන්නේ ය.

647. කුශල මූලයන්ගෙන් මෙහෙයන ලද්දේ ගිහිගෙන් නික්ම **ගෞතම** බුදුරජානන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේ ය.

648. හෙතෙම පැවිදි වී පසු ව භාවනානුයොගී වූයේ විදර්ශනා කරන්නේ සියලු ආශ්‍රවයන් (ප්‍රහාණපරිඥාවෙන්) දැන ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය."

649. නිර්වාණ සඞ්ඛ්‍යාත යෝගක්‍ෂෙමයට පමුණුවන ධුරවාහකයා (=ගැල් බර උසුලන ගවයා) මාගේ වියර්ය යි. (මම මේ) සම්බුද්ධශාසනයෙහි අන්තිම ශරීරය දරමි. (මේ අන්තිම ජාතිය යි.)

650. මා විසින් කල්පලක්‍ෂයකට පෙර කරණලද කර්මය මෙහි දී විපාක දැක්වී ය. දුනුදියෙන් මැනවින් මිදුනු හීයේ වේගය මෙන් (ඒ **කර්මය**) මාගේ කෙලෙස් දැවී ය.

651. ඉක්බිති ලොකාන්තයට ගිය මහනුවණැති බුදුරජාණන් වහන්සේ වනසෙනසුනෙහි ඇලුනා වූ මා දැක වනවාසි භික්‍ෂූන් අතුරෙන් අගතන්හි තබා වදාළ සේක.

652. සිවු පිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඛදිරවනියරෙවත** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**නවවැනි වූ ඛදිරවනියරෙවතස්ථවිරාවදානය යි.**

---

# 10. ආනන්දත්ථෙරාපදානං

653. ආරාමද්වාරා නික්ඛම්ම **පදුමුත්තරො** මහාමුනි,
වස්සෙන්තො[1] අමතං වුට්ඨිං නිබ්බාපෙසි මහාජනං.

654. සතසහස්සා තෙ වීරා[2] ඡළභිඤ්ඤා මහිද්ධිකා,
පරිවාරෙන්ති සම්බුද්ධං ඡායාව අනපායිනී[3].

655. හත්ථික්ඛන්ධගතො ආසිං සෙතච්ඡත්තං වරුත්තමං,
සුචාරුරූපං දිස්වාන විත්ති මෙ උපපජ්ජථ.

656. ඔරුය්හ හත්ථික්ඛන්ධම්හා උපගච්ඡිං නරාසභං,
රතනාමයඡත්තං මෙ බුද්ධසෙට්ඨස්ස ධාරයිං.

657. මම සඞ්කප්පමඤ්ඤාය **පදුමුත්තරො** මහාඉසි,
තං කථං ඨපයිත්වාන ඉමා ගාථා අභාසථ:

658. “යො සො ඡත්තං අධාරෙසි සොණ්ණාලඞ්කාරභූසිතං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

659. ඉතො ගන්ත්වා අයං පොසො තුසිතං ආවසිස්සති,
අනුභොස්සති සම්පත්තිං අච්ඡරාහි පුරක්ඛතො.

660. චතුත්තිංසතික්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති,
බලාධිපො අට්ඨසතං වසුධං ආවසිස්සති.

661. අට්ඨපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං මහියා කාරයිස්සති.

662. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

663. සක්‍යානං කුලකෙතුස්ස ඤාතිබන්ධු භවිස්සති,
**ආනන්දො** නාම නාමෙන උපට්ඨාකො මහෙසිනො.

664. ආතාපී නිපකො චාපි[5] බාහුසච්චෙසු කොවිදො,
නිවාතවුත්ති අත්ථද්ධො සබ්බපාඨී භවිස්සති.

665. පධානපහිතත්තො සො උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත’නාසවො”.

666. සන්ති ආරඤ්ඤකා නාගා කුඤ්ජරා සට්ඨිහායනා,
තිධා පභින්නමාතඞ්ගා ඊසාදන්තා උරූළ්හවා.

667. අනෙකසතසහස්සා පණ්ඩිතාපි මහිද්ධිකා,
සබ්බෙ තෙ බුද්ධනාගස්ස න හොන්තු’පනිධිම්හි තෙ[6].

1. වස්සන්තො. ම. PTS. 2. සතසහස්සානි වීරා. PTS.
3. අනුපායිනී. ම. ථෙ. 4. නාමෙන. ථෙ. 5. සද්ධො. ථෙ.
6. හොන්ති පණිදිම්හි. ම න හොන්ති පරිවිම්හිතා PTS.

# 10. ආනන්දස්ථවිරාවදානය

653. **පදුමුත්තර** බුදුරජ තෙම අරම් දෙරින් නික්ම අමාවැසි වස්වන්නේ මහාජනයා සන්හිඳවී ය. (=නිවණට පැමිණවී ය.)

654. ෂඩභිඥ ඇත්තා වූ ද මහාඍද්ධි ඇත්තා වූ ද ලක්ෂයක් ඒ ක්ෂීණාශ්‍රවයෝ අත හැර නො යන්නා වූ සෙවණැල්ල මෙන් සම්බුදුයන් වහන්සේ පිරිවරත්.

655. (මම) උතුම් සේසත (මාගේ මස්තකයෙහි දරන්නේ) ඇතුපිට හුන්නෙම් වෙමි. මනොඥ වූ රූමත් බුදුරජානන් වහන්සේ දැක මට ප්‍රීතිය උපන්නේ ය.

656. ඇතු පිටින් බැස නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. මාගේ රුවන්මුවා ඡත්‍රය බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දැරීමි.

657. **පදුමුත්තර** මහර්ෂි (බුදුරජ) තෙම මාගේ අදහස දැන (තමන් වහන්සේගේ) ඒ කථාව නවතා මේ ගාථාවන් වදාළේ ය:

658. "ඒ යමෙක් සවර්ණාලඞ්කාරයන්ගෙන් සරසනලද ඡත්‍රයක් දැරී ද ඔහු (පිළිබඳ ව) ප්‍රකාශ කරන්නෙමි. පවසන්නා වූ මාගේ (ඒ වචනය) අසවු.

659. මේ පුරුෂ තෙම මෙයින් (චුත ව) ගොස් තුෂිතයෙහි වසන්නේ ය. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ සම්පත් අනුභව කරන්නේ ය.

660. සූතිස්වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (ඉන් චුත ව) සිවුරඟ සෙනඟට අධිපති ව එකසියඅටවරක් (පෘථිවීශ්වර ව) පොළොවෙහි වාසය කරන්නේ ය.

661. අටපණස්වරක් සක්විතිරජ වන්නේ ය. පෘථිවියෙහි මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ද කරවන්නේ ය.

662. කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

663. ශාක්‍යකුලයට ධජයක් වැනි වූ මහාවීර වූ බුදුරජානන් වහන්සේගේ ඥාති වූ (මෙතෙම) **ආනන්ද** නම් උපස්ථායකයා වන්නේ ය.

664. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති ප්‍රඥාවත් වූ බහුශ්‍රැතභාවයෙහි දක්ෂ වූ නිහතමාන පැවැතුම් ඇති තදබැවින් තොර ත්‍රිපිටකධාරියෙක් වන්නේ ය.

665. වීර්‍ය්‍යය කිරීමෙහි මෙහයනලද සිත් ඇති හෙතෙම උපශාන්ත වූයේ උපධි රහිත වූයේ සියලු ආශ්‍රවයන් (ප්‍රහාණපරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය.".

666. (යම් සේ) අරණ්‍යෙහි උපතින් සැටවස් ඉක්ම ගිය ත්‍රිමද ගලිත වූ මාතඞ්ගහස්තිකුලයෙහි උපන්නා වූ මහත් දළ ඇති රාජවාහන වූ ඇත්තු වෙත් ද,

667. (එසේ ම) පණ්ඩිත වූ ද මහා ඍද්ධිමත් වූ ද නොයෙක් ලක්ෂගණන් රහත් නාගයෝ වෙත් නම්, ඒ සියල්ලෝ බුද්ධනාගයන් වහන්සේට ලං කොට තැබීමෙහි දී (සම) නො වෙත්.

668. ආදියාමෙ නමස්සාමි මජ්ඣිමෙ අථ පච්ඡිමෙ,
පසන්නචිත්තො සුමනො බුද්ධසෙට්ඨං උපට්ඨහිං.

669. ආතාපී නිපකො චාපි සම්පජානො පතිස්සතො,
සොතාපත්තිඵලම්පත්තො සෙක්ඛභූමීසු කොවිදො.

670. කප්පෙ'තො සතසහස්සෙ යං කම්මමභිනීහරිං,
තා'හං භූමිමනුප්පත්තො ඨිතො සද්ධම්මමාචලො[1].

671, 672, 673. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආනන්දො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආනන්දත්ථෙරාපදානං දසමං.**

---

**බුද්ධවග්ගො පඨමො.**

උද්දානං:

බුද්ධො පච්චෙකබුද්ධො ච[2] සාරිපුත්තො ච කොලිතො,
කස්සපො අනුරුද්ධො ච පුණ්ණත්ථෙරො උපාලි ච.
අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො පිණ්ඩොලො රෙවතා'නන්දපණ්ඩිතො.
ඡසතානි ච පඤ්ඤාස ගාථායො සබ්බපිණ්ඩිතා.

---

1. ඨිතා...චලා. ථෙ.. 2. පච්චෙකසම්බුද්ධො. සෙ.

668. පෙරයම්හි ද මැදියම්හි ද පැසුළුයම්හි ද නමස්කාර කරන්නෙමි. පහන් සිත් ඇත්තෙම් තුටු වූයෙම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹ සිටියෙමි.

669. කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූයෙම් පැණවත් වූයෙම් මනා දැනුම් ඇත්තෙම් සිහියෙන් යුතු වූයෙම් ශෛක්‍ෂ්‍යභූමියෙහි දක්‍ෂ වූයෙම් සෝවාන් ඵලයට පැමිණියෙම් වෙමි.

670. මෙයින් කල්ප ලක්‍ෂයකට පෙර යම් කර්‍මයක් (කොට යමක්) ප්‍රාර්ථනා කෙළෙම් නම්, මම ඒ පදවියට පැමිණියෙම් සසුනෙහි නිශ්චල ව සිටියෙම් වෙමි.

671, 672, 673, කෙලෙස් දවනලදී -පෙ- බුදුරජානන් වහන්සේගේ අනුශාසනය කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආනන්‍දස්ථවිරයන්** වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් යී.

**දසවැනි වූ ආනන්‍දස්ථවිරාපදානය යි.**

**පළමුවැනි බුද්ධවග්ගය යි.**

(එහි අපදාන) නාමාවලිය-

බුදු පසේබුදු හා - සැරියුත් කෝලිත කසුප්,
අනුරුදු පුණ්ණ උපාලි - අඤ්ඤාකොණ්ඩඤ්ඤ ද.
පිඬොල්බරදූජ රේවත - පඬිඅනඳ යන සිරිතුදු;
සසිය පණසක් ගා වෙයි - එහැම පිඬු කොට දක්වූ.

# 2

## 11. සීහාසනදායකත්ථෙරාපදානං

674. නිබ්බුතෙ ලොකනාථම්හි සිද්ධත්ථෙ දිපදුත්තමෙ,
විත්ථාරිතෙ පාවචනෙ බාහුජඤ්ඤම්හි සාසනෙ.

675. පසන්නචිත්තො සුමනො සීහාසනමකාස'හං,
සීහාසනං කරිත්වාන පාදපීඨමකාස'හං.

676. සීහාසනෙ ච වස්සන්තෙ ඝරං තත්ථ අකාස'හං,
තෙන චිත්තප්පසාදෙන තුසිතං උපපජ්ජ'හං.

677. ආයාමෙන චතුබ්බීසයොජනං ආසි තාවදෙ,
විමානං සුකතං මය්හං විත්ථාරෙන චතුද්දස[1].

678. සතං[2] කඤ්ඤාසහස්සානි පරිවාරෙන්ති මං සදා,
සොණ්ණමයඤ්ච පල්ලඞ්කං ව්‍යම්හෙ ආසි සුනිම්මිතං.

679. හත්ථියානං අස්සයානං දිබ්බයානං උපට්ඨිතං,
පාසාදා සිවිකා චෙව උපපජ්ජන්ති[3] යදිච්ඡකං.

680. මණිමයා ච පල්ලඞ්කා අඤ්ඤෙ සාරමයා බහූ,
නිබ්බත්තන්ති මමං සබ්බෙ සීහාසනස්සි'දං ඵලං.

681. සොණ්ණමයා රූපිමයා ඵලිකා වෙළුරියාමයා,
පාදුකා අභිරූහාමි පාදපීඨස්සි'දං ඵලං.

682. චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

683. තෙසත්තතිම්හිතො කප්පෙ ඉන්දනාමා තයො ජනා,
ද්වෙසත්තතිම්හිතො කප්පෙ තයො සුමනනාමකා.

684. සමසත්තතිම්හිතො කප්පෙ තයො වරුණනාමකා,
සත්තරතනසම්පන්නා චතුදීපම්හි ඉස්සරා.

685. පටිසම්භිදා චතස්සො ච-පෙ-කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සීහාසනදායකො ථෙරො
ඉමා ගාථායො අභාසිත්ථාති.

**සීහාසනදායකත්ථෙරස්සාපදානං පඨමං.**

## 12. එකත්ථම්භිකත්ථෙරාපදානං.

686. සිද්ධත්ථස්ස භගවතො මහාපූගගණො අහු,
සරණඞ්ගතා ච තෙ බුද්ධං සද්දහන්ති තථාගතං.

687. සබ්බෙ සඞ්ගම්ම මන්තෙත්වා මාළං[4] කුබ්බන්ති සත්ථුනො,
එකත්ථම්භං අලභන්තා විචිනන්ති බ්‍රහාවනෙ.

1. චතුද්දසං. 2. සත. ම. සත්ත. සෙ. 3. නිබ්බත්තන්ති. සෙ. 4 සාල. සෙ. ථෙ

# 2

## 11. සිංහාසනදායකස්ථවිරාපදානය

674, 675. ලොකනාථ වූ **සිද්ධාර්ථ** බුදුරදුන් පිරිනිවි කල්හි ත්‍රිපිටක ධර්මය පැතිර ගිය කල්හි බොහෝ ජනයා විසින් මැනැවැයි දන්නාලද සසුනෙහි මම පහන් සිතැත්තෙම් තුටු වූයෙම් සිහසුනක් කෙළෙම්. (එසේ ම) මම සිහසුන කොට පාපුටුවක් ද කෙළෙම්.

676. සිහසුන තෙමෙන කල්හි මම එහි ආවරණයට ගෘහයක් ද කෙළෙම්. මම ඒ සිත පැහැදවීම හේතු කොට ගෙණ **තුසිත**භවනයෙහි උපතිම්.

677. එ කෙණෙහි දිගින් සුවිසියොදුන් වූ පුළුලින් තුදුස්යොදුන් වූ මැනැවින් කරණ ලද විමානයක් මට (පහළ) වී ය.

678. දිව්‍යකන්‍යාවෝ ලක්ෂයක් හැම කල්හි මා පිරිවරත්. විමානයෙහි මැනවින් නිර්මිත කළ සවර්ණමයපය්‍යීඞ්කයෙක් වී ය.

679. හස්තිවාහන ද අශ්වවාහන ද දිව්‍යවාහන ද එළඹ සිටියේ ය. කැමැති පරිදි ප්‍රාසාදයෝ ද සිවිකාවෝ (=දෝලා) ද පහළ වෙත්.

680. මිණිමුවා පය්‍යීඞ්කයෝ ද අන්‍ය වූ (රුක්) හරමුවා බොහෝ පය්‍යීඞ්කයෝ ද යන සියල්ල මට පහළ වෙත්. සිංහාසනදානයාගේ මේ විපාකය සි.

681. රුවන්මුවා වූ ද, රිදීමුවා වූ ද, පළිගුමුවා වූ ද, විදුරුමුවා වූ ද, පාදුකා (=පාවහන්) නගිම් (=පළඳිම්). පාදපීඨ (=පාපුටු) දානයාගේ මේ විපාකයයි.

682. එකල්හි (එනම්) මෙයින් සිවුඅනූවන කපෙහි සම් කර්මයක් කෙළෙම් ද, (එ ම කර්මඵලයෙන්) දුගතියක් නො දනිමි. මේ පුණ්‍යකර්මයාගේ විපාකය සි.

683. මෙයින් (පෙර) තෙසැත්තෑවැනි කපෙහි තුන්අත්බවෙක **ඉන්ද්‍ර** නම් (=සක්විති රජ) වීමි. (එසේම) මෙයින් දෙසැත්තෑවැනි කපෙහි **සුමන** නම් ඇති ව තෙවරක් ද,

684. මෙයින් සමසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් සතර මහදිවයිනෙහි අධිපති **වරුණ** නම් ඇති ව තෙවරක් ද සක්විතිරජ වීමි.

685. සිවුපිළිසිඹියාවෝ ද -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සිංහාසනදායකස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

සිංහාසනදායකස්ථවිරාපදානය පළමුවැනි සි.

## 12. එකත්ථම්භිකස්ථවිරාපදානය

686. **'සිද්ධාර්ථ'** භාග්‍යවතුන් වහන්සේට මහත් වූ උපාසක සමූහයෙක් වී ය. ඔහු බුදුරජුන් සරණ ගියාහු තථාගතයන් වහන්සේ අදහත්.

687. (ඒ) සියල්ලෝ එකතු ව මන්ත්‍රණය කොට බුදුරජානන් වහන්සේට උපස්ථානසාලාවක් කෙරෙත්. (ඒ සඳහා) එක් ටැඹක් නො ලබන්නාහු මහවෙනෙහි සොයත්.

688. තෙ'හං අරඤ්ඤෙ දිස්වාන උපගම්ම ගණං තදා,
අඤ්ජලිම්පග්ගහෙත්වාන පටිපුච්ඡිං ගණං අහං.

689. තෙ මෙ පුට්ඨා වියාකංසු සීලවන්තො උපාසකා,
මාළං[1] මයං කත්තුකාමා එකත්ථම්භො න ලබ්භති.

690. "එකත්ථම්භං මමං දෙථ අහං දස්සාමි සත්ථුනො,
ආහරිස්සාමි'හං ථම්භං අප්පොස්සුක්කා භවන්තු වො.

691. තෙ මෙ ථම්භං පවෙච්ඡිංසු පසන්නා තුට්ඨමානසා,
තතො පටිනිවත්තිත්වා අගමිංසු සකං ඝරං.

692. අචිරං ගතෙ පූගගණෙ ථම්භං අදාස'හං[2] තදා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පඨමං උස්සපෙස'හං.

693. තෙන චිත්තප්පසාදෙන විමානං උපපජ්ජ'හං
උබ්බිද්ධං භවනං මය්හං සතභූමං[3] සමුග්ගතං.

694. වජ්ජමානාසු භෙරීසු පරිචාරෙම'හං තදා,
පඤ්චපඤ්ඤාසකප්පම්හි රාජා ආසිං **යසොධරො.**

695. තත්ථාපි භවනං මය්හං සතභූමං සමුග්ගතං,
කූටාගාරවරූපෙතං එකත්ථම්භං මනොරමං.

696. එකවීසතිකප්පම්හි **උදෙනො** නාම ඛත්තියො,
තත්‍රා'පි භවනං මය්හං සතභූමං සමුග්ගතං.

697. යං යං යොනු'පපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
අනුභොමි සුඛං සබ්බං[4] එකත්ථම්භස්සි'දං ඵලං.

698. චතුනවුතෙ ඉතො කප්පෙ යං ථම්භමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි එකත්ථම්භස්සි'දං ඵලං.

699. පටිසම්භිදා-පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකත්ථම්භිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකත්ථම්භිකත්ථෙරස්සාපදානං දුතියං.**

## 13. නන්දත්ථෙරාපදානං*

700. **පදුමුත්තරස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
වත්ථං ඛොමං[5] මයා දින්නං සයම්භුස්ස මහෙසිනො.

701. තං මෙ බුද්ධො වියාකාසි ජලජුත්තරනාමකො,[6]
ඉමිනා වත්ථදානෙන හෙමවණ්ණො භවිස්සසි.

---

1. සාලං. ථෙ. සෙ. 2. අභාස'හං අඃ මු. ආකාසහං. ථෙ.
3. සතභූම. P T S. සතතභූමං සෙ. ථෙ.
4. අනුභොමි සබ්බමෙතං. P T S. සෙ. 5. වත්ථුත්තමං. P T S
6. ජලජුත්තමනායකො P T S. * ථෙරගාථට්ඨකථාය විසදිසං.

688. මම ඒ උවසුසමූහයා වනයෙහි දී දැක (එම) සමූහයා වෙත එළඹ ඇඳිලි බැඳගෙණ උවසුසමූහයාගෙන් (මෙසේ) විචාළෙමි.

689. මා විසින් විචාරණ ලද ඒ සිල්වත් උවසුවෝ මෙසේ පැවසූහ: "අපි උපට්ඨානසාලාවක් කරණු කැමැත්තෙමු. (ඒ සඳහා) එක් ටැඹක් නො ලැබේ ය" (කියා සි.)

690. එක් ටැඹ මට දෙවූ. මම ශාස්තෲන් වහන්සේට දෙන්නෙමි. මම ටැඹ ගෙණ එන්නෙමි; භවත්හු (ඒ සඳහා) උත්සාහ නැත්තෝ වෙත්වා" යි (කීමි)

691. පැහැදුනා වූ සතුටු සිත් ඇති ඔහු මට ටැඹ පැවරූහ. එම වනයෙන් පෙරලා ගොස් සවකීය ගෘහය ට පැමිණියාහු ය.

692. (උවසු) සමූහයා ගිය නොබෝ වේලාවකින් මම ටැඹක් දිනිමි. එකල්හි සතුටු වූ මම සතුටු සිතින් (එය) පළමු කොට ම එසවීමි.

693. එම චිත්තප්‍රසාදය හෙතු කොට ගෙණ පැන නැගුනා වූ උස් වූ මහල් සියයක් ඇති මාගේ විමානයට මම (උත්පත්ති වශයෙන්) ගියෙමි.

694. එකල්හි බෙර වයද්දී මම (දෙව්පිරිස්) පිරිවරමි. (එයින්) පස් පණස්වන කපෙහි **'යසොධර'** නම් රජෙක් වීමි.

695. එහි ද මට මහල් සියයක් ඇති උඩට නැගුනු උතුම් කුළු ගෙවලින් යුත් එක් ටැම් ඇති මනහර වූ භවනයෙක් වි ය.

696. එක්විසිවන කල්පයෙහි **'උදෙන'** නම් ක්ෂත්‍රියයෙක් වීමි. එහි ද මට සියයක් මහල් ඇති උස් ව පැන නැංගා වූ භවනයෙක් වි ය.

697. යම් යම් දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ යොනියක උපදිම් ද, සියලු සුව අනුභව කරමි. මෙය එක් ටැඹ පිදීමේ විපාකය සි.

698. (මෙයින්) සිවු අනූවනකපෙහි එකල යම් ටැඹක් දිනිම් ද, (එහෙයින්) දුගතියක් නො දතිමි. එක් ටැඹ පිදීමේ මේ විපාකය සි.

699. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් **එකත්ථම්භික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කළසේක් සී.

**එකත්ථම්භික** ස්ථවිරාවදානය දෙවැනි සි.

## 13. නන්දස්ථවිරාවදානය

700. ලොකජ්‍යෙෂ්ඨ වූ, තාදි(අටලෝදහමින් නො සැලෙන)ගුණ ඇති, සියල්ල තෙමේ ම අවබොධ කළා වූ, මහර්ෂි වූ **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේට මා විසින් කොමු පිළියක් දෙන ලදී.

701. ඒ (වස්ත්‍රදායක වූ) මට **පදුමුත්තර** නම් බුදුරජානන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක: "මේ වස්ත්‍රදානය කරණ කොට ගෙණ සවණ්වණ් වන්නෙහි ය.

702. දෙව සම්පත්ති අනුභොත්වා කුසලමූලෙහි චොදිතො,
ගොතමස්ස භගවතො කනිට්ඨො ත්වං භවිස්සසි.

703. රාගරත්තො සුඛසීලො කාමෙසු ගෙධමායුතො,
බුද්ධෙන චොදිතො සන්තො තදා[1] ත්වං පබ්බජිස්සසි.

704. පබ්බජිත්වාන ත්වං තත්ථ කුසලමූලෙන චොදිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සස’නාසවො.

705. සතකප්පසහස්සම්හි[2] චතුරො **චෙලනාමකා**,
සට්ඨිකප්පසහස්සම්හි **උපචෙලා** චතුජ්ජනා.

706. පඤ්චකප්පසහස්සම්හි චෙලාව චතුරො ජනා,
සත්තරතනසම්පන්නා චතුදීපම්හි ඉස්සරා.

707. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නන්දො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නන්දත්ථෙරස්සාපදානං තතියං.**

## 14. චූලපන්ථකත්ථෙරාපදානං

708. **පදුමුත්තරො** නාම ජිනො ආහුතීනං පටිග්ගහො,
ගණම්හා වූපකට්ඨො සො හිමවන්තෙ වසී තදා.

709. අහම්පි හිමවන්තම්හි වසාමි අස්සමෙ තදා,
අචිරාගතං මහාවීරං උපෙසිං ලොකනායකං.

710. පුප්ඵච්ඡත්තං ගහෙත්වාන උපගච්ඡිං නරාසභං,
සමාධිං සමාපජ්ජන්තං අන්තරායමකාස’හං[3].

711. උභොහත්ථෙහි පග්ගය්හ පුප්ඵච්ඡත්තං අදාස’හං,
පටිග්ගහෙසි භගවා **පදුමුත්තරො** මහාමුනි.

712. සබ්බෙ දෙවා අත්තමනා හිමවන්තං උපෙන්ති[4] තෙ,
සාධුකාරං පවත්තෙන්සුං[5] අනුමොදිස්සති චක්ඛුමා.

1. තතො. සෙ. අ. 2. සත්තකප්පසහස්සම්හි 3. ආරාධනමකාසහං. ථෙ.
4. (එවං සබ්බත්ථ) 5. පවත්තිංසු. ම. P T S. සෙ. ථෙ.

702, (දිව්‍ය මනුෂ්‍ය සඞ්ඛ්‍යාත) ද්විවිධ සම්පත් අනුභව කොට කුසල මූලයෙන් මෙහෙයන ලදුවහු ඔබ **ගෞතම** බුදුරජානන් වහන්සේගේ බාල සොහොයුරු වන්නහු ය.

703. කෙලශකාමයෙන් ඇලුනහු (කාය - චිත්ත) සුඛයන් අනුභව කරණ ස්වභාවය ඇත්තහු, වස්තුකාමයන්හි ගිජු වූවහු, බුදුරජානන් වහන්සේ විසින් මෙහෙයන ලදුවහු, ශාන්ත වූවහු එකල්හි පැවිදි වන්නහු ය.

704. තෝ එහි පැවිදි ව කුසලමූලයන් විසින් මෙහෙයන ලදුයෙහි සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥාවෙන් දැන හැර දමා ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නෙහි ය'' (**කියායි**).

705. මෙ කපින් පෙර **එක්දහස් එක්සිය** වන කපෙහි **'චෙල'** නම් වූ සක්විතිරජවරු සිවුදෙනෙක් වූහ. **එක්දහස්** සැට වන කල්පයෙහි (සිවු ජාතියක) **'උපචෙල'** නම් වූ සක්විතිරජවරු සිවු දෙනෙක් වූහ.

706. එක්දහස් පස් වන කපෙහි **'චෙල'** නම් වූ ම (සක්විතිරජවරු) සිවුදෙනෙක් වූහ. ඔහු සත්රුවනින් යුක්ත වූවාහු සතර මහ දිවයිනෙහි අධිපති වූහ.

707. **සිවුපිළිසිඹියාවෝ** -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් **'නන්ද'** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**නන්දස්ථවිරාවදානය තෙවැනියි.**

## 14. චූලපන්ථකස්ථවිරාවදානය

708. එකල්හි පූජාවන් පිළිගන්නා වූ හෙවත් පූජාවනට ගෙයක් බඳු වූ **පදුමුත්තර** නම් බුදුරජානන් වහන්සේ ගණ(=සමූහ)යා කෙරෙන් වෙන් වූ සේක් හිමවතෙහි විසූ සේක.

709. එකල්හි මම ද හිමවතෙහි අසපුවක වෙසෙමි. පැමිණි නොබෝ කල් ඇති ලොකනායක වූ මහාවීරයන් (=බුදුරජානන්) වහන්සේ වෙත එළඹියෙමි.

710. මල්සතක් (=මල්කුඩයක්) ගෙණ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. මම සමවතට සමවන් උන්වහන්සේගේ සමාධියට අන්තරායයක් නො කෙළෙමි.

711. මම දෑතින් ගෙණ මල්සත දුනිමි. මහාමුනි වූ **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේ (එය) පිළිගත් සේක.

712. සතුටු වූ ඒ සියලු දෙවිවරු හිමවතට එළඹෙත්. ''පසැස් ඇති බුදුරජ තෙම අනුමොදනා කරන්නේ ය'' සි සාධුකාර පැවැත්වූහ.

713. ඉදං වත්වාන තෙ දෙවා උපගච්ඡුං නරුත්තමං,
ආකාසෙ ධාරයන්තං මෙ[1] පදුමච්ඡත්තමුත්තමං[2].

714. සතපත්තඡත්තං[3] පග්ගය්හ[4] අද්දසි තාපසො මමං,
තම'හං කිත්තයිස්සාමි; සුණොථ මම භාසතො:

715. පඤ්චවීසති කප්පානි දෙවරජ්ජං කරිස්සති,
චතුත්තිංසතික්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති.

716. යං යං යොනිං සංසරති දෙවත්තං අථ මානුසං,
අබ්භොකාසෙ පතිට්ඨන්තං පදුමං ධාරයිස්සති.

717. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

718. පකාසිතෙ පාවචනෙ මනුස්සත්තං ලභිස්සති,
මනොමයම්හි කායම්හි උත්තමො සො භවිස්සති.

719. ද්වෙ භාතරො භවිස්සන්ති උභොපි පන්ථකව්හයා,
අනුභොත්වා උත්තමත්ථං ජොතයිස්සන්ති සාසනං.

720. සො'හං අට්ඨාරසවස්සො[5] පබ්බජිං අනගාරියං,
විසෙසා'හං න විඤ්දමි සක්‍යපුත්තස්ස සාසනෙ.

721. දන්ධා මය්හං ගතී ආසි පරිභූතො පුරෙ අහුං[6],
භාතා ච මං පනාමෙසි: ගච්ඡ 'දානි සකං ඝරං.

722. සො'හං පනාමිතො සන්තො සංඝාරාමස්ස කොට්ඨකෙ,
දුම්මනො තත්ථ අට්ඨාසිං සාමඤ්ඤස්මිං[7] අපෙක්ඛවා.

723. භගවා තත්ථ[8] ආගඤ්ඡි සීසං මය්හං පරාමසි,
බාහාය මං ගහෙත්වාන සංඝාරාමං පවෙසයී.

724. අනුකම්පාය මෙ සත්ථා අදාසි පාදපුඤ්ඡනිං,
එවං සුද්ධං අධිට්ඨෙහි එකමන්තං ස්වධිට්ඨිතං.[9]

725. හත්ථෙහි තමහං ගය්හ සරිං කොකනදං අහං;
තත්ථ චිත්තං විමුච්චි මෙ අරහත්තං අපාපුණිං.

726. මනොමයෙසු කායෙසු සබ්බත්ථ පාරමිංගතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

727. පටිසම්භිදා –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චුල්ලපන්ථකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චුල්ලපන්ථකත්ථෙරස්සා'පදානං චතුත්ථං.**

---

1. ධාරයන්තස්ස. අ. මු. 2. පදුමං ම. ථෙ. 3. පදුමඡත්තං. P T S 4. ගණ්හ. ම.
5. සො අට්ඨාරසවස්සො'හං. ථෙ. අට්ඨාරසඤ්චවස්සො'හං. ම. P T S. සෙ.
6. අහං. P T S. ථෙ. 7. සාසනස්මිං. ථෙ. 8. අථෙ 'සත්ථා. අ. මු.
9. එකමන්තමධිට්ඨහං ම. මධිට්ඨිතං. P T S. සෙ

713. ඒ දෙව්වරු මෙය කියා මාගේ පියුම් සත අහසෙහි දරන්නා වූ උතුම් වූ නරශ්‍රේෂ්ඨයන් වහන්සේ වෙත එළඹියාහු ය.

714 "(මේ)තවුස්තෙමේ පියුම්සතක් ගෙණ මට දුන්නේ ය. ඔහු පිළිබඳ ව මම (කරුණු) ප්‍රකාශ කරමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවු" යි (මෙසේ බුදුහු වදාළහ).

715. (මෙතෙම) පස්විසි වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. සූතිස් වරක් සක්විතිරජ ද වන්නේ ය.

716. (මෙතෙම) දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක සැරිසරා ද, අභ්‍යවකාශයෙහි (=එළිමහනෙහි) හුන්නේ පියුමක් (කුඩයක්) මෙන් දරන්නේ ය.

717. කල්ප ලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

718. උන්වහන්සේ පිටකත්‍රය ධර්මය දෙසූ කල්හි හෙතෙම මිනිසත් බව ලබන්නේ ය. මනොමය වූ ශරීරනිර්මාණයෙහි අග්‍ර ද වන්නේ ය.

719. සොහොයුරෝ දෙදෙනෙක් වන්නාහු ය. දෙදෙන ම පන්ථක නම් වන්නාහු ය. උත්තමාර්ථය වූ නිවණ ප්‍රතිවෙධ කොට සසුන බබුලු-වන්නාහු ය" (කියායි).

720. ඒ මම අටළොස්වියැ'ත්තේ අනගාරිය නම් වූ සාසනයෙහි පැවිදි වීමි. මම ශාක්‍යපුත්‍ර වූ බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි විශෙෂාධිගමය(ධර්මාවබොධය)ක් නො ලැබීමි.

721. මාගේ ගතිය (=ස්වභාවය) දන්ධ (=මෝඩ) වි ය. (මම) පළමු කොට ගරහන ලදුයෙම් වීමි. දූත් ස්වකීය ගෘහයට යව යි කියා මාගේ සොහොයුරා ද මා නෙරපා දැමී ය.

722. නෙරපා දමන ලද ඒ මම සඟරම්දොරටුවෙහි නැවතී දොම්නස් වූයෙම් පැවිදිබැව්හි බලාපොරොත්තු සහිත ව එහි සිටියෙමි.

723. ශාස්තෘ තෙම එහි පැමිණියේ ය. මාගේ හිස පිරිමැද්දේ ය. මගේ අතින් අල්ලා සඟරමට පිවිසවී ය.

724. මෙසේ පිරිසිදු (මෙය ගෙණ) එකත්පසෙක හිඳ මනා කොට ඉටුව යි (=සිහි කරවයි) කියා මට අනුකම්පාවෙන් ශාස්තෘතෙම පෑපිස්නා කඩක් දුන්නේ ය.

725. මම එය දෑතින් ගෙණ පියුම සිහි කෙළෙමි. එහි දී මගේ සිත (කෙලෙසුන්ගෙන්) මිදුනේ ය. රහත්බවට පැමිණියෙමි.

726. සියලු තන්හි මනොමයශරීරයන් නිර්මිත කිරීමෙහි පරතෙරට පැමිණියෙම් සියළු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දැන දුරු කෙළෙම් ආශ්‍රව රහිත ව (=රහත් ව) වෙසෙමි.

727. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

චුල්ලපන්ථක ස්ථවිරාපදානය සතරවැනියි.

## 15. පිළින්දිවච්ඡත්ථෙරාපදානං

728. නිබ්බුතෙ ලොකනාථම්හි **සුමෙධෙ** අග්ගපුග්ගලෙ,
පසන්නචිත්තො සුමනො ථූපපූජමකාස'හං.

729. යෙ ච ඛීණාසවා තත්ථ ඡළභිඤ්ඤා මහිද්ධිකා,
තෙ'හං තත්ථ සමානෙත්වා සංඝභත්තං අකාස'හං.

730. සුමෙධස්ස භගවතො උපට්ඨාකො තදා අහු,
**සුමෙධො** නාම නාමෙන අනුමොදිත්ථ සො තදා.

731. තෙන චිත්තප්පසාදෙන විමානං උපපජ්ජහං,
ඡළාසීතිසහස්සානි අච්ඡරායො රමිංසු මෙ.

732. මමෙව අනුවත්තන්ති සබ්බකාමෙහි තා සදා,
අඤ්ඤෙ දෙවෙ අතිභොමි[1] පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

733. පඤ්චවීසතිකප්පම්හි **වරුණො** නාම ඛත්තියො,
සුසුද්ධභොජනො[2] ආසිං චක්කවත්ති අහං තදා.

734. න තෙ බීජං පවපන්ති නපි නීයන්ති නඞ්ගලා,
අකට්ඨපාකිමං සාලිං පරිභුඤ්ජන්ති මානුසා.

735. තත්ථ රජ්ජං කරිත්වාන දෙවත්තං පුන ගච්ඡ'හං,
තදාපි එදිසා මය්හං නිබ්බත්තා භොගසම්පදා.

736. න මං මිත්තා අමිත්තා වා හිංසන්ති සබ්බපාණිනො,
සබ්බෙසම්පි පියො හොමි පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

737. තිංසකප්පසහස්සම්හි යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ගන්ධාලෙපස්සි'දං ඵලං.

738. ඉමස්මිං භද්දකෙ කප්පෙ එකො ආසිං[3] ජනාධිපො,
මහානුභාවො රාජා'හං[4] චක්කවත්ති මහබ්බලො.

739. සො'හං පඤ්චසු සීලෙසු ඨපෙත්වා ජනතං බහුං,
පාපෙත්වා සුගතිංයෙව දෙවතානං පියො අහුං.

740. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **පිළින්දිවච්ඡො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පිළින්දිවච්ඡත්ථෙරස්සාපදානං පඤ්චමං.**

---

1. අභිභොමි. ථෙ. 2. විසුද්ධ. ම. සෙ. ථෙ.
3. ආසි. ම. සෙ. 4. රජාසිං. PTS. ම.

# 15. පිළින්දිවච්ඡත්ථෙරාපදානය

728. ලොකනාථ වූ අග්‍රපුද්ගල වූ **'සුමෙධ'** බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි පහන් සිත් ඇති මනා සිත් ඇති මම ස්තූපපූජාවක් කෙළෙමි.

729. යම් ෂඩභිඥ වූ මහාසෘද්ධි ඇති ක්‍ෂීණාශ්‍රව කෙනෙක් එහි (වූවාහු ද) මම උන්වහන්සේලා එහි රැස් කරවා සඟබතක් දිනිමි.

730. එකල්හි **'සුමෙධ'** භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයෙක් වී ය. නමින් සුමෙධ නම් වූ හෙතෙම එකල්හි අනුමොදනා කෙළේ ය.

731. එ ම (ථූපපූජා කිරීම් වශයෙන් ඇති වූ) චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ මම දිව්‍යවිමානයක උපනිමි. අසූසයදහසක් දෙවඟනෝ මාගේ (සිත එහි) ඇලවූහ.

732. එ ම අප්සරාවෝ සියලු කාමයන් කරණ කොට ගෙණ මා අනු ව ම පවතිත්. අනික් දෙවියන් (සමපත්තියෙන්) ඉක්මවමි. මේ (ස්තූපපූජා) පුණ්‍යකර්මයාගේ විපාකය යි.

733. මම එකල්හි පස්විසිවන කපෙහි පිරිසිදු බොජුන් ඇති **'වරුණ'** නම් සක්විතිරජෙක් වීමි.

734. ඒ මනුෂ්‍යයෝ බිජුවට නො වපුරත්. නගුල් (සීසෑම් වශයෙන්) නො පමුණුවනු ලැබේ. අරණ්‍යයෙහි නො සෑ බිම්පෙදෙස්හි තෙමේ ම හට ගත් හැල් අනුභව කෙරෙත්.

735. මම එහි රාජ්‍යය කොට නැවත දිව්‍යාත්මභාවයට පැමිණියෙමි. එකල්හි ද මට මෙබඳු ම වූ භොගසම්පත්ති තොමෝ උපන්නී ය.

736. මිතුරු වූ හෝ පසමිතුරු වූ හෝ සියලු ප්‍රාණීහු මට හිංසා නො කෙරෙත්. සියලු දෙනාහට ම ප්‍රිය වෙමි. මෙය (ස්තූපපූජා) පුණ්‍ය-කර්මයාගේ විපාකය යි.

737. එකල මෙයින් එක්දහස්තිස්වන කල්පයෙහි මම යම් දනක් දිනිම් ද, (ඉන්) දුගතියක් නො දනිමි. (ස්තූපයෙහි) සුගන්ධාලෙපයාගේ (=සුවඳ ගැල්වීමෙහි) ඵලය යි.

738. මේ භද්‍රකල්පයෙහි මම ජනාධිපති වූ මහානුභාව ඇති මහත් බල ඇති එක් සක්විතිරජෙක් වීමි.

739. ඒ මම බොහෝ ජනයා පන්සිල්හි පිහිටුවා සුගතියට ම පමුණුවා දෙවියනට ප්‍රිය වීමි.

740. පටිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **'පිළින්දිවච්ඡ'** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**පිළින්දිවච්ඡත්ථෙරාපදානය** පස්වැනි යි.

# 16. රාහුලත්ථෙරාපදානං

741. **පදුමුත්තරස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
සත්තභූමම්හි පාසාදෙ ආදාසං සන්ථරිං[1] අහං.

742. ඛීණාසවසහස්සෙහි පරිකිණ්ණො මහාමුනි,
උපාගමි ගන්ධකුටිං දිපදින්දො නරාසභො.

743. විරොචෙන්තො[2] ගන්ධකුටිං දෙවදෙවො නරාසභො,
භික්ඛුසඞ්ඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ.

744. යෙනා'යං ජොතිතා සෙය්‍යා[3] ආදාසො ච සුසන්ථතො,
තම'හං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො.

745. සොවණ්ණමයා රූපිමයා[4] අථො වෙළුරියාමයා,
නිබ්බත්තිස්සන්ති ආදාසා[5] යෙ කෙචි මනසො පියා.

746. චතුසට්ඨික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
සහස්සක්ඛත්තුං චක්කවත්තී භවිස්සති අනන්තරා.

747. එකවීසතිකප්පම්හි **විමලො** නාම ඛත්තියො,
චාතුරන්තො විජිතාවී චක්කවත්තී භවිස්සති.

748. නගරං **රෙණුවතී** නාම ඉට්ඨකාහි සුමාපිතං,
ආයාමතො තීණි සතං චතුරස්සසමායුතං[6].

749. **සුදස්සනො** නාම පාසාදො විස්සකම්මෙන නිම්මිතො[7],
කූටාගාරවරූපෙතො සත්තරතනභූසිතො.

750. දස සද්ද අවිවිත්තං[8] විජ්ජාධරසමාකුලං,
**සුදස්සනං**ව නගරං දෙවතානං භවිස්සති.

751. පභා නිග්ගච්ඡතෙ තස්ස උග්ගච්ඡන්තෙව සූරියෙ[9],
විරොචෙස්සති[10] තං නිච්චං සමන්තා අට්ඨයොජනං.

752. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

753. තුසිතා සො චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො අත්‍රජො සො භවිස්සති.

754. සචෙ වසෙය්‍යා'ගාරං චක්කවත්තී භවෙය්‍ය සො[11],
අට්ඨානමෙතං යං තාදී අගාරෙ රතිමජ්ඣගා.

755. නික්ඛමිත්වා අගාරම්හා පබ්බජිස්සති සුබ්බතො,
**රාහුලො** නාම නාමෙන අරහා සො භවිස්සති.

---

1. ආදසිං සන්ථරං. P T S. සෙ. ථෙ. අද්දසිං. ම. 2. විරොචන්තං. P T S.
3. ජොතිතො සියා. P T S. 4. සොවණ්ණමයා මණීමයා. සෙ. ථෙ.
5. ආකාසෙ. ම. P T S. ථෙ. සෙ. 6. චතුරස්සං. P T S. සෙ.
7. මාපිතො. සෙ. ථෙ. 8. දසසද්දාවිවිත්තං තං. ම.
9. උග්ගච්ඡන්තොව සූරියො. ම. සෙ. 10. විරොචිස්සති. ම. P T S.
11. භවිස්සති. සෙ. ම.

# 16. රාහුලස්ථවිරාවදානය

741. මම ලොකජ්‍යෙෂ්ඨ වූ තාදී ගුණ ඇති **'පදුමුත්තර'** බුදුරජාණන් වහන්සේට සත්බුමුපහයක කැඩපතක් මෙන් පැහැපත් ඇතිරියක් අතුළෙමි.

742. දෙපා ඇතියනට අග්‍ර වූ මහාමුනි වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ රහතුන් දහසක් විසින් පිරිවරණ ලද සේක් ගඳකිළියට එළඹි සේක.

743. "දෙවියනට දෙවි වූ නරශ්‍රෙෂ්ඨ වූ ශාස්තෘ තෙමේ ගඳකිළිය බබුළුවන්නේ බික්සඟන මැද සිටියේ මේ ගාථාවන් වදාළේ ය:

744. යමකු විසින් මේ සෙනසුන බබුළුවන ලද ද කැටපතක් මෙන් පැහැපත් ඇතිරියක් මැනැවින් අතුරණ ලද ද මම ඔහු (කවරෙක් දැයි) ප්‍රකාශ කරන්නෙමි. (එසේ) ප්‍රකාශ කරන්නා වූ මාගේ වචනය අසවු.

745. "සවර්ණමය වූ ද රජතමය වූ ද යළි වෙරළුමිණිමුවා වූ ද යම්කිසි සිතට ප්‍රිය ආදසයෝ වෙත් නම්, (ඒ ආදසයෝ) පහළ වන්නාහු ය.

746. සූසැට වරක් ශක්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය. අනතුරු ව දහස්වරක් සක්විතිරජ වන්නේ ය.

747. එක්විසිවන කපෙහි සිවුමහසයුර හා සිවුමහදිවයින කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූ සතුරුරජුන් ජය ගන්නා සුළු වූ **'විමල'** නම් සක්විති රජෙක් වන්නේ ය.

748. ගඩොළුවලින් නිර්මිත කරණ ලද නගරය **රේණුවතී** නම් වේ. (එය) දිගින් තුන්සියයක් (යොදුන්) වේ. හතරැස්හැඩයෙන් යුතු ය.

749. (එහි) උතුම් වූ කුළුගෙවලින් යුත් සත්රුවනින් අලංකාර කරණ ලද විශ්වකර්මයා විසින් නිර්මිත කරණ ලද **'සුදර්ශන'** නම් ප්‍රාසාදයෙක් වන්නේ ය.

750. එය දශවිධශබ්දයෙන් වෙන් නො වූ විද්‍යාධරයන්ගෙන් ගැවසී ගත් දෙවියන්ගේ **සුදර්ශන**නගරය මෙන් වන්නේ ය.

751. එම ප්‍රාසාදයාගේ ප්‍රභාව හිරු උදා වන කල්හි විහිදේ. එය නිරතුරු ව ම හාත්පස අටයොදුනක් (තන්හි) බබළන්නේ ය.

752. කල්පලක්ෂයකින් මතුයෙහි **'ඔක්කාක'** කුලයෙහි උපදින්නා වූ නමින් **'ගෞතම'** නම් ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන සේක

753. හෙතෙම කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ, **තුෂිත**පුරයෙන් චුත ව ගෞතමයන් වහන්සේගේ ඒ ඖරසපුත්‍රයා වන්නේ ය.

754. හෙතෙම ඉදින් ගිහිගෙයි වසන්නේ නම්, සක්විතිරජ වන්නේ ය. තාදීගුණ ඇතියෙක් ගිහිගෙයි ඇලීමට පැමිණේ ය යන මේ කරුණ සිදු නො වන්නකි. (නෙවත් සිදු වීමට හෙතු නැත්තකි.)

755. සුශික්ෂිත වූ (හෙතෙම) ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ ය. නමින් ඒ තෙම **'රාහුල'** නම් වූ රහත් වන්නේ ය".

756. කිකීව අණ්ඩං රක්ඛෙය්‍ය, චමරී විය වාලධිං,
නිපකො සීලසම්පන්නො එවං රක්ඛිං[1] මහාමුනෙ.

757. තස්සා'හං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

758. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **රාහුලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රාහුලත්ථෙරස්සාපදානං ඡට්ඨං.**

## 17. උපසෙනත්ථෙරාපදානං

759. **පදුමුත්තරං** භගවන්තං ලොකජෙට්ඨං නරාසභං,
පබ්භාරම්හි නිසින්නං තං[2] උපගච්ඡිං නරුත්තමං.

760. කණිකාරං පුප්ඵිතං දිස්වා වණ්ටෙ[3] ඡෙත්වාන'හං තදා,
අලඞ්කරිත්වා ඡත්තම්හි බුද්ධස්ස අභිරොපයිං.

761. පිණ්ඩපාතඤ්ච පාදාසිං[4] පරමන්නං සුභොජනං,
බුද්ධෙන නවමෙ තත්ථ සමණෙ අට්ඨ භොජයිං.

762. අනුමොදි මහාවීරො සයම්භූ අග්ගපුග්ගලො,
ඉමිනා ඡත්තදානෙන පරමන්නපවෙච්ඡනා.

763. තෙන චිත්තප්පසාදෙන සම්පත්තිමනුභොස්සති,
ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

764. එකවීසතික්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

765. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති*.

766. සාසනෙ දිප්පමානම්හි මනුස්සත්තං ගමිස්සති,
තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො
**උපසෙනොති** නාමෙන හෙස්සති සත්ථුසාවකො†.

767. චරිමා වත්තතෙ මය්හං භවා සබ්බෙ සමූහතා;
ධාරෙමි අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහනං.

768. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපසෙනො වඞ්ගන්තපුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපසෙනවඞ්ගන්තපුත්තත්ථෙරස්සාපදානං සත්තමං.**

(තතියභාණවාරං.)

---

1. මමං රක්ඛි. PTS. සෙ. මමරක්ඛි. ථෙ.
2. නිසීදන්තං. ම. සෙ. 3. වණ්ටා PTS. වණ්ටං. සෙ. 4. පිණ්ඩපාතං උපනෙසිං. ථෙ.
*. ම සෙ. PTS. පොත්ථකෙසු ඉමිස්සා ගාථාය ඨානෙ
"යං වදන්ති සුමෙධොති භූරිපඤ්ඤං සුමෙධසං
කප්පෙ'තො සතසහස්සෙ එස බුද්ධො භවිස්සති" ඉති.
අයං ගාථා දිස්සති.
† "සමන්තපාසාදිකත්තාය අග්ගට්ඨානෙ ඨපෙස්සති" ති ගාථාබන්ධොපි ථෙරගාථට්ඨකථායං දිස්සති

756. මහාමුනි වූ ගෞතම බුදුරජානන් වහන්ස, කිරලා බිජුවට රකින්නාක් මෙන් ද, සෙමෙරමුවා වලග රකින්නාක් මෙන් ද මෙසේ සීලයෙන් යුක්ත වූ මම (මැනැවින් ශීලය) ආරක්ෂා කෙළෙමි.

757. මම ඒ බුදුරජානන් වහන්සේගේ ධර්මය දැන සසුනෙහි ඇලුනෙම් විසීමි. සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥවශයෙන් දැන හැර දමා ආශ්‍රව රහිත ව වෙසෙමි.

758. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් **'රාහුල'** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් සී.

**රාහුල** ස්ථවිරාවදානය සවැනියි.

## 17. උපසෙනස්ථවිරාවදානය

759. කඳුපාමුලක (=ශිලාපර්වතයෙක්හි විවෙකස්ථානයක) වැඩ හුන්නා වූ මනුෂ්‍යොත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ ඒ **'පදුමුත්තර'** බුදුරජානන් වහන්සේ වෙත මම එළඹියෙමි.

760. එකල්හි මම මැනැවින් පිපුනු **කිණිහිරි** මලක් දැක නටුවෙන් කඩා ගෙණ ඒ මලින් ඡත්‍රය අලඞ්කාර කොට බුදුරජානන් වහන්සේට (ඒ ඡත්‍රය) නැඟීමි.

761. සුන්දරභොජනසඞ්ඛ්‍යාත උත්තම ආහාරය වූ පිණ්ඩපාතය ද දිනිමි. එහි දී බුදුරජානන් වහන්සේ නව වැනි කොට ඇති ශ්‍රමණයන් අටනමක් වැළඳවීමි.

762-763 සියල්ල තෙමේ ම අවබොධ කළා වූ, අග්‍රපුද්ගල වූ, මහාවීර වූ (පදුමුත්තර) බුදුරජ තෙම (මෙසේ) අනුමොදනාව කෙළේ ය: "මෙ ම ඡත්‍රදානය ද උතුම් ආහාරදානය ද හේතු කොට ගෙණ (ඇති වූ) එ ම චිත්තප්‍රසාදයෙන් (මෙතෙමේ) සම්පත් අනුභව කරන්නේ ය. සතිස් වරක් ශක්‍ර ව දිව්‍යරාජ්‍ය කරන්නේ ය.

764. එක්විසිවරක් සක්විතිරජ වන්නේ ය. මහත් වූ ප්‍රදෙශරාජ්‍යය කරණ (වාරගණන) සඞ්ඛ්‍යාපථාතික්‍රාන්ත ය.

765. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන්නේ ය.

766. (උන්වහන්සේගේ) සසුන බබළන කල්හි මිනිසත්බවට පැමිණෙන්නේ ය. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූයේ ධර්මයෙන් ම නිර්මිත කළාක් වැනි වූ නමින් **'උපසෙන'** නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය"

767. (මෙය) මාගේ අන්තිමආත්මය වන්නේ ය. සියලු භවයෝ නසන ලදහ. සේනා සහිත වූ මාරයා ජය ගෙණ අන්තිම ශරීරය දරමි.

768. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් **උපසෙනවඞ්ගන්තපුත්ත** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් සි.

**උපසෙනවඞ්ගන්තපුත්ත** ස්ථවිරාවදානය සත්වැනි සි.

තෙවෙනි බණවර සි.

## 18. රට්ඨපාලත්ථෙරාපදානං

769. **පදුමුත්තරස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
වරනාගො මයා දින්නො ඊසාදන්තො උරූළ්හවා[1].

770. සෙතච්ඡත්තොපසොභිතො[2] සකප්පනො[3] සහත්ථිපො,
අග්ඝාපෙත්වාන තං සබ්බං සංඝාරාමං අකාරයිං.

771. චතුපඤ්ඤාස සහස්සානි පාසාදෙ කාරයිං අහං,
මහාභත්තං[4] කරිත්වාන නිය්‍යාදෙසිං මහෙසිනො.

772. අනුමොදි මහාවීරො සයම්භූ අග්ගපුග්ගලො,
සබ්බෙ ජනෙ හාසයන්තො දෙසෙසි අමතං පදං.

773. තං මෙ බුද්ධො වියාකාසි ජලජුත්තරනාමකො[5],
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

774. චතුපඤ්ඤාස සහස්සානි පාසාදෙ කාරයී අයං,
කථයිස්සාමි විපාකං, සුණොථ මම භාසතො.

775. අට්ඨාරස සහස්සානි කූටාගාරා භවිස්සරෙ,
ව්‍යම්හුත්තමම්හි නිබ්බත්තා සබ්බසොණ්ණමයා ච තෙ.

776. පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති
අට්ඨපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති.

777. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

778. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
අඩ්ඪෙ කුලෙ මහාභොගෙ නිබ්බත්තිස්සති තාවදෙ.

779. සො පච්ඡා පබ්බජිත්වාන සුක්කමූලෙන චොදිතො,
**රට්ඨපාලො**'ති නාමෙන හෙස්සති සත්ථුසාවකො.

780. පධානපහිතත්තො සො උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො.

781. උට්ඨාය අභිනික්ඛම්ම ජහිතා[6] භොගසම්පදා,
ඛෙළපිණ්ඩව භොගම්හි පෙමං මය්හං න විජ්ජති.

782. විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

783. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **රට්ඨපාලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රට්ඨපාලත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. උරූළ්හවො. P T S.
2. ඡත්තොපසෙවිතො. P T S. සෙ. ඡත්තො සොපධිකො. ම. ථෙ.
3. සාදබ්බිතො. ම. සීදබ්බනො. ථෙ. 4. මහොඝඤ්ඤව. ම. සෙ අ. මහඩ්ඪඝඤ්ඤව. ථෙ.
5. ජලජුත්තමනායකො P T S. 6. ජහිත්වා ම. ථෙ. සෙ

# 18. රට්ඨපාලසථවිරාවදානය

769-770. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදී ගුණ ඇති **'පදුමුත්තර'** බුදුරජානන් වහන්සේට (නගුලිස් පමණ වූ) විශාල දළ ඇති රාජාහී (=රජුනට සුදුසු) වූ (ඇත්කඳෙහි ඔසවන ලද) ශ්වෙතච්ඡත්‍රයෙන් ශොභමාන වූ හත්ථ්‍යාලඞ්කාර සහිත වූ ඇත්ගොව්වෙකු සහිත වූ උතුම් හස්තියෙක් තෙම මා විසින් දෙන ලදී. ඒ සියල්ලෙහි වටිනා කමින් (සියල්ල විකුණා) සඞ්ඝාරාමයක් ද කරවීමි.

771. මම සූපණ්ණස්දහසක් ප්‍රාසාදයන් ද කරවීමි. මහදනක් (පිළි-යෙල) කොට මහර්ෂි වූ බුදුරජානන් වහන්සේට පිළිගැන්වීමි.

772. මහාවීර වූ සියල්ල තෙමේ ම දැන වදළා වූ අග්‍රපුද්ගල වූ බුදු-රජානන් වහන්සේ සියලු ජනයන් සතුටු කරමින් අමෘතපදය (=නිර්වාණ ධර්මය) දෙසූ සේක.

773. **'පදුමුත්තර'** නම් වූ බුදුරජානන් වහන්සේ මාගේ ඒ පින්කම (ගුණ මෙසේ) පැවසූ සේක. භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් දෙශනා කළසේක:

774. "මෙතෙම සිවුපණ්ණස්දහසක් ප්‍රාසාදයන් කරවී ය. (එහි) විපාකය කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවූ.

775. (මොහුට) අටළොස්දහසක් කූටාගාරයෝ වන්නාහු ය. උතුම් විමනෙහි පහළ වූ ඒ (කූටාගාරයෝ) සර්වසවර්ණමයහ.

776. (මෙතෙම) ශක්‍රදේවෙන්ද්‍ර ව පණස්වරක් දිව්‍යරාජ්‍යය කරන්-නේ ය. අටපණස් වරක් සක්විතිරජ වන්නේ ය.

777. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුල්යෙහි උප-දින්නා වූ ගොත්‍රයෙන් **'ගෞතම'** නම් වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන්නේ ය.

778. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුත ව එකෙණෙහි ආඪ්‍ය වූ මහත් භොග ඇති කුලයක උපදින්නේ ය.

779. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ හෙතෙම පසු ව පැවිදි ව නමින් **රට්ඨපාල** ය යි ප්‍රසිද්ධශ්‍රාවකයෙක් වන්නේ ය:

780. වීර්‍ය්‍යයෙහි යොදන ලද සිත් ඇත්තේ උපශාන්ත වූ උපධිරහිත වූ හෙතෙම සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥවශයෙන් දැන දුරු කොට ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය".

781. (උත්සාහවීර්‍ය්‍යයෙන්) නැගිට අභිනිෂ්ක්‍රමණය කොට කෙළ පිඩු මෙන් භොගසම්පත් තොරෙමෝ හරණ ලද්දී ය. මාගේ (ඒ) භොග සම්පත්තියෙහි ඇලීමෙක් නැත.

782. යොගක්ෂෙමසඞ්ඛ්‍යාත නිර්වාණයට පමුණුවන ධුරවාහකයා (=ගැල්-බර උසුලනගවයා) මාගේ වීර්‍ය්‍යය යි. (මම) මේ සර්වඥශාසනයෙහි අන්තිම ශරීරය දරමි.

783. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **රට්ඨපාලසථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදළ සේක් යී.

**රට්ඨපාල සථවිරාවදානය අටවැනි යි.**

# 19. සොපාකත්ථෙරාපදානං.

784. පබ්භාරං සෙවයන්තස්ස[1] විපිනෙ[2] පබ්බතුත්තමෙ,
**සිද්ධත්ථො** නාම භගවා ආගච්ඡි මම සන්තිකං.

785. බුද්ධං උපාගතං දිස්වා ලොකජෙට්ඨස්ස තාදිනො,
සන්ථරං සන්ථරිත්වාන[3] පුප්ඵාසනමදාස'හං.

786. පුප්ඵාසනෙ නිසීදිත්වා සිද්ධත්ථො ලොකනායකො,
මමඤ්ච ගතිමඤ්ඤාය අනිච්චතමුදාහරි:

787. "අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො."

788. ඉදං වත්වාන සබ්බඤ්ඤූ ලොකජෙට්ඨො නරාසභො,
නභං අබ්භුග්ගමී වීරො හංසරාජාව අම්බරෙ.

789. සකං දිට්ඨිං ජහිත්වාන භාවයා'නිච්චසඤ්ඤ'හං,
එකාහං භාවයිත්වාන තත්ථ කාලකතො අහං.

790. ද්වෙ සම්පත්ති අනුභොත්වා සුක්කමූලෙන චොදිතො,
පච්ඡිමභවෙ සම්පත්තෙ සපාකයොනු'පාගමිං[4].

791. අගාරා අභිනික්ඛම්ම පබ්බජිං අනගාරියං,
ජාතියා සත්තවස්සො'හං අරහත්තමපාපුණිං.

792. ආරද්ධවිරියො පහිතත්තො සීලෙසු සුසමාහිතො,
තොසෙත්වාන මහානාගං අලත්ථං උපසම්පදං.

793. චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සි'දං ඵලං.

794. චතුනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤං භාවයිං තදා,
තං සඤ්ඤං භාවයන්තස්ස පත්තො මෙ ආසවක්ඛයො.

795. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සොපාකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සොපාකත්ථෙරස්සාපදානං නවමං.**

# 20. සුමඞ්ගලත්ථෙරාපදානං.*

796. ආහුතිං යිට්ඨුකාමො'හං පටියාදෙත්වාන භොජනං,
බ්‍රාහ්මණෙ පතිමානෙන්තො විසාලෙ මාළකෙ ඨිතො.

797. අථ'ද්දසාසිං සම්බුද්ධං **පියදස්සිං** මහායසං,
සබ්බලොකවිනෙතාරං සයම්භුං අග්ගපුග්ගලං.

798. භගවන්තං ජුතිමන්තං සාවකෙහි පුරක්ඛතං,
ආදිච්චමිව රොචන්තං රථියං පටිපන්නකං[5].

---

1. සොධයන්තස්ස, P T S. සොභයන්තස්ස, සෙ.
2. පපරෙ, P T S. පවනෙ, සෙ. පවරෙ, ථෙ. 3. පඤ්ඤපෙත්වාන, සෙ. ථෙ.
4. සොපාකා, ථෙ. 5. පටිසන්තකං, P T S.

* ථෙරගාථට්ඨකථායං පන විසදිසං අපදානං පඤ්ඤායති, තම්පන ද්වාදසමවග්ගෙ සුමඞ්ගලාපදානෙන සමෙති.

## 19. සවපාකස්ථවිරාවදානය.

784. වනයෙහි උතුම් පර්වතයෙක්හි ගුහාවක් පිරිසිදු කරන්නා වූ මා වෙත **සිද්ධාර්ථ** නම් භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක.

785. මම එළඹ සිටියා වූ බුදුරජානන් වහන්සේ දක තාදිගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ ශාස්තෲන් වහන්සේට ඇතිරියක් අතුරා පුෂ්පාසනයක් (=මලසුනක්) දිනිමි.

786. **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ පුෂ්පාසනයෙහි වැඩහිඳ මාගේ මතු උත්පත්තිස්ථානය ද දැන අනිත්‍යභාවය වදාළ සේක.

787. "ඒකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යයහ. ඉපදීම හා විනාශය ස්වභාවය කොට ඇත්තාහ. ඉපදී නැති වෙත්. ඔවුන්ගේ සන්සිඳීම සැප සි.

788. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ මෙය වදරා අහසෙහි (යන) හංසරාජයකු මෙන් අහසට පැනනැංගේ ය.

789. මම ස්වකීය ලබ්ධිය හැර අනිත්‍යසංඥව වැඩීමි. එක්දිනක් භාවනා කොට මම එයින් චුත වීමි.

790. කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙමි (දිව්‍ය මනුෂ්‍ය සඞ්ඛ්‍යාත) ද්විවිධසම්පත් අනුභව කොට අන්තිමභවය පැමිණි කල්හි (ස්වකීය පාකය වූ බත අනුන් අනුභව නො කරණ බැවින්) **'සපාක'** නම් සැඩොල් කුලයට උත්පත්තිවශයෙන් එළඹුනෙමි.

791. අගාර සඞ්ඛ්‍යාත ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය සංඛ්‍යාත ශාසන-යෙහි පැවිදි වීමි. උත්පත්තියෙන් සත්හැවිරිදි වයස් වූ මම රහත් බවට පැමිණියෙමි.

792. ඇරඹූ වීර්‍ය්‍යය ඇත්තෙමි (නිවණ කෙරෙහි) මෙහෙයන ලද සිත් ඇත්තෙමි ශීලයන්හි මැනැවින් හික්මුනෙමි බුදුරජානන් වහන්සේ සතුටු කොට උපසම්පදාව ලැබීමි.

793. මෙයින් සිවුඅනූවන කපෙහි (වූ) එම කාලයෙහි යම් කර්මයක් කෙළෙම් ද, (එයින්) දුගතියක් නො දනිමි. මෙය පුෂ්පදානයාගේ විපාකය යි.

794. මෙයින් සිවුඅනූවන කපෙහි (වූ) එම කාලයෙහි යම් අනිත්‍ය සංඥවක් වැඩූයෙම් නම් එම, සංඥව වඩන්නා වූ මාහට ආශ්‍රවක්ෂය ය පැමිණියේ ය.

795. ප්‍රතිසම්භිදාවෝ –පෙ– බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් අයුෂ්මත් **'සොපාක'** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් දෙශනා කළ සේක් යී.

**සවපාක ස්ථවිරා'වදානය නවවැනි යී.**

## 20. සුමඞ්ගලස්ථවිරාවදානය.

796. යාගයක් කරණු කැමැති (දනයක් දෙනු කැමැති) මම බොජුන් පිළියෙළ කරවා (ප්‍රතිග්‍රාහක වූ ශුද්ධ පැවිදි) බමුණන් සොයමින් විශාල මාළකයෙහි සිටියෙමි.

797-798. ඉක්බිති මහත් යසස් ඇති, සියලු ලොකයා (නිවණට) පමුණුවන්නා වූ, තමා ම සියල්ල අවබොධ කළා වූ, අග්‍රපුද්ගල වූ, ප්‍රඥාසම්පන්න වූ, ශ්‍රාවකයන් විසින් පිරිවරණ ලද, සූර්‍ය්‍යයා මෙන් බබලන, වීථියට පිළිපන් **පියදස්සි** බුදුරජානන් වහන්සේ දුටුවෙමි.

799. අඤ්ජලිම්පග්ගහෙත්වාන සකං චිත්තං පසාදයිං,
මනසා 'ව නිමන්තෙසිං ආගච්ඡතු මහාමුනීති.

800. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
ඛීණාසවසහස්සෙහි මම ද්වාරං උපාගමි.

801. "නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
පාසාදං අභිරූහිත්වා සීහාසනෙ නිසීද ත්වං".

802. දන්තො දන්තපරිවාරො තිණ්ණො තාරයතං වරො,
පාසාදං අභිරූහිත්වා නිසීදි පවරාසනෙ.

803. යං මෙ අත්ථි සකෙ ගෙහෙ ආමිසං පච්චුපට්ඨිතං,
තා'හං බුද්ධස්ස පාදාසිං පසන්නො සෙහි පාණිහි.

804. පසන්නචිත්තො සුමනො වෙදජාතො කතඤ්ජලී,
බුද්ධසෙට්ඨං නමස්සාමි අහො බුද්ධස්සුළාරතා.!

805. අට්ඨන්නං පයිරූපාසතං[1] භුඤ්ජං[2] ඛීණාසවා බහු,
තුය්හෙවෙසො ආනුභාවො සරණං තං උපෙමහං.

806. **පියදස්සී** ච භගවා ලොකජෙට්ඨො නරාසභො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

807. "යො සො සංඝං අභොජෙසි උජ්ජුභූතං සමාහිතං,
තථාගතඤ්ච සම්බුද්ධං සුණාථ මම භාසතො.

808. සත්තවීසතික්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
සකකම්මාභිරද්ධො සො දෙවලොකෙ රමිස්සති.

809. දසඤ්ච'ට්ඨක්ඛත්තුං සො චක්කවත්ති භවිස්සති,
පථව්‍යා රජ්ජං පඤ්චසතං වසුධං ආවසිස්සති."

810. අරඤ්ඤං වනමොග්ගය්හ කානනං ව්‍යග්ඝසෙවිතං,
පධානං පදහිත්වාන කිලෙසා ඣාපිතා මයා.

811. අට්ඨාරසෙ කප්පසතෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භත්තදානස්සි'දං ඵලං.

812. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුමඞ්ගලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුමඞ්ගලත්ථෙරස්සාපදානං දසමං.**

උද්දානං:

සීහාසනී එකථම්භී නන්දො ච චූළපන්ථකො,
පිළින්දො[3] රාහුලො චෙව වඞ්ගන්තො රට්ඨපාලකො
සොපාකො මඞ්ගලො චෙව දසෙව දුතියෙ වග්ගෙ.
සතඤ්ච අට්ඨතිංසා ච ගාථා එත්ථ පකාසිතා.

**සීහාසනදායකවග්ගො දුතියො**

1. පයිරූපාසං, ම.   2. (එවං සබ්බත්ථ)   3. පිළින්ද, ම. පිළින්දී, සෙ

799. ඇඳිලි බැඳ සවකීය චිත්තය පැහැදවීමි. මහාමුනි වූ බුදුරජාණන් වහන්සේ (මාගේ නිවෙසට) වඩින සේක්වා යි සිතින් ම ආරාධනා කෙළෙමි.

800. ලොකයෙහි අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ මාගේ අදහස දැන රහතුන් දහසක් සමග මාගේ ගෙදෙරට එළඹි සේක.

801. "පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයානන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. ඔබ පහයට නැගී සිඟසුනෙහි වැඩ හිඳිනු මැනව"

802. දමුනු සේක් දමුනු පිරිවර ඇති (සසරින්) එතෙර වූ එතෙර කරන්නවුන් අතුරෙන් උතුම් වූ බුදුරජාණන් වහන්සේ පහයට නැගී උතුම් අසුනෙහි වැඩ හුන් සේක.

803. සවකීයගෘහයෙහි මට සම්පාදනය කරණලද යම් ආහාරයක් වී ද, පහන් සිත් ඇති මම සියතින් ම බුදුරජාණන් වහන්සේට එ ම ආහාර (දානය) දිනිමි.

804. පහන් සිත් ඇත්තෙම් සතුටු වූයේ හටගත් සොම්නස් ඇත්තෙම් කරණ ලද ඇඳිලි ඇත්තෙම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට නමස්කාර කරන්නෙමි. බුදුරජාණන් වහන්සේගේ උදාරබව ආශ්චර්‍ය්‍ය යි.

805. (එහි) වළඳන්නා වූ පයර්‍ය්‍යුපාසනය කරණ අෂ්ටආර්‍ය්‍යපුද්ගලයන් අතුරෙන් රහත්හු ම බොහෝ වූහ. මෙය ඔබ වහන්සේගේ ම අනුභාවය යි. මම (ඔබවහන්සේ) සරණ කොට යෙමි.

806. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **පියදස්සි** භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළ සේක.

807. "ඍජුප්‍රතිපන්නතාදි ගුණ යුත් සත්පුරුෂ සංඝයා ද තථාගත වූ බුදුරජාණන් වහන්සේ ද ඒ යමෙක් වැළඳවී ද, (ඔහු පිළිබඳ ව) කියන්නා වූ මාගේ වචනය අසවු.

808. හෙතෙම සත්විසිවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. පටන් ගත් සවකීය කට යුතු ඇති හෙතෙම දිව්‍යලොකයෙහි සිත් අලවා වෙසෙසි.

809. හෙතෙම අටළොස්වරක් සක්විතිරජ වන්නේ ය. පන්සිය වරක් පෘථිවියෙහි රාජ්‍යය ගෙණ පොළොවෙහි වාසය කරන්නේ ය."

810. ව්‍යාඝ්‍රයන් (ව්‍යාලමෘගයන්) විසින් සෙවුනා ලද මහාවනයට පිවිස වීර්‍ය්‍යය කොට මා විසින් කෙලෙස් දවන ලදි.

811. එක්සියඅටළොස්වන කපෙහි වූ එකල්හි යම් දානයක් දිනිම් ද, (එබැවින්) දුගතියක් නො දනිමි. ආහාරදානයාගේ මේ විපාකය යි.

812. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සුමඞ්ගලස්ථවිරයන්** වහන්සේ මෙ ම ගාථාවන් වදාළ සේක් යි.

**සුමඞ්ගලස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

සිඟසුන් ද එක්ටැම් - දුන් දෙනම හා නන්ද ද,
සුළුපතු පිළිඳි රාහුල - වංගන්ත රටපල් හා.
සෝපාක මංගල ය යි - දසසිරිතකි දෙවන වගැ,
එක්සියඅටතිසෙක් ගී - යෙන් එය මෙහි කියන ලදී.

**දෙවෙනි සිංහාසනදායකවර්ගය යි.**

# 21. සුභූතිත්ථෙරාපදානං.

813. හිමවන්තස්ස අවිදූරෙ නිසභො නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

814. කොසියො නාම නාමෙන ජටිලො උග්ගතාපනො,
එකාකියො අදුතියො වසාමි නිසභෙ තදා.

815. ඵලං මූලඤ්ච පණ්ණඤ්ච න භුඤ්ජාමි අහං තදා,
පවත්තපණ්ඩුපත්තානි[1] උපජීවාමි තාවදෙ.

816. නා'හං කොපෙමි ආජීවං චජමානොපි ජීවිතං,
ආරාධෙමි සකං චිත්තං විවජ්ජෙමි අනෙසනං.

817. රාගූපසංහිතං චිත්තං යදා උප්පජ්ජතෙ මම,
සයංව පච්චවෙක්ඛාමි එකග්ගො තං දමෙම'හං.

818. "රජ්ජසි රජනීයෙ ච දොසනීයෙ ච දුස්සසි[2],
මුය්හසෙ මොහනීයෙ ච නික්ඛමස්සු වනා තුවං.

819. විසුද්ධානං අයං වාසො නිම්මලානං තපස්සිනං,
මා ඛො විසුද්ධං දූසෙසි නික්ඛමස්සු වනා තුවං.

820. අගාරිකො භවිත්වාන සදා යුත්තං[3] ලභිස්සසි,
උභොපි මා විරාධෙසි නික්ඛමස්සු වනා තුවං.

821. ඡවාලාතං යථා කට්ඨං න ක්වචි කිච්චකාරකං,[4]
නෙව ගාමෙ අරඤ්ඤෙ වා න හි තං කට්ඨසම්මතං.

822. ඡවාලාතූපමො ත්වංසි න ගිහී නාපි සඤ්ඤතො[5],
උභතො මුත්තකො අජ්ජ නික්ඛමස්සු වනා තුවං.

823. සියා නු ඛො තව[6] එතං කො පජානාති තෙ[7] ඉදං,
සද්ධාධුරං ජහසි[8] තෙ* කොසජ්ජබහුලාය ච.

824. ජිගුච්ඡිස්සන්ති තං විඤ්ඤූ අසුචිං නාගරිකො යථා,
ආකඩ්ඪිත්වාන ඉසයො චොදයිස්සන්ති තං සදා.

825. තං විඤ්ඤූ පවදිස්සන්ති සමතික්කන්තසාසනං,
සංවාසං අලභන්තො හි කථං ජීවිස්සසි[9] තුවං.

1. පවත්තංව සුපාතාහං, ම. සෙ. පත්තා'හං, PTS. 2. දුස්සසෙ, ථෙ. ම.
3. සද පුත්තං, ම. ථෙ. 4. කාරණං, ම. ථෙ. 5. ගිහිතා නාපි සඤ්ඤතතා, P T S.
6. තුවං, ම. 7. කො පජානිඥ තෙ, P T S. සෙ.
8. පාහිසි, PTS. වහසි ම. පහාසි, ථෙ. පිඛගදූරංපහිසි, සෙ. * මෙ
9. ජීවාහිසි, සෙ. ම. ජීවිහිසි, P T S. ථෙ.

# 21. සුභූතිසථවිරාවදානය.

813. හිමවතට නුදුරෙහි **නිසභ** නම් පර්වතයකි. (එහි) මට අසපුවක් කරණලදී. පන්සලක් ද මැනැවින් නිර්මිත කරණලදී.

814. (මම එහි) උග්‍ර වූ තපස් ඇති **'කොසිය'** නම් ජටිලයෙක් (ජටාධරයෙක්) වීමි. එකල්හි මම **'නිසභ'** පර්වතයෙහි එකලා ව දෙවැන්-නෙකු නො මැති ව වසමි.

815. එකල්හි මම පල මුල් කොළ (ගස්වලින් නෙලාගෙණ) අනුභව නො කරමි. එකෙණෙහි සවයංපතිත (ඉබේ වැටුනු) පඬුවන් පත් ඇසුරු කර (අනුභව කොට) ජීවත් වෙමි.

816. මම ජීවිතය හැර දමන්නෙම් නමුදු (සම්‍යක්) ආජීවය (ඵලමුල් ආදි ආහාර සෙවීමෙන්) විකොපනය නො කරමි. සවකීය සිත (අල්පෙච්ඡ සන්තුෂ්ටතාවන්ගෙන්) පහදවමි. (වෙදකම් ආදි එක්විසි) අනෙසනයන් දුරු කරමි.

817. යම් කලෙක්හි රාගයෙන් යුත් වූ සිතක් මට උපදී නම්, (එකල්හි) තෙමේ ම ප්‍රත්‍යවෙක්‍ෂා කරමි. එකග වූ සිත් ඇති මම එම (රාග අදහස) මෙසේ අවවාද කරගණිමින් දමනය කරමි. (කෙ සේ ද? යත්:-)

818. "තෝ ඇලුම් කට යුතු දූයෙහි ඇලෙහි ද, ද්වෙෂ කට යුතු දූයෙහි ද්වෙෂ කෙරෙහි ද, මූලා විය යුතු දූයෙහි මුලාවෙහි ද, (එසේ නම්) වනයෙන් නික්ම යව.

819. මේ (අරණ්‍ය)වාසය පිරිසිදු වූ නිර්මල තපෝගුණ ඇතියනට ය. තෝ මේ පිරිසිදු (වාසය) දූෂ්‍ය (අපිරිසිදු) නො කරව. (එසේ නම්) වනයෙන් නික්ම යව.

820. ගිහි ව හැමකල්හි (ඒ තමාට) සුදුසු දෑ ලබන්නෙහි ය. තෝ (ගිහිබව හා පැවිදිබව යන) දෙක ම වරද්දා නො ගණුව, වනයෙන් නික්ම යව.

821. සොහොන්පෙනෙල්ල යම් සේ කිසි කට යුත්තකට නො යෙදේ ද, ගමෙහි හෝ අරණෙහි හෝ කාෂ්ඨ (=දර) ය යි සම්මත නො වේ ද, (එසේ ම)

822. තෝ සොහොන්පෙනෙල්ලක් වැනි වෙහි ය. ගිහියෙක් නො වෙහි. පැවිද්දෙක් ද නො වෙහි. ගිහි පැවිදි දෙපසින් ම මිදුනෝ වෙහි ය. අද ම වනයෙන් නික්ම යව.

823. තාගේ මෙබඳු ගතියක් වේ නම්, එය කවරෙක් දනී ද? තාගේ ශ්‍රද්ධාධුරය දුරු කෙරෙහි නම්, (එය) කුසීතබව වැඩි වීම පිණිස ද පවතී.

824. යම් සේ නුවර වැසියෙක් අශුචි පිළිකුල් කරන්නේ ද, එසේ නුවණැත්තෝ තට පිළිකුල් කරන්නාහු ය. ඍෂිහු තා ඇද දමා හැම කල්හි චොදනා කරන්නාහු ය.

825. නුවණැත්තෝ තා ඉක්මවූ සසුන ඇත්තෙකැයි (චොදනා වශයෙන්) කියන්නාහු ය. නුවණැත්තන්ගේ සංවාසය නො ලබන්නා වූ තෝ කෙසේ ජීවත් වන්නෙහි ද?.

826. තිධා පභින්නමාතඞ්ගං කුඤ්ජරං සට්ඨිහායනං,
බලී නාගො උපගන්ත්වා යූථා නීහරතෙ ගජං.

827 යූථා විනිස්සටො සන්තො සුඛං සාතං න වින්දති,
දුක්ඛිතො විමනො[1] හොති පජ්ඣායන්තො[2] පවෙධති[3].

828. තථෙව ජටිලා තම්පි නීහරිස්සන්ති දුම්මතිං,[4]
තෙහි ත්වං නිස්සටො සන්තො සුඛං සාතං න ලච්ඡසි.

829. දිවා වා යදි වා රත්තිං සොකසල්ලසමප්පිතො,
ඩය්හසි පරිළාහෙන ගජො යූථා’ව නිස්සටො[5].

830. ජාතරූපං යථා කූටං නෙව ඣාපෙති[6] කත්ථචි,
තථා සීලවිහීනො ත්වං න ඣාපෙස්සසි[7] කත්ථචි.

831. අගාරං වසමානොපි කථං ජීවිහිසී තුවං,
මත්තිකං පෙත්තිකං චාපි නත්ථි තෙ නිහිතං[8] ධනං.

832. සයං[9] කම්මං කරිත්වාන ගත්තෙ සෙදං පමොචයං,
එවං ජීවිහිසි ගෙහෙ සාධු තෙ තං[10] න රුච්චති.”

833. එවාහං තත්ථ වාරෙමි[11] සඞ්කිලෙසගතං මනං,
නානාධම්මකථං කත්වා පාපා චිත්තං නිවාරයිං.

834. එවං මෙ විහරන්තස්ස අප්පමාදවිහාරිනො,
තිංස වස්සසහස්සානි විපිනෙ මෙ[12] අතික්කමුං.

835. අප්පමාදරතං දිස්වා උත්තමත්ථගවෙසකං,
පදුමුත්තරසම්බුද්ධො ආගච්ඡි මම සන්තිකං.

836. තිම්බරූසකවණ්ණාභො[13] අප්පමෙය්‍යො අනූපමො,
රූපෙන’සදිසො බුද්ධො ආකාසෙ චඞ්කමී තදා.

837. සුඵුල්ලො සාලරාජා’ව විජ්ජූ’ව’බ්භඝනන්තරෙ[14],
ඤාණෙනා’සදිසො බුද්ධො ආකාසෙ චඞ්කමී තදා.

838. සීහරාජාව’සම්භීතො ගජරාජාව දප්පිතො,
ලසිතො[15] ව්‍යග්ඝරාජාව ආකාසෙ චඞ්කමී තදා.

839. සිංගීනික්ඛසුවණ්ණාභො ඛදිරඞ්ගාරසන්නිභො,
මණී යථා ජොතිරසො ආකාසෙ චඞ්කමී තදා.

840. විසුද්ධකෙලාසනිභො පුණ්ණමායෙව[16] චන්දිමා,
මජ්ඣන්තිකෙව[17] සුරියො ආකාසෙ චඞ්කමී තදා.

---

1. දුම්මනො, ථෙ. 2. උජ්ඣා, P T S. 3. පධාවති, P T S.
4. දුම්මති, P T S. සෙ. 5. යූථා විනිස්සටො, අ මු. 6. ඣායති. යායති, P T S.
7. නෙවයාසි, P T S. ඣායිස්සසි. 8. නිචිතං, ථෙ. 9. සකං, P T S. සෙ.
10. කිං, ථෙ. 11. ධාරෙමි, සෙ. 12. පවනෙව මෙ, P T S. සෙ. පවනෙව, ථෙ.
13. තිම්බරූපසක, ථෙ. 14. විජ්ජුව ගගනන්තරෙ, ථෙ.
15. දූරාසදො, ථෙ. 16. මාසෙව, P T S; සෙ. 17. කොව, P T S; සෙ.

826. බලවත් ඇත් රජෙක් තෙම එළඹ ත්‍රිමදගලිත වූ **මාතඞ්ග** හස්තිකුලයෙහි ජාත වූ උපතින් සැටවස් ඉක්ම ගිය මහඇතෙකු ඇත්රැළෙන් බැහැර කෙරෙයි නම්,

827. ඇත්රැළෙන් බැහැර වූ එම ඇතා ලොකුසුවයක් නො විඳී. දුඃඛිත ව දොම්නස් සහිත වේ. ලත වමින් වෙවුල යි.

828. එසේ ම ජටාධර තවුසෝ අඥාන වූ තා (තවුස් පිරිසෙන්) බැහැර කෙරෙත්. ඔවුන් විසින් බැහැර කරණ ලද තෝ (සිත - කය දෙකින් ම) සුවයක් නො ලබන්නෙහි ය.

829. දිවාකල්හි ද යළි රාත්‍රියෙහි ද ඇනුනු ශොක නමැති හුල් ඇත්තේ ඇත් රැළෙන් බැහැර කළ ඇතෙකු මෙන් (තෝ) පරිලාහයෙන් දැවෙහි ය.

830. යම් සේ සවර්ණය කිසි තැනෙක්හි යකුළ නො දවා ද එසේ ම සීලයෙන් තොර වූ තෝ කිසි තැනෙක්හි (කෙලෙස්) නො දවන්නෙහි ය.

831. තෝ ගිහිගෙයි වසන්නේ නමුදු කෙසේ ජීවත් වන්නෙහි ද ? තට මව සතු වූ හෝ පියා සතු වූ තැන්පත් කොට තබන ලද ධනයක් නැත.

832. සිරුරෙහි ඩහ වගුරුවමින් තෙමේ ම කර්මාන්ත කොට ගිහිගෙයි මෙසේ ජීවත් වන්නෙහි ය. තට එය රිසි නො වේ නම් මැනවි."

833. මෙසේ මම එහි දී කිලිටිබවට ගිය සිත වළක්වමි. නොයෙක් ධර්මකථා කියා පවින් සිත වැළකීමි.

834. නො පමා ව වෙසෙනසුළු වූ මෙසේ වනයෙහි වසන මට හවුරුදු තිස්දහසක් ඉක්ම ගියේ ය.

835. උත්තමාර්ථය වූ (නිවණ) සොයන අප්‍රමාදයෙහි ඇලුනු මා දැක **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ මාගේ සමීපයට එළඹි සේක.

836. තියඹරාගෙඩියක වර්ණයට බඳු පැහැ ඇති පමණ කළ නො හැකි ගුණ ඇති උපමාවිෂයාතික්‍රාන්ත වූ රූපයෙන් අසදෘශ වූ බුදුරජානන් වහන්සේ ඒකල්හි අහසෙහි සක්මන් කළ සේක.

837. මැනැවින් පිපුනු මහසල්රුකක් මෙන් ද, වැසිවලාකුළු අතුරෙහි වූ විදුලියක් මෙන් ද, නුවණින් අසදෘශ වූ බුදුරජානන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

838. අභීත වූ සිංහරාජයකු මෙන් ද, දර්පිත වූ ඇත්රජකු මෙන් ද, බැබළුනු ව්‍යාඝ්‍රරාජයකු මෙන් ද, (බුදුරජානන් වහන්සේ) එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

839. (දිව්‍යසුවර්ණයනට ද වඩා ශ්‍රෙෂ්ඨ) **සිඞ්ගී** නම් සවර්ණ නිෂ්කයක* පැහැයට බඳු පැහැ ඇති කිහිරඟුරු මෙන් (දිලිසෙන්නා) වූ **ජොතිරස** නම් මැණික මෙන් වූ බුදුරජානන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

840. නිර්මල කෛලාසය වැනි වූ පූර්ණචන්ද්‍රයා වැනි වූ මධ්‍යාහ්නයෙහි සූර්යයා වැනි වූ (බුදුරජානන් වහන්සේ) එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

---

* කලන් විස්සක හෝ විසිපහක හෝ බර ඇති රන් කාසියක් නිෂ්කය යි.

841. දිස්වා තහෙ[1] චඞ්කමන්තං එවං චින්තෙස'හං තදා,
“දෙවො නු ඛො අයං සත්තො, උදාහු මනුජො අයං?

842. න මෙ සුතො වා දිට්ඨො වා මහියා එදිසො නරො,
අපි මන්තපදං අත්ථි, අයං සත්ථා භවිස්සති.”

843. එවාහං චින්තයිත්වාන සකං චිත්තං පසාදයිං,
නානාපුප්ඵඤ්ච ගන්ධඤ්ච සන්නිපාතෙස්ව'හං[2] තදා.

844. පුප්ඵාසනං පඤ්ඤපෙත්වා සාධුචිත්තං මනොරමං,
නරසාරථිනං අග්ගං ඉදං වචනමබ්‍රවිං.

845. “ඉදං මෙ ආසනං වීර පඤ්ඤත්තං තව'නුච්ඡවිං[3],
හාසයන්තො මමං චිත්තං, නිසීද කුසුමාසනෙ.”

846. නිසීදි තත්ථ භගවා අසම්භීතොව කෙසරී,
සත්තරත්තින්දිවං බුද්ධො පවරෙ කුසුමාසනෙ.

847. නමස්සමානො අට්ඨාසිං සත්තරත්තින්දිවං අහං,
වුට්ඨහිත්වා සමාධිම්හා සත්ථා ලොකෙ අනුත්තරො.

848. මම කම්මං පකිත්තෙන්තො ඉදං වචනමබ්‍රවිං,
“භාවෙහි බුද්ධානුස්සතිං භාවනානමනුත්තරං.

849. ඉමං සතිං භාවයිත්වා පූරයිස්සසි මානසං,[4]
තිංස කප්පසහස්සානි දෙවලොකෙ රමිස්සසි.

850. අසීතික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සසි,
සහස්සක්ඛත්තුං චක්කවත්තී රාජා රට්ඨෙ භවිස්සසි.

851. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
අනුභොස්සසි තං සබ්බං බුද්ධානුස්සතියා ඵලං.

852. භවාභවෙ සංසරන්තො මහාභොගං ලභිස්සසි,
භොගෙ තෙ ඌනතා නත්ථි බුද්ධානුස්සතියා ඵලං.

853. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

854. අසීතිකොටිං ඡඩ්ඩෙත්වා දාසෙ[5] කම්මකරෙ බහූ,
ගොතමස්ස භගවතො සාසනෙ පබ්බජිස්සසි.

855. ආරාධයිත්වා සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
සුභූති නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො.

---

1. දිස්වාන තං, ම. දිස්වාවන තං තහෙ, ථෙ.
2. සන්නිපාතෙස'හං, ම. 3. නුච්ඡකං, සෙ.
4. පූරයස්සු සුමානසං, ථෙ. 5. පෙස, සෙ.

841. මම එකල්හි අහසෙහි සක්මන් කරන්නා වූ උන්වහන්සේ දැක මෙසේ සිතීමි:- 'මේ සත්ත්ව තෙමේ දෙවියෙක් ද ? නැතහොත් මෙ තෙමේ මනුෂ්‍යයෙක් ද ?

842. මා විසින් පොළොවෙහි (වසන) මෙබඳු මනුෂ්‍යයෙක් තෙම නො අසනලදී. එසේ ම නො දක්නාලදී. (පුරුෂ ලක්‍ෂණප්‍රකාශක) මන්ත්‍රපදයකුදු ඇත. මේ ශාස්තෘ තෙමේ වන්නේ ය, (කියාසි.)

843. එකල්හි මම මෙසේ සිතා සවකීය සිත පැහැදවීමි. මම නොයෙක් මල් ද සුවඳ ද රැස් කොට,

844. මල්අසුනක් පණවා යහපත් සිත් ඇති මනොඥ වූ පුරුෂයන් දමනය කරන්නවුන්ට අග්‍ර වූ බුදුරජානන් වහන්සේට මෙම වචනය කීමි.

845. 'වීරයන්වහන්ස, මා විසින් මේ අසුන ඔබවහන්සේට සුදුසු කොට පණවනලදී. මාගේ සිත සතුටු කරමින් මල්අසුනෙහි වැඩහිඳිනු මැනව, (කියාසි).

846. භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ රෑ දවල් සතක් (=සතියක්) මුළුල්ලෙහි අභීතකෙශරසිංහරාජයකු මෙන් එම මල්අසුනෙහි වැඩහුන් සේක.

847. මම ද සතියක් මුළුල්ලෙහි නමස්කාර කරමින් සිටියෙමි. ලොකයෙහි (තමන් වහන්සේට වැඩි කෙනෙකුත් නැති හෙයින්) අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ සමාධියෙන් නැගිට,

848. මාගේ කර්මය ප්‍රකාශ කරණ සේක් මෙ ම වචනය වදාළ සේක. භාවනාවන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ බුද්ධානුස්සතිභාවනාව වඩව.

849. මෙ ම බුද්ධානුස්සතිය වඩා අධ්‍යාශය සම්පූර්ණ කරන්නෙහි ය. කල්ප තිස්දහසක් මුළුල්ලෙහි දිව්‍යලොකයෙහි සිත් අලවා වාසය කරන්නෙහි ය.

850. ශක්‍රදෙවෙන්ද්‍ර ව අසූවරක් දිව්‍යරාජ්‍යය කරන්නෙහි ය. දහස් වරක් රටෙහි සක්විතිරජ වන්නෙහි ය.

851. (තමා ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය (මෙපමණ ය යි) ගණන් වශයෙන් ගිණිය නො හැකි ය. එ ම සියල්ල තෝ විඳින්නෙහි ය. (මෙය) බුද්ධානුස්මෘතියෙහි ඵලය යි.

852. කුඩු මහත් භවයෙහි හැසිරෙන්නේ මහත් වූ භොගසම්පත් ලබන්-නෙහි ය. ඔබගේ (ඒ) භොගසම්පත්තියෙහි අඩු බවක් (නම්) නැත. මේ බුද්ධානුස්මෘතියෙහි ඵලයයි.

853. කල්පලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාකවංසයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන සේක.

854. අසූකෙළක් (ධනය) ද බොහෝ දස්කම්කරුවන් ද හැරදමා ගෞතම බුදුරජානන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නෙහි ය.

855. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතමබුදුරජානන් වහන්සේ සතුටු කොට නමින් සුභූති නම් වූ බුඩශ්‍රාවකයෙක් වන්නේ ය.

856. භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා දක්ඛිණෙය්‍යගුණම්හි තං[1],
තථා'රණවිහාරෙ ච[2] ද්වීසු අග්ගෙ ඨපෙස්සති[3].

857. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තරනාමකො[4],
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජාව අම්බරෙ.

858. සාසිතො ලොකනාථෙන නමස්සිත්වා තථාගතං,
සදා භාවෙමි[5] මුදිතො බුද්ධානුස්සතිමුත්තමං.

859. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡ'හං.

860. අසීතික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති අහොස'හං.

861. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
අනුභොමි සුසම්පත්තිං බුද්ධානුස්සතියා ඵලං.

862. භවාභවෙ සංසරන්තො මහාභොගං ලභාම'හං,
භොගෙ මෙ ඌනතා නත්ථි බුද්ධානුස්සතියා ඵලං.

863. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධානුස්සතියා ඵලං.

864. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුභූතිත්ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුභූතිත්ථෙරස්සාපදානං** පඨමං.

## 22. උපවානත්ථෙරාපදානං

865. **පදුමුත්තරො** නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
ජලිත්වා අග්ගික්ඛන්ධොව සම්බුද්ධො පරිනිබ්බුතො.

866. මහාජනා සමාගම්ම පූජයිත්වා තථාගතං,
චිතං[6] කත්වාන සුකතං සරීරං අභිරොපයුං.

867. සරීරකිච්චං කත්වාන ධාතුං[7] තත්ථ සමානයුං,
සදෙවමානුසා සබ්බෙ බුද්ධථූපං අකංසු තෙ.

868. පඨමා කඤ්චනමයා දුතියා'සි මණීමයා,
තතියා රූපියමයා චතුත්ථා[8] ඵලිකාමයා.

869. තත්ථ පඤ්චමියා නෙමි[9] ලොහිතඞ්කමයා අහු,
ඡට්ඨා මසාරගල්ලස්ස සබ්බරතනමය්‍යුපරි.

1. එතදග්ගෙ ඨපෙස්සති, ථෛ. ණෙය්‍යගුණෙසි, ම.
2. විහාරෙන, ම. අරණවිහාරෙ දක්ඛිණෙය්‍යෙ, ථෛ. 3. වීසු ඨානෙසු ගොතමො, ථෛ.
4. ජලජුත්තමනායකො, P T S. සෙ. 5. භාවෙසිං. 6. චිතකං, අ මු.
7. ධාතු, P T S. 8. චතුත්ථී ම. සෙ. ථෛ.
9. පඤ්චමිකාවෙති, ම. P T S. සෙ. තත්ථ පඤ්චමිකා වෙති, ථෛ.

856. (ඒ ගෞතම බුදුරජානන් වහන්සේ) **භික්ෂුසඞ්ඝයා** මැද වැඩ හිඳ ඒ **සුභූති** තෙරුන් දක්ෂිණෙයගුණයෙහි ද එසේ ම නො ඇලී විසීමෙහි ද යන මේ කරුණු දෙකෙහි අග්‍රස්ථානයෙහි තබන සේක (කියාසි.)

857. ප්‍රාඥ වූ **දීපඞ්කර** නමැති බුදුරජානන් වහන්සේ මෙ ම වචනය වදරා අහසෙහි (යන) හංසරාජයකු මෙන් අහසට පැන නැංගේ ය.

858. ලොකනාථයන් වහන්සේ විසින් අනුශාසනා කරණ ලද මම තථාගතයන් වහන්සේට වැඳ හැම කල්හි සතුටු වූයෙම් උතුම් වූ බුද්ධානුස්මෘති භාවනාව වැඞීමි.

859. මැනැවින් කරණලද එම කර්මයන් හා චිත්තප්‍රණිධීන් ද හේතු කොට ගෙණ මම මනුෂ්‍යශරීරය හැරදමා **තව්තිසා**දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

860.. මම ශක්‍ර දෙවෙන්ද්‍ර ව අසූවරක් දිව්‍ය රාජ්‍යය කරවීමි. දහස්වරක් සක්විති රජ වීමි.

861. මහත් වූ ප්‍රදෙස රාජ්‍යය (ලැබූ වාරගණන මෙතෙකැයි) ගණිතින් ගණිය නො හැකි ය. උතුම් සම්පත් අනුභව කෙරෙමි. මේ බුද්ධානුස්මෘති භාවනාවෙහි විපාකය යි.

862. මම කුදු මහත් භවයෙහි සැරිසරන්නෙමි මහත් වූ භොගසම්පත් ලබමි. මාගේ භොගසම්පත්තියෙහි අඩුබවෙක් නම් නැත. මේ බුද්ධානුස්මෘති භාවනාවෙහි විපාකය යි.

863. මෙයින් කල්පලක්ෂයකින් පෙර වූ එ ම කාලයෙහි යම් කර්මයක් කෙලෙම් ද, (එයින්) දුගතියක් නො දනිමි. බුද්ධානුස්මෘතිභාවනාවෙහි මේ විපාකය යි.

864. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සුභූති** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළ සේක් යී.

**සුභූතිස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 22. උපවානස්ථවිරාවදානය

865. සියලු ධර්මයන්ගේ පරතෙරට ගියා වූ පස්මරුන් දිනූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ ගිනිකඳක් මෙන් බබලා පිරිනිවන් පෑ සේක.

866. මහාජනයා එක් රැස් ව තථාගතයන් වහන්සේ පුදා මැනැවින් සෑයක් කොට සර්ණදෙහය (එයට) නැගූහ.

867. එහි ශරීරය පිළිබඳ ආදාහනකෘත්‍යය කොට ධාතු ගෙණාවාහු ය. ඒ සියලු දිව්‍ය මනුෂ්‍යයෝ (එ ම ධාතු නිදන් කොට) බුද්ධස්තූපයක් කළාහු ය.

868. (එ ම ස්තූපයෙහි) පළමු නිම්වළල්ල රත්මුවා ය. දෙවැන්න මිණිමුවා ය. තෙවැන්න රිදීමුවා ය. සිව්වැන්න පළිඟුමුවා ය.

869. එසේ ම පස්වැනි නිම්වළල්ල පියුම්රාමිණිමුවා ය. සවැන්න මැසිරිගල්මුවා ය. (මේ සියල්ලට) මතුයෙහි (කොටස) සර්වරත්නමය ය.

870. ජඞ්ඝා මණිමයා ආසි වෙදිකා රතනාමයා,
සබ්බසොවණ්ණයො ථූපො උද්ධං යොජනමුග්ගතො.

871. දෙවා තත්ථ සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
"මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො.

872. ධාතු ආවෙණිකා නත්ථි සරීරං එකපිණ්ඩිතං,
ඉමම්හි බුද්ධථූපම්හි කස්සාම කඤ්චුකං මයං."

873. දෙවා සත්තරතනෙහි[1] අඤ්ඤං වඩ්ඪෙසු යොජනං,
ථූපො ද්වියොජනුබ්බෙධො තිමිරං ව්‍යපහන්ති සො.

874. නාගා තත්ථ සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
"මනුස්සා චෙව දෙවා ච බුද්ධථූපං අකංසු තෙ.

875. මා නො පමත්තා අස්සුම්හා අප්පමත්තා සදෙවකා,
මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො."

876. ඉන්දනීලං මහානීලං අථො ජොතිරසං මණිං,
එකතො සන්නිපාතෙත්වා බුද්ධථූපං අඡාදයුං.

877. සබ්බං මණිමයං ආසි තාවතා බුද්ධචෙතියං,
තිංසයොජනමුබ්බෙධං[2] ආලොකකරණං තදා.

878. ගරුළා[3] ච සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
"මානුසා දෙවා නාගා ච බුද්ධථූපං අකංසු තෙ.

879. මා නො පමත්තා අස්සුම්හා අප්පමත්තා සදෙවකා,
මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො.

880. සබ්බමණිමයං ථූපෙ[4] අකරු'න්තරකඤ්චුකං[5],
යොජනං තෙපි වඩ්ඪෙසුං ආයතං බුද්ධචෙතියං.

881. චතුයොජනමුබ්බිද්ධො[6] බුද්ධථූපො විරොචති,
ඔභාසෙති දිසා සබ්බා සතරංසීව උග්ගතො.*

882. කුම්භණ්ඩා ච සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
"මනුස්සා චෙව දෙවා ච නාගා ච ගරුළා[7] තථා.

883. පච්චෙකං බුද්ධසෙට්ඨස්ස අකංසු ථූපමුත්තමං,
මා නො පමත්තා අස්සුම්හා අප්පමත්තා සදෙවකා.

884. මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො,
රතනෙහි ඡාදයිස්සාම ආයතං බුද්ධචෙතියං.

885. යොජනං තෙපි වඩ්ඪෙසුං ආයතං බුද්ධචෙතියං,
පඤ්චයොජනමුබ්බිද්ධො ථූපො ඔභාසතෙ තදා.

---

*"ගරුළා"ති ආදයො චතස්සො ගාථායො සෙ. P T S. පොත්ථකෙසු න විජ්ජන්ති.
1. සත්තහි රතනෙහි, ම. සෙ. 2. මුබ්බිධං, අ මු.. 3. කුම්භණ්ඩා, P T S. ථෙ.
4. සබ්බං මණිමයං ථූපං, ම. ථෙ. 5. අකරුං තෙ ච කඤ්චුකං, ම. සෙ. ථෙ.
6 මුබ්බෙධො, ථෙ. 7. නාගා කුම්භණ්ඩකා, ථෙ.

870. ජඝනය (=කට කොටස) මිණිමුවා ය. වෙදිකාව රුවන්මුවා ය. (මෙසේ) සෑය සර්වසවර්ණමය ය. යොදුනක් උසට පැන නැංගේ ය.

871. එකල්හි එහි දෙවියෝ එක් රැස් ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:) "තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට අපි ද සෑයක් කරමු.

872. (ඒ පදුමුත්තරබුදුරජානන් වහන්සේගේ) ධාතු වෙන් වෙන් ව නැත. මුළු සිරුර ම එකට කැටි ව තිබේ. (එබැවින්) අපි මේ සෑයෙහි ම කංචුකයක් කරන්නෙමු ය" (කියා සි).

873. දෙවියෝ (එ ම සෑය) සත්රුවනින් තවත් යොදුනක් වැඩි කළාහු ය. (ඉක්බිති) එ ම සෑය දෙයොදුනක් උස ය. (එහි ආලොකයෙන්) අඳුර ද දුරු කෙරෙයි.

874. එකල්හි නාගයෝ එහි එක් රැස්ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:) "ඒ මනුෂ්‍යයෝ ද දෙවියෝ ද බුදුරජානන් වහන්සේට සෑය කළාහු ය.

875. අපි ද පමා නො වෙමු. දෙවියන් සහිත ලෝවැස්සෝ ද පමා නො වෙති. තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට අපි ද සෑයක් කරවන්නෙමු" (කියා සි).

876. ඉඳුනිල් ද මහනිල් ද යලි ජොතිරස නම් මැණික් ද එක් රැස් කොට බුදුරජානන් වහන්සේගේ සෑය වැසූහ.

877. එකල්හි (එය) එපමණකින් සියල්ල මිණියෙන් කරණලද එළිය කරන්නා වූ තුන් යොදුන් උස බුඩස්තූපයක් වී ය.

878. එකල්හි ගුරුළෝ ද එක් රැස්ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:) ඒ මනුෂ්‍යයෝ ද දෙවියෝ ද නාගයෝ ද බුද්ධස්තූපයක් කළාහු ය.

879. අපි ද පමා නො වමු. දෙවියන් සහිත ලොවැස්සෝ පමා නො වූවෝ වෙති. තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට අපි ද සෑයක් කරන්නෙමු.

880. ගුරුළෝ ස්තූපයෙහි සර්වමණිමය පිට සැට්ටයක් (=වැස්මක්) කළාහු ය. ඔහු ද බුද්ධස්තූපයෙහි උස යොදුනකින් වැඩි කළාහු ය.

881. සිව්යොදුන් උස (මෙ ම) බුද්ධස්තූපය බබළයි. උඩට නැගුනු සූර්‍ය්‍යයා මෙන් සියලු දිශාවන් ආලොක කෙරෙයි.

882-883. එකල්හි කුම්භාණ්ඩයෝ ද (දිව්‍යවිශෙෂයකි). එහි එක් රැස්ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:-) "මනුෂ්‍යයෝ ද දෙවියෝ ද නාගයෝ ද එසේ ම ගුරුළෝ ද වෙන වෙන ම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට උතුම් සෑයක් කළාහු ය. අපි ප්‍රමත්තයෝ නො වෙමු. දෙවියන් සහිත ලෝවැස්සෝ ද පමා නො වූවෝ වෙති.

884. තාදිගුණ ඇති බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට අපි ද සෑයක් කරවන්නෙමු. උස් වූ බුද්ධස්තූපය අපි ද රත්නයන්ගෙන් වසන්නෙමු" (කියාසි.)

885. ඔහු ද බුද්ධස්තූපය යලි යොදුනක් (උස) වැඩි කළාහු ය. එකල්හි පස් යොදුන් උස සෑය බබළයි.

886. යක්ඛා තත්ථ සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
“මනුස්සා දෙවනාගා ච ගරුළා කුම්භඅණ්ඩකා.

887. පච්චෙකං බුද්ධසෙට්ඨස්ස අකංසු ථූපමුත්තමං,
මා නො පමත්තා අස්සුම්හා අප්පමත්තා සදෙවකා.

888. මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො,
ඵලිකාහි[1] ඡාදයිස්සාම ආයතං බුද්ධචෙතියං.

889. යොජනං තෙපි වඩ්ඪෙසුං ආයතං බුද්ධචෙතියං,
ඡ යොජනානි උබ්බිද්ධො ථූපො ඔභාසතෙ තදා.

890. ගන්ධබ්බා ච සමාගන්ත්වා එකතො මන්තයුං තදා,
“මනුජා දෙවතා නාගා කුම්භණ්ඩා ගුරුළා තථා[2].

891. සබ්බෙ’කංසු[3] බුද්ධථූපං මයමෙත්ථ අකාරකා,
මයම්පි ථූපං කස්සාම ලොකනාථස්ස තාදිනො.

892. වෙදියො සත්ත කත්වාන ඡත්තමාරොපයිංසු තෙ[4],
සබ්බසොණ්ණමයං[5] ථූපං ගන්ධබ්බා කාරයුං තදා*.

893. සත්තයොජනමුබ්බිද්ධො ථූපො ඔභාසතෙ තදා,
රත්තින්දිවා න ඤායන්ති ආලොකො හොති[6] සබ්බදා.

894. අභිභොන්ති න තස්සා’භා චන්දසූරා සතාරකා,
සමන්තා යොජනසතෙ පදීපොපි න පජ්ජලි.

895. තෙන කාලෙන යෙ කෙචි ථූපං පූජෙන්ති මානුසා,
න තෙ ථූපමාරුහන්ති අම්බරෙ උක්ඛිපන්ති තෙ.

896. දෙවෙහි ඨපිතො යක්ඛො **අභිසම්මත**නාමකො,
ධජං වා පුප්ඵදාමං වා අභිරොපෙති උත්තරි.

897. න තෙ පස්සන්ති තං යක්ඛං දාමං පස්සන්ති ගච්ඡතො,
එවං පස්සිත්වා ගච්ඡන්තා[7] සබ්බෙ ගච්ඡන්ති සුග්ගතිං.

898. විසද්ධා[8] යෙ පාවචනෙ පසන්නා යෙ ච සාසනෙ,
පාටිහීරං දට්ඨුකාමා ථූපං පූජෙන්ති මානුසා.

899. නගරෙ හංසවතියා අහොසිං භතකො[9] තදා,
ආමොදිතං ජනං දිස්වා එවං චින්තෙස’හං තදා.

900. “උළාරො භගවා හෙ’සො[10] යස්ස ධාතුඝරෙ’දිසං,
ඉමා ච ජනතා තුට්ඨා කාරං කුබ්බන්තනප්පකං[11].

901. අහම්පි කාරං කස්සාමි ලොකනාථස්ස තාදිනො,
තස්ස ධම්මෙසු දායාදො භවිස්සාමි අනාගතෙ.

---

1. ඵලිකා, අ මු. 2. කුම්භණ්ඩා ගුය්හකා තථා, P T S. ගරුළා කුම්භයක්ඛකා, අ මු.
3. කථා, ම. P T S. 4. යාව ජඞ්ඝා අකංසු තෙ, P T S. සෙ. ධජං ඡත්තමකංසු තෙ, ථෛ.
5. සබ්බසොවණ්ණයං, P T S. 6. ආලොකා හොන්ති, ම. 7. ගච්ඡන්ති, ම.
8. විරුඪා, ම. ථෛ. 9. වරකො, ම. වඩ්ඪකො, P T S. සෙ.
10. තෙසො, ම. P T S. සෙ. ථෛ.
11. කුබ්බං න තප්පරෙ, ම. ථෛ. කුබ්බන්ති තප්පරෙ, P T S.
*කුම්භණ්ඩාදීනං පටිපාටියා විසදිසතා එකච්චෙසු දිස්සති. P T S. සෙ. ථෛ. පොත්ථකෙසු ඡයොජනුබ්බෙධතා න වුත්තා. ගරුළා ච වජ්ජිතා.

886-887. එකල්හි යක්ෂයෝ ද එහි එක් රැස්ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:) මනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, නාගයෝ ද, ගුරුළෝ ද, කුම්භාණ්ඩයෝ ද වෙනවෙන ම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට උතුම් සෑයක් කළාහු ය. අපි ප්‍රමාදී නො වෙමු. දෙවියන් සහිත ලෝවැස්සෝ ද පමා නො වූවෝ වෙති.

888. තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට අපි ද සෑයක් කරවන්නෙමු. උස් වූ බුද්ධස්තූපය පළිඟුයෙන් වසන්නෙමු" (කියායි).

889. ඔහු ද උස් වූ බුද්ධස්තූපය යොදුනක් වැඩි කළාහු ය. එකල්හි (එම) සෑය සයොදුනක් උස් වේ.

890-891. එකල්හි ගන්ධර්වයෝ ද එක් රැස්ව මන්ත්‍රණය කළාහු ය. (කෙසේ ද ? යත්:) "මනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, නාගයෝ ද, ගුරුළෝ ද, කුම්භාණ්ඩයෝ ද, යක්ෂයෝ ද යන සියල්ලෝ බුද්ධස්තූපය කළාහු ය. මෙහි අපි (කිසිවක්) නො කළමෝ වෙමු. තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට අපි ද සෑය කරවන්නෙමු (කියාහි).

892. ඔවුහු (එහි) වෙදිකා සතක් කොට ඡත්‍රයක් ද නැගූහ. එකල්හි ගන්ධර්වයෝ සෑය සර්වස්වර්ණමය කරවූහ.

893. එකල්හි සත්යොදුන් උස සෑය බබලයි. රුදුවල්හු නො දනෙත්. හැමකල්හි ආලෝකය වේ.

894. තාරකා සහිත වූ චන්ද්‍රසූර්‍ය්‍යයෝ එ ම චෛත්‍යයාගේ ප්‍රභාව නො මඩිත්. හාත්පස යොදුන් සියයක් තන්හි පහනකුදු නො දැල්වූනේ ය.

895. එකල්හි යම්කිසි මනුෂ්‍යකෙනෙක් සෑයට (කිසිවක්) පූජා කෙරෙත් නම්, ඔහු සෑයට නො නගිත්. ඔහු අහසෙහි උඩ දමත්.

896. දෙවියන් විසින් තබනලද **අභිසම්මත** නම් යක්ෂයෙක් වී ය. (තෙතෙම උඩට දැමූ) ධජයක් වුවත් පුෂ්පදාමයක් (=මල්දමක්) වුවත් සෑ මුදුනෙහි නගා තබයි.

897. ඔහු එ ම යක්ෂයා නො දකිත්. එය ගෙණයන යක්ෂයාගේ මල්දම පමණක් දකිත්. මෙසේ දැක යන සියල්ලෝ සුගතියට යෙත්.

898. ත්‍රිපිටක බුද්ධවචන සඞ්ඛ්‍යාත ධර්මයෙහි සැදැහැ නැති යම් කෙනෙක් වෙත් නම්, ඔහු ද, සසුනෙහි පහන් වූ යම් කෙනෙක් වෙත් නම්, ඔහු ද, (යන සියලු) මනුෂ්‍යයෝ ප්‍රාතිහාර්‍ය්‍යය දකිනු කැමැත්තාහු ස්තූපය (මල්දම්ආදියෙන්) පුදත්.

899. එකල්හි මම **හංසවතී**නගරයෙහි බැලයෙක් වීමි. එකල්හි සතුටු වූ ජනයා දැක මම මෙසේ සිතීමි:

900. "යම් (බුදු) කෙනෙකුන්ගේ දාගෙය මෙබඳු (ගරු සත්කාර ලබා) නම් (එ ම ධාතු අයත්) ඒ භාග්‍යවත් තෙමේ උදාර කෙනෙකි. මේ ජනසමූහයා ද සතුටු වූවාහු බොහෝ වූ සත්කාර කෙරෙත්.

901. මම ද තාදිගුණ ඇති (පදුමුත්තර) ලොකනාථයන් වහන්සේගේ (චෛත්‍යයට) සත්කාරයක් කරන්නෙමි. අනාගතයෙහි උන්වහන්සේගේ ධර්මයෙහි කොටස් හිමියෙක් වන්නෙමි".

902. සුධොතං රජකෙනා'හං උත්තරෙය්‍යපටං මම,
වෙළග්ගෙ ආලග්ගෙත්වාන ධජං උක්ඛිපිමම්බරෙ.

903. **අභිසම්මතකො** ගය්හ අම්බරෙ'හාසි මෙ ධජං,
වාතෙරිතං ධජං දිස්වා භීයො හාසං ජනෙස'හං.

904. තත්ථ චිත්තං පසාදෙත්වා සමණං උපසඞ්කමිං,
තං භික්ඛුං අභිවාදෙත්වා විපාකං පුච්ඡ'හං ධජෙ.

905. සො මෙ කථෙසි ආනන්දපීතිසඤ්ජනනං මම,
"තස්ස ධජස්ස විපාකං අනුභොස්සසි සබ්බදා.

906. හත්ථී අස්සා රථා පත්තී සෙනා ච චතුරඞ්ගිනී,
පරිවාරෙස්සන්ති[1] තං නිච්චං ධජදානස්ස' දං ඵලං.

907. සට්ඨි තූරියසහස්සානි භෙරියො සමලඞ්කතා,
පරිවාරෙස්සන්ති තං නිච්චං ධජදානස්සි'දං ඵලං.

908. ඡළාසීතිසහස්සානි නාරියො සමලඞ්කතා,
විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

909. අළාරපම්හා හසුලා සුසඤ්ඤා[2] තනුමජ්ඣිමා,
පරිවාරෙස්සන්ති තං නිච්චං ධජදානස්සි'දං ඵලං.

910. තිංස කප්පසහස්සානි දෙවලොකෙ රමිස්සසි,
අසීතික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සසි.

911. සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සසි,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

912. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

913. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
පුඤ්ඤකම්මෙන සංයුත්තො බ්‍රහ්මබන්ධු භවිස්සසි.

914. අසීතිකොටිං ඡඩ්ඩෙත්වා දාසෙ කම්මකරෙ බහූ,
**ගොතමස්ස** භගවතො සාසනෙ පබ්බජිස්සසි.

915. ආරාධයිත්වා සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
**උපවානො**ති නාමෙන හෙස්සසි සත්ථු සාවකො"ති.

916. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයිං[3] මම.

917. චක්කවත්තිස්ස සන්තස්ස චතුදීපිස්සරස්ස මෙ,
තියොජනානි සාමන්තා[4] උස්සීයන්ති ධජා සදා.

918. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ධජදානස්සි'දං ඵලං.

919. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපවානො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපවානත්ථෙරස්සාපදානං දුතියං.**

---

1. පරිවාරෙන්ති, PTS. 2. සුවත්ථා, ථෙ. සුසඤ්ඤා, බහුසු.
3. කිලෙසා ඣාපිතා, ථෙ. 4. තීණි යොජනා සාමන්තා, සෙ. ථෙ

902. රජකයකු විසින් මැනවින් සෝදා පිරිසිදු කරණලද මාගේ උතුරු සළුව උණදඬුවක අග එල්වා ධජයක් කොට අහසෙහි (උඩට) ඔසොවා තැබීමි.

903. **අභිසම්මත** යක්ෂ තෙමේ මාගේ ධජය ගෙණ අහසෙහි එල්වා තැබී ය. වාතයෙන් සෙලවෙන්නා වූ ධජය දැක මම බොහෝ සතුට ඉපදවීමි.

904. එහි සිත පහදවා ශ්‍රමණයකු වෙත එළඹුනෙමි. මම ඒ භික්ෂුහු වැඳ ධජ(දාන)යෙහි විපාක විමසීමි.

905. හෙතෙමේ මාගේ මහත් ප්‍රීතිය ඇති කරණ (අනුසස්) මට මෙසේ කී ය. (කෙසේ ද ? යත්:) "හැම කල්හි එම ධජයාගේ විපාකය අනුභව කරන්නෙහි ය.

906. ඇත් අස් රිය පාබල යන සිවුරඟසේනාවෝ නිරතුරු ව ම ඔබ පිරිවරන්නාහු ය. මෙය ධජදානයාගේ විපාකය යි.

907. සැටදහසක් තූර්‍ය්‍යයෝ ද මැනැවින් අලඞ්කාර කරණලද භෙරීහු ද ඔබ නිරතුරු ව ම (වැයීමෙන්) පිරිවරන්නාහු ය. මෙය ධජදානයාගේ විපාකය යි.

908-909. සැරසුනු අසූදහසක් (පමණ) සත්‍රීහු විසිතුරු අබරණ ඇත්තාහු පැලඳි මිණිකොඩොල් ඇත්තාහු දිග ඇසිපිය ඇත්තාහු සිනා සහිත වූවාහු ඉතා මොළොක් ශරීරාවයව ඇත්තාහු සිහින් කටිප්‍රදෙශ ඇත්තාහු නිරතුරු ව ම ඔබ පිරිවරන්නාහු ය. මෙය ධජදානයාගේ විපාකය යි.

910. කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නෙහි ය. ශක්‍රදෙවෙන්ද්‍ර ව අසූවරක් දිව්‍යරාජ්‍යය කරන්නෙහි ය.

911. දහස්වරක් සක්විතිරජ වන්නෙහි ය. මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ලබන වාර ගණන මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

912. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන සේක.

913. කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුත ව පුණ්‍ය කර්‍මය හා එක් වූයේ බ්‍රාහ්මණයෙක් වන්නෙහි ය.

914. අසූකෙලක් ධනය ද බොහෝ දස්කම්කරුවන් ද හැර දමා **ගෞතම**බුදුරජානන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නෙහි ය.

915. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජානන් වහන්සේ සතුටු කොට නමින් **උපවාන** ය යි බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේ ය" යි වදාළ සේක.

916. කල්පලක්ෂයකට පෙර මා විසින් කරණලද කර්‍ම්‍ය මෙහි දී විපාක දුන්නේ ය. (දුනුදියෙන්) මැනවින් මිදීගිය හීයක වෙගය මෙන් මාගේ කෙලෙස් දැවී ය.

917. සතර මහදිවයිනට අධිපති වූ සක්විතිරජ වූ මට හැම කල්හි හාත්පස තුන් යොදුනක් ධජයෝ ඔසවනු ලබත්.

918. මෙයින් කල්ප ලක්ෂයකින් පෙර වූ එකල්හි යම් කර්‍මයක් කෙලෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දතිමි. ධජදානයාගේ මේ විපාකය යි.

919. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උපවාන**ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළ සේක් යී.

**උපවානස්ථවිරාවදානය දෙවැනි යි.**

## 23. සරණගමනියත්ථෙරාපදානං*

920. නගරෙ **චන්දවතියා**[1] මාතුපට්ඨායකො අහුං,
අන්ධා මාතා පිතා මය්හං තෙ පොසෙමි අහං තදා.

921. රහොගතො නිසීදිත්වා එවං චින්තෙස'හං තදා,
පොසෙන්තො මාතාපිතරෙ පබ්බජ්ජං න ලභාම'හං.

922. තමන්ධකාරපිහිතා[2] තිවිධග්ගීහි ඩය්හරෙ,
එතාදිසෙ භයෙ[3] ජාතෙ නත්ථි කොචි විනායකො.

923. බුද්ධො ලොකෙ සමුප්පන්නො දිප්පති ජිනසාසනං,
සක්කා උද්ධරිතුං[4] අත්තා පුඤ්ඤකම්මෙන[5] ජන්තුනා.

924. උග්ගය්හ තීණි සරණෙ පරිපුණ්ණානි ගොපයිං,
තෙන කම්මෙන සුකතෙන පටිමොක්ඛාමි[6] දුග්ගතිං.

925. **නිසභො** නාම සමණො බුද්ධස්ස අග්ගසාවකො,
තමහං උපගන්ත්වාන සරණාගමනං ගහිං.

926. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා සරණාගමනං පරිපුණ්ණං අගොපයිං.

927. චරිමෙ වත්තමානම්හි සරණං තං අනුස්සරිං,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡ'හං.

928. දෙවලොකගතො සන්තො පුඤ්ඤකම්මසමාහිතො,
යං දෙසං උපගච්ඡාමි[7] අට්ඨ හෙතූ ලභාමහං.

929. දිසාසු පූජිතො හොමි තික්ඛපඤ්ඤො භවාම'හං,
සබ්බෙ දෙවා'නුවත්තන්ති අමිතභොගං ලභාම'හං.

930. සුවණ්ණවණ්ණො සබ්බත්ථ පටිකන්තො භවාම'හං,
මිත්තානං අචලො හොමි යසො අච්චුග්ගතො[8] මම.

931. අසීතික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
දිබ්බං සුඛං අනුභවිං අච්ඡරාහි පුරක්ඛතො.

932. පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොස'හං.
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

933. පච්ඡිමභවෙ සම්පත්තෙ පුඤ්ඤකම්මසමාහිතො,
පුරෙ සාවත්ථියං ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ.

934. නගරා නික්ඛමිත්වාන දාරකෙහි පුරක්ඛතො,
හාසඛිඩ්ඩාසමඞ්ගීහං[9] සඞ්ඝාරාමං උපාගමිං.

935. තත්ථ'ද්දසාසිං සමණං විප්පමුත්තං නිරූපධිං,
සො මෙ ධම්මමදෙසෙසි සරණඤ්ච අදාසි මෙ.

---

1. බන්ධුමතියා, සෙ. අ. 2. මහන්ධකාරපිහිතා, 3. භවෙ, ම. සෙ.
4. උත්තරිතුං, සෙ. 5 පුඤ්ඤකාමෙන, සෙ. 6. පරි, P T S.
7. උපපජ්ජාමි, ම. P T S. සෙ 8. අබ්භුග්ගතො, ම 9. සහසා ඛිඩ්ඩ, සෙ. P T S.
* තිසරණගමනියත්ථෙරාපදානං, ම

# 23. සරණගමනියසථවිරාවදානය.

920. මම චන්‍ද්‍රවතී නගරයෙහි දෙමාපියනට උවටැන් කරන්නෙක් වීමි. එකල්හි මාගේ ඒ අඳදෙමාපියන් පෝෂණය කරමි.

921. එකල්හි මම රහසිගත ව හිඳ මෙසේ සිතීමි. (කෙසේ ද ?යත්:) "මම දෙමාපියන් පොෂණය කරන්නෙම් පැවිද්ද නො ලබමි.

922. මහත් වූ මොහඳුරින් වසන ලදී. (රාග ද්වෙෂ මොහ යන) ත්‍රිවිධාග්නියෙන් (සත්ත්වයෝ) දැවෙත්. මෙබඳු බිය ඇති වූ කල්හි කිසි ගලවන්නෙක් නැත.

923. බුදුරජ තෙම ලොව පහළ වී ය. සම්බුද්ධශාසනය බබලයි. පින්කම් ඇත්තහු විසින් (සවකීය) ආත්මය ගොඩ නගා තැබිය හැකි ය.

924. තුන් සරණ ඉගෙණ සම්පූර්ණ ලෙස රැකීමි. මැනැවින් කරණලද එම කර්මය හෙතු කොට ගෙණ දුගතියෙන් මිදෙමි.

925. බුදුරජානන් වහන්සේගේ අග්‍රශ්‍රාවක වූ නිසභ නම් භික්ෂුනමක් වී ය. මම උන්වහන්සේ වෙත එළඹ සරණගමනය ගතීමි. (සරණ ගත වීමි.)

926. එකල්හි හවුරුදු ලක්‍ෂයක් ආයුෂ විද්‍යමාන වේ. එපමණ කලක් සරණගමනය සම්පූර්ණ ලෙස රැකීමි.

927. අන්තිම අවසථාව පවත්නා කල්හි (මරණ සමයෙහි) එ ම සරණය සිහි කෙළෙමි. මම මැනැවින් කරණ ලද එ ම කර්මය හේතු කොට ගෙණ තව්තිසාවට ගියෙමි.

928. දෙව්ලොවට ගියෙම් පින්කමින් යුත් වූයෙම් යම් දෙසකට යෙම් නම්, අට හේතුවක් (=ආනිසංසයක්) ලබමි.

929. සියලු දිගුන්හි පුදනලදුයෙම් වෙමි. මම තියුණු නුවණැත්තෙම් වෙමි. සියලු දෙවියෝ (මා) අනුව පවතිත්. මම අපමණ වූ භොගසම්පත් ලබමි.

930. මම සවර්ණවර්ණ වූයෙම් හැම තන්හි දී ප්‍රිය වූයෙක් වෙමි. මිතුරන්ට ස්ථිර වෙමි. මාගේ යසස ඉතා උස් ව නැංගේ ය.

931. ශක්‍රදෙවෙන්ද්‍ර ව අසූවරක් දිව්‍යරාජ්‍යය කරවීමි. අප්සරාවන් විසින් පිරිවරණ ලදුයෙම් දිවසුව අනුභව කෙළෙමි.

932. මම පන්සැත්තෑවරක් සක්විති රජ වීමි. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණින් වශයෙන් කිය නො හැකි ය. (අපමණ ය.)

933. අන්තිමභවය පැමිණි කල්හි පුණ්‍යකර්මය හා එක් වූයෙම් සැවැත්නගරයෙහි අතිශයින් ආඪ්‍ය වූ මහාසාරකුලයෙහි උපන්නෙමි.

934. මම කුමරුන් විසින් පිරිවරණ ලද්දෙමි. සතුටින් හා කෙළි සෙල්ලමින් යුතු වූ මම සඞ්ඝාරාමයට එළඹියෙමි.

935. එහි දී කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ උපධි රහිත වූ භික්ෂුනමක් දුටුවෙමි. හෙතෙම මට දහම් දෙසී ය. (මට) සරණ ද දුන්නේ ය.

936. සො'හං සුත්වාන සරණං සරණං මෙ අනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

937. ජාතියා සත්තවස්සෙන අරහත්තං අපාපුණිං,
උපසම්පාදෙසි[1] සම්බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා.

938. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ සරණානි අගච්ඡි'හං,
තතො මෙ සුකතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ.

939. සුගොපිතං මෙ සරණං මානසං සුප්පණිහිතං,
අනුභොත්වා යසං සබ්බං පත්තොම්හි අචලං පදං.

940. යෙසං සොතාවධානත්ථි සුණාථ මම භාසතො,
අහං[2] වො කථයිස්සාමි සාමං දිට්ඨං පදං[3] මම.

941. "බුද්ධො ලොකෙ සමුප්පන්නො වත්තතෙ ජිනසාසනං,
අමතා වාදිතා භෙරී සොකසල්ලවිනොදනා.

942. යථා සකෙන ථාමෙන පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
අධිකාරං කරෙය්‍යාථ ඵස්සයිස්සථ[4] නිබ්බුතිං.

943. පග්ගය්හ තීණි සරණෙ පඤ්ච සීලානි ගොපිය[5],
බුද්ධෙ චිත්තං පසාදෙත්වා දුක්ඛස්සන්තං කරිස්සථ.

944. මමොපමං කරිත්වාන[6] සීලානි පරිගොපිය,
අචිරං අරහත්තං වො සබ්බෙපි පාපුණිස්සථ".

945. තෙවිජ්ජො ඉද්ධිපත්තො'ම්හි චෙතොපරියකොවිදො,
සාවකො තෙ මහාවීර චරණෙ[7] වන්දති සත්ථුනො.

946. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ සරණං බුද්ධස්ස ගච්ඡහං,
දුග්ගතිං නාභිජානාමි සරණාගමනෙ ඵලං.

947. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිසරණගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිසරණගමනියත්ථෙරස්සාපදානං[8] තතියං.**

## 24. පඤ්චසීලසමාදානියත්ථෙරාපදානං

948. නගරෙ **චන්දවතියා** භතකො ආස'හං තදා,
පරකම්මායනෙ යුත්තො පබ්බජ්ජං න ලභාම'හං.

949. තමන්ධකාරපිහිතා[9] තිවිධග්ගීහි[10] ඩය්හරෙ,
කෙන නු ඛො උපායෙන විසංයුත්තො භවෙ අහං.

950. දෙය්‍යධම්මො ච මෙ නත්ථි වරාකො භතකො[11] අහං,
යන්නූනා'හං පඤ්චසීලං රක්ඛෙය්‍යං පරිපූරයං.

---

1. උපසම්පාදයී, ම. 2. අත්ථං, සෙ. 3. දිට්ඨම්දං, PTS. දිට්ඨපදං, සෙ.
4. පස්සයිස්සථ, (සබ්බත්ථ) 5 ගොපය, සෙ PTS. 6. සම්මා ධම්මං භාවෙත්වා, ම.
7. සරණො, ම. සෙ සරණෙ, PTS. 8 සරණගමනිය, ම.
9. මහන්ධකාර පිහිතා, සෙ. 10. තිවිධග්ගි, පි PTS 11. භතකො දුක්ඛිතො, ම.

936. මම ඒ සරණ අසා (පෙර) මාගේ සරණය සිහි කෙළෙමි. ඒ අනුභවෙනි ම හිඳ රහත්බවට පැමිණියෙමි.

937. උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හි රහත්බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජානන් වහන්සේ (මාගේ) ගුණ දැන (මා) උපසම්පන්න කළ සේක.

938. මම මෙයින් අපරිමෙය කල්පයකට පෙර සරණගත වීමි. ඉක්බිති මා විසින් මැනැවින් කරණලද (ඒ මාගේ) කර්මය තෙම මෙහි දී ඵලය දැක්වී ය.

939. මා විසින් සරණය මැනැවින් රක්නාලදී. සිත මනා ව පිහිටුවන ලදී. සියලු සම්පත් අනුභව කොට නිශ්චල වූ නිර්වාණපදයට පැමිණියෙම් වෙමි.

940. යමෙකුට ඇසීමෙහි එකඟකම ඇත්තේ නම්, (ඒ තෙපි)කියන්නා වූ මාගේ වචනය අසව්. මා විසින් (භික්ෂුනමකගේ මාර්ග දෙශකත්වයෙන්) තමා විසින් දක්නා ලද ශාන්තපදය මම තොපට කියන්නෙමි. (කෙසේ ද ? යත්: )

941. "බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සේක. සර්වඥශාසනය පවතී. සෝහුල් දුරු කරන්නා වූ අමාබෙරය වයනලදී.

942. සවකීය ශක්ති පමණින් නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි කුසල් කරන්නහු නම්, නිවණ පහස්නහු ය. (=ලබන්නහු ය).

943. තිසරණ ගෙණ පන්සිල් රැක බුදුන් වහන්සේ කෙරෙහි සිත පහදවා දුක් කෙළවර කරන්නහු ය.

944. මා උපමා කොට ගෙණ සිල් රැක තෙපි සියල්ලෝ නො බෝ කලකින් ම රහත්බවට පැමිණෙන්නහු ය".

945. ත්‍රිවිද්‍යා ඇත්තෙම් පරසිත් දන්නා නුවණෙහි දක්ෂ වූයෙම් ඍද්ධියට පත් වූයෙම් ද වෙමි. මහාවීරයන් වහන්ස, ඔබ වහන්සේගේ (ඒ) ශ්‍රාවක තෙම ශාස්තෘන්වහන්සේගේ සිරිපා වඳියි.

946. මම මෙයින් අපරිමෙය කල්පයෙහි බුදුරජානන් වහන්සේ සරණ කොට ගියෙමි. දුගතියක් නො දනිමි. (මෙය) සරණගමනයෙහි ඵලය යි.

947. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිසරණගමනිය** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් සි.

**තිසරණගමනිය ස්ථවිරාවදානය තෙවැනි සි.**

## 24. පඤ්චසීල සමාදනිය ස්ථවිරාවදානය

948. එකල්හි මම **චන්ද්‍රවතී** නගරයෙහි බැළයෙක් (=බැළයට මෙහෙ කරන්නෙක්) වීමි. අනුන්ගේ කටයුතු කිරීමෙහි යෙදුනා වූ මම පැවිද්ද නො ලබමි.

949. මහත් වූ මොහාන්ධකාරයෙන් වසන ලද (සත්වයෝ) (රාග-ද්වෙෂ-මොහ-යන) ත්‍රිවිධාග්නියෙන් දැවෙත්. මම කවර නම් උපායයකින් (භව දුකින්) වෙන් වූවෙක් වන්නෙම් ද?

950. මා ලඟ දිය යුතු දෑයක් (=දෙයධර්මයක්) ද නැත. මම දුඃඛිත වූ බැළයෙක්මි. මම පඤ්චසීලය පුරිණි කරමින් රකින්නෙම් නම් ඉතා යෙහෙකි.

951. **අනොමදස්සි**[1] මුනිනො **නිසභො** නාම සාවකො,
තම'හං උපසඞ්කම්ම පඤ්චසික්ඛාපද'ග්ගහිං.

952. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා පඤ්ච සීලානි පරිපුණ්ණානි ගොපයිං.

953. මච්චුකාලම්හි[2] සම්පත්තෙ දෙවා අස්සාසයන්ති මං,
රථො සහස්සස්සයුත්තො මාරිසා'යං[3] උපට්ඨිතො.

954. වත්තන්තෙ[4] චරිමෙ චිත්තෙ මම සීලං අනුස්සරිං,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡ'හං.

955. තිංසක්ඛත්තුඤ්ච දෙවින්දො දෙවරජ්ජං අකාරයිං,
දිබ්බං සුඛං අනුභවිං අච්ඡරාහි පුරක්ඛතො.

956. පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොස'හං.
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

957. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
පුරෙ **වෙසාලියං** ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ.

958. වස්සූපනායිකෙ කාලෙ දිප්පන්තෙ ජිනසාසනෙ,
මාතා ච මෙ පිතා චෙව පඤ්චසික්ඛාපද'ග්ගහුං.

959. සහ සුතෙන'හං සීසං මම සීලං අනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

960. ජාතියා පඤ්චවස්සො'හං අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා.

961. පරිපුණ්ණානි ගොපෙත්වා පඤ්ච සික්ඛාපදාන'හං,
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ විනිපාතං න ගච්ඡ'හං.

962. ස්වාහං යසමනුභවිං තෙසං සීලාන වාහසා,
**කප්පකොටිම්පි** කිත්තෙන්තො කිත්තෙය්‍ය එකදෙසකං.

963. පඤ්ච සීලානි ගොපෙත්වා තයො හෙතූ ලභාමහං,
දීඝායුකො මහාභොගො තික්ඛපඤ්ඤො භවාම'හං.

964. පකිත්තෙන්තො[5] ච සබ්බෙසං අධිමත්තඤ්ච පොරිසං,
භවාභවෙ සංසරිත්වා එතෙ ඨානෙ ලභාමහං.

965. අපරිමෙය්‍ය සීලෙසු වත්තන්තො ජිනසාවකො[6],
භවෙසු යදි රජ්ජෙය්‍ය[7] විපාකො කීදිසො භවෙ.

1. දස්සිස්ස, ම. P T S. සෙ.
2. කාලෙ ච, ම. 3. මාරිසස්ස, ම. 4. සම්පත්තෙ, P T S.
5. සංකිත්තෙන්තො, ම. P T S. 6. වත්තන්තා ජිනසාවකා ම. 7. රජ්ජෙය්‍යුං, ම.

951. **අනවමදර්ශී** බුදුරජානන් වහන්සේගේ **නිසභ** නම් ශ්‍රාවකයෙක් වී ය. මම උන්වහන්සේ වෙත එළඹ පඤ්චශික්ෂාපද (=පන්සිල්) ගතිමි.

952. එකල්හි හවුරුදු ලක්ෂයක් ආයුෂ විද්‍යමාන වේ. එපමණ කලක් සම්පූර්ණ වූ පන්සිල් රැකීමි.

953. මැරෙණ කල පැමිණි කල්හි දෙවියෝ මා අස්වසත්. (කෙසේ ද? යත්:) "නිදුකාණෙනි, ඔබට මේ දහසක් අසුන් යෙදූ (දිව්‍ය) රථය එළඹ සිටියේ ය" (කියාසි.)

954. අන්තිම සිත (=චුතිචිත්තය) පවත්නාකල්හි මාගේ (පඤ්ච) සීලය සිහි කෙළෙමි. මැනැවින් කරණලද (ඒ කුශල)කර්මය හෙතු කොට ගෙණ මම තව්තිසාදෙව්ලොවට ගියෙමි.

955. ශක්‍රදෙවෙන්ද්‍ර ව තිස්වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. අප්සරාවන් විසින් පිරිවරණ ලදු ව දිවසුව අනුභව කෙළෙමි.

956. මම පන්සැත්තැවරක් සක්විති රජ වීමි. (ලබනලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් (මෙපමණ ය යි) කිය නො හැකිය.

957. කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙමි දෙව්ලොවින් චුත ව වෛශාලී නගරයෙහි අතිශයින් ආඪ්‍ය වූ මහාසාරකුලයෙහි උපන්නෙමි.

958. බුදුසසුන බබළද්දී වස් එළඹෙන කාලයෙහි මාගේ මවු තොමෝ ද පිය තෙමේ ද පඤ්චශික්ෂාපද (පන්සිල්) ගත්තාහු ය.

959. (එය) ඇසීම හා සමග ම වහා මාගේ ශීලය මම සිහි කෙළෙමි. එම අසුනෙහි ම හිඳ රහත්බවට පැමිණියෙමි.

960. උත්පත්තියෙන් පස්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජ තෙම (මාගේ) ගුණ දැන (මා) උපසපත් කරවී ය.

961. මම සම්පූර්ණ පන්සිල් රැක මෙයින් අපරිමෙයකල්පයෙහි (සිට) දුගතියකට නො ගියෙමි.

962. එ ම පන්සිල්හි අනුහසින් ඒ මම සම්පත් අනුභව කෙළෙමි. (ඒ සම්පත්) කල්පකොටියක් මුළුල්ලෙහි වර්ණනා කරන්නේ නමුදු ලෙශ මාත්‍රයක් ම වර්ණනා කරන්නේ ය.

963. මම පන්සිල් රැක අනුසස් තුණක් ලබමි. (කවර නම් අනුසස් තුණක් ද ? යත්-) මම දීර්ඝායු ඇත්තෙම් වෙමි. මහත් වූ භොගසම්පත් ඇත්තෙම් වෙමි. තීක්ෂණ ප්‍රඥා ඇත්තෙම් ද වෙමි.

964. සියලු දෙනාහට (තමාගේ) අධිමාත්‍ර වූ ශූර භාවය ප්‍රකාශ කරන්නාක් මෙන් කුදුමහත් භවයෙහි (සසරෙහි) හැසිර මම මෙ ම තනතුරු ලබමි.

965. අප්‍රමාණ වූ ශීලයන්හි (රැකීම් වශයෙන්) පවත්නා බුද්ධශ්‍රාවක තෙමේ ඉදින් භවයන්හි රැදෙන්නේ නම්, විපාකය කෙබඳු වන්නේ ද

966. සුචිණ්ණා මෙ පඤ්චසීලා භතකෙන විපස්සිනා,
තෙන සීලෙන'හං අජ්ජ මොචයිං[1] සබ්බබන්ධනං.

967. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ පඤ්ච සීලානි ගොපයිං,
දුග්ගතිං නාභිජානාමි පඤ්චසීලානි'දං ඵලං.

968. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චසීලසමාදානියො ථෙරො**. ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චසීලසමාදානියත්ථෙරස්සාපදානං චතුත්ථං.**

## 25. අන්නසංසාවකත්ථෙරාපදානං

969. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
කඤ්චනග්ඝියසඞ්කාසං ද්වත්තිංසවරලක්ඛණං.

970. **සිද්ධත්ථං** ලොකපජ්ජොතං අප්පමෙය්‍යං අනොපමං,
අලත්ථං පරමං පීතිං දිස්වා දන්තං ජුතින්ධරං.

971. සම්බුද්ධං අභිමන්තෙත්වා[2] භොජයිං තං මහාමුනිං,
මහාකාරුණිකො[3] නාථො[4] අනුමොදි මමං තදා.

972. තස්මිං මහාකාරුණිකෙ පරමස්සාසකාරකෙ,
බුද්ධෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොද'හං.

973: චතුන්නවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භික්ඛාදානස්සි'දං ඵලං.

974. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අන්නසංසාවකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අන්නසංසාවකත්ථෙරස්සාපදානං පඤ්චමං.**

## 26. ධූපදායකත්ථෙරාපදානං

975. **සිද්ධත්ථස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
කුටිධූපං[5] මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

976. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙසම්පි පියො හොමි ධූපදානස්සි'දං ඵලං.

1. පොඨයිං, P T S. 2. අතිනාමෙත්වා, අභිනාමෙත්වා, ම සෙ.
3. මුනි කාරුණිකො, P T S. 4 ලොකෙ, ම. 5 කුටිධූපනං, P T S. සෙ.

966. විශෙෂ දැකුම් ඇති බැලයකු වූ මා විසින් පන්සිල් මැනැවින් හැසිරෙණ (=රක්නා)ලදී. මම එ ම ශීලය හේතු කොට ගෙණ අද සියලු භව බන්ධන මිදුවෙමි.

967. මෙයින් අපරිමෙයකල්පයෙහි පන්සිල් රැක්කෙමි. (ඒ හේතු වෙන්) දුගතියක් නො දනිමි. මේ පන්සිල් (රැකීමේ) විපාකය යි.

968. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පඤ්චසීල සමාදානිය** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් යි.

**පඤ්චසීලසමාදානිය ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 25. අන්නසංසාවක ස්ථවිරාපදානය

969-970. (අවන්හල් සහිත) ඇතුළු වීථියෙහි වඩින්නා වූ සවණ්වණ් වූ රන්තොරණක් මෙන් බබලන දෙතිස් මහපුරිස්ලකුණු ඇති ලොව බබුළු වන්නා වූ අපමණ ගුණ ඇති අනුපම (උපමා රහිත) වූ දමුනා වූ දීප්තිය දරන්නා වූ **සිඛාණී** බුදුරජානන් වහන්සේ දැක අධික වූ ප්‍රීතියක් ලැබීමි.

971. මම බුදුරජානන් වහන්සේට නිමන්ත්‍රණය කොට ඒ මහාමුනීන් වහන්සේ වැළඳවීමි. එකල්හි මහාකාරුණික වූ බුදුරජානන් වහන්සේ මට අනුමෝදනා (ධර්ම දෙශනා) කළසේක.

972. (සත්ත්වයාට) උතුම් වූ අස්වැසිලි කරණ ඒ මහාකාරුණික වූ බුදු රජානන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

973. මෙයින් සිවු අනූවනකප්හි වූ එකල්හි යම් දානයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. භික්ෂාදානයාගේ මේ විපාකය යි.

974. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **'අන්නසංසාවක'** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් යි.

**අන්නසංසාවක ස්ථවිරාපදානය පස්වැනි යි.**

## 26. ධූපදායකස්ථවිරාපදානය.

975. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති **සිඛාණී** බුදුරජානන් වහන්සේට පැහැදුනු සිතින් මා විසින් කුටිධූපයක් (ගඳ කිලියට සුවඳ දුමක්) දෙනලදී.

976. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යෝනියක උපදිම් නම් සියලු දෙනාට ම ප්‍රිය වෙමි. සුගන්ධධූපදානයාගේ මේ විපාකය යි.

977. චතුනවුතෙ ඉතො කප්පෙ යං ථූපං අදදිං තදා[1],
දුග්ගතිං නාභිජානාමි ථූපදානස්සි'දං ඵලං.

978. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ථූපදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ථූපදායකත්ථෙරස්සාපදානං ඡට්ඨං.**

## 27. පුලිනපූජකත්ථෙරාපදානං

979. **විපස්සිස්ස** භගවතො බොධියා පාදපුත්තමෙ,
පුරාණපුලිනං ඡඩ්ඩෙත්වා සුද්ධං පුලිනමාකිරිං.

980. එකනවුතෙ ඉතො කප්පෙ යං පුලිනමදාස'හං,
දුග්ගතිං නාභිජානාමි පුලිනදානස්සි'දං ඵලං.

981. තිපඤ්ඤාසෙ[2] ඉතො කප්පෙ රාජා ආසිං ජනාධිභූ,
**මහාපුලින**නාමෙන[3] චක්කවත්තී මහබ්බලො.

982. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුලිනපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුලිනපූජකත්ථෙරස්සාපදානං සත්තමං.**

## 28. උත්තරියත්ථෙරාපදානං

983. **චන්දභාගා**නදීතීරෙ සුංසුමාරො අහං තදා,
සගොචරප්පසුතො'හං[4] නදීතිත්ථං අගඤ්ඡ'හං.

984. **සිද්ධත්ථො** තම්හි සමයෙ සයම්භූ අග්ගපුග්ගලො,
නදිං තරිතුකාමො සො නදීතිත්ථං උපාගමි.

985. උපාගතෙ ච[5] සම්බුද්ධෙ අහම්පි තත්ථු'පාගමිං,
උපගන්ත්වාන සම්බුද්ධං ඉමං වාචං උදීරයිං.

986. අභිරූහ මහාවීර තාරෙස්සාමි අහං තුවං,
පෙත්තිකං විසයං මය්හං අනුකම්ප මහාමුනෙ.

987. මම උග්ගජ්ජනං සුත්වා අභිරූහි මහාමුනි,
හට්ඨො හට්ඨෙන චිත්තෙන තාරෙසිං ලොකනායකං.

988. නදියා පාරිමෙ තීරෙ **සිද්ධත්ථො** ලොකනායකො,
අස්සාසෙසි මමං තත්ථ අමතං පාපුණිස්සසි.

1. යං ථූපමදාස'හං, ම. සෙ. 2. තිංසතිමෙ, ම.
3. මහාපුලිනො, P T S. සෙ 4. සභොජන, සෙ. P T S. 5. උපාගතම්හි

977. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් සුවඳදුම්දනක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සුගන්ධධූපදානයාගේ මේ විපාකය යි.

978. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ධූපදායක** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථා වන් වදාළ සේක් යි.

**ධූපදායක ස්ථවිරාවදානය සවැනි යි.**

## 27. පුලිනපූජකස්ථවිරාවදානය.

979. **විපස්සී**බුදුරජානන් වහන්සේගේ බුද්ධත්වයට උපකාර වූ උතුම් වූ දැම්මුලයෙහි පරණ වැලි අස් කොට පිරිසිදු (අළුත්) වැලි විසිරවීමි.

980. මෙයින් එක් අනූවන කපෙහි මම යම් වැලි දනක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මෙය වාලුකා(=වැලි) දානයාගේ විපාකය යි.

981. මෙයින් තෙපණස්වන කපෙහි ජනයා අධිපති වන මහත් බල ඇති **මහාපුලින** නම් වූ සක්විති රජෙක් වීමි.

982. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

**පුලිනපූජකස්ථවිරාවදානය සත්වැනි යි.**

## 28. උත්තරියස්ථවිරාවදානය.

983. මම එකල්හි **චන්ද්‍රභාගා**නදීතීරයෙහි කිඹුලෙක් වීමි. සිය ගොදුරු සෙවීමෙහි නිරත වූ මම නදීතීර්ථයකට පැමිණියෙමි.

984. එසමයෙහි තෙමේ ම සියල්ල අවබොධ කළා වූ අග්‍රපුද්ගල වූ ඒ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ ගඟ තරණය කරණු කැමැති සේක් නදී තීර්ථයට පැමිණියහ.

985. බුදුරජානන් වහන්සේ එළෙඹි කල්හි මම ද එහි ගියෙමි. එළඹ තථාගතයන් වහන්සේට මෙ ම වචනය කීමි. (කෙබඳු වචනයක් ද ? යත්:)

986. "මහාවීරයන් වහන්ස, (මා පිට) නගිනු මැනව, මම ඔබ (ගඟින්) එතෙර කරන්නෙමි. (මේ ජලය ) මාගේ පිතෘපරම්පරාවෙන් හිමි ස්ථානය යි. මහාමුනීන් වහන්ස, අනුකම්පා කරණු මැනැව.

987. මාගේ ගිගුම් හඬ (ආරාධනය) අසා බුදුරජානන් වහන්සේ (මාගේ පිටෙහි) නැගුනුසේක. සතුටු සිතින් පිණා ගියෙමි ලොකනාථයන් වහන්සේ එතෙර කොළෙමි.

988. ගඟ පරතෙරෙහි වූ **සිද්ධාර්ථ** බුදුරජ තෙමේ එහි දී "(තෝ) නිවණට පැමිණෙන්නෙහි ය" යි මා සැනසී ය.

989. තම්හා කායා චවිත්වාන දෙවලොකං අගඤ්ඡහං,
දිබ්බං සුඛං අනුභවිං අච්ඡරාහි පුරක්ඛතො.

990. සත්තක්ඛත්තුඤ්ච දෙවින්දො දෙවරජ්ජං අකාසʼහං,
තීණික්ඛත්තුං චක්කවත්තී මහියා ඉස්සරො අහුං.

991. විවෙකමනුයුත්තොʼහං නිපකො ච සුසංවුතො,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

992. චතුනවුතෙ ඉතො කප්පෙ තාරෙසිං යං නරාසභං,
දුග්ගතිං නාභිජානාමි තාරණාය[1] ඉදං ඵලං.

993. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උත්තරියො**[2] ථෙරො ඉමා ගාථායොඅභාසිත්ථාති.

**උත්තරියත්ථෙරස්සාපදානං[3] අට්ඨමං.**

## 29. එකඤ්ජලිකත්ථෙරාපදානං

994. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
**විපස්සිං** සත්ථවාහග්ගං නරවීරං විනායකං.

995. අදන්තදමකං[4] තාදිං මහාවාදිං මහාමතිං[5],
දිස්වා පසන්නො සුමනො එකඤ්ජලිමකාසʼහං.

996. එකනවුතෙ ඉතො කප්පෙ යමඤ්ජලිං කරිං[6] තදා,
දුග්ගතිං නාභිජානාමි අඤ්ජලිස්ස ඉදං ඵලං.

997. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකඤ්ජලිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකඤ්ජලිකත්ථෙරස්සාපදානං නවමං.**

## 30. ඛොමදායකත්ථෙරාපදානං

998. නගරෙ **බන්ධුමතියා** අහොසිං වාණිජො තදා,
තෙනෙʼව දාරං පොසෙමි රොපෙමි බීජසම්පදං.

999. රථියං පටිපන්නස්ස **විපස්සිස්ස** මහෙසිනො,
එකං ඛොමං මයා දින්නං කුසලත්ථාය සත්ථුනො.

---

1. තරණාය, ම. P T S. සෙ. 2. උත්තිරො, ම. උත්තීයො, P T S.
3 උත්තිර, ම. උත්තිය P T S. 4. දමනං, ම. P T S දමිතං, සෙ
5. මහාමුනිං, P T S. 6. අඤ්ජලිමකරිං, ම.

989. මම එම කයින් චුත ව දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරණ ලද්දෙම් දිව්‍යසුව අනුභව කෙළෙමි.

990. මම ශක්‍ර දෙවේන්ද්‍ර ව සත්වරක් දිව්‍යරාජ්‍යය කෙළෙමි. තෙවරක් පෘථිවීශ්වර වූ සක්විතිරජ වීමි.

991. මම විවෙකයෙහි යෙදුනෙම් ප්‍රඥ ඇත්තෙම් මැනැවින් සංවරණය වූ ඉඳුරන් ඇත්තෙම් සම්‍යක් සම්බුදු රජානන් වහන්සේගේ සසුනෙහි මේ අන්තිම ශරීරය දරමි.

992. යම්හෙයකින් මෙයින් සිවුඅනූවනකපෙහි නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ (ගඟින්) එතෙර කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. එතෙර කිරීමෙහි මේ විපාකය යි.

993. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **උත්තාරියසථවිරයන්** වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් යී.

**උත්තාරියසථවිරාවදානය අටවැනි යි.**

## 29. එකඤ්ජලිකසථවිරාවදානය.

994. 995. ඇතුළු වීථියෙහි වඩින්නා වූ (සසර කතරින් සත්ත්වයා එතෙර කරණ බැවින්) ශ්‍රෙෂ්ඨ සාර්ථවාහකයකු වූ මනුෂ්‍ය වීරයකු වූ (සත්ත්වයා නිවන්පුරයට පමුණුවන බැවින්) විනායක වූ නො දැමුනු අය දමනය කරන්නා වූ තාදිගුණ ඇති මහාවාදී වූ මහාප්‍රාඥ වූ සවර්ණවර්ණ වූ **විපස්සී** බුදුරජානන් වහන්සේ දැක මම පැහැදුනෙම් සොම්නස් සිත් ඇත්තෙම් දෑත් එක් කොට එක්වරක් ඇඳිලි කෙළෙමි.

996. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි (**විපස්සී** බුදුරජුන්හට) යම් ඇඳිලි බැඳීමක් (වැඳීමක්) කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. අඤ්ජලි කර්මයාගේ මේ විපාකය යි.

997. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **එකඤ්ජලිකසථවිරයන්** වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් යී.

**එකඤ්ජලිකසථවිරාවදානය නවවැනි යි.**

## 30. ඛොමදායකසථවිරාවදානය.

998. එකල්හි මම **බන්ධුමතීනගරයෙහි** වෙළෙඳෙක් වීමි. එම වණික් කර්මයෙන් ම භාර්‍යාව පොෂණය කරමි. (දාන සීලාදි පුණ්‍ය) බීජසම්පත් ද රොපණය කරමි.

999. වීථියට පිළිපන් ශාසනා වූ **විපස්සී** බුදුරජානන් වහන්සේට පින් පිණිස කොමුපිළියක් මා විසින් දෙන ලදී.

1000. එකනවුතෙ ඉතො කප්පෙ යං ඛොමං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි, ඛොමදානස්සිදං ඵලං.

1001. සත්තවීසෙ ඉතො කප්පෙ එකො **සින්ධවසන්දනො,**
සත්තරතනසම්පන්නො චතුදීපම්හි ඉස්සරො.

1002. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං **ආයස්මා ඛොමදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඛොමදායකත්ථෙරස්සාපදානං දසමං.**

උද්දානං:

සුභූති උපවානො ච සරණො සීලගාහකො,
අන්නසංසාවකො ධූපො පුලිනො උත්තරියෙන[1] ච.
අඤ්ජලී ඛොමදායී ච දසෙව තතියෙ ගණෙ,
පඤ්චාසීති සතං වුත්තා ගාථායො සබ්බපිණ්ඩිතා.

**සුභූතිවග්ගො තතියො.**

## චතුත්ථං භාණවාරං.

## 31. කුණ්ඩධානත්ථෙරාපදානං

1003. සත්තාහං පටිසල්ලීනං සයම්භුං අග්ගපුග්ගලං,
පසන්නචිත්තො සුමනො බුද්ධසෙට්ඨං උපට්ඨහිං.

1004. වුට්ඨිතං කාලමඤ්ඤාය පදුමුත්තරං මහාමුනිං,
මහන්තිං[2] කදලිකණ්ණිං ගහෙත්වා උපගඤ්ඡ'හං.

1005. පටිග්ගහෙත්වා[3] භගවා තං ඵලං[4] ලොකනායකො,
මම චිත්තං පසාදෙන්තො පරිභුඤ්ජි මහාමුනි.

1006. පරිභුඤ්ජිත්වාන සම්බුද්ධො සත්ථවාහො අනුත්තරො,
සකාසනෙ[5] නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

1007. "යෙ වසන්ති සමෙතාරො[6] යක්ඛා ඉමම්හි පබ්බතෙ,
අරඤ්ඤෙ භූතභව්‍යානි සුණන්තු වචනං මම.

1008. යො සො බුද්ධං උපට්ඨාසි[7] මිගරාජාව කෙසරී[8]
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1. උත්තියෙන, PTS. 2. මහන්තං, ථෙ. PTS. 3 පටිග්ගහෙසි, ම. සෙ.
4. සබ්බඤ්ඤු, ම. සෙ. 5 එකාසනෙ, සෙ.
6. යෙ ච සන්ති සමිතාරො, ම. සෙ.
7. යො මං උපට්ඨාසි පොසො, ථෙ. 8. මිගරාජාව කෙසරිං, ම.

1000. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි (මම) යම් කොමු පිළියක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කොමුපිළිදනෙහි මේ විපාකය යි.

1001. මෙයින් සත්විසිවන කපෙහි සිවුමහදිවයිනෙහි අධිපති වූ සප්ත රත්නයන්ගෙන් යුක්ත වූ **සිඛවසඥන** නම් එක් සක්විතිරජෙක් විමි.

1002. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **බොමඥයක** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළ සේක් යි.

**බොමඥයක ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

සුභූති උපවාන ද - සරණ හා සිල් ගත්තෙ ද,
අහර ද ධූම් ද දුන්නෝ - යලි උත්තරිය තෙරිඳු ද.
ඇඳිලි බැඳි කෙ මුදුන් - තෙරුන් සී වත් දසයකි,
එක්සිය අසූපස් ගය - කීන් එය මෙහි කියවින.

**සුභූති වර්ගය තෙවැනියි.**

# සතරවෙනි බණවරයි.

## 31. කුණ්ඩධානස්ථවිරාපදානය.

1003. **සතියක්** (නිරොධසමාපත්තියට සමවැදී) විවෙකයෙන් සිටි සියල්ල තමා ම අවබොධ කළාවූ අග්‍ර පුද්ගල වූ (පදුමුත්තර) බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹීමි.

1004. මම (නිරොධසමාපත්තියෙන්) නැඟී සිටි මහාමුනි වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට (දානය පිළිගැන්වීමට) සුදුසු කලැයි දන මහත් වූ කෙසෙල්කැණක් ගෙණ ආයෙමි.

1005. ලොකනායක වූ මහාමුනි වූ භාග්‍යවතුන් වහන්සේ එ ම ඵලය (කෙසෙල්කැණ) පිළිගෙණ මාගේ සිත පහදවනසේක් වැළඳූ සේක.

1006. (තමාට වැඩි කෙනෙකුන් නැති බැවින්) අනුත්තර වූ සත්ත්වයන් (සසර කතරින් එතෙර කරණ බැවින්) සාර්ථවාහකයකු වැනි වූ බුදුරජානන් වහන්සේ වළඳා සවකීය අසුනෙහි වැඩ හිඳ මෙ ම ගාථාවන් වදාළ සේක.

1007. ''මෙ ම පර්වතයෙහි රැස් වූ යම් යක්ෂ කෙනෙක් වෙසෙත් නම්, (ඔහු ද) අරණ්‍යෙහි මේ ධර්මය ඇසීමට සුදුසු අනිකුත් භූතයෝ ද මාගේ වචනය අසත්වා.

1008. ඒ යමෙක් කෙශරසිංහයකු මෙන් සම්ඥ වූ මට උවටැන් කොළේ ද, මම ඔහු (කවරෙක් දැ යි) ප්‍රකාශ කරන්නෙමි. (එය) කියන්නා වූ මාගේ වචනය අසවූ.

1009. සො'යමෙකාදසක්ඛත්තුං[1] දෙවරාජා භවිස්සති,
චතුත්තිංසක්ඛත්තුඤ්ච[2] චක්කවත්තී භවිස්සති.

1010. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

1011. අක්කොසිත්වාන සමණෙ සීලවන්තෙ අනාසවෙ,
පාපකම්මවිපාකෙන නාමධෙය්‍යං ලභිස්සති[3].

1012. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
**කුණ්ඩධානොති** නාමෙන සාවකො සො භවිස්සති.

1013. පවිවෙකමනුයුත්තො ඣායී ඣානරතො අහං,
තොසයිත්වාන සත්ථාරං විහරාමි අනාසවො.

1014. සාවකග්ගෙහි[4] පරිවුතො භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා සලාකං ගාහයී ජිනො.

1015. එකංසං චීවරං කත්වා වන්දිත්වා ලොකනායකං,
වදතං වරස්ස පුරතො පඨමං අග්ගහෙස'හං.

1016. තෙන කම්මෙන භගවා දසසහස්සීපකම්පකො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා අග්ගට්ඨානෙ ඨපෙසි මං.

1017. විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1018. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **කුණ්ඩධානො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුණ්ඩධානත්ථෙරස්සාපදානං පඨමං.**

## 32. සාගතත්ථෙරාපදානං.

1019. **සොභිතො** නාම නාමෙන අහොසිං බ්‍රාහ්මණො තදා,
පුරක්ඛතො සසිස්සෙහි ආරාමං අගමාස'හං.

1020. භගවා තම්හි සමයෙ භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
ආරාමද්වාරා නික්ඛම්ම අට්ඨාසි පුරිසුත්තමො.

1021. තමද්දසාසිං සම්බුද්ධං දන්තං දන්තපුරක්ඛතං,
සකං චිත්තං පසාදෙත්වා සන්ථවිං ලොකනායකං.

1 එකාදසඤ්චක්ඛත්තුං, සී. මු. 2 චතුවීසතික්ඛත්තුඤ්ච, ථෙ. චතුත්තිංසති. ම. සෙ
3 භවිස්සති, ම. 4 සාවකෙහි, සී. මු.

1009. ඒ මේ තැනැත්තේ එකොළොස් වරක් ශක්‍ර දෙවේන්ද්‍ර වන්නේ ය. සූතිස් වරක් සක්විති රජ වන්නේ ය.

1010. කල්පලක්ෂයකින් මතුයෙහි **ඔක්කාක** කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘ තෙමේ ලොව්පහළ වන්නේ ය.

1011. සිල්වත් රහත් භික්ෂූන්ට ආක්‍රොශ කොට එ ම පාපකර්මයාගේ විපාකයෙන් (කුණ්ඩධාන යන) නමක් ද ලබන්නේ ය.

1012. හෙතෙම ඒ (ගෞතම) බුදුරජානන් වහන්සේගේ ධර්මයට දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ නමින් **කුණ්ඩධාන** නම් ඖරස (බුද්ධ) පුත්‍ර වූ ශ්‍රාවකයෙක් වන්නේ ය'' (කියායි).

1013. මම ප්‍රකර්ෂවිවෙකයෙහි යෙදුනෙම් ධ්‍යාන කරණසුලු වූයෙම් ධ්‍යානයෙහි ඇලුනෙම් ශාස්තෘන් වහන්සේ සතුටු කොට ආශ්‍රව රහිත ව වෙසෙමි.

1014. අග්‍රශ්‍රාවකයන් විසින් පිරිවරණ ලද භික්ෂුසඞ්ඝයා විසින් පෙරටු කරණලද සර්වඥ තෙම භික්සඟන මැද හිඳ ලහ ගැන්වී ය.

1015. සිවුරු එකස් කොට ලොකනායක වූ බුදුරජානන් වහන්සේ වැඳ තථාගතයන් වහන්සේ ඉදිරියෙහි දී මම පළමු කොට ම (ලහ) ගතිමි.

1016. **ඒ කර්මය** හේතු කොට ගෙණ දසදහසක් සක්වළ කම්පනය කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා මැද හිඳ මා අග්‍රස්ථානයෙහි තැබූ සේක.

1017. නිර්වාණසඞ්ඛ්‍යාත යොගක්ෂෙමයට පමුණුවන ධුරවාහකයා (=ගැල් උසුලන ගවයා) මාගේ වීර්‍ය්‍යය යි. (මම මේ) සර්වඥ ශාසනයෙහි අන්තිමශරීරය දරමි. (=අන්තිම ආත්මයෙහි සිටිමි).

1018. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **කුණ්ඩධාන** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළ සේක් යී.

**කුණ්ඩධානස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 32. සාගතස්ථවිරාවදානය.

1019. එකල්හි මම නමින් **සොභිත** ය යි (ප්‍රකට) බමුණෙක් වීමි. ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයෙම් ආරාමයට ගියෙමි.

1020. එකල්හි පුරුෂොත්තම වූ (පදුමුත්තර) භාග්‍යවත් තෙමේ භික්ෂු සඞ්ඝයා විසින් පිරිවරණ ලදුයේ අරම් දොරටුවෙන් නික්ම සිටියේ ය.

1021. දමුනා වූ දමුනවුන් විසින් පිරිවරණ ලද්දා වූ ඒ ලොක-නායකයන් වහන්සේ දුටුවෙමි. (දැක) ස්වකීය චිත්තය පහදවා සතුටු සාමීචි කථා කෙළෙමි. (කෙසේ ද ? යත්:)

1022. "යෙ කෙචි පාදපා සබ්බෙ මහියා තෙ විරූහරෙ,
බුද්ධිමන්තො තථා සත්තා රූහන්ති ජිනසාසනෙ.

1023. සත්ථවාහො'සි සප්පඤ්ඤො මහෙසී[1] බහුකෙ ජනෙ,
විපථා උද්ධරිත්වාන පථං ආචික්ඛසෙ තුවං.

1024. දන්තො දන්තපරික්කිණ්ණො ඣායී ඣානරතෙහි ච,
ආතාපී පහිතත්තෙහි උපසන්තෙහි තාදිහි.

1025. අලඞ්කතො පරිසාහි[2] පුඤ්ඤඤාණෙහි[3] සොභසි,
පභා නිද්ධාවතෙ තුය්හං සූරියොදයනෙ[4] යථා.

1026. පසන්නචිත්තං දිස්වාන මහෙසී පදුමුත්තරො,
භික්ඛුසංඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ.

1027. යො සො හාසං ජනෙත්වාන මමං කිත්තෙසි බ්‍රාහ්මණො,
කප්පානං සතසහස්සං දෙවලොකෙ රමිස්සති.

1028. තුසිතා හි චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො සාසනෙ පබ්බජිස්සති.

1029. තෙන කම්මෙන සුකතෙන[5] අරහත්තං[6] ලභිස්සති,
**සාගතො** නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො.

1030. පබ්බජිත්වාන කායෙන පාපකම්මං විවජ්ජයිං,
වචීදුච්චරිතං හිත්වා ආජීවං පරිසොධයිං.

1031. එවං විහරමානො'හං තෙජොධාතුසු කොවිදො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1032. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සාගතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සාගතත්ථෙරස්සාපදානං දුතියං.**

## 33. මහාකච්චානත්ථෙරාපදානං.*

1033. **පදුමුත්තරනාථස්ස** පදුමං නාම චෙතියං,
සිලාසනං[7] කාරයිත්වා සුවණ්ණෙනාභිලෙපයිං.

1034. රතනාමයඡත්තඤ්ච පග්ගය්හ වාලවීජනිං,
බුද්ධස්ස අභිරොපෙසිං ලොකබන්ධුස්ස තාදිනො.

1. පනෙසි, P T S. 2. පරිසතො, P T S සෙ. 3. සහගණෙහි, PTS.
4. සූරියොබ්භඝනෙ, P T S. 5. විම්බකප්පසුතො හුත්වා, P T S.
6. තුට්ඨහට්ඨො, ම. සෙ. 7. සීහාසනං, ම. P T S.

* ථෙරගාථට්ඨකථාය විසදිසං අපදානං දිස්සතෙ. ඉමිනා නාමෙන අඤ්ඤම්පදානං චතුපඤ්ඤාසතිමෙ වග්ගෙ විජ්ජතෙ.

1022. "යම්කිසි වෘක්ෂ කෙනෙක් වෙත් නම්, ඒ සියලු වෘක්ෂයෝ පොළොවෙහි වැඩෙත්. එසේ ම බුද්ධිමත් සත්ත්වයෝ සර්වඥශාසනයෙහි වැඩෙත්.

1023. සපුඥ වූ මහර්ෂි වූ බුදුරජානන් වහන්ස, (ඔබ වහන්සේ) බොහෝ ජනයා විෂයයෙහි (සසර කතරින් සත්ත්වයා එතෙර කරණ බැවින්) සාර්ථවාහයෙක් වන සේක. ඔබ වහන්සේ නො මගින් නගා (සත්ත්වයාට) මග කියන සේක.

1024. (එසේ ම ඔබ වහන්සේ) දැමුනුසේක් දැමුනවුන් විසින් පිරිවරණ ලද සේක. ධ්‍යාන කරණ සුලු වූයේ ධ්‍යානයෙහි ඇලුනවුන් විසින් ද, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්ත වූ සේක් නිවණ කරා මෙහෙයූ සිත් ඇත්තවුන් විසින් ද උපශාන්ත වූවන් විසින් හා තාදිගුණ යුක්ත වූවන් විසින් ද (පිරිවරණ ලදහ).

1025. පිණින් හා නුවණින් යුත් පිරිස කරණ කොට ගෙණ අලඞ්කාර වූ සේක් හොබනාහ. හිරු උදා වන කල්හි මෙන් ඔබවහන්සේගේ ප්‍රභාව පැතිරේ"යි

1026. මහර්ෂි වූ පදුමුත්තර බුදුරජ තෙමේ පහන් සිත් ඇති (මං) දැක භික්සඟන මැද හිඳ මෙම ගාථාවන් වදාළ සේක. (කෙසේ ද ? යත්:)

1027. "යම් බමුණෙක් තෙමේ සතුටු සිත් උපදවා මා වණ්නා කෙළේ ද, හෙතෙමේ කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය.

1028. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ තුෂිතාදිව්‍යලොකයෙන් ච්‍යුත ව ගෞතම බුදුරජානන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේ ය.

1029. මැනැවින් කරණලද එම පුණ්‍යකර්මය කරණ කොට ගෙණ රහත්බව ලබන්නේ ය. (තමින්) සාගත නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ යි"

1030. පැවිදි ව කයින් පව්කම් දුරු කෙළෙමි. වාග්දුශ්චරිතය හැර ආජීවය පිරිසිදු කෙළෙමි.

1031. මෙසේ වසන්නා වූ මම තෙජොධාතුන්හි දක්ෂ වූයෙමි (සියලු ආශ්‍රවයන්) ප්‍රහාණපරිඥවශයෙන් දැන (දුරු කොට) ආශ්‍රව රහිත ව වෙසෙමි.

1032. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් සාගතස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් දෙශනා කළසේක් යි.

**සාගතස්ථවිරාවදානය දෙවැනි යි.**

## 33. මහාකාත්‍යායන ස්ථවිරාවදානය.

1033. **පදුමුත්තර** බුදුරජානන් වහන්සේගේ **පදුම** නම් චෛත්‍යයක් වී ය. (එහි) ගල් අසුනක් කරවා සුවර්ණලෙප කරවීමි.

1034. සුවර්ණමය වූ ඡත්‍රයක් ද වල්විදුනාවක් ද ගෙණ ලොකබන්ධු වූ තාදිගුණ ඇති බුදුරජානන් වහන්සේට නගා තැබීමි.

1035. යාවතා දෙවතා භුම්මා සබ්බෙ සන්නිපතුං තදා,
රතනාමයඡත්තානං විපාකං කථයිස්සති.

1036. තඤ්ච සබ්බං සුණිස්සාම කථයන්තස්ස සත්ථුනො,
භීය්‍යො හාසං ජනෙය්‍යාම සම්මාසම්බුද්ධසාසනෙ.

1037. හෙමාසනෙ නිසීදිත්වා සයම්භූ අග්ගපුග්ගලො,
භික්ඛුසඞ්ඝපරිබ්බූළ්හො ඉමා ගාථා අභාසථ.

1038. යෙනි'දං ආසනං දින්නං සොවණ්ණරතනාමයං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1039. තිංස කප්පානි දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
සමන්තා යොජනසතං ආභායා'භිභවිස්සති.

1040. මනුස්සලොකං ආගන්ත්වා චක්කවත්ති භවිස්සති,
**පභස්සරොති** නාමෙන උග්ගතෙජො භවිස්සති.

1041. දිවා වා යදි වා රත්තිං සතරංසීව උග්ගතො,
සමන්තා අට්ඨරතනං උජ්ජොතෙස්සති ඛත්තියො.

1042. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති

1043. තුසිතා හි චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
**කච්චානො** නාම නාමෙන බ්‍රහ්මබන්ධු භවිස්සති.

1044. සො පච්ඡා පබ්බජිත්වාන අරහා හෙස්සත'නාසවො,
ගොතමො ලොකපජ්ජොතො අග්ගට්ඨානෙ ඨපෙස්සති.

1045. සංඛිත්තපුච්ඡිතං පඤ්හං විත්ථාරෙන කථෙස්සති,
කථයන්තො ච තං පඤ්හං අජ්ඣාසං[1] පූරයිස්සති"

1046. අඩ්ඪෙ කුලෙ අභිජාතො බ්‍රාහ්මණො මන්තපාරගූ,
ඔහාය ධනධඤ්ඤානි පබ්බජිං අනගාරියං.

1047. සංඛිත්තෙනපි පුච්ඡන්තෙ විත්ථාරෙන කථෙම'හං,
අජ්ඣාසං[1] තෙසං පූරෙමි, තොසෙමි දිපදුත්තමං.

1048. තොසිතො මෙ මහාවීරො සයම්භූ අග්ගපුග්ගලො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

1049. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මහාකච්චානො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මහාකච්චානත්ථෙරස්සාපදානං තතියං.**

---

1. අජ්ඣාසයං, ම.

1035, 1036. එකල්හි භූමිය ඇතුරූ කලා වූ යම් නාක් දෙවියෝ වූ නම්, ඒ සියල්ලෝ ම රැස් වූහ. (කුමකට ද ? යත්:) "සුවර්ණමයඡත්‍රයාගේ විපාකය වදරන්නේ ය. එසේ වදරන්නා වූ බුදුරජානන් වහන්සේගේ ඒ සියලු කථාව අසන්නෙමු. සම්මාසම්බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි වැඩියක් සතුට උපදවන්නෙමු" යි යනුවට ය.

1037. සියලු දත යුතු දෑ තෙමේ ම දන්නා වූ අග්‍රපුද්ගල වූ බුදුරජානන් වහන්සේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද සේක් සුවර්ණාසනයෙහි හිඳ මෙ ම ගාථාවන් වදාළසේක.

1038. "යමකු විසින් සුවර්ණරත්නමය වූ (සත් රුවනින් කරණලද,) මෙ ම ඡත්‍රය පුදන ලද ද, ඔහු (කවරෙක් දෑ යි) මම ප්‍රකාශ කරන්නෙමි. (එය) පවසන්නා වූ මාගේ වචනය අසවු.

1039. (හෙතෙමේ) තිස් කපක් මුළුල්ලෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය. හාත්පස යොදුන් සියයක් ප්‍රභාවෙන් යටපත් කරන්නේ ය.

1040, 1041. මිනිස්ලොවට අවුත් උග්‍රතෙජස් ඇති නමින් **ප්‍රභාසඞ්කර** නම් වූ සක්විති රජෙක් වන්නේ ය. (මෙ ම) ක්ෂත්‍රිය තෙමේ උදා වූ සූර්යයා මෙන් දිවාරෑ දෙක්හි ම හාත්පස අටරියනක් (තැන්) බබුළුවන්නේ ය.

1042. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි **ඔක්කාකකුලයෙහි** උප-දින්නා වූ නමින් **ගෞතම** නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

1043. කුශලමූලයෙන් මෙහෙයන ලද්දා වූ මෙතෙමේ තුසිපුරයෙන් චුත ව නමින් **කච්චායන** නම් වූ බමුණෙක් වන්නේ ය.

1044. හෙතෙම පසු ව පැවිදි ව ආශ්‍රව රහිත වූ රහත් නමක් වන්නේ ය. ලොව බබුළුවන්නා වූ **ගෞතම** බුදුරජ තෙමේ (ඔහු) අග්‍රස්ථා-නයෙහි තබන්නේ ය. (කෙසේ ද ? යත්):

1045. මෙතෙම සැකෙවින් විචාරණලද ප්‍රශ්නය විතර විසින් කියන්නේ ය. ඒ ප්‍රශ්නය (විතර විසින්) කියන්නේ ද (අසන්නාගේ) අදහස සම්පූර්ණ කරන්නේ"යි.

1046. ආඪ්‍යකුලයෙහි උපන්නා වූ මන්ත්‍රයන්හි පරතෙරට ගියා වූ බ්‍රාහ්මණයෙක් වූ (මම) ධනධාන්‍යයන් අත හැර දමා අනගාරිකසඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි.

1047. මම සංක්ෂිප්ත ලෙස විචාරණ කල්හි දු විස්තරවශයෙන් කියමි. (විචාරන්නා වූ) ඔවුන්ගේ අදහස් සම්පූර්ණ කරමි. ද්විපදෙත්තම වූ බුදුරජානන් වහන්සේ සතුටු කරමි.

1048. මා විසින් තුටු කරණ ලද මහාවීර වූ සියල්ල තෙමේ ම දන්නා වූ අග්‍රපුද්ගල වූ (ගෞතම බුදුරජතෙම) භික්සඟන මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

1049. මෙහි මේ අයුරින් ආයුෂමත් **මහාකාත්‍යායන** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළසේක් යී.

**මහාකාත්‍යායනස්ථවිරාවදානය තෙවැනි යි.**

## 34. කාළුදායිත්ථෙරාපදානං.

1050. **පදුමුත්තරබුද්ධස්ස**[1] ලොකජෙට්ඨස්ස තාදිනො,
අද්ධානං පටිපන්නස්ස චරතො චාරිකං තදා.

1051. සුඵුල්ලං පදුමං ගය්හ උප්පලං මල්ලිකඤ්චහං,
පරමන්නං ගහෙත්වාන අදාසිං සත්ථුනො අහං.

1052. පරිභුඤ්ජි මහාවීරො පරමන්නං[2] සුභොජනං,
තඤ්ච පුප්ඵං ගහෙත්වාන ජනස්ස සම්පදස්සයි.

1053. "ඉට්ඨං කන්තං පියං ලොකෙ ජලජං පුප්ඵමුත්තමං,
සුදුක්කරං තෙන කතං යො[3] මෙ පුප්ඵං අදාසි'දං[4].

1054. යො පුප්ඵමභිරොපෙසි පරමන්නඤ්ච'දාසි මෙ,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1055. දස අට්ඨක්ඛත්තුං සො[5] දෙවරජ්ජං කරිස්සති,
උප්පලං පදුමඤ්චාපි මල්ලිකඤ්ච තදුත්තරි.

1056. අස්ස පුඤ්ඤවිපාකෙන දිබ්බගන්ධසමායුතං,
ආකාසෙ ඡදනං කත්වා ධාරයිස්සති තාවදෙ

1057. පඤ්චවීසතික්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති,
පථව්‍යා රජ්ජං පඤ්චසතං වසුධං ආවසිස්සති.

1058. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

1059. සකකම්මාභිරද්ධො සො සුක්කමූලෙන චොදිතො,
සක්‍යානං නන්දිජනනො ඤාතිබන්ධු භවිස්සති.

1060. සො පච්ඡා පබ්බජිත්වාන සුක්කමූලෙන චොදිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො.

1061. පටිසම්භිදා ච'නුප්පත්තං කතකිච්චමනාසවං,
ගොතමො ලොකබන්ධු සො එතදග්ගෙ ඨපෙස්සති.

1062. පධානපහිතත්තො සො උපසන්තො නිරූපධි,
**උදායී** නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො."

1063. රාගො දොසො ච මොහො ච[6] මානො මක්ඛො ච ධංසිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1064. තොසයිඤ්චාපි[7] සම්බුද්ධං ආතාපී නිපකො අහං,
පමොදිතො ච[8] සම්බුද්ධො එතදග්ගෙ ඨපෙසි මං.

1065. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා **කාළුදායී** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කාළුදායිත්ථෙරස්සාපදානං චතුත්ථං.**

---

1. පදුමුත්තරස්ස, P T S. ථෛ. සෙ. 2. පරිපුණ්ණං, ථෛ. 3. යං, ම.
4. අදාසි සො, සෙ. ම. 5. තං, ම.
6. චිත්තඤ්ච මෙ සුවිමුත්තං, ථෛ. P T S. 7. තොසයිත්වාපි, ථෛ.
8. පාසාදිකො ච, ථෛ

# 34. කාළුදායිස්ථවිරාවදානය

1050, 1051. මම එකල්හි ලෝකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති, මහමගට පිළිපන්, චාරිකාවෙහි හැසිරෙන්නා වූ ශාස්තෘ වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට මැනැවින් පිපුනු පියුම් ද උපුල් ද බෝලිද්ද ද කිරිබත් ද ගෙණ (එහි) ගියෙමි.

1052. මහාවීර වූ බුදුරජතෙමේ මනා භොජනය (**කිරිබත**) වැළඳී ය. ඒ මල් ද ගෙණ මහාජනයාට දැක්වී ය. (කෙසේද ? යත්:)

"1053. (මේ) ලොකයෙහි ඉෂ්ට වූ මන වඩන්නා වූ ප්‍රිය වූ උතුම් ජලජ(ජලයෙහි හටගන්නා)පුෂ්පයෝ වෙති. යමෙක් තෙමේ මට මේ මල් දුන්නේ ද, ඔහු විසින් ඉතා දුෂ්කර (පින්කමක්) කරණලදි.

1054. යමෙක් මට මල් තගා දුන්නේ ද, උතුම් වූ ආහාරය දුන්නේ ද ඔහු (කවරෙක් දැයි) මම කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු. (කෙසේ ද යත්?)

1055, 1056. හෙතෙමේ අටළොස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. එකෙණෙහි ඔහුගේ පුණ්‍යවිපාකයෙන් දිව්‍යමයසුගන්ධයෙන් යුතු උපුල් ද පියුම් ද බෝලිද්ද ද ඔහු මත අහසෙහි වියනක් කොට දරන්නේ ය.

1057. පස්විසිවරක් සක්විතිරජ වන්නේ ය. පන්සියවරක් පෘථිවී රාජ්‍යය ලබා පොළොවෙහි වෙසෙන්නේ ය.

1058. මෙයින් කල්ප ලක්ෂයකින් මතුයෙහි **ඔක්කාක**කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

1059. කුශලමූලයෙන් මෙහෙයන ලද ස්වකීය කර්මයෙන් සන්තුෂ්ට වූ හෙතෙමේ ශාක්‍යයන්ගේ සතුට ඇති කරන්නා වූ නෑ සබඳ කම් ඇත්තෙක් වන්නේ ය.

1060. කුශලමූලයෙන් මෙහෙයන ලද හෙතෙමේ පසු ව පැවිදි ව සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දැන (දුරු කොට) ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය.

1061. ලොකබන්ධු වූ ගෞතමබුදුරජානන් වහන්සේ පැමිණි (සිවු) පිළිසිඹියාවන් ඇති, කරණ ලද කටයුතු ඇති, ආශ්‍රව රහිත වූ ඔහු එතදග්‍රස්ථානයෙහි තබන සේක.

1062. වීර්යය වැඩූ, නිවණ කෙරෙහි මෙහෙයූ සිත් ඇති, උපශාන්ත වූ උපධි රහිත වූ හෙතෙමේ නමින් **උදායී** නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

1063. රාගය ද ද්වෙෂය ද මොහය ද මක්ඛය (=ගුණමකුබව) ද විනාශ කරණ ලද්දේ ය. සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දැන (දුරු කොට) ආශ්‍රව රහිත ව වෙසෙමි.

1064. කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වූ ප්‍රඥාවත් වූ මම බුදුරජානන් වහන්සේ සතුටු කෙළෙමි. ප්‍රමුදිත වූ බුදුරජ තෙමේ මා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

1065. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කාළුදායී** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් දෙශනා කළ සේක් සි.

**කාළුදායී ස්ථවිරාවදානය සිවුවැනි සි.**

# 35. මොඝරාජත්ථෙරාපදානං.

1066. **අත්ථදස්සී** තු භගවා සයම්භූ අපරාජිතො,
භික්ඛුසඞ්ඝපරිබ්බූළ්හො රථියං පටිපජ්ජථ.

1067. සිස්සෙහි සම්පරිවුතො ඝරම්හා අභිනික්ඛමිං,
නික්ඛමිත්වානහං තත්ථ අද්දසං ලොකනායකං.

1068. අභිවාදිය[1] සම්බුද්ධං සිරෙ කත්වාන අඤ්ජලිං,
සකං චිත්තං පසාදෙත්වා සන්ථවිං ලොකනායකං.

1069. "යාවතා රූපිනො සත්තා අරූපී වා අසඤ්ඤිනො,
සබ්බෙ තෙ තව ඤාණම්හි අන්තො හොන්ති සමොගධා[2].

1070. සුඛුමච්ඡිකජාලෙන උදකං යො පරික්ඛිපෙ,
යෙ කෙචි උදකෙ පාණා අන්තො ජාලෙ භවන්ති තෙ.

1071. යෙසඤ්ච චෙතනා අත්ථි රූපිනො ච අරූපිනො,
සබ්බෙ තෙ තව ඤාණම්හි අන්තො හොන්ති සමොගධා.

1072. සමුද්ධරසි'මං ලොකං අන්ධකාරසමාකුලං,
තව ධම්මං සුණිත්වාන කඞ්ඛාසොතං තරන්ති තෙ.

1073. අවිජ්ජානිවුතො ලොකො අන්ධකාරෙන ඔත්ථටො,
තව ඤාණම්හි ජොතන්තෙ අන්ධකාරා පධංසිතා.

1074. තුවං චක්ඛූ'සි සබ්බෙසං මහාතමපනූදනො,
තව ධම්මං සුණිත්වාන නිබ්බායති බහුජ්ජනො."

1075. පිඨරං[3] පූරයිත්වාන මධුඛුද්දං[4] අනෙළකං,
උභොහත්ථෙහි පග්ගය්හ උපනෙසිං මහෙසිනො.

1076. පටිග්ගණ්හි මහාවීරො සහත්ථෙන[5] මහාඉසි,
භුඤ්ජිත්වා තඤ්ච සබ්බඤ්ඤූ වෙහාසං නභමුග්ගමි.

1077. අන්තලික්ඛෙ ඨිතො සත්ථා **අත්ථදස්සී** නරාසභො
මම චිත්තං පසාදෙන්තො ඉමා ගාථා අභාසථ.

1078. "යෙනි'දං ථවිතං ඤාණං බුද්ධසෙට්ඨො ච ථොමිතො,
තෙන චිත්තප්පසාදෙන දුග්ගතිං සො න ගච්ඡති.

1079. චතුද්දසක්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
පථව්‍යා රජ්ජං[6] අට්ඨසතං[7] වසුධං ආවසිස්සති.

---

1. අභිවාදෙත්වාන, P T S. ථෙ. 2. සමොහටා, PTS. 3 පූටකං, ම. නෙ.
4. බුද්දම්බු, ථෙ. 5. සුහත්ථෙන, PTS. සෙ. 6. පදෙසරජ්ජ, P T S. සෙ.
7. ද්විසතං, ථෙ.

## 35. මොඝරාජසථවිරාපදානය.

1066. සියල්ල තෙමේ ම දැනගත්තා වූ අපරාජිත වූ (පස්මරුන් දිනූ) **අත්ථදස්සී** භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද්දාහු වීථියට පිළිපන් සේක.

1067. මම ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයෙමි ගෘහයෙන් නික්මුනෙමි. නික්ම එහි ලොකනායකයන් වහන්සේ දුටුවෙමි

1068. සිරසෙහි ඇඳිලි බැඳ බුදුරජුන් වැඳ සිය සිත පහදවා ලොකනාථයන් වහන්සේ (හා) පිළිසඳර කථා කෙළෙමි.

1069. "යම් පමණ රූපාවචර බ්‍රහ්මලොක වාසි සත්ත්වයෝ වෙත් ද, එසේ ම අරූපාවචරබ්‍රහ්මලොකවාසි සත්ත්වයෝ වෙත් ද, අසංඥතලවාසි සත්ත්වයෝ වෙත් ද, ඒ සියල්ලෝ ඔබ වහන්සේගේ ඥානයෙහි ඇතුළත් වෙත්. (ඔබ වහන්සේගේ නුවණට ඔහු පෙණෙත්.)

1070 යමෙක් කුඩා සිදුරු ඇති දැලක් දියෙහි බහන්නේ නම්, (එවිට) දියෙහි කිසියම් ප්‍රාණී කෙනෙක් වෙත් ද, ඔවුහු දැල තුළෙහි වෙත්.

1071. රූපීසත්ත්වයන් පිළිබඳ වූ හෝ අරූපීසත්ත්වයන් පිළිබඳ වූ යමෙකුගේ චෙතනාවක් ඇත් නම්, ඒ සියලු චෙතනාවෝ ඔබ වහන්සේගේ නුවණෙහි ඇතුළත් වෙත්.

1072. අඳුරෙන් ගැවසී ගත් මේ ලොකයා (ඔබවහන්සේ) නගා සිටුවන සේක. ඔහු ඔබ වහන්සේගේ ධර්මය අසා සැකය නමැති සැඩපහර තරණය කෙරෙත්.

1073. ලොකවාසි සත්ත්ව තෙමේ අවිද්‍යාව විසින් වසාගන්නා ලදී. (මොහ)අන්ධකාරය විසින් වෙළාගන්නා ලදී. ඔබ වහන්සේගේ නුවණ බබලන කල්හි (ලෝවැස්සෝ) නසන ලද මොහාන්ධකාර ඇත්තෝ වෙත්.

1074. ඔබ වහන්සේ සියලු දෙනාගේ මහා මොහාන්ධකාරය දුරු-කරන්නා වූ ඇසක් වන සේක. බොහෝ ජන තෙමේ ඔබ වහන්සේගේ ධර්මය අසා (කෙලෙස් ගින්න) නිවාගණී.

1075. තිඳෙස් වූ බුද්දකමධු (දඹුවෙල්බෑ මීපැණි) සැළියක් පුරවා දෙහොතින් ගෙණ ගොස් බුදුරජානන් වහන්සේට පිළිගැන්වීමි.

1076. මහර්ෂි වූ මහාවීර වූ (**අත්ථදස්සී**) බුදුරජතෙමේ මී අනුභව කොට අහසට නැංගේ ය.

1077. අහසෙහි සිටියා වූ නරශ්‍රෙෂ්ඨ වූ **අත්ථදස්සී** ශාස්තෘ තෙමේ මාගේ සිත පහදවමින් මෙ ම ගාථාවන් දෙසී ය.

1078. "මේ (බුද්ධ) ඥනය යමකු විසින් පසසන ලද ද, බුද්ධ ශ්‍රෙෂ්ඨ තෙමේ ද (යමකු විසින්) තුති කරණ ලද ද, හෙතෙමේ ඒ ම චිත්තප්‍රසාදය කරණ කොට ගෙණ දුගතියකට නො යයි.

1079. හෙතෙමේ තුදුස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. අටසිය වරක් පෘථිවීරාජ්‍යය (කොට) පොළොවෙහි වාසය කරන්නේ ය.

1080. අථ පඤ්චසතක්ඛත්තුං[1] චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජමසඞ්ඛෙය්‍යං මහියා කාරයිස්සති.

1081. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානපාරගු,
ගොතමස්ස භගවතො සාසනෙ පබ්බජිස්සති.

1082. ගම්භීරං නිපුණං අත්ථං ඤාණෙන විචිනිස්සති,
**මොඝරාජාති** නාමෙන හෙස්සති සත්ථු සාවකො.

1083. තීහි විජ්ජාහි සම්පන්නං කතකිච්චං අනාසවං[2],
ගොතමො සත්ථවාහග්ගො එතදග්ගෙ ඨපෙස්සති."

1084. හිත්වා මානුසකං යොගං ඡෙත්වාන භවබන්ධනං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1085. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මොඝරාජා** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මොඝරාජත්ථෙරස්සාපදානං පඤ්චමං.**

## 36. අධිමුත්තත්ථෙරාපදානං.*

1086. නිබ්බුතෙ ලොකනාථම්හි අත්ථදස්සිනරුත්තමෙ,
උපට්ඨහිං[3] භික්ඛුසඞ්ඝං විප්පසන්නෙන චෙතසා.

1087. නිමන්තෙත්වා සඞ්ඝරතනං උජ්ජුභූතං සමාහිතං,
උච්ඡුනා මණ්ඩපං කත්වා භොජෙසිං සඞ්ඝමුත්තමං.

1088. යං යං යො'නුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙ සත්තෙ අභිභොමි පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

1089. අට්ඨාරසෙ කප්පසතෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි උච්ඡුදානස්සි'දං ඵලං.

1090. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අධිමුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අධිමුත්තත්ථෙරස්සාපදානං ඡට්ඨං.**

## 37. ලසුණදායකත්ථෙරාපදානං.

1091. හිමවන්තස්ස අවිදූරෙ තාපසො ආසි'හං තදා,
ලසුණං උපජීවාමි ලසුණං මය්හ භොජනං.

1092. ඛාරියො පූරයිත්වාන සඞ්ඝාරාමමගච්ඡ'හං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන සඞ්ඝස්ස ලසුණං අදං.

1. පඤ්චවෙ, ම. P T S 2. සම්පන්නො කතකිච්චො අනාසවො, P T S. සෙ.
* ථෙරගාථට්ඨකථායං දෙව ථෙරා ඉමිනා නාමෙන දිස්සන්ති. අයං පන ථෙරො සොළසනිපාතෙ දස්සිතො
3 නිමන්තෙත්වා, P T S

1080. **ඉක්බිති** පන්සියවරක් **සක්විතිරජ** වන්නේ ය. පෘථිවියෙහි අසඞ්ඛ්‍යවාරගණනක් ප්‍රදේශරාජ්‍යය කරවන්නේ ය.

1081. වෙද හදාරන්නා වූ මන්ත්‍රධර වූ වෙදත්‍රයයෙහි පරතෙරට ගියා වූ (හෙතෙමේ) **ගෞතම** බුදුරජානන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේ ය.

1082. ගැඹුරු වූ සියුම් වූ අර්ථ නුවණින් දැනගන්නේ ය. (හෙතෙමේ) නමින් **මොඝරාජ** ය සි බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

1083. (සසර කතරින් සත්වයන් එතෙර කරණ බැවින්) අග්‍ර සාර්ථවාහයකු වැනි වූ **ගෞතම** බුදුරජ තෙමේ ත්‍රිවිද්‍යාවන්ගෙන් යුක්ත වූ කොට නිමවූ කට යුතු ඇති ආශ්‍රව රහිත වූ (ඔහු) ඒතදග්‍රස්ථානයෙහි තබන්නේ ය.''

1084. මිනිස්යෙදුම් හැර භවබැඳුම් සිඳ සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥාවශයෙන් දැන ආශ්‍රව රහිත ව වෙසෙමි.

1085. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මොඝරාජස්ථවිරයන්** වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් සි.

**මොඝරාජස්ථවිරාවදානය පස්වැනි සි.**

## 36. අධිමුත්තස්ථවිරාවදානය.

1086. මනුෂ්‍යෝත්තම වූ **අත්ථදස්සී** බුදුරජානන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි (මම) පැහැදි සිතින් යුතු ව භික්ෂු සඞ්ඝයාට උපස්ථාන කෙළෙමි.

1087. සෘජු ගුණ යුත් එකඟ සිත් ඇති සංඝරත්නය පවරා මඩුවක් කරවා උතුම් සඞ්ඝයාට උක් වැළඳවීමි.

1088. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් නම්, සියලු සත්ත්වයන් අභිභවනය කරමි. මේ (එ ම) පුණ්‍යකර්මයාගේ ඵලය සි.

1089. කල්ප එක්දහස්අටසියයකට පෙර වූ එකල්හි යම් දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. උක් දනෙහි මේ විපාකය සි.

1090. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අධිමුත්ත** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් සි.

**අධිමුත්තස්ථවිරාවදානය සවැනි සි.**

## 37. ලසුණදායකස්ථවිරාවදානය.

1091. මම එකල්හි හිමවතට නුදුරු තන්හි තවුසෙක් වීමි. (රතු) ලූනුණු (ආහාර කොට ගෙණ) ජීවත් වෙමි. මාගේ භොජනය ලූනුණු ය.

1092. මම (ලූනුණු) කදක් පුරවාගෙණ සඞ්ඝාරාමයට ගියෙමි. සතුටු වූයෙම් සතුටු සිතින් ම සඞ්ඝයාට ලූනුණු දුන්නෙමි.

1093. **විපස්සිස්ස** නරග්ගස්ස සාසනෙ නිරතස්ස'හං,
සංඝස්ස ලසුණං දත්වා කප්පං සග්ගම්හි මොද'හං.

1094. එකනවුතෙ ඉතො කප්පෙ ලසුණං යම'දං තදා,
දුග්ගතිං නාභිජානාමි ලසුණානං[1] ඉදං ඵලං.

1095. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ලසුණදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ලසුණදායකත්ථෙරස්සාපදානං සත්තමං.**

## 38. ආයාගදායකත්ථෙරාපදානං

1096. නිබ්බුතෙ ලොකනාථම්හි **සිඛිම්හි** වදතං වරෙ,
හට්ඨො හට්ඨෙන චිත්තෙන අවන්දිං ථූපමුත්තමං.

1097. වඩ්ඪකීහි කථාපෙත්වා මූලං දත්වා'න'හං තදා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ආයාගං කාරපෙස'හං.

1098. අට්ඨ කප්පානි දෙවෙසු අබ්බොච්ඡින්නං වසිං අහං,
අවසෙසෙසු කප්පෙසු වොකිණ්ණං සංසරිං අහං.

1099. කායෙ විසං න කමති සත්ථානි න ච හන්ති මෙ,
උදකෙ'හං න මීයාමි ආයාගස්ස ඉදං ඵලං.

1100. යදිච්ඡාමි අහං වස්සං මහාමෙඝො පවස්සති,
දෙවාපි මෙ වසං එන්ති පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

1101. සත්තරතනසම්පන්නො තිංසක්ඛත්තුං අහොස'හං,
න මං කෙච'වජානන්ති පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

1102. එකතිංසෙ ඉතො කප්පෙ ආයාගං යමකාරයිං,
දුග්ගතිං නාභිජානාමි ආයාගස්ස ඉදං ඵලං.

1103. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආයාගදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**ආයාගදායකත්ථෙරස්සාපදානං අට්ඨමං.**

## 39. ධම්මචක්කිකත්ථෙරාපදානං.

1104. **සිද්ධත්ථස්ස** භගවතො සීහාසනස්ස සම්මුඛා,
ධම්මචක්කං මයා ඨපිතං සුකතං විඤ්ඤුවණ්ණිතං.

1 ලසුණස්ස, ම.

1093. මම **විපස්සී** නරශ්‍රෙෂ්ඨයන් (බුදුරජානන්) වහන්සේගේ සසුනෙහි නිරත වූ **සඞ්ඝයාට** ලුහුණු දී කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටු වීමි.

1094. මෙයින් එකානූවන කල්පයෙහි වූ එකල්හි (මම) යම් ලුහුණු දනක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ලසුණදානයාගේ විපාකය යි.

1095. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් ලසුණදායක ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් යි.

**ලසුණදායකස්ථවිරාවදානය සත්වැනි යි.**

## 38. ආයාගදායකස්ථවිරාවදානය.

1096. කථා කරන්නවුන් අතුරෙන් උතුම් වූ **සිඛී** බුදුරජානන් වහන්සේ පිරිනිවි කල්හි මම සතුටු වූයෙම් සතුටු සිතින් ශ්‍රෙෂ්ඨ චෛත්‍යය වැන්දෙමි.

1097. මම එකල්හි වඩුවන් සමග කථා කොට මුදල් දී සතුටු වූයෙම් සතුටු සිතින් දිසී භොජනශාලාවක් කරවීමි.

1098. (ඒ හෙතුවෙන්) මම අටකපක් නො කඩ කොට දෙව්ලොව විසීමි. සෙසු කල්පයන්හි (දිව්‍ය – මනුෂ්‍ය දෙගතියෙහි) මිශ්‍ර ලෙස සැරි සැරීමි.

1099. මාගේ කයෙහි විෂ ඇතුළු නො වේ. ශස්ත්‍රයෝ (මා) නො තසත්. දියෙහි මම නො මැරෙමි. ආයාග (දිසීශාලා) දානයාගේ මේ විපාකය යි.

1100. ඉදින් මම වැස්ස කැමැති වෙම් නම්, මහවැසි වසින්නේ ය. දෙවියෝ ද මාගේ වසඟයට පැමිණෙත්. (ආයාගදානමය) පුණ්‍යකර්මයාගේ මේ විපාකය යි.

1101. මම තිස්වරක් සත්රුවනින් යුක්ත වූ සක්විතිරජ වීමි. මට කිසිවෙක් නිඳා නො කෙරෙත්. පුණ්‍යකර්මයාගේ මේ විපාකය යි.

1102. (මෙයින්) එක්තිස්වන කල්පයෙහි (මම) යම් දීසීශාලාවක් කරවීම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. දීසීශාලාදානයාගේ මේ විපාකය යි.

1103. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආයාගදායක** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් යි.

**ආයාගදායකස්ථවිරාවදානය අටවැනි යි.**

## 39. ධම්මචක්කිකස්ථවිරාවදානය.

1104. **සිද්ධාර්ථ** භාග්‍යවතුන්වහන්සේගේ ධර්මාසනය ඉදිරියෙහි මා විසින් මැනවින් කරණලද නුවණැත්තවුන් විසින් වර්ණිනා කරණලද ධර්මචක්‍රයක් තබන ලදී.

1105. චාරුවණ්ණාව සොභාමි සයොග්ගබලවාහනො,
පරිවාරෙන්ති මං නිච්චං අනුයුත්තා බහුජ්ජනා.

1106. සට්ඨිතුරියසහස්සෙහි පරිවාරෙම'හං[1] සදා,
පරිවාරෙන සොභාමි පුඤ්ඤකම්මස්සි'දං ඵලං.

1107. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං චක්කං ඨපයිං අහං,
දුග්ගතිං නාභිජානාමි ධම්මචක්කස්සි'දං ඵලං.

1108. ඉතො එකාදසෙ කප්පෙ අට්ඨා'සිංසු* ජනාධිපා,
සහස්සරාජනාමෙන චක්කවත්තී මහබ්බලා.

1109. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ධම්මචක්කිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ධම්මචක්කිකත්ථෙරස්සාපදානං නවමං.**

## 40. කප්පරුක්ඛියත්ථෙරාපදානං.

1110. **සිද්ධත්ථස්ස** භගවතො ථූපසෙට්ඨස්ස සම්මුඛා,
විචිත්තදුස්සෙ ලග්ගෙත්වා[2] කප්පරුක්ඛං ඨපෙස'හං.

1111. යං යං යො'නුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සොභයන්තො මම ද්වාරං කප්පරුක්ඛො'පතිට්ඨති[3].

1112. අහඤ්ච පරිසා චෙව යෙ කෙචි මම නිස්සිතා,[4]
තම්හා දුස්සං ගහෙත්වාන නිවාසෙම මයං සදා.

1113. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං රුක්ඛං ඨපයිං[5] තදා,
දුග්ගතිං නාභිජානාමි කප්පරුක්ඛස්සි'දං ඵලං.

1114. ඉතො ච සත්තමෙ කප්පෙ **සුචෙළා** අට්ඨ ඛත්තියා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1115. පටිසම්භිදා -පෙ- බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කප්පරුක්ඛියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කප්පරුක්ඛියත්ථෙරාපදානං දසමං.**

උද්දානං:

කුණ්ඩ - සාගත - කච්චානා උදයී මොඝරාජකො,
අධිමුත්තො ලසුණදෙ ආයාගී[6] ධම්මචක්කිකො,
කප්පරුක්ඛී ච දසමො ගාථායො ද්වාදස සතානි.

**කුණ්ඩධානවග්ගො චතුත්ථො.**

1. පරිවාරෙමහං, P T S. සෙ. 2. ලම්බිත්වා, සෙ. P T S. 3. පතිට්ඨති, ම.
4. වාසිකා, සෙ. වස්සිතා ම. 5. චපයිං, සෙ 6. ආසනා, ම.
* අට්ඨ ආසුං?

1105. මනොඥ වූ (සවර්ණ) වර්ණ වූයෙම් ම (සවර්ණසිවිකාදි) යාන ද (සෙනාපති මහාමාත්‍යාදි) සෙවාභටයන් ද (හස්ති අශ්ව රථ සඞ්ඛ්‍යාත) වාහන ද ඇත්තෙම් බබලමි. මා අනු ව පවතින්නා වූ බොහෝ දෙන නිරතුරු ව ම මා පිරිවරත්.

1106. මම හැමකල්හි සැටදහසක් තූර්‍ය්‍යයන්ගෙන් පරිවරණය කරමි. පිරිවර කරණ කොට ගෙණ බබලමි. පුණ්‍යකර්මයාගේ මේ ඵලය යි.

1107. මෙයින් සිවුඅනූවන කල්පයෙහි මම යම් (ධර්ම)චක්‍රයක් තැබුයෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ධර්මචක්‍රදානයාගේ මේ විපාකය යි.

1108. මෙයින් එකොලොස්වන කල්පයෙහි නමින් සහස්සරාජ නම් වූ ජනාධිපති වූ මහත් බල ඇති සක්විතිරජවරු අටදෙනෙක් (අටවරකට) වූවාහු ය.

1109. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **ධම්මචක්කික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සී.

**ධම්මචක්කිකස්ථවිරාවදානය නවවැනි සී.**

## 40. කප්පරුක්ඛියස්ථවිරාවදානය

1110. මම **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේගේ ශ්‍රෙෂ්ඨ ස්තූපය ඉදිරියෙහි විසිතුරු දුහුල් එල්වා කප්රුකක් තැබීමි.

1111. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද, (ඒ හැම අත්බැව්හි දී ම) මාගේ දොරටුව සොබවමින් කප්රුකක් පිහිටයි.

1112. මම ද මා ඇසුරු කළ යම් කිසි පිරිසක් වේ නම්, ඔහු ද යන අපි හැමකල්හි ඒ කප්රුකින් දුහුල් ගෙණ හඳිමු.

1113. මෙයින් සිවු අනූවන කප්හි වූ එකල්හි යම් කප්රුකක් තැබීම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. කල්පවෘක්ෂදානයාගේ මේ විපාකය යි.

1114. මෙයින් සත්වැනි කල්පයෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති **සුචෙල** නම් වූ සක්විතිරජවරු අටදෙනෙක් වූහ.

1115. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කප්පරුක්ඛිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සී.

**කප්පරුක්ඛියස්ථවිරාවදානය දසවැනි සී.**

**උද්දානය:**

කුංඩ සාගත කසයින් - උදසී මෝගරාජ ද,
අදිමුත්ත ලසුන ආයාගී - දම්සක් කප්රුක් ද දසි.
තෙරසිරින් දසයකි - එක්සිය දෙලොස් ගයකින්.

**කුණ්ඩධානවර්ගය සිවුවැනි සී.**

## 41. භාගිනෙය්‍යඋපාලිත්ථෙරාපදානං

1116. ඛීණාසවසහස්සෙහි පරිවුතො ලොකනායකො,
විවෙකමනුයුත්තො සො ගච්ඡතෙ පටිසල්ලිතුං.

1117. අජිනෙන නිවත්ථො'හං තිදණ්ඩපරිධාරකො[1],
භික්ඛුසංඝපරිබ්බූළ්හං අද්දසං ලොකනායකං.

1118. එකංසං අජිනං කත්වා සිරෙ කත්වාන අඤ්ජලිං,
සම්බුද්ධං අභිවාදෙත්වා සන්ථවිං ලොකනායකං:

1119. "යථාණ්ඩජා ච සංසෙදා ඔපපාතී ජලාබුජා,
කාකාදිපක්ඛිනො සබ්බෙ අන්තලික්ඛචරා සදා[2].

1120. යෙ කෙචි පාණභූතත්ථි සඤ්ඤිනො වා අසඤ්ඤිනො,
සබ්බෙ තෙ තව ඤාණම්හි අන්තො හොන්ති සමොගධා.

1121. ගන්ධා ච පබ්බතෙය්‍යා යෙ හිමවන්තනගුත්තමෙ,
සබ්බෙ තෙ තව සීලම්හි කලාය[3]පි න යුජ්ජරෙ.

1122. මොහන්ධකාරපක්ඛන්තො අයං ලොකො සදෙවකො,
තව ඤාණම්හි ජොතන්තෙ අන්ධකාරා විධංසිතා.

1123. යථා අත්ථඞ්ගතෙ සූරියෙ හොන්ති සත්තා තමොගතා,
එවං බුද්ධෙ අනුප්පන්නෙ හොති ලොකො තමොගතො.[4]

1124. යථොදයන්තො ආදිච්චො විනොදෙති තමං සදා,
තථෙව ත්වං බුද්ධසෙට්ඨ විද්ධංසෙසි තමං සදා.

1125. පධානපහිතත්තො'සි බුද්ධො ලොකෙ සදෙවකෙ,
තව කම්මාභිරද්ධෙන තොසෙසි ජනතං බහුං."

1126. තං සබ්බං අනුමොදිත්වා පදුමුත්තරො මහාමුනි,
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජා'ව අම්බරෙ.

1127. අබ්භුග්ගන්ත්වාන සම්බුද්ධො මහෙසී පදුමුත්තරො,
අන්තලික්ඛෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ:

1128. "යෙනි'දං ථවිතං ඤාණං ඔපම්මෙහි සමායුතං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1129. අට්ඨාරසක්ඛත්තුං සො දෙවරාජා භවිස්සති,
පථව්‍යා රජ්ජං තිසතං වසුධං ආවසිස්සති.

1130. පඤ්චවීසතික්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

1131. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

---

1. ධාරණො, සෙ. පරිවාරණො, PTS.
2. අන්තලික්ඛෙ පදෙසගා, P T S. 3. කලායො, සෙ. P T S
4. හොන්ති ලොකා තමොගතා, සෙ.

# 41. භාගිනෙය්‍යඋපාලිස්ථවිරාපදානය

1116. දහසක් රහතුන් විසින් පිරිවරණ ලද ඒ ලොකනායක වූ බුදුරජානන් වහන්සේ විවේකයෙහි යෙදුනුයේක් එකලාව වසන්නට යන සේක.

1117. (එකල්හි) ත්‍රිදණ්ඩය දරන්නා වූ අඳුන්දිවිසම් හැන්ද වූ මම ලොකනායකයන් (=තථාගතයන්) වහන්සේ දිටිමි.

1118. අඳුන්දිවිසම එකස් කොට හිසෙහි ඇඳිලි බැඳ බුදුරජානන් වහන්සේ වැඳ ලොකනායකයන් වහන්සේට සතුති කෙළෙමි:

1119, 1120. "යම් බඳු අණ්ඩජ වූ සංසෙදජ වූ, ඔපපාතික වූ, ජලාබුජ වූ සත්ත්වයෝ ද, හැමකල්හි අහසෙහි හැසිරෙන සියලු කාකාදිපක්ෂීහු ද යන සංඥී වූ හෝ අසංඥී වූ යම් කිසි ප්‍රාණභූතකෙනෙක් වෙත් නම්, ඒ සියල්ලෝ ඔබ වහන්සේගේ නුවණෙහි ඇතුළත් වෙත්.

1121. උතුම් වූ හිමවත්පව්වෙහි පර්වතයන්හි හටගන්නා (මලයජ) සඳුන් (ආදී) යම් ගන්ධයෝ වෙත් නම්, ඒ සියලු සුගන්ධයෝ ඔබ වහන්සේගේ සීල(සුගන්ධ)යෙහි කලාවකට ද නො යෙදෙත්. (=සම නො වෙත්).

1122. මේ දෙවියන් සහිත ලොකයා මොහඳුරට වැදුනේ වෙයි. ඔබ වහන්සේගේ ඤාණය බබලන කල්හි (ඔහු) වනසන ලද (මොහ) අඳුර ඇත්තෝ වෙත්.

1123. යම් සේ සූර්‍ය්‍යයා අස්තගත වූ කල්හි සත්ත්වයෝ අඳුරට ගියාහු වෙත් ද, එසේ ම බුදුරජානන් වහන්සේ නූපන් කල්හි ලොකයා අඳුරට ගියේ වේ.

1124. යම් සේ උදා වන්නා වූ සූර්‍ය්‍යයා හැම කල්හි අඳුරු දුරු කෙරේ ද, එසේ ම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේ හැම කල්හි අඳුර නසනසේක.

1125. දෙවියන් සහිත ලොකයෙහි සර්‍වඥ වූ ඔබ වහන්සේ වීර්‍ය්‍යයෙහි මෙහෙයූ සිත් ඇති සේක. (එසේ ම) ඔබ වහන්සේ ප්‍රීතිජනක වූ කර්‍මයෙන් බොහෝ ජනසමූහයා සතුටු කරණසේක" (කියායි).

1126. මහාමුනි වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ ඒ සියල්ල අනුමෙව (=සියල්ලට සතුටු ව) අහසෙහි (යන) හංසරාජයකු මෙන් ආකාශයට පැනනැඟුනු සේක.

1127. අහසට පැනනැඟී ශාස්තෘ වූ මහර්ෂි වූ **පදුමුත්තර** බුදුරජ තෙමේ අහසෙහි සිටියේ මේ ගාථාවන් වදාළේ ය:

1128. "යමකු විසින් උපමාවන්ගෙන් යුක්ත සේ මාගේ මේ නුවණ පසසන ලද ද, මම ඔහු (කවරෙක් දැ යි) කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවූ.

1129. හෙතෙමේ අටළොස්වරක් ශක්‍රදිව්‍යරාජයා වන්නේ ය. තුන්සිය වරක් පෘථිවිරාජ්‍යය කරමින් පොළොවෙහි වාසය කරන්නේ ය.

1130. පස්විසිවරක් සක්විතිරජ වන්නේ ය. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

1131. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ ගොත්‍රනාමයෙන් **ගෞතම** නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

1132. තුසිතා හි චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
හීනො'ව ජාතියා සන්තො **උපාලි** නාම හෙස්සති.

1133. සො ච පච්ඡා පබ්බජිත්වා විරාජෙත්වාන පාපකං,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

1134. තුට්ඨො ච **ගොතමො** බුද්ධො සක්‍යපුත්තො මහායසො,
විනයාධිගතං තං ස එතදග්ගෙ ඨපෙස්සති."

1135. සද්ධායාහං පබ්බජිතො කතකිච්චො අනාසවො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1136. භගවා චානුකම්පී මං විනයෙ'හං විසාරදො,
සකකම්මාභිරද්ධො ච විහාරාමි අනාසවො.

1137. සංවුතො පාතිමොක්ඛම්හි ඉන්ද්‍රියෙසු ච පඤ්චසු,
ධාරෙමි විනයං සබ්බං කෙවලං රතනාකරං.

1138. මමඤ්ච ගුණමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

1239. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපාලිත්ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**භාගිනෙය්‍යඋපාලිත්ථෙරස්ස[1] අපදානං පඨමං.**

## 42. සොණකොටිකණ්ණ[2]ත්ථෙරාපදානං

1140. * අනොමදස්සිමුනිනො ලොකජෙට්ඨස්ස තාදිනො,
සුධාය ලෙපනං කත්වා චඞ්කමං කාරයිං අහං.

1141. නානාවණ්ණෙහි පුප්ඵෙහි චඞ්කමං සන්ථරිං අහං,
ආකාසෙ විතානං කත්වා භොජයිං බුද්ධමුත්තමං.

---

1. භාගිනෙය්‍යඋපාලිත්ථෙරස්ස, අට්ඨකථා; සීහලක්ඛරමුද්දිත පොත්ථකෙ "භාගිනෙය්‍ය" ඉති න දිස්සතෙ.

2. "කුටිකණ්ණ" ඉතිපි පාඨො.

* ඉතො පට්ඨාය දිස්සමානං අපදානං සොණකොළියවෙස්සත්ථෙරස්සාති සීහලක්ඛරමුද්දිත අපදානපාළියං ච සොණකොළිවිසත්ථෙරස්සාති මරම්මක්ඛරමුද්දිතාපදානපාළියං ච ආගච්ඡති. ථෙරගාථට්ඨකථායම්පි ඉමා ගාථා කොළිවිසත්ථෙරචරිතෙ නිවෙසිතා. අපදානට්ඨකථාචරියො පන අපදානමිදං සොණකොටිකණ්ණත්ථෙරස්සාති ච සො ථෙරො කොලියරාජවංසෙ ජාතො'ති ච දස්සෙසි. සො පනායං ථෙරො සොණො කොළිවිසො වා සොණො කුටිකණ්ණො වා හවතු. අයං අම්හාකං භගවතො සාසනෙ එතදග්ගට්ඨානං ලභී'ති අපදානපාළියා එව විඤ්ඤායති. ආරද්ධවිරියානං අග්ගතං ගතො සොණො කොළිවිසත්ථෙරො චම්පානගරෙ වෙස්සකුලෙ ජාතො'ති ච කල්‍යාණවාක්කරණානං අග්ගට්ඨානප්පත්තො කොටිකණ්ණත්ථෙරො අවන්තිජනපදෙ කාළියා නාම සෙට්ඨිභරියාය කුච්ඡිම්හි උප්පන්නො'ති ච මහාවග්ගපාළි මනොරථපූරණීආදීසු පාමාණිකෙසු ගන්ථෙසු සුවිසදං පාකටං හවති. අපදානපාළියං එකූනචත්තාළීසතිමෙ වග්ගෙ දිස්සමානං සොණකොටිවිසත්ථෙරස්ස අපදානං පන මනොරථපූරණියා දස්සිතෙන ආරද්ධවිරියානං අග්ගතං ගතස්ස සොණකොළිවිසත්ථෙරස්ස චරිතෙන සද්ධිං සමෙති. තස්මා ඉදං (42) අපදානං අපදානට්ඨකථායං දිස්සමානස්ස සොණස්ස කොටිකණ්ණත්ථෙරස්සවා'ති අවගන්තබ්බං.

1132. (එකල) කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ තුෂිතදිව්‍යලොකයෙන් චුත ව ජාතියෙන් හීන වූයේ **උපාලි** නම් වන්නේ ය.

1133. හෙතෙමේ පසු ව පැවිදි ව පව් දුරු කර සියලු ආස්‍රවයන් ප්‍රහාණපරිඥවශයෙන් දැන (දුරු කොට) ආස්‍රව රහිත වූයේ පිරිනිවන් පාන්නේ ය.

1134. මහායශස් ඇති ශාක්‍යපුත්‍ර වූ **ඒ ගෞතමබුදුරජ** තෙමේ සතුටු වූයේ විනයපිටකය අවබොධ කල ඔහු එතදග්‍රස්ථානයෙහි තබන්නේ ය.''

1135. මම ශ්‍රද්ධාවෙන් පැවිදි වූයෙම් කොට නිමවන ලද කටයුතු ඇත්තෙම් ආස්‍රව රහිත වූයෙම් සියලු ආස්‍රවයන් ප්‍රහාණපරිඥවශයෙන් දැන (දුරු කොට) ආස්‍රව රහිත ව වෙසෙමි.

1136. භාග්‍යවත් තෙමේ මට අනුකම්පා කෙළේ ය. මම විනයයෙහි විශාරද වෙමි. සචකීය කුශලකර්මයෙන් පිණා ගියෙම් ආස්‍රව රහිත ව වෙසෙමි.

1137. ප්‍රාතිමොක්ෂ(ශීල)යෙහි ද පසිදුරන් විෂයෙහි ද මැනැවින් සංවෘත වූයෙම් හුදු මැණික් ආකරයක් වැනි සියලු විනය (ධර්මය) දරමි.

1138. ලොකයෙහි නිරුත්තර වූ ශාස්තෘ තෙමේ මාගේ ගුණ දැන භික්ෂුසඞ්ඝයා මැද හිඳ මා (විනයප්‍රශ්නයන්හි නියුණු නුවණ ඇත්තවුන් අතුරෙහි*) එතදග්‍රස්ථානයෙහි තැබී ය.

1139. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් (භාගිනෙය්‍ය) **උපාලි** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**භාගිනෙය්‍ය උපාලිස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 42. සොණකොටිකණ්ණස්ථවිරාවදානය

1140. *මම තාදිගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ අනොමදස්සී බුදුරජානන් වහන්සේට හුණින් ආලෙප කොට සක්මනක් කරවීමි.

1141. මම නානාවර්ණ පුෂ්පයන්ගෙන් සක්මන අතුරා වැසීමි. අහසෙහි වියනක් ද කොට (බඳවා) උතුම් වූ බුදුරජානන් වහන්සේ වැළඳවීමි.

---

* අට්ඨකථා.

* මෙතැන් පටන් පැණෙන අපදානය සොණකොළිය‍වෙස්ස තෙරුන්ගේ ය යි සිංහලාක්ෂරමුද්‍රිතඅපදානයෙහි ද සොණකොළිවිස තෙරුන්ගේ ය යි බුරුම අකුරින් මුද්‍රිත අපදානපාළියෙහි ද සඳහන් වෙයි. ථෙරගාථට්ඨකථාවෙහි ද මේ ගාථාවෝ කොළිවිසථෙර චරිතයෙහි ඇතුළත් කරණ ලදහ. අපදානට්ඨකථාචාරීන් වහන්සේ මේ අපදානය සොණකොටිකණ්ණ තෙරුන්ගේ ය යි ද ඒ තෙරණු කොලියරාජවංශයෙහි උපන්හ යි ද දක්වූහ. ඒ මේ තෙරුන්වහන්සේ සොණකොළිවිස හෝ සොණකුටිකණ්ණ හෝ වෙත්වා. මුන්වහන්සේ අප බුද්ධ ශාසනයෙහි එතදග්‍රස්ථානයක් ලැබූ බව අපදානපාළියෙන් ම හැඟේ. ආරබ්ධවීර්‍ය්‍ය ඇතියවුන් අතුරෙන් අග්‍ර වූ සොණකොළිවිස තෙරුන්වහන්සේ චම්පා නුවර වෛශ්‍යකුලයෙහි උපන්හයි ද කල්‍යාණවචන ඇත්තවුන් අතුරෙන් අග්‍ර වූ කොටිකණ්ණතෙරුන්ඃහන්සේ අවන්තිජනපදයෙහි කාළී නම් සිටුබිරියගේ කුසෙහි උපන්හ යි ද මහාවග්ගපාළිමනොරථපූරණී ආදි ප්‍රාමාණිකග්‍රන්ථයන්ගෙන් සුප්‍රකට වෙයි. අපදානපාළියෙහි එකුන්සාළිස්වන වගෙහි පෙණෙන, සොණකොටිවිස තෙරුන්ගේ අපදානය මනොරථපූරණියෙහි දක්වූ ආරබ්ධවීර්‍ය්‍යාග්‍රත්වය ලැබූ සොණකොළිවිස-තෙරුන්ගේ චරිතය හා සම වෙයි. එබැවින් මේ (42) අපදානය අපදානට්ඨකථාවෙහි දක්වෙන සොණකොටිකණ්ණ තෙරුන්ගේ ම ය යි දතයුතු.

1142. අඤ්ජලිම්පග්ගහෙත්වාන අභිවාදෙත්වාන සුබ්බතං,
දීඝසාලං භගවතො නිය්‍යාදෙසිමහං තදා.

1143. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
පටිග්ගහෙසි භගවා අනුකම්පාය චක්ඛුමා.

1144. පටිග්ගහෙත්වා සම්බුද්ධො දක්ඛිණෙය්‍යො සදෙවකෙ,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

1145. "යො සො හට්ඨෙන චිත්තෙන දීඝසාලං අකාසි[1] මෙ,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1146. ඉමස්ස මච්චුකාලම්හි පුඤ්ඤකම්මසමඞ්ගිනො,
සහස්සයුත්තා'ස්සරථො උපට්ඨිස්සති තාවදෙ.

1147. තෙන යානෙන'යං පොසො දෙවලොකං ගමිස්සති,
අනුමොදිස්සරෙ දෙවා සම්පත්තෙ කුසලෙ භවෙ.

1148. මහාරහං ව්‍යම්හසෙට්ඨං රතනමත්තිකලෙපනං[2],
කූටාගාරවරූපෙතං ව්‍යම්හං අජ්ඣාවසිස්සති.

1149. තිංස කප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
පඤ්චවීසති කප්පානි දෙවරාජා භවිස්සති.

1150. සත්තසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති,
යසොධර සනාමා[3] තෙ සබ්බෙපි එකනාමකා.

1151. ද්වෙ සම්පත්තී අනුභොත්වා චිනිත්වා[4] පුඤ්ඤසඤ්චයං,
අට්ඨවීසතිකප්පම්හි චක්කවත්තී භවිස්සති.

1152. තත්‍රාපි ව්‍යම්හං පවරං විස්සකම්මෙන මාපිතං,
දසසද්දාවිවිත්තං තං පුරමජ්ඣාවසිස්සති.

1153. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ භූමිපාලො මහිද්ධිකො,
ඔක්කාකො නාම නාමෙන රාජා රට්ඨෙ භවිස්සති.

1154. සොළසිත්ථිසහස්සානං සබ්බාසං පවරා ච සා[5],
අභිජාතා ඛත්තියානී නව පුත්තෙ ජනෙස්සති.

1155. නව පුත්තෙ ජනෙත්වාන ඛත්තියානී මරිස්සති,
තරුණී ච පියා[6] අඤ්ඤා* මහෙසිත්තං කරිස්සති.

1156. ඔක්කාකං තොසයිත්වාන වරං කඤ්ඤා[7] ලභිස්සති,
වරං ලද්ධාන[8] සා කඤ්ඤා පුත්තෙ පබ්බාජයිස්සති.

1157. පබ්බාජිතා ච තෙ සබ්බෙ ගමිස්සන්ති නගුත්තමං,
ජාතිභෙදභයා සබ්බෙ භගිනීහි සංවසිස්සරෙ[9].

1158. එකා ච කඤ්ඤා ව්‍යාධීහි භවිස්සති පරික්ඛතා[10],
'මා නො ජාති පභිජ්ජී'ති නිඛණිස්සන්ති ඛත්තියා.

1159. ඛත්තියො නීහරිත්වාන තාය සද්ධිං වසිස්සති,
භවිස්සති තදා භෙදො ඔක්කාකකුලසම්භවො.

---

1. අදාසි, ථෙ. සෙ. මජසං. 2. රතනභිත්තිසමුජ්ජලං, ථෙ. 3. සමානා, සී මු.
4. වඩ්ඪෙත්වා, සී මු. 5. යා, ථෙ. ස්‍යා. 6. සා සියා, ථෙ. * කඤ්ඤා, මජසං.
7. කඤ්ඤං, ථෙ. 8. වරලද්ධා, ථෙ. 9. වසිස්සරෙ, මජසං. PTS.
10 පුරක්ඛතා, P T S. සෙ. ස්‍යා.

1142. මනා ව්‍රත ඇති බුදුරජාණන් ඇඳිලි බැඳ වැඳ මම එකල්හි භාග්‍යවතුන් වහන්සේට දීඝශාලාව පිළිගැන්වීමි.

1143. ලොකයෙහි අනුත්තර වූ භාග්‍යවත් වූ පසැස් ඇත්තා වූ ශාස්තෘ තෙමේ මාගේ අදහස දැන අනුකම්පාවෙන් (එය) පිළිගත්තේ ය.

1144. දෙවියන් සහිත ලොකයෙහි දක්ෂිණෙය වූ සම්බුදුයන් වහන්සේ (එය) පිළිගෙණ භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළසේක:

1145. "ඒ යමෙක් සතුටු සිතින් මට දීඝශාලාවක් කරවී ද, මම ඔහු කවරෙක් දැ යි ප්‍රකාශ කරන්නෙමි. (එය) ප්‍රකාශ කරන්නා වූ මාගේ වචනය අසවු.

1146. පුණ්‍යකර්මයන්ගෙන් යුක්ත වූ මොහුට මැරෙණ අවස්ථාවෙහි දහසක් අසුන් යෙදූ අශ්වරථයක් එකෙණෙහි එළඹෙන්නේ ය.

1147. මේ පුරුෂ තෙමේ ඒ යානයෙන් දෙව්ලොවට යන්නේ ය. කුශලවිපාකය එළඹ සිටි කල්හි දෙවියෝ සතුටු වෙත්.

1148. රත්සුණුඅලෙවි දුන් උතුම් කුළුගෙවලින් යුක්ත වූ මාහැඟි වූ ශ්‍රෙෂ්ඨ සඳලු සහිත විමනක වසන්නේ ය.

1149. කල්ප තිස්දහසක් දිව්‍යලොකයෙහි සිත් අලවා වසන්නේ ය. පස්විසිකපක් ශක්‍රදෙවේන්ද්‍රයා වන්නේ ය.

1150. සත්සැත්තෑවරක් සක්විතිරජ වන්නේ ය. ඒ සියල්ලෝ යශොධර යන සමාන නාම ඇත්තාහු එක ම නම ඇත්තෝ වෙත්.

1151. (දිව්‍ය - මනුෂ්‍ය යන) ද්විවිධසම්පත් අනුභව කොට පින් ද රැස් කොට අටවිසිවන කපෙහි සක්විතිරජ වන්නේ ය.

1152. එහි විශ්වකර්මයා විසින් මවන ලද උතුම් විමනකි. දශවිධ ශබ්දයන්ගෙන් වෙන් නො වූ ඒ පුරයෙහි අධිපති ව වසන්නේ ය.

1153. මෙසින් අපරිමෙයකල්පයෙහි පෘථිවිය පාලනය කරන්නා වූ මහර්ධි ඇති නමින් ඔක්කාක නම් වූ රජෙක් රටෙහි වන්නේ ය.

1154. සියලු සොළොස්දහසක් සත්‍රීන්ට උතුම් වූ විශිෂ්ට ජන්ම ඇති ඒ (=ප්‍රසිද්ධ වූ) කැත්තූ තොමෝ පුතුන් (4, දූන් 5) නව දෙනෙකුන් වදන්නී ය.

1155. කැත්තූ තොමෝ පුතුන් නව දෙනෙකුන් වදා මැරෙන්නී ය. (ඉක්බිති) අන්‍ය වූ ප්‍රියාවක් තොමෝ මෙහෙසිබව කරන්නී ය.

1156. ඒ කන්‍යා තොමෝ ඔක්කාකරජ සතුටු කොට වරයක් ලබන්නී ය. වරය ලැබූ ඒ කන්‍යාතොමෝ පුතුන් රටින් පිටුවහල් කරවන්නී ය.

1157. පිටුවහල් වූ ඒ සියල්ලෝ උතුම් පර්වතයට (=හිමවතට) යන්නාහු ය. සියල්ලෝ ජාතිභෙදය වන බියෙන් සොහොයුරියන් සමග සංවාසය කරන්නාහු ය.

1158. (එසින්) එක් (පියා නම්) කන්‍යාවක් තොමෝ ව්‍යාධිය (කුෂ්ඨරොගය)කින් වැළඳගන්නා ලද්දී වන්නී ය. ක්ෂත්‍රිය කුමාරවරු 'ජාති-සම්භෙදය නො කරාවා'යි ඇය වළක දමා (උඩින්) වසත්.

1159. (රාම නම්) රජෙක් තෙම (ඇය ඒ වළින්) ගොඩට ගෙණ ඇය සමග (අඹු සැමියන් ලෙස) වසන්නේ ය. එකල්හි ඔක්කාක කුලයෙහි වූ ජාතිසම්භෙදය වන්නේ ය.

1160. තෙසං පජා භවිස්සන්ති **කොළියා** නාම ජාතියා,
තත්‍ථ මානුසකං භොගං අනුභොස්සන්තනප්පකං.

1161. තම්හා කායා චවිත්වාන දෙවලොකං ගමිස්සති,
තත්‍රාපි පවරං ව්‍යම්හං වින්දිස්සති[1] මනොරමං.

1162. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
ආගන්ත්වාන මනුස්සත්තං **සොණො** නාම භවිස්සති.

1163. ආරද්ධවිරියො පහිතත්තො පදහං සත්‍ථු සාසනෙ,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

1164. අනන්තදස්සී[2] භගවා **ගොතමො** සක්‍යපුඞ්ගවො,
විසෙසඤ්ඤූ මහාවීරො අග්ගට්ඨානෙ ඨපෙස්සති."
* ——

1165, උත්තමෙ දමථෙ[3] දන්තො චිත්තං මෙ සුප්පණිහිතං,
භාරො මෙ ඔහිතො සබ්බො නිබ්බුතො'ම්හි අනාසවො.

1166. අංගීරසො මහානාගො අභිජාතොව කෙසරී,
භික්ඛුසංඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

1167. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්‍ථං සුදං ආයස්මා **සොණො කොටිකණ්ණො** ථෙරො ඉමා ගාථායො අභාසිත්‍ථාති.

**සොණකොටිකණ්ණත්ථෙරස්ස අපදානං දුතියං.**

## 43. කාළිගොධාපුත්තභද්දියත්ථෙරාපදානං[4]

1168. **පදුමුත්තරසම්බුද්ධං** මෙත්තචිත්තං මහාමුනිං,
උපෙති ජනතා සබ්බා සබ්බලොකග්ගනායකං.

1169. වත්‍ථං සෙනාසනං චෙව[5] ආමිසං පානභොජනං,
දදන්ති සත්‍ථුනො සබ්බෙ පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

1170. අහම්පි දානං දස්සාමි දෙවදෙවස්ස තාදිනො,
බුද්ධසෙට්ඨං නිමන්තෙත්වා සංඝම්පි ච අනුත්තරං.

1171. උය්‍යොජිතා මයා චෙතෙ නිමන්තෙසුං තථාගතං,
කෙවලං භික්ඛුසඞ්ඝඤ්ච පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

---

1. ලභිස්සති, ථෙ. සෙ. මජසං. 2. අත්‍ථදස්සී, සෙ. ජථ.

* "වුට්ඨම්හි දෙවෙ චතුරඞ්ගුලම්හි - තිණෙ අනිලෙරිත අඞ්ගණම්හි,
ඨත්වාන යොගස්ස පයුත්තතාදිනො - තතොත්තරිං පාරගතා න විජ්ජති"
දිස්සතෙ චායං ගාථා මරම්ම ඡට්ඨසඞ්ගීති පොත්‍ථකෙ.

ථෙරගාථට්ඨකථායං පන -
"වට්ටම්හි දෙවෙ චතුරඞ්ගුලෙ පතිතෙ අනිලෙරිතාපාදපසම්පහුට්ඨෙ,
ඣානෙ රතස්සප්පසුස්සත තාදිනො තතො රතී පරමතරා න විජ්ජති"ති
ගාථා ආගතා. තථාපිස්සා එත්‍ථ උචිතතා නත්‍ථි.

3 උත්තමෙන දමථෙන, ථෙ. 4. භද්දියත්ථෙරාපදානං, සී මු.

5. සතතුකාඤ්ච බද්ධකාඤ්ච, මජසං. PTS. පදකං, සෙ. සතතුකාඤ්ච පවාකාඤ්ච, සතා.

1160. ඔවුන්ගේ ප්‍රජා තොමෝ (දරුමුනුබුරුපරපුර) ජාතිවශයෙන් **කොලිය** නම් වන්නී ය. එහි (ඔහු) මිනිසුන් සතු අනල්ප වූ භොග සම්පත් අනුභව කරන්නාහු ය.

1161. එ ම කයින් ච්‍යුත ව දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) යන්නේ ය. එහි ද මනහර වූ උතුම් විමානයෙක්හි (සැප) විඳින්නේ ය.

1162. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් ච්‍යුත ව මිනි-සත්බවට පැමිණ **සොණ** නම් වන්නේ ය.

1163. බුදුසසුනෙහි පටන් ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තේ, නිවණ කෙරෙහි මෙහෙයන ලද සිත් ඇත්තේ වීර්‍ය්‍ය කරමින් සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දන (දුරු කොට) ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය.

1164. අනන්ත (දැය) දක්නාසුලු වූ ශාක්‍යකුලජ්‍යෙෂ්ඨ වූ (දත යුතු සියල්ල) විශෙෂයෙන් දන්නා වූ ගෞතම බුදුරජ තෙමේ (මොහු) අග්‍රස්ථානයෙහි තබන්නේ ය'' (කියාසි).

1165. උතුම් දමනයෙහි දමුනෙමි. මා විසින් සිත මැනැවින් පිහිටුවා ගන්නාලදී. (එසේ ම) මා විසින් සියලු බර බහා තබනලදී. ආශ්‍රව රහිත ව (කෙලශ පරිනිර්වාණයෙන්) පිරිනිවුනෙමි වෙමි.

1166. (සිරුරෙන් රැස් විහිදෙන බැවින් හෝ අඞ්ගිරස් නම් රුසිහුගේ පරපුරෙහි වූ බැවින්) **අංගීරස** නම් වූ (සතර අගතියට හෝ සතර අපායට නො යන බැවින්) මහානාග වූ ශ්‍රෙෂ්ඨ ජන්ම ඇත්තා වූ කෙශරසිංහයකු වැනි වූ (සර්වඥ තෙමේ) භික්ෂුසංඝයා මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තබන්නේ ය.

1167. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **කොටිකණ්ණ** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**සොණකොටිකණ්ණස්ථවිරාපදානය දෙවැනි සී.**

## 43. කාළිගොධාපුත්‍රභද්දියස්ථවිරාපදානය

1168. සියලු ලෝකයෙහි අසහාය නායක වූ මෙත් සිත් ඇති මහා මුනි වූ **පදුමුත්තර** බුදුරදුන් වෙත සියලු ජනසමූහයා එළඹෙයි.

1169. සියල්ලෝ නිරන්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි (භික්ෂුසංඝයාට ද ශාස්තෘන් වහන්සේට ද) වස්ත්‍ර ද සෙනසුන් ද පාන හා භොජන ද (යන) ආමිසය දෙත්.

1170. මම ද බුදුරජානන් වහන්සේ ද අනුත්තර වූ සංඝයා ද පවරා, දෙවියන්ට දෙව් වූ තාදිගුණ ඇති බුදුරජානන් වහන්සේට දනක් දෙමි.

1171. මා විසින් මෙහෙයන ලද්දා වූ ඒ මනුෂ්‍යයෝ ද තථාගතයන් වහන්සේ ද නිරන්තරපුණ්‍යක්ෂෙත්‍රය වූ සියලු භික්ෂුසංඝයා ද පැවරූහ.

1172. සතසහස්ස[1]පල්ලඞ්කං සොවණ්ණං ගොණකත්ථතං,
තූලිකා පටලිකාය[2] ඛොමකප්පාසිකෙහි[3] ච,
මහාරහං පඤ්ඤපෙසිං ආසනං බුද්ධයුත්තකං.

1173. පදුමුත්තරො ලොකවිදූ දෙවදෙවො නරාසභො,
භික්ඛුසංඝපරිබ්බූළ්හො මම ද්වාරං උපාගමි.

1174. පච්චුග්ගන්ත්වාන සම්බුද්ධං ලොකනාථං යසස්සිනං,
පසන්නචිත්තො සුමනො අභිනාමයිං සකං[4] ඝරං.

1175. භික්ඛූනං සතසහස්සං බුද්ධඤ්ච ලොකනායකං,
පසන්නචිත්තො සුමනො පරමන්නෙන තප්පයිං.

1176. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

1177. “යෙනිදං ආසනං දින්නං සොවණ්ණං ගොණකත්ථතං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1178. චතුසත්තතික්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
අනුභොස්සති සම්පත්තිං අච්ඡරාහි පුරක්ඛතො.

1179. පදෙසරජ්ජං සහස්සං වසුධං ආවසිස්සති,
එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති.

1180. සබ්බාසු භවයොනීසු උච්චාකුලී[5] භවිස්සති,
සො ච පච්ඡා පබ්බජිත්වා සුක්කමූලෙන චොදිතො,
භද්දියො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.”

1181. විවෙකමනුයුත්තො'ම්හි පන්තසෙනනිවාසහං,
ඵලඤ්චාධිගතං සබ්බං චත්ත[6]කෙලෙසො'ම්හි අජ්ජ'හං.

1182. මම සබ්බං අභිඤ්ඤාය සබ්බඤ්ඤූ ලොකනායකො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

1183. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා **භද්දියො කාළිගොධාය පුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කාළිගොධාපුත්තස්ස භද්දියත්ථෙරස්ස අපදානං තතියං.**

1. සහස්සං, P T S. සෙ. 2. පටලිකා ච, ථෙ.
3. කප්පාසිකෙපි, ථෙ. 4. අභිනාමයිතං, ථෙ සංඝරං, මජසං.
5. කුලීනොච, ථෙ. 6. ඡින්න, ථෙ.

1172. කොඳුපලස් අතුරණ ලද්දා වූ ද, පුළුන්ඇතිරි හා ඝන පුප් එළුලොම්ඇතිරි අතුරණ ලද්දා වූ ද, කොමුඇතිරියෙන් හා කපුඇතිරියෙන් අතුරණ ලද්දාවූ ද, සවර්ණමය වූ (පාදයන්හි ව්‍යාලරූප තගා කළ) සියක් දහසක් අගනා මහාඝී වූ බුදුන්ට යොග්‍ය වූ අසුනක් පැණවීමි.

1173. දෙවියන්ට ද දෙව් වූ නරශ්‍රෙෂ්ඨ වූ **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලදසේක් මාගේ ගෙදොරට එළඹි සේක.

1174. ලොකනාථ වූ යශස් ඇති සම්බුදුරජාණන් වහන්සේට පෙරගමන් කොට පහන් සිත් ඇත්තෙම් සතුටු ව සවකීය ගෘහය (තුළට) වැඩම කරවීමි.

1175. පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් භික්ෂූන් සියක් දහස ද ලොකනායක වූ බුදුරජුන් ද කිරිබතින් සන්තර්පණය කෙළෙමි.

1176. පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවන්ට ගෙයක් බඳු වූ **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ භික්ෂුසංඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළ සේක:

1177. "යමකු විසින් කොඳුපලස් අතුරණ ලද සවර්ණමය වූ මේ අසුන දෙන ලද ද, ඔහු (කවරෙක් දැ යි) මම කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ (වචනය) අසවු:

1178. හෙතෙමේ සූසැත්තෑවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරණලදුයේ (දිව්‍ය)සම්පත් අනුභව කරන්නේ ය.

1179. දහස්වරක් ප්‍රදෙශරාජ්‍යය කරමින් පොළොවෙහි වසන්නේ ය. එක්පණස්වරක් සක්විතිරජ ද වන්නේ ය.

1180. සියලු භවයොනීන්හි උසස් කුල ඇත්තේ වන්නේ ය. කුශල මූලයන් විසින් මෙහෙයනලද හෙතෙමේ පසු ව පැවිදි ව නමින් භද්දිය නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය" (කීයායි).

1181. මම විවෙකයෙහි යෙදුනෙම් වෙමි. අරණ්‍යෙහි දුරසෙනසුන්හි වසන්නෙම් වෙමි. (මා විසින්) සියලු (ශ්‍රාමණ්‍ය)ඵල ද ලබනලදී. අද මම හරණලද කෙලශ ඇත්තෙම් වෙමි

1182. ලොකනායක වූ සර්වඥතෙමේ මා පිළිබඳ සියල්ල දැන භික්ෂුසඞ්ඝයා මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

1183. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **කාළිගොධාපුත්‍රභද්දියස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සී.

**කාළිගොධාපුත්‍රභද්දියස්ථවිරාවදානය නවැනි සී.**

## 44. සන්නිට්ඨාපකත්ථෙරාපදානං

1184. අරඤ්ඤෙ කුටිකං කත්වා වසාමි පබ්බතන්තරෙ,
ලාභාලාභෙන සන්තුට්ඨො යසෙන අයසෙන ච.

1185. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
වසීසතසහස්සෙහි ආගච්ඡි මම සන්තිකං.

1186. උපාගතං මහාවීරං ජලජුත්තරනාමකං,
තිණසන්ථරං පඤ්ඤපෙත්වා අදාසිං සත්ථුනො අහං.

1187. පසන්නචිත්තො සුමනො ආමණ්ඩං පානියඤ්ච'හං,
අදාසිං උජුභූතස්ස විප්පසන්නෙන චෙතසා.

1188. සතසහස්සෙ ඉතො කප්පෙ[1] යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ආමණ්ඩස්ස ඉදං ඵලං.

1789. එකතාළීසකප්පම්හි එකො ආසිං අරින්දමො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1190. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සන්නිට්ඨාපකො**[2] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සන්නිට්ඨාපකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 45. පඤ්චහත්ථියත්ථෙරාපදානං

1191. **සුමෙධො** නාම සම්බුද්ධො ගච්ඡතෙ අන්තරාපණෙ,
ඔක්ඛිත්තචක්ඛු[3] මිතභාණී සතිමා සංවුතින්ද්‍රියො.

1192. පඤ්ච උප්පලහත්ථානි ආවෙලත්ථං අහංසු[4] මෙ,
තෙන බුද්ධං අපූජෙසිං පසන්නො සෙහි පාණිභි.

1193. ආරොපිතා ච තෙ පුප්ඵා ඡදනං ආසු[5] සත්ථුනො,
සංසාවිංසු[6] මහානාගං සිස්සා ආචරියං යථා.

1194. තිංසකප්පසහස්සම්හි යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1195. ඉතො වීසකප්පසතෙ අහෙසුං පඤ්ච ඛත්තියා,
**හත්ථියා** නාම නාමෙන චක්කවත්තී මහබ්බලා.

1196. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චහත්ථියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චහත්ථියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

---

1. ඉතො කප්පසතසහස්සෙ, සෙ. 2. සන්නිධාපකො, සී මු.
3. ඛිත්තචක්ඛු, (සබ්බත්ථ) 4. ආවෙලත්ථමකාසි, PTS. සෙ.
5. අංස, මජසං. PTS. සෙ. අංසු, අ. 6. සමාහිංසු, මජසං.

## 44. සතනිට්ඨාපකසථවිරාවදානය

1184. (මම) ලාභ අලාභ දෙකින් ද, යස අයස දෙකින් ද, (සම සේ) සතුටු වූයෙම් කඳු අතුරෙහි වූ අරණෙහි කුටියක් තොට (ගෙණ) වෙසෙමි.

1185. පූජාවත් පිළිගන්නා වූ නොහොත් පූජාවන්ට ගෘහයක් වැනි වූ පදුමුත්තර බුදුරජතෙමේ සියක් දහසක් භික්ෂූන් විසින් පිරිවරණ ලදුයේ මාගේ සමීපයට එළඹියේ ය.

1186. එළඹ සිටි පදුමුත්තර නම් වූ මහාවීරයන් වහන්සේ (දැක) මම ඒ ශාස්තෘන් වහන්සේට තණඇතිරියක් පණවා දිනිමි.

1187. පැහැදුනු සිත් ඇති සොම්නස් සහිත වූ මම සෘජුගුණ ඇති බුදුරජානන් වහන්සේට පහන් සිතින් කැකිරි ද පැන් ද දිනිමි.

1188. මෙයින් කල්ප ලක්ෂයකින් පෙර වූ එකල්හි (මම) යම් දනක් දුන්නෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කැකිරි දනයාගේ මේ ඵලය යි.

1189. එක්සාළිස්වන කපෙහි සත්රුවනින් යුක්ත වූ මහත් බල ඇති අම්බඳම නම් සක්විතිරජෙක් වීමි.

1190. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් සතනිට්ඨාපක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**සතනිට්ඨාපකසථවිරාවදානය සිවුවැනි යි.**

## 45. පඤ්චහත්ථියසථවිරාවදානය

1191. යටට හෙළන ලද ඇස් ඇති ප්‍රමාණවත් වචන ඇති, සිහියෙන් යුත් සංවරණය කරණලද ඉඳුරන් ඇති, සුමෙධ නම් බුදුරජතෙමේ ඇතුළ වීථියෙහි වඩනා කල්හි-

1192. මට මුදුන්මල්කඩ පිණිස උපුල්අත් (උපුල්මිටි) පසක් ගෙණාවාහු ය. මම පහන් වූයෙම් ඒ මලින් සියතින් බුදුන් පිදීමි.

1193. උඩට නැගුනු ඒ මල් බුදුරජානන් වහන්සේට වියනක් වී ය. ශිෂ්‍යයෝ ගුරුවරයෙකුගේ මෙන් සියලු පුෂ්පයෝ බුදුරජානන් වහන්සේගේ හිමන් තිවූහ.

1194. මෙයින් තිස්දහස්වන කපෙහි යම් මල් රුසක් (බුදුන් මුදුනෙහි) එළවූයෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1195. මෙයින් දෙදහස්වන කපෙහි නමින් හත්ථිය නම් වූ මහත් බල ඇති සක්විතිරජවරු පස්දෙනෙක් වූහ.

1196. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් පඤ්චහත්ථියසථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පඤ්චහත්ථියසථවිරාවදානය පස්වැනි යි.**

## 46. පදුමච්ඡදනියත්ථෙරාපදානං

1197. නිබ්බුතෙ ලොකනාථම්හි **විපස්සි**මහග්ගපුග්ගලෙ,
සුඵුල්ලං පදුමං ගය්හ චිතකමාරොපයිං අහං.[1]

1198. ආරොපිතෙ ච චිතකෙ වෙහාසං නභමුග්ගමි,
ආකාසච්ඡදනං කත්වා චිතකම්හි අධාරයිං.[2]

1199. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1200. සත්තනාළීසිතො කප්පෙ **පදුමිස්සර**නාමකො,
චාතුරන්තො විජිතාවී චක්කවත්තී මහබ්බලො.

1201. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදුමච්ඡදනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමච්ඡදනියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 47. සයනදායකත්ථෙරාපදානං

1202. **සිද්ධත්ථස්ස** භගවතො මෙත්තචිත්තස්ස තාදිනො,
සයනග්ගං මයා දින්නං දුස්සභණ්ඩෙහි අත්ථතං.

1203. පටිග්ගහෙසි භගවා කප්පියං සයනාසනං,
උට්ඨාය ආසනා තම්හා වෙහාසං උග්ගමී ජිනො.

1204. චතුනවුතෙ ඉතො කප්පෙ යං සයනමදාසහං,
දුග්ගතිං නාභිජානාමි සයනදානස්සිදං[3] ඵලං.

1205. එකපඤ්ඤාසිතො කප්පෙ **වරුණො**[4] දෙවසව්හයො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1206. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සයනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සයනදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 48. චඞ්කමදායකත්ථෙරාපදානං

1207. **අත්ථදස්සිස්ස** මුනිනො ලොකජෙට්ඨස්ස තාදිනො
ඉට්ඨකාහි චිනිත්වාන චඞ්කමං කාරයිං අහං.

1208. උච්චතො පඤ්චරතනං චඞ්කමං සාධු මාපිතං,
ආයාමතො හත්ථසතං භාවනීයං[5] මනොරමං.

1209. පටිග්ගහෙසි භගවා **අත්ථදස්සී** නරුත්තමො,
හත්ථෙන පුලිනං ගය්හ ඉමා ගාථා අභාසථ:

---

1. තද, සීමු. 2. අධාරයි, සී මු. 3. සයනස්ස ඉදං, මජ්ඣං.
4 වරකො, මජ්ඣං. 5. භාවනීයං, මජ්ඣං.

## 46. පදුමච්ඡදනියස්ථවිරාවදානය

1197. එකල්හි අග්‍රපුද්ගල වූ **විපස්සී** බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි මම මැනැවින් පිපුනු පියුම් ගෙණ චිතකයට පිදීමි.

1198. චිතකයට නැඟූ කල්හි (ඒ පියුම්) අහසට නැගුනේ ය. එය අහසෙහි වියනක් කොට චිතකයෙහි දැරීමි.

1199. මෙයින් එක්අනූවන කපෙහි යම් මලක් පිදුවෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1200. මෙයින් සත්සාළිස්වන කපෙහි සිවුමහදිවයින් හා සිවු සයුරු කෙලවර කොට ඇති පෘථිවීශ්වර වූ, සතුරු රජුන් ජය ගන්නාසුළු වූ මහත් බල ඇති **පදුමිස්සර** නම් සක්විතිරජෙක් වීමි.

1201. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් **පදුමච්ඡදනියස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පදුමච්ඡදනියස්ථවිරාවදානය සවැනි යි.**

## 47. ශයනදායකස්ථවිරාවදානය

1202. තාදිගුණ ඇති මෛත්‍රී සිත් ඇති **සිද්ධත්ථ** භාග්‍යවතුන් වහන්සේට ඇතිරි ආදි වූ දුස්සභණ්ඩයන්ගෙන් අතුරණ ලද උතුම් සයනයක් මා විසින් දෙනලදී.

1203. භාග්‍යවතුන් වහන්සේ ඒ කැප ශයනාසනය පිළිගත් සේක. පස්මරුන් දිනූ බුදුරජතෙමේ ඒ අසුනින් නැගිට අහසට නැගුනේ ය.

1204. මම මෙයින් සිවුඅනූවන කපෙහි යම් සයනයක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සයනදානයාගේ මේ විපාකය යි.

1205. මෙයින් එක්පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහා බල ඇති **වරුණදෙව** නම් සක්විතිරජෙක් වීමි.

1206. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ශයනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**ශයනදායකස්ථවිරාවදානය සත්වැනි. යි**

## 48 චඞ්ක්‍රමදායකස්ථවිරාවදානය

1207. මම ලොකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති **අත්ථදස්සී** බුදුරජාණන් වහන්සේට ගඩොළින් බැඳ සක්මනක් කරවීමි.

1208. එය මැනැවින් කරණ ලද්දකි. උසින් පස්රියනකි. දිගින් රියන් සියයකි. සිහි කට යුත්තකි. මනොඥ ය.

1209. නරශ්‍රෙෂ්ඨ වූ **අත්ථදස්සී** භාග්‍යවත් තෙමේ ඒ සක්මන පිළිගත්තේ ය. අතින් (එයින්) වැලි (ටිකක්) ගෙණ මේ ගාථාවන් වදාළේ ය:

1210. "ඉමිනා පුලිනදානෙන චඞ්කමං සුකතෙන ච,
සත්තරතනසම්පන්නං පුලිනං අනුභොස්සති.

1211. තීණි කප්පානි දෙවෙසු දෙවරජ්ජං කරිස්සති,
අනුභොස්සති සම්පත්තිං අච්ඡරාහි පුරක්ඛතො.

1212. මනුස්සලොකං ආගන්ත්වා රාජා රට්ඨෙ භවිස්සති,
තික්ඛත්තුං චක්කවත්තී ච මහියා සො භවිස්සති."

1213. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි චඞ්කමස්ස ඉදං ඵලං.

1214. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා චඞ්කම[1]දායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

චඞ්කමදායකත්ථෙරස්ස* අපදානං අට්ඨමං.

## 49. සුභද්දත්ථෙරාපදානං

1215. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
ජනතං උද්ධරිත්වාන නිබ්බායති මහායසො.

1216. නිබ්බායන්තෙ ච සම්බුද්ධෙ දසසහස්සී පකම්පථ,[2]
ජනකායො මහා ආසි දෙවා සන්නිපතුං තදා.

1217. චන්දනං පූජයිත්වාන[3] තගර[4]මල්ලිකාහි ච,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ආලෙපෙසිං[5] තරුත්තමං.

1218. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
නිපන්නකොව සම්බුද්ධො ඉමා ගාථා අභාසථ:

1219. "යො මෙ පච්ඡිමකෙ කාලෙ ගන්ධමාල්‍යෙන[6] ඡාදයි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1220. ඉතො චුතො අයං පොසො තුසිතකායං ගමිස්සති,
තත්ථ රජ්ජං කරිත්වාන නිම්මානං සො ගමිස්සති.

1221. එතෙනෙව උපායෙන දත්වා මල්‍යං[7] වරුත්තමං,
සකකම්මාභිරද්ධො සො සම්පත්තිං අනුභොස්සති.

1222. පුනාපි තුසිතෙ කායෙ නිබ්බත්තිස්සතයං නරො,
තම්හා කායා චවිත්වාන මනුස්සත්තං ගමිස්සති.

1223. සක්‍යපුත්තො මහානාගො අග්ගො ලොකෙ සදෙවකෙ,
බොධයිත්වා බහූ සත්තෙ නිබ්බායිස්සති චක්ඛුමා.

1. චඞ්කමන, මජසං. සෙ. 2. දසසහස්සිකම්පථ, මජසං.
3 පූරයිත්වාන, සීමු. මජසං. 4. තගරා, මජසං.
5. අරොපෙසිං, සෙ. ස්‍යා. ආරොපයිං මජසං. 6. මාලෙන, මජසං. මල්ලෙන, ස්‍යා.
7. මාලං, මජසං. මල්‍යා, ස්‍යා. * චඞ්කමනදායකත්ථෙරස්ස, මජසං.

1210. මේ වැලි දීමේ හේතුවෙන් ද, සක්මන මැතැවින් කළ හේතුවෙන් ද සත්රුවනින් යුත් වැලි (පරිභොගයට) ලබන්නේ ය.

1211. තුන්කපක් මුළුල්ලෙහි දෙවියන් අතර දිව්‍යරාජ්‍යය කරන්නේ ය. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ (දිව්‍ය) සම්පත් අනුභව කරන්නේ ය.

1212. මිනිස්ලොවට පැමිණ රටෙහි රජ වන්නේ ය. හෙතෙමේ තෙවරක් පෘථිවියෙහි සක්විතිරජ වන්නේ ය" (කියායි).

1213. එක්දහස්අටසියවන කල්පයෙහි වූ එකල්හි (මම) යම් කර්මයක් කෙළෙම් ද ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. චඞ්ක්‍රමදායකයාගේ මේ විපාකය යි.

1214. ප්‍රතිසම්භිදාවෝ -ප- බුද්ධරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චඞ්ක්‍රමදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**චඞ්ක්‍රමදායකස්ථවිරාවදානය අටවැනි යි.**

## 49. සුභද්‍රස්ථවිරාවදානය

1215. පූජාවන් පිළිගන්නා වූ මහ පිරිවර ඇති **පදුමුත්තර** බුද්ධරජානන් වහන්සේ ජනසමූහයා සසරින් ගොඩ නගා පිරිනිවන් පෑසේක.

1216. ඒ බුද්ධරජානන් වහන්සේ පිරිනිවන් පානා කල්හි දසදහසක් ලෝධා කම්පිත වී ය. (රැස් වූ) ජනසමූහයා ද මහත් වී ය. එකල්හි දෙවියෝ ද රැස් වූහ.

1217. සතුටු වූයෙම් සතුටු සිතින් තුවරලා හා බෝලිද්දමලින් යුත් සඳුන් පුද නරොත්තමයන් වහන්සේට සඳුතින් අලෙවූ දිනිමි.

1218. ලොකයෙහි නිරුත්තර ශාස්තෘ වූ සම්බුද්ධරජ තෙමේ (පරිනිර්වාණ මඤ්චකයෙහි) හොත්තේ ම මාගේ අදහස් දැන මේ ගාථාවන් වදාළේ ය:

1219. "යමෙක් මාගේ අන්තිමකාලයෙහි මා ගඳින් මලින් පිදී ද, ඔහු ප්‍රකට කරන්නෙමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු.

1220. මේ පුරුෂතෙමේ මෙයින් චුත ව **තුෂිත** දෙව්ලොවට යන්නේ ය. හෙතෙමේ එහි රාජ්‍යය කොට **නිර්මාණරති** දෙව්ලොවට යන්නේ ය.

1221. මේ ක්‍රමයෙන් ම උතුම් මල් පුද සවකීයකර්මයෙන් තුටු වූයේ සම්පත් අනුභව කරන්නේ ය.

1222. මේ මිනිස් තෙමේ නැවත ද **තුෂිත**දෙව්ලොව උපදින්නේ ය. ඒ අත්බැවින් චුත ව මිනිසත්බවට පැමිණෙන්නේ ය.

1223. ශාක්‍යපුත්‍ර වූ මහොත්තම වූ දෙවියන් සහිත ලොකයෙහි අග්‍රපුද්ගල වූ පසැස් ඇති ගෞතම බුද්ධරජතෙමේ බොහෝ සත්ත්වයන්ට ධර්මාවබොධය කරවා පිරිනිවන් පානේ ය.

1224. පබ්බජ්ජුපගතො[1] සන්තො සුක්කමූලෙන චොදිතො,
උපසඞ්කම්ම සම්බුද්ධං පඤ්හං පුච්ඡිස්සතී තදා.

1225. හාසයිත්වාන[2] සම්බුද්ධො සබ්බඤ්ඤූ ලොකනායකො,
පුඤ්ඤකම්මං පරිඤ්ඤාය සච්චානි විවරිස්සති.

1226. ආරද්ධො ච අයං පඤ්හෙ තුට්ඨො එකග්ගමානසො,
සත්ථාරං අභිවාදෙත්වා පබ්බජ්ජං යාචයිස්සති.

1227. පසන්නමානසං දිස්වා සකකම්මෙන තොසිතං,
පබ්බාජෙස්සති සො බුද්ධො අග්ගධම්මස්ස කොවිදො.

1228. වායමිත්වාන'යං පොසො සම්මාසම්බුද්ධසාසනෙ,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො".

(පඤ්චමභාණවාරං.)

1229. පුබ්බකම්මෙන සංයුත්තො එකග්ගො සුසමාහිතො,
බුද්ධස්ස ඔරසො පුත්තො ධම්මජො'මහි සුනිම්මිතො.

1230. ධම්මරාජං උපාගම්ම[3] ආපුච්ඡිං පඤ්හමුත්තමං,
කථයන්තො ච මෙ පඤ්හං ධම්මසොතං උපානයී.

1231. තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1232. සතසහස්සෙ ඉතො කප්පෙ ජලජුත්තරනායකො,
නිබ්බායි අනුපාදානො දීපො'ව තෙලසඞ්ඛයා.

1233. සත්තයොජනිකං ආසි ථූපඤ්ච රතනාමයං,
ධජං තත්ථ අපූජෙසිං සබ්බභද්දං මනොරමං.

1234. කස්සපස්ස ච බුද්ධස්ස තිස්සො නාමග්ගසාවකො,
පුත්තො මෙ ඔරසො ආසි දායාදො ජිනසාසනෙ.

1235. තස්ස හීනෙන මනසා වාචං භාසිං අභද්දකං,
තෙන කම්මවිපාකෙන පච්ඡිමෙ අද්දසං ජිනං[4].

1236. උපවත්තනෙ සාලවනෙ පච්ඡිමෙ සයනෙ මුනි,
පබ්බාජෙසි මහාවීරො හිතො කාරුණිකො ජිනො.

1237. අජ්ජෙව'දානි පබ්බජ්ජා අජ්ජෙව උපසම්පදා,
අජ්ජෙව පරිනිබ්බාණං සම්මුඛා දිපදුත්තමෙ.

1238. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සුභද්දො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුභද්දත්ථෙරස්ස අපදානං නවමං.**

---

1. තදූසොපගතො, සීමු. මජසං.
2. හාසයිත්වාන, සෙ. P T S. 3. උපාගන්ත්වා, P T S.
4. පච්ඡා මෙ ආසි භද්දකං, මජසං. සෙ.

1224. හේ කුශලමූලයෙන් මෙහෙයන ලද්දේ තවුස් පැවිද්දෙන් පැවිදි වූයේ ම එකල්හි බුදුරජුන් කරා එළඹ ප්‍රශ්න විචාරන්නේ ය.

1225. ලොකනායක වූ සර්‍වඥ වූ (ගෞතම) බුදුරජ තෙම ඔහු සතුටු කොට (පෙර කළ) පුණ්‍යකර්‍මයන් පිරිසිඳ දැන සත්‍යයන් ප්‍රකට කරන්නේ ය.

1226. මෙතෙමේ ප්‍රශ්න (විසර්ජන)යෙන් ආරාධිත වූයේ සතුටු වූයේ එකඟ සිත් ඇත්තේ ශාස්තෲන් වහන්සේ වැඳ පැවිද්ද ඉල්ලන්නේ ය.

1227. අග්‍ර වූ (චතුරාර්‍ය්‍යසත්‍ය) ධර්‍මයෙහි දක්ෂ වූ ඒ සම්‍යක් සම්බුද්ධ තෙමේ සවකීයකර්‍මයෙන් සතුටට පැමිණි පහන් සිත් ඇති ඔහු දැක පැවිදි කරන්නේ ය.

1228. මේ පුරුෂ තෙම බුදුසසුන්හි වීර්‍ය්‍ය වඩා සියලු ආස්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දැන (දුරු කොට) ආස්‍රව රහිත ව පිරිනිවන් පානේ ය'' (කියා යි).

(පස්වැනි බණවර යි.)

1229. (මම) පෙර කළ කුශලකර්‍මයෙන් යුක්ත වූයෙම් එකඟ සිත් ඇත්තෙම් සන්හිඳුනෙම් බුදුරදුන් උරදෑ පුත් වූයෙම් (කර්‍මස්ථාන) ධර්‍මයෙන් ආර්‍ය්‍යජාතියෙහි උපන්නෙම් නිම කළ මගකිස ඇත්තෙම් වීමි.

1230 බුදුරජුන් වෙත එළඹ උතුම් ප්‍රශ්න විචාළෙමි. ඔබ මට ප්‍රශ්න (විසඳා) වදාරන්නාහු ම (නිර්‍වාණ සඞ්ඛ්‍යාත) ධර්‍මප්‍රවාහය එළවූහ.

1231. මම උන්වහන්සේගේ ධර්‍මය දැන සසුනෙහි ඇලුනෙම් විසීමි. සියලු ආස්‍රවයන් ප්‍රහාණපරිඥාවශයෙන් දැන (දුරු කොට) ආස්‍රව රහිත ව වෙසෙමි.

1232. මෙයින් කල්පලක්ෂයකට පෙර **පදුමුත්තර** නම් බුදුරජාණන් වහන්සේ තෙල් ක්ෂීණ වීමෙන් (නිවෙන) පහනක් මෙන් (පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත) උපාදාන රහිත ව පිරිනිවන් පෑසේක.

1233. එහි උසින් සත්යොදුන් වූ රුවන්මුවා ස්තූපයෙක් වි ය. සියල්ලෙන් යහපත් වූ මනහර ධජයක් එහි පිදීමි.

1234. තව ද **කාශ්‍යප** බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි දායාද වූ **තිස්ස** නම් අග්‍රශ්‍රාවක තෙමේ මාගේ ඖරසපුත්‍රයා විය.

1235. ඒ මාගේ පුත්‍ර **තිස්ස** නම් අග්‍රශ්‍රාවකයන් වහන්සේට ලාමක සිතින් අයහපත් වචනයක් (-''අන්තකයා, පශ්චිමයා'') යන වචනය කීමි. ඒ කර්‍මවිපාකයෙන් පශ්චිම (පරිනිර්‍වාණ) කාලයෙහි බුදුරජු දිටිමි.

1236. මහාවීර වූ සත්ත්වලොකයාට හිත වූ කාරුණික වූ පස්මරුන් දිනූ (ගෞතම) බුදුරජාණන් වහන්සේ **උපවත්තන**සාලවනයෙහි පරිනිර්‍වාණ මඤ්චකයෙහි දී මා පැවිදි කළ සේක.

1237. බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි අද ම (මාගේ) පැවිද්ද විය. අද ම උපසම්පදාව විය. අද ම පරිනිර්‍වාණය ද විය.

1238. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සුභද්‍රස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේ ක.

**සුභද්‍රස්ථවිරාවදානය නවවැනි යි.**

## 50. චුන්දත්ථෙරාපදානං

1239. **සිද්ධත්ථස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
අග්ඝියං කාරයිත්වාන ජාතිපුප්ඵෙහි ඡාදයිං.

1240. නිට්ඨාපෙත්වාන තං පුප්ඵං බුද්ධස්ස උපනාමයිං,
පුප්ඵාවසෙසං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

1241. කඤ්චනග්ඝියසඞ්කාසං බුද්ධං ලොකග්ගනායකං,
පසන්නචිත්තො සුමනො පුප්ඵග්ඝියමුපානයිං.

1242. විතිණ්ණකඞ්ඛො සම්බුද්ධො තිණ්ණොඝෙහි පුරක්ඛතො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

1243. "දිබ්බගන්ධං පවායන්තං යො මෙ පුප්ඵග්ඝියං අදා,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1244. ඉතො චුතො අයං පොසො දෙවසංඝපුරක්ඛතො,
ජාතිපුප්ඵෙහි පරිකිණ්ණො දෙවලොකං ගමිස්සති.

1245. උබ්බිද්ධං භවනං තස්ස සොවණ්ණඤ්ච මණීමයං,
ව්‍යම්හං පාතුභවිස්සති පුඤ්ඤකම්මප්පභාවිතං.

1246. චතුසත්තතික්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
අනුභොස්සති සම්පත්තිං අච්ඡරාහි පුරක්ඛතො.

1247. පථව්‍යා රජ්ජං තිසතං වසුධං ආවසිස්සති,
පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති.

1248. **දුජ්ජයො** නාම නාමෙන හෙස්සති මනුජාධිපො,
අනුභොත්වාන තං පුඤ්ඤං සකකම්මං අපස්සිතො.

1249. විනිපාතං අගන්ත්වාන[1] මනුස්සත්තං ගමිස්සති,
හිරඤ්ඤස්ස ච නිචිතං කොටිසතමනප්පකං.

1250. නිබ්බත්තිස්සති යොනිම්හි[2] බ්‍රාහ්මණෙ[3] සො භවිස්සති,
**වඞ්ගන්තස්ස** සුතො ධීමා **සාරියා** ඔරසො පියො.

1251. සො ච පච්ඡා පබ්බජිත්වා අඞ්ගීරසස්ස සාසනෙ,
**චූළචුන්දො**'ති නාමෙන හෙස්සති සත්ථු සාවකො.

1252. සාමණෙරො'ව සො සන්තො ඛීණාසවො භවිස්සති,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො".

1253. උපට්ඨිහිං මහාවීරං අඤ්ඤෙ ච පෙසලෙ බහූ,
භාතරං මෙ චුපට්ඨාසිං උත්තමත්ථස්ස පත්තියා.

1254. භාතරං මෙ උපට්ඨිත්වා ධාතු පත්තම්හි ඔපිය,
සම්බුද්ධං උපනාමෙසිං ලොකජෙට්ඨං නරාසභං.

1. ආගන්ත්වා, P T S. සෙ. 2. ලොකම්හි, P T S. 3. බ්‍රාහ්මණො, මජ්ඣං. P T S.

# 50. චූළසුගන්ධිවිරාවදනය

1239. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට රත්ඇගෑයක් කරවා දූසමන්මලින් වැසීමි.

1240. ඒ මල් (වසා) තිමවා බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි. ඉතිරි මල් අතින් ගෙණ බුදුරජාණන් වහන්සේ මත්තෙහි විසුරුවා හලෙමි.

1241. පහන්සිතින් යුත් සොම්නස් වූ (මම) රත්ඇගෑයක් සේ බබලන බුදුරජුන්ට මල්ඇගෑය පිළිගැන්වීමි.

1242. තරණය කළ සැක ඇති බුදුරජාණන් වහන්සේ තරණය කළ ඔඝ ඇත්තවුන් (=රහතුන්) විසින් පිරිවරණ ලදසේක් මේ ගාථාවන් වදාළසේක:

1243. "යමෙක් මට දිව්‍යසුවඳ හමන මල්ඇගෑයක් දුන්නේ ද, ඔහු මම ප්‍රකට කරන්නෙමි. එය කියන්නා වූ මාගේ වචනය අසවු.

1244. මේ පුරුෂතෙමේ මෙයින් ච්‍යුත වූයේ දිව්‍යසමූහයා විසින් පිරිවරණ ලදුයේ සමන් මලින් ගැවසී ගත්තේ දෙව්ලොවට යන්නේ ය.

1245. ඔහුට පුණ්‍යකර්මයෙන් හටගත්තා වූ සවර්ණමය වූ ද මාණිමය වූ ද පැනතැගුනු සඳලු සහිත විමානයක් පහළ වන්නේ ය.

1246. හෙතෙම සූසැත්තෑවරක් දෙව්රජය කරන්නේ ය. අප්සරාවන් විසින් පිරිවැරුණේ සම්පත් අනුභව කරන්නේ ය.

1247. තෙසියවරක් පෘථිවිරාජ්‍යය ලැබ පොළොවෙහි වාසය කරන්නේ ය. පන්සැත්තෑවරක් සක්විතිරජවන්නේ ය.

1248. තමින් දුජ්ජය නම් රජෙක් වන්නේ ය. සවකීය කර්මය ඇසුරු කෙළේ ඒ පින් පල විඳ,

1249-1250. දුගතියකට නො ගොස් මිනිසත්බවට යන්නේ ය. ඔහුගේ නොඅඩු කෙළසියක් රන් නිදන්ගත වෙයි. හෙතෙම බමුණු කුලයෙහි උපදින්නේ ය. වඞ්ගන්තබ්‍රාහ්මණයාගේ ද සාරී නම් බැමිණියගේ ද ප්‍රාඥ වූ ප්‍රිය වූ ඖරසපුත්‍රයෙක් වන්නේ ය.

1251 හෙ ද පසු ව සම්බුදුසසුනෙහි පැවිදි ව නමින් චූලචුන්ද නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

1252. හෙ තෙම සාමණේර වූයේ ම රහත් වන්නේ ය. සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥාවශයෙන් දැන (දුරු කොට) ආශ්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය" කියා සි.

1253. උත්තමාර්ථයට (රහත්බවට) පැමිණීම පිණිස මහාවීර වූ බුදුරජාණන් වහන්සේට ද අනිත් ප්‍රියශීල වූ බොහෝ සඞ්ඝයාට ද උපස්ථාන කෙළෙමි. මාගේ සොහොයුරු (ශාරීපුත්‍රයන්) හට උවටැන් ද කෙළෙමි.

1254. මාගේ සොහොයුරාට උවටැන් කොට (උන්වහන්සේ පිරිනිවි කල්හි) ධාතූන් පාත්‍රයෙහි බහා ගෙණ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි.

1255. උභො හත්ථෙහි පග්ගය්හ බුද්ධො ලොකෙ සදෙවකෙ,
සංදස්සයන්තො තං ධාතුං කිත්තයී අග්ගසාවකං.

1256. චිත්තං ච සුවිමුත්තං මෙ සද්ධා මය්හං පතිට්ඨිතා,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

1257. පටිසම්භිදා අනුප්පත්තා විමොක්ඛාපි ච ඵස්සිතා,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චුන්දො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චුන්දත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

උපාලි සොණො භද්දියො සන්නිට්ඨාපක[1]හත්ථියො,
ඡදනං සෙය්‍යචඞ්කමං සුභද්දො චුන්දසව්හයො,
ගාථා සතං ච තාළීසං චතස්සො ච තදුත්තරි.

**උපාලිවග්ගො පඤ්චමො.**

## 51. විධූපනදායකත්ථෙරාපදානං

1258. පදුමුත්තරබුද්ධස්ස ලොකජෙට්ඨස්ස තාදිනො,
වීජනිකා[2] මයා දින්නා දිපදින්දස්ස තාදිනො.

1259. සකං චිත්තං පසාදෙත්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
සම්බුද්ධං අභිවාදෙත්වා පක්කාමිං උත්තරමුඛො.

1260. වීජනිං පග්ගහෙත්වාන සත්ථා ලොකෙ අනුත්තරො,[3]
භික්ඛුසංඝෙ ඨිතො සන්තො ඉමං ගාථං අභාසථ:

1261. "ඉමිනා වීජනිදානෙන චිත්තස්ස පණිධීහි ච,
කප්පානං සතසහස්සං විනිපාතං න ගච්ඡති".

1262. ආරද්ධවිරියො පහිතත්තො චෙතොගුණසමාහිතො,
ජාතියා සත්තවස්සො'හං අරහත්තමපාපුණිං.

1263. සට්ඨිකප්පසහස්සම්හි **වීජමානසනාමකා**[4],
සොළසා'සිංසු රාජානො චක්කවත්තී මහබ්බලා.

1264. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **විධූපනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**විධූපනදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. සන්නිධාපක, සෙ. 2. බීජනිකා, මජසං.
3. සත්ථා ලොකග්ගනායකො, මජසං.
4. වීජනාමසමානකා, සෙ බීජමානසනාමකා, මජසං.

1255. දෙවියන් සහිත ලොකයෙහි සම්ඥ වූ (බුදුරජ තෙම) ධාතු දෙහොතින් තගාගෙණ දක්වන්නේ ඒ අගසව්වානන් පැසැසී ය.

1256. මාගේ සිත කෙලෙසුන්ගෙන් මැනැවින් මිදුනේ ය. මාගේ ශ්‍රද්ධාව මැනැවින් පිහිටියේ ය. සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥවශයෙන් දුන (දුරු කොට) ආශ්‍රව රහිත ව වෙසෙමි.

1257. සිවුපිළිසැඹියා ලැබින. විමොක්‍ෂයෝ පහන්නා ලදහ. ෂඩභිඥවෝ මා විසින් සාක්‍ෂාත්කෘතයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් චුන්‍දසථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේකි.

**චුන්‍දසථවිරාවදානය දසවැනි සී.**

උද්‍දානයః-

උපාලිසොණ බද්දිය - සන්නිට්ටාපක හත්තිය,
සියන් සෙය සක්මන් - සුබද සුදු යනි දසවත්,
එක්සියසුසාළිස් ගයකින් මෙහි කියන ලදී.

**උපාලිවග්ගය පස්වැනි සී.**

## 51. විධූපනදායකසථවිරාවදානය

1258. තාදිගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ ද්විපදෙත්තම වූ පදුමුත්තර බුදුරජානන් වහන්සේට මා විසින් විදුනාවක් දෙන ලදී.

1259. සිය සිත පහදවා ඇදිලි බැඳ සම්බුදුන් වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

1260. ලොකයෙහි අසහායශාස්තෘ වූ බුදුරජනන් වහන්සේ භික්‍ෂු සඞ්ඝයා මැද හිඳ විදුනාව ගෙණ මේ ගාථාව වදාලසේක:

1261. “මේ විජනී දානය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද කැලපලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො යයි” යනු සී.

1262. පිරිපුන් වීයසීය ඇති (නිවණ) කෙරෙහි මෙහෙයන ලද සිත් ඇති සමාධිගුණයෙන් යුත් උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමි.

1263. සැටදහසක් කපින් මතුයෙහි විජමාන යන සමාන නම් ඇති මහා බලවත් සක්විතිරජවරු සොළොස්දෙනෙක් වූහ.

1264. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් විධූපනදායක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේකි.

**විධූපනදායකසථවිරාවදානය පළමුවැනි සී.**

## 52. සතරංසිකත්ථෙරාපදානං

1265. උච්චියං[1] සෙලමාරුය්හ නිසීදි පුරිසුත්තමො,
පබ්බතස්සාවිදූරම්හි බ්‍රාහ්මණො මන්තපාරගූ.

1266. උපවිට්ඨං මහාවීරං දෙවදෙවං නරාසභං,
අඤ්ජලිම්පග්ගහෙත්වාන සන්ථවිං ලොකනායකං:

1267. "එස බුද්ධො මහාවීරො වරධම්මප්පකාසකො,
ජලතී අග්ගික්ඛන්ධො'ව භික්ඛුසංඝපුරක්ඛතො.

1268. මහාසමුද්දො 'වක්ඛොභො අණ්ණවො 'ව දුරුත්තරො,
මිගරාජා'වසම්භීතො ධම්මං දෙසෙති චක්ඛුමා".

1269. මම සඞ්කප්පමඤ්ඤාය **පදුමුත්තර**නායකො,
භික්ඛුසංඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ:

1270. "යෙනායං අඤ්ජලි දින්නො බුද්ධසෙට්ඨො ච ථොමිතො,
තිංසකප්පසහස්සානි දෙවරජ්ජං කරිස්සති.

1271. කප්පසතසහස්සම්හි **අංගීරස**සනාමකො,
විවත්තච්ඡද්දො[2] සම්බුද්ධො උප්පජ්ජිස්සති තාවදෙ.

1272. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
**සතරංසී**ති නාමෙන අරහා සො භවිස්සති."

1273. ජාතියා සත්තවස්සො'හං පබ්බජිං අනගාරියං,
**සතරංසී**'ම්හි නාමෙන පභා නිද්ධාවතෙ මම.

1274. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා ඣායී ඣානරතො අහං,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1275. සට්ඨිකප්පසහස්සම්හි චතුරො **රාම**[3]නාමකා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1276. පටිසම්භිදා –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සතරංසියො**[4] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සතරංසිකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 53. සයනදායකත්ථෙරාපදානං

1277. පදුමුත්තරබුද්ධස්ස සබ්බලොකානුකම්පිනො,
සයනං තස්ස පාදාසිං විප්පසන්නෙන චෙතසා.

1278. තෙන සයනදානෙන සුඛෙත්තෙ බීජසම්පදා,
භොගා නිබ්බත්තරෙ[5] තස්ස සයනස්ස ඉදං ඵලං.

---

1. උබ්බිද්ධං, මජසං. 2. විවත්තච්ඡදො, මජසං. සෙ 3. රොම, PTS. සෙ
4. සතරංසි, මජසං. 5. භොගො නිබ්බත්තතෙ,. PTS. සෙ.

## 52. සතරංසිකස්ථවිරාපදානය

1265. පුරුෂොත්තම වූ **පදුමුත්තර** බුදුරජහු උස් වූ පර්වතයට නැගී වැඩ හුන්හ. ඒ පර්වතයට නුදුරෙහි හුන් වෙදමන්ත්‍රයෙහි පරතෙරට ගිය බමුණෙක් වූ (මම) -

1266. එසේ වැඩහුන්නා වූ මහාවීර වූ දෙවාතිදෙව වූ නරශ්‍රෙෂ්ඨ වූ ලොකනායකයන් වහන්සේට ඇඳිලි බැඳගෙණ සතුති කෙළෙමි:

1267. "උතුම් ධර්මය ප්‍රකාශ කරන්නා වූ මහාවීර වූ මේ සර්වඥයන් වහන්සේ භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලදසේක් ගිනිකඳක් මෙන් බබලන සේක.

1268. මහසමුදුර මෙන් නො කැලඹිය හැකි සයුර මෙන් තරණය කළ නො හැකි සිහරජෙකු මෙන් අසමභීත වූ පසැස් ඇත්තා වූ බුදුරජානන් වහන්සේ ධර්මදෙශනා කරණ සේක" යනුයි.

1269. ශාස්තෘ වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ මාගේ අදහස් දැන භික්ෂුසංඝයා මැද වැඩසිටිසේක් මේ ගාථාවන් වදාළසේක:

1270. "යමකු විසින් (සර්වඥයන්හට) ඇඳිලි බඳනා ලද ද, එසේ ම යමකු විසින් බුද්ධශ්‍රෙෂ්ඨ තෙම පසසන ලද ද, (එසේ කළ) මේ තෙමේ තිස්දහසක් කප් දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

1271. මෙයින් කල්පලක්ෂයක් ඉක්ම ගිය කල්හි අංගීරස නම් වූ බැහැර කළ කෙලෙස්සෙවෙනි ඇති ගෞතම සම්බුදුරජ තෙම උපදින්නේ ය.

1272. හෙතෙම ඒ බුදුරජානන් වහන්සේගේ ධර්මයට දායාද වූ ඖරස පුත්‍ර වූ ධර්මමය වූ නමින් **සතරංසි** වූ රහතෙක් වන්නේ ය" කියා යි.

1273. උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම සසුනෙහි පැවිදි වීමි. නමින් **සතරංසි** වෙමි මාගේ සිරුරින් පැහැය නික්ම දිවෙයි.

1274. මණ්ඩපයක හෝ වෘක්ෂමූලයක හෝ ධ්‍යාන කරණසුලු වූ ධ්‍යානයෙහි ඇලුනා වූ මම සර්වඥශාසනයෙහි අන්තිමශරීරය දරමි. (මේ අන්තිම භවය යි.)

1275. සැටදහස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති රාම නම් වූ සක්විති රජවරු සිවුදෙනෙක් වූහ.

1276. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සතරංසික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළහ.

**සතරංසිකස්ථවිරාපදානය දෙවැනි යි.**

## 53. ශයනදායකස්ථවිරාපදානය

1277. සියලු ලොවැසියනට අනුකම්පා කරණසුලු වූ ඒ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට පහන්සිතින් යහනක් දිනිමි.

1278. ඒ ශයනදානය කරණ කොට ගෙණ යහපත් කෙතක සස්‍ය-සම්පත් මෙන් ඔහුට භොගයෝ උපදිත්. ශයනදානයාගේ මේ විපාකය යි.

1279. ආකාසෙ සෙය්‍යං කප්පෙමි ධාරෙමි පඨවිං ඉමං,
පාණෙසු මෙ ඉස්සරියං සයනස්ස ඉදං ඵලං.

5280. පඤ්චකප්පසහස්සම්හි අට්ඨ ආසුං **මහාවරා**,[1]
චතුත්තිංසෙ කප්පසතෙ චතුරො ච මහබ්බලා.

1281. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සයනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සයනදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 54. ගන්ධොදකියත්ථෙරාපදානං

1282. **පදුමුත්තරබුද්ධස්ස** මහාබොධිමහො අහු,
විචිත්තං ඝටමාදාය ගන්ධොදකමදාසහං.

1283. නහාපනකාලෙ බොධියා[2] මහාමෙඝො පවස්සථ,
නින්නාදෙ ච මහා ආසි[3] අසනියා ඵලන්තියා.

1284. තෙනෙවාසනිවෙගෙන තත්ථ කාලකතො අහුං,[4]
දෙවලොකෙ ඨිතො සන්තො ඉමං ගාථං අභාසහං.

1285. "අහො බුද්ධො! අහො ධම්මො! අහො නො සත්ථුසම්පදා!
කළෙබරං මෙ පතිතං දෙවලොකෙ රමාමහං."

1286. උබ්බිද්ධං භවනං මය්හං සතභූමං සමුග්ගතං,
කඤ්ඤාසතසහස්සානි පරිවාරෙන්ති මං සදා.

1287. ආබාධා මෙ න විජ්ජන්ති සොකො මය්හං න විජ්ජති,
පරිළාහං න පස්සාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

1288. අට්ඨවීසෙ කප්පසතෙ රාජා **සංවසිතො** අහුං,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1289. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගන්ධොදකියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගන්ධොදකියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 55. ඔපවය්හ[5]ත්ථෙරාපදානං

1290. **පදුමුත්තරබුද්ධස්ස** ආජානීයමදාසහං,
නිය්‍යාදෙත්වාන සම්බුද්ධෙ[6] අගමාසිං සකං ඝරං.

1291. **දෙවලො** නාම නාමෙන සත්ථුනො අග්ගසාවකො,
වරධම්මස්ස දායාදො ආගච්ඡි මම සන්තිකං.

---

1. මහාතෙජා, මජසං. මහාවීරා, ස්‍යා. PTS.
2. නහානකාලෙ ච බොධියා, සීමු.
3. අහු, PTS.
4. අහං, මජසං.
5. ඔපවුය්හ, බහුසු.
6. සම්බුද්ධං, PTS.

1279. අහසෙහි ශයනය කරමි. මේ පෘථිවිය (ඊශ්වරත්වයෙන්) දරමි. සත්ත්වයන් කෙරෙහි මාගේ අධිපතිත්වය පවතී. ශයනදානයාගේ මේ විපාකය යි.

1280. මෙයින් පන්දහස්වන කපෙහි **මහාවර** නමින් රජවරු අට දෙනෙක් වූහ. තුන්දහස්සිවුසියවන කපෙහි මහත් බල ඇති රජවරු සිය දෙනෙක් වූහ.

1281. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් ශයනදායකස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

**ශයනදායකස්ථවිරාවදානය තෙවැනි යි.**

## 54. ගන්ධොදකියස්ථවිරාවදානය

1282. **පදුමුත්තර** බුදුරජානන් වහන්සේගේ මහාබොධියට පූජාවෙක් විය. විසිතුරු කලයක් ගෙණ මම එහි සුවඳ පැන් දිනිමි.

1283. බොධිය නාවනකල්හි මහවැසි වැස්සේ ය. හෙණ පුපුරණ කල්හි මහත් ශබ්ද ද විය.

1284. ඒ අසනිවෙගයෙන් (=හෙණ පහරින්) එහි ම කලුරිය කෙළෙමි. (මම එකෙණෙහි) දෙව්ලොව උපන්නෙමි මේ ගාථාව කීමි:

1285. "සම්බුද්ධයන් වහන්සේ ආශ්චර්යයහ. ධර්මය ආශ්චර්යයී ය. අපගේ ශාස්තෘසම්පත්තිය ආශ්චර්යයී ය. මාගේ සිරුර (සෙණපහරින්) ඇද වැටිනි. එයින් චුත වූ මම දෙව්ලොව සිත් අලවා වසමි."

1286. පැන නැගුනා වූ මාගේ සත්බුමු විමන උස් ව නැගුනේ ය. හැම කල්හි සියක් දහසක් කන්‍යාවෝ මා පිරිවරත්.

1287. මට ආබාධයෝ නො වෙත්. මට ශොකයෙක් ද නැත. පරිලාහයක් (=තැවීමක්) නො දකිමි. පුණ්‍යකර්මයාගේ මේ විපාකය යි.

1288. දෙදහස්අටසියවන කපෙහි සත්රුවනින් යුත් වූ මහත් බල ඇති **සංවසිත** නම් සක්විතිරජෙක් විමි.

1289. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ගන්ධොදකිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

**ගන්ධොදකියස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 55. ඔපවය්හස්ථවිරාවදානය

1290. මම **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට ආජානීය අශ්වයකු දිනිමි. බුදුරජානන් වහන්සේට (ඒ අශ්වයා) දක්වා දී ස්වකීය ගෘහයට ගියෙමි.

1291. උතුම් ධර්මයට දයාද වූ (පදුමුත්තර) ශාස්තෲන් වහන්සේගේ අග්‍රශ්‍රාවක වූ නමින් **දෙවල** නම් වූ තෙරණුවෝ මා වෙත පැමිණියහ. (පැමිණ මෙසේ කීහ:)

1292. "සප්පත්තභාරො භගවා ආජානෙය්‍යො න කම්පති,
තව සබ්බප්පමඤ්ඤාය අධිවාසෙසි චක්ඛුමා."

1293. අගඤ්ඤාපෙත්වා වාතජවං සින්ධවං සීඝවාහනං,
**පදුමුත්තර**බුද්ධස්ස බමනීයමදාසහං.

1294. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,[1]
බමනීයා වාතජවා[2] චිත්තා[3] නිබ්බත්තරෙ[4] මම.

1295. ලාභා තෙසං සුලද්ධං'ව යෙ ලභන්තුපසම්පදං,
පුනපි පයිරුපාසෙය්‍යං බුද්ධො ලොකෙ සචෙ භවෙ.

1296. අට්ඨවීසතික්ඛත්තුං'හං රාජා ආසිං මහබ්බලො,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[5] ඉස්සරො.

1297. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
පත්තො'ස්මි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1298. චතුත්තිංසසහස්සම්හි මහාතෙජො'සි ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1299. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඔපවය්හො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඔපවය්හත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 56. සපරිවාරාසනත්ථෙරාපදානං

1300. **පදුමුත්තර**බුද්ධස්ස පිණ්ඩපාතං අදාසහං,
ගන්ත්වා තං භොජනට්ඨානං[6] මල්ලිකාහි පරික්ඛිපිං[7].

1301. තම්හාසනම්හි ආසීනො බුද්ධො ලොකග්ගනායකො,
අකිත්තයී පිණ්ඩපාතං උජ්ජුභූතො සමාහිතො:

1302. "යථාපි භද්දකෙ ඛෙත්තෙ බීජං අප්පම්පි රොපිතං,
සම්මා ධාරං පවෙච්ඡන්තෙ ඵලං තොසෙති කස්සකං.

1303. තථෙවායං පිණ්ඩපාතො සුඛෙත්තෙ රොපිතො තයා,
භවෙ නිබ්බත්තමානං හි[8] ඵලතො තොසයිස්සති"[9]

1304. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තරනාමකො,
පිණ්ඩපාතං ඨපිත්වාන[10] පක්කාමි උත්තරාමුඛො.

---

1. දෙවෙ ච මානුසෙ භවෙ, සීමු. භවතෙ සබ්බදා මම, PTS
2. බමනීයං වාතජවං, මජසං බමනීයො වාතජවො, සෙ. ආජානීයාවාතජවා, ස්‍යා.
3. චිතෙත, P T S. සෙ. චිත්තං, මජසං. 4 නිබ්බත්තතෙ, මජසං. සෙ.
5. ජම්බුදීපස්ස, ස්‍යා. 6. කිලිට්ඨකට්ඨානං, මජසං. සෙ.
7. පරික්ඛිත්තං, මජසං. PTS. සෙ. 8. නිබ්බත්තමානම්හි, මජසං. P T S.
9. ඵලන්තෙ කප්පයිස්සති, මජසං. 10. ගහෙත්වාන, මජසං. සෙ.

1292. "භාග්‍යවත්හු සපත්තනාරයහ. (=පාත්‍රය සහිත අටපිරිකරබර උසුලන්නෝ ය. උන්වහන්සේට) ආජානීය අශ්ව තෙමේ කැප නො වේ. පසැස් ඇත්තා වූ බුදුරජහු ඔබගේ අදහස දැන එය පිළිගත්හ" කියා යි.

1293. ඉක්බිති මම වාතවෙගය ඇති ශීඝ්‍ර ව ගමන් යන වාහනයක් වූ සෛන්ධවයා අගය කොට (විකුණා) **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට යොග්‍ය වූ පිරිකරක් දිනිමි.

1294. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් නම්, මට රිසි වූ විසිතුරු වූ වාතජවයෝ (සෛන්ධවයෝ) උපදිත්.

1295. (ඒ බුදුන් වෙත) යම්කෙනෙක් උපසම්පදාව ලබත් ද, (ඔවුනට) එය ලාභයෙකි. මනා ලාභයෙකි. ඉදින් බුදුකෙනෙක් ලෙව්හි (පහළ) වන්නෝ නම්, නැවත ද පසිරුපාසනය කරන්නෙමි.

1296. මම අටවිසිවරක් මහත් බල ඇති සතරමහ දිවයින් හා සිව්වූ මහ සයුරු කෙළවර කොට ඇති පෘථිවියෙහි අධිපති වූ සතුරු රජුන් ජය ගන්නා සුලු වූ ජම්බුද්වීපයට අධිපතී වූ සක්විතිරජ වීමි.

1297. මෙය මාගේ පශ්චිමදෙහය යි. පැසිම් උපත වේ. ජය පරාජය දෙක හැර නිශ්චලස්ථානය(=නිවණ) ට පැමිණියෙම් වෙමි.

1298. සුනිස්දහස්වන කපෙහි මහත් බල ඇති සත්රුවනින් යුත් මහත් තේජස් ඇති සක්විති රජෙක් විය.

1299. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඔපවයහ** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේකි.

**ඔපවයහස්ථවිරාවදානය පස්වැනි යි.**

## 56. සපරිවාරාසනස්ථවිරාවදානය

1300. මම **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට පිණ්ඩපාත දානයක් දිනිමි. ඒ වළඳන ස්ථානයට ගොස් බෝලිද්ද මලින් පිරිකෙව් කෙළෙමි. (සැරසීමි)

1301. ලොකයෙහි අග්‍රනායක වූ සෘජුගුණ ඇති සත්හුන් වූ බුදුරජහු ඒ අසුනෙහි වැඩහුන්නාහු එ ම පිණ්ඩපාතය (පිළිබඳ අනුසස්) වදාළහ:

1302. "යම්සේ මනා කෙතක රොපණය කළ සවල්ප වූ ද බීජයක් මැනැවින් වැසිදහර වස්නා කල්හි ඵලය ගොවියා සතුටු කෙරේ ද,

1303. එසේ ම තා විසින් මනා කෙතෙහි රොපණය කරණ ලද මේ පිණ්ඩපාත(කර්ම)ය තෙම භවයෙහි උපදින්නා වූ තා ඵලයෙන් සතුටු කරන්නේ ය."

1304. **පදුමුත්තර** නම් වූ බුදුරජහු මෙය වදාරා පිණ්ඩපාතය පසසා උතුරුදෙසට මුහුණ ලා වැඩියහ.

1305. සංවුතො පාතිමොක්ඛස්මිං ඉන්ද්‍රියෙසු ච පඤ්චසු,
පවිවෙකමනුයුත්තො විහරාමි අනාසවො.

1306. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සපරිවාරාසනො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සපරිවාරාසනත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 57. පඤ්චදීපකත්ථෙරාපදානං

1307. **පදුමුත්තරබුද්ධස්ස** සබ්බභූතානුකම්පිනො,
සුසණ්ඨිත්වා[1] සද්ධම්මෙ උජුදිට්ඨි අහොසහං.

1308. පදීපදානං පාදාසිං පරිවාරෙත්වාන බොධියං,
සද්දහන්තො පදීපානි අකරිං තාවදෙ අහං.

1309. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
ආකාසෙ උක්කං ධාරෙන්ති දීපදානස්සිදං ඵලං.

1310. තිරොකුඩ්ඩං තිරොසෙලං සමතිග්ගය්හ පබ්බතං,
සමන්තා යොජනසතං දස්සනං අනුභොමහං.

1311. චතුත්තිංසෙ කප්පසතෙ **සතචක්ඛු**සනාමකා,
රාජා'හෙසුං මහාතෙජා චක්කවත්තී මහබ්බලා.

1312 තෙන කම්මාවසෙසෙන පත්තො'මහි ආසවක්ඛයං,
ධාරෙමි අන්තිමං දෙහං දිපදින්දස්ස සාසනෙ.

1313. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චදීපකො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චදීපක*ත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 58. ධජදායකත්ථෙරාපදානං

1314. **පදුමුත්තරබුද්ධස්ස** බොධිම්හි පාදපුත්තමෙ,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ධජමාරොපයිං අහං.

1315. පතිත[2]පත්තානි ගණ්හිත්වා බහිද්ධා ඡඩ්ඩයිං අහං,
අන්තොසුද්ධං බහිසුද්ධං අධිමුත්තමනාසවං,
සම්මුඛා විය සම්බුද්ධං අවන්දිං බොධිමුත්තමං.

1316. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසංඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ:

1. සද්දහිත්වාන, මජ්ඣං. සෙ. 2. සතත, සෙ. අ. පත, PTS.
* පදීපදායක ?

1305. ප්‍රාතිමොක්‍ෂයෙහි ද පසිඳුරන් විෂයයෙහි ද සංවෘත වූයෙම් **ප්‍රකර්‍ෂවිවෙකයෙහි** යෙදුනෙම් ආශ්‍රව රහිත ව වෙසෙමි.

1306. **පිළිසැඹියාවෝ** -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන **කරණ** ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **සපරිවාරාසනසථවිර**යන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කල සේක් සී.

**සපරිවාරාසන සථවිරාවදානය සවැනි සි.**

## 57. පඤ්චදීපකසථවිරාවදානය

1307. මම සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පී වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේගේ සද්ධර්මයෙහි මනා ව පිහිටා ඍජු වූ දෘෂ්ටි ඇත්තෙම් වීමි.

1308. බොධිය වට කොට ප්‍රදීපදානයක් දිනිමි. (පහන් පූජාවක් කෙළෙමි). **එකෙණෙහි** (කර්මඵල) අදහමින් පහන් දල්වීමි.

1309. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද, (ඒ **පුණ්‍යකර්‍ම** හෙතුවෙන්) අහසෙහි දඹුවැටපහන් දරත්. ප්‍රදීපදානයාගේ මේ විපාකය සි.

1310. **පර්වතය** ද ඉක්මවා බිත්තියෙන් පිටත ද ගල්පව්වෙන් පිටත ද හාත්පස යොදුන් සියක් තැන වූ සියල්ල දර්‍ශනය කරමි.

1311. තුන්දහස්සිවුසියවනකපෙහි **සතචක්‍ඛු** යන නම් ඇති මහාතෙජස් ඇති මහත් බල ඇති සක්විතිරජවරු වූහ.

1312. ඒ **කර්මයාගේ** අවශෙෂ විපාකයෙන් ආශ්‍රවක්‍ෂයයට පැමිණියෙම් වෙමි. **සර්වඥශාසනයෙහි** අන්තිමශරීරය (=අන්තිම ආත්මය) දරමි.

1313. **පිළිසැඹියාවෝ** -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන **කරණ**ලදී.

මෙසේ මේ අයුරින් **පඤ්චදීපකසථවිර**යන් වහන්සේ මේ ගාථාවන් වදාලසේකි.

**පඤ්චදීපකසථවිරාවදානය සත්වැනි සි.**

## 58. ධවජදායකසථවිරාවදානය

1314. මම **පදුමුත්තර** බුදුරජානන් වහන්සේගේ උතුම් බෝරුකෙහි සතුටු වූයෙම් සතුටු සිතින් ම ධජයක් නැංවීමි.

1315. (බොධියෙන්) වැටුනු කොළ ගෙණ බැහැර ලීමි. ඇතුළත පිරිසිදු පිටත ද පිරිසුදු වූ අභිමුඛත (තිශවයබුද්ධිසහිත) වූ ආශ්‍රව රහිත වූ බුදුරජානන් වහන්සේ හමුයෙහි වඳින්නාක් මෙන් උතුම් බොධිය වැන්දෙමි.

1316. පූජාවන් පිළිගන්නා වූ නොහොත් ලෝවැස්සන්ගේ පූජාවනට ගෙයක් වැනි වූ ශාස්තෘ වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ භික්‍ෂු **සඞ්ඝයා** මැද වැඩහිඳ මේ ගාථාවන් වදාලසේක:

1317. “ඉමිනා ඛජ්ජදානෙන උපට්ඨානෙන චූභයං,
කප්පානං සතසහස්සං දුග්ගතිං සො න ගච්ඡති.

1318. දෙවෙසු දෙවසොභග්ගං[1] අනුභොස්සතනප්පකං,
අනෙකසතක්ඛත්තුඤ්ච රාජා රට්ඨෙ භවිස්සති,
**උග්ගතො** නාම නාමෙන චක්කවත්තී භවිස්සති.

1319. සම්පත්තිං අනුභොත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො සාසනෙ'භිරමිස්සති.”

1320. පධානපහිතත්තො'ම්හි උපසන්තො නිරූපධි,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1321. එකපඤ්ඤාසසහස්සෙ කප්පෙ **උග්ගත**සව්හයො,
පඤ්ඤාසතිසහස්සෙ[2] ඛත්තියො **මෙඝ**සව්හයො.

1322. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඛජ්ජදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඛජ්ජදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 59. පදුමත්ථෙරාපදානං

1323. චතුසච්චං පකාසෙන්තො වරධම්මප්පවත්තකො[3],
වස්සන්තෙ අමතං වුට්ඨිං නිබ්බාපෙන්තො මහාජනං.

1324. සදණ්ඩං[4] පදුමං ගය්හ අඩ්ඪකොසෙ ඨිතො අහං,
**පදුමුත්තර**මුනිස්ස හට්ඨො උක්ඛිපිමම්බරෙ.

1325. ආගච්ඡන්තෙ ච පදුමෙ අබ්භුතො ආසි තාවදෙ,
මම සඞ්කප්පමඤ්ඤාය පග්ගණ්හි වදතං වරො.

1326. කරසෙට්ඨෙන පග්ගය්හ ජලජං පුප්ඵමුත්තමං,
භික්ඛුසංඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ:

1327. “යෙනිදං පදුමං ඛිත්තං සබ්බඤ්ඤුම්හි විනායකෙ[5],
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1328. තිංස කප්පානි දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
පථව්‍යා රජ්ජං සත්තසතං වසුධං ආවසිස්සති.

1329. තත්ථ පත්තං ගණෙත්වාන[6] චක්කවත්තී භවිස්සති,
ආකාසතො පුප්ඵවුට්ඨි අභිවස්සිස්සති තදා.

1330. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

1. සොභාග්‍යං, PTS. සෙ. 2. පඤ්ඤාසසතසහස්සෙ, මජ්සං. PTS. සෙ.
3. වරධම්මචක්කප්පවත්තකො, PTS. 4. සධජං, PTS. සෙ. අ.
5. සබ්බඤ්ඤුත්තමනායකෙ, ස්‍යා. PTS. සෙ.
6. ගහෙත්වාන, සී මු.

1317. "මේ ධ්වජපූජායෙන් ද උපස්ථානයෙන් ද යන මේ දෙකින් හෙතෙම කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියට නො යයි.

1318. දෙවියන් අතර බොහෝ වූ දිව්‍යසෞභාග්‍යය (=සම්පත්) අනුභව කරන්නේ ය. නොයෙක් සියගණන්වාරයන්හි රටෙහි රජ වන්-නේ ය. **උග්ගත** නම් වූ සක්විතිරජෙක් ද වන්නේ ය.

1319. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ සම්පත් අනුභව කොට **ගෞතම** බුදුරජානන් වහන්සේගේ සස්නෙහි සිත් අලවා වාසය කරන්-නේ ය" (කියා යි).

1320. උපශාන්ත වූයෙම් උපධි රහිත වූයෙම් ප්‍රධන්වීර්‍ය්‍යයෙහි මෙහෙයූ සිතැත්තෙම් වෙමි. සර්‍වඥශාසනයෙහි අන්තිමශරීරය දරමි.

1321. පණස්එක්දහස් වන කපෙහි **උග්ගත** නම් රජෙක් වීමි. (එසේ ම) පණස්දහස් කපෙහි **මෙඝ** නම් රජෙක් වීමි.

1322. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ධ්වජදායකස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේකි.

**ධ්වජදායකස්ථවිරාවදානය අටවැනි යි.**

## 59. පද්මස්ථවිරාවදානය

1323. උත්තම ධර්‍මප්‍රකාශක **පදුමුත්තර** බුදුරජ තෙම චතුස්සත්‍යය දෙසමින් මහාජනයාගේ (කෙලෙස්ගිනි) නිවමින් අමාවැසි වස්වයි.

1324. නටුව සහිත පියුමක් ගෙණ මුදුන්මැදියක සිටි මම සතුටු වූයෙම් **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට (පූජා පිණිස) අහසෙහි දැම්මි.

1325. එකෙණෙහි පියුම පහතට වැටෙන කල්හි ආශ්චර්‍ය්‍යයෙක් විය. වාදිවර වූ බුදුරජහු මාගේ අදහස දැන එය පිළිගත්හ.

1326. උතුම් පියුම දකුණුඅතින් ගෙණ බුදුරජහු භික්සඟන මැද හිඳ මේ ගාථාවන් වදාළහ:

1327. "විනායක (නිවණට පමුණුවන්නා) වූ සර්‍වඥයන් වහන්සේ කෙරෙහි යමකු විසින් මේ පියුම (උඩට) දමන ලද ද, මම ඔහු ප්‍රකට කොට කියමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු.

1328. තිස්කපක් මුළුල්ලෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව දෙව්රජය කරන්නේ ය. සත්සියවරක් පෘථිවිරාජ්‍යය (කරණුයේ) පොළොවෙහි වාසය කරන්නේ ය.

1329. එහි පියුම් පත් ගැණ (එම පත් ගණනින්) සක්විතිරජ වන්නේ ය. එකල්හි අහසින් මල්වැසි වසින්නේ ය.

1330. (මෙයින්) කල්ප ලක්‍ෂයක් ඉක්ම ගිය කල **ඔක්කාක** කුලයෙහි උපදින්නා වූ නමින් **ගෞතම** නම් වූ ශාස්තෘහු ලොව පහළ වන්නාහ.

1331. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො."

1332. නික්ඛමිත්වාන කුච්ඡිම්හා සම්පජානො පතිස්සතො,
ජාතියා පඤ්චවස්සො'හං අරහත්තමපාපුණිං.

1333. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **පදුමො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමත්ථෙරස්ස අපදානං නවමං.**

## 60. අසනබොධියත්ථෙරාපදානං

1334. ජාතියා සත්තවස්සො'හං අද්දසං ලොකනායකං,
පසන්නචිත්තො සුමනො උපගච්ඡිං නරුත්තමං.

1335. **තිස්සස්සාහං** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
හට්ඨො හට්ඨෙන චිත්තෙන රොපයිං බොධිමුත්තමං.

1336. **අසනො** නාමධෙය්‍යෙන ධරණීරුහපාදපො,
පඤ්ච වස්සෙ පරිචරිං අසනං බොධිමුත්තමං.

1337. පුප්ඵිතං පාදපං දිස්වා අබ්භුතං ලොමහංසනං,
සකං කම්මං පකිත්තෙන්තො බුද්ධසෙට්ඨං උපාගමිං.

1338. **තිස්සො** තදා සො සම්බුද්ධො සයම්භූ අග්ගපුග්ගලො,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

1339. "යෙනායං රොපිතා බොධි බුද්ධපූජා ච සක්කතා,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

1340. තිංස කප්පානි දෙවෙසු දෙවරජ්ජං කරිස්සති,
චතුසට්ඨික්ඛත්තුං සො චක්කවත්ති භවිස්සති.

1341. තුසිතා හි චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
ද්වෙ සම්පත්ති අනුභොත්වා මනුස්සත්තෙ රමිස්සති.

1342. පධානපහිතත්තො සො උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො."

1331. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූයේ ඖරස බුද්ධපුත්‍ර වූයේ ධර්මයෙන් නිර්මිත කලාක් වැනි වූයේ සියලු ආස්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් (දැන) දුරු කොට ආස්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය" (කියායි).

1332. සිඛිනුවණින් යෙදී මවුකුසින් බිහි ව උත්පත්තියෙන් පස් හැවිරිදි කල්හි මම රහත් බවට පැමිණියෙමි.

1333. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පදුම** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**පදුමස්ථවිරාවදානය නවවැනියි.**

## 60. අසනබොධියස්ථවිරාවදානය

1334. උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම (**තිස්ස**) බුදුරජානන් වහන්සේ දිටිමි. පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් තථාගතයන් වහන්සේ වෙත එළඹුනෙමි.

1335. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති **තිස්ස** බුදුරජානන් වහන්සේට සතුටු වූයෙම් සතුටු සිතින් (උන්වහන්සේගේ පියාබෝරුකින් ඵලයක් ගෙණ) උතුම් බොධියක් රොපණය කෙළෙමි.

1336. එය නමින් **අසන** (=පියා) නම් වූ බොධිවෘක්ෂය යි. ඒ උතුම් බෝරුක පස්වසක් පරිචරණය (=පොෂණය) කෙළෙමි.

1337. ආශ්චර්ය වූ ලොමුදහගන්වන්නා වූ පිපුනු පියාබෝරුක දැක සවකීයකර්මය ප්‍රකාශ කරන්නෙම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹුනෙමි.

1338. එකල්හි සියල්ල තෙමේ ම දැනගත්තා වූ අග්‍රපුද්ගල වූ ඒ **තිස්ස** සර්වඥතෙමේ භික්ෂුසඞ්ඝයා මැද වැඩහිඳ මෙම ගාථාවන් වදාළසේක:

1339. "යමෙකු විසින් මෙ ම බොධිය රොපණය කරණ ලද ද, බුද්ධ පූජාව මැනැවින් කරණ ලද ද, මම ඔහු (කවරෙක් දැයි) ප්‍රකාශ කරන්නෙමි. එය ප්‍රකාශකරන්නා වූ මාගේ වචනය අසවු:

1340. තෙතෙම තිස්කපක් දෙවියන් අතුරෙහි දිව්‍යරාජ්‍යය කරන්නේ ය. සූසැටවරක් සක්විතිරජ වන්නේ ය.

1341. කුශලමූලයෙන් මෙහෙයන ලද්දේ තුෂිත දෙව්ලොවින් ච්‍යුත ව දිව්‍යමනුෂ්‍යසම්පත් දෙක අනුභව කොට මිනිසත්බැව්හි සිත් අලවා වසන්නේ ය.

1342. වීර්යයෙන් මෙහෙයන ලද සිත් ඇති උපශාන්ත වූ උපධි රහිත වූ හෙතෙම සියලු ආස්‍රවයන් ප්‍රහාණපරිඥා වශයෙන් දැන (දුරු කොට) ආස්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය" (කියායි).

1343. විවෙකමනුයුත්තො'හං උපසන්තො නිරූපධි,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

1344. ද්වෙනවුතෙ ඉතො කප්පෙ බොධිං රොපෙසහං තදා,
දුග්ගතිං නාභිජානාමි බොධිරොපස්සිදං ඵලං.

1345. චතුසත්තති'තො කප්පෙ **දණ්ඩසෙනොති** විස්සුතො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති තදා අහුං.

1346. තෙසත්තතිම්හි'තො කප්පෙ සත්තාසුං මහීපතී,
**සමන්තනෙමි** නාමෙන රාජානො චක්කවත්තිනො.

1347. පණ්ණවීසති'තො කප්පෙ **පුණ්ණකො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

1348 පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අසනබොධියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අසනබොධියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

වීජනී සතරංසී ච සයනො'දකි වාහියො
පරිවාරො පදීපඤ්ච ධජො පදුමපූජකො
බොධී ච දසමො වුත්තො ගාථා ද්වෙ නවුතී තථා.

**වීජනීවග්ගො ඡට්ඨො.**

## 61. සකචින්තනිය[1]ත්ථෙරාපදානං

1349. පවනං කානනං දිස්වා අප්පසද්දමනාවිලං,
ඉසීනං අනුචිණ්ණංව ආහුතීනං පටිග්ගහං.

1350. ථූපං කත්වාන පුලිනං[2] නානාපුප්ඵං සමොකිරිං.
සම්මුඛා විය සම්බුද්ධං නිම්මිතං අභිවන්දහං.

1351. සත්තරතනසම්පන්නො රාජා රට්ඨම්හි[3] ඉස්සරො,
සකකම්මාභිරද්ධො'හං ථූපපූජායිදං ඵලං.

1352. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි ථූපපූජායිදං ඵලං.

1353. අසීතිකප්පෙ'**නන්තයසො** චක්කවත්ති අහොසහං,
සත්තරතනසම්පන්නො චතුදීපම්හි ඉස්සරො.

1354. පටිසම්භිදා -පෙ කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සකචින්තනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සකචින්තනියත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. සකචින්තිය, සීමු. 2 වෙළුනා P T S. සෙ අ.
3. රට්ඨස්මිං, මජසං. සී මු.

1343. විවෙකයෙහි යෙදුනු උපශාන්ත වූ උපධිරහිත වූ මම හස්තිරාජයෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

1344. මෙයින් දෙඅනූවන කපෙහි වූ එකල්හි මම ඒ පියා බොධිය රොපණය කෙළෙමි. (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බොධිරොපණයෙහි මේ විපාකය යි.

1345. මෙයින් සූසැත්තෑවන කපෙහි වූ එකල්හි සත්රුවනින් යුත් **දණ්ඩසෙන** නම් සක්විතිරජෙක් වීමි.

1346. මෙයින් තෙසැත්තෑවන කපෙහි පෘථිවීශ්වර වූ **සමන්තනෙමි** නම් වූ සක්විතිරජවරු සත්දෙනෙක් වූහ.

1347. මෙයින් පස්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **පුණ්ණක** නම් සක්විතිරජෙක් වීමි.

1348. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අසනබොධියස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**අසනබොධියස්ථවිරාවදානය දසවැනියි.**

උද්දානය:

විජනී සතරංසි සයන - උදක වාහිය පරිවාර ද,
පදීප ධජ පදුම පූජක - බොධිය දසි වත් දසෙක් වේ,
දෙයනූගයකින් බැඳ - මෙහි එය කියන ලද්දේ.

**විජනිවග්ගය සවැනියි.**

## 61. සකචින්තනියස්ථවිරාවදානය

1349, 1350 සෘෂීන් විසින් සෙවුනාලද සවල්ප වූ ශබ්ද ඇති කැලඹීම් රහිත මහවනයක් දැක දෙවිමිනිසුන්ගේ පූජාවන් පිළිගන්නා වූ බුදු-රජානන් වහන්සේ උදෙසා වැලිසෑයක් කොට නොයෙක් මල් විසිරවීමි. නිර්මිත බුදුරදුන් ඉදිරියෙහි මෙන් මම ඒ සෑය වැන්දෙමි.

1351. සවකීය කර්මයෙන් සතුටු වූ මම (ඒ පිණින්) සත්රුවනින් යුක්ත ව රටෙහි අධිපති රජ වීමි. සතූපපූජාවෙහි මේ විපාකය යි.

1352. මෙයින් එක්අනූවන කපෙහි (සෑයට) යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ස්තූපපූජාවෙහි මේ විපාකය යි.

1353. මම අසූවන කපෙහි සත්රුවනින් යුක්ත ව සිවුමහදිවයින්හි අධිපති වූ **අනන්තයස** නම් සක්විතිරජෙක් වීමි.

1354. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සකචින්තනිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**සකචින්තනිය ස්ථවිරාවදානය පළමුවැනියි.**

## 62. අවොපුප්ඵියත්ථෙරාපදානං

1355. විහාරා අභිනික්ඛම්ම අබ්භුට්ඨහිය[1] චඞ්කමෙ,
චතුසච්චං පකාසෙන්තො දෙසෙති[2] අමතං පදං.

1356. **සිඛිස්ස** ගිරමඤ්ඤාය බුද්ධසෙට්ඨස්ස තාදිනො,
නානාපුප්ඵං ගහෙත්වාන ආකාසම්හි සමොකිරිං.

1357. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ[3]
පත්තො'ම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1358. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1359. ඉතො වීසතිකප්පම්හි සුමෙඝො නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1360. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **අවො**[4]**පුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අවොපුප්ඵියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 63. පච්චාගමනියත්ථෙරාපදානං

1361. **සින්ධුයා** නදියා තීරෙ චක්කවාකො අහං තදා,
සුද්ධසෙවාලභක්ඛො'හං පාපෙසු ච සුසඤ්ඤතො.

1362. අද්දසං විරජං බුද්ධං ගච්ඡන්තං අනිලඤ්ජසෙ,
තුණ්ඩෙන සාලං[5] පග්ගය්හ **විපස්සිස්සා**භිරොපයිං.

1363. “යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
තෙන චිත්තප්පසාදෙන දුග්ගතිං සො න ගච්ඡති.”

1364. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
විහඞ්ගමෙන සන්තෙන සුබීජං රොපිතං මයා.

1865. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1366. **සුචාරුදස්සනා** නාම අට්ඨෙතෙ එකනාමකා,
කප්පෙ සත්තරසෙ ආසුං චක්කවත්තී මහබ්බලා.

1367. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **පච්චාගමනියො**[6] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පච්චාගමනියත්ථෙරස්ස අපදානං තතියං.**

---

1. අබ්භුට්ඨාසි, PTS. අ. අබ්භුට්ඨාහි ච සෙ. 2. දෙසෙන්තො, PTS. සෙ. අ.
3. “දිපදින්ද, ලොකජෙට්ඨ, නරාසභ,” ඉති සබ්බත්ථ.
4 ආවො, PTS. සෙ. 5. මාලං, සෙ. 6. සද්ධාගමනීය. සෙ.

## 62. අවොපුප්ඵියසථවිරාවදානය

1355. (සිඛී බුදු රජ තෙම) විහාරයෙන් නික්ම සක්මනෙහි සිට චතුසත්‍යය ප්‍රකාශ කරන්නේ අමෘතපදය (=නිර්වාණධර්මය) දෙශනා කරයි.

1356. තාදිගුණ ඇති සිඛී නම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ හඬ අසා නොයෙක් මල් ගෙණවුත් අහසෙහි විසිරවීමි.

1357. ද්විපදෙන්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කරණලද එම කර්මය හෙතු කොට ගෙණ ජය පරාජය දෙක හැර නිශ්චල ස්ථානයට (නිවණට) පැමිණියෙම් වෙමි.

1358. මෙයින් එක්තිස්වන කපෙහි යම් මල්පූජාවක් කෙළෙම් ද, ඒ හේතු කොට ගෙණ දුගතියක් නො දනිමි. මල්පූජාවේ මේ විපාකය යි.

1359. මෙයින් විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුමෙඛ නම් සක්විතිරජෙක් වීමි.

1360. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අවොපුප්ඵියසථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**අවොපුප්ඵියසථවිරාවදානය දෙවැනියි.**

## 63. පච්චාගමනියසථවිරාවදානය

1361. මම එකල සින්ධුනදීතීරයෙහි හුදු සෙවෙල් අනුභව කරන්නා වූ පාපයන් කිරීමෙන් වැළකුනා වූ සක්වාලිහිණියෙක් වීමි.

1362. (එකල්හි) කෙලෙස්මල නැත්තා වූ අහස්මගෙහි ගමන් කරන්නා වූ බුදුරජු දිටිමි. (දක) තුඩින් සල්මලක් ගෙනවුත් ඒ **විපස්සී** බුදුරජානන් වහන්සේට පිදීමි.

1363. "යමෙකුගේ ශ්‍රද්ධාතොමෝ තථාගතයන් වහන්සේ විෂයයෙහි නිශ්චල ව පිහිටියා ද, හෙතෙම ඒ චිත්තප්‍රසාදය හෙතු කොට ගෙණ දුගතියකට නො යේ" යි (**විපස්සී** බුදුරජ තෙම වදාළේ ය.)

1364. ඒකාන්තයෙන් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ මනා පැමිණීමෙක් විය. (සක්වා)ලිහිණියෙකු වූ මා විසින් මනා (කුශල) බීජයක් රොපණය කරණලදී.

1365. මෙයින් එක්අනූවන කපෙහි යම් මලක් පිදූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

1366. සතළොස්වනකපෙහි **සුචාරුදස්සන** නම් එකනම ඇති මහාබලවත් වූ සක්විතිරජවරු අටදෙනෙක් වූහ.

1367. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පච්චාගමනියසථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පච්චාගමනියසථවිරාවදානය තෙවැනියි.**

## 64. පරප්පසාදකත්ථෙරාපදානං

1368. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
සුවණ්ණවණ්ණං සම්බුද්ධං කො දිස්වා නප්පසීදති.

1369. හිමවා'වාපරිමෙය්‍යො සාගරො'ව දුරුත්තරො,
තථෙව ඣානං බුද්ධස්ස[1] කො දිස්වා නප්පසීදති.

1370. වසුධා යථා අප්පමෙය්‍යා චිත්තා වනවටංසකා,
තථෙව සීලං බුද්ධස්ස කො දිස්වා නප්පසීදති.

1371. අනිලජො'ව අසඞ්ඛොභො[2] යථාකාසො අසඞ්ඛියො,
තථෙව ඤාණං බුද්ධස්ස කො දිස්වා නප්පසීදති.

1372. ඉමාහි චතුගාථාහි[3] බ්‍රාහ්මණො සෙනසව්හයො,
බුද්ධසෙට්ඨං ථවිත්වාන සිද්ධත්ථං අපරාජිතං.

1373. චතුනවුතිකප්පානි දුග්ගතිං නුපපජ්ජථ,[4]
සුගතීසු සුසම්පත්තිං[5] අනුභොසි[6] අනප්පකං.

1374. චතුනවුතෙ ඉතො කප්පෙ ථවිත්වා ලොකනායකං,
දුග්ගතිං නාභිජානාමි ථොමනාය ඉදං ඵලං.

1375. චතුද්දසම්හි කප්පම්හි චතුරො ආසුමුග්ගතා[7]
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1376. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පරප්පසාදකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පරප්පසාදකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 65. භිසදායකත්ථෙරාපදානං

1377. **වෙස්සභූ** නාම නාමෙන ඉසීනං තතියො අහු,
කානනං වනමොග්ගය්හ විහාසි පුරිසුත්තමො.

1378. භිසං මූළාලං ගණ්හිත්වා අගමං[8] බුද්ධසන්තිකං,
තං ච බුද්ධස්ස පාදාසිං පසන්නො සෙහි පාණිහි.

1379. කරෙන ච පරාමට්ඨො **වෙස්සභූ**වරබුද්ධිනා,
සුඛාහං නාභිජානාමි සමං තෙන කුතුත්තරිං.

1380. චරිමො වත්තතෙ මය්හං භවා සබ්බෙ සමූහතා,
හත්ථිනාගෙන සන්තෙන කුසලං රොපිතං මයා.

---

1. දෙවදෙවස්ස, සෙ. 2. අනිලඤ්ජසාසඞ්ඛුබ්භො, PTS.
3. චතුසි ගාථාහි, PTS. සෙ. 4. නුපපජ්ජහං, PTS සෙ.
5. සුගතිං සුඛසම්පත්තිං, මජ්ඣං. 6. අනුභොමි, සෙ. අනුභොසිං, PTS.
7. ආසුං උග්ගතා, සෙ. PTS. 8. ආගමම්, සෙ.

## 64. පරප්පසාදකසථවිරාවදානය

1368. ශ්‍රෙෂ්ඨ වූ උතුම් වූ වීර වූ මහර්ෂි වූ කෙලෙස්සතුරන් ජය ගන්නාසුලු වූ සවණ්ණවණ්ණ වූ බුදුරජු දැක කවරෙක් (නම්) නො පහදී ද?

1369. ප්‍රමාණ කළ නො හැකි හිමවත්පව්ව යම්සේ ද, තරණය කළ නො හැකි සාගරය යම් සේ ද, බුදුරජානන් වහන්සේගේ ධ්‍යානය ද එසේ ම ය. (උන්වහන්සේ) දැක කවරෙක් නම් නො පහදී ද?

1370. විසිතුරු වන අරම් නමැති මුදුන්මල්කඩ ඇති පොළොව යම් සේ ප්‍රමාණ නො කට හැකි ද, බුදුරජානන් වහන්සේගේ ශීලය ද එසේ ම ය. (උන්වහන්සේ) දැක කවරෙක් නම් නො පහදී ද?

1371. නො කැලඹිය හැකි සයුර යම් සේ ද, පමණ කළ නො හැකි අහස යම් සේ ද, බුදුරජානන් වහන්සේගේ ඤාණය ද එසේ ම ය. (උන්වහන්සේ) දැක කවරෙක් නො පහදී ද?

1372. සෙන නම් වූ බ්‍රාහ්මණ තෙමේ මේ සිවු ගයින් පස්මරුන් දිනූ සිද්ධත්ථ නම් වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට සතුති කොට-

1373. සිවු අනු කපක් මුළුල්ලෙහි දුගතියක නූපන්නේ ය. සුගතීන්හි බොහෝ වූ මනා සමපත් අනුභව කෙළේ ය.

1374. මෙයින් සිවුඅනූවන කපෙහි ලොකනායක වූ බුදුරජානන් වහන්සේ පසසා (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පැසසීමෙහි මේ විපාකය යි.

1375. තුදුස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති උග්ගත නම් වූ සක්විතිරජවරු සිවුදෙනෙක් වූහ.

1376. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් පරප්පසාදක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පරප්පසාදකසථවිරාවදානය සිවුවැනියි.**

## 65 භිසදායකසථවිරාවදානය

1377. (එක් කපක වූ) බුදුවරයන් අතුරෙහි තෙවැන්නෙක් නමින් වෙස්සභූ නම් වි ය. පුරුෂොත්තම වූ ඒ බුදුරජ තෙම මහවනයට පිවිස එහි විසී ය.

1378. නෙළුඹල ද නෙළුඹුදඹු ද ගෙණ බුදුරජානන් වහන්සේගේ සමීපයට ගියෙමි. පහන් වූයෙම් සියසොඬින් එය බුදුරජානන් වහන්සේට පිදීමි.

1379. උතුම් නුවණැති වෙස්සභූ බුදුරජානන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ශ්‍රීහස්තයෙන් පරාමර්ශනය කරණ (=පිරිමදින) ලද්දාවූ මම ඒ හා සමාන සැපයක් නො දනිමි. එයට වැඩි සැපයක් නම් කොයින් ද?

1380. සියලු භවයෝ නසන ලදහ. මාගේ මේ අන්තිම භවය වේ. එකල හස්තිරාජයකු වූ මා විසින් කුසල් බිජුවටක් රොපණය කරණලදී.

1381. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි භිසදානස්සිදං ඵලං.

1382. **සමොධානා** ච රාජානො සොළස මනුජාධිපා,
කප්පම්හි තෙරසෙ ආසුං චක්කවත්තී මහබ්බලා.

1383 පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භිසදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භිසදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 66. සුචින්තිතත්ථෙරාපදානං

1384. ගිරිදුග්ගචරො ආසිං අභිජාතොව කෙසරී,
මිගසංඝං වධිත්වාන ජීවාමි පබ්බතන්තරෙ.

1385. **අත්ථදස්සී** තු භගවා සබ්බඤ්ඤූ වදතං වරො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි පබ්බතුත්තමං.

1386. පසදඤ්ච මිගං හන්ත්වා භක්ඛිතුං සමුපාගමිං,
භගවා තම්හි සමයෙ භික්ඛමානො[1] උපාගමි.

1387. වරමංසානි පග්ගය්හ අදාසිං තස්ස සත්ථුනො,
අනුමොදි මහාවීරො නිබ්බාපෙන්තො මමං තදා.

1388. තෙන චිත්තප්පසාදෙන ගිරිදුග්ගං පවිසහං,
පීතිං උප්පාදයිත්වාන තත්ථ කාලකතො අහං.

1389. එතෙන මංසදානෙන චිත්තස්ස පණිධීහි ච,
පණ්ණරසෙ කප්පසතෙ දෙවලොකෙ රමිං අහං.

1390. අවසෙසෙසු කප්පෙසු කුසලං නිච්චිතං[2] මයා,
තෙනෙව මංසදානෙන බුද්ධානුස්සරණෙන ච.

1391. අට්ඨතිංසම්හි කප්පම්හි අට්ඨ **දීඝායුනාමකා**,
සට්ඨිම්හි'තො කප්පසතෙ දුවෙ **වරුණ**නාමකා.

1392. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුචින්තිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුචින්තිතත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

---

1. භික්ඛයානො, සෙ. 2. කාරිතං, සෙ. PTS. චින්තිතං, මජසං. කරිතං, සක.

1381. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. තෙළඹලදානයාගේ මේ විපාක ය යි.

1382. තෙළෙස්වන කපෙහි මහත් බල ඇති **සමොධාන** නමින් මනුජාධිපති වූ සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1383. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිසන්ධියක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දෙශනා කල සේක් යි.

**තිසන්ධියකස්ථවිරාවදානය පස්වැනියි.**

## 66. සුචින්තිතස්ථවිරාවදානය

1384. (මම) විශිෂ්ට ජන්ම ඇති කෙශරසිංහ රාජයෙකු වැනි දුර්ග-යන්හි හැසිරෙන නෙසාදයෙක් (=වැද්දෙක්) වීමි. මෘග සමූහයා මරාගෙණ කඳු අතරෙහි ජීවත් වෙමි.

1385. සම්බුද්ධ වූ වාදීවර වූ ඒ **අත්ථදස්සී** භාග්‍යවත්තෙම මා (පවින්) නගා සිටුවනු කැමැත්තේ උතුම් පර්වතයට වැඩියේය.

1386. පසදමෘගයකු (තිත්මුවකු) මරා අනුභව කිරීමට එළඹියෙමි. එසමයෙහි භාග්‍යවත් තෙමේ පිඩු සිඟමින් (එතැනට) වැඩියේය.

1387. උතුම් මස්ගෙණ (මම) ඒ ශාස්තෘන් වහන්සේට දිනිමි. මහා වීර වූ බුදුරජානන් වහන්සේ එකල්හි සිත නිවමින් අනුමොදනා කළසේක.

1388. මම ඒ චිත්තප්‍රසාදයෙන් යුතු ව ගිරිදුර්ගයට පිවිසියෙමි. ප්‍රීතිය උපදවා එහි කළුරිය කෙළෙමි.

1399 මේ මස්දන හේතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් (=ප්‍රාර්ථනා-වන්) හේතු කොට ගෙණ ද, එක්දහස් පන්සිය කපක් දෙව්ලොවෙහි සිත් අලවා විසීමි.

1390, 1391. අවශෙෂ කල්පයන්හි ද මා විසින් කුසල් රැස් කරණ ලදී. එම මාංශදානයෙන් ද බුදුගුණ සිහි කිරීමෙන් ද, අටතිස්වන කපෙහි **දීඝායු** නම් වූ රජවරු අට දෙනෙක් වූහ. මෙයින් කල්ප සදහසකින් පෙර **වරුණ** නමින් රජවරු දෙදෙනෙක් වූහ.

1392. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සුචින්තිත** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**සුචින්තිතස්ථවිරාවදානය සවැනියි.**

## 67. වත්ථදායකත්ථෙරාපදානං

1393. පක්ඛිජාතො තදා ආසිං සුවණ්ණො ගරුළාධිපො,
අද්දසං විරජං බුද්ධං ගච්ඡන්තං **ගන්ධමාදනං**.

1394. ජහිත්වා ගරුළං[1] වණ්ණං මාණවකං අධාරයිං,
එකං වත්ථං මයා දින්නං දිපදින්දස්ස තාදිනො.

1395. තඤ්ච දුස්සං පටිග්ගය්හ බුද්ධො ලොකග්ගනායකො,
අන්තලික්ඛෙ ඨිතො සත්ථා ඉමං ගාථං අභාසථ:

1396. "ඉමිනා වත්ථදානෙන චිත්තස්ස පණිධීහි ච,
පහාය ගරුළං යොනිං දෙවලොකෙ රමිස්සති."

1297. **අත්ථදස්සී** තු භගවා ලොකජෙට්ඨො නරාසභො,
වත්ථදානං පසංසිත්වා පක්කාමි උත්තරාමුඛො.

1398. භවෙ නිබ්බත්තමානම්හි හොන්ති මෙ වත්ථසම්පදා,
ආකාසෙ ඡදනං හොති වත්ථදානස්සිදං ඵලං.

1499. **අරුණකා**[2] සත්ත ජනා චක්කවත්තී මහබ්බලා,
ඡත්තිංසතිම්හි කප්පම්හි ආසිංසු මනුජාධිපා.

1400. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වත්ථදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වත්ථදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 68. අම්බදායකත්ථෙරාපදානං

1401. **අනොමදස්සී** භගවා නිසින්නො පබ්බතන්තරෙ,
මෙත්තාය අඵරී ලොකං අප්පමාණං නිරූපධි.

1402. කපි අහං තදා ආසිං හිමවන්තෙ නගුත්තමෙ,
දිස්වා අනොමං අමිතං බුද්ධෙ චිත්තං පසාදයිං.

1403. හිමවන්තස්ස අවිදූරෙ[3] අම්බාසුං ඵලිනො තදා,
තතො පක්කං ගහෙත්වාන අම්බං සමධුකං අදං.

1404. තමෙම බුද්ධො ව්‍යාකාසි **අනොමදස්සී** මහාමුනි,
"ඉමිනා මධුදානෙන අම්බදානෙන චූභයං.

1405. සත්තපඤ්ඤාස කප්පානි දෙවලොකෙ රමිස්සති,
අවසෙසෙසු කප්පෙසු වොකිණ්ණං සංසරිස්සති.

1406. ඛෙපෙත්වා පාපකං කම්මං පරිපක්කාය බුද්ධියා,
විනිපාතමගන්ත්වාන[4] කිලෙසෙ ඣාපයිස්සති."

1407. දමෙන උත්තමෙනාහං දමිතො'ම්හි මහෙසිනා,
පත්තො'ම්හි අචලං[5] ඨානං හිත්වා ජයපරාජයං.

---

1. ගරුළ, මජසං. P T S.
2. අරුණවා, මජසං.. 3. අවිදූරෙ හිමවන්තස්ස (සබ්බත්ථ)
4. විනිපාතාදියාගන්ත්වා, PTS. සෙ. 5. අමතං, මජසං.

## 67. වත්ථදායකත්ථෙරාපදානය

1393. (මම) පක්ෂියොනියෙහි උපන්නේ මනා පැහැ ඇති ගුරුළු රජෙක් වීමි. එකල්හි ගන්ධමාදන පර්වතයට වඩින්නා වූ බැහැර කළ කෙලෙස් රජස් ඇති බුදුරජානන් වහන්සේ දිටිමි.

1394 (දැක) ගුරුළු වෙස හැර මාණවක වෙසක් දැරීමි. තාදිගුණ ඇති ද්විපදෝත්තම බුදුරජානන් වහන්සේට මා විසින් එක් වස්ත්‍රයක් දෙනලදී.

1395. ලොකයෙහි අසහාය නායක වූ ශාස්තෘ වූ බුදුරජ තෙම ඒ වස්ත්‍රය පිළිගෙණ අහසෙහි සිටියේ මේ ගාථාව දෙසීය:

1396 "මේ වස්ත්‍රදානය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද ගුරුළු අත්බව හැර දෙව්ලොව සිත් අලවා වසන්නේය."

1397. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **අත්ථදස්සී** භාග්‍යවත් තෙමේ වස්ත්‍රදානය පසසා උතුරු දිගට මුහුණ ලා වැඩියේය.

1398. භවයෙහි උපදින කල්හි මට වස්ත්‍රසම්පත් (ඇති) වේ. අහසෙහි වියනක් ඇති වේ. වස්ත්‍රදානයාගේ මේ විපාක ය යි.

1499. සතිස්වන කපෙහි මනුෂ්‍යාධිපති වූ මහත් බල ඇති **අරුණක** නම ඇති සක්විතිරජවරු සත්දෙනෙක් වූහ.

1400. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **වත්ථදායකත්ථෙරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**වත්ථදායකත්ථෙරාපදානය සත්වැනියි.**

## 68. අම්බදායකත්ථෙරාපදානය

1401. හිමවත් පර්වතාන්තරයෙහි වැඩහුන් උපධිරහිත වූ **අනොමදස්සී** බුදුරජතෙම අප්‍රමාණ වූ (සත්ත්ව) ලොකයෙහි මෛත්‍රිය පැතිරවීය.

1402. එකල්හි මම උතුම් හිමවත් පව්වෙහි වඳුරෙක් වීමි. අලාමක වූ අපමණ ගුණ ඇති (උන්වහන්සේ) දැක ඒ බුදුරදුන් කෙරෙහි සිත පැහැදවීමි.

1403. එකල්හි හිමවතට නුදුරු තන්හි පලගත් අඹරුක් වූහ. එයින් අඹගෙඩියක් මීවදයක් සහිතව බුදුරජානන් වහන්සේට දිනිමි.

1404, 1405. **අනොමදස්සී** බුදුරජානන් වහන්සේ මට මෙසේ ප්‍රකාශ කළසේක: "මේ මීවද දානයෙන් ද අඹදානයෙන් ද යන දෙකින් මෙතෙම සත් පණස් කපක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. සෙසු කල්පයන්හි (දිව්‍යමනුෂ්‍ය දෙගතියෙහි) මිශ්‍රවශයෙන් සැරිසරන්නේය.

1406. පිරිපැසුනු නුවණින් පව්කම් ගෙවා දුගතියකට නොගොස් කෙලෙස් දවන්නේය." (කියායි.)

1407. මම මහර්ෂීන් වහන්සේ විසින් උත්තම වූ දමනයෙන් (රහත් බැවින්) දමනය කරණ ලදුයේ වෙමි. ජය පරාජය දෙක හැර නිශ්චලස්ථානයට (නිවණට) පැමිණියේ වෙමි.

1408 සත්තසත්තතිකප්පසතෙ **අම්බට්ඨජ** සනාමකා,
චතුද්දසා තෙ රාජානො චක්කවත්තී මහබ්බලා.

1409. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අම්බදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 69. සුමනත්ථෙරාපදානං

1410. **සුමනො** නාම නාමෙන මාලාකාරො අහං තදා
අද්දසං විරජං බුද්ධං ලොකාහුතිපටිග්ගහං[1]

1411. උභො හත්ථෙහි පග්ගය්හ සුමනං පුප්ඵමුත්තමං,
බුද්ධස්ස අභිරොපෙසිං **සිඛිනො** ලොකබන්ධුනො.

1412. ඉමාය පුප්ඵපූජාය චෙතනාපණිධීහි ච,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1413. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1414. ඡබ්බීසතිම්හි කප්පම්හි චත්තාරොසුං[2] මහායසා,
සත්තරතනසම්පන්නා රාජානො චක්කවත්තිනො.

1415. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **සුමනො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුමනත්ථෙරස්ස අපදානං නවමං**

## 70. පුප්ඵචඞ්ගොටියත්ථෙරාපදානං

1416. අභීතරූපං සීහංව අභිජාතංව කෙසරිං,
ව්‍යග්ඝුසභංව පවරං ගරුළග්ගංව පක්ඛිනං.*

1417. **සිඛිං** තිලොකසරණං අනෙජං අපරාජිතං,
නිසින්නං සමණානග්ගං භික්ඛුසංඝපුරක්ඛතං.

1418. චඞ්ගොටකෙ ඨපෙත්වාන අනොජං පුප්ඵමුත්තමං,
සහ චඞ්ගොටකෙනෙව බුද්ධසෙට්ඨං සමොකිරිං.

1419. තෙන චිත්තප්පසාදෙන දිපදින්දෙ නරාසභෙ[3]
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1420. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1421. සම්පුණ්ණෙ තිංසකප්පම්හි **දෙවභූතිසනාමකා**,
සත්තරතනසම්පන්නා පඤ්චාසුං චක්කවත්තිනො.

1422. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුප්ඵචඞ්ගොටියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුප්ඵචඞ්ගොටියත්ථෙරස්ස අපදානං දසමං**

---

1. ආහුතීනං පටිග්ගහං P T S. සෙ. 2. චත්තාරස්සු, P T S සෙ.

* "අභීත රූපං සීහං ච ගරුළග්ගංව පක්ඛිනං,
ව්‍යග්ඝුසභංව පවරං අභිජාතංව කෙසරිං"-
ඉති මුද්දිතපොත්ථකෙසු දිස්සතෙ.

3. දිපදින්ද නරාසභ, (සබ්බත්ථ)

1408. සත්දහස්සත්සියවන කපෙහි මහත් බල ඇති **අම්බටඨ** නම් වූ ඒ තුදුස් සක්විති රජවරු වූහ.

1409. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අම්බදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**අම්බදායකස්ථවිරාවදානය අටවැනිසි.**

## 69. සුමනස්ථවිරාවදානය

1410. මම එකල්හි නමින් **සුමන** නම් වූ මල්කරුවෙක් වීමි. (ඒ මම) කෙලෙස් රජස් රහිත ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනි වූ **සිඛී** බුදුරජානන් වහන්සේ දිටිමි.

1411. අතින් උතුම් සමන් මල් ගෙණ **සිඛී** බුදුරජානන් වහන්සේට පිදීමි.

1412. මේ මල්පූජාව හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් (ප්‍රාර්ථනාවන්) හේතු කොට ගෙණ ද දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය සි.

1413. මෙයින් එක්තිස්වන කපෙහි යම් මලක් පිදූයෙම් ද ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය සි.

1414. සව්සිවන කපෙහි මහත් යශස් ඇති සත්රුවනින් යුත් සක්විතිරජවරු සිවුදෙනෙක් වූහ.

1415. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සුමන** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**සුමනස්ථවිරාවදානය නවවැනිසි.**

## 70. පුප්ඵචඞ්ගෝටියස්ථවිරාවදානය

1416. උත්තම ජන්මවත් අභීත සවභාවය ඇති කෙශර සිංහරාජයෙකු මෙන් ද, උතුම් ව්‍යාඝ්‍රයෙකු මෙන් ද, පක්ෂීන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ ගුරුළකු මෙන් ද,

1417, 1418. කෙලෙස් රහිත වූ පස්මරුන් දිනුවා වූ ශ්‍රමණයනට අග්‍ර වූ භික්ෂුසංඝයා පිරිවරා හුන් තිලොවට පිළිසරණ වූ **සිඛී** බුදුරජානන් වහන්සේට උතුම් කටුකරඬු මල් ගොටුවක තබා ගොටුව ද සමග පිදීමි.

1419. ද්විපදෙත්තම වූ නරශ්‍රෙෂ්ඨ බුදුරජාණන් වහන්සේ කෙරෙහි එම චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ ජයපරාජය දෙක ම (හැර) නිශ්චලස්ථානයට (නිවණට) පැමිණියේ වෙමි.

1420. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක ය සි.

1421. තිස්කපක් සම්පූර්ණ වූ කල්හි සත්රුවනින් යුත් **දෙවභූති** නම් සක්විතිරජවරු පස්දෙනෙක් වූහ.

1422. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පුප්ඵචඞ්ගෝටිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**පුප්ඵචඞ්ගෝටියස්ථවිරාවදානය දසවැනිසි.**

උද්දානං:

සකචින්තී අවොපුප්ඵී පච්චාභිගමනෙන ච
පරප්පසාදී භිසදො සුචින්තී වත්ථදායකො
අම්බදායී ච සුමනො පුප්ඵචඞ්ගොටියො'පි ච
ගාථෙකසත්තති වුත්තා ගණිතා අත්ථදස්සිභි.

**සකචින්තනියවග්ගො සත්තමො.**

## 71. නාගසමාලත්ථෙරාපදානං

1423. ආපාටලිං[1] අහං පුප්ඵං උජ්ඣිතසම්හි මහාපථෙ,[2]
ථූපම්හි අභිරොපෙසිං **සිඛිනො** ලොකබන්ධුනො.

1424. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ථූපපූජායිදං ඵලං.

1425. ඉතො පණ්ණරසෙ කප්පෙ **භූමියො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1426. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නාගසමාලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නාගසමාලත්ථෙරස්ස අපදානං පඨමං.***

## 72. පදසඤ්ඤකත්ථෙරාපදානං

1427. අක්කන්තං ච පදං දිස්වා තිස්සස්සාදිච්චබන්ධුනො
හට්ඨො හට්ඨෙන චිත්තෙන පාදෙ චිත්තං පසාදයිං.

1428. දෙවනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි පදසඤ්ඤායිදං ඵලං.

1429. ඉතො සත්තමකෙ කප්පෙ **සුමෙධො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1430. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදසඤ්ඤකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1. අපාටලිං, සබ්බත්ථ. 2. උජ්ඣිතං සුමහාපථෙ, සබ්බත්ථ.
* ථෙරගාථට්ඨකථායං පනස්ස ථෙරස්ස විසදිසං අපදානං දිස්සති.

උද්දානය:

සකචිත්තනිය ආවොපුප්ඵිය - පච්චාගමනීය ද,
පරප්පවාදිය භිසදය - සුචින්තිය වත්ථදායකය.
අම්බදායක සුමනය - පුප්ඵචඞ්ගොටිය දස
ගී එක්සැත්තෑවකින් - පිඩුකොට මෙහි කියන ලදි.

**සකචිත්තනියවර්ගය සත්වැනියි**

## 71. නාගසමාලස්ථවිරාපදානය

1423. මම (නගරවාසීන්ගේ වැඳුම් පිදුම් සඳහා) නගරමැද වීථියෙහි (ගඩොල් ආදියෙන්) නිමවනලද **සිඛී** බුදුරජුන්ගේ ස්තූපයෙහි ආදර සහිතව පලොල්මලක් ගෙණ පිදීමි.*

1424. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ස්තූපපූජාවෙහි මේ විපාකය යි.

1425. මෙයින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **භූමිය** නම් සක්විති රජෙක් වීමි.

1426. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **නාගසමාල** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**නාගසමාලස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 72. පදසඤ්ඤකස්ථවිරාපදානය

1427. **තිස්ස** බුදුරජානන් වහන්සේගේ ඇක්මුනු පදලස් දැක සතුටු වූයේ සතුටු සිතින් ඒ ශ්‍රීපාදයෙහි සිත පැහැදවීමි.

1428. මෙයින් දෙඅනූවන කපෙහි වූ එකල්හි (ශ්‍රීපාදය පිළිබඳ) යම් සංඥාවක් ලැබීම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පදසංඥාවෙහි (සිරිපාසටහන් පිදීමෙහි) මේ විපාකය යි.

1429. මෙයින් සත්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බලඇති **සුමෙධ** නම් සක්විති රජෙක් විය.

1430. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පදසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පදසඤ්ඤකස්ථවිරාපදානය දෙවැනි යි.**

* අට්ඨකථාව බලනු.

## 73. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං[1]

1431. දුමග්ගෙ පංසුකූලිකං ලග්ගං දිස්වාන සත්ථුනො,
තතො තමඤ්ජලිං කත්වා පංසුකූලං අවන්දහං.

1432. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

1433. ඉතො චතුත්ථකෙ කප්පෙ **දුමසාරො**'සි ඛත්තියො[2]
චාතුරන්තො විජිතාවී චක්කවත්තී මහබ්බලො.

1434. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බුද්ධසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බුද්ධසඤ්ඤකත්ථෙරස්ස අපදානං තතියං.**

## 74. භිසාලුවදායකත්ථෙරාපදානං

1435. කානනං වනමොගය්හ වසාමි විපිනෙ[3] අහං,
**විපස්සිං** අද්දසං බුද්ධං ආහුතීනං පටිග්ගහං.

1336. භිසාලුවඤ්ච පාදාසිං උදකං හත්ථධොවනං,
වන්දිත්වා සිරසා පාදෙ පක්කාමිං උත්තරාමුඛො.

1437. එකනවුතෙ ඉතො කප්පෙ භිසාලුවමදං තදා,
දුග්ගතිං නාභිජානාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

1438. ඉතො තතියකෙ කප්පෙ **භිසසම්මත**ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1439. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භිසාලුවදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භිසාලුවදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 75. එකසඤ්ඤකත්ථෙරාපදානං

1440. **ඛණ්ඩො** නාමාසි නාමෙන විපස්සිස්ස'ග්ගසාවකො,
එකා භික්ඛා මයා දින්නා ලොකාහුතිපටිග්ගහෙ.

1441. තෙන චිත්තප්පසාදෙන දිපදින්දෙ නරාසභෙ,[4]
දුග්ගතිං නාභිජානාමි එකභික්ඛායිදං ඵලං.

---

1. සඤ්ඤකත්ථෙරාපදානං, සෙ. P T S. අ.
2. දුමසාරො සුඛත්තියො P T S. සෙ
3. විවනෙ, අ. PTS.
4. දිපදින්ද නරාසභ, සීමු. මජසං.

## 73. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානය

1431. ගසක් මුදුනෙහි ලැගුනු බුදුරජානන් වහන්සේගේ පවුල් සිවුර දැක ඉක්බිති එයට ඇඳිලි බැඳ මම ඒ පවුල්සිවුර වැන්දෙමි.

1432. මෙයින් දෙඅනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධ ය යන හැඟීමෙහි මේ විපාකයයි.

1433. මෙයින් සිවුවැනි කපෙහි සිවුමහ සයුර කෙළවර කොට ඇති පොළවට අධිපති වූ සතුරුරජුන් ජයගත්තා වූ මහත් බලඇති **දුමසාර** නම් සක්විති රජෙක් වී ය. (=වීමි).

1434. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **බුද්ධසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**බුද්ධසඤ්ඤකත්ථෙරාපදානය තෙවැනියි.**

## 74. භිසාලුවදායකත්ථෙරාපදානය

1435. මම මහවනයට පිවිස (එ ම) වනයෙහි වසමි. ලෝවැසියන්ගේ පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවට ගෙයක් වැනි වූ **විපස්සී** බුදුරජානන් වහන්සේ දිටිමි.

1436. (උන්වහන්සේට) අත ධෝනා දිය ද නෙළුම්අල ද පිදීමි. (ඉක්-බිති) භිස තමා (උන්වහන්සේගේ) ශ්‍රීපාදයන් වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

1437. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි නෙළුම්අල දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මේ ඒ පුණ්‍යකර්මයාගේ විපාක ය සි.

1438. මෙයින් තෙවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **භිස** නම් සක්විතිරජෙක් විය (=වීමි).

1439. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **භිසාලුවදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**භිසාලුවදායකත්ථෙරාපදානය සිවුවැනියි.**

## 75 එකසඤ්ඤකත්ථෙරාපදානය

1440. **විපස්සී** බුදුරජානන් වහන්සේගේ නමින් **ඛණ්ඩ** නම් වූ අග්‍රශ්‍රාවකයෙක් විය. ලොකයාගේ පූජාවන් පිළිගැණීමට සුදුසු (දක්ෂිණෙය්‍ය) වූ උන්වහන්සේ කෙරෙහි මා විසින් එක භික්ෂාවක් දෙනලදී.

1441. ද්විපදෝත්තම වූ තරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි වූ ඒ චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ දුගතියක් නො දනිමි. එක භික්ෂාවෙහි මේ විපාකය සි.

1442. චත්තාළීසෙ ඉතො කප්පෙ **වරුණො** නාම ඛත්තියො
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1443. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඒකසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඒකසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 76. තිණසන්ථරදායකත්ථෙරාපදානං

1444. හිමවන්තස්ස අවිදූරෙ මහාජාතස්සරො අහු,
සතපත්තෙහි සඤ්ඡන්නො නානාසකුණමාලයො.

1445. තම්හි නහාත්වා පිත්වා ච අවිදූරෙ වසාමහං,
අද්දසං සමණානග්ගං ගච්ඡන්තං අනිලඤ්ජසෙ.

1446. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
ව්‍යොමහා ඔරුහිත්වාන භූමියට්ඨාසි තාවදෙ.

1447. විසාණෙන තිණං ගය්හ නිසීදනමදාසහං,
නිසීදි භගවා තත්ථ **තිස්සො** ලොකග්ගනායකො[1].

1448. සකං චිත්තං පසාදෙත්වා අවන්දිං ලොකනායකං,
පතිකුටිකො[2] අපසක්කිං[3] නිජ්ඣායන්තො මහාමුනිං.

1449. තෙන චිත්තප්පසාදෙන **නිම්මානං** උපපජ්ජහං,
දුග්ගතිං නාභිජානාමි සන්ථරස්ස ඉදං ඵලං.

1450. ඉතො දුතියකෙ කප්පෙ **මිගසම්මත**ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1451. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිණසන්ථරදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිණසන්ථරදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 77. සූචිදායකත්ථෙරාපදානං

1452. තිංසකප්පසහස්සම්හි සම්බුද්ධො ලොකනායකො,
**සුමෙධො** නාම නාමෙන බාත්තිංසවරලක්ඛණො.

1453. තස්ස කඤ්චනවණ්ණස්ස දිපදින්දස්ස තාදිනො,
පඤ්ච සූචී මයා දින්නා සිබ්බනත්ථාය චීවරං.

---

1. ලොකජිනායකො, P T S.
2. පටිකුටිකො, මජසං. උක්කුටිකො, සභා. පටික්කුටිකො, සෙ.
3. අවසක්කිං, සෙ P T S.

1442. මෙයින් සතළිස්වන කපෙහි සත්රුවනින් යුත් වූ මහත් බල ඇති **වරුණ** නම් සක්විති රජෙක් විය (=වීමි).

1443. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේක් සි.

**එකසඤ්ඤකස්ථවිරාපදානය පස්වැනියි.**

## 76. තිණසන්ථරදායකස්ථවිරාපදානය

1444. හිමවතට නුදුරු තන්හි පියුම්මලින් ගැවසීගත් නානා පක්ෂීන්හට වාසස්ථාන වූ මහාජාතස්සරයක් (ඉබේ හට ගත් මහවිලක්) විය.

1445. මම (තවුසෙක් ව) ඒ විලෙහි නා පැන් බී (විලට) නුදුරු තන්හි වසමි. (එහි දී) අහස්මගෙහි යන ශ්‍රමණයනට අග්‍ර වූ බුදුරජානන් වහන්සේ දිටිමි.

1446. ලොකයෙහි නිරුත්තර වූ ශාස්තෘන් වහන්සේ මාගේ අදහස දැන අහසින් බැස එකෙණෙහි භූමියෙහි වැඩසිටි සේක.

1447. මම අතකින් තෘණ (කපා) ගෙණ නිසීදනයක් (=තණඇතිරියක් කොට) දිනිමි. **තිස්ස** බුදුරජානන් වහන්සේ එහි වැඩහුන් සේක.

1448. සිය සිත පහදවා ලොකනායක වූ බුදුන් වැන්දෙමි. (ඉක්බිති) මහාමුනින් වහන්සේ සිහි කරමින් (සිරුරෙන්) හැකිළුනෙම් පසුබැස ගියෙමි.

1449. එම චිත්තප්‍රසාදය හේතු කොටගෙණ මම **නිම්මාණරති** දෙව් ලොව උපනිමි. දුගතියක් නො දනිමි. මෙය තණඇතිරිය පිදීමේ විපාකයයි.

1450. මෙයින් දෙවැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මිග** නම් සක්විතිරජෙක් විය.

1451. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිණසන්ථරදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**තිණසන්ථරදායකස්ථවිරාපදානය සවැනියි.**

## 77. සූචිදායකස්ථවිරාපදානය

1452. තිස්දහස්වන කපෙහි උතුම් දෙතිස් මහපුරිස්ලකුණු ඇති නමින් **සුමෙධ** නම් වූ ලොකනායක වූ බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සේක.

1453. තාදිගුණ ඇති කසුත්වත් වූ ද්විපදෙන්ද්‍ර වූ ඒ බුදුරජානන් වහන්සේට සිවුර මසනු පිණිස මා විසින් හිඳි (කටු) පසක් දෙනලදී.

1454. තෙනේ'ව සූචිදානෙන නිපුණත්ථවිපස්සකං,
තික්ඛං ලහුඤ්ච ඵාසුඤ්ච ඤාණං මෙ උදපජ්ජථ.

1455. **ද්විපදාධිපතී** නාම රාජානො චතුරො අහුං,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1456. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1457. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **සූචිදායකො** ථෙරො ඉමා ගථායො අභාසිත්ථාති.

**සූචිදායකත්ථෙරස්ස අපදානං සත්තමං**

## 78. පාටලිපුප්ඵියත්ථෙරාපදානං

1458. සෙට්ඨිපුත්තො තදා ආසිං සුඛුමාලො සුඛෙධිතො
උච්ඡඞ්ගෙ පාටලිපුප්ඵං කත්වා තං අභිසංහරිං.

1459. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
කඤ්චනග්ඝියසඞ්කාසං ද්වත්තිංස[1] වරලක්ඛණං.*

1460. හට්ඨො හට්ඨෙන චිත්තෙන පුප්ඵෙන[2] අභිපූජයිං,
**තිස්සං** ලොකවිදුං නාථං නරදෙවං නමස්සහං.

1461. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1462. ඉතො තෙසට්ඨිකප්පම්හි **අභිසම්මත**නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1463. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පාටලිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පාටලිපුප්ඵියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 79. ඨිතඤ්ජලියත්ථෙරාපදානං

1464. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
තත්ථද්දසාසිං සම්බුද්ධං **තිස්සං** පවරලක්ඛණං.

1465. තස්සාහං[3] අඤ්ජලිං කත්වා පක්කාමිං පාචිනාමුඛො,
අවිදූරෙ නිසින්නස්ස නියකෙ පණ්ණසන්ථරෙ.

1466. තතො මෙ අසනීපාතො මත්ථකෙ නිපතී තදා,
සො'හං මරණකාලම්හි අකාසිං පුනරඤ්ජලිං.

1. ඛත්තිංස, මජ්සං. 2. පුප්ඵෙහි, මජ්සං. සෙ.
3. තත්ථාහං, මජ්සං. PTS.
* අයං ගාථා අස්මිං අපදානෙ පඨමගාථාවසෙන පොත්ථකෙසු දිස්සතෙ.

1454. ඒ හිදිකටුදන හේතු කොට ගෙණ ම සියුම් අර්ථයන් විශෙෂයෙන් දක්නා සුලු වූ තියුණු වූ ශීඝ්‍ර වූ පහසු වූ නුවණ මට උපන්නේ ය.

1455. සත්රුවනින් යුත් මහත් බල ඇති **ද්විපදාධිපති** නම් වූ සිවුරජ කෙනෙක් වූහ.

1456. මාගේ කෙලෙස් දවනලදී. සියලු භවයෝ නසන ලදහ. සම්බුදුසසුනෙහි පශ්චිමශරීරය දරමි.

1457. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සූචිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**සූචිදායක ස්ථවිරාවදානය සත්වැනියි.**

## 78. පාටලිපුප්ඵියස්ථවිරාවදානය

1458. එකල්හි මම සියුමැලි වූ සුව සේ වැඩුනු සිටුපුත්‍රයෙක් වීමි. පලොල්මලක් ඔඩොක්කුවෙහි ලා එය ගෙණ ගියෙමි.

1459, 1460. අතුරු අවුණෙහි (වීථියෙහි) වඩින්නා වූ ස්වර්ණවර්ණ වූ රන්ඇගෑවක් මෙන් බබලන දෙතිස් මහපුරිස්ලකුණු ඇති නරශ්‍රෙෂ්ඨ වූ (අනාථ) නාථ වූ සියල්ල අවබොධ කළ **තිස්ස** බුදුරජානන් වහන්සේට සතුටු වූයෙමි සතුටු සිතින් ඒ මලින් පිදීමි. උන්වහන්සේට නමස්කාර ද කෙළෙමි.

1461. එකල්හි මෙයින් දෙඅනුවන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකයයි.

1462. මෙයින් තෙසැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අභිසම්මත** නම් සක්විතිරජෙක් වීමි.

1463. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පාටලිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පාටලිපුප්ඵියස්ථවිරාවදානය අටවැනියි.**

## 79. ඨිතඤ්ජලියස්ථවිරාවදානය

1464. මම පෙර මහවනයෙහි මුවවැද්දෙක් වීමි. එහිදී උතුම් ලකුණු ඇති **තිස්ස** බුදුරජානන් වහන්සේ දිටිමි.

1465. නුදුරු තන්හි සිය පන්ඇතිරියෙහි වැඩහුන් උන්වහන්සේට මම ඇඳිලි බැඳ පෙරදිගට මුහුණ ලා ගියෙමි.

1466. එකල්හි මාගේ හිස මත සෙනක් වැටින. ඉක්බිති මැරෙණ කල්හි ද මම නැවත ඇඳිලි කෙළෙමි.

1467. ද්වෙනවුතෙ ඉතො කප්පෙ අඤ්ජලිං අකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි අඤ්ජලිස්ස ඉදං ඵලං.

1468. චතුපඤ්ඤාසකප්පම්හි **මිගකෙතු** සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1469. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සීතඤ්ජලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සීතඤ්ජලියත්ථෙරස්ස අපදානං නවමං.**

## 80. තිපදුමියත්ථෙරාපදානං

1470. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ,
දන්තො දන්තපරිවුතො නගරා නික්ඛමී ජිනො.

1471. නගරෙ හංසවතියා අහොසිං මාලිකො තදා,
යං තත්ථ උත්තමං පුප්ඵං තීණි පුප්ඵානි[1] අග්ගහිං.

1472. අද්දසං විරජං බුද්ධං පටිමග්ගන්තරාපණෙ,
සො'හං[2] දිස්වාන සම්බුද්ධං එවං චින්තෙසහං තදා:

1473. "කිමෙම ඉමෙහි පුප්ඵෙහි රඤ්ඤො උපනෙතෙහි[3] මෙ,
ගාමං වා ගාමක්ඛෙත්තං වා සහස්සං වා ලභෙය්‍යහං.

1474. අදන්තදමකං වීරං සබ්බසත්තසුඛාවහං,
ලොකනාථං පූජයිත්වා ලච්ඡාමි අමතං ධනං."

1475. එවාහං චින්තයිත්වාන සකං චිත්තං පසාදයිං,
තීණි ලොහිතකෙ ගය්හ ආකාසෙ උක්ඛිපිං[4] තදා.

1476. මයා උක්ඛිත්තමත්තම්හි ආකාසෙ පත්ථරිංසු[5] තෙ,
ධාරිංසු මත්ථකෙ තත්ථ උද්ධංවණ්ටා අධොමුඛා.

1477. යෙ කෙචි මනුජා දිස්වා උක්කුට්ඨිං සම්පවත්තයුං,
දෙවතා අන්තළික්ඛම්හි සාධුකාරං පවත්තයුං:

---

1. පදුමපුප්ඵා, මජ්ඣසං  2. සහ, සෙ.  3. උපනීතෙහි, සබ්බත්ථ.
4. උක්කිරිං, සෙ  5 උක්කිරිංසු සෙ.

1467. මෙයින් දෙයානුවන කපෙහි වූ එකල්හි යම් ඇඳිලි (බැඳීමක්) කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. අඤ්ජලිකම්යාගේ මේ විපාකය යි.

1468. සුපණ්ණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මිගකෙතු** නම් සක්විතිරජෙක් වීමි.

1469. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සිතඤ්ජලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සී.

**සිතඤ්ජලියස්ථවිරාපදානය නවවැනියි.**

## 80. තිපදුම්යස්ථවිරාපදානය

1470. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය දැමුනා වූ දැමුනවුන් විසින් පිරිවරණ ලද පස්මරුන් දිනූ **පදුමුත්තර** නම් බුදුරජානන් වහන්සේ නුවරින් නික්මුනු සේක.

1471. එකල්හි මම **හංසවතීනගරයෙහි** මල්කරුවෙක් වීමි. එහි (මල් රැසෙහි) උතුම් මල් වී ද, ඒ මල්වලින් (ඉතා ශොභාවත්) මල් **තුණක්** ඇරගතිමි.

1472. අතුරු අවුණෙහි පෙරමගට එන කෙලෙස් රජස් විරහිත බුදුරජානන් වහන්සේ දිටිමි. එකල්හි ඒ මම බුදුරජානන් වහන්සේ දැක මෙසේ සිතීමි:

1473. "රජුට පිරිනමනලද මේ මල්වලින් මට කවර ප්‍රයෝජන ද ? ඉදින් ප්‍රයෝජනයක් වතොත් මම ගමක් හෝ ග්‍රාමක්ෂෙත්‍රයක් හෝ ලබන්නෙමි.

1474. නොදැමුනවුන් දමනය කරන්නාවූ ප්‍රාඥ වූ සියලු සතුනට සැප එළවන්නා වූ බුදුරජානන් වහන්සේ (මේ මලින්) පුදා අමෘතධනය (=නිවණ) ලබන්නෙමි"යි කියා යි.

1475. මම මෙසේ සිතා සියසිත පැහැදවීමි. එකල්හි ලෙහෙවන් මල් **තුණක්** ගෙණ අහසෙහි දැමීමි.

1476. මා විසින් උඩට ඉසිනලද කෙණෙහි ඒ කුසුමයෝ අහසෙහි පැතුරුණාහුය. (තථාගතයන් වහන්සේගේ හිස) මතුයෙහි වූ එහි නැටි උඩුකුරු ව මල් අධොමුඛ ව අහසෙහි නැවතුනාහු ය.

1477. යම් කිසි මිනිස් කෙනෙක් එය දැක (සිටියාහු ද ඔහු) ප්‍රීතිඝොෂා පැවැත්වූවාහු ය. (එසේ ම) අහසෙහි දෙවියෝ ද සාධුනාද පැවැත්වූහ.

1478. "අච්ඡෙරං ලොකෙ උප්පන්නං බුද්ධසෙට්ඨස්ස වාහසා,
සබ්බෙ ධම්මං සුණිස්සාම පුප්ඵානං වාහසා මයං."

1479. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
වීථියං හි ඨිතො සත්ථා[1] ඉමා ගාථා අභාසථ:

1480. "යො සො බුද්ධං අපූජෙසි රතනපද්මෙහි[2] මාණවො,
තමහං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො.

1481. තිංස කප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
තිංස කප්පානි දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

1482. **මහාවිත්ථාරිකං** නාමං ව්‍යම්හං හෙස්සති තාවදෙ,
තියොජනසතුබ්බෙධං දියඩ්ඪසතවිත්ථතං.

1483. චත්තාරි සතසහස්සානි නිය්‍යූහා ච සුමාපිතා,
කූටාගාරවරූපෙතා මහාසයනවොසිතා.

1484. කොටිසතසහස්සායො පරිවාරෙස්සන්ති අච්ඡරා,
කුසලා නච්චගීතස්ස වාදිතෙපි පදක්ඛිණා.

1485. එතාදිසෙ ව්‍යම්හවරෙ නාරීගණසමාකුලෙ,
වස්සිස්සති පුප්ඵවස්සො දිබ්බො ලොහිතකො සදා.

1486. භිත්තිඛීලෙ නාගදන්තෙ ද්වාරබාහාය[3] තොරණෙ,
චක්කමත්තා ලොහිතකා ඔලම්බිස්සන්ති තාවදෙ.

1487. පත්තෙන පත්තසඤ්ඡන්නෙ[4] අන්තොව්‍යම්හවරෙ ඉධ,
අත්ථරිත්වා පාරුපිත්වා තුවට්ටිස්සන්ති තාවදෙ.

1488. භවනං පරිවාරෙත්වා සමන්තා සතයොජනං,
තෙ විසුද්ධා ලොහිතකා දිබ්බගන්ධං පවායරෙ.

1489. පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්ති භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

1490. සම්පත්තියො දුවෙ භුත්වා අනීති අනුපද්දවො,
සම්පත්තෙ පරියොසානෙ නිබ්බාණං ඵස්සයිස්සති."

1491. සුදිට්ඨො වත මෙ බුද්ධො වාණිජ්ජං සුප්පයොජිතං,
පද්මානි[5] තීණි පූජෙත්වා අනුභොසිං තිසම්පදං.

1492. අජ්ජ මෙ ධම්මප්පත්තස්ස විප්පමුත්තස්ස සබ්බසො,
සුපුප්ඵිතං ලොහිතකං ධාරයිස්සති මත්ථකෙ.

---

1. සත්තා, සෙ. 2. රතනපදුමෙහි, සීමු. 3. ද්වාරබාහෙ, සෙ.
4. පත්තං පිඤ්ජරෙන, සෙ. 5. පදුමානි, සෙ. P T S.

1478. "බුදුරජාණන් වහන්සේගේ බලයෙන් ලොකයෙහි ආශ්චර්යයයි වූ දෑ පහළ විය. අපි සියල්ලෝ (උන්වහන්සේට ඒ) මල්පිදීමේ බලයෙන් ධර්මය අසන්නෙමු" ය කියායි

1479. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවන් රැස් වීමට ගෙයක් වැනි වූ විපියෙහි වැඩසිටි ශාස්තෘ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක:

1480. "යම් ඒ මාණවකයෙක් තෙම රත්පියුම්වලින් බුදුරජාණන් වහන්සේ පිදී ද, මම හේ කවරෙක්දැයි ප්‍රකාශ කරන්නෙමි. එසේ පවසන්නා වූ මාගේ වචනය අසවු.

1481. මෙතෙම කප් තිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. තිස්කපක් මුළුල්ලෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

1482. එකල්හි තුන්සියක් යොදුන් උස ඇති එක්සියපණස් යොදුන් පුළුල ඇති මහාවිත්ථාරික නම් (සඳලුසහිත) විමනෙක් පහළ වන්නේ ය.

1483. එහි සුනිර්මිත ද්වාරයෝ හාරලක්ෂයක් වෙති. කුළුගෙවලින් ශුක්තයහ. මහාසයනයන්ගෙන් නිමවන ලදහ.

1484. නෘත්‍යගීතයන්හි දක්ෂ, වාදනයෙහි ද හුරුපුරුදු කෙළලක්ෂයක් අප්සරාවෝ පිරිවරන්නාහු ය.

1485. දිව්‍යාප්සරා සමූහයා විසින් ගැවසීගත් මෙබඳු උතුම් විමනෙහි හැම කල්හි දිව්‍යමය වූ ලෙහෙවන් මල්වැසි වසී.

1486. එකල්හි බිත්තියෙහි වූ ඇණවල ද නාදැතිවල ද උළුවස්සුවල ද තොරන්හි ද චක්‍රප්‍රමාණ වූ ලෙහෙවන් පුෂ්පයෝ එල්බෙන්නාහු ය.

1487. එකල්හි මල් පෙත්තෙන් පෙත්ත වැසෙන සේ වූ මේ විමානය තුළ (ඒ මලින් ම කළ ඇතිරි) අතුරා (පොරෝණා) පොරොවා හෝනාහු ය.

1488. භවනය වටා හාත්පස යොදුන් සියයක් ඒ පිරිසිදු ලෙහෙවන් පුෂ්පයෝ දිවසුවඳ පතුරුවත්.

1489. පන්සැත්තෑවරක් සක්විතිරජ වන්නේ ය. මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නො හැකි ය.

1490. (දිව්‍ය මනුෂ්‍ය) ද්විවිධ සම්පත් අනුභව කොට උවදුරු රහිත වූයේ උපද්‍රව නැත්තේ පශ්චිමභවය පැමිණි කල්හි නිවණ පහස්නේය- අවබොධ කරන්නේය" කියායි

1491. මා විසින් බුදුරජාණන් වහන්සේ මැනැවින් දක්නාලදී. වණික් කර්මය මැනැවින් යොදන ලදී. තුන්පියුමක් පුදා දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ යන ත්‍රිවිධසම්පත්තිය අනුභව කෙළෙමි.

1492. අද නිර්වාණධර්මයට (සාක්ෂාත් කිරීම් වශයෙන්) පැමිණියා වූ සර්වාකාරයෙන් (කෙලෙසුන්ගෙන්) මිදුනා වූ මාගේ හිස මතුයෙහි මැනැවින් පිපුනු ලෙහෙවන් පියුමක් පවත්නේ ය.

1493. මම කම්මං[1] කථෙන්තස්ස පදුමුත්තරසත්ථුනො,
සත්තපාණසහස්සානං ධම්මාභිසමයො අහු.

1494. සතසහස්සෙ ඉතො කප්පෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි තිණ්ණං පදුමානිදං[2] ඵලං.

1495. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථි'දානි පුනබ්භවො.

1496. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිපදුමියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිපදුමියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

නාගසමාලො පදසඤ්ඤී සසඤ්ඤකොලුවදායකො
එකසඤ්ඤී තිණදදො සුචි පාටලිපුප්ඵියො
ඨිතඤ්ජලී තිපදුමී ගාථායො පඤ්චසත්තති.

**නාගසමාලවග්ගො අට්ඨමො.**

## 81. තිමිරපුප්ඵියත්ථෙරාපදානං

1497. **චන්දභාගා**නදීතීරෙ අනුසොතං වජාමහං,
නිසින්නං සමණං දිස්වා විප්පසන්නමනාවිලං.

1498. තත්ථ[3] චිත්තං පසාදෙත්වා එවං චින්තෙසහං තදා,
"තාරයිස්සති තිණ්ණො'යං දන්තො'යං දමයිස්සති.

1499. අස්සාසෙස්සති අස්සත්ථො සන්තො ච සමයිස්සති,
මොචයිස්සති මුත්තො ච නිබ්බාපෙස්සති නිබ්බුතො".

1500. එවං සං[4] චින්තයිත්වාන **සිද්ධත්ථස්ස** මහෙසිනො,
ගහෙත්වා තිමිරං පුප්ඵං මත්ථකෙ ඔකිරිං අහං.

1501. අඤ්ජලිං පග්ගහෙත්වාන කත්වාන ච පදක්ඛිණං,
වන්දිත්වා සත්ථුනො පාදෙ පක්කාමිං අපරං දිසං.

---

1 ධම්මං, සෙ. 2 තිණිපදුමානිදං, (සබ්බත්ථ)
3. තස්ස, සෙ PTS. 4. එවාහං, සබ්බත්ථ.

1493. **පදුමුත්තර** බුදුරජහු මාගේ කර්මය ප්‍රකාශ කරණ කල්හි සත්දහසක් ප්‍රාණීන්හට ධර්මාභිසමය විය.

1494. මෙයින් සියක්දහස්වන කපෙහි බුදුරජුන්නට යම් පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. **පියුම් තුණ පිදීමේ** මේ ප්‍රතිඵලය යි.

1495. මාගේ කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ **ක්ෂය කරණ** ලදහ. දැන් නැවත **ඉපදීමෙක් නැත.**

1496. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජනන් වහන්සේගේ සසුන **කරණ** ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **තිපදුමිය ස්ථවිරයන්** වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**තිපදුමියස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

නාගසමාල පදසඤ්ඤක – බුද්ධසඤ්ඤක ආලුවදායක,
එකසඤ්ඤක තිණදද – සූචි පාටලිපුප්ඵිය,
ඨිතඤ්ජලී තිපදුමී වත්දස – පන්සැත්තෑ ගයෙක් වේ.

**නාගසමාලවග්ගය අටවැනි යි.**

# 81. තිමිරපුප්ඵියස්ථවිරාවදානය

1497. මම **චන්ද්‍රභාගා** නදීතීරයෙහි යටිහොයට (=ගඟ බැස යන අතට තැන් තැන්වල ලැගුම් ගණිමින්) යමි. (එකල්හි) වැඩහුන් **සත්**-සිඳුවන ලද පව් ඇති පැහැදුනු නො කැලඹුනු සිත් ඇති බුදුරජුන් දුක-

1498. මම එහි සිත පහදවා මෙසේ සිතීමි: "මේ (සර්වඥ) තෙම (සසරසයුරින්) එතෙර වූයේ (සෙස්සන් ද) එතෙර කරවන්නේ ය. මේ (සර්වඥ) තෙමේ දාන්ත වූයේ (සෙස්සන් ද) දමනය කරන්නේ ය.

1499. තෙමේ අස්වැසුනේ (සෙස්සන් ද) අස්වසන්නේ ය. තෙමේ ශාන්ත වූයේ (සෙස්සන් ද) ශාන්ත කරන්නේ ය. තෙමේ මිදුනේ (සෙස්සන් ද) මුදවන්නේ ය. තෙමේ නිවුනේ (සෙස්සන් ද) නිවණට පමුණුවන්නේ ය" කියායි.

1500. මම මෙසේ සිතා **සිඛාණී** බුදුරජානන් වහන්සේට **තිමිරමල්** (=විසිදි නිල් රැසින් වනය අඳුරු වූවාක් මෙන් **කරණ** මල් වර්ගයක්) බුදු-රජානන් වහන්සේගේ මත්තෙහි විසිරවීමි.

1501. ඇඳිලි බැඳ පැදකුණු කොට බුදුරජානන් වහන්සේගේ ශ්‍රී පාදයන් වැඳ බටහිරදිගට ගියෙමි.

1502. අචිරං ගතමත්තං මං මිගරාජා විහෙඨයි[1],
පපාතමනුගච්ඡන්තො තත්ථෙව පපතිං අහං.

1503. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1504. ඡප්පඤ්ඤාසම්හි කප්පම්හි සෙත්තවාසුං මහායසා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1505. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිමිරපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**තිමිරපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 82. ගතසඤ්ඤකත්ථෙරාපදානං

1506. ජාතියා සත්තවස්සො'හං පබ්බජිං අනගාරියං,
අවන්දිං සත්ථුනො පාදෙ විප්පසන්නෙන චෙතසා.

1507. සත්ත නඞ්ගලිකීපුප්ඵෙ ආකාසෙ උක්ඛිපිං අහං,
තිස්සං බුද්ධං සමුද්දිස්ස අනන්තගුණසාගරං.

1508. සුගතානුගතං[2] මග්ගං පූජෙත්වා හට්ඨමානසො
අඤ්ජලිඤ්ච තදා'කාසිං පසන්නො සෙහි පාණිහි.

1509. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1510. ඉතො අට්ඨමකෙ කප්පෙ තයො අග්ගිසිඛා අහුං,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1511. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගතසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගතසඤ්ඤකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 83. නිපන්නඤ්ජලියත්ථෙරාපදානං

1512. රුක්ඛමූලෙ නිසින්නො'හං ව්‍යාධිතො පරමෙන ච,
පරමකාරුඤ්ඤපත්තො'ම්හි අරඤ්ඤෙ කානනෙ අහං.

1513. අනුකම්පං උපාදාය **තිස්සො** සත්ථා උපෙසි මං,
සො'හං නිපන්නකො සන්තො සිරෙ කත්වාන අඤ්ජලිං.

---

1. අපීළයි, මජසං. සෙ 2. සුගතෙන ගතං (අට්ඨකථා)

1502. තොබෝ වේලාවක් ගියා වූ මා සිංහයෙක් පෙළී ය. මම ප්‍රපාතය අනු ව යන්නෙම් එහි ම වැටුනෙමි.

1503. මෙයින් සිවුඅනූවන කපෙහි යම් මල්පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1504. සපණ්ණස්වන කපෙහි මහත් යශස් ඇති සත්රුවනින් යුත් මහත් බල ඇති සක්විතිරජවරු සත්දෙනෙක් වූහ.

1505. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **තිමිරපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**තිමිරපුප්ඵියස්ථවිරාවදානය පළමුවැනියි.**

## 82. ගතසඤ්ඤකස්ථවිරාවදානය

1506. උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම අනගාරියසඞ්ඛ්‍යාත ශාසනයෙහි පැවිදි වීමි. පැහැදුනු සිතින් (යුතු ව) ශාස්තෘන් වහන්සේගේ ශ්‍රීපාදයන් වැඳීමි.

1507. මම අනන්තගුණසාගරයක් වූ **තිස්ස** බුදුරජානන් වහන්සේ උදෙසා (නගුලෙන් සෑ බිමෙහි හටගත්*) නාඞ්ගලිකී පුෂ්ප (ලාඞ්ගලිකී= ලියනගලා මල්) සතක් අහසෙහි දැමීමි.

1508. සතුටු සිත් ඇත්තෙම් බුදුරජුන් විසින් අනුගමනය කළ ආර්‍ය්‍ය මාර්ගයට පහන්සිත් ඇත්තෙම් පුද සියතින් ඇඳිලි කෙළෙමි.

1509. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් කර්‍මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1510. මෙයින් අටවැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අග්ගිසිඛ** නම් සක්විතිරජවරු තිදෙනෙක් වූහ.

1511. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ගතසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**ගතසඤ්ඤකස්ථවිරාවදානය දෙවැනි යි.**

## 83. නිපන්නාඤ්ජලියස්ථවිරාවදානය

1512. මම (රුක්ඛමූලිකඞ්ගය සමාදන් ව) රුක්මුල්හි හුන්නෙම් තදින් රෝගී වූයෙම් මහවෙනෙහි අතිශය දුඃඛිතභාවයට පත්වූයෙම් වෙමි.

1513. **තිස්ස** බුදුරජානන් වහන්සේ අනුකම්පා උපදවා මා වෙත එළඹිසේක. මම වැදහොත්තේ ම සිරසෙහි ඇඳිලි කොට-

---

* අට්ඨකථා.

1514. පසන්නචිත්තො සුමනො සබ්බසත්තානමුත්තමං,
සම්බුද්ධං අභිවාදෙත්වා තත්ථ කාලකතො අහං.

1515. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං වන්දිං පුරිසුත්තමං,
දුග්ගතිං නාභිජානාමි වන්දනාය ඉදං ඵලං.

1516. ඉතො පඤ්චමකෙ කප්පෙ පඤ්චෙවාසුං මහාසිඛා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1517. පටිසම්භිදා කතං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නිපන්නඤ්ජලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නිපන්නඤ්ජලියත්ථෙරස්ස අපදානං තතියං.**

## 84. අධොපුප්ඵියත්ථෙරාපදානං

1518. **අභිභූ** නාම සො භික්ඛු සිඛිනො අග්ගසාවකො,
මහානුභාවො තෙවිජ්ජො හිමවන්තං උපාගමි[1].

1519. අහම්පි හිමවන්තම්හි රමනීයස්සමෙ ඉසි,
වසාමි අප්පමඤ්ඤාසු ඉද්ධීසු ච තදා වසී.

1520. පක්ඛජාතො වියාකාසෙ පබ්බතං අධිවත්තයිං[2],
අධොපුප්ඵං ගහෙත්වාන ආගච්ඡිං[3] පබ්බතං අහං.

1521. සත්ත පුප්ඵානි ගණ්හිත්වා මත්ථකෙ ඔකිරිං අහං,
ආලොකිතෙ ච වීරෙන[4] පක්කාමිං පාචිනාමුඛො.

1522. ආවාසං අභිසම්භොසිං පත්වාන අස්සමං අහං,
ඛාරිභාරං ගහෙත්වාන පාවිසිං[5] පබ්බතන්තරං.

1523. අජගරො මං පීළෙසි ඝොරරූපො මහබ්බලො,
පුබ්බකම්මං සරිත්වාන තත්ථ කාලකතො අහං.

1524. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1525. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **අධොපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අධොපුප්ඵියත්ථෙරස්ස අපදානං චතුත්ථං**

---

1. තදාගමි, සෙ. මජසං. 2. අධිපත්ථයිං, සෙ. PTS. අභිමත්ථයිං, මජසං.
3. අගච්ඡිං, මජසං. 4. ධීරෙන, සෙ. 5. පායාසිං, සෙ. මජසං.

1514. පහන්සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් සියළු සත්නට උතුම් වූ බුදුරජානන් වහන්සේ වැඳ මම එහි කලුරිය කෙළෙම්.

1515. මෙයින් දෙයානුවන කපෙහි යම් පුරුෂොත්තම වූ සම්බුද්ධ කෙනෙකුන් වැන්දෙම් ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. බුද්ධවන්දනාවෙහි මේ විපාකය යි.

1516. මෙයින් පස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මහාසිඛ** නම් වූ සක්විතිරජවරු පස්දෙනෙක් වූහ.

1517. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **නිපන්නඤ්ජලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**නිපන්නඤ්ජලිය ස්ථවිරාපදානය තෙවැනි යි.**

## 84. අධොපුප්ඵිය ස්ථවිරාපදානය

1518. **සිඛී** බුදුරජානන් වහන්සේගේ අග්‍රශ්‍රාවක වූ මහානුභාව ඇති ත්‍රිවිද්‍යාවෙන් යුත් **අභිභූ** නම් ප්‍රසිද්ධ භික්ෂු තෙමේ හිමවතට එළඹියේ ය.

1519. එකල්හි මම අප්‍රාමාණ්‍ය ආලම්බනයන් හි ද සෘද්ධීන්හි ද වශීප්‍රාප්ත සෘෂියෙක් වූයෙම් රමණීය අසපුවක වසමි.

1520. මම (උන්වහන්සේ විසූ) කඳු පහළින් මල් ගෙණ පැමිණි-යෙමි. (පැමිණ) අනසෙහි පක්ෂියෙකු මෙන් පර්වතයට නැංගෙමි.

1521. මල් සතක් ගෙණ මම (උන්වහන්සේගේ) මස්තකයෙහි විසිර වීමි වීර වූ **අභිභූ** ශ්‍රාවකයන්. වහන්සේ විසින් (ඒ දෙස) බලන ලද කල්හි (මම) පෙරදිගට මුහුණ ලා ගියෙමි.

1522. (ගොස් මාගේ) ආවාසයට පැමිණියෙමි. ආශ්‍රමයට පැමිණ මම පිරිකරබර ගෙණ කඳු අතරට ගියෙමි.

1523. (එහි දී) ඝොරස්වරූප වූ මහත් බල ඇති පිඹුරෙක් මා පෙළී ය. පෙර කල (ඒ පුෂ්පපූජා)පුණ්‍යකර්මය සිහි කොට මම එහි ම කලුරිය කෙළෙමි.

1524. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

1525. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අධොපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**අධොපුප්ඵියස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 85 රංසිසඤ්ඤකත්ථෙරාපදානං

1526. පබ්බතෙ හිමවන්තම්හි වාසං කප්පෙසහං පුරෙ,
අජිනුත්තරවාසො'හං[1] වසාමි පබ්බතන්තරෙ.

1527. සුවණ්ණවණ්ණං සම්බුද්ධං සතරංසිංව භානුමං,
වනන්තරගතං දිස්වා සාලරාජං'ව පුප්ඵිතං.

1528. රංස්‍යා[2] චිත්තං පසාදෙත්වා විපස්සිස්ස මහෙසිනො,
පග්ගය්හ අඤ්ජලිං වන්දිං සිරසා උක්කුටි[3] අහං.

1529. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ර සිසඤ්ඤායිදං ඵලං.

1530. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා රංසිසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රංසිසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 86. දුතියරංසිසඤ්ඤකත්ථෙරාපදානං

1531. පබ්බතෙ හිමවන්තම්හි වාකචීරධරො අහං,
චඞ්කමඤ්ච සමාරූළ්හො නිසීදිං පාචිනාමුඛො.

1532. පබ්බතෙ සුගතං දිස්වා ඵුස්සං ඣානරතං තදා,
අඤ්ජලිං පග්ගහෙත්වාන රංස්‍යා[4] චිත්තං පසාදයිං.

1533. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි රංසිසඤ්ඤායිදං ඵලං.

1534. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා රංසිසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**දුතියරංසිසඤ්ඤකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 87. ඵලදායකත්ථෙරාපදානං

1535. පබ්බතෙ හිමවන්තම්හි ඛුරාජිනධරො අහං,
ඵුස්සං ජිනවරං දිස්වා ඵලහත්ථො ඵලං අදං.

1536. යමහං ඵලමදාසිං විප්පසන්නෙන චෙතසා,
භවෙ නිබ්බත්තමානම්හි ඵලං නිබ්බත්තතෙ මම.

1537. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං අහං,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

1538. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ඵලදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඵලදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

---

1 අජිනුත්තමවසනොහං, P T S  2. රංසෙ, මජසං. P T S. සෙ.
3. සිරසුක්කුටිකො, මජසං.  4. රංසෙ, සබ්බත්ථ.

## 85 රංසිසඤ්ඤකස්ථවිරාවදානය

1526. මම පෙර **හිමවත්**පව්වෙහි වාසය කෙළෙමි. අඳුන්දිවිසම් උතුරුසළු කොට ඇති මම කඳු අතරෙහි වෙසෙමි.

1527 සියගණන් රැස් ඇති හිරු වැනි වූ පිපුණු සල්රුකක් වැනි වනගත වූ සවණ්ණවණ්ණ ඇති බුදුරජාණන් වහන්සේ දැක-

1528. ඒ **විපස්සී** බුදුරජාණන් වහන්සේගේ රශ්මියෙහි සිත පහදවා මම ඇඳිලි බැඳ උක්කුටික ව හිස නමා වැන්දෙමි.

1529. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් (පුණ්‍ය) කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. රශ්මිසංඥාවෙහි (පැහැදී පිදීමේ) මේ විපාකය යි.

1530. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **රංසිසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**රංසිසඤ්ඤකස්ථවිරාවදානය පස්වැනි යි.**

## 86. දුතියරංසිසඤ්ඤකස්ථවිරාවදානය

1531. වැහැරි සිවුරු දරන්නා වූ මම **හිමවත්**පව්වෙහි සක්මනට නැගුනේ නැගෙනහිර දිගට මුහුණ ලා හුන්නෙමි.

1532. එකල්හි **හිමවත්**පව්වෙහි දී ධ්‍යානයෙහි ඇලුනා වූ **ඵුස්ස** බුදුරජාණන් වහන්සේ දැක ඇඳිලි බැඳ (බුදු)රැස්හි සිත පැහැදවීමි.

1533 මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි (බුද්ධරශ්මිය පිළිබඳ) යම් සංඥාවක් ලැබූයෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. (බුද්ධ)රශ්මිසංඥාවෙහි (සිත පැහැදවීමේ) මේ විපාකය යි.

1534. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **රංසිසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි

**දුතියරංසිසඤ්ඤකස්ථවිරාවදානය සවැනි යි.**

## 87. ඵලදායකස්ථවිරාවදානය

1535. කුර සහිත අඳුන්දිවිසම් දරන්නා වූ මම පලතුරු ගත් අත් ඇත්තෙම් **හිමවත්**පව්වෙහි දී **ඵුස්ස** බුදුරජාණන් වහන්සේ දැක පලතුරු දිනිමි.

1536. මම පැහැදි සිතින් යම් පලතුරු දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) භවයෙහි උපදින කල්හි මට පලතුරු ලැබේ.

1537. මෙයින් දෙයානූවන කපෙහි මම යම් පලතුරු දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පලතුරුදානයාගේ මේ විපාකය යි.

1538. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඵලදායක**ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**ඵලදායකස්ථවිරාවදානය සත්වැනියි.**

## 88. සද්දසඤ්ඤකත්ථෙරාපදානං

1539. පබ්බතෙ **හිමවන්ත**ම්හි වසාමි පණ්ණසන්ථරෙ,
**ඵුස්සස්ස** ධම්මං භණතො සද්දෙ චිත්තං පසාදයිං.

1540. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

1541. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සද්දසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සද්දසඤ්ඤකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 89. බොධිසිඤ්චකත්ථෙරාපදානං

1542. **විපස්සිස්ස** භගවතො මහාබොධිමහො අහු,
පබ්බජ්ජූපගතො සන්තො උපගච්ඡිං මහං අහං[1].

1543. කුසුමොදකමාදාය බොධියා ඔකිරිං අහං,
"මොචයිස්සති නො මුත්තො නිබ්බාපෙස්සති නිබ්බුතො".

1544. එකනවුතෙ ඉතො කප්පෙ යං බොධිමභිසිඤ්චයිං,
දුග්ගතිං නාභිජානාමි බොධිසිඤ්චායිදං[2] ඵලං.

1545. තෙත්තිංසෙ වත්තමානම්හි කප්පෙ ආසුං ජනාධිපා,
**උදකාසෙචනා** නාම අට්ඨෙතෙ චක්කවත්තිනො.

1546. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බොධිසිඤ්චකො**[3] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බොධිසිඤ්චකත්ථෙරස්ස අපදානං නවමං.**

## 90. පදුමපුප්ඵියත්ථෙරාපදානං

1547. පොක්ඛරවනං පවිට්ඨො භඤ්ජන්තො පදුමානහං,
අද්දසං **ඵුස්සසම්බුද්ධං** බාත්තිංසවරලක්ඛණං.

1548. පදුමපුප්ඵං ගහෙත්වාන ආකාසෙ උක්ඛිපිං අහං,
පසන්නකම්මං කත්වාන[4] පබ්බජිං අනගාරියං.

1549. පබ්බජිත්වාන කායෙන මනසා සංවුතෙන ච,
වචීදුච්චරිතං හිත්වා ආජීවං පරිසොධයිං.

---

1 මහා තදා, මජ්ඣං. 2. බොධිසඤ්ඤායිදං PTS. 3. බොධිසඤ්ඤකො PTS.
4. පාපකම්මං කරිත්වාන, අ. සීමු.

## 88. සද්දසඤ්ඤකත්ථෙරාපදානය

1539. (මම) හිමවතෙහි පත්ඇතිරියක වසමි. (එකල්හි) දහම් දෙසන්නා වූ **ඵුස්ස** බුදුරජානන් වහන්සේගේ (මධුර)ස්වරයෙහි සිත පැහැදවීමි.

1540. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඒ පුණ්‍යකර්මයාගේ මේ විපාකය යි.

1541. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදි.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සද්දසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**සද්දසඤ්ඤකත්ථෙරාපදානය අටවැනියි.**

## 89. බොධිසිඤ්චකත්ථෙරාපදානය

1542. **විපස්සී** බුදුරජානන් වහන්සේගේ මහාබොධියට පූජාවක් විය. (එකල) පැවිදි ව සිටි මම ඒ පූජාවට එළඹියෙමි.

1543. මම මල් හා (සුවඳ)පැන් ගෙණ (ඒ කිණිහිරි)බොධියට ඉස්සෙමි. (ඉස මෙසේ සිතීමි:) "සම්බුදුතෙම (සසර දුකින්) මිදුනේ අප ද (ඉන්) මුදවන්නේ ය. (කෙලෙස්ගින්නෙන්) නිවුනේ (අප ද ඉන්) නිවීමට පමුණුවන්නේ ය" කියායි.

1544. මෙයින් එක්අනූවන කපෙහි (කිණිහිරි) බොධියට යම් (සුවඳ පැන්) ඉසීමක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බොධියට පැන් ඉසීමේ මේ විපාකය යි.

1545. තෙතිස්වන කප පවත්නා කල්හි **උදකාසෙචන** නම් ජනාධිපති වූ ඒ අට සක්විතිරජවරු වූහ.

1546. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **බොධිසිඤ්චක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**බොධිසිඤ්චකත්ථෙරාපදානය නවවැනි යි.**

## 90. පදුමපුප්ඵියත්ථෙරාපදානය

1547. මම නෙළුම් වනයට (=පොකුණකට) පිවිසියෙම් මල් බිඳින්නෙම් (=නෙළන්නෙම්) දෙතිස්මහපුරිස්ලකුණෙන් යුත් **ඵුස්ස** බුදුරජානන් වහන්සේ දිටිමි.

1548. මම නෙළුම්මල් ගෙණ (ඒ බුදුරජුන් උදෙසා) අහසට දැමීමි. ඒ ප්‍රසන්නකර්මය කොට අනගාරයීසඛ්‍යාත ශාසනයෙහි පැවිදි වීමි.

1549. පැවිදි ව සංවරණය කළා වූ කයින් ද සිතින් ද යුතු ව වාග් දුශ්චරිතය හැර ආජීවය පිරිසිදු කෙළෙමි.

1550. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1551. **පදුමාභාස**නාමා අට්ඨාරස මහීපතී,
අට්ඨාරසසු කප්පෙසු අට්ඨතාළීසමාසිසුං.

1552. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදුමපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමපුප්ඵියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

තිමිර නඞ්ගලිපුප්ඵී නිප්පන්නඤ්ජලිකො අධො
ද්වෙ රංසිසඤ්ඤී ඵලදො සද්දසඤ්ඤී ච සෙචකො
පදුමපුප්ඵී ච ගාථායො ඡප්පඤ්ඤාස පකිත්තිතා.

**තිමිරපුප්ඵියවග්ගො නවමො.**

## 91. සුධාපිණ්ඩියත්ථෙරාපදානං

1553. පූජාරහෙ පූජයතො බුද්ධෙ යදි ච සාවකෙ
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ.

1554. තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ,
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉදමෙත්තම්පි[1] කෙනචි.

1555. චතුන්නම්පි දීපානං ඉස්සරං යො'ධ කාරයෙ,
එකිස්සා පූජනායෙතං කලං නාග්ඝති සොළසිං.

1556. **සිද්ධත්ථස්ස** නරග්ගස්ස චෙතියෙ ඵලිතන්තරෙ,
සුධාපිණ්ඩො මයා දින්නො විප්පසන්නෙන චෙතසා.

1557. චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පටිසඞ්ඛාරස්සිදං ඵලං.

1558. ඉතො තිංසතිකප්පම්හි **පටිසඞ්ඛාර**සව්හයා,
සත්තරතනසම්පන්නා තෙරස චක්කවත්තිනො.

1559. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුධාපිණ්ඩියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුධාපිණ්ඩියත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. ඉදමෙත්තන්ති, සීමු.

1550. මෙයින් දෙඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1551. කල්ප අටළොසක පදුමාභාස නම් වූ අටළොස් රජකෙනෙක් වූහ. (එසේ ම) අටසාළිස් රජකෙනෙක් ද වූහ.

1552. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාතන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් පදුමපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පදුමපුප්ඵියස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

තිමිරය නඩ්ගලි - පුප්ඵිය නිපන්නාඤ්ජලිකය
අධො පුප්ඵිය රංසිසඤ්ඤක - සද්දසඤ්ඤී ද සේවක ය
පදුමපුප්ඵිය දස - සපණස් ගාථාකින් බැඳි.

**තිමිරපුප්ඵියවග්ගය නවවැනියි.**

## 91. සුධාපිණ්ඩියස්ථවිරාපදානය

1553, 1554. පිදීමට සුදුසු වූ තණ්හාදි කෙලෙස් ඉක්මවූ තරණය කළ (=නැති කළ) සොකපරිදෙව ඇති බුදුරජුන් කෙරෙහි හෝ සව්වන් කෙරෙහි හෝ පුදන්නහුට (හෙවත් කෙලෙස් පිරිනිවණින්) පිරිනිවි බිය නැති එබඳු උතුමන් කෙරෙහි පුදන්නා වූ ඔවුනට (ලැබෙන) පිණ මෙපමණ ය යි කිසිවකින් පමණ කිරීමට (=මැනීමට) නො හැකි ය.

1555. යමෙක් මේ ලෙව්හි සිවුමහදිවයිනට ඉසුරු රජය කරවන්නේ නමුදු එය මෙබඳු එක පිදුමක සොළොස්වැනි කලාවකට ද නො අගී.

1556. සිද්ධාර්ථ බුදුරජාතන් වහන්සේගේ සෑයෙහි පැළුම් අතර මා විසින් පැහැදිසිතින් සුණුපිඩක් දෙනලදි. (පැළුම් අතරෙහි සුණු බහා සකසන ලදී.)

1557. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් පින්කමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පිළිසකරෙහි (=ප්‍රතිසංස්කරණයෙහි) මේ විපාකය යි.

1558. මෙයින් තිස්වන කපෙහි සත්රුවනින් යුත් පටිසඞ්ඛාර නම් වූ තෙළෙස් සක්විතිරජකෙනෙක් වූහ.

1559. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජාතන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සුධාපිණ්ඩිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

---

**සුධාපිණ්ඩියස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 92. සුචින්තිතත්ථෙරාපදානං

1560. තිස්සස්ස ලොකනාථස්ස සුද්ධාපීඨ[1]මදාසහං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන බුද්ධස්සාදිච්චබන්ධුනො.

1561. අට්ඨතිංසෙ ඉතො කප්පෙ රාජා ආසිං **මහාරුචි**,
භොගො ච විපුලො ආසි සයනං ච අනප්පකං.

1562. පීඨං බුද්ධස්ස දත්වාන විප්පසන්නෙන චෙතසා,
අනුභොමි සකං කම්මං පුබ්බෙ සුකතමත්තනො.

1563. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පීඨමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පීඨදානස්සිදං ඵලං.

1564. අට්ඨතිංසෙ ඉතො කප්පෙ තයො තෙ චක්කවත්තිනො,
**රුචි උපරුචි** චෙව **මහාරුචි** තතියකො.

1565. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුචින්තිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුචින්තිතත්ථෙරස්ස අපදානං දුතියං.**

## 93. අඩ්ඪචෙලකත්ථෙරාපදානං

1566. තිස්සස්සාහං භගවතො උපඩ්ඪදුස්සමදාසහං,
පරමකාපඤ්ඤපත්තොම්හි[2] දුග්ගන්ධෙන[3] සමප්පිතො.

1567. උපඩ්ඪදුස්සං දත්වාන කප්පං සග්ගම්හි මොදහං,
අවසෙසෙසු කප්පෙසු කුසලං කාරිතං[4] මයා.

1568. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං දුස්සමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි දුස්සදානස්සිදං ඵලං.

1569. එකූනපණ්ණෙ[5] කප්පම්හි රාජානො චක්කවත්තිනො,
**සමන්තච්ඡදනා**[6] නාම බත්තිංසාසුං ජනාධිපා.

1570. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අඩ්ඪචෙලකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**අඩ්ඪචෙලකත්ථෙරස්ස අපදානං තතියං.**

---

1. පුබ්බෙ පීඨ, PTS. සුධාපීඨ, සීමු.
2. කාරුඤ්ඤ, ස්‍යා. සෙ.
3. දුග්ගතෙන, මජසං.
4. තීරිතං, P T S.
5. එකූණපඤ්ඤාස, සීමු.
6. සමන්තභද්දකා, PTS. සෙ.

## 92. සුචින්තිතස්ථවිරාවදානය

1560. මම ගිරුගොත්හි වූ සියල්ල දත් **තිස්ස**බුදුරදුන්හට තුටු වූයෙම් තුටුසිතින් ම (සිලිටි දුවමුවා අතගී) පිරිසිදු පුටුවක් පිදීමි.

1561. මෙයින් අටතිස්වන කපෙහි **මහාරුචි** නම් රජෙක් වීමි. (ඔහුට) බොහෝ වූ සයනාසන ද මහත් වූ භොග ද විය.

1562. පිරිසිදු සිතින් බුදුරජානන් වහන්සේට පුටුවක් දී තමා විසින් පෙර මැනැවින් කල (ඒ සවකීය පුණ්‍ය)කර්මය අනුභව කරමි.

1563. මෙයින් දෙඅනූවන කපෙහි වූ එකල්හි යම් පුටුවක් දීනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පීඨදානයාගේ මේ විපාකය යි.

1564. මෙයින් අටතිස්වන කපෙහි **රුචි** ය, **උපරුචි** ය, **මහාරුචි** ය යන සක්විති රජවරු තිදෙනෙක් වූහ.

1565. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සුචින්තිත** ස්ථවිරයන් වහන්සේ මේ ගථාවන් වදාලසේක් යි.

**සුචින්තිතස්ථවිරාවදානය දෙවැනියි.**

## 93. අඩ්ඪචෙලකස්ථවිරාපදානය

1566. මම **තිස්ස** බුදුරජානන් වහන්සේට සිවුරු පිණිස රෙදි කැබැල්-ලක් දුන්නෙමි. (එකල) දුගඳින් යුත් මම අතිශයින් කෘපණභාවයට (දුකට) පත් වූයෙම් වෙමි.

1567. මම (සිවුරු පිණිස මේ) රෙදිකැබැල්ල පුද කල්පයක් මුළුල්ලෙහි සවර්ගයෙහි සතුටු වීමි. සෙසු කල්පයන්හි මා විසින් කුසල් කරණ ලදී.

1568. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් වස්ත්‍රයක් දුන්නෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. වස්ත්‍රදානයාගේ මේ විපාකයයි.

1569. එකුන්පණස්වන කපෙහි ජනාධිපති වූ **සමණුපච්ඡදන** නම් දෙළොස් සක්විතිරජ කෙනෙක් වූහ.

1570. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අඩ්ඪචෙලක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේක් යි.

**අඩ්ඪචෙලකස්ථවිරාවදානය තෙවැනියි.**

## 94 සූචිදායකත්ථේරාපදානං

1571. කම්මාරොහං පුරෙ ආසිං බන්ධුමායං පුරුත්තමෙ,
සූචිදානං මයා දින්නං විපස්සිස්ස මහෙසිනො.

1572. වජිරග්ගසමං ඤාණං හොති කම්මෙන තාදිසා[1],
විරාගො'ම්හි විමුත්තො'ම්හි පත්තො'ම්හි ආසවක්ඛයං.

1573. අතීතෙ ච භවෙ සබ්බෙ වත්තමානෙ ච'නාගතෙ,
ඤාණෙන විචිනිං සබ්බං සූචිදානස්සිදං ඵලං.

1574. ඒකනවුතෙ ඉතො කප්පෙ සත්තාසුං වජිරව්හයා[2],
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1575. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සූචිදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සූචිදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 95. ගන්ධමාලියත්ථේරාපදානං

1576. සිද්ධත්ථස්ස භගවතො ගන්ධථූපං අකාසහං,
සුමනෙහි පටිච්ඡන්නං බුද්ධානුච්ඡවිකං කතං[3].

1577. කඤ්චනග්ඝියසඞ්කාසං බුද්ධං ලොකග්ගනායකං,
ඉන්දීවරං'ව ජලිතං ආදිත්තං'ව හුතාසනං.

1578. ව්‍යග්ඝූසභං'ව පවරං අභිජාතං'ව කෙසරිං,
නිසින්නං සමණානග්ගං භික්ඛුසංඝපුරක්ඛතං,
වන්දිත්වා සත්ථුනො පාදෙ පක්කාමිං උත්තරාමුඛො.

1579. චතුනවුතෙ ඉතො කප්පෙ ගන්ධමාලං යතො අදං,
බුද්ධෙ කතස්ස කාරස්ස ඵලෙනාහං විසෙසතො,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1580. චත්තාරීසම්හි එකූනෙ කප්පෙ ආසිංසු සොළස,
දෙවගන්ධසනාමා තෙ රාජානො චක්කවත්තිනො.

1581. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ගන්ධමාලියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගන්ධමාලියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

---

1. තාදිසං, සබ්බත්ථ. 2. වජිරාසමා, P T S. සෙ 3. අහං, P T S. සෙ.

## 94. සුවිදූයකසථ්විරාවදානය

1571. මම පෙර බන්ධුමා නම් උතුම් පුරයෙහි සඹුරෙක් විමි. මා විසින් විපස්සි බුදුරජාණන් වහන්සේට කිදි (=ඉදිකටු) දනක් දෙනලදී.

1572. එබඳු කර්මය කරණ කොට ගෙණ විදුරග වැනි (සියුම්) නුවණ ඇති වේ. පහ වූ රාගය ඇත්තෙම් වෙමි. කෙලෙසුන්ගෙන් මිදුනෙම් වෙමි. ආශ්‍රවක්ෂයට පැමිණියෙම් වෙමි..

1573. අතීතභවයෙහි ද වර්තමානභවයෙහි ද අනාගතභවයෙහි ද සියල්ල නුවණින් සොයා දන ගතිමි. කිදිදනෙහි මේ විපාකය යි.

1574. මෙයින් ඒකානුවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති වජිර නම් වූ සත්සක්විතිරජකෙනෙක් වූහ.

1575. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් සූවිදූයක සථ්විරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**සූවිදූයකසථ්විරාවදානය සිවුවැනියි.**

## 95. ගන්ධමාලියසථ්විරාවදානය

1576. මම සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට (සඳුන් - අගිල් - කපුරු කස්තුරි ආදිය වඩා) සුගන්ධස්තූපයක් කෙළෙමි. බුදුරජාණන් වහන්සේට සුදුසු සේ කරණ ලද එය සමන්මල්වලින් වසන ලදී.

1577, 1578. රන්ඇගැවක් වැනි වූ ලොකයෙහි අසහාය නායක වූ සම්ඳ වූ උදුල උපුල් මලක් වැනි වූ ඇවිළුනු ගින්නක් වැනි, ශ්‍රෙෂ්ඨ ව්‍යාඝ්‍රයෙකු මෙන් උතුම් වූ, විශිෂ්ට ජන්ම ඇති කෙශර සිංහයෙකු වැනි, භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලද, ශ්‍රමණයන්ට අග්‍ර වූ බුදුරජාණන් වහන්සේ ද බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාදයුග්මය ද වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

1579. යම් හෙයකින් සිවුඅනූවන කපෙහි යම් ගඳමල් පූජාවක් කරණලද ද, බුදුරජුන් විෂයයෙහි කරණ ලද ඒ පුණ්‍යකර්මයාගේ විපාකය හේතු කොට ගෙණ මම විශෙෂයෙන් දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1580. එකුන්සතළිස්වන කපෙහි දෙවගන්ධ නම් වූ ඒ සොළොස් සක්විතිරජ කෙනෙක් වූහ.

1581. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් ගන්ධමාලිය සථ්විරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**ගන්ධමාලියසථ්විරාවදානය පස්වැනියි.**

## 96. තිපුප්ඵියත්ථෙරාපදානං

1582. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
පාටලිං හරිතං දිස්වා **තීණි** පුප්ඵානි ඔකිරිං.

1583. **සත්ත**[1] පත්තානි ගණ්හිත්වා බහි ඡඩ්ඩෙසහං තදා,
අන්තොසුද්ධං බහිසුද්ධං සුවිමුත්තං අනාසවං.

1584. සම්මුඛා විය සම්බුද්ධං විපස්සිං ලොකනායකං,
පාටලිං අභිවාදෙත්වා තත්ථ කාලඞ්කතො අහං.

1585. එකනවුතෙ ඉතො කප්පෙ යං බොධිමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බොධිපූජායිදං ඵලං.

1586. සමන්තපාසාදිකා නාම තෙරසා'සිංසු රාජිනො,
ඉතො තෙත්තිංසකප්පම්හි චක්කවත්තී මහබ්බලා.

1587. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිපුප්ඵියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 97. මධුපිණ්ඩිකත්ථෙරාපදානං

1588. විපිනෙ[2] කානනෙ දිස්වා අප්පසද්දෙ නිරාකුලෙ,
**සිද්ධත්ථං** ඉසිනං සෙට්ඨං ආහුතීනං පටිග්ගහං.

1589. නිබ්බුතත්තං[3] මහානාගං නිසභාජානියං යථා,
ඔසධිං'ව විරොචන්තං දෙවසඞ්ඝනමස්සිතං,
විත්ති මෙ පහුතා ආසි[4] ඤාණං උප්පජ්ජි තාවදෙ.

1590. වුට්ඨිතස්ස සමාධිම්හා මධුං දත්වාන සත්ථුනො,
වන්දිත්වා සත්ථුනො පාදෙ පක්කාමිං පාචිනාමුඛො.

1591. චතුත්තිංසම්හි කප්පම්හි රාජා ආසිං **සුදස්සනො**,
මධු භිසෙහි සවති භොජනම්හි ච තාවදෙ,
මධුවස්සං පවස්සිත්ථ පුබ්බකම්මස්සිදං ඵලං.

1592. චතුනවුතෙ ඉතො කප්පෙ යං මධුං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මධුදානස්සිදං ඵලං.

1593. චතුත්තිංසෙ ඉතො කප්පෙ චත්තාරො තෙ **සුදස්සනා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1594. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මධුපිණ්ඩිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මධුපිණ්ඩිකත්ථෙරස්ස අපදානං සත්තමං.**

---

1. සත්ත, සීමු. පතිත, මජසං. සුක්ඛපණ්ණානි, ස්‍යා. 2. විවනෙ, PTS.
3. නිබ්බුතං තං, සෙ. 4. මමාහු තාවදෙ, මජසං. මෙ පාහුණා තාව, සීමු.

## 96. තිපුප්ඵියසථවිරාවදානය

1582. මම පෙර මහවෙනෙහි වැද්දෙක් වීමි. (**විපස්සි** බුදුරජුන්ගේ) නිල්වන් වූ පලොල්බොධිය (=පාටලී බොධිය) දක (එයට) මල් **තුණක්** විසිරවීමි (පිදීමි.)

1583-84. මම එකල්හි වැටුනු බෝකොළ (අවුලා) හෙණ පිටත දැමීමි. ඇතුලත පිරිසිදු වූ පිටත ද පිරිසිදු වූ (කෙලෙසුන්ගෙන්) මැනැවින් මිදුනු, ආස්‍රව රහිත වූ ලොකනායක වූ **විපස්සි** බුදුරජුන් ඉදිරියෙහි දී මෙන් පලොල් බොධිය වැඳ මම එහි කලුරිය කෙළෙමි.

1585. මෙයින් එක්අනූවන කපෙහි යම් බොධිපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බොධිපූජාවෙහි මේ විපාකයයි.

1586. මෙයින් තෙතිස්වන කපෙහි මහත් බල ඇති **සමන්තපාසාදික** නම් වූ සක්විතිරජවරු තෙළෙස් දෙනෙක් වූහ.

1587. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **තිපුප්ඵිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**තිපුප්ඵියසථවිරාවදානය සවැනියි.**

## 97. මධුපිණ්ඩිකසථවිරාවදානය

1588-1589. අල්පශබ්ද ඇති, නිරාකුල වූ මහවනයෙහි දී **සෑමිත්ථ** ශ්‍රෙෂ්ඨ වූ ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ නොනොත් පූජාවන්ට හෙයක් වැනි වූ නිවී ගිය අත්බැව් ඇති අතිශ්‍රෙෂ්ඨ වූ උත්තම ආජානීය-යකු වැනි ඔසධී තරුව මෙන් බබලන්නා වූ දිව්‍යසමූහයා විසින් නමසකාර කරණලද **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ දක මට මහත් ප්‍රීතියක් වී ය. එකෙණෙහි නුවණ ද උපන්නේ ය.

1590. සමාධියෙන් නැගී සිටි ඒ බුදුරජානන් වහන්සේට මී දී ඒ බුදුරජානන් වහන්සේගේ ශ්‍රීපාදයුග්මය ද වැඳ නැගෙනහිර දෙසට මුහුණ ලා ගියෙමි.

1591. සූතිස්වන කපෙහි **සුදස්සන** නම් රජෙක් වීමි. එකල්හි (අනුභව කරණ) භොජනයෙහි ද තෙළඹුපැනි වැගිරේ. මීවැසි ද වැස්සේ ය. පූජිකර්මයාගේ මේ විපාකය යි.

1592. මෙයින් සිවුඅනූවන කපෙහිවූ එකල්හි යම් මීපැනි දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මධුදනයාගේ මේ විපාකයයි.

1593. මෙයින් සූතිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ඒ **සුදස්සන** නම් සිවුසක්විති රජකෙනෙක් වූහ.

1594. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **මධුපිණ්ඩික** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**මධුපිණ්ඩිකසථවිරාවදානය සත්වැනියි.**

## 98. සෙනාසනදායකත්ථෙරාපදානං

1595. සිද්ධත්ථස්ස භගවතො අදාසිං පණ්ණසන්ථරං,
සමන්තා උපහාරං[1] ච කුසුමං ඔකිරිං අහං.

1596. පාසාදෙ'වං ගුණං[2] රම්මං[3] අනුභොමි මහාරහං[4],
මහග්ඝානි ච පුප්ඵානි සයනෙ'භිසවන්ති[5] මෙ.

1597. සයනෙ'හං තුවට්ටාමි විචිත්තෙ පුප්ඵසන්ථතෙ,
පුප්ඵවුට්ඨි ච සයනෙ අභිවස්සති තාවදෙ.

1598. චතුන්නවුතෙ ඉතො කප්පෙ අදාසිං පණ්ණසන්ථරං,
දුග්ගතිං නාභිජානාමි සන්ථරස්ස ඉදං ඵලං.

1599. **තිණසන්ථරකා** නාම සත්තෙ'තෙ චක්කවත්තිනො,
ඉතො තෙ පඤ්චමෙ කප්පෙ උප්පජ්ජිංසු ජනාධිපා.

1600. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සෙනාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සෙනාසනදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 99 වෙය්‍යාවච්චකත්ථෙරාපදානං

1601. **විපස්සිස්ස** භගවතො මහාභූරිගණො[6] අහු,
වෙය්‍යාවච්චකරො ආසිං සබ්බකිච්චෙසු ව්‍යාවටො.

1602. දෙය්‍යධම්මො ච මෙ නත්ථි සුගතස්ස මහෙසිනො,
අවන්දිං සත්ථුනො පාදෙ විප්පසන්නෙන චෙතසා.

1603. එකනවුතෙ ඉතො කප්පෙ වෙය්‍යාවච්චං අකාසහං,
දුග්ගතිං නාභිජානාමි වෙය්‍යාවච්චස්සිදං ඵලං.

1604. ඉතො ච අට්ඨමෙ කප්පෙ රාජා ආසිං **සුචින්තිතො**,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

1605. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වෙය්‍යාවච්චකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වෙය්‍යාවච්චකත්ථෙරස්ස* අපදානං නවමං.**

## 100. බුද්ධුපට්ඨාකත්ථෙරාපදානං

1606. **විපස්සිනො** භගවතො අහොසිං සංඛධම්මකො,
නිච්චුපට්ඨානයුත්තොම්හි සුගතස්ස මහෙසිනො.

1607. උපට්ඨානඵලං පස්ස ලොකනාථස්ස තාදිනො,
සට්ඨි තුරියසහස්සානි පරිවාරෙන්ති මං සදා.

---

1. උපකාරිං, P T S. උපකාරී, ථෙ.
2. පාසාදෙ ච ගුහා, PTS සෙ. පාසාදෙ චතුරො, ථෙ.
3. රම්මෙ, ථෙ 4 මහාරහෙ, ථෙ 5 සයනෙ'භිහරන්ති, ථෙ.
6. මහාපූගගණො, සීමු මජ්ඣං. PTS.
* ථෙරගාථට්ඨකථායං සඤ්ජයත්ථෙරනාමෙන දස්සිතං.

## 98. සේනාසනදායකසථවිරාපදානය

1595. මම **සිද්ධාර්ථ** බුදුරජාණන් වහන්සේට පන්ඇතිරියක් දුනිමි. හාත්පස අසෙනියකුසුම් ද විසිරවීමි.

1956. මෙබඳු ගුණ ඇති සිත්කලු මහාර්ඝ වූ පහයක් ලබමි. මාගේ ඇඳෙහි මහඟු පුෂ්පයෝ වැගිරෙත්.

1597. මම විසිතුරු වූ මල් අතුළ සයනයෙහි නිදමි. එකෙණෙහි සයනයෙහි මල්වැසි ද වසින්නේ ය.

1598. මෙයින් සිවුඅනූවන කපෙහි පන්ඇතිරියක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඇතිරිදනෙහි මේ විපාකයයි.

1599. මෙයින් පස්වැනි කපෙහි ජනාධිපති වූ **තිණසන්ථරක** නම් සත් සක්විතිරජකෙනෙක් වූහ.

1600. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සේනාසනදායක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**සේනාසනදායකසථවිරාපදානය අටවැනිසි.**

## 99. වෙය්‍යාවච්චකසථවිරාපදානය

1601. **විපස්සී** බුදුරජාණන් වහන්සේගේ (භක්තිමත්) මහාප්‍රාඥ සමූහයා විය. මම එකල්හි සියලු කටයුතුවල යෙදුනු වතාවත් කරන්නෙක් වීමි.

1602. මහර්ෂි වූ බුදුරජාණන් වහන්සේට පිදිය යුතු දෙයක් මට නැත. පිරිසිදු සිතින් බුදුරජාණන් වහන්සේගේ සිරිපා වැන්දෙමි.

1603. මම මෙයින් එක්අනූවන කපෙහි (බුදුරජුන්ට) වතාවත් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. වතාවත් කිරීමෙහි මේ ප්‍රතිඵලයයි.

1604. මෙයින් අටවැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුචින්තිත** නම් සක්විති රජෙක් වීමි.

1605. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **වෙය්‍යාවච්චක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**වෙය්‍යාවච්චකසථවිරාපදානය නවවැනි සි.**

## 100 බුද්ධුපට්ඨාකසථවිරාපදානය

1606. (මම) **විපස්සී** බුදුරජුන්ගේ (කාලයෙහි) සක් පිඹින්නෙක් වීමි. මහර්ෂි වූ සුගතයන් වහන්සේට නිතර (සක් පිඹීමෙන්) උවටැනෙහි යෙදුනෙම් වෙමි.

1607. තාදිගුණ ඇති ලොකනාථයන් වහන්සේට උවටැන් කිරීමෙහි විපාකය දකු. හැමකල්හි සැටදහසක් තූර්‍යයෝ මා පිරිවරත්.

1608. එකනවුතෙ ඉතො කප්පෙ උපට්ඨහිං මහාඉසිං,
දුග්ගතිං නාභිජානාමි උපට්ඨානස්සිදං ඵලං.

1609. චතුවීසෙ[1] ඉතො කප්පෙ මහානිග්ඝොසනාමකා,
සොළසාසිංසු රාජානො චක්කවත්තී මහබ්බලා.

1610. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බුද්ධුපට්ඨාකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බුද්ධුපට්ඨාකත්ථෙරස්ස අපදානං දසමං**

උද්දානං:

සුධාසචින්තී චෙලඤ්ච සූචි ච ගන්ධමාලියො,
තිපුප්ඵියො මධු සෙනා - වෙය්‍යාවච්චො ච බුද්ධුපට්ඨාකො[2],
සමසට්ඨි ච ගාථායො අස්මිං වග්ගෙ පකිත්තිතා.

**සුධාපිණ්ඩියවග්ගො දසමො.**

**අථ වග්ගුද්දානං:**

බුද්ධවග්ගො හි පඨමො සීහාසන සුභූති ච,
කුණ්ඩධානො උපාලි ච බීජනී සකචින්ති ච,
නාගසමාලො තිමිරො සුධාවග්ගෙන තෙ දස,
චතුද්දසසතං ගාථා පඤ්චපඤ්ඤාසමෙව ච.

**බුද්ධවග්ගදසකං.**

**පඨමසතකං සමත්තං.**

## 101. භික්ඛාදායකත්ථෙරාපදානං

1611. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ආහුතීනං පටිග්ගහං,
පවනා අභිනික්ඛමන්තං වනා නිබ්බනමාගතං.

1612. කටච්ඡුභික්ඛං පාදාසිං සිද්ධත්ථස්ස මහෙසිනො,
පඤ්ඤස්ස[3] උපසන්තස්ස මහාවීරස්ස තාදිනො.

1613. පදෙනානුපදං යන්තං[4] නිබ්බාපෙන්තෙ[5] මහාජනං,
උළාරා විත්ති මෙ ජාතා බුද්ධෙ ආදිච්චබන්ධුනි[6].

1614. චතුනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භික්ඛාදානස්සිදං ඵලං.

1615. සත්තාසීතිම්හි'තො කප්පෙ මහාරෙණුසනාමකා,
සත්තරතනසම්පන්නා සත්තෙත'ව චක්කවත්තිනො.

1616. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා භික්ඛාදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භික්ඛාදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. චතුනවුතෙ, PTS.
2. ච ධම්මකො, P T S. 3. පඤ්ඤාය, සීමු.
4. යන්තො, සීමු 5. නිබ්බාපෙන්තං, P T S.
6. විත්ති මම පාහුණා තාව බුද්ධස්සාදිච්චබන්ධුනො, ස්‍යා P T S සෙ 6. බන්ධුනෙ, මජසං.

1608. මෙයින් එක්අනූවන කපෙහි මහර්ෂි වූ බුදුරදුන්ට (සක් පිඹීමෙන් යම්) උවටැනක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. උවටැන් කිරීමෙහි මේ විපාකය යි.

1609. මෙයින් සූතිස්වන කපෙහි මහත් බල ඇති **මහානිග්ඝෝස** නම් වූ සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1610. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජුන්ගේ සසුන කරන ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **බුද්ධුපට්ඨාක**ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**බුද්ධුපට්ඨාකස්ථවිරාපදානය දසවැනි යි.**

**උද්දානය:**

සුධා සුචින්ති චේල ද - සූචි ද ගන්ධමාලිය,
තිපුප්ඵිය මධුසෙනසුන - වෙය්‍යාවච්චුපට්ඨායක
මෙ වගෙහි පවසන ලද - සමසැටගයෙක් වන්නේ.

**සුධාපිණ්ඩියවග්ගය දසවැනියි.**

**යලි වග්ගුද්දානය යි:**

බුදුවග පළමු ය - යලි සිනසුන් සුභූති ය
කුණ්ඩධාන ද උපාලිය - විජනිය සකචින්තිය ද
නාගසමාලය තිමිරය - සුධාවග දැ යි දසයකි
ගීතුදුස් සියයකි - පස්පණසක් ද වන්නේ

**ප්‍රථමවග්ගදශකය යි.**

**ප්‍රථමශතකය සමාප්තයි.**

## 101. භික්ඛාදායකස්ථවිරාපදානය

1611. මම ස්වර්ණවර්ණ වූ ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ නොනොත් පූජාවනට ගෙයක් වැනි වූ වනලැහැබින් නික්මුනා වූ තෘෂ්ණාවෙන් නික්ම නිවණට පැමිණියා වූ ප්‍රඥාවෙන් උපශාන්ත වූ සම්බුදුරජ (දිටිමි).

1612. තාදිගුණ ඇති මහාවීර වූ ඒ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේට සැන්දක් පමණ වූ භික්ෂාවක් දිනිමි.

1613. සූර්යබන්ධු වූ බුදුරජානන් වහන්සේ පියෙන් පිය අනුව (පසුපස්සෙන්) යන මහාජනයා (දහම්වැස්සෙන්) තිවන කල්හි මට මහත් ප්‍රීතියෙක් විය.

1614. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. භික්ෂාදානයාගේ මේ විපාකය යි.

1615. මෙයින් සත්අසූවන කපෙහි සත්රුවනින් යුත් **මහාරේණු** නම් සත් සක්විති රජකෙනෙක් වූහ.

1616. සිවු පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරන ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **භික්ඛාදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**භික්ඛාදායකස්ථවිරාපදානය පළමුවැනියි.**

## 102. ඤාණසඤ්ඤකත්ථෙරාපදානං

1617. සුවණ්ණවණ්ණං සම්බුද්ධං නිසභාජානියං යථා,
තිධා පභින්නමාතඞ්ගං කුඤ්ජරං'ව මහෙසිනං.

1618. ඔභාසන්තං දිසා සබ්බා උළුරාජං'ව පූරිතං,
රථියං පටිපජ්ජන්තං ලොකජෙට්ඨං අපස්සිසං.[1]

1619. ඤාණෙ චිත්තං පසාදෙත්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
පසන්නචිත්තො සුමනො **සිද්ධත්ථං** අභිවාදයිං.

1620. චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඤාණසඤ්ඤායිදං ඵලං.

1621. තෙසත්තතිම්හි'තො කප්පෙ සොළසා'සුං නරුත්තමා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1622. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඤාණසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඤාණසඤ්ඤකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 103. උප්පලහත්ථියත්ථෙරාපදානං

1623. **තිවරායං** නිවාසී'හං අහොසිං මාලිකො තදා,
අද්දසං විරජං බුද්ධං **සිද්ධත්ථං** ලොකනායකං.

1624. පසන්නචිත්තො සුමනො පුප්ඵහත්ථමදාසහං,
යත්ථ යත්ථූපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා.

1625. අනුභොමි ඵලං ඉට්ඨං පුබ්බෙ සුකතමත්තනො,
පරික්ඛිත්තො සුමල්ලෙහි පුප්ඵදානස්සිදං[2] ඵලං.

1626. චතුනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1627. චතුනවුතුපාදාය ඨපෙත්වා වත්තමානකං,
පඤ්චරාජසතා තත්ථ **නජ්ජුසම**[3] සනාමකා.

1628. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උප්පලහත්ථියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උප්පලහත්ථියත්ථෙරස්ස අපදානං තතියං.**

---

1. අපස්සිහං, සීමු. 2. සසඤ්ඤය, PTS සෙ.
3. නජ්ජසම, මජසං. සෙ.

## 102. ඤාණසඤ්ඤකස්ථවිරාවදානය

1617-1618. මම සවර්ණවර්ණ වූ උතුම් ආජානීයයකු මෙන් ශ්‍රේෂ්ඨ වූ ත්‍රිමදගලිතමාතඞ්ගහස්තිකුලයෙහි ඇත්රජකු වැනි මහර්ෂි වූ පුන්සඳ මෙන් සියලු දිගුත් බබුළුවන්නා වූ ලොකජ්‍යෙෂ්ඨ වූ වීථියට පිළිපන්නා වූ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ දිටිමි.

1619. (උන්වහන්සේගේ) නුවණෙහි සිත පහදවා ඇඳිලි බැඳ සොම්නස් වූයෙම් පහන් සිත් ඇත්තෙම් **සිද්ධාර්ථ** බුදුරජුන්හට අභිවාදනය කෙළෙමි.

1620. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධඥානය පැහැදි සිතින් මෙනෙහි කිරීමේ මේ විපාකය යි.

1621. මෙයින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති නරශ්‍රේෂ්ඨ වූ සක්විති රජවරු සොළොස් දෙනෙක් වූහ.

1622. සිවු පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඤාණසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**ඤාණසඤ්ඤකස්ථවිරාවදානය දෙවැනියි.**

## 103. උප්පලහත්ථියස්ථවිරාවදානය

1623. එකල්හි මම **තිවරා** නගරයෙහි වෙසෙන මල්කරුවෙක් වීමි. පහ වූ කෙලෙස් රජස් ඇති ලොකනායක වූ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ දිටිමි.

1624. මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් (උන්වහන්සේට) උපුල් මල් මිටක් දිනිමි. ඒ කර්මයාගේ විපාකයෙන් යම් යම් භවයක උපදිම් ද,

1625. මනා වූ මල්ලයන් විසින් පිරිවරණ ලදුයෙම් පෙර තමා කළ පින් කම්හි ඉෂ්ටවිපාක අනුභව කරමි. පුෂ්පදානයාගේ මේ විපාකය යි.

1626. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1627. මෙම භවය හැර සිවුඅනූවන කපෙහි පටන් ම **නජ්ජුපම** නම් පන්සියයක් රජවරු වූහ.

1628. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උප්පලහත්ථිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**උප්පලහත්ථියස්ථවිරාවදානය තෙවැනියි.**

## 104. පදපූජකත්ථෙරාපදානං

1629. **සිද්ධත්ථස්ස** භගවතො ජාතිපුප්ඵමදාසහං,
පාදෙසු සත්තපුප්ඵානි හාසෙනොකිරිතානි[1] මෙ.

1630. තෙන කම්මෙන'හං අජ්ජ අභිභොමි නරාමරෙ,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1631. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

1632. **සමන්තගන්ධ**නාමාසුං තෙරස චක්කවත්තිනො,
ඉතො පඤ්චමකෙ කප්පෙ චාතුරන්තා ජනාධිපා.[2]

1633. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදපූජකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 105 මුට්ඨිපුප්ඵියත්ථෙරාපදානං

1634. **සුදස්සනොති** නාමෙන මාලාකාරො අහං තදා,
අද්දසං විරජං බුද්ධං ලොකජෙට්ඨං නරාසභං.

1635. ජාතිපුප්ඵං ගහෙත්වාන පූජයිං **පදුමුත්තරං**,
විසුද්ධචක්ඛු සුමනො දිබ්බචක්ඛුං සමජ්ඣගං.

1636. එතිස්සා පුප්ඵපූජාය චිත්තස්ස පණිධීහි ච,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං.

1637. සොළසාසිංසු රාජානො **දෙවුත්තර**සනාමකා,
ඡත්තිංසම්හි ඉතො කප්පෙ චක්කවත්තී මහබ්බලා.

1638. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මුට්ඨිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මුට්ඨිපුප්ඵියත්ථෙරස්ස අපදානං පඤ්චමං**

1. හාසෙන කාරිතානි, PTS. හාසෙනොකිරිතානි, ථෙ.
2. ගණාධිපා, PTS. සෙ.

## 104. පදපූජකසත්ථිරාපදානය

1629. මම **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේට සමන් මල් පිදීමි. (උන්වහන්සේගේ) ශ්‍රීපාදයෙහි මා විසින් මල් සතක් සතුටින් විසුරුවන ලදී.

1630. එම පුණ්‍යකර්මය හේතු කොට ගෙණ අද දෙව්මිනිසුන් අතුරෙහි අතිශයින් බබලමි. සම්බුදුසසුනෙහි අන්තිම ශරීරය දරමි.

1631. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

1632. මෙයින් පස්වෙනි කපෙහි සිවුමහදිවයින හා සිවුසයුර කෙළවර කොට ඇති (පෘථිවියෙහි) ජනාධිපති වූ **සමන්තගන්ධ** නම් වූ තෙළෙස් සක්විති රජකෙනෙක් වූහ.

1633. පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පදපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**පදපූජකස්ථවිරාපදානය සිවුවැනියි.**

## 105. මුට්ඨිපූජපිඨියස්ථවිරාපදානය

1634. එකල්හි මම නමින් **සුදස්සන** නම් වූ මල්කරුවෙක් වීමි. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ පහ වූ කෙලෙස් මල ඇති බුදුරජානන් වහන්සේ දිටිමි.

1635. (මම) දෑසමන් මල් ගෙණ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේට පිදීමි. ඒ හේතුවෙන් පිරිසිදු ඇස් ඇත්තේ සොම්නස් වූයේ දිවැස ද ලැබීමි.

1636. මම මේ පුෂ්පපූජාව හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධියෙන් හේතු කොට ගෙණ ද කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපන්මි.

1637. මෙයින් සතිස්වන කපෙහි මහත් බල ඇති **පදුමුත්තර** නම් වූ සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1638. සිවු පිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **මුට්ඨිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**මුට්ඨිපුප්ඵියස්ථවිරාපදානය පස්වැනියි.**

## 106. උදකපූජකත්ථෙරාපදානං

1639. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අනිලඤ්ජසෙ,
ඝතාසනං'ව ජලිතං ආදිත්තං'ව හුතාසනං.

1640. පාණිනා උදකං ගය්හ ආකාසෙ උක්ඛිපිං අහං,
සම්පටිච්ඡි මහාවීරො බුද්ධො කාරුණිකො ඉසි[1].

1641. අන්තලික්ඛෙ ඨිතො සත්ථා **පදුමුත්තර**නාමකො,
මම සඞ්කප්පමඤ්ඤාය ඉමං ගාථං අභාසථ:

1642. "ඉමිනොදකදානෙන පීතිඋප්පාදනෙන ච,
කප්පසතසහස්සම්හි[2] දුග්ගතිං නූපපජ්ජති"[3].

1643. තෙන කම්මෙන ද්විපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1644. **සහස්සරාජ**නාමෙන තයො තෙ චක්කවත්තිනො,
පඤ්චසට්ඨිකප්පසතෙ චාතුරන්තා ජනාධිපා.

1645. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උදකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උදකපූජකත්ථෙරාපදානං ඡට්ඨං.**

## 107. නළමාලියත්ථෙරාපදානං

1646. **පදුමුත්තර**බුද්ධස්ස ලොකජෙට්ඨස්ස තාදිනො,
තිණත්ථරෙ[4] නිසින්නස්ස උපසන්තස්ස තාදිනො.

1647. නළමාලං ගහෙත්වාන බන්ධිත්වා බීජනිං අහං,
බුද්ධස්ස උපනාමෙසිං ද්විපදින්දස්ස තාදිනො.

1648. පටිග්ගහෙත්වා සබ්බඤ්ඤූ බීජනිං ලොකනායකො,
මම සඞ්කප්පමඤ්ඤාය ඉමං ගාථං අභාසථ:

1649. "යථා මෙ කායො නිබ්බාති පරිළාහො න විජ්ජති,
තථෙව තිවිධග්ගීහි චිත්තං තව විමුච්චතු."

1650. සබ්බෙ දෙවා සමාගච්ඡුං යෙ කෙචි වනනිස්සිතා[5]
'සොස්සාම බුද්ධවචනං හාසයන්තඤ්ච දායකං'.

1651. නිසින්නො භගවා තත්ථ දෙවසඞ්ඝපුරක්ඛතො,
දායකං සම්පහංසෙන්තො ඉමා ගාථා අභාසථ:

1. මහෙසි, PTS. සෙ. 2. සහස්සම්හි, මජසං. 3. නූපගච්ඡති, PTS.
4. තිණන්තරෙ, PTS. සෙ. තිණසන්ථරෙ, ථෙ.
5. දුමනිස්සිතා, PTS. සෙ.

## 106. උදකපූජකත්ථෙරාපදානය

1639-1640. මම අහස්මගෙහි වඩින්නා වූ රන්වන් වූ ඇවිලගත් දිලිසෙන ගිනිකඳක් වැනි වූ පූජාසත්කාරයන්ට ආසන (ස්ථාන) වූ බුදුරජාණන් වහන්සේට අතින් දිය ගෙණ අහසෙහි උඩට දැමීමි. මහාවීර වූ කාරුණික ඍෂි වූ බුදුරජ තෙම එය පිළිගත්තේ ය.

1641. අහසෙහි වැඩ සිටියා වූ **පදුමුත්තර** නම් ශාස්තෘ තෙමේ මේ ගාථාව වදාළේ ය:

1642. "මේ ජලදානයෙන් ද ප්‍රීතිය ඉපදවීමෙන් ද (මෙතෙම) කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදී" (කියා යි.)

1643. ද්විපදෙත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කරණ ලද ඒ කර්‍මය හේතු කොට ගෙණ ජය - පරාජය (දෙක) හැර නිශ්චලස්ථානය (=නිවණ)ට පැමිණියෙම් වෙමි.

1644. සදහස්පන්සියවන කපෙහි සිවුමහදිවයින හා සිවු මහ සමුදුරු කෙලවර කොට ඇති පොළොවට අධිපති වූ ජනශ්‍රෙෂ්ඨ වූ ඒ **සහස්සරාජ** නම් සක්විති රජවරු තිදෙනෙක් වූහ.

1645. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උදකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යී.

**උදකපූජකත්ථෙරාපදානය සමැප්තියි.**

## 107. නළමාලියස්ථෙරාපදානය

1646-1647. තාදීගුණ ඇති ද්විපදෙත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ තණ ඇතිරියක වැඩහුන්නා වූ **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේට බටමලක් ගෙණ විජිනියක් බැඳ පිළිගැන් වීමි.

1648. ලොකනායක වූ බුදුරජාණන් වහන්සේ විජිනිය පිළිගෙණ මාගේ අදහස දැන මෙම ගාථාව වදාළ සේක:

1649. "යම් සේ මාගේ සිරුර නිවේ ද, පරිළාහයක් නො වේ ද, එසේ ම ඔබගේ සිත (රාග - ද්වෙෂ - මොහ - යන) ත්‍රිවිධාග්නියෙන් (නිවේවා) කෙලෙසුන්ගෙන් ද මිදේවා" (කියා යි.)

1650. වනය ඇසුරු කළා වූ යම් කිසි දෙවිකෙනෙක් වූවාහු ද, ඒ සියලු දෙවිවරු 'දායකයාහට දෙශනා කරන්නා වූ බුද්ධවචනය අසමු'ය යි රැස්වූවාහු ය.

1651. එහි දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව වැඩහුන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දායකයා සතුටු කරමින් මේ ගාථාවන් වදාළ සේක:

1652. "ඉමිනා වීජනිදානෙන චිත්තස්ස පණිධීහි ච,
**සුබ්බතො** නාම නාමෙන චක්කවත්තී භවිස්සති.

1653. තෙන කම්මාවසෙසෙන සුක්කමූලෙන චොදිතො,
**මාලුතො** නාම නාමෙන චක්කවත්ති භවිස්සති.

1654. ඉමිනා වීජනිදානෙන සම්මානවිපුලෙන ච,
කප්පසතසහස්සම්හි දුග්ගතිං නුපපජ්ජති."

1655. තිංසකප්පසහස්සම්හි **සුබ්බතා** අට්ඨතිංස තෙ,
එකූනතිංසසහස්සෙ අට්ඨ **මාලුත**නාමකා.

1656. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නළමාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නළමාලියත්ථෙරස්ස අපදානං[1] සත්තමං**

**සත්තමභාණවාරං නිට්ඨිතං.**

## 108. ආසනූපට්ඨාපකත්ථෙරාපදානං

1657. කානනං වනමොග්ගය්හ අප්පසද්දං නිරාකුලං,
සීහාසනං මයා දින්නං **අත්ථදස්සිස්ස** තාදිනො.

1658. මාලාහත්ථං ගහෙත්වාන කත්වා ච නං පදක්ඛිණං,
සත්ථාරං පයිරුපාසිත්වා පක්කාමිං උත්තරාමුඛො.

1659. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
සන්නිබ්බාපෙමි අත්තානං[2] භවා සබ්බෙ සමූහතා.

1660. අට්ඨාරසෙ[3] කප්පසතෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි සීහාසනස්සිදං ඵලං.

1661. ඉතො සත්තකප්පසතෙ **සන්නිබ්බාපකා** ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1662. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආසනූපට්ඨාපකො[4] ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආසනූපට්ඨාපකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

1. නළමාලිය ථෙරස්සාපදානං, මජ්ඣසං. 2. සන්නිබ්බාපෙසිමත්තානං, සෙ.
3. අට්ඨාරස, මජ්ඣසං. 4. ආසනූපට්ඨාහකා, මජ්ඣසං.

1652. මේ "විජිනිදන හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධිය හේතු කොට ගෙණ ද නමින් **සුබ්බත** නම් වූ සක්විති රජෙක් වන්නේ ය.

1653. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ එම කර්මයාගේ ඉතිරි විපාකය වශයෙන් නමින් **මාලුත** නම් වූ සක්විතිරජෙක් වන්නේ ය.

1654. මෙම විජිනිදන හේතු කොට ගෙණ ද මහත් වූ සත්කාරය හේතු කොට ගෙණ ද කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදින්නේ ය".

1655. තිස්දහස්වන කපෙහි ඒ සුබ්බත නමින් අටතිස් රජකෙනෙක් වූහ. එකුන්තිස්දහස්වන කපෙහි **මාලුත** නමින් අට රජකෙනෙක් වූහ.

1656. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **නළමාලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**නළමාලියස්ථවිරාපදානය සත්වැනියි.**

**සත්වැනි බණවර නිමියේ ය.**

## 108. ආසනූපට්ඨාපකස්ථවිරාපදානය

1657. අල්පශබ්ද ඇති නිශ්චල වූ මහවනයට පිවිස තාදිගුණ ඇති **අත්ථදස්සී** බුදුරජානන් වහන්සේට මා විසින් සිහසුනක් පුදන ලදී.

1658. මල්මිටක් ගෙණ ඒ ශාස්තෘන් වහන්සේ පැදකුණු කොට ඇසුරු ද කොට උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

1659. ද්විපාදෝත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කරණ ලද එම පුණ්‍යකර්මය හේතු කොට ගෙණ ආත්මය (=නිවණ) ලබමි. සියලු භවයෝ නසන ලදහ.

1660. එක්දහස් අටසියවන කපෙහි වූ එකල්හි යම් දනක් දිනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සිහසුන්දනෙහි මේ විපාකය සි.

1661. මෙයින් සත්සියවැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සන්නිබ්බාපක** නම් සක්විති රජෙක් වී ය.

1662. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආසනූපට්ඨාපක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**ආසනූපට්ඨාපකස්ථවිරාපදානය අටවැනියි.**

## 109. බිළාලිදායකත්ථෙරාපදානං

1663. හිමවන්තස්ස අවිදූරෙ වසාමි පණ්ණසන්ථරෙ,
ඝාසෙසු ගෙධමාපන්නො සෙය්‍යසීලො වහං තදා.

1664. ඛණන්තාලු කලම්බානි බිළාලී තක්කලානි ච,
කොලං භල්ලාතකං බිල්ලං ආහිත්වා[1] පටියාදිතං.

1665. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම සඞ්කප්පමඤ්ඤාය ආගච්ඡි මම සන්තිකං.

1666. උපාගතං මහානාගං දෙවදෙවං නරාසභං,
බිළාලිං පග්ගහෙත්වාන පත්තම්හි ඔකිරිං අහං.

1667. පරිභුඤ්ජි මහාවීරො තොසයන්තො මමං තදා,
පරිභුඤ්ජිත්වාන සබ්බඤ්ඤු ඉමං ගාථං අභාසථ.

1668. "සකං චිත්තං පසාදෙත්වා බිළාලිං මෙ අදා තුවං,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපගච්ඡසි."[2]

1669. චතුපඤ්ඤාසිතො කප්පෙ සුමෙඛලිය සව්හයො[5],
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.*

1670. චරිමං වත්තතෙ මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1671. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ජළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බිළාලිදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බිළාලිදායකත්ථෙරස්ස අපදානං නවමං.**

## 110. රෙණුපූජකත්ථෙරාපදානං

1672. සුවණ්ණවණ්ණං සම්බුද්ධං සතරංසිං'ව භානුමං,
ඔභාසෙන්තං දිසා සබ්බා උළුරාජං'ව පූරිතං.

1673. පුරක්ඛතං සාවකෙහි සාගරෙහෙ'ව[3] මෙදිනිං,
නාගං පග්ගය්හ රෙණූහි විපස්සිස්සාභිරොපයිං.

1674. එකනවුතෙ ඉතො කප්පෙ යං රෙණුමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1. ආහත්වා, සීමු. ආහරිත්වා, සෙ. 2. නූපපජ්ජසි, මජ්සං.. සෙ.
* අයං ගාථා අසම්මං අපදානෙ අට්ඨමගාථාවසෙන සීහලක්ඛරමුද්දිත පොත්ථකෙ දිස්සති.
3. සාගරෙනෙව, PTS. සෙ.

## 109 බිලාලිදායකත්ථෙරාපදානය

1663. (මම) හිමවතට නුදුරු තන්හි පත්ඇතිරියක වසමි. එකල්හි අහරෙහි ගිජුබවට නො පැමිණියෙමි (නිරතුරු) පත් ඇතිරියෙහි හෝනා වත ඇත්තෙම් වෙමි.

1664. ඒ මා විසින් කලම්බ බිලාලි තක්කල යන අල වගී සාරා ඩෙබර බදුලු බෙලි යන ගෙඩි කඩා ගෙණවුත් ආහාරයක් පිළියෙල කරණ ලදී.

1665. පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවනට භාජන වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ මාගේ අදහස් දැන මා සමීපයට වැඩි සේක.

1666. (එසේ සමීපයට) එළඹ සිටියා වූ මහොත්තම වූ දෙවියනට දෙවි වූ නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ (දැක) බිලාලි අල ගෙණ පාත්‍රයෙහි බැහීම්.

1667. එකල්හි මහාවීර වූ බුදුරජානන් වහන්සේ මා සතුටු කරමින් වැළඳූ සේක. සර්වඥයන් වහන්සේ වළඳා ඉක්බිති මේ ගාථාව වදාල සේක:

1668. "තෙපි සිය සිත පහදවා මට බිලාලි (අල) දුන්නහු ද (ඒ හේතුවෙන්) කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො පැමිණෙන්නේ ය."

1669. මෙයින් සුපණස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුමෙඛලිය** නම් වූ සක්විති රජෙක් වී ය.

1970. මේ මාගේ අන්තිම (භව) ය වේ. සියලු භවයෝ නසන ලදහ. සම්බුදුසසුනෙහි අන්තිම දෙහය දරමි.

1671. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **බිලාලිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**බිලාලිදායකත්ථෙරාපදානය නවවැනි සි.**

## 110. රේණුපූජකත්ථෙරාපදානය

1672-1673. රන්වන් වූ සියක්රස් ඇති හිරු වැනි වූ ද, සියලු දිගුන් බබුළුවන පුන්සඳ වැනි වූ ද, සයුරුවලින් පිරිවැරූ පොළොව මෙන් සව්වන් විසින් පිරිවරණ ලද **විපස්සි** බුදුරජානන් වහන්සේ දිටිමි. (දැක) නාමල් ගෙණ (එහි) රේණුවලින් **විපස්සි** බුදුරජානන් වහන්සේ පිදීමි.

1674. මෙයින් එක් අනූවන කපෙහි (යම් නාමල්) රොන් පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සි.

* "අතිශයින් අලෙපවත් වූයේ ලද දෙයින් සතුටු වූයේ ආලුක (අල) ආදියෙන් යැපෙයි" යනු අටුවාසි.

1675. පණ්ණතාළීසිතො කප්පෙ **රෙණු** නාමාසි ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1676. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **රෙණුපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රෙණුපූජකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

භික්ඛාදායී ඤාණසඤ්ඤී හත්ථියො පදපූජකො,
මුට්ඨිපුප්ඵී උදකදො නළමාලී උපට්ඨකො[1]
බිලාලිදායී රෙණු ච ගාථායො ඡ ච සට්ඨි ච.

**භික්ඛාදායිවග්ගො එකාදසමො.**

# 111. මහාපරිවාරත්ථෙරාපදානං*

1677. **විපස්සී** නාම භගවා ලොකජෙට්ඨො නරාසභො,
අට්ඨසට්ඨිසහස්සෙහි පාවිසි බන්ධුමං තදා.

1678. නගරා අභිනික්ඛම්ම අගමං දීපචෙතියං,
අද්දසං විරජං බුද්ධං ආහුතීනං පටිග්ගහං.

1679. චුල්ලාසීතිසහස්සානි යක්ඛා මය්හං උපන්තිකෙ,
උපට්ඨහන්ති සක්කච්චං ඉන්දං'ව තිදසා ගණා.

1680. භවනා අභිනික්ඛම්ම දුස්සං පග්ගය්හ'හං තදා,
සිරසා අභිවාදෙසිං තං චාදාසිං මහෙසිනො.

1681. "අහො බුද්ධො අහො ධම්මො[2] අහො නො සත්ථුසම්පදා
බුද්ධස්ස ආනුභාවෙන වසුධා'යං පකම්පථ.

1682. තං ච අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං,
බුද්ධෙ චිත්තං පසාදෙසිං දිපදින්දම්හි තාදිනෙ.

1683. සොහං චිත්තං පසාදෙත්වා දුස්සං දත්වාන සත්ථුනො,
සරණඤ්ච උපාගඤ්ඡිං සාමච්චො සපරිජ්ජනො.

1684. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1685. ඉතො පණ්ණරසෙ කප්පෙ සොළසා'සුං **සුවාහනා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1686. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මහාපරිවාරො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මහාපරිවාරත්ථෙරස්ස අපදානං පඨමං.**

1. නිවාසකො සෙ. PTS. 2. අහො ධම්මො, සීමු..
* මහාපරිවාරකත්ථෙරඅපදානං, මජ්සං.

1675. මෙයින් පන්සාළිස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **රේණු** නම් සක්විති රජෙක් වී ය.

1676. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **රේණුපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**රේණුපූජකස්ථවිරාවදානය දසවැනි සි.**

උද්දානය:

භික්ඛාදායී ඤාණසඤ්ඤී - හත්ථිය පද පූජක
මුට්ඨිපුප්ඵඋදකද - නලමාලි උපට්ඨාක
බිළාලිදායී රේණු යි - සසැටක් ගයින් බැඳියේ.

**භික්ඛාදායිවග්ගය එකොළොස් වැනි සි.**

# 111. මහාපරිවාරස්ථවිරාවදානය

1677. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **විපස්සී** නම් භාග්‍යවතුන් වහන්සේ එකල්හි අටසැටදහසක් භික්ෂූන් සමග **බන්ධුම** නගරයට පිවිසි සේක.

1678. නුවරින් නික්ම ද්වීප චෛත්‍යස්ථානයට ගියෙමි. (එහිදී) කෙලෙස් රජස් විරහිත ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවනට ගෙයක් බඳු වූ බුදුරජානන් වහන්සේ දිටිමි.

1679. අසූදහසක් අවශෙෂ යක්ෂයෝ මා **සමීපයෙහි** තව්තිසාවැසි දිව්‍යසමූහයෝ ශක්‍රයාට මෙන් (මට) සකසා උවැටැන් කෙරෙත්.

1680. මම එකල්හි භවනයෙන් නික්ම වස්ත්‍රයක් ද ගෙණ බුදුරජුන්ට හිස නමා වැන්දෙමි. එම වස්ත්‍රය ද දුනිමි.

1681. අහෝ! බුදුරජ තෙම ආශ්චර්‍ය්‍ය ය. ධර්මය ද ආශ්චර්‍ය්‍ය ය. අපගේ ශාස්තෲසම්පත්තිය ද ආශ්චර්‍ය්‍ය ය. බුදුරජානන් වහන්සේගේ ආනුභාවයෙන් මේ පෘථිවිය ද කම්පිත වී ය.

1682. ආශ්චර්‍ය්‍ය වූ ලොමු දැහැ ගන්වන්නා වූ එම විස්මය දැක තාදි ගුණ ඇති ද්විපදෙත්තම වූ බුදුරජුන් කෙරෙහි සිත පැහැද වීමි.

1683. ඒ මම සිත පහදවා ශාස්තෲන් වහන්සේට වස්ත්‍රය පුදා ඇමතියන් සහිත වූ පිරිවරජනයා සමග සරණගත ද වීමි.

1684. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් පුණ්‍යකර්මයක් කෙලෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

1685. මෙයින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුවාහන** නම් සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1686. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මහාපරිවාර** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**මහාපරිවාරස්ථවිරාවදානය පළමුවැනි සි.**

## 112. සුමඞ්ගලත්ථෙරාපදානං

1687. **අත්ථදස්සී** ජිනවරො ලොකජෙට්ඨො නරාසභො,
විහාරා අභිනික්ඛම්ම තළාකං උපසඞ්කමි.

1688. න්හාත්වා පිත්වා ච සම්බුද්ධො උත්තරිත්වෙකචීවරො,
අට්ඨාසි භගවා තත්ථ විලොකෙන්තො දිසොදිසං.

1689. භවනෙ උපවිට්ඨොහං අද්දසං ලොකනායකං.
හට්ඨො හට්ඨෙන චිත්තෙන අප්ඵොටෙසිං අහං තදා.

1690. සතරංසිං‘ව ජොතන්තං පභාසන්තං‘ව කඤ්චනං,
නච්චගීතෙ ච යුත්තො‘හං[1] පඤ්චඞ්ගතුරියම්හි ච[2].

1691. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙ සත්තෙ අතිභොමි විපුලො හොති මෙ යසො.

1692. “නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
අත්තානං තොසයිත්වාන පරෙ තොසෙසි ත්වං මුනෙ.”

1693. පරිග්ගය්හ[3] නිසීදිත්වා හාසං කත්වාන සුබ්බතෙ[4],
උපට්ඨහිත්වා සම්බුද්ධං තුසිතං උපපජ්ජ හං.

1694. සොළසෙතො කප්පසතෙ ද්වි – නව **එකචින්තිතා,**
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1695. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සුමඞ්ගලො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුමඞ්ගලත්ථෙරස්ස අපදානං දුතියං.**

## 113. සරණගමනීයත්ථෙරාපදානං

1696. උභින්නං දෙවරාජූනං සඞ්ගාමො පච්චුපට්ඨිතො[5]
අහොසි සමුපබ්‍යූළ්හො මහාඝොසො පවත්තථ.

1697. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
අන්තලික්ඛෙ ඨිතො සත්ථා සංවෙජෙසි මහාජනං.

1698. සබ්බෙ දෙවා අත්තමනා නික්ඛිත්තකවචාවුධා,
සම්බුද්ධමභිවාදෙත්වා එකග්ගා'සිංසු තාවදෙ.

1. නච්චගීතෙ පයුත්තොහං, මජසං. 2. පඤ්චතුරියසතම්හි ච,
3. පටිග්ගහෙත්වා, PTS සෙ පරිග්ගය්හ, මජසං. 4 සුබ්බතො, සීමු.
5. සඞ්ගාමො සමුපට්ඨිතො, මජසං.

## 112. සුමඞ්ගලස්ථවිරාපදානය

1687. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **අත්ථදස්සී** බුදුරජානන් වහන්සේ විහාරයෙන් නික්ම තඩාගයක් වෙත එළඹි සේක.

1688. භාග්‍යවත් සර්‍වඥ තෙම (එහි) නා (පැන්) බී එයින් ගොඩ නැග (හඳනය පමණක් හැඳීමෙන්) එක සිවුර ඇත්තේ දිශානුදිශාවන් බලමින් එහි වැඩ සිටියේ ය.

1689–1690 (රුක් දෙවි වූ) මම භවනයෙහි හුන්නෙම් එකල්හි සූර්‍ය්‍යයා මෙන් බබලන සවර්ණයක් මෙන් දිලිසෙන ලොකනායකයන් වහන්සේ දිටිමි. (දැක) සතුටු වූයෙම් සතුටු සිතින් අත්පොළසන් දිනිමි. (ඒ හේතුවෙන්) නෘත්‍යයෙහි ද, ගීතයෙහි ද, පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යයෙහි ද යෙදුනා වූ මම–

1691. දිව්‍ය වූ හෝ යලි මනුෂ්‍ය වූ හෝ යම් යම් යෝනියක උපදිම් නම් (යසසින්) සියලු සත්ත්වයන් ඉක්ම වම්. මාගේ යසස විශාල වේ.

1692. පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස! ඔබ වහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස! ඔබවහන්සේට නමස්කාර වේවා. සර්‍වඥයන් වහන්ස! නුඹ වහන්සේ තමා තුටු කොට අනුන්ද තුටු කරණ සේක්වා.

1693. මනා චිත ඇත්තේ (තථාගතයන් වහන්සේ) පිරිවරා ගෙණ හිඳ (උන්වහන්සේ ද) සතුටු කොට මම බුදුරජානන් වහන්සේට උවැටැන් කොට **තුසිත** භවනයෙහි උපනිමි.

1694. මෙයින් එක්දහස් හසියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **එකච්නන්ත** නම් එකොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1695. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **සුමඞ්ගල** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**සුමඞ්ගලස්ථවිරාපදානය දෙවැනි සී.**

## 113. දුතියසරණගමනීයස්ථවිරාපදානය

1696. දෙව්රජුන් දෙදෙනකුන්ගේ සංග්‍රාමයක් එළඹ සිටියේ ය. (පෙරමුණෙහි) රැස් වූයේ විය. මහත් ඝොෂාව ද පැවැත්තේ ය.

1697. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ නොහොත් පූජාවනට ගෙයක් බඳු වූ තුන්ලෝ දන් ශාස්තෘ වූ **පදුමුත්තර** බුදුරජතෙම අහසෙහි වැඩ සිටියේ මහාජනයා සංවේගයට පත් කෙළේ ය.

1698. එකෙණෙහි සියලු දෙවිවරු සතුටු වූවාහු බැහැර කරණ ලද හුදඇඳුම් හා ආයුධ ඇත්තාහු බුදුරජානන් වහන්සේට වැඳ එකගව සිටියාහු ය.

1699. අථහං සබ්බප්පමඤ්ඤාය වාචාසභිමුදීරයිං,
අනුකම්පකො ලොකවිදූ නිබ්බාපෙසි මහාජනං.

1700. "පදුට්ඨචිත්තො මනුජො එකපාණං[1] විහෙඨයං,
තෙන චිත්තප්පදොසෙන අපායං උපපජ්ජති.

1701. සඞ්ගාමසීසෙ නාගො'ව බහූ පාණෙ විහෙඨයං,
නිබ්බාපෙථ සකං චිත්තං මා හඤ්ඤිත්ථො පුනප්පුනං"

1702. ද්වින්නම්පි යක්ඛරාජූනං සෙනායො විම්හිතා අහු,
සරණඤ්ච උපාගච්ඡුං ලොකජෙට්ඨං සුතාදිනං.

1703. සඤ්ඤාපෙත්වාන ජනතං උද්ධරි පන[2] චක්ඛුමා,
පෙක්ඛමානොව දෙවෙහි පක්කාමි උත්තරාමුඛො.

1704. පඨමං සරණං ගච්ඡිං[3] ද්විපදින්දස්ස තාදිනො,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජ'හං.

1705. **මහාදුන්දුභිනාමා** ච[4] සොළසා'සුං රථෙසභා,
තිංසකප්පසහස්සම්හි රාජානො චක්කවත්තිනො.

1706. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සරණගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සරණගමනියත්ථෙරස්ස අපදානං තතියං.**

## 114. එකාසනියත්ථෙරාපදානං

1707. **වරුණො** නාම නාමෙන දෙවරාජා අහං තදා,
උපට්ඨහෙසිං සම්බුද්ධං සයොග්ගබලවාහනො.

1708. නිබ්බුතෙ ලොකනාථම්හි **අත්ථදස්සි**නරුත්තමෙ,
තුරියං සබ්බමාදාය අගමං බොධිමුත්තමං.

1709. වාදිතෙන ච නච්චෙන සම්මතාලසමාහිතො,
සම්මුඛා විය සම්බුද්ධං උපට්ඨිං බොධිමුත්තමං.

1710. උපට්ඨිත්වා තං බොධිං ධරණීරුහපාදපං,
පල්ලඞ්කං ආභුජිත්වාන තත්ථ කාලකතො අහං.

1711. සකකම්මාභිරද්ධො'හං පසන්නො බොධිමුත්තමෙ,
තෙන චිත්තප්පසාදෙන නිම්මානං උපපජ්ජහං.

1. පාණිං, සීමු. 2 පදමුද්ධරි, මජසං. 3. ගච්ඡිං, මජසං.
4. මහාදුන්දුභි නාම, PTS.

1699. බුදුරජාණන් වහන්සේ අපගේ අදහස් දැන ශ්‍රෙෂ්ඨ වචන ප්‍රකාශ කළ සේක. හට ගත් අනුකම්පා ඇත්තේ මහාජනයා (දුක්ගිනි හැර) නිවූ සේක. (කෙසේ ද ? යත්:)

1700. එක ප්‍රාණියකු දු නසන්නා වූ ප්‍රදුෂ්‍ය සිත් ඇති මනුෂ්‍ය-තෙමේ එම ප්‍රදුෂ්‍යචිත්තය හේතු කොට ගෙණ අපායයෙහි උපදී.

1701. යුදපෙරමුණෙහි බොහෝ ප්‍රාණීන් නසන්නා වූ ඇතකු මෙන් සිය සිත නිවවු. නැවත නැවත නො නසවු" (යි කියා යි).

1702. දෙ - යක්රජුන්ගේ ම සේනාවෝ විස්මයට පත්වූහ. තාදිගුණ ඇති ලොකනායකයන් වහන්සේ සරණ කොට ගියහ.

1703. පසැස් ඇති බුදුරජ තෙම ජනසමූහයාට කරුණු අවබෝධ කරවා (පවින්) ගොඩ ගත්තේ ය. දෙවියන් විසින් බලනු ලබන්නේ ම උතුරුදිගට මුහුණ ලා වැඩියේ ය.

1704. පළමු කොට ද්විපදෙත්තම වූ තාදිගුණ ඇති බුදුරජාණන් වහන්සේගේ සරණ ගියෙමි. (ඒ හේතුවෙන්) මම කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියෙහි නූපන්මි.

1705. තිස්දහස්වන කපෙහි රාජ්‍යධුරවහනයෙහි ශ්‍රෙෂ්ඨ වූ මහාදුන්දුභි නම් සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1706. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සරණගමනීය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**සරණගමනීයස්ථවිරාවදානය තෙවැනි යි.**

## 114. එකාසනියස්ථවිරාවදානය

1707. එකල්හි නමින් **වරුණ** නම් වූ දිව්‍යරාජයෙක් ව මම බල වාහන සහිත ව බුදුරජුන් හට උවැටැන් කෙළෙමි.

1708. **අත්ථදස්සි** බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි සියලු තූර්‍යයන් ගෙණ උතුම් බෝරුක වෙත එළඹියෙමි.

1709. වාදිතයෙන් ද, නෘත්‍යයෙන් ද, කුළුතාලම් ආදියෙන් ද යුක්ත වූයේ බුදුරජාණන් වහන්සේ ඉදිරියට මෙන් උතුම් බොධිය වෙත එළඹි යෙමි.

1710. මම ඒ බොධියට උවැටැන් කොට පලඟ බැඳ ගෙණ එහි කළුරිය කෙළෙමි.

1711. ස්වකීය පින්කම් වලින් පැහැදුනු මම උතුම් බොධිය කෙරෙහි ද පැහැදුනේ එම පහන් සිතින් **නිර්මාණරතී** දෙව්ලොව උපන්මි.

1712. සට්ඨි තුරියසහස්සානි පරිවාරෙන්ති මං සදා,
මනුස්සෙසු ච දෙවෙසු වත්තමානං භවාභවෙ.

1713. සුබාහු නාම නාමෙන චතුත්තිංසාසු ඛත්තියා,
සත්තරතනසම්පන්නා පඤ්ච කප්පසතෙ ඉතො.

1714. තිවිධග්ගී නිබ්බුතා මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

1715. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකාසනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකාසනියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 115 සුවණ්ණපුප්ඵියත්ථෙරාපදානං

1716. **විපස්සී** නාම භගවා ලොකජෙට්ඨො නරාසභො,
නිසින්නො ජනකායස්ස දෙසෙති අමතං පදං.

1717. තස්සාහං ධම්මං සුත්වාන දිපදින්දස්ස තාදිනො,
සොණ්ණපුප්ඵානි චත්තාරි බුද්ධස්ස අභිරොපයිං.

1718. සුවණ්ණච්ඡදනං ආසි යාවතා පරිසා තදා,
බුද්ධාභා ච සුවණ්ණාභා ආලොකො විපුලො අහු

1719. උදග්ගචිත්තො සුමනො වෙදජාතො කතඤ්ජලී,
විත්තිසඤ්ජනනො තෙසං දිට්ඨධම්මසුඛාවහො.

1720. ආයාචිත්වාන සම්බුද්ධං වන්දිත්වාන ච සුබ්බතං,
පාමොජ්ජං ජනයිත්වාන සකං භවනුපාගමිං.

1721. භවනෙ උපවිට්ඨො'හං බුද්ධසෙට්ඨං අනුස්සරිං,
තෙන චිත්තප්පසාදෙන තුසිතං උපපජ්ජහං.

1722. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1723. සොළසා'සිංසු රාජානො **නෙමිසම්මත** නාමකා,
තෙතාළීසෙ ඉතො කප්පෙ චක්කවත්තී මහබ්බලා.

1724. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුවණ්ණපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුවණ්ණපුප්ඵියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

1712. මිනිසුන් අතුරෙහි ද දෙවියන් අතුරෙහි ද කුදුමහත් භවයෙහි (ඉපද)පවත්නා වූ මා සැටදහසක් තූර්‍යයෝ හැම දා පිරිවරත්.

1713. මෙයින් පන්සියවන කපෙහි සත්රුවනින් යුත් නමින් **සුබාහු** නම් සූතිස් රජකෙනෙක් වූහ.

1714. මා විසින් ත්‍රිවිධාග්නීහු නිවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සම්බුදුසසුනෙහි අන්තිම ශරීරය දරමි.

1715. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ ආයුරින් ආයුෂ්මත් **එකාසනිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**එකාසනියස්ථවිරාවදානය සිවුවැනි සී.**

## 115 සුවර්‍ණපුෂ්පියස්ථවිරාවදානය

1716. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **විපස්සී** භාග්‍යවත් තෙමේ වැඩහුන්නේ ජනසමූහයාට අමෘතපදය (නිර්‍වාණධර්මය) දෙශනා කරයි.

1717. මම තාදිගුණ ඇති ද්විපදෙත්තම වූ උන්වහන්සේගේ ධර්මය අසා රන්මල් සතක් බුදුරජානන් වහන්සේට පිදීමි.

1718. එකල්හි යම් තාක් පිරිස වී ද, ඒ තාක් (පැතුරුණු) රන් පියස්සක් විය. බුද්ධරශ්මිය ද සවර්‍ණරශ්මිය ද මිශ්‍ර ව අලෝකය මහත් විය.

1719. ඔදවැඩි සිත් ඇති සොම්නස් සහිත වූ හටගත් සතුට ඇති ප්‍රීතිය උපදවන්නා වූ ඔවුනට මෙලොව සුව ගෙණ දෙන්නා වූ මම-

1720. බුදුරජානන් වහන්සේ අයැද මනා වූත ඇති උන්වහන්සේ වැඳ සතුට උපදවා සවකීය භවනයට ගියෙමි.

1721. භවනයෙහි හුන් මම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි. මම ඒ චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ **තුෂිත** භවනයෙහි උපන්මි.

1722. මෙයින් එක්අනූවන කපෙහි යම් මල්පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සී.

1723. මෙයින් තෙසාළිස්වන කපෙහි මහත් බල ඇති **නෙමිසම්මත** නම් සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

1724. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සුසන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සුවර්‍ණපුෂ්පිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**සුවර්‍ණපුෂ්පියස්ථවිරාවදානය පස්වැනි සී.**

## 116. චිතකපූජකත්ථෙරාපදානං

1725. වසාමි රාජායතනෙ සාමච්චො සපරිජ්ජනො,
පරිනිබ්බුතෙ භගවති **සිඛිනෙ** ලොකබන්ධුනෙ[1].

1726. පසන්නචිත්තො සුමනො චිතකං අගමාසහං,
තුරියං තත්ථ වාදෙත්වා ගන්ධමාලං සමොකිරිං.

1727. චිතම්හි පූජං කත්වාන[2] වන්දිත්වා චිතකං අහං,
පසන්නචිත්තො සුමනො සකං භවනුපාගමිං.

1728. භවනෙ උපවිට්ඨො'හං චිතපූජං[3] අනුස්සරිං,
තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභෙ.

1729. අනුභොත්වාන සම්පත්තිං දෙවෙසු මනුජෙසු ච,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1730. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි චිතපූජායිදං ඵලං.

1731. එකූනතිංසෙ කප්පම්හි ඉතො සොළස රාජානො,[4]
**උග්ගතා** නාම නාමෙන චක්කවත්තී මහබ්බලා.

1732. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චිතකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චිතකපූජකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 117. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං

1733. යදා **විපස්සී** ලොකග්ගො ආයුසංඛාරමොස්සජී,
පථවී සම්පකම්පිත්ථ මෙදිනී ජලමෙඛලා.

1734. ඔතතං විත්ථතං[5] මය්හං සුවිචිත්තවටංසකං,[6]
භවනම්පි පකම්පිත්ථ බුද්ධස්ස ආයුසංඛයෙ.

1735. තාසො මය්හං සමුප්පන්නො භවනෙ සම්පකම්පිතෙ,
උප්පාතො[7] නු කිමත්ථාය ආලොකො විපුලො අහු.

1736. **වෙස්සවණො** ඉධාගම්ම නිබ්බාපෙසි මහාජනං,
"පාණභූතෙ[8] භයං නත්ථි එකග්ගා හොථ සංවුතා.

1737. අහො බුද්ධො අහො ධම්මා[9] අහො නො සත්ථු සම්පදා.
යස්මිං උප්පජ්ජමානම්හි පථවී සම්පකම්පති."

1738. බුද්ධානුභාවං කිත්තෙත්වා කප්පං සග්ගම්හි මොදහං,
අවසෙසෙසු කප්පෙසු කුසලං චරිතං[10] මයා.

---

1. සිඛිනො ලොකබන්ධුනො. සීමු. සහා.
2. චිතක පූජං කත්වා, PTS. සෙ.
3. චිතකපූජං, සීමු.
4. රාජිනො, සීමු.
5. විතතං, සෙ. PTS
6. සුවිචිත්තං, PTS. සෙ
7. උප්පාදො, සබ්බත්ථ.
8. පාණභූතං PTS. සෙ.
9. ධම්මො, ඉතිපි.
10. කාරිතං, PTS. සෙ. කරිතං, සීමු.

# 116. චිතකපූජකස්ථවිරාවදානය

1725-1726. මම ඇමැතියන් සහිත වූයෙම් පිරිවරජනයා සමග වූයෙම් රාජායතනයෙහි වසමි. ලෝකබන්ධු වූ **සිඛී** බුදුරජානන් වහන්සේ පිරිනිවි කල්හි පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් චිතකය වෙත ගියෙමි. එහි තූර්යවාදනය කර සුවඳ මල් ඉස්සෙමි.

1727. මම සැයෙහි පූජාව කොට චිතකය ද වැඳ පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් ස්වකීය භවනයට ගියෙමි.

1728. භවනයෙහි හුන්නා වූ මම චිතකපූජාව සිහි කෙළෙමි. ද්විපදෝත්තම වූ ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨයන් වහන්සේ කෙරෙහි කළ ඒ කුශලකර්මය හේතු කොට ගෙණ-

1729. දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි සම්පත් අනුභව කොට ජය පරාජය දෙක හැර නිශ්චලස්ථානයට (නිවණට) පැමිණියෙම් වෙමි.

1730. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. චිතකපූජාවෙහි මේ විපාකය සි.

1731. මෙයින් එක් තිස්වන කපෙහි නමින් **උග්ගත** නම් වූ මහත් බල ඇති සොළොස්සක්විති රජකෙනෙක් වූහ.

1732. සිව්පිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චිතකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**චිතකපූජකස්ථවිරාවදානය සවැනිසි.**

# 117. බුද්ධසඤ්ඤකස්ථවිරාවදානය

1733. යම් කලෙක්හි **විපස්සී** බුදුරජතෙම ආයුඃසංස්කාරය අත්හළේ ද, (එකල්හි) සයුරු මෙවුල් කොට ඇති (සයුරෙන් වට වූ) පෘථිවිය කම්පිත වී ය.

1734. විසිතුරු මලින් සැරසූ මාගේ දිගුවිසල් භවනය ද තථාගතයන් වහන්සේගේ ආයුඃසංස්කාරය හරණා කල්හි කම්පිත වී ය.

1735. මාගේ භවනය කම්පිත වූ කල්හි නැති ගැණීම ද ඇති විය. කුමක් සඳහා ආලෝකය මහත් වූයේ ද? උත්පාතය (=මහාභූතවිකාරය) වූ යේ ද?

1736-1737. **වෛශ්‍රවණ** තෙම මෙහි පැමිණ මහාජනයා සන්සිඳවී ය. (කෙසේ ද? යත්:) එකඟ සිත් ඇත්තෝ සංවරයෙන් යුක්ත වවු. ප්‍රාණීන් කෙරෙහි බියක් නැත. යම් බුදුකෙනෙකුන් උපදනා කල්හි මහාපෘථිවිය කම්පිත වී ද, ඒ බුදුරජතෙම ආශ්චර්ය ය. ධර්මයෝ ද ආශ්චර්යයහ. අපගේ ශාස්තෘසම්පත්තිය ද ආශ්චර්ය ය' (කියාසි).

1738. මම බුදුගුණ පවසා කපක් ස්වර්ගයෙහි සතුටු වීමි. සෙසු කල්පයන්හි මා විසින් කුසල් කරණ ලදී.

1739. එකනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

1740. ඉතො චුද්දසකප්පම්හි රාජා ආසිං පතාපවා,
**සමිතො** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

1741. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බුද්ධසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බුද්ධසඤ්ඤකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 118. මග්ගසඤ්ඤකත්ථෙරාපදානං

1742. **පදුමුත්තර**බුද්ධස්ස සාවකා වනචාරිනො,
විප්පනට්ඨා බ්‍රහාරඤ්ඤෙ අන්ධාව අනුසූයරෙ.

1743. අනුස්සරිත්වා සම්බුද්ධං පදුමුත්තරනාමකං,
තස්ස තෙ මුනිනො පුත්තා විප්පනට්ඨා මහාවනෙ.

1744. භවනා ඔරුහිත්වාන අගමං භික්ඛුසන්තිකං[1],
තෙසං මග්ගඤ්ච ආචික්ඛිං භොජනඤ්ච අදාස 'හං.

1745. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
ජාතියා සත්තවස්සො'හං අරහත්තමපාපුණිං.

1746. **සචක්ඛු** නාම නාමෙන ද්වාදස චක්කවත්තිනො,
සත්තරතනසම්පන්නා පඤ්චකප්පසතෙ ඉතො.

1747. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මග්ගසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මග්ගසඤ්ඤකත්ථෙරස්ස අපදානං අට්ඨමං**

## 119. පච්චුපට්ඨානසඤ්ඤකත්ථෙරාපදානං

1748. **අත්ථදස්සිම්හි** සුගතෙ නිබ්බුතෙ සමනන්තරා,
යක්ඛයොනිං උපපජ්ජිං යසං පත්තො ච'හං තදා.

1749. දුල්ලද්ධං වත මෙ ආසිං දුප්පභාතං දුරුට්ඨිතං,
යං මෙ භොගෙ විජ්ජමානෙ පරිනිබ්බායි චක්ඛුමා.

---

1 සන්තිකෙ, PTS. සෙ.

1739. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් බුද්ධසංඥාවක් (බුද්ධ ය යන හැඟීමක්) ලැබුයෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවෙහි (බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහි කිරීමෙහි) මේ විපාකය යි.

1740. මෙයින් තුදුස්වන කපෙහි මහත් බල ඇති නමින් **සමිත** නම් වූ ප්‍රතාපවත් රජෙක් වීමි.

1741. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **බුද්ධසංඥක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**බුද්ධසඤ්ඤක ස්ථවිරාවදානය සත්වැනියි.**

## 118. මග්ගසඤ්ඤකස්ථවිරාවදානය

1742. **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වනයෙහි හැසිරෙන්නාහු මහවෙනෙහි මංමුළා වූවාහු අන්ධයන් මෙන් ඒ මේ අත හැසිරෙත්.

1743. **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ ද උන්වහන්සේගේ ඒ මහවෙනෙහි මංමුළා වූ ශ්‍රාවකයන් ද සිහි කොට–

1744. මම භවනයෙන් බැස ඒ භික්ෂූන් වෙතට පැමිණියෙමි. මම උන්වහන්සේලාට මාර්ගය ද කීමි. බොජුන් ද දුන්නෙමි.

1745. ද්විපදොත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කළ ඒ පුණ්‍යකර්මය හේතු කොට ගෙණ උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම රහත්බවට ද පැමිණියෙමි.

1746. මෙයින් පන්සියවන කපෙහි සත්රුවනින් යුත් නමින් **සචක්ඛු** නම් වූ දෙලොස් සක්විති රජකෙනෙක් වූහ.

1747. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මග්ගසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**මග්ගසඤ්ඤක ස්ථවිරාවදානය අටවැනි සී.**

## 119. පච්චුපට්ඨානස්ථවිරාවදානය

1748. යසසට පත් වූ මම **අත්ථදස්සී** බුදුරජුන් පිරිනිවීමට අනතුරු ම යක්ෂයොනියෙහි උපන්මි. එකල්හි (මම මෙසේ සිතීමි)–

1749. මාගේ සම්පත් පවත්නා කල්හි යම් හෙයකින් බුදුරජාණන් වහන්සේ පිරිනිවී සේක් ද, එය මට අලාභයකි. නපුරු පහත් වීමකි. නපුරු (කිරු) නැඟීමෙකි.

1750. මම සබ්බකප්පමඤ්ඤය **සාගරො** නාම සාවකො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකං[1].

1751. "කින්නු සොචසි මා භායි චර ධම්මං[2] සුමෙධස,
අනුප්පදින්නා බුද්ධෙන සබ්බෙසං බීජසම්පදා.

1752. යො ච පූජෙය්‍ය සම්බුද්ධං තිට්ඨන්තං ලොකනායකං,
ධාතුං සාසපමත්තං හි නිබ්බුතස්සාපි පූජයෙ.

1753. සමෙ චිත්තප්පසාදම්හි සමං පුඤ්ඤං මහග්ගතං,
තස්මා ථූපං කරිත්වාන පූජෙහි ජිනධාතුයො".

1754. **සාගරස්ස** වචො සුත්වා බුද්ධථූපං අකාසහං,
පඤ්ච වස්සෙ පරිචරිං මුනිනො ථූපමුත්තමං.

1755. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
සම්පත්තිං අනුභොත්වාන අරහත්තං අපාපුණිං.

1756. **භූරිපඤ්ඤා** ච චත්තාරො සත්තකප්පසතෙ ඉතො,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1757. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පච්චුපට්ඨානසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පච්චුපට්ඨානසඤ්ඤකත්ථෙරස්ස අපදානං නවමං.**

## 120. ජාතිපූජකත්ථෙරාපදානං

1758. ජායන්තස්ස **විපස්සිස්ස** ආලොකො විපුලො අහු,
පථවී ච පකම්පිත්ථ සසාගරා[3] සපබ්බතා.

1759. නෙමිත්තා ච වියාකංසු බුද්ධො ලොකෙ භවිස්සති,
අග්ගො ච සබ්බසත්තානං ජනතං උද්ධරිස්සති.

1760. නෙමිත්තානං සුණිත්වාන ජාතිපූජමකාසහං,
එදිසා පූජනා නත්ථි යාදිසා ජාතිපූජනා.

1761. සංචරිත්වාන[4] කුසලං සකං චිත්තං පසාදයිං,
ජාතිපූජං කරිත්වාන තත්ථ කාලකතො අහං.

1. සන්තිකෙ, PTS. සෙ. ථෙ. 2. වරධම්ම, සෙ.
3. සසාගර, සීමු. 4. සංසරිත්වාන, PTS. සෙ. සංහරිත්වාන, සීමු.

1750. (මෙසේ සිතන්නා වූ) මාගේ අදහස **සාගර** නම් ශ්‍රාවකයෙක් තෙමේ දැන ගෙණ හෙ තෙමේ මා දුකින් ගොඩ ගණු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේ ය.

1751. "නුවණැත්තානෙනි, කවර හෙයින් ශොක කෙරෙහි ද? බිය නො වනු මැනැව. ධර්මයෙහි හැසිරෙන්න. බුදුරජුන් විසින් සියලු දෙනාට කුශලබීජසම්පත්තිය නැවත නැවත දෙන ලදී.

1752. යමෙක් ජීවමාන වූ ලොකනායක බුදුරජුන් පුදන්නේ නම්, එසේ ම පිරිනිවි බුදුරජුන්ගේ අබැටක් පමණ වූ ධාතූන් වහන්සේ නමකුදු පුදන්නේ නම්-

1753. චිත්තප්‍රසාදය සම වූ කල්හි පිණ ද සමාන ය. මහත් බවට ගියේ ද වේ. එහෙයින් සෑයක් කොට සර්‍වඥධාතූන් පුදනු මැනව".

1754. **සාගර** ශ්‍රාවකයන් වහන්සේගේ වචනය අසා මම සර්‍වඥ (ධාතු නිදන් කොට) සෑයක් කෙළෙමි. බුදුරජුන්ගේ ඒ උතුම් සෑය පස්වසක් ම පරිවරණය කෙළෙමි.

1755. ද්විපදොත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කළ එ ම පුණ්‍යකර්මය හේතු කොට ගෙණ සම්පත් අනුභව කොට රහත්බවට පැමිණියෙමි.

1756. මෙයින් සත්සියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **භූරිපඤ්ඤ** නම් සිවු සක්විතිරජකෙනෙක් වූහ.

1757. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සව්බුපට්ඨානසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**සවබුපට්ඨානසඤ්ඤක ස්ථවිරාවදානය නවවැනි යි.**

## 120. ජාතිපූජකස්ථවිරාවදානය

1758. **විපස්සී** බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ කල්හි සාගර සහිත පර්‍වත සහිත පෘථිවිය කම්පිත වී ය.

1759. නිමිත්තපාඨකයෝ මෙසේ පැවසූහ: (කෙසේ ද? යත්) "සියලු සත්ත්වයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ සර්‍වඥ තෙම ලොව පහළ වන්නේ ය. ජනසමූහයා සසරසයුරින් නගා සිටුවන්නේ ය."

1760. මම නිමිත්තපාඨකයන්ගේ වචනය අසා (උත්පත්තිය නිමිති කොට පැවැත්වූ) ජාතිපූජාව කෙළෙමි. (බුදුරජුන්ගේ උපත පිළිබඳ ව පවත්වන) **ජාතිපූජාව** යම් බඳු නම්, එබඳු උතුම් පූජාවක් ලෙව්හි නැත.

1761. කුසල් රැස් කොට සිත පැහැදවීමි. එහි දී එ ම ජාතිපූජාව කොට කළුරිය කෙළෙම් වෙමි.

1762. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙ සත්තෙ අතිහොමි ජාතිපූජායිදං ඵලං.

1763. ධාතියො[1] මං උපට්ඨන්ති මම චිත්තවසානුගා,
න තා[2] සක්කොන්ති කොපෙතුං ජාතිපූජායිදං ඵලං.

1764. එකනවුතෙ ඉතො කප්පෙ යං පූජමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ජාතිපූජායිදං ඵලං.

1765. **සුපාරිචාරියා** නාම චතුත්තිංස ජනාධිපා,
ඉතො තතියකප්පම්හි චක්කවත්තී මහබ්බලා.

1766. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ජාතිපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ජාතිපූජකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

පරිවාර සුමඞ්ගලා සරණාසන පුප්ඵකා,
චිතපූජී බුද්ධසඤ්ඤී මග්ගුපට්ඨාන ජාතිනා,
ගාථායො නවුතී වුත්තා ගණිතායො විභාවිභි.

**මහාපරිවාරවග්ගො ද්වාදසමො.**

# 121. සෙරෙය්‍යකත්ථෙරාපදානං

1767. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
අබ්භොකාසෙ ඨිතො සන්තො අද්දසං ලොකනායකං

1768. සීහං යථා වනචරං ව්‍යග්ඝරාජංව නිත්තසං,
තිධා පභින්නමාතඞ්ගං කුඤ්ජරංව මහෙසිනං.

1769. සෙරෙය්‍යකං ගහෙත්වාන ආකාසෙ උක්ඛිපිං අහං,
බුද්ධස්ස ආනුභාවෙන පරිවාරෙන්ති සබ්බතො[3].

1770 අධිට්ඨාසි මහාවීරො සබ්බඤ්ඤූ ලොකනායකො,
සමන්තා පුප්ඵච්ඡදනා[4] ඔකිරිංසු නරාසභං.

1771. තතො සා පුප්ඵකඤ්චුකා[5] අන්තොවණ්ටා බහිමුඛා,
සත්තාහං ඡදනං හුත්වා[6] තතො අන්තරධායථ.

1. ධාතුයො ච, සෙ. PTS. 2. තෙ, PTS. 3. සබ්බසො, මජසං.
4. ඡදනං, PTS. සෙ. 5. සපුප්ඵ, PTS. 6. කත්වා, සීමු.

1762. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද, සම්පත්තියෙන් සියලු සත්ත්වයන් ඉක්මවමි. ජාතිපූජාවෙහි මේ විපාකය යි.

1763. මාගේ චිත්තාචාරයට අනුව පවතින්නා වූ කිරිමවුවරු මට උවටැන් කෙරෙත්. (ඒ ස්ත්‍රීහු) මා කෝප කිරීමට නො හැක්කාහු වෙත්. ජාතිපූජාවෙහි මේ විපාකය යි.

1764. මෙයින් එක්අනූවන කල්පෙහි වූ එකල්හි යම් පින්කමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ජාතිපූජාවෙහි මේ විපාකය යි.

1765. මෙයින් තෙවන කල්පයෙහි මහත් බල ඇති ජනාධිපති වූ **සුපාරිචාරිය** නම් වූ සූතිස් සක්විතිරජකෙනෙක් වූහ.

1766. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ජාතිපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**ජාතිපූජකස්ථවිරාපදානය දසවැනි යි.**

**උද්දානය:**

පරිවාර සුමඞ්ගල සරණ ආසන පුප්ඵික,
චිතපූජී බුද්ධසඤ්ඤී මග්ග උපට්ඨාන ජාති යී,
දසවතක් පිඩු කොට මෙහි අනූගයකින් බැඳුනේ.

**මහාපරිවාරවර්ගය දොළොස් වැනි යි.**

## 121. සෙරෙය්‍යක ස්ථවිරාපදානය

1767. වේද හදාරන්නා වූ මන්ත්‍ර දරන්නා වූ වෙදත්‍රයෙහි පරතෙරට ගිය–

1768. (මම) එළිමහන්තන්හි සිටියෙම් වනයෙහි හැසිරෙණ සිංහයකු වැනි වූ තැති නො ගන්නා ව්‍යාඝ්‍රරාජයකු වැනි වූ මාතඞ්ග කුලයෙහි වූ ත්‍රිමදගලිත හස්තිරාජයකු වැනි වූ මහර්ෂි ලොකනායක බුදුරජුන් දිටිමි.

1769. මම කටුකරඬුමල් ගෙණ අහසෙහි දැමීමි. බුදුරජුන්ගේ ආනුභාවයෙන් (පුෂ්පයෝ) හැම දෙසින් පිරිවරත්.

1770. මහාවීර වූ ලොකනායක සර්වඥයන් වහන්සේ අදිටන් කළසේක. (ඒ අදිටන්බලයෙන්) නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ හාත්පස මල් වියන්හු විසිරුණාහ.

1771. ඉක්බිති ඇතුළට ගිය නැටි ඇති පිටතට හැරුණු මල් ඇති ඒ පුෂ්ප කඤ්චුකය (මල්වියන) සතියක් මුළුල්ලෙහි සෙවෙනියක් වී එතනින් අතුරුදහන් විය.

1772. තං ච අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං,
බුද්ධෙ චිත්තං පසාදෙසිං සුගතෙ ලොකනායකෙ.

1773. තෙන චිත්තප්පසාදෙන සුක්කමූලෙන චොදිතො,
කප්පානං සතසහස්සං දුග්ගතිං නුපපජ්ජහං.

1774. පණ්ණරසසහස්සම්හි කප්පානං පඤ්චවීස තෙ,
**විත්තමාලා**සනාමා[1] ච චක්කවත්තී මහබ්බලා.

1775. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සෙරෙය්‍යකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සෙරෙය්‍යකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 122. පුප්ඵථූපියත්ථෙරාපදානං

1776. **හිමවන්තස්සා**විදූරෙ **කුක්කුටො**[2] නාම පබ්බතො,
වෙමජ්ඣෙ තස්ස වසති බ්‍රාහ්මණො මන්තපාරගූ.

1777. පඤ්ච සිස්සසහස්සානි පරිවාරෙන්ති මං සදා,
පුබ්බුට්ඨායී ච තෙ ආසුං මන්තෙසු ච විසාරදා.

1778. බුද්ධො ලොකෙ සමුප්පන්නො තං විජානාථ නො භවං,
අසීති ව්‍යඤ්ජනානස්ස බාත්තිංස වරලක්ඛණා,
බ්‍යාමප්පභො ජිනවරො ආදිච්චොව විරොචති.

1779. සිස්සානං වචනං සුත්වා බ්‍රාහ්මණො මන්තපාරගූ,
අස්සමා අභිනික්ඛම්ම දිසං පුච්ඡති සිස්සකෙ.[3]
යම්හි දෙසෙ මහාවීරො වසතී ලොකනායකො.

1780. තාහං දිසං නමස්සිස්සං[4] ජිනං අප්පටිපුග්ගලං,
උදග්ගචිත්තො සුමනො පූජෙසිං[5] තං තථාගතං.

1781. එථ සිස්සා ගමිස්සාම දක්ඛිස්සාම තථාගතං,
වන්දිත්වා සත්ථුනො පාදෙ සොස්සාම ජිනසාසනං.

1782. එකාහං අභිනික්ඛම්ම ව්‍යාධිං පටිලභිං අහං,
ව්‍යාධිතා පීළිතො සන්තො සාලං වෙසයිතුං[6] ගමිං,

1783. සබ්බෙ සිස්සෙ සමානෙත්වා අපුච්ඡිං තෙ තථාගතං[7],
කීදිසං ලොකනාථස්ස ගුණං පරමබුද්ධිනො.

---

1. විතමාලා, PTS. විතමාලා, මජසං. 2. කුක්කුරො, මජසං.
3. බ්‍රාහ්මණො, PTS. සෙ. 4. තහි දිස්වාන පස්සිස්සං, PTS.
5. පූජෙස්සං ච, PTS. 6 වො සෙයිතුං, සීමු. 7. තථා අහං, PTS. සෙ.

1772. විස්මයජනක වූ ලොමුදහ ගන්වන්නාවූ ඒ ආශ්චර්ය්‍යය දැක සුගත වූ ලොකනායක වූ බුදුරජුන් කෙරෙහි සිත පැහැදවීමි.

1773. මම ඒ චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ කුශලමූලයෙන් මෙහෙයන ලද්දෙම් කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක නො උපනිමි.

1774. එක්දහස්පන්සියවන කපෙහි මහත් බල ඇති **චිත්තමාල** නම් පස්විසි සක්විතිරජකෙනෙක් වූහ.

1775. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සෙරෙය්‍යක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් සි.

**සෙරෙය්‍යකස්ථවිරාපදානය පළමුවැනි සි.**

## 122. පුප්ඵථූපිය ස්ථවිරාපදානය

1776. හිමවතට නුදුරු තන්හි **කුක්කුට** නම් පර්වතයක් විය. ඒ පර්වතය අතුරෙහි මන්ත්‍රයන්හි පරතෙරට ගිය බ්‍රාහ්මණයෙක් විය.

1777. හැම කල්හි ම පන්දහසක් ශිෂ්‍යයෝ මා පිරිවරත්. ඔහු හැම පළමු උදෑසන නැගිටිනසුලු වූවාහු මන්ත්‍රයන්හි විශාරදයෝ ද වූහ.

1778. (ඒ ශිෂ්‍යයෝ මෙසේ කීහ:) "බුදුරජ තෙම ලොව පහළ විය. උන්වහන්සේට අසූවක් අනුව්‍යඤ්ජන ඇත. මහාපුරුෂලක්‍ෂණයෝ දෙතිසක් වෙති. ව්‍යාමප්‍රභා ඇති ඒ ජිනෙන්ද්‍රයන් වහන්සේ හිරු මෙන් බබලන සේක. පින්වතුන් වහන්ස, අපගේ වචනය දැනගණු මැනැව" (කියා යි).

1779. මන්ත්‍රයන්හි පරතෙරට ගිය බමුණු තෙමේ ශිෂ්‍යයන්ගේ වචනය අසා අසපුවෙන් නික්ම ශිෂ්‍යයන්ගෙන් ලොකනායක වූ මහා-වීරයන් වහන්සේ යම් දිශාවක වැඩවෙසෙන සේක් නම් ඒ (බුදුන් වැඩ වසන) දිශාව විචාරයි.

1780. මම ඒ දිශාවට ද අප්‍රතිපුද්ගල වූ පස්මරුන් දිනුවා වූ උන්වහන්සේට ද නමස්කාර කරන්නෙම් යි (කියා යි.) ඔද වැඩි සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් ඒ තථාගතයන් පිදීමි. (එසේ කොට ශිෂ්‍යයනට මෙසේ කීමි).

1781. "ශිෂ්‍යයෙනි, එවූ. යන්නෙමු. ඒ තථාගතයන් දකින්නෙමු. ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ බුද්ධධර්මය අසන්නෙමු" (කියායි).

1782. (එහෙත්) නික්ම එක් දිනකින් මම රොගී වීමි. රොගයෙන් පෙළුනෙම් ශයනය කරන්නට ශාලාවකට ගියෙමි.

1783. සියලු ශිෂ්‍යයන් රැස් කරවා "තථාගතයන් කෙබඳු ද ? පරම බුද්ධිමත් ලොකනාථයන් වහන්සේගේ ගුණ කෙබඳු දැ"යි ඔවුන්ගෙන් විචාළෙමි.

1784. තෙ මෙ පුට්ඨා ව්‍යාකරිංසු යථා දස්සාවිනො තථා,
සක්කච්චං[1] බුද්ධසෙට්ඨං තං දස්සෙසුං මම සම්මුඛා.

1785. තෙසාහං වචනං සුත්වා සකං චිත්තං පසාදයිං,
පුප්ඵෙහි ථූපං කත්වාන තත්ථ කාලකතො අහං.

1786. තෙ මෙ සරීරං ඣාපෙත්වා අගමුං[2] බුද්ධසන්තිකෙ,
අඤ්ජලිං පග්ගහෙත්වාන සත්ථාරං අභිවාදයුං.

1787. පුප්ඵෙහි ථූපං කත්වාන සුගතස්ස මහෙසිනො,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං.

1788. චත්තාරීසසහස්සම්හි කප්පෙ සොළස ඛත්තියා,
නාමෙන'**ඞ්ගිසමා** නාම චක්කවත්තී මහබ්බලා.

1789. වීසෙ කප්පසහස්සම්හි රාජානො චක්කවත්තිනො,
**සතාසන**සනාමා ච අට්ඨතිංස මහීපතී.

1790. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුප්ඵථූපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුප්ඵථූපියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 123. පායාසදායක*ථෙරාපදානං

1791. සුවණ්ණවණ්ණං සම්බුද්ධං[3] ද්වත්තිංසවරලක්ඛණං,[4]
පවනා අභිනික්ඛන්තං භික්ඛුසංඝපුරක්ඛතං.

1792. මහච්චා[5] කංසපාතියා වඩ්ඪෙත්වා පායසං අහං,
ආහුතිං යිට්ඨුකාමො සො උපනෙසිං[6] බලිං අහං.

1793. භගවා තම්හි සමයෙ ලොකජෙට්ඨො නරාසභො,
චඞ්කමං සුසමාරූළ්හො අම්බරෙ අනිලායනෙ.

1794. තං ච අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං,
ඨපයිත්වා කංසපාතිං විපස්සිං අභිවාදයිං.

1795. තුවං දෙවො'සි සබ්බඤ්ඤූ සදෙවෙ සහමානුසෙ,
අනුකම්පං උපාදාය පටිගණ්හ මහාමුනි.

1796. පටිග්ගහෙසි භගවා සබ්බඤ්ඤූ ලොකනායකො,
මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ මහාමුනි.

---

1. කුක්කුට්ඨ, PTS. 2. අගමංසු, PTS. සෙ.
* පායසදායක, මජ්ඣං. 3. සුවණ්ණවණ්ණො සම්බුද්ධො, මජ්ඣං.
4. ලක්ඛණො... අභිනික්ඛන්තො... පුරක්ඛතො, මජ්ඣං.
5. සහත්ථා, PTS. සෙ. 6. අගමාසිං, PTS. සෙ

1784. මා විසින් විචාරණ ලද ඔහු යම් සේ බුදුරජුන් දක්නා සුලු වූවාහු නම් එසේ ම විස්තර කළාහු ය. මාගේ හමුයෙහි ඒ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ මැනැවින් (වචනයෙන්) දක්වූහ.

1785. මම ඔවුන්ගේ වචනය අසා සිත පැහැදවීමි. මම එහි මල්වලින් සැයක් කොට කලුරිය කෙළෙමි.

1786. ඔහු මාගේ සිරුර දවා බුදුරජුන් සමීපයට ගියාහු ය. ඇඳිලි බැඳ ශාස්තෘන් වහන්සේට අභිවාදනය කළාහු ය.

1787. මම සුගත වූ මහර්ෂි බුදුරජාණන් වහන්සේට මල්වලින් සැයක් කොට කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නො උපනිමි.

1788. සතළිස් දහස්වන කපෙහි තම්න් අග්ගිසම නම් මහත් බල ඇති සොළොස් සක්විතිරජකෙනෙක් වූහ.

1789. විසිදහස්වන කපෙහි ඝතාසන නම් වූ පෘථිවීශ්වර වූ අටතිස් සක්විතිරජකෙනෙක් වූහ.

1790. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් පුළිනථූපිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**පුළිනථූපියස්ථවිරාවදානය දෙවැනි යි.**

## 123. පායාසදායකස්ථවිරාවදානය

1791-1792. මහලොහොතලියක කිරිබතක් බහා ගෙණ දනක් දෙනු කැමැත්තා වූ ඒ මම ඒ පූජාව දෙතිස්මහපුරිස් ලකුණින් යුත් සුවර්ණවර්ණ වූ භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලද අරණින් නික්මුනා වූ විපස්සි බුදුරජුන් වෙත පැමිණවීමි.

1793. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවත් තෙමේ එකල්හි වායුපථය වූ අහසෙහි (මවන ලද) සක්මනට නැගුනේ වේ.

1794. විස්මය ජනක වූ ලොමුදහ ගන්වන ඒ ආශ්චර්‍ය්‍ය දැක ලොහොතලිය (පසෙක) තබා විපස්සී බුදුරජුන්හට අභිවාදනය කෙළෙමි. මෙසේ ද කීමි:

1795. "දෙව් මිනිසුන් සහිත ලොවෙහි නුඹ වහන්සේ සර්‍වඥ ද දෙව ද වන සේක. මහාමුනි වූ බුදුරජාණන් වහන්ස, අනුකම්පා උපදවා මෙය පිළිගත මැනැව" (කියා යී).

1796. ලොකයෙහි ශාස්තෘ වූ මහාමුනි වූ ලොකනායක වූ භාග්‍යවත් සර්‍වඥ තෙමේ මාගේ අදහස දැන එය පිළිගත්තේ ය.

1797. එකනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පායාසස්ස ඉදං ඵලං.

1798. එකතාළීසිතො කප්පෙ **බුද්ධො** නාමාසි ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1799. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පායාසදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**පායාසදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 124. ගන්ධොදකියත්ථෙරාපදානං

1800. නිසජ්ජ පාසාදවරෙ **විපස්සිං** අද්දසං ජිනං,
කකුධං විලසන්තංව සබ්බඤ්ඤුං තමනාසකං[1].

1801. පාසාදස්සාවිදූරෙ ච ගච්ඡති ලොකනායකො,
පභා නිද්ධාවතෙ තස්ස යථා ච සතරංසිනො[2].

1802. ගන්ධොදකඤ්ච පග්ගය්හ බුද්ධසෙට්ඨං සමොකිරිං,
තෙන චිත්තප්පසාදෙන තත්ථ කාලකතො අහං.

1803. එකනවුතෙ ඉතො කප්පෙ යං ගන්ධොදකමාකිරිං[3],
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1804. එකතිංසෙ ඉතො කප්පෙ **සුගන්ධො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1805. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගන්ධොදකියො*** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගන්ධොදකියත්ථෙරස්ස අපදානං චතුත්ථං**

## 125. සම්මුඛාථවිකත්ථෙරාපදානං

1806. ජායමානෙ **විපස්සිම්හි** නිමිත්තං ව්‍යාකරිං අහං,
නිබ්බාපයඤ්ච ජනතං බුද්ධො ලොකෙ භවිස්සති.

1807. යස්මිඤ්ච ජායමානස්මිං දසසහස්සී පකම්පති,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1808. යස්මිඤ්ච ජායමානස්මිං ආලොකො විපුලො අහු,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1. සබ්බඤ්ඤුතමනාසවං, PTS. 2. සතරංසිම්හි නිබ්බුතෙ, PTS. සෙ. ස්‍යා.
3. ගන්ධොදකං සමොකිරිං, PTS. සෙ. ගන්ධොදකමොකිරිං ස්‍යා.
* සුගන්ධොදකියො, සීමු.

1797. මෙයින් ඒකානූවන කපෙහි වූ එකල්හි මම යම් දනක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. කිරිබත්දනෙහි මේ විපාකය යි.

1798. මෙයින් එක්සාළිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **බුද්ධ** නම් සක්විතිරජෙක් විය.

1799. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පායාසදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**පායාසදායකස්ථවිරාවදානය තෙවැනි යි.**

## 124. ගන්ධෝදකිය ස්ථවිරාවදානය

1800. උතුම් පහයෙහි හිඳ බබළන කුඹුක්ගසක් වැනි මොහඳුරු දුරු කරන්නා වූ පස්මරුන් දිනූ **විපස්සි** බුදුරජානන් වහන්සේ දිටිමි.

1801. පහයට නුදුරෙහි බුදුරජානන් වහන්සේ වඩනා කල්හි සූර්‍ය්‍යයාගේ (ප්‍රභාව) මෙන් උන්වහන්සේගේ ප්‍රභා විහිදෙයි.

1802. සුවඳ පැන් ද ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ඉස්සෙමි. මම ඒ චිත්තප්‍රසාදයෙන් යුතු ව කලුරිය කෙළෙමි.

1803. මෙයින් එක්අනූවන කපෙහි යම් සුවඳ පැනක් ඉස්සෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1804. මෙයින් එක්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුගන්ධ** නම් සක්විති රජෙක් විය.

1805. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සුගන්ධෝදකිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවෙන් වදාළ සේක් සී.

**ගන්ධෝදකිය ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 125. සම්මුඛාථවික ස්ථවිරාවදානය

1806. මම **විපස්සි** බුදුරදුන් ලොව පහළ වන කල්හි (ඇති වූ) නිමිති බලා මෙසේ පැවසීමි: (කෙසේ ද යත්:) "ජනසමූහයා (කෙලෙස් ගින්නෙන්) නිවමින් බුදුරජ තෙම ලොව පහළ වන්නේ ය.

1807. යම් උතුමෙකු උපදින කල්හි දසදහසක් ලෝදා කම්පිත වී ද, දූන් ඒ ශාස්තෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1808. යම් උතුමෙකු උපදින කල්හි මහත් ආලෝකය වී ද, දූන් ඒ ශාස්තෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1809. යස්මිං ච ජායමානස්මිං සරිතායො න සන්දිසුං,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1810. යස්මිං ච ජායමානස්මිං අවීචග්ගි න පජ්ජලි,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1811. යස්මිං ච ජායමානස්මිං පක්ඛිසඞ්ඝො න සඤ්චරි,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1812. යස්මිං ච ජායමානස්මිං වාතක්ඛන්ධො න වායති,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1813. යස්මිං ච ජායමානස්මිං සබ්බරතනානි ජොතිසුං,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1814. යස්මිං ච ජායමානස්මිං සත්තා'සුං[1] පදවික්කමා,
සො'දානි භගවා සත්ථා ධම්මං දෙසෙති චක්ඛුමා.

1815. ජාතමත්තො ච සම්බුද්ධො දිසා සබ්බා විලොකයි,
වාචාසභිමුදීරෙසි එසා බුද්ධාන ධම්මතා.

1816. සංවෙජයිත්වා ජනතං ථවිත්වා ලොකනායකං,
සම්බුද්ධං අභිවාදෙත්වා පක්කාමිං පාචිනාමුඛො.

1817. එකනවුතෙ ඉතො[2] කප්පෙ යං බුද්ධමභිථොමයිං,
දුග්ගතිං නාභිජානාමි ථොමනාය ඉදං ඵලං.

1818. ඉතො නවුතිකප්පම්හි **සම්මුඛාථවිකව්හයො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1819. **පථවිදුන්දුභි**[3] නාම එකූනනවුතිම්හි'තො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1820. අට්ඨාසීතිම්හි'තො කප්පෙ **ඔභාසො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1821. සත්තාසීතිම්හි'තො කප්පෙ **සරිතච්ඡෙදනව්හයො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1822. **අග්ගිනිබ්බාපනො** නාම කප්පානං ඡළසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1823. **ගතිපච්ඡෙදනො** නාම කප්පානං පඤ්චසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1824. රාජා **වාතසමො** නාම කප්පානං චුල්ලසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1825. **රතනපජ්ජලො** නාම කප්පානං තෙඅසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1. සතෙතාසු, PTS. සෙ. 2. එකනවුතිතො, මජ්සං.
3. පථවිදුන්දුභි, කත්ථචි.

1809. යම් උතුමකු උපදින කල්හි ගඞ්ගාවෝ නො ගැලූවාහු ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1810. යම් උතුමකු උපදින කල්හි අවීචියෙහි ගිනි නො දූල්විනි ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1811. යම් උතුමකු උපදින කල්හි පක්ෂිසමූහයා (ඒ මේ අත) නො හැසිරිනි ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1812. යම් උතුමකු උපදින කල්හි වාතසක්‍ඛය නො හමා ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1813. යම් උතුමකු උපදින කල්හි සියලු රත්නයෝ බැබලූනාහු ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1814. යම් උතුමකු උපදින කල්හි සප්තපදවික්‍රමයෝ වූවාහු ද, දූන් ඒ ශාසතෘ වූ පසැස් ඇති භාග්‍යවත් තෙමේ දහම් දෙසයි.

1815. උපන්නා හා ම සර්‍වඥ තෙමේ සියලු දිගුන් බැලී ය. අභීත වචන පැවසී ය. මෝ බුදුවරයින්ගේ ධර්‍මතා යි.

1816. (මෙසේ) ජනතාව සංවෙගයට පමුණුවා ලොකනායකයන් වහන්සේට සතුති කොට සර්‍වඥයන් වහන්සේ වැඳ නැගෙනහිරට මුහුණ ලා ගියෙමි.

1817. මෙයින් එක් අනූවන කපෙහි යම් බුද්ධ සතුතියක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධ සතුතියෙහි මේ විපාකය යි.

1818. මෙයින් අනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සමමුබාථවික** නම් සක්විතිරජෙක් විය.

1819. මෙයින් එකුන් අනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **පඨවිදුන්‍දුභි** නම් සක්විතිරජෙක් විය.

1820. මෙයින් අටාසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **ඔභාස** නම් සක්විතිරජෙක් විය.

1821. මෙයින් සත්අසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සරිතච්ඡෙදන** නම් සක්විතිරජෙක් විය.

1822. මෙයින් සයඅසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අග්ගිනිබ්බාපන** නම් සක්විතිරජෙක් විය.

1823. මෙයින් පස්අසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **ගතිපච්ඡෙදන** නම් සක්විතිරජෙක් විය.

1824. මෙයින් සූඅසූවනකපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **වාතසම** නම් සක්විතිරජෙක් විය.

1825. මෙයින් තෙයාසූවනකපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **රතනපජ්ජල** නම් සක්විතිරජෙක් විය.

1826. **පදවික්කමනො** නාම කප්පානං ද්වෙඅසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1827. රාජා **විලොකනො** නාම කප්පානං එකසීතියා,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1828. **ගිරිසාරො**'ති නාමෙන කප්පෙ'සීතිම්හි ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1829. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සම්මුඛාථවිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සම්මුඛාථවිකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 126. කුසුමාසනියත්ථෙරාපදානං

1830. නගරෙ ධඤ්ඤවතියා අහොසිං බ්‍රාහ්මණො තදා,
ලක්ඛණෙ ඉතිහාසෙ ච සනිඝණ්ඩු සකෙටුභෙ.

1831. පදකො වෙය්‍යාකරණො[1] නිමිත්තෙ කොවිදො අහං,
මන්තෙ ච සිස්සෙ වාචෙසිං තිණ්ණං වෙදාන පාරගූ.

1832. පඤ්ච උප්පලහත්ථානි පීඨියං[2] ඨපිතානි මෙ,
ආහුතිං යිට්ඨුකාමො'හං පිතුමාතුසමාගමෙ.

1833. තදා **විපස්සී** භගවා භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
ඔභාසෙන්තො දිසා සබ්බා ආගච්ඡති නරාසභො.

1834. ආසනං පඤ්ඤපෙත්වාන නිමන්තෙත්වා මහාමුනිං,
සන්ථරිත්වාන තං පුප්ඵං අභිනෙසිං[3] සකං ඝරං.

1835. යං මෙ අත්ථි සකෙ ගෙහෙ ආමිසං පච්චුපට්ඨිතං,
තාහං බුද්ධස්ස පාදාසිං පසන්නො සෙහි පාණිභි.

1836. භුත්තාවිං කාලමඤ්ඤාය පුප්ඵහත්ථං[4] අදාසහං,
අනුමොදිත්වාන සබ්බඤ්ඤූ පක්කාමි උත්තරාමුඛො.

1837. එකනවුතෙ ඉතො[5] කප්පෙ යං පුප්ඵමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සි'දං ඵලං.

1838. අනන්තරා ඉතො කප්පෙ රාජා'හුං **වරදස්සනො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1839. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **කුසුමාසනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුසුමාසනියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

---

1. පදකො, වෙය්‍යාකරණො, සීමු.
2. පිට්ඨියං, මජ්ඣං. PTS.
3. අභිනෙසිං, සී මු.
4. එකහත්ථං, PTS. සෙ.
5. එකනවුතිතො, මජ්ඣං.

1826. මෙයින් දෙයාසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **පදවික්කමන** නම් සක්විතිරජෙක් විය.

1827. මෙයින් එක් අසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **විලොකන** නම් සක්විතිරජෙක් විය.

1828. අසූවන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති නමින් **ගිරිසාර** නම් සක්විතිරජෙක් විය.

1829. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සමමුඛාථවික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යී.

**සමමුඛාථවිකස්ථවිරාවදානය පස්වැනියි.**

## 126. කුසුමාසනියස්ථවිරාවදානය

1830. මම එකල්හි නිඝණ්ඩුශාස්ත්‍රය හා (කවීනට හිත වූ) කෛටභ ශාස්ත්‍රය සහිත **ලක්ෂණ**ශාස්ත්‍රයෙහි ද, ඉතිහාසයෙහි ද දක්ෂ වූයෙමි **ධඤ්ඤවතී** නගරයෙහි බමුණෙක් වීමි.

1831. පදපාඨ දන්නෙමි ව්‍යාකරණශාස්ත්‍රය දන්නෙමි නිමිති-ශාස්ත්‍රයෙහි ද දක්ෂ වූයෙමි වෙදත්‍රයෙහි පරතෙරට ගියෙමි ශිෂ්‍යයනට මන්ත්‍ර කියවීමි.

1832. මම දෙමාපියන් හමුවෙහි (ඔවුනට) පුදනු කැමැත්තෙම් වීමි. ඒ සඳහා මා විසින් උපුල් මිටි සතක් අස්නක තබන ලදී.

1833. එකල්හි නරශ්‍රෙෂ්ඨ වූ **විපස්සි** බුදුරජ තෙමේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලදුයේ සියලු දිගුන් බබුළුවමින් වැඩම කරයි.

1834. බුදුරජානන් වහන්සේ පවරා ඒ මල් අතුරා අසුනක් පණවා සිය ගෙදොරට වැඩම කරවීමි.

1835. සවකීය ගෘහයෙහි මට එළවා වූ යම් ආහාරයක් ඇද්ද එය මම පහන් සිතැත්තෙම් සියතින් ම බුදුරජුහට පිදීමි.

1836. මම වළඳා අවසන් වූ උන්වහන්සේට සුදුසු කලැයි දැන මල් මිටක් ද පිරිනැමීමි. සර්වඥයන් වහන්සේ අනුමොදනා කොට උත්තරදිශාභි-මුඛ ව වැඩි සේක.

1837. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් පුෂ්පදානයක් දිනිම් ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. පුෂ්පදානයෙහි මේ විපාකය යි.

1838. මෙයින් ඉක්බිති අනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **වරදස්සන** නම් සක්විතිරජෙක් විය.

1839. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කුසුමාසනිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යී.

**කුසුමාසනියස්ථවිරාවදානය සවැනියි.**

## 127. ඵලදායකත්ථෙරාපදානං

1840. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
හිමවන්තස්සාවිදූරෙ වසාමි අස්සමෙ අහං.

1841. අග්ගිහුත්තඤ්ච මෙ අත්ථි පුණ්ඩරීකඵලානි ච,
පුටකෙ නික්ඛිපිත්වාන දුමග්ගෙ ලග්ගිතං මයා.

1842. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මමුද්ධරිතුකාමො සො භික්ඛන්තො මං උපාගමි.

1843. පසන්නචිත්තො සුමනො ඵලං බුද්ධස්ස'දාසහං,
විත්තිසඤ්ජනනො මය්හං දිට්ඨධම්මසුඛාවහො.

1844. සුවණ්ණවණ්ණො සම්බුද්ධො ආහුතීනං පටිග්ගහො,
අන්තලික්ඛෙ ඨිතො සත්ථා ඉමං ගාථං අභාසථ:

1845. "ඉමිනා ඵලදානෙන චෙතනා පණිධීහි ච,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපගච්ඡති"[1].

1846. තෙනෙව සුක්කමූලෙන අනුභොත්වාන සම්පදා,
පත්තො'ම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1847. ඉතො සත්තසතෙ කප්පෙ[2] රාජා ආසිං සුමඞ්ගලො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1848. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඵලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඵලදායකත්ථෙරස්ස අපදානං සත්තමං**

## 128. ඤාණසඤ්ඤකත්ථෙරාපදානං*

1849. පබ්බතෙ හිමවන්තම්හි වසාමි පබ්බතන්තරෙ,
පුලිනං සොභනං දිස්වා බුද්ධසෙට්ඨං අනුස්සරිං.

1850. "ඤාණෙ උපනිධා[3] නත්ථි සඞ්ගාමං[4] නත්ථි සත්ථුනො,
සබ්බං ධම්මං අභිඤ්ඤාය ඤාණෙන අධිමුච්චති.

1851. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
ඤාණෙන තෙ සමො නත්ථි යාවතා ඤාණමුත්තමං"[5].

1852. ඤාණෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොදහං,
අවසෙසෙසු කප්පෙසු කුසලං කරිතං[6] මයා.

1853. එකනවුතෙ ඉතො[7] කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඤාණසඤ්ඤායිදං ඵලං.

---

1. නූපපජ්ජි'හං, සෙ. නූපපජ්ජසි, මජසං.
2. සත්තකප්පසතෙ, PTS. සෙ. 3. උපනිධං, සෙ.
4. සඞ්ඛාරං, මජසං. 5. මුත්තමෙ PTS. සෙ. 6. චරිතං, මජසං.
7 එකනවුතිතො මජසං. * ඤාණසඤ්ඤිකත්ථෙරාපදානං, මජසං.

# 127. ඵලදායකස්ථවිරාවදානය

1840. වෙද හදාරන්නා වූ මන්ත්‍රධර වූ වේදත්‍රයෙහි පරතෙරට ගිය මම හිමවතට නුදුරෙහි අසපුවක වසමි.

1841. මාගේ අග්නිහෝත්‍රයක් ද ඇත. මා විසින් ඇටඹපල මුලක බහා ගසක් මුදුනෙහි එල්ලන ලදී.

1842. ලොකයාගේ පූජාවන්ට භාජන වූ ඒ **පදුමුත්තර** බුදුරජ තෙමේ මා (සසරින්) ගොඩ නගනු කැමැත්තේ පිඩු පිණිස හැසිරෙමින් මා වෙත එළඹියේ ය.

1843-1844. මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් බුදුරජුන්හට එම ඵල පිදීමි. මාගේ ප්‍රීතිය ඇති කරන්නා වූ මේ ලොව මැ සුව ඵලවත්නාවූ රත්වත් වූ ලෝවැස්සාගේ පූජාවන් පිළිගන්නාවූ ශාස්තෘ තෙමේ අහසෙහි වැඩ සිටියේ මේ ගාථාව වදාළේ ය:

1845. මෙ ම ඵලදානය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො එළඹේ ය (කියාසි.)

1846. එ ම කුශලමූලය හේතු කොට ගෙණ සම්පත් අනුභව කොට ජය - පරාජය හැර අචලස්ථානය (නිවණ) ට පැමිණියෙම් වෙමි.

1847. මෙයින් සත්සියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුමඞ්ගල** නම් සක්විති රජෙක් වීමි.

1848. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඵලදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**ඵලදායකස්ථවිරාවදානය සත්වැනි සි.**

# 128. ඤාණසඤ්ඤකස්ථවිරාවදානය

1849. හිමවත් පර්වතෙහි කඳුඅතුරෙහි වෙසෙමි. ශොභන වූ වැලිතලාවක් දැක බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි:

1850. "නුවණෙහි (සැසඳීමට) උපමාවක් නැත. ශාස්තෘන් වහන්සේට සංග්‍රාමයකුදු නැත. සියලු ධර්මයන් මොනොවට දන නුවණින් නිශ්චයට පැමිණේ.

1851. පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, ඔබවන්සේට නමස්කාර වේවා. උතුම් නුවණ යම් තාක් ද, (ඒ තාක් නුවණැති) ඔබවහන්සේට නුවණින් සම කෙනෙක් නැත."

1852. බුද්ධඥානයෙහි සිත පහදවා කපක් මුළුල්ලෙහි මම ස්වර්ගයෙහි සතුටු වීමි. සෙසු කල්පයන්හි මා විසින් කුසල් කරණ ලදී.

1853. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් (බුද්ධ) ඥාන-සංඥාවක් ලැබුයෙම් ද, ඒ හේතුයෙන් දුගතියක් නො දනිමි. බුද්ධඥාන-සංඥාවෙහි මේ ප්‍රතිඵලය සි.

1854. ඉතො තෙසත්තතිකප්පෙ[1] එකො **පුලිනපුප්ඵියො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1855. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඤාණසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඤාණසඤ්ඤකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 129. ගන්ධපුප්ඵියත්ථෙරාපදානං*

1856. සුවණ්ණවණ්ණො සම්බුද්ධො **විපස්සී** දක්ඛිණාරහො,
පුරක්ඛතො සාවකෙහි ආරාමා අභිනික්ඛමි.

1857. දිස්වාන'හං බුද්ධසෙට්ඨං සබ්බඤ්ඤුං තමනාසකං,
පසන්නචිත්තො සුමනො ගන්ධපුප්ඵං[2] අපූජයිං.

1858. තෙන චිත්තප්පසාදෙන දිපදින්දස්ස තාදිනො,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පුන වන්දිං තථාගතං.

1859. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1860. එකතාළීසි'තො කප්පෙ **චරණො**[3] නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

1861. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගන්ධපුප්ඵියො**[4] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගන්ධපුප්ඵියත්ථෙරස්ස අපදානං නවමං.**

## 130. පදුමපූජකත්ථෙරාපදානං

1862. හිමවන්තස්ස අවිදූරෙ **ගොතමො** නාම පබ්බතො,
නානාරුක්ඛෙහි සඤ්ඡන්නො මහාභූතගණාලයො.

1863. වෙමජ්ඣම්හි ච තස්සාසි අස්සමො අභිනිම්මිතො,
පුරක්ඛතො සසිස්සෙහි වසාමි අස්සමෙ අහං.

1864. "ආයන්තු මෙ සිස්සගණා පදුමං ආහරන්තු මෙ,
බුද්ධපූජං කරිස්සාම දිපදින්දස්ස තාදිනො"

1865. එවන්ති තෙ පටිස්සුත්වා පදුමං ආහරිංසු මෙ,
තථා[5] නිමිත්තං කත්වා'හං බුද්ධස්ස අභිරොපයිං.

1. සත්තතිකප්පෙමහි, මජසං. 2. ගණ්ඨිපුප්ඵං, සීමු. 3. වරණො, PTS.
4. ගණ්ඨිපුප්ඵියො, සීමු. 5. තථා, සීමු.
* ගණ්ඨිපුප්ඵියත්ථෙරාපදානං සීමු.

1854. මෙයින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **පුලිනපුප්ඵිය** නම් එක් සක්විතිරජෙක් විය.

1855. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඤාණසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**ඤාණසඤ්ඤක ස්ථවිරාවදානය අටවැනියි.**

## 129. ගන්ධපුප්ඵිය ස්ථවිරාවදානය

1856. **දක්ෂිණාර්හ** වූ **සුවර්ණවර්ණ** වූ **විපස්සී** බුදුරජානන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවැරුණාහු ආරාමයෙන් නික්මුනු සේක.

1857. මම මොහඳුරු දුරු කරන්නා වූ **සමිඳු** වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ දැක පහන් සිත් ඇත්තෙම් සොම්නස් සහිත වූයෙම් සුවඳමල් පිදීමි.

1858. ද්විපදෙත්තම වූ තාදීගුණ ඇති බුදුරජුන් කෙරෙහි (ඇතිකරගත්) ඒ චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ සතුටු වූයෙම් සතුටු සිතින් නැවත තථාගතයන් වැන්දෙමි.

1859. මෙයින් එක්අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1860. මෙයින් එක්සාළිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **චරණ** නම් සක්විතිරජෙක් වීමි.

1861. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ගන්ධපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**ගන්ධපුප්ඵියස්ථවිරාවදානය නවවැනියි.**

## 130. පදුමපූජක ස්ථවිරාවදානය

1862. **හිමවතට** නුදුරෙහි නානාවෘක්ෂයන්ගෙන් ගැවසී ගත් මහාභූත සමූහයාට වාසස්ථාන වූ **ගෞතම** නම් පර්වතයක් විය.

1863. ඒ මධ්‍යයෙහි නිර්මිත කරණ ලද ආශ්‍රමයක් විය. මම ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයෙම් අසපුවෙහි වෙසෙමි.

1864. "මාගේ ශිෂ්‍ය සමූහයෝ පැමිණෙත්වා ! මට පියුම් ගෙණ එත්වා! ද්විපදෙත්තම වූ තාදීගුණ ඇති බුදුරජානන් වහන්සේට පූජා කරන්නෙමු."

1865. ඔහු එසේ ය යි මට පිළිවදන් දී පියුම් ගෙණාහ. එසේ ම මම (බුදුරජානන් වහන්සේ උදෙසා) නිමිත්තක් කොට ඒ සමිඳුයන් වහන්සේට පිදීමි.

1866. සිස්සෙ තදා සමානෙත්වා සාධුකං අනුසාසහං,
මා ඛො තුම්හෙ පමජ්ජිත්ථ අප්පමාදො සුඛාවහො.

1867. එවං සමනුසාසිත්වා තෙ සිස්සෙ[1] වචනක්ඛමෙ,
අප්පමාදගුණෙ යුත්තො තදා කාලඞ්කතො අහං.

1868 එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1869. එකපඤ්ඤාසකප්පම්හි රාජා ආසිං **ජලුත්තමො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

ඉත්ථං සුදං ආයස්මා **පදුමපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමපූජකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

සෙරෙය්‍යකො පුප්ඵථූපි පායාසො'දකි[2] ථොමකො,
ආසනී ඵලසඤ්ඤී ච ගතිපදුමපුප්ඵියො,
පඤ්චුත්තරසතා ගාථා භණිතා අත්ථදස්සිභි.

**සෙරෙය්‍යකවග්ගො තෙරසමො.**

## 131. සොභිතත්ථෙරාපදානං

1870. **පදුමුත්තරො** නාම ජිනො ලොකජෙට්ඨො නරාසභො,
මහතො ජනකායස්ස දෙසෙති අමතං පදං.

1871. තස්සාහං වචනං සුත්වා වාචාසභිමුදීරයිං[3],
අඤ්ජලිං පග්ගහෙත්වාන එකග්ගො ආසහං තදා.

1872. යථා සමුද්දො උදධීනමග්ගො,
නෙරූ නගානං පවරො සිලුච්චයො,
තථෙව යෙ චිත්තවසෙන වත්තරෙ,
න බුද්ධඤාණස්ස කලං උපෙන්ති තෙ.

1873. ධම්මවිධිං[4] ඨපෙත්වාන බුද්ධො කාරුණිකො ඉසි,
භික්ඛුසංඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

1874. "යො සො ඤාණං පකිත්තෙසි බුද්ධම්හි ලොකනායකෙ,
කප්පානං සතසහස්සං දුග්ගතිං න ගමිස්සති[5].

1875. කිලෙසෙ ඣාපයිත්වාන එකග්ගො සුසමාහිතො,
**සොභිතො** නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො"

1 තෙ සිස්සෙ, සීමු. 2. පායසොදකා, මජසං.
3. වාචාසභිමුදීරිතං, සීමු. මජසං. 4. ධම්මවිධිං, මජසං.

1866. එකල්හි ශිෂ්‍යයන් රැස් කරවා මම මනා කොට අනුශාසනා කෙළෙමි: "තෙපි පමා නො වවු. අප්‍රමාදය සුව එලවත්තේ වෙයි" (කියායි.)

1867. වචනක්ෂම (=කීකරු) වූ ස්වකීය ශිෂ්‍යයනට මෙසේ අනුශාසනා කොට එකල්හි මම අප්‍රමාදී ගුණයෙහි යෙදුනෙම් කලුරිය කෙළෙමි.

1868. මෙයින් එක්අනූවන කපෙහි යම් මල්පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

1869. එක්පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **ජලුත්තම** නම් සක්විතිරජෙක් වීමි.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **පදුමපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**පදුමපූජකස්ථවිරාවදානය දසවැනියි.**

උද්දානය:

සෙරෙය්‍යක පුප්ඵථූපී පායාසී උදකී ථොමක
ආසනී ඵලසඤ්ඤී ගන්ධ පදුමපුප්ඵිය වත්
පසක් වැඩි සියක් ගයින් මෙහි කියවිනි.

**සෙරෙය්‍යකවග්ගය තෙළෙස්වැනියි.**

## 131. සොභිතස්ථවිරාවදානය.

1870. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ මහත් වූ ජනසමූහයාට අමෘතපදය (නිවණ) දෙශනා කරණ සේක.

1871. මම උන්වහන්සේ විසින් වදාරණ ලද උතුම් වචන අසා එකල්හි ඇදිලි බැඳගෙණ එකඟ සිත් ඇත්තෙම් වීමි. බුදුනුවණ ද මෙසේ පැසසීමි:

1872. "යම් සේ මහසයුර ජලාශයනට අග්‍ර වේ ද, සිනෙරු පර්වතය පර්වතයනට අග්‍ර වේ ද, එසේ ම යම් කෙනෙක් සචෙතන වශයෙන් පවතිත් නම්, ඔහු බුදුනුවණින් කලාවකට ද නො පැමිණෙත්. (හැම නුවණට වඩා බුදුනුවණ අග්‍රය" කියායි.)

1873. එකල්හි කාරුණික සෘෂි වූ බුදුරජානන් වහන්සේ ධර්මන්‍යාය පිහිටුවා භික්ෂුසඞ්ඝයා මැද වැඩහිඳ මේ ගාථාවන් වදාළ සේක:

1874. "ලොක නායක බුදුරජුන් විෂයෙහි වූ නුවණ යමෙක් ප්‍රශංසා මුඛයෙන් පැවසී ද, (ඒ හේතුවෙන්) හෙතෙම කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො යන්නේ ය.

1875. එකඟ ව සන්සුන් ව කෙලෙස් දවා නමින් **සොභිත** නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය" (කියායි).

1876. පඤ්ඤාසෙ කප්පසහස්සෙ සත්තෙවාසුං **යසුග්ගතා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1877. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,[1]
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1878. පටිසම්භිදා-පෙ-කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සොභිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සොභිතත්ථෙරස්ස අපදානං පඨමං.**

## 132. සුදස්සනත්ථෙරාපදානං

1879 **විතත්ථා**නදියා[2] තීරෙ පිලක්ඛො[3] ඵලිතො අහු,
තාහං රුක්ඛං ගවෙසන්තො අද්දසං ලොකනායකං.

1880. කෙතකං පුප්ඵිතං දිස්වා වණ්ටෙ ඡෙත්වාන'හං තදා,
බුද්ධස්ස අභිරොපෙසිං **සිඛිනො** ලොකබන්ධුනො.

1881 යෙන ඤාණෙන පත්තො'සි අච්චුතං අමතං පදං,
තං ඤාණං අභිපූජෙමි බුද්ධසෙට්ඨ මහාමුනි.

1882. ඤාණම්හි පූජං කත්වාන පිලක්ඛං[4] අද්දසං අහං,
පටිලද්ධොම්හි තං පඤ්ඤං[5] ඤාණපූජායිදං ඵලං.

1883. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි ඤාණපූජායිදං ඵලං.

1884. ඉතො තෙරසකප්පම්හි ද්වාදසාසුං **ඵලුග්ගතා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1885. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුදස්සනො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුදස්සනත්ථෙරස්ස අපදානං දුතියං.**

## 133. චන්දනපූජකත්ථෙරාපදානං

1886. **චන්දභාගා**නදීතීරෙ අහොසිං කින්නරො තදා,
පුප්ඵභක්ඛො ච'හං ආසිං පුප්ඵනිවසනො තථා[6].

1887. **අත්ථදස්සී** තු භගවා ලොකජෙට්ඨො නරාසභො,
විපිනග්ගෙන[7] නිය්‍යාසි හංසරාජාව අම්බරෙ.

1888. "නමො තෙ පුරිසාජඤ්ඤ චිත්තං තෙ සුවිසොධිතං,
පසන්නමුඛනෙත්තො'සි[8] විප්පසන්නමුඛින්ද්‍රියො.

1. සමුග්ගතා, PTS. සෙ.
2. විත්ථතායනදී, PTS. විනතා. මජසං. සීමු. විත්ථතාය, ස්‍යා.
3. පිලක්ඛු, මජසං. 4. පිලක්ඛුං, මජසං. 5. සඤ්ඤං, PTS. සෙ.ස්‍යා.
6. ච'හං, PTS. සෙ. 7. පාවනග්ගෙන, PTS. සෙ.
8. මුඛවණ්ණො'සි, PTS. සෙ.

1876. මෙයින් පණසදහස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **යසුග්ගත** නම් සත් සක්විතිරජකෙනෙක් වූහ.

1877. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ වනසන ලදහ. පැමිණෙන ලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහ. මේ අයුරින් බුදුසසුන කරණලදී.

1878. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සොභිත** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**සොභිතස්ථවිරාපදානය පළමුවැනියි.**

## 132. සුදස්සනස්ථවිරාපදානය

1879. **විතස්තා** නදී තීරයෙහි පුළිලගසක් පල ගත්තේ විය. මම එ ම ගස සොයන්නෙම් ලොකනායක වූ බුදුරජාණන් වහන්සේ දිටිමි.

1880. එකල්හි මම පිපුනු කේතකීගසක් දැක (එයින් මලක්) නටුවෙන් කඩා ලොකබන්ධු වූ **සිඛී** බුදුරජාණන් වහන්සේට පිදීමි. (කෙසේ ද යත්:)

1881. "මහාමුනීන් වහන්ස, බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේ **අච්‍යුත** නම් වූ අමෘතපදසංඛ්‍යාත නිර්වාණට යම් නුවණක් කරණ කොට ගෙණ පැමිණිසේක් ද, එ ම නුවණට පුදමි" (කියායි.).

1882. ඒ බුදුරජාණන් වහන්සේගේ **සර්වඥතාඥාන** විෂයෙහි පුද කොට පුළිල ගස දිටිමි. (ඒ පූජාහේතුවෙන්) ඒ ප්‍රඥාව ලැබුයෙම් වෙමි. **ඥාන** පූජාවෙහි මේ විපාකය යි.

1883. මෙයින් එක්තිස්වන කපෙහි යම් මලක් පිදුයෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. **ඥානපූජාවෙහි මේ විපාකය යි.**

1884. මෙයින් තෙළෙස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **එලුණගත** නම් දෙලොස් සක්විතිරජකෙනෙක් වූහ.

1885. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **සුදස්සන** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**සුදස්සනස්ථවිරාපදානය දෙවැනියි.**

## 133. චන්දනපූජකස්ථවිරාපදානය

1886. එකල්හි මම **චන්ද්‍රභාගා** නදීතීරයෙහි කිඳුරෙක් වීමි. මම මල් අනුභව කරන්නෙම් එසේ ම මල්මුවා හඳනා ඇත්තෙම් ද වීමි.

තත්ථ චිත්තං පසාදෙසිං බුද්ධො නො අග්ගපුග්ගලො.

2090. චතුනවුතෙ ඉතො කප්පෙ යං දුස්සමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි දුස්සදානස්සිදං ඵලං.

2091. සත්තසට්ඨිමහි'තො කප්පෙ චක්කවත්ති තදා අහුං,
පරිසුද්ධොති නාමෙන මනුජින්දො මහබ්බලො.

2092. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා දුස්සදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**දුස්සදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 169. සමාදපකත්ථෙරාපදානං

2093. නගරෙ බන්ධුමතියා මහාපූගගණො අහු,
තෙසාහං පවරො ආසිං මම බද්ධචරා ච තෙ.

2094. තෙ සබ්බෙ සන්නිපාතෙත්වා පුඤ්ඤකම්මෙ සමාදයිං,
මාළං කස්සාම සඞ්ඝස්ස පුඤ්ඤක්ඛෙත්තමනුත්තරං.

2095. සාධූ'ති තෙ පටිස්සුත්වා මම ඡන්දවසානුගා,
නිට්ඨාපෙසුං[1] ච තං මාළං විපස්සිස්ස අදම්හසෙ.

1. නිට්ඨාපෙත්වා, සීමු.

2084. මෙයින් සිවුඅනූවන කපෙහි යම් **පුෂ්පපූජාවක්** කෙළෙම් ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2085. මෙයින් **සත්සැටවන** කපෙහි සත්රුවනින් ආඪ්‍ය මහත් බල ඇති **සමුද්දධර** නම් සක්විති රජෙක් වීමි.

2086. **පිළිසිඹියාවෝ -පෙ- බුදුරජා**නන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **යූථිකාපුෂ්පිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**යූථිකාපුෂ්පියස්ථවිරාපදානය සත්වැනි යි.**

## 168. දුස්සදායකස්ථවිරාපදානය

2087. මම එකල්හි රම්‍ය වූ **තිවරා** නගරයෙහි රාජපුත්‍රයෙක් වීමි. මම පඬුරක් කොට දුන් වස්ත්‍රයක් ලැබ උපශාන්ත වූ බුදුරජුන්හට පිළිගැන්වීමි.

2088. භාග්‍යවත් තෙමේ ඒ (වස්ත්‍රය) ඉවැසීය. එය අතින් සපයී කෙළේ ය. **සිද්ධාර්ථ** භාග්‍යවත් තෙම එය ඉවසා (=පිළිගෙණ) අහසට නැංගේ ය.

2089. බුදුරජුන් අහසෙහි වඩිනා කල්හි දුහුල් වස්ත්‍රයෝ පසුපසින් දිවෙත්. එහිදී බුදුරජහු අපගේ අග්‍රපුද්ගලයන් වහන්සේ යි සිත පැහැදුවීමි.

2090. මෙයින් සිවු අනූවන කපෙහි වූ එ දවස් යම් වස්ත්‍රයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. වස්ත්‍රදානයාගේ මේ විපාකය යි.

2091. මෙයින් සත්සැටවන කපෙහි වූ එ දවස් මහත් බල ඇති මනුජේන්ද්‍ර වූ **පරිසුද්ධ** නම් සක්විති රජෙක් වීමි.

2092. පිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **දුස්සදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**දුස්සදායකස්ථවිරාපදානය අටවැනි යි.**

## 169. සමාදපක ස්ථවිරාපදානය

2093. **බන්ධුමතී** නගරයෙහි මහත් උවසු මුළුවෙක් වූහ. මම ඔවුන්ගේ ගණදෙටු වීමි. ඕහු ද මාගේ සහචරයෝ වූහ.

2094. ඒ සියල්ලන් රැස් කරවා 'නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ සඞ්ඝයාට මාලකයක් කරවන්නෙමු'යි පින්කමෙහි සමාදම් කරවීමි.

2095. මාගේ අදහස් අනුව ගියා වූ ඔහු 'මැනවැ'යි පිළිවදන් දී ඒ මාලකය නිම වූහ. අපි **විපස්සී** බුදුරජුන්හට එය දුනුම්හ.

2096. එකනවුතෙ ඉතො කප්පෙ යං මාලමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මාලදානස්සිදං ඵලං.

2097. එකූනසට්ඨිකප්පම්හි[1] එකො ආසි ජනාධිපො,
**ආදෙය්‍යො** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

2098. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සමාදපකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සමාදපකත්ථෙරස්ස අපදානං නවමං.**

## 170. පඤ්චඞ්ගුලියත්ථෙරාපදානං

2099. **තිස්සො** නාමාසි භගවා ලොකජෙට්ඨො නරාසභො,
පවිසන්තං ගන්ධකුටිං විහාරකුසලං මුනිං.

2100. සුගන්ධමාලමාදාය අගමාසිං ජිනන්තිකං,
අප්පසද්දො'ව සම්බුද්ධෙ පඤ්චඞ්ගුලිමදාසහං.

2101. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං ගන්ධමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පඤ්චඞ්ගුලිස්සිදං ඵලං.

2102. ද්වෙසත්තතිම්හි'තො කප්පෙ රාජා ආසි **සයම්පභො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2103. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චඞ්ගුලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චඞ්ගුලියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

සුපාරිචාරී කණවෙරී ඛජ්ජකො දෙසපූජකො
කණිකාරො සප්පිදදො යූථිකො දුස්සදායකො
මාලො ච පඤ්චඞ්ගුලිකො චතුපඤ්ඤාස ගාථකාති.

**සුපාරිචරියවග්ගො සත්තරසමො.**

## 171. කුමුදමාලියත්ථෙරාපදානං

2104. පබ්බතෙ හිමවන්තම්හි මහාජාතස්සරො අහු,
තත්ථජො රක්ඛසො ආසිං ඝොරරූපො මහබ්බලො.

2105. කුමුදං පුප්ඵතෙ තත්ථ චක්කමත්තානි ජායරෙ,
ඔචිනාමි ච තං පුප්ඵං බලිනො සමිතී තදා.

1. එකූනසත්තතිකප්පෙ, මජ්ඣං.

2096. මෙයින් එක් අනූවන කපෙහි වූ එදවස යම් මාලකයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මාලකදානයාගේ මේ විපාකය යි.

2097. එකුන් සැටවන කපෙහි මහත් බල ඇති ජනාධිපති වූ ආදෙය්‍ය නම් වූ සක්විති රජෙක් වීමි.

2098. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් සමාදපක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සමාදපකස්ථවිරාපදානය නවවැනි යි.**

## 170. පඤ්චඞ්ගුලියස්ථවිරාපදානය

2099. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ තිස්ස නම් බුදුවරයෙක් විය. මම ශ්‍රෙෂ්ඨ විහරණයෙහි දක්ෂ වූ ගඳකිළියට පිවිසෙන සම්බුද්ධයන් වහන්සේ දිටිමි.

2100. සුවඳමල ගෙණ බුදුරජානන් වහන්සේ වෙතට ගියෙමි. නිශශබ්දව මම බුදුරජුන්ගේ කයෙහි පසඟුල් දිනිමි.

2101. මෙයින් දෙයානුවන කපෙහි යම් සුගන්ධ පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පසඟුල් දීමෙහි මේ විපාකය යි.

2102. මෙයින් දෙසැත්තෑවන කපෙහි සත්රුවනින් ආඪ්‍ය මහත් බල ඇති සයම්පභ නම් සක්විති රජෙක් වීමි.

2103. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් පඤ්චඞ්ගුලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**පඤ්චඞ්ගුලියස්ථවිරාපදානය දසවැනියි.**

**උද්දානය:**

සුපාරිචාරි කණවෙරී - බජ්ජක දෙසපූජක
කණිකාර සප්පිදද - යූථිකා දුස්සදායක
මාලද පඤ්චඞ්ගුලික - සිවුපණස් ගයින් බැඳියේ.

**සුපාරිචරියවර්ගය සතළොස් වැනි යි.**

## 171. කුමුදමාලියස්ථවිරාපදානය

2104. හිමවත් පව්වෙහි මහත් වූ සවයංජාත විලෙක් විය. මම එය අසල උපන් මහ බලැති බිහිසුණු රකුසෙක් වීමි.

2105. ඒ විලෙහි කුමුදු පිපේ. ඔහු රියසක් පමණ හටගණිත්. ඒ මල් නෙලමි. එකල්හි දශබලයන් වහන්සේගේ (සඟ) පිරිසක් වූය.

2106. **අත්ථදස්සී** තු භගවා දිපදින්දො නරාසභො,
පුප්ඵං **සමොහිතං** දිස්වා ආගච්ඡි මම සන්තිකං.

2107. උපාගතඤ්ච සම්බුද්ධං දෙවදෙවං නරාසභං,
සබ්බමම පුප්ඵං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

2108. යාවතා හිමවන්තන්තා පරිසා සා තදා අහු,
තාවච්ඡදනසම්පන්නො අගමාසි තථාගතො.

2109. අට්ඨාරසෙ කප්පසතෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2110. ඉතො පණ්ණරසෙ කප්පෙ සත්තාහෙසුං ජනාධිපා,
**සහස්සරථ**නාමා තෙ චක්කවත්තී මහබ්බලා.

2111. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුමුදමාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුමුදමාලියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 172. නිස්සෙණිදායකත්ථෙරාපදානං

2112. **කොණ්ඩඤ්ඤස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
ආරොහත්ථාය පාසාදං නිස්සෙණී කාරිතා මයා.

2113. තෙන චිත්තප්පසාදෙන අනුභොත්වාන සම්පදා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

2114. එකතිංසම්හි කප්පානං සහස්සම්හි තයො අහූ,
**සම්බහුලා** නාම රාජානො චක්කවත්තී මහබ්බලා.

2115. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නිස්සෙණිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නිස්සෙණිදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 173. රත්තිපුප්ඵියත්ථෙරාපදානං

2116. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
**විපස්සිං** අද්දසං බුද්ධං දෙවදෙවං නරාසභං.

2117. රත්තිකං පුප්ඵිතං දිස්වා කුටජං ධරණීරුහං,
සමූලං පග්ගහෙත්වාන උපනෙසිං මහෙසිනො.

2118. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සිදං ඵලං.

2106. ද්විපදෙත්තම වූ නරාසභ වූ **අත්ථදස්සී** භාග්‍යවත්හු නෙළු මල් **දුටු** මා වෙත වැඩියහ.

2107. දෙවියනට දෙවි වූ නරශ්‍රීභ වූ එළඹ සිටි තථාගතයන් වෙත පැමිණ මල් ගෙණ ඒ බුදුරජුන්හට පිදීමි.

2108. එකල්හි (එහි රැස් වූ) ඒ පිරිස හිමවත කෙලවර දක්වා විය. එතෙක් දුර මල්වියන් ඇති සේක් තථාගතයන් වහන්සේ වැඩි සේක.

2109. එක්දහස් අටසියවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙලෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2110. මෙයින් පසළොස්වන කපෙහි මහත් බල ඇති ජනාධිපති වූ **සහස්සරථ** නම් ඒ සත් සක්විතිරජ කෙනෙක් වූහ.

5111. පිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාතන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **කුමුදමාලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**කුමුදමාලියස්ථවිරාවදානය පළමුවැනියි.**

## 172. නිස්සෙණිදායක ස්ථවිරාවදානය

2112. ලොවට දෙටු වූ තාදිගුණ ඇති **කොණ්ඩඤ්ඤ** භාග්‍යවතුන් වහන්සේට නැගීම සඳහා මා විසින් හිණෙක් කරණ ලදී.

2113. ඒ චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ සමපත් වළඳ සම්බුදු සස්නෙහි අන්තිම සිරුර දරමි.

2114. එක්තිස්දහස්වන කපෙහි මහත් බල ඇති **සම්බහුල** නම් තුන් සක්විති රජ කෙනෙක් වූහ.

2115. පිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාතන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **නිස්සෙණිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**නිස්සෙණිදායක ස්ථවිරාවදානය දෙවෙනියි.**

## 173. රත්තිපුප්ඵිය ස්ථවිරාවදානය

2116. මම පෙර මහවෙනෙහි (හැසිරෙණ) මුවවැද්දෙක් වීමි. (එකල්හි) දෙවියනට දෙවි වූ නරශ්‍රීභ වූ **විපස්සී** බුදුරජුන් දිටිමි.

2117. රතු මල් ඇති පිපුනු කෙළිඳගසක් දුටු ඒ මල් නටු සහිතව ම නෙලා ගෙණ බුදුරජුන්හට පිරිනැම්මි.

2118. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙලෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකයයි.

2119. ඉතො ච අට්ඨමෙ කප්පෙ **සුප්පසන්න**සනාමකො,
සත්තරතනසම්පන්නො රාජාහොසිං මහබ්බලො.

2120. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **රතනිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රතනිපුප්ඵියත්ථෙරස්ස අපදානං තතියං.**

## 174. උදපානදායකත්ථෙරාපදානං

2121. **විපස්සිනො** භගවතො උදපානො කතො මයා,
පිණ්ඩපාතඤ්ච දත්වාන නිය්‍යාතෙසිං අහං තදා.

2122. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි උදපානස්සිදං ඵලං.

2123. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උදපානදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උදපානදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 175. සීහාසනදායකත්ථෙරාපදානං

2124. නිබ්බුතෙ ලොකනාථම්හි **පදුමුත්තර**නායකෙ,
පසන්නචිත්තො සුමනො සීහාසනමදාසහං.

2125. පහූතගන්ධමාලෙහි[1] දිට්ඨධම්මෙ සුඛාවහෙ,
තත්ථ පූජං කරිත්වාන[2] නිබ්බායති බහුජ්ජනො.

2126. පසන්නචිත්තො සුමනො වන්දිත්වා බොධිමුත්තමං,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං

2127. පණ්ණරසසහස්සම්හි කප්පානං අට්ඨ ආසු තෙ[3],
**සිලුච්චය** සනාමා ච රාජානො චක්කවත්තිනො.

2128. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සීහාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සීහාසනදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

---

1. බහූහි ගන්ධමාලෙහි, මජසං. 2. පූජඤ්ච කත්වාන, මජසං.
3. ආසුනො, සෙ.

2119. මෙයින් අටවැනි කපෙහි සත්රුවනින් ආඪ්‍ය මහත් බලැති **සුපසනන** නම් සක්විතිරජෙක් වීමි.

2120. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **රතනිපුපපිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**රතනිපුපපියස්ථවිරාවදානය තෙවැනි යි.**

## 174. උදපානදායකස්ථවිරාවදානය

2121. මා විසින් **විපස්සි** බුදුරජානන් වහන්සේට ළිඳක් කරණ ලදී. මම එකල්හි පිණ්ඩපාතය ද දී (ඒ ළිඳ ද) පිරිනැමීමි.

2122. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් (උදපානදාන සඞ්ඛ්‍යාත) කර්මයක් කරණ ලද ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. ළිඳක් පිදීමෙහි මේ විපාකය යි.

2123. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

**උදපානදායක ස්ථවිරාවදානය සිවුවැනියි.**

## 175. සිහාසනදායකස්ථවිරාවදානය

2124. **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ පිරිනිවි කල්හි මම පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් සිහසුනක් පිදීමි.

2125. මෙ ලොව සුව එළවන ඒ සිංහාසනයෙහි බොහෝ ගඳින් මලින් පූජා පවත්වා බොහෝ ජනයා (දුක් ගින්නෙන්) නිවෙයි.

2126. මම පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් උතුම් බෝධිය වැඳ (ඒ හේතුවෙන්) කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක නො උපනිමි.

2127. පසළොස්දහස්වන කපෙහි **සිළුච්චය** නම් ප්‍රසිද්ධ වූ අට සක්විතිරජකෙනෙක් වූහ.

2128. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සිහාසනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සිහාසනදායක ස්ථවිරාවදානය පස්වැනියි.**

## 176. මග්ගදත්තිකත්ථෙරාපදානං

2129. **අනොමදස්සී** භගවා දිපදින්දො නරාසභො,
දිට්ඨධම්මසුඛත්ථාය අබ්භොකාසම්හි චඞ්කමි.

2130. පසන්නචිත්තො සුමනො වන්දිත්වා පුප්ඵමොකිරිං,
උද්ධතෙ පාදෙ පුප්ඵානි සීසමුද්ධනි[1] තිට්ඨරෙ.

2131. විසකප්පසහස්සම්හි ඉතො පඤ්ච ජනා අහු,
**පුප්ඵච්ඡදනියා** නාම චක්කවත්තී මහබ්බලා.

2132. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මග්ගදත්තිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මග්ගදත්තිකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 177. එකදීපියත්ථෙරාපදානං

2133. **පදුමුත්තරස්ස** මුනිනො සලලෙ බොධිමුත්තමෙ,
පසන්නචිත්තො සුමනො එකදීපං අදාසහං.

2134. භවෙ නිබ්බත්තමානම්හි නිබ්බත්තෙ පුඤ්ඤසඤ්චයෙ,
දුග්ගතිං නාභිජානාමි දීපදානස්සිදං ඵලං.

2135. සොළසකප්පසහස්සෙ ඉතො තෙ චතුරො ජනා,
**චන්දාභා** නාම නාමෙන චක්කවත්තී මහබ්බලා.

2136. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකදීපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකදීපියත්ථෙරස්ස අපදානං සත්තමං.**

**නවමං භාණවාරං.**

## 178. මණිපූජකත්ථෙරාපදානං

2137. ඔරෙන හිමවන්තස්ස නදිකා[2] සම්පවත්තථ,
තස්සා චානුපඛෙත්තම්හි සයම්භූ වසතෙ තදා.

2138. මණිං පග්ගය්හ පල්ලඞ්කං සාධුචිත්තං මනොරමං,
පසන්නචිත්තො සුමනො බුද්ධස්ස අභිරොපයිං.

2139. චතුනවුතෙ ඉතො කප්පෙ යං මණිං අභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2140. ඉතො ච ද්වාදසෙ කප්පෙ **සතරංසී** සනාමකා,
අට්ඨ තෙ ආසුං රාජානො චක්කවත්තී මහබ්බලා.

2141. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මණිපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මණිපූජකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. සොභංමුද්ධනි, සීමු. 2. නන්දකා, සෙ.

## 176. මගගදත්තිකසථවිරාවදානය

2129. ද්විපදෙත්තම වූ නරශීහ වූ **අනොමදස්සි** භාග්‍යවත්හු දිට්ඨධම්ම-සුඛය (=දිටුදැම්යෙහි සිරුරු සුවය) පිණිස එළිමහනෙහි සක්මන් කළහ.

2130. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් (මම උන්වහන්සේ) වැඳ මල් විසුරුවාලිමි. (සක්මන් කිරීම සඳහා ඒ බුදුරජහු පා එසෙවූ කල්හි (ඒ පියුම් උපුල් ආදී) මල් (විසිරී) උන්වහන්සේගේ හිස මතුයෙහි බබලමින් සිටියි.

2131. මෙයින් විසිදහස්වන කපෙහි **පුප්ඵච්ඡදනිය** නම් මහබල ඇති පස් සක්විති රජකෙනෙක් වූහ.

2132. සිවුපිළිසිඹියාවෝ -ප- බුදුරජාතන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **මගගදත්තික** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**මගගදත්තිකසථවිරාවදානය සවැනිසි.**

## 177. එකදීපිය සථවිරාවදානය

2133. **පදුමුත්තර** බුදුරජුන්ගේ සලලබෝරුකෙහි පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් මම් එක් පහනක් දැල්වීමි.

2134. භවයෙහි උපදනා කල්හි තිපන් පින් රැසෙහි (විපාක වශයෙන්) දුගතියක් නො දනිමි. ප්‍රදීපදානයාගේ මේ විපාකයයි.

2135. මෙයින් සොළොස්දහස්වන කපෙහි **චන්‍ද්‍රාභ** නම් වූ මහත් බල ඇති සිවු සක්විති රජ කෙනෙක් වූහ.

2136. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

**එකදීපියසථවිරාවදානය සත්වැනිසි.**

**නවවැනි බණවර සි.**

## 178. මණිපූජක සථවිරාවදානය

2137. හිමවතැ මොබ පෙදෙසෙක්හි (එක්) නදියක් ගලා බැස්සේය. එකල්හි ඒ ගං ඉවුර සමීපයෙහි **පදුමුත්තර** බුදුරජානන් වහන්සේ වැඩ වසන සේක.

2138. මැනැවින් විසිතුරු මතරම වූ **මිණිපලඟක්** ගෙණ පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් බුදුරජුන්හට පිරිනැමීමි.

2139. මෙයින් සිවු අනූවන කපෙහි යම් **මිණිපලඟක්** පිදෙයම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සි.

2140. මෙයින් සොළොස්වන කපෙහි මහබල ඇති **සතරංසි** නම්වූ අට සක්විති රජකෙනෙක් වූහ.

2141. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **මණිපූජක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**මණිපූජකසථවිරාවදානය අටවැනිසි.**

## 179. තිකිච්ඡකත්ථෙරාපදානං

2142. නගරෙ **බන්ධුමතියා** වෙජ්ජො ආසිං සුසික්ඛිතො,
ආතුරානං සදුක්ඛානං මහාජනසුඛාවහො.[1]

2143. ව්‍යාධිතං සමණං දිස්වා සීලවන්තං මහාජුතිං,
පසන්නචිත්තො සුමනො භෙසජ්ජමදදිං තදා.

2144. අරොගො ආසි තෙනෙව සමණො සංවුතින්ද්‍රියො,
**අසොකො** නාම නාමෙන උපට්ඨාකො විපස්සිනො.

2145. එකනවුතෙ ඉතො කප්පෙ යමොසධමදාසහං,
දුග්ගතිං නාභිජානාමි භෙසජ්ජස්ස ඉදං ඵලං.

2146. ඉතො ච අට්ඨමෙ කප්පෙ **සබ්බොසධසනාමකො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2147. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිකිච්ඡකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිකිච්ඡකත්ථෙරස්ස අපදානං නවමං.**

## 180. සඞ්ඝුපට්ඨාකත්ථෙරාපදානං

2148. **වෙස්සභුම්හි** භගවති අහොසාරාමිකො අහං,
පසන්නචිත්තො සුමනො උපට්ඨිං සංඝමුත්තමං.

2149. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි උපට්ඨානස්සිදං ඵලං.

2150. ඉතො තෙ සත්තමෙ කප්පෙ සත්තෙවාසුං **සමොදකා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2151. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සඞ්ඝුපට්ඨාකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සඞ්ඝුපට්ඨාකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

කුමුදො අථ නිස්සෙණී රත්තිකො උදපානදො
සීහාසනී මග්ගදදො එකදීපී මණිප්පදො
තිකිච්ඡකො උපට්ඨාකො එකූනපඤ්ඤාස ගාථකාති.

**කුමුදවග්ගො අට්ඨාරසමො.**

---

1. මනුස්සානං සුඛාවහො?

# 179. තිකිච්ඡකසථවිරාපදානය

2142. මම **බන්ධුමතී** නගරයෙහි රොගී වූ දුක්සහිත මහාජනයාට සුව ගෙණ දෙන්නා වූ (වෛද්‍යශාස්ත්‍රයෙහි) මැනැවින් හික්මුනු වෛද්‍යවරයෙක් වීමි.

2143 එකල්හි සිල්වත් වූ මහත් ගුණ ඇති රොගී වූ ශ්‍රමණයන් වහන්සේ නමක් දැක පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් බෙහෙතක් දුනිමි.

2144. **විපස්සී** බුදුරජුන්ගේ උපස්ථායක වූ **අසොක** නම් සත්පුත් ඉදුරන් ඇති ඒ ශ්‍රමණයන් වහන්සේ එම බෙහෙතින් ම නීරොග වූහ.

2145. මම මෙයින් එක්අනූවන කපෙහි යම් ඖෂධයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බෙහෙත්දනෙහි මේ විපාකය යි.

2146. මෙයින් අටවැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සබ්බොසධ** නම් වූ සක්විතිරජෙක් වීමි.

2147. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිකච්ඡක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිකිච්ඡකසථවිරාපදානය නවවැනියි.**

# 180. සඞ්ඝුපට්ඨාකසථවිරාපදානය

2148. **වෙස්සභූ** බුදුරජුන්ගේ කාලයෙහි මම ආරාමිකයෙක් (අරමෙහි උවටැන් කරන්නෙක්) වීමි. පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙමි උතුම් සඞ්ඝයාට උවටැන් කෙළෙමි.

2149. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සඟනට උවටැන් කිරීමේ මේ විපාකය යි.

2150. මෙයින් සත්වැනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සමොදක** නම් සත් සක්විතිරජකෙනෙක් වූහ.

2151. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සඞ්ඝුපට්ඨාක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**සඞ්ඝුපට්ඨාකසථවිරාපදානය දසවැනියි.**

උද්දානය:

කුමුදනිසෙණී රතනික උදපානද
සීහාසනී මගගදද එකදීපි මණිප්පද
තිකිච්ඡකුපට්ඨාකැයි දසවනතකුන්පණස් ගී.

**කුමුදවර්ගය අටළොස් වැනි යි.**

## 181. කුටජපුප්ඵියත්ථෙරාපදානං

2152. සුවණ්ණවණ්ණං සම්බුද්ධං සතරංසිංව උග්ගතං,
දිසං අනුවිලොකෙන්තං ගච්ඡන්තං අනිලඤ්ජසෙ.

2153. කුටජං පුප්ඵිතං දිස්වා සංවිත්ථතසමොත්ථතං,
රුක්ඛතො ඔචිනිත්වාන ඵුස්සස්ස අභිරොපයිං.

2154. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2155. ඉතො සත්තරසෙ කප්පෙ තයො ආසිංසු පුප්ඵිතා[1],
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2156. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුටජපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුටජපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 182. බන්ධුජීවකත්ථෙරාපදානං

2157 **සිද්ධත්ථො** නාම සම්බුද්ධො සයම්භූ සබ්භි වණ්ණිතො,
සමාධිං සො සමාපන්නො නිසීදි පබ්බතන්තරෙ.

2158. ජාතස්සරෙ ගවෙසන්තො දකජං පුප්ඵමුත්තමං,
බන්ධුජීවකපුප්ඵානි අද්දසං සමනන්තරං.

2159. උභො හත්ථෙහි පග්ගය්හ උපගච්ඡිං මහාමුනිං,
පසන්නචිත්තො සුමනො සිද්ධත්ථස්සාභිරොපයිං.

2160. චතුනවුතෙ ඉතො[2] කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

2161. ඉතො චතුද්දසෙ[3] කප්පෙ එකො ආසිං ජනාධිපො,
**සමුද්දකප්පො** නාමෙන චක්කවත්තී මහබ්බලො.

2162. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බන්ධුජීවකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බන්ධුජීවකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1 ආසුං සුපුප්ඵිතා, මඡසං. 2. චතුන්නවුතිතො, මඡසං
3. චාතුද්දසෙ, මඡසං.

# 181. කුටජපුප්ඵිය ස්ථවිරාපදානය

2152. උදාවූ හිරු මෙන් අහසෙහි වඩින්නාවූ දිශාවිලොකනය කරන්නාවූ ස්වර්ණවර්ණ වූ බුදුරජානන් වහන්සේ (දිටිමි).

2153. දිගුපුළුල් ලෙස පැතිරී ගිය පිපුනු කෙළිඳගසක් දුක ඒ ගසින් මල් නෙලා ඵුස්ස බුදුරජානන් වහන්සේට පිදීමි.

2154. මෙයින් ලද අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2155. මෙයින් සතළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති පුප්ඵිත නම් තුන් සක්විතිරජකෙනෙක් වූහ.

2156. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් කුටජපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**කුටජපුප්ඵියස්ථවිරාපදානය පළමුවැනියි.**

# 182. බන්ධුජීවක ස්ථවිරාපදානය

2157. සියල්ල තෙමේම අවබොධ කළාවූ සත්පුරුෂයන් විසින් වර්ණනා කරණ ලද සිද්ධාර්ථ නම් ඒ බුදුරජහු සමාධියට සමවැදුනාහු පර්වතය අතුරෙහි වැඩ හුන්හ.

2158. ස්වයංජාත විලෙක්හි ජලයෙහි හටගන්නාවූ උතුම් මල් සොයන්නෙම් (ඒ නො දුක) ඉක්බිති ව බඳුවදමල් දිටිමි.

2159. (ඒ මල්) දෝතින් ගෙණ මහාමුනි වූ බුදුරජුන් වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් සිද්ධාර්ථ බුදුරජුන්හට එය පිරිනැමීමි.

2150. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

2061. මෙයින් තුදුස්වන කපෙහි ජනාධිපති වූ සමුද්දකප්ප නම් මහත් බල ඇති සක්විති රජෙක් වීමි.

2162. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් බන්ධුජීවක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**බන්ධුජීවකස්ථවිරාපදානය දෙවැනියි.**

## 183. කොටුම්බරියත්ථෙරාපදානං

2163. කණිකාරං'ව ජොතන්තං නිසින්නං පබ්බතන්තරෙ,
අප්පමෙය්‍යං'ව උදධිං විත්ථතං[1] ධරණිං යථා.

2164. පූජිතං[2] දෙවසඞ්ඝෙන නිසභාජානියං යථා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන උපගච්ඡිං නරුත්තමං.

2165. සත්ත පුප්ඵානි පග්ගය්හ කොටුම්බරසමාකුලං,
බුද්ධස්ස අභිරොපෙසිං **සිඛිනො** ලොකබන්ධුනො.

2166. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං[3],
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2167. ඉතො වීසතිකප්පම්හි **මහානෙලසනාමකො**,
එකො ආසිං[4] මහාතෙජො චක්කවත්තී මහබ්බලො.

2168. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කොටුම්බරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කොටුම්බරියත්ථෙරස්ස අපදානං තතියං.**

## 184. පඤ්චහත්ථියත්ථෙරාපදානං

2169. **තිස්සො** නාමාසි භගවා ලොකජෙට්ඨො නරාසභො,
පුරක්ඛතො සාවකෙහි රථියං පටිපජ්ජථ.

2170. පඤ්ච උප්පලහත්ථා ච චතුරො ඨපිතා මයා,
ආහුතිං දාතුකාමොහං පග්ගණ්හිං වතසිද්ධියා[5].

2171. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
බුද්ධරංස්‍යාභිඵුට්ඨොම්හි[6] පූජෙසිං දිපදුත්තමං.

2172. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2173. ඉතො තෙරසකප්පම්හි පඤ්චාසුං සහසම්මතා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2174. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චහත්ථියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චහත්ථියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

---

1. උද්ධතං, PTS. උබ්බතං, සෙ. 2. පූජිතං, මජසං.
3. මභිරොපයිං, මජසං. 4. ආසි, මජසං. 5. ඛිතසිද්ධියා, සයා.
6. බුද්ධරංසීහි ඵුට්ඨොස්මි, මජසං. බුද්ධරංසීහි ඵුට්ඨොම්හි, PTS.

## 183. කොටුම්බරියසථ්විරාවදානය

2163-2164. පණීත අතුරෙහි (පිපුනු) කිණිකිරිරුකක් මෙන් බබලන වැඩහුන්නා වූ පමණ කළ නො හැකි (ජලය ඇති) සයුර මෙන් අපමණ ගුණ ඇති පැතුරුණා වූ පොළොව මෙන් නිශ්චල අතිශ්‍රෙෂ්ඨ ආජානීයයකු මෙන් දිව්‍යසමූහයා විසින් පුදන ලද (සිඛී බුදුරජුන්) දිටිමි. (දැක) සොම්නස් වූයෙම් සතුටු සිතින් නරොත්තම වූ උන්වහන්සේ වෙත එළඹියෙමි.

2165. **කොටුම්බර** නම් වස්ත්‍ර වර්‍ගයෙහි ගැවසී තුබුනු මල් සතක් ගෙණ ලොකබන්ධු වූ බුදුරජානන් වහන්සේට පූජා කෙළෙමි.

2166. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2167. මෙයින් විසිවැනි කපෙහි මහත් බල ඇති **මහානෙල** නම් මහාතෙජස් ඇති එක් සක්විතිරජෙක් වීමි.

2168. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කොටුම්බරිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**කොටුම්බරියසථ්විරාවදානය තෙවැනි යි.**

## 184. පඤ්චහත්ථියසථ්විරාවදානය

2169. ලොවට දෙටු වූ නරශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවත් වූ **තිස්ස** නම් බුදුවරයෙක් විය. (උන්වහන්සේ) සව්වන් විසින් පිරිවරණ ලද්දහු වීථියට පිළිපන් සේක.

2170. මා විසින් උපුල්මල් මිටි පසක් ද හතරක් ද (හෙවත් උපුල් මිටි නවයක්) තබන ලදී. මම (ඒ මල්) ව්‍රතසිද්ධිය සඳහා බුදුරජුන්හට දෙනු කැමැත්තෙම් (තුබූ තැනින්) ගතිමි.

2171. ඇතුළු වීථියෙහි ගමන් කරන්නා වූ සවර්‍ණවර්‍ණ වූ බුදුරජුන් (දිටිමි.) මම බුදුරැසින් මැනවින් පහස්නා ලද්දෙම් ද වෙමි. ද්විපදෙත්තම වූ ඒ බුදුරජුන් පිදීමි.

2172. මෙයින් දෙයානූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2173. මෙයින් තෙළෙස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **උසභ** නම් වූ පස් සක්විති කෙනෙක් වූහ,

2174. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පඤ්චහත්ථිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පඤ්චහත්ථියසථ්විරාවදානය සිවුවැනියි.**

## 185. ඉසිමුග්ගදායකත්ථෙරාපදානං

2175. උදෙන්තං සතරංසිං'ව සීතරංසිං'ව[1] භානුමං,
කකුධං විලසන්තං'ව **පදුමුත්තරනායකං**.

2176. ඉසිමුග්ගානි පිංසෙත්වා[2] මධුඛුද්දෙ අනීළකෙ,
පාසාදෙ'ව ඨිතො සන්තො අදාසිං ලොකබන්ධුනො.

2177. අට්ඨසතසහස්සානි අහෙසුං බුද්ධසාවකා,
සබ්බෙසං පත්තපූරං තං[3] තතො වාපි බහුත්තරං.

2178. තෙන චිත්තප්පසාදෙන සුක්කමූලෙන චොදිතො,
කප්පානං සතසහස්සං දුග්ගතිං නුපපජ්ජහං.

2179. චත්තාරීසම්හි සහස්සෙ කප්පානං අට්ඨතිංස තෙ,
**ඉසිමුග්ග**සනාමා තෙ[4] චක්කවත්තී මහබ්බලා.

2180. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඉසිමුග්ගදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඉසිමුග්ගදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 186. බොධිඋපට්ඨාකත්ථෙරාපදානං

2181. නගරෙ රම්මවතියා ආසිං මුරජවාදකො,
නිච්චුපට්ඨානයුත්තො'ම්හි ගතොහං බොධිමුත්තමං.

2182. සායං පාතං උපට්ඨිත්වා සුක්කමූලෙන චොදිතො,
අට්ඨාරසකප්පසතෙ දුග්ගතිං නුපපජ්ජහං.

2183. පඤ්චදසෙ[5] කප්පසතෙ ඉතො ආසිං ජනාධිපො,
**මුරජො**[6] නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

2184. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බොධිඋපට්ඨාකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බොධිඋපට්ඨාකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 187. එකචින්තිකත්ථෙරාපදානං

2185. යදා දෙවො දෙවකායා චවතෙ ආයුසඞ්ඛයා,
තයො සද්දා නිච්ඡරන්ති දෙවානං අනුමොදතං.

2186. ඉතො භො සුගතිං ගච්ඡ මනුස්සානං සහබ්‍යතං,
මනුස්සභූතො සද්ධම්මෙ ලභ සද්ධම්මනුත්තරං[7].

---

1. වීතරංසිංව, මජසං.
2. පිසෙත්වා, මජසං. සංදිත්වා සෙ. සංදෙත්වා, PTS. ඉසිමුග්ගං හිමතොතත්වා, ස්‍යා
3. පූරෙත්වා, මජසං. PTS. සෙ.
4. මහිසමන්තනාමා, ස්‍යා. PTS සෙ.
5. පඤ්චරසෙ, මජසං.
6. දමකො, ස්‍යා.
7. ලභ සද්ධං අනුත්තරං, මජසං.

## 185. ඉසිමුග්ගදායක ස්ථවිරාවදානය

2175. උදා වන්නා වූ සූර්යයා මෙන් ද, (උදා වූ) අතිශයින් දීප්ත **රැස්** ඇති හිරු මෙන් ද, මල්ගෙඩිදලුවලින් හොබනා කුඹුක්ගසක් මෙන් ද බබලන්නා වූ **පදුමුත්තර** බුදුරජුන් (දිටිමි.)

2176. සෑඹිමුඟ (සෑඹින් පරිභෝග කරණ මුං) අඹරා නිමැසි (මැස්සන් නැති) බුද්දක මධු (කණමී) ද (ගෙණ) පහයෙහි සිටියෙම් ම ලොකබන්ධු වූ බුදුරජුන්හට දුනිමි.

2177. එහි අටලක්ෂයක් බුද්ධශ්‍රාවකයෝ වූහ. ඒ මුං හා මී ඒ හැමදෙනා වහන්සේගේ ම පාත්‍ර පුරාසිටියේ එයිනුදු වැඩිතරම් විය.

2178. ඒ චිත්තප්‍රසාදය හේතුකොටගෙණ කුශල මූලයෙන් මෙහෙයන ලදුයෙම් කල්ප ලක්ෂයක් ඉවුල්ලෙහි (මම) දුගතියක නො උපනිමි.

2179. සතළිස් දහස්වන කපෙහි මහත් බල ඇති **ඉසිමුග්ග** නම් වූ ඒ අටතිස් සක්විති රජකෙනෙක් වූහ.

2180. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ **සසුන** කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ඉසිමුග්ගදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ඉසිමුග්ගදායකස්ථවිරාවදානය පස්වැනියි.**

## 186. බොධිඋපට්ඨාක ස්ථවිරාවදානය

2181 මම **අමරවතී** නගරයෙහි මිහිඟුබෙර වයන්නෙක් වීමි. මම උතුම් බොධිය වෙතට ගියෙම් නිතර උවටැනෙහි යෙදුනෙම් වෙමි.

2182. උදය සවස එළඹ (උවටැන් කොට) ඒ කුශල මූලයෙන් මෙහෙයන ලදුයෙම් එක්දහස් අටසිය කපක් මම දුගතියෙක නො උපනිමි.

2183. මෙයින් එක්දහස් පන්සිය වන කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **මුරජ** නම් සක්විතිරජෙක් වීමි.

2184. සිවුපිළිසිඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **බොධිඋපට්ඨාක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**බොධිඋපට්ඨාකස්ථවිරාවදානය සවැනියි.**

## 187. එකචින්තික ස්ථවිරාවදානය

2185. යම් කලෙක්හි ආයු පිරිහී යෑමෙන් දෙවියෙක් දෙව්ලොවින් චුත වේ ද, (එකල්හි) අනුමෝදනය කරන්නා වූ දෙවියන්ගේ ත්‍රිවිධ ශබ්ද කෙනෙක් පිට ව යෙත්. (කෙසේ ද යත්:)

2186. "පින්වත, මෙයින් ච්‍යුත ව මනුෂ්‍යයන්ගේ සහභාවය වූ සුගතියට යනු මැනව. මිනිස් ව සසුනෙහි උතුම් වූ ශ්‍රද්ධාව ලබව.

2187. සා තෙ සද්ධානිවිට්ඨස්ස[1] මූලජාතා පතිට්ඨිතා,
යාවජීවං අසංහීරා සද්ධම්මෙ සුප්පවෙදිතෙ.

2188. කායෙන කුසලං කත්වා වාචාය කුසලං බහුං,
මනසා කුසලං කත්වා අව්‍යාපජ්ඣං[2] නිරූපධිං.

2189. තතො ඔපධිකං පුඤ්ඤං කත්වා දානෙන තං බහුං,
අඤ්ඤෙපි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසය.

2190. ඉමාය අනුකම්පාය දෙවා දෙවං යදා විදූ,
වචනං අනුමොදන්තා එහි දෙවපුරං පුන[3].

2191. සංවෙගො මෙ[4] තදා ආසි දෙවසඞ්ඝෙ සමාගතෙ,
කං සු නාම අහං යොනිං ගමිස්සාමි ඉතො චුතො.

2192. මම සංවෙගමඤ්ඤාය සමණො භාවිතින්ද්‍රියො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකං.

2193. සුමනො නාම නාමෙන පදුමුත්තරසාවකො,
අත්ථධම්මානුසාසිත්වා සංවෙජෙසි මමං තදා.

2194. තස්සාහං වචනං සුත්වා බුද්ධෙ චිත්තං පසාදයිං,
තං ධීරමභිවාදෙත්වා තත්ථ කාලකතො අහං.

2195. උපපජ්ජිං ස තත්ථෙව සුක්කමූලෙන චොදිතො,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං.

2196. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා එකචින්තිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකචින්තිකත්ථෙරස්ස අපදානං සත්තමං.

## 188. තිකණ්ණිපුප්ඵියත්ථෙරාපදානං

2197. දෙවභූතො අහං සන්තො අච්ඡරාහි පුරක්ඛතො,
පුබ්බකම්මං සරිත්වාන බුද්ධසෙට්ඨමනුස්සරිං.

2198. තිකණ්ණිපුප්ඵං පග්ගය්හ සකං චිත්තං පසාදිය[5],
බුද්ධම්හි අභිරොපෙසිං විපස්සිම්හි නරාසභෙ.

2199. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං[6],
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2200 තෙසත්තතිම්හිතො කප්පෙ චතුරාසුං රමුත්තමා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2201. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා තිකණ්ණිපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තිකණ්ණිපුප්ඵියත්ථෙරස්ස අපදානං අට්ඨමං.

---

1. නිවිට්ඨස්සං, සීමු. 2. අබ්‍යාපජ්ජං, මජසං. අව්‍යාපජ්ජං,
3. දෙව පුනප්පුනං, මජසං. 4. සංවිග්ගොහං, සයා. 5. පසාදයිං, මජසං
6. එකනවුතිතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං, මජසං.

2187. "තාගේ ඒ ශ්‍රද්ධා තොමෝ මනා සේ පවසන ලද සද්ධර්මයෙහි බැස-ගත්තී හටගත් මුල් ඇත්තී මැනවින් පිහිටියා දිවි ඇතිතාක් නිශ්චල වේවා.

2188. කයින් ද, වචනයෙන් ද, සිතින් ද, බොහෝ කුසල් කොට නිදුක් වූ (කෙලෙසොපධි රහිත බැවින්) පිරිසිදු වූ-

3189. (ආත්මභාව සම්පත් හා භවභොග සම්පත් උපදනා) ඖපධික වූ ඒ බොහෝ කුසල් ද කොට පරිත්‍යාගයෙන් යුතු ව අනෙක් මිනිසුන් ද බ්‍රහ්මචර්ය සඞ්ඛ්‍යාත සද්ධර්මයෙහි පිහිටුවනු මැනව" කියා යි.

2190. යම් කලෙක නුවණැති දෙවිවරු චුත වන්නා වූ දෙවියා දන ගණිත් ද "දෙව්පුරයට නැවත එනු මැනවැ"යි කියා මේ අනුකම්පාවෙනුදු අනුමොදනය කෙරෙත්.

2191. දිව්‍ය සමූහයා රැස් වූ එකල්හි මට සංවෙගයෙක් ඇති විය. (කෙසේ ද ? යත්:) "මම මෙයින් චුත ව කිනම් යොනියකට (උත්පත්ති වශයෙන්) යන්නෙම් ද" (කියා යි.)

2192-2193. වඩන ලද ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙම මාගේ දුක දන මා ඒ දුකින් ගොඩනගනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේ ය. එකල්හි ඒ පදුමුත්තර බුදුරජානන් වහන්සේගේ සුමන නම් ශ්‍රාවක තෙම අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කොට මා සංවෙගයට පත් කෙළේ ය.

2194. මම උන්වහන්සේගේ වචනය අසා බුදුරජුන් කෙරෙහි සිත පැහැදවීමි. ඒ ප්‍රාඥයන් වහන්සේට අභිවාදනය කොට මම එහි කලුරිය කෙළෙමි.

2195. ඒ මම එ කී කුශල මූලයෙන් මෙහෙයන ලදුයෙම් ඒ දෙව්ලොවෙහි උපනිමි. කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක නො උපනිමි.

2196. සිවුපිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් එකවින්නික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකවින්නිකස්ථවිරාවදානය සත්වැනි යි.**

## 188. තිකණ්ණිපුප්ඵියස්ථවිරාවදානය

2197. දෙව් වූ මම අපසරාවන් විසින් පිරිවරණ ලදුයෙම් පෙර කරණ ලද කර්මය සිහි කොට බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි.

2198. සිහින් මිදිමල් තුණක් ගෙණ සිය සිත පහදවා නරර්ෂභ වූ විපස්සි බුදුරජුන් කෙරෙහි පිදීමි.

2199. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2200. මෙයින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති රමුත්තම නම් සිවු සක්විතිරජ කෙනෙක් වූහ.

2201. සිවුපිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තිකණ්ණිපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිකණ්ණිපුප්ඵියස්ථවිරාවදානය අටවැනි යි.**

## 189. එකචාරියත්ථෙරාපදානං

2202. තාවතිංසෙසු දෙවෙසු මහාඝොසො තදා අහු,
බුද්ධො ච ලොකෙ නිබ්බාති මයං චම්හ සරාගිනො.

2203. තෙසං සංවෙගජාතානං සොකසල්ලසමඞ්ගිනං,
සබලෙන උපත්ථද්ධො අගමං බුද්ධසන්තිකං.

2204. මන්දාරවං ගහෙත්වාන සඞ්ගීතං[1] අභිනිම්මිතං,
පරිනිබ්බානකාලම්හි බුද්ධස්ස අභිරොපයිං.

2205. සබ්බෙ දෙවානුමොදිංසු අච්ඡරායො ච මෙ තදා,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං.

2206. සට්ඨිකප්පසහස්සම්හි ඉතො සොළස තෙ ජනා,
**මහාමල්ලජනා** නාම චක්කවත්තී මහබ්බලා.

2207. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකචාරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකචාරියත්ථෙරස්ස අපදානං නවමං.**

## 190. තිවණ්ටිපුප්ඵියත්ථෙරාපදානං

2208. අභිභූතො පනිජ්ඣන්ති[2] සබ්බෙ සඞ්ගම්ම තෙ මමං[3],
තෙසං නිජ්ඣායමානානං පරිළාහො අජායථ.

2209. **සුනන්දො** නාම නාමෙන බුද්ධස්ස සාවකො තදා,
**ධම්මදස්සිස්ස** මුනිනො ආගච්ඡි මම සන්තිකෙ.

2210. යෙ මෙ බද්ධචරා ආසුං තෙ මෙ පුප්ඵං අදුං තදා,
තාහං පුප්ඵං ගහෙත්වාන සාවකෙ අභිරොපයිං.

2211. සොහං කාලකතො තත්ථ පුනාපි උපපජ්ජහං,
අට්ඨාරසෙ කප්පසතෙ විනිපාතං න ගච්ඡහං.

2212. තෙරසෙතො කප්පසතෙ අට්ඨාසුං **ධූමකෙතුනො**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2213. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිවණ්ටිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිවණ්ටිපුප්ඵියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

කුටජො බන්ධුජීවී ච කොටුම්බරිකහත්ථියො
ඉසිමුග්ගො ච බොධී ච එකචින්තී තිකණ්ණිකො
එකචාරී තිවණ්ටී ච ගාථා ද්වාසට්ඨි කිත්තිතා.

**කුටජපුප්ඵියවග්ගො එකූනවීසතිමො.**

---

1. සඞ්ගීතා, මජ්සං. සඞ්ගීතං, ස්‍යා. 2. අභිභූං වොපනිජ්ඣන්ති, PTS.
3. අභිභූං ථෙරං පනිජ්ඣාම සබ්බෙ සඞ්ගම්ම තෙ මයං, ස්‍යා.

## 189. ඒකචාරියසථවිරාවදානය

2202. එකල්හි තව්තිසා වැසි දෙවියන් අතර මහත් ඝෝෂයක් විය. (කෙසේද ? යත්:) "බුදුරජානන් වහන්සේ ලොකයෙහි පිරිනිවන් පානා සේක. අපිදු (මේ තාක්ම) රාග සහිතයෝ වමු" (කියා සි).

2203. සංවෙගයට පත් ශොක නමැති උල් ඇනුනු ඒ (දෙවියන් අතුරෙන්) මම චිත්ත බලයෙන් දුඃඛ වූයෙමි බුදුරජුන් සමීපයට ගියෙමි.

2204. මවන ලද සියුම් වූ මඳාරා (මල්) ගෙණ පිරිනිවන් පාන වේලෙහි බුදුරජුන්හට පිදීමි.

2205. එකල්හි සියලු දෙවියෝ ද අප්සරාවෝ ද මාගේ පිණ අනු-මෝදන් වූහ. (ඒ හේතුවෙන්) මම කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක් නො දනිමි.

2206. මෙයින් සැටදහස්වන කපෙහි මහත් බල ඇති මහාමල්ලජන නම් සොලොස් සක්විති රජ කෙනෙක් වූහ.

2207. සිවුපිළිසැඹියාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් ඒකචරිය සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ඒකචරියසථවිරාවදානය නවවැනි සි.**

## 190. තිවණ්ණිපුප්ඵියසථවිරාවදානය

2208. ඒ සියල්ලෝ රුස් වැ සොවින් මැඩුනෝ ලං වැ මා දෙස බලත්. එසේ ලං වැ බලන ඔවුන්හට සිත්හි දුර්වල ඇති විය.

2209. එකල්හි ධම්මදස්සී බුදුරජානන් වහන්සේගේ සුනන්ද නම් ශ්‍රාවක තෙමේ මා වෙත පැමිණියේ ය.

2210. එදා යම් කෙනෙක් මාගේ සහචරයෝ වූ හු ද, ඔවුහු මට මල් දුන්නාහු ය. මම ඒ මල් ගෙණ (සුනන්ද නම්) ශ්‍රාවකයන් වහන්සේ කෙරෙහි පිදීමි.

2211. (ඉක්බිති) කලුරිය කළා වූ මම ඒ දෙව්ලොවෙහි ම උපනිමි. කප් එක්දහස් අටසියයක් ම දුගතියකට නො ගියෙමි.

2212. මෙයින් එක්දහස් තෙසියවන කපෙහි සත්රුවනින් අංග්‍ය වූ මහත් බල ඇති ධූමකෙතු නම් අට සක්විති කෙනෙක් වූහ.

2213. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් තිවණ්ණිපුප්ඵිය සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තිවණ්ණිපුප්ඵියසථවිරාවදානය දසවැනි සි.**

උද්දානය:

කුටජ බන්ධුජීවි - කොටුම්බරික හත්‍ථිය
ඉසිමුග්ග බොධි ද - ඒකචින්තී තිකණ්ණික ද
ඒකචාරී තිවණ්ණී දස - දෙසැට ගයෙකින් බැඳියේ.

**කුටජපුප්ඵියවග්ගය එකූන්විසිවැනි සි.**

## 191. තමාලපුප්ඵියත්ථෙරාපදානං

2214. චුල්ලාසීතිසහස්සානි ථම්භා සොවණ්ණමයා අහු,
දෙවලට්ඨිපටිභාගං විමානං මෙ සුනිම්මිතං.

2215. තමාලපුප්ඵං පග්ගය්හ විප්පසන්නෙන චෙතසා,
බුද්ධස්ස අභිරොපෙසිං සිඛිනො ලොකබන්ධුනො.

2216. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2217. ඉතො වීසතිමෙ කප්පෙ චන්දතිත්තොති එකකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2218. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තමාලපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තමාලපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 192. තිණසන්ථරදායකත්ථෙරාපදානං*

2219. යං දායවාසිකො[1] ඉසි තිණං ලායති සත්ථුනො,
සබ්බෙ පදක්ඛිණාවත්තා[2] පුථව්‍යා[3] නිපතිංසු තෙ.

2220. තමහං තිණමාදාය සන්ථරිං ධරණුත්තමෙ,
තීණෙව තාලපත්තානි ආහරිත්වානහං තදා.

2221. තිණෙන ඡදනං කත්වා සිද්ධත්ථස්ස අදාසහං,
සත්තාහං ධාරයුං තස්ස සත්ථුනො දෙවමානුසා.

2222. චතුනවුතෙ ඉතො කප්පෙ යං තිණං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි තිණදානස්සිදං ඵලං.

2223. පඤ්චසට්ඨිම්හිතො කප්පෙ චත්තාරොසුං මහද්ධනා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2224. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිණසන්ථරදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිණසන්ථරදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

* තිණසන්ථාරකත්ථෙර අපදානං, මජ්ඣං.
1. යදා වනවාසී, මජ්ඣං.
2. සබ්බෙ පදක්ඛිණාවණ්ණටා, මජ්ඣං. 3. පඨව්‍යා, මජ්ඣං.

## 191. තමාලපුප්ඵියස්ථවිරාපදානය

2214. මට කප්රුකක් (දිව්‍යවෘක්ෂයක්) වැනි විමනක් මැනවින් මැවිනා. එහි ස්වර්ණමය වූ සූවාසූදහසක් ස්තම්භයෝ වූහ.

2215. තමළු මලක් ගෙණ පහන් සිතින් ලොකබන්ධු වූ සිඛී බුදුරජුන්හට පිදීමි.

2216. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2217. මෙයින් විසිවෙනි කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති චන්ද්‍රතිත්ත නම් සක්විති රජෙක් විමි.

2218. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තමාලපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි·

**තමාලපුප්ඵියස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 192. තිණසන්ථරදායකස්ථවිරාපදානය

2219. වන වැසි තවුසෙක් බුදුරජානන් වහන්සේට (සෙවෙනියක් කරණු පිණිස) යම් තෘණයක් කපා ද, ඒ සියලු තෘණ දක්ෂිණාවර්ත වැ පොළොවෙහි වැටිනා.

2220. මම් ඒ තෘණ ගෙණ වැඩ වසන ඒ උතුම් බිම ඇතිරීමි. එකල්හි මම තල්පත් තුණක් ද ගෙණ අවුත්,

2221. සිද්ධාර්ථ බුදුරජුන්හට තෘණයෙන් සෙවෙනියක් කොට දිනිමි. දෙවිමිනිස්සු (සමවතින් හුන්) ශාස්තෲන් වහන්සේට සතියක් ම එය දැරූහ.

2222. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එ දවස් යම් තණ (සෙවෙනි-යක්) දිනිම් ද ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. තණ (සෙවෙනි) දනෙහි මේ විපාකය යි.

2223. මෙයින් පන්සැටවන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති මහද්ධන නම් සිවු සක්විති රජ කෙනෙක් වූහ.

2224. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තිණසන්ථරදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තිණසන්ථරදායකස්ථවිරාපදානය දෙවැනි යි.**

## 193. ඛණ්ඩඵුල්ලියත්ථෙරාපදානං

2225. **ඵුස්සස්ස** ඛො භගවතො ථූපො ආසි මහාවනෙ,
කුඤ්ජරෙහි තදා භින්නො පරූළ්හපාදපො[1] තහිං.

2226. විසමඤ්ච සමං කත්වා සුධාපිණ්ඩං අදාසහං,
තිලොකගරුනො තස්ස ගුණෙහි පරිතොසිතො.

2227. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි සුධාපිණ්ඩස්සිදං ඵලං.

2228. සත්තසත්තතිකප්පම්හි **ජිතසෙනා**සුං සොළස,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2229. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඛණ්ඩඵුල්ලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඛණ්ඩඵුල්ලියත්ථෙරස්ස අපදානං තතියං.**

## 194. අසොකපූජකත්ථෙරාපදානං

2230. **තිවරායං**[2] පුරෙ රම්මෙ රාජුය්‍යානමහූ තදා,
උය්‍යානපාලො තත්ථාසිං රඤ්ඤො බන්ධවරො අහං.

2331. **පදුමො** නාම නාමෙන සයම්භූ සප්පභො අහු,
නිසින්නං පුණ්ඩරීකම්හි ඡායා න ජහි තං මුනිං.

2232. අසොකං පුප්ඵිතං දිස්වා පිණ්ඩිභාරං සුදස්සනං,
බුද්ධස්ස අභිරොපෙසිං ජලජුත්තමනාමිනො.

2233. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2234. සත්තතිංසම්හිතො කප්පෙ සොළස **අරුණඤ්ජහා**[3],
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2235. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අසොකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අසොකපූජකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

---

1. පරූළ්හා පාදපො, මජ්ඣසං, සංරූළ්හා පාදපො PTS. සෙ.
2. තිවරායං, මජ්ඣසං. තිපුරායං, ස්‍යා. 3. අරණඤ්ජහා මජ්ඣසං.

## 193. ඛණ්ඩඵුල්ලියසථවිරාවදානය

2225. මහවෙනෙහි **ඵුස්ස** භාග්‍යවතුන් වහන්සේගේ ස්තූපයක් විය. එය එ කල්හි ඇතුන් විසින් බිඳින ලද්දේ වැඩුනු ගස් ඇත්තේ ද විය.

2226. ඒ තිලෝගුරු වූ බුදුරජානන් වහන්සේගේ ගුණයෙන් සතුටු වූ මම (ඒ සෑයෙහි) විසමතැන් සම කොට සුණුපිඩු දිනිමි. (සුණුපිරියම් කෙළෙමි.)

2227. මෙයින් දෙයානූවන කපෙහි වූ එ දවස යම් පිළිසකරක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සුණු පිඩු දනෙහි මේ විපාකය යි.

2228. සත්සැත්තෑවන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති **ජිතසෙන** නම් සොළොස් සක්විති රජ කෙනෙක් වූහ.

2229. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඛණ්ඩඵුල්ලිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ඛණ්ඩඵුල්ලියසථවිරාවදානය තෙවැනි යි.**

## 194. අසොකපූජකසථවිරාවදානය

2230. එකල්හි රම්‍ය වූ **තිවරා** පුරයෙහි රාජෝද්‍යානයක් විය. මම එහි රජුගේ සහචර වූ උයන්පල්ලෙක් වීමි.

2231. නමින් **පදුම** නම් වූ ප්‍රභාසහිත සම්බුදු වරයෙක් විය. හෙළ පියුමෙහි සෙවන වැඩහුන් ඒ බුදුරජුන් නො හළේය.

2232. පිපුනු දළුකුම්කළ අශොක ගසක් දැක (එයින්) මල්පොකුරක් පදුම නම් වූ බුදුරජානන් වහන්සේට පිදීමි.

2233. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2234. මෙයින් සත්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අරුණඤ්ජහ** නම් සොළොස් සක්විති රජ කෙනෙක් වූහ.

2235. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අසොකපූජක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**අසොකපූජකසථවිරාවදානය සිවුවැනි යි.**

## 195. අඞ්කොලකත්ථෙරාපදානං

2236. අඞ්කොලං පුප්ඵිතං දිස්වා මාලාවරං සකොසකං[1],
ඔචිනිත්වාන තං පුප්ඵං අගමං බුද්ධසන්තිකං.

2237. **සිද්ධත්ථො** තම්හි සමයෙ පටිලීනො[2] මහාමුනී,
මුහුත්තං පතිමානෙත්වා ගුහායං පුප්ඵමොකිරිං.

2238. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං[3] ඵලං.

2239. ඡත්තිංසම්හි ඉතො කප්පෙ ආසෙකො **දෙවගජ්ජිතො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2240. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අඞ්කොලකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අඞ්කොලකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 196. කිසලයපූජකත්ථෙරාපදානං

2241. නගරෙ **ද්වාරවතියා** මාලාවච්ඡො මමං අහු,
උදපානො ච තත්ථෙව පාදපානං විරොහනො.

2242. සබලෙන උපත්ථද්ධො **සිද්ධත්ථො** අපරාජිතො,
මමානුකම්පමානො සො ගච්ඡතෙ අනිලඤ්ජසෙ.

2243. අඤ්ඤං කිඤ්චි න පස්සාමි පූජායොග්ගං මහෙසිනො,
අසොකපල්ලවං දිස්වා ආකාසෙ උක්ඛිපිං අහං.

2244. බුද්ධස්ස තෙ කිසලයා ගච්ඡතො යන්ති පච්ඡතො,
සොහං දිස්වාන තං ඉද්ධිං[4] අහො බුද්ධස්සුළාරතා.

2245. චතුන්නවුතෙ ඉතො කප්පෙ පල්ලවං අභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2246. සත්තවීසෙ[5] ඉතො කප්පෙ එකො **එකස්සරො**[6] අහු,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2247. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කිසලයපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කිසලයපූජකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

---

1. සමොගමං, ස්‍යා.
2. පතිලීනො, මජසං.
3. පුප්ඵදානස්සිදං ඵලං, මජසං.
4. තාහං දිස්වාන සංවිජිං, මජසං.
5. සත්තතිංසෙ, මජසං.
6. එකිස්සරො, මජසං.

## 195. අඬකාලකසථවිරාවදානය

2236. පිපුනු රුකඟුන ගසක් දැක එහි උතුම් මල් කොපු සහිතව ම නෙලා ඒ මල් ගෙණ (**සිද්ධාර්ථ**) බුදුරජුන් වෙත ගියෙමි.

2237. එ සමයෙහි මහාමුනි වූ **සිද්ධාර්ථ** බුදුරජහු විවේක සුවයෙන් හුන්හ. (මම උන්වහන්සේට) මොහොතක් බුහුමන් දක්වා ඒ මල් ගුහාවෙහි විසිරු වීමි.

2238. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2239. මෙයින් සතිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **දෙවගජ්ජිත** නම් එක් සක්විති රජෙක් විය.

2240· සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ.

මෙහි මේ අයුරින් ආයුෂමත් **අඬකාලක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**අඬකාලකසථවිරාවදානය පස්වැනි යි.**

## 196. කිසලයපූජකසථවිරාවදානය

2241. **ද්වාරවතී** නගරයෙහි මාගේ පුෂ්පොද්‍යානයෙක් විය. ගස්වල වැඩීමට ජලය සපයන ළිඳෙක් ද එහිම විය.

2242. සවබලයෙන් නහවුරු බවට පත් පස්මරුන් දිනූ ඒ **සිද්ධාර්ථ** බුදුරජහු මට අනුකම්පා කරණුවෝ අහස් මගෙහි වඩිති.

2243. මහර්ෂීන් වහන්සේට පිදීමට සුදුසු අන් කිසිවක් නො දකිමි. මම හෝපළු (දලු) දැක එය ගෙණ අහසෙහි දැමීමි.

2244. ඒ අසොක පල්ලවයෝ වඩින්නා වූ බුදුරජුන් පසුපසින් යෙත්. මම ඒ විසමය දැක "බුදුරජානන් වහන්සේගේ උදාරබව ආශ්චර්‍ය්‍යයැ" යි සිතීමි.

2245 මෙයින් සිවුඅනූවන කපෙහි යම් හෝපළු පිදීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මෙ විපාකය යි.

2246. මෙයින් සත්විසිවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **එකාසාර** නම් සක්විති රජෙක් වීමි.

2247. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කිසලයපූජක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කිසලයපූජක සථවිරාවදානය සවැනියි.**

## 197. තින්දුකදායකත්ථෙරාපදානං

2248. ගිරිදුග්ගචරො ආසිං මක්කටො ථාමවෙගිකො,
ඵලිතං තින්දුකං දිස්වා බුද්ධසෙට්ඨං අනුස්සරිං.

2249. නික්ඛමිත්වා කතිපාහං විචිනිං ලොකනායකං,
පසන්නචිත්තො සුමනො සිද්ධත්ථං තිභවන්තගුං.

2250. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
ඛීණාසවසහස්සෙහි ආගච්ඡි මම සන්තිකං.

2251. පාමොජ්ජං ජනයිත්වාන ඵලහත්ථො උපාගමිං,
පටිග්ගහෙසි භගවා සබ්බඤ්ඤූ වදතං වරො.

2252. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

2253. සත්තපඤ්ඤාසකප්පම්හි උපනන්ද සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2254. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තින්දුකදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තින්දුකදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 198. මුට්ඨිපූජකත්ථෙරාපදානං

2255. සුමෙධො නාම භගවා ලොකජෙට්ඨො නරාසභො,
පච්ඡිමෙ අනුකම්පාය පධානං පදහී ජිනො.

2256. තස්ස චඞ්කමමානස්ස දිපදින්දස්ස තාදිනො,
ගිරිනෙලස්ස පුප්ඵානං මුට්ඨිං බුද්ධස්ස රොපයිං.

2257. තෙන චිත්තප්පසාදෙන සුක්කමූලෙන චොදිතො,
තිංසකප්පසහස්සානි දුග්ගතිං නූපපජ්ජහං.

2258. තෙවීසතිකප්පසතෙ සුනෙලො නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො එකො ආසිං මහබ්බලො.

2259. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මුට්ඨිපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**මුට්ඨිපූජකත්ථෙරස්ස අපදානං අ   මං.**

## 197. තින්දුකදායකස්ථවිරාවදානය

2248. මම ජවවේගයෙන් යුත් ගිරිදුර්ගයන්හි හැසිරෙන වඳුරෙක් වීමි. (එකල්හි) ගෙඩි හටගත් තිඹිරි ගසක් දැක බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි පත් කෙළෙමි.

2249. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ත්‍රිභවාන්තගත **සිද්ධාර්ථ** බුදුරජුන් කිහිපදිනක් ම සෙවිමි.

2250. ලොකයෙහි නිරුත්තර ශාස්තෘ වූ ඒ සිද්ධාර්ථ බුදුරජුහු මාගේ අදහස දැන රහතුන් දහසක් සමග මා වෙත වැඩියහ.

2251. සතුට උපදවා ඒ තිඹිරිගෙඩි ගත් ඇතැතිව (බුදුරජුන් වෙත) එළඹියෙමි. ශ්‍රෙෂ්ඨ සර්වඥ වූ භාග්‍යවත්හු එය පිළිගත්හ.

2252. මෙයින් සිවු අනූවන කපෙහි වූ එකල්හි යම් ඵලදානයක් දුනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාකය යි.

2253. සත්පණස්වන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති **උපනන්ද** නම් සක්විති රජෙක් වීමි.

2254. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තින්දුකදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තින්දුකදායක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 198. මුට්ඨිපූජකස්ථවිරාවදානය

2255. පස්මරුන් දිනූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරසීහ වූ **සුමෙධ** නම් භගවත්හු පශ්චිම ජනානුකම්පාවෙන් ප්‍රධන්වීර්‍ය්‍ය වැඩූහ.

2256. (දවසෙක) සක්මන්හි යෙදෙන ද්විපදෙත්තම වූ තාදිගුණ ඇති ඒ බුදුරජුන්හට ගිරිනිල් මල්මිටක් පිදීමි.

2257. ඒ චිත්තප්‍රසාදයෙන් කළ කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙම් කප් තිස්දහසක් මුළුල්ලෙහි දුගතියක නූපනිමි.

2258. දෙදහස් තුන්සිය වන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති **සුනෙල** නම් සක්විති රජෙක් වීමි.

2259. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මුට්ඨිපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**මුට්ඨිපූජකස්ථවිරාවදානය අටවැනි යි.**

## 199. කිඞ්කණිපුප්ඵියත්ථෙරාපදානං[1]

2260. **සුමඞ්ගලොති** නාමෙන සයම්භූ අපරාජිතො,
පවනා නික්ඛමිත්වාන නගරං පාවිසී ජිනො.

2261. පිණ්ඩචාරං චරිත්වාන නික්ඛම්ම නගරා මුනි,
කතකිච්චොව සම්බුද්ධො සො වසී වනමන්තරෙ.

2262. කිඞ්කණිපුප්ඵං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං,
පසන්නචිත්තො සුමනො සයම්භුස්ස මහෙසිනො.

2263. චතුනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2264. ඡළාසීතිම්හිතො කප්පෙ **අපිලාපිය**[2] නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2265. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කිඞ්කණිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කිඞ්කණිපුප්ඵියත්ථෙරස්ස** අපදානං නවමං.

## 200. යූථිකාපුප්ඵියත්ථෙරාපදානං[3]

2266. **පදුමුත්තරො** නාම ජිනො ආහුතීනං පටිග්ගහො,
පවනා නික්ඛමිත්වාන විහාරං යාති චක්ඛුමා.

2267. උභො හත්ථෙහි පග්ගය්හ යූථිකං පුප්ඵමුත්තමං,
බුද්ධස්ස අභිරොපෙසිං මෙත්තචිත්තස්ස තාදිනො.

2268. තෙන චිත්තප්පසාදෙන අභිභොත්වාන සම්පදා,
කප්පානං සතසහස්සං දුග්ගතිං නූපපජ්ජහං.

2269. ඉතො පඤ්ඤාසකප්පෙසු එකො ආසිං ජනාධිපො,
**සමිත්තනන්දනො** නාම චක්කවත්තී මහබ්බලො.

2270. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **යූථිකාපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**යූථිකාපුප්ඵියත්ථෙරස්ස** අපදානං දසමං.

---

1. කිංකණිකපුප්ඵියත්ථෙරාපදානං, මජසං. 2. අපිලාසිය, මජසං.
3. යූථිකපුප්ඵියත්ථෙරාපදකං, මජසං.

## 199. කිඞ්කණිපුප්ඵිය ස්ථවිරාවදානය

2260. සියල්ල තමන්ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ අපරාජිත වූ සුමඞ්ගල බුදුරජහු විහාරයෙන් නික්ම නුවරට පිවිසියහ.

2261. කොට නිම වූ සියලු බුදුකිස ඇති සවීඥ මුනිහු පිඩු පිණිස හැසිර නුවරින් නික්ම වනතුරෙහි වුසූහ.

2262. (එ දවස්) පහන් සිත් ඇත්තෙම් සතුටු වූයෙම් කිඞ්කණි පුෂ්පයන් ගෙණ සියල්ල තමන්ම දතුවා වූ මහර්ෂි වූ බුදුරජුන්හට එළැවීමි.

2263. මෙයින් සිවූ අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙලෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2264. මෙයින් සඅනූවන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති අපිලාපිය නම් සක්විති රජෙක් වීමි.

2265. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් කිඞ්කණිපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කිඞ්කණිපුප්ඵිය ස්ථවිරාවදානය නවවැනි යි.**

## 200. යූථිකාපුප්ඵිය ස්ථවිරාවදානය

2266. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පස්මරුන් ජයගත් පසැස් ඇති පදුමුත්තර බුදුරජහු වනයෙන් නික්ම විහාරයට වඩිති.

2267. උතුම් සීනිද්ද මල් ඉෑතින් ගෙණ මෙත්සිත් ඇති තාදී ගුණ යුත් බුදුරජුන් පිදීමි.

2268. ඒ චිත්තප්‍රසාදයෙන් සම්පත් අනුභව කොට මම කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියක නො උපනිමි.

2269. මෙයින් පණස්වෙනි කපෙහි මහත් බල ඇති ජනාධිපති වූ සමිත්තනන්දන නම් සක්විති රජෙක් වීමි.

2270. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් යූථිකාපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**යූථිකාපුප්ඵිය ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානං:

තමාලී තිණසන්ථාරො ඛණ්ඩඵුල්ලී අසොකියො
අඞ්කොලකී කිසලයො තින්දුකො නෙලපුප්ඵියො
කිඞ්කණිකො යූථිකො ච ගාථා පඤ්ඤාස අට්ඨ ච.

**තමාලපුප්ඵියවග්ගො වීසතිමො.**

අථ වග්ගුද්දානං:

භික්ඛාදායී පරිවාරො සෙරෙය්‍යො සොභිතො තථා
ඡත්තො ච බන්ධුජීවො ච[1] සුපාරිචරියොපි ච
කුමුදෙ කුටජො චෙව තමාලි දසමො කතො.
ඡසත්තාති ච ගාථානං ඡසට්ඨි ච තදුත්තරිං.

**භික්ඛාවග්ගදසකං.**

**දුතියං සතකං සමත්තං.**

---

## 201. කණිකාරපුප්ඵියත්ථෙරාපදානං

2271. කණිකාරං පුප්ඵිතං දිස්වා ඔච්චිනිත්වානහං තදා,
තිස්සස්ස අභිරොපෙසිං ඔඝතිණ්ණස්ස තාදිනො.

2272. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2273. පඤ්චතිංසෙ ඉතො කප්පෙ අරුණපාණීති විස්සුතො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2274. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කණිකාරපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කණිකාරපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 202. මිනෙලපුප්ඵියත්ථෙරාපදානං

3275. සුවණ්ණවණ්ණො භගවා සතරංසී පතාපවා.
චඞ්කමනං සමාරූළ්හො මෙත්තචිත්තො සිඛීසභො.

2276. පසන්නචිත්තො සුමනො වන්දිත්වා[2] ඤාණමුත්තමං,
මිනෙලපුප්ඵං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

2277. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

---

1. ඡත්තඤ්ච බන්ධුජීවඤ්ච, මජසං. 2. ථොමෙත්වා, ස්‍යා.

උද්දානය:

තමාලී තිණසන්ථාර - ඛණ්ඩඵුල්ලි අසොකිය
අඞ්කොලකී කිසලය - තින්දුක නෙලපුප්ඵිය
කිඞ්කණික යූථික ද යි - දසවත් අටපණස් ගී.

**තමාලපුප්ඵිය වර්ගය විසිවැනියි.**

යලි වගෙහි උද්දානය:

භික්ඛාදායී පරිවාර - සෙරෙය්‍ය සොභිත සහ
ඡත්ත බන්ධුජීව - සුපාරිචරිය ද
කුමුද කුටජ සහ - තමාලීවග දැයි දස
සසිය සසැට ගයෙකි - ඉන් වැඩියෙකුදු වේ ම ය.

**භික්ඛාවර්ගදශකය යි.**

**ද්විතීය ශතකය සමාප්තයි.**

---

## 201. කණිකාරපුප්ඵිය ස්ථවිරාපදානය

2271. මම එකල්හි පිපුණු කිණිහිරි රුකක් දැක චතුරොඝයන් තරණය කළා වූ තාදී ගුණ ඇති තිස්ස බුදුරජානන් වහන්සේට (ඒ මල් නෙලා) පිදීමි.

2272. මෙයින් දෙඅනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි·

2273. මෙයින් පන්තිස්වන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති **අරුණපාණි** යැ යි ප්‍රකට වූ සක්විති රජෙක් වීමි.

2274. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **කණිකාරපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කණිකාරපුප්ඵිය ස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 202. මිනෙලපුප්ඵිය ස්ථවිරාපදානය

2275. හිරු මෙන් ප්‍රතාපවත් වූ සුවර්ණවර්ණ වූ මෙත් සිත් ඇති සිඛී භාග්‍යවත්හු සක්මනට නැගුනාහ.

2276. එ දවස් මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ශ්‍රෙෂ්ඨඥත ඇති බුදුරජුන්හට වැඳ මිනෙල පුෂ්පයක් ගෙණ (එම) බුදුරජුන්හට පිදීමි.

2277. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2278. එකූනතිංසෙ කප්පම්හි සුමෙඛයසො[1] නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2279. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මිනෙලපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මිනෙලපුප්ඵියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 203. කිඞ්කිණිකපුප්ඵියත්ථෙරාපදානං*

2280. කඤ්චනග්ඝියසඞ්කාසො සබ්බඤ්ඤූ ලොකනායකො,
ඔදකං දහමොග්ගය්හ සිනායි ලොකනායකො.

2281. පග්ගය්හ කිඞ්කිණිං[2] පුප්ඵං **විපස්සිස්සා**භිරොපයිං,
උදග්ගචිත්තො සුමනො ද්විපදින්දස්ස තාදිනො.

2282. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2283. සත්තවීසතිකප්පම්හි රාජා **භීමරථො** අහු,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2284. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කිඞ්කිණිකපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කිඞ්කිණිකපුප්ඵියත්ථෙරස්ස අපදානං තතියං.**

## 204. තරණියත්ථෙරාපදානං

2285. **අත්ථදස්සී** තු භගවා ද්විපදින්දො නරාසභො,
පුරක්ඛතො සාවකෙහි ගඞ්ගාතීරමුපාගමි.

2286. සමතිත්තිකා කාකපෙය්‍යා ගඞ්ගා ආසි දුරුත්තරා,
උත්තාරයිං භික්ඛුසඞ්ඝං බුද්ධං ච ද්විපදුත්තමං.

2287. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි තරණාය ඉදං ඵලං.

2288. තෙරසෙතො කප්පසතෙ පඤ්ච **සබ්බොභාගවා**[3] අහුං,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

1. සුමෙඝඝන නාමකො, මජසං. * කිඞ්කණිපුප්ඵියත්ථෙරාපදානං, මජ්ඣං.
2. කිඞ්කණිං, මජසං. 3. සබ්බොහවා, මජ්ඣං.

2278. එකුන්තිස්වන කපෙහි සත්රුවනින් ආඪ්‍ය වූ මහත්බල ඇති **සුමෙඛයස** නම් වූ සක්විති රජෙක් වීමි.

2279. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මිනෙලපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**මිනෙලපුප්ඵිය ස්ථවිරාවදානය දෙවැනි සි.**

## 203. කිඞ්කිණිකපුප්ඵියස්ථවිරාවදානය

2280 රන් ඇගෑවක් මෙන් බබලන සම්බුදු වූ ලොකනායක බුදුරජ තෙමේ සිසිල් දිය සහිත විලකට බැස ජලස්නානය කෙළේය.

2281. මම කිඞ්කිණික මල් ගෙණ ඔදවැඩි සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ද්විපදොත්තම වූ තාදීගුණ ඇති **විපස්සී** බුදුරජුන්හට පිදීමි.

2282. මෙයින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සි.

2283. සත්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **භීමරථ** නම් සක්විති රජෙක් වීමි.

2284. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කිඞ්කිණිකපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සෙක් සි.

**කිඞ්කිණිකපුප්ඵිය ස්ථවිරාවදානය තෙවැනි සි.**

## 204. තරණියස්ථවිරාවදානය

2285. ද්විපදොත්තම වූ නරශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවත් **අත්ථදස්සී** බුදුරජානන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවරණ ලදසේක් ගංතෙරට එළඹි සේක.

2286. මම මුවවිට දක්වා සමව පිරුණු කපුටුවනට පවා ඉවුරෙහි සිට පැන් පානය කළ හැකි සේ දියෙන් පිරී ගිය තරණය කොට එතර යාම දුෂ්කර වූ (ඒ ගඟින්) ද්විපදොත්තම වූ බුදුරජුන් ද භික්ෂු සඞ්ඝයා ද එතර කරවීමි

2287. එක්දහස් අටසියවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. (ගඟින්) තරණය කරවීමෙහි මේ විපාකය සි.

2288. මෙයින් එක්දහස් තෙසියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සබ්බොභාගවා** නම් පස් සක්විති රජකෙනෙක් වූහ.

2289. පච්ඡිමෙ ච භවෙ අස්මිං ජාතො'හං බ්‍රාහ්මණෙ කුලෙ,
සද්ධිං තීහි සහායෙහි පබ්බජිං සත්ථුසාසනෙ.

පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තරණියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තරණියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 205. නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරාපදානං

2290. **විපස්සිස්ස** භගවතො ආසිමාරාමිකො අහං,
නිග්ගුණ්ඩිපුප්ඵං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

2291. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2292. පඤ්චතිංසෙ ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො,
**මහාපතාපො** නාමෙන[1] චක්කවත්තී මහබ්බලො.

2293. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නිග්ගුණ්ඩිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 206. උදකදායකත්ථෙරාපදානං

2294. භුඤ්ජන්තං සමණං දිස්වා විප්පසන්නමනාවිලං,
ඝටෙනො'දකමාදාය **සිද්ධත්ථස්ස** අදාසහං.

2295. නිම්මලො හොම'හං අජ්ජ විමලො ඛීණසංසයො,
භවෙ නිබ්බත්තමානම්හි ඵලං නිබ්බත්තතෙ සුභං.

2296. චතුනවුතෙ ඉතො කප්පෙ උදකං යං තදා අදං[2],
දුග්ගතිං නාභිජානාමි උදකදානස්සිදං ඵලං.

2297. එකසට්ඨිම්හිතො කප්පෙ එකොව **විමලො** අහුං,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2298. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උදකදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උදකදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

1. මහාපතාපනාමෙන, මජසං. 2. උදකං යමදාසහං, මජසං.

2289. මම මේ පශ්චිම භවයෙහි බමුණු කුලයෙහි උපනිමි. යහළුවන් තිදෙනකු සමග ශාස්තෘශාසනයෙහි පැවිදි වීමි.

සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තරණීය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තරණීය ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 205. නිගගුණ්ඩිපුප්ඵිය ස්ථවිරාවදානය

2290. මම **විපස්සි** බුදුරජානන් වහන්සේගේ ආරාමිකයෙක් වීමි. (ඒ මම) නික මල් ගෙණ බුදුරජානන් වහන්සේට **පිදීමි**.

2291. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2292. මෙයින් පන්තිස්වන කපෙහි මහත් බල ඇති ජනාධිපති වූ **මහාපතාප** නම් සක්විති රජෙක් වීමි.

2293. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **නිගගුණ්ඩිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**නිගගුණ්ඩිපුප්ඵිය ස්ථවිරාවදානය පස්වැනියි.**

## 206. උදකදායක ස්ථවිරාවදානය

2294. මම පැහැදුනු ඉඳුරන් ඇති කෙලෙස් කැලඹිලි නැති වළඳන්නා වූ ශ්‍රමණයන් වහන්සේ දැක ඒ **සිද්ධාර්ථ** බුදුරජුන්හට කළයෙන් දිය ගෙණවුත් දුනිමි.

2295. මම අද පහ වූ සැක ඇතියෙම් පිරිසිදු වූයෙම් නිර්මල වූයෙම් වෙමි. (ඒ හෙතුවෙන්) භවයෙහි උපදනා කල්හි යහපත් විපාක ඇති වේ.

2296. මෙයින් සිවු අනූවන කපෙහි වූ එකල්හි යම් ජලදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. උදකදානයාගේ මේ විපාකය යි.

2297. මෙයින් එක් සැටවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **විමල** නම් සක්විති රජෙක් වීමි.

2298. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උදකදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**උදකදායක ස්ථවිරාවදානය සවැනි යි.**

## 207. සළලමාලියත්ථෙරාපදානං

2299. කණිකාරංව ජොතන්තං නිසින්නං පබ්බතන්තරෙ,
ඔභාසෙන්තං දිසා සබ්බා සිද්ධත්ථං නරසාරථිං.

2300. ධනුමද්වෙජ්ඣං කත්වාන උසුං සන්නය්හ'හං තදා,
පුප්ඵං සවණ්ටං ඡෙත්වාන බුද්ධස්ස අභිරොපයිං.

2301. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං[1],
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2302. එකපඤ්ඤාසි'තො කප්පෙ එකො ආසිං **ජුතින්ධරො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2303. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සලලමාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සලලමාලියත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 208. කොරණ්ඩපුප්ඵියත්ථෙරාපදානං

2304. අක්කන්තඤ්ච පදං දිස්වා චක්කාලඞ්කාරභූසිතං,
පදෙනා'නුපදං යන්තො විපස්සිස්ස මහෙසිනො.

2305. කොරණ්ඩං පුප්ඵිතං දිස්වා සමූලං පූජිතං මයා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන අවන්දිං පදමුත්තමං.

2306. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි පදපූජායිදං ඵලං.

2307. සත්තපඤ්ඤාසකප්පම්හි එකො **වීතමලො** අහු,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2308. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කොරණ්ඩපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කොරණ්ඩපුප්ඵියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. **මභිරොපයිං, මජසං.**

## 207. සලලමාලිය ස්ථවිරාවදානය

2299. **කිණිහිරි** රුකක් මෙන් බබලමින් පර්වතයන් අතුරෙහි හුන් සියලු දිගුන් හෙළි කරන්නා වූ **සිද්ධාර්ථ** බුදුරජුන් දිටිමි.

2300. එකල්හි මම දුන්න තිසැක කොට හීය යොදා (විද) නටු ඇතිත මලක් කඩා බුදුරජුන්හට පිදීමි.

2301. මෙයින් සිවු අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2302. මෙයින් එක් පණස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **ජුතිනිධර** නම් සක්විති රජෙක් වීමි.

2303. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාතන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සලලමාලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සලලමාලිය ස්ථවිරාවදානය සවැනි යි.**

## 208. කොරණ්ඩපුප්ඵිය ස්ථවිරාවදානය

2304. සක් ලකුණෙන් බබලන තබන ලද ශ්‍රී පාද සටහන් දැක (මම ඒ) **විපස්සි** බුදුරජුන්ගේ පියවර සටහන් අනුව යන්නෙමි-

2305. පිපුණු කොරණ්ඩ වෘක්ෂයක් දැක සතුටු වූයෙම් මුලසිට ම ඇති ඒ සියලු මල් මා විසින් (බුදුරජුන්හට) පුදන ලදී. සතුටු සිතින් ම උතුම් පා වැන්දෙමි.

2306. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පියවර සටහන් පිදීමෙහි මේ විපාකය යි.

2307. සත්පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **විතමල** නම් එක් සක්විති රජෙක් වීමි.

2308. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාතන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කොරණ්ඩපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**කොරණ්ඩපුප්ඵිය ස්ථවිරාවදානය අටවැනි යි.**

## 209. ආධාරදායකත්ථෙරාපදානං

2309. ආධාරකං මයා දින්නං **සිඛිනො** ලොකබන්ධුනො,
ධාරෙමි පඨවිං[1] සබ්බං කෙවලං වසුධං ඉමං.

2310. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

2311. සත්තවීසෙ ඉතො කප්පෙ අහෙසුං චතුරො ජනා,
**සමන්තවරණා**[2] නාම චක්කවත්තී මහබ්බලා.

2312. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආධාරදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආධාරදායකත්ථෙරස්ස අපදානං නවමං.**

## 210. වාතාතපනිවාරියත්ථෙරාපදානං*

2313. **තිස්සස්ස** තු භගවතො දෙවදෙවස්ස තාදිනො,
එකච්ඡත්තං මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

2314. නිවුතං හොති මෙ පාපං කුසලස්සු'පසම්පදා,
ආකාසෙ ඡත්තං ධාරෙන්ති පුබ්බකම්මස්සිදං ඵලං.

2315. චරිමං වත්තතෙ මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

2316. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං ඡත්තමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඡත්තදානස්සිදං ඵලං.

2317. ද්වෙසත්තතිම්හිතො කප්පෙ අට්ඨාසිංසු ජනාධිපා,
**මහානිදාන**නාමෙන රාජානො චක්කවත්තිනො.

2318. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වාතාතපනිවාරියො*** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වාතාතපනිවාරියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

කණිකාරො මිනෙලඤ්ච කිඞ්කිණී තරණෙන ච
නිග්ගුණ්ඩිපුප්ඵී දකදො සලලො ච කුරණ්ඩකො
ආධාරකොතපවාරී[3] අට්ඨතාළීස ගාථකා.

**කණිකාරපුප්ඵියවග්ගො එකවීසතිමො.**

---

1. පඨවිං, මජසං. 2. සමන්තවරණ, මජසං.
* පාපනිවාරියත්ථෙරාපදානං, මජසං. 3. පාපවාරී, මජසං.

## 209. ආධාරදායක ස්ථවිරාපදානය

2309. ලොකබන්ධු වූ සිඛී බුදුරජුන්හට මා විසින් ආධාරකයක් (පාත්‍රාධාරයක්) පුදන ලදී. මම (ඒ හෙතුවෙන්) ධනය සහිත මේ මුළු පොළොව ම දරමි.

2310. මා විසින් සියලු කෙලෙස් දවන ලදී. සියලු භවයෝ වනසන ලදහ. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරය ද දරමි.

2311. මෙයින් සත්විසිවනු කපෙහි මහත් බල ඇති **සමන්තචරණ** නම් සිවු සක්විති රජකෙනෙක් වූහ.

2312. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ආධාරදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආධාරදායක ස්ථවිරාපදානය නවවැනි යි.**

## 210. වාතාතපනිවාරිය ස්ථවිරාපදානය

2313. දෙවියනට දෙවි වූ තාදී ගුණ ඇති **තිස්ස** බුදුරජුන්හට පැහැදුනු සිතින් එක් ඡත්‍රයක් මා විසින් පුදන ලදී.

2314. ඒ හෙතුවෙන් මාගේ පව් වැළැක්කේ විය. (තමා වෙත) කුශලයන්ගේ පැමිණීම විය. අහසෙහි ඡත්‍ර දරත්. පූර්ව (ඡත්‍රදානමය) කර්මයාගේ මේ විපාකය යි.

2315. (මා විසින්) සියලු භවයෝ නසන ලදහ. මෙය මාගේ අන්තිම භවය යි. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරය ද දරමි.

2316. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් ඡත්‍රදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඡත්‍රදානයාගේ මේ විපාකය යි.

2317. මෙයින් දෙසැත්තෑවන කපෙහි ජනාධිපති වූ **මහානිදාන** නම් අට සක්විති රජකෙනෙක් වූහ.

2318. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **වාතාතපනිවාරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**වාතාතපනිවාරිය ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

කණිකාර මිනෙලි - කිඞකිණි සහ තරණ ද
නිග්ගුණ්ඩිපුප්පී උදකද - සලලකුරණ්ඩක ද ආධාරක
ආතපවාරි යයි දස - අටසාළිස් ගයින් බැඳී.

**කණිකාරපුප්ඵියවර්ගය එක්විසිවැනි යි.**

## 211. හත්ථිදායකත්ථෙරාපදානං

2319. **සිද්ධත්ථස්ස** භගවතො දිපදින්දස්ස[1] තාදිනො,
නාගසෙට්ඨො මයා දින්නො ඊසාදන්තො උරූළ්හවා.

2320. උත්තමත්ථං අනුභොමි සන්තිපදමනුත්තරං,
අග්ගදානං[2] මයා දින්නං සබ්බලොකහිතෙසිනො.

3321. චතුනවුතෙ ඉතො කප්පෙ යං නාගමදදිං[3] තදා,
දුග්ගතිං නාභිජානාමි නාගදානස්සිදං ඵලං.

2322. අට්ඨසත්තතිකප්පම්හි සොළසා'සිංසු ඛත්තියා,
**සමන්තපාසාදිකා** නාම චක්කවත්තී මහබ්බලා.

2323. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **හත්ථිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**හත්ථිදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 212. පානධිදායකත්ථෙරාපදානං

2324. ආරඤ්ඤකස්ස[4] ඉසිනො චිරරත්තතපස්සිනො,
වුද්ධස්ස[5] භාවිතත්තස්ස අදාසිං පානධිං අහං.

2325. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
සබ්බං යානං[6] අනුභොමි පුබ්බකම්මස්සිදං ඵලං.

2326. චතුනවුතෙ[7] ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පානධිස්ස ඉදං ඵලං.

2327. සත්තසත්තති'තො කප්පෙ අට්ඨ ආසිංසු ඛත්තියා,
**සුයානා** නාම නාමෙන චක්කවත්තී මහබ්බලා.

2328. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පානධිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පානධිදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1. ද්විපදින්දස්ස, මජසං. 2. නාගදානං. 3. දන්තමදදිං, සීමු.
4. ආරඤ්ඤිකස්ස, මජසං. 5. ධම්මස්ස, සහා. ක. 6. දිබ්බයානං, මජසං.
7. චතුනෙවුතෙ.

## 211. හත්ථිදායක ස්ථවිරාවදානය

2319. තාදී ගුණ ඇති ද්විපදෙන්තම වූ **සිද්ධාර්ථ** භාග්‍යවතුන් වහන්සේට රාජවාහනයොග්‍ය වූ උඩට නැගුනු මහත් දළ ඇති ඇත්රජෙක් මා විසින් පුදන ලදී.

2320. (ඒ හෙතුවෙන්) නිරුත්තර උත්තමාර්ථය වූ ශාන්තිපදය අනුභව කරමි. සර්වලොකහිතෛෂීන් වහන්සේට මා විසින් අග්‍රදානයක් දෙන ලදී.

2321. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් හස්තිනාගයකු දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. හස්තිනාගයා දන් දීමෙහි මේ විපාකය යි.

2322. අට සැත්තෑවන කපෙහි මහත් බල ඇති **සමන්තපාසාදික** නම් සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

2323. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **හත්ථිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**හත්ථිදායක ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 212. පානධිදායක ස්ථවිරාවදානය

2324. මම බොහෝ කලක් තපස්කම් කළ වෘද්ධ වූ වඩතාලද සිත් ඇති අරණ්‍යෙහි වසන ඍෂිවරයකුහට පාවහනක් දුනිමි.

2325. ද්විපදෙන්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඒ පුණ්‍යකර්ම හෙතුවෙන් සියලු යානයන් (ලබා) පරිභොග කරමි.

2326. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පාවහන් දනෙහි මේ විපාකය යි.

2327. මෙයින් සත්සැත්තෑවනු කපෙහි මහත් බල ඇති **සුයාන** නම් වූ අට සක්විති රජකෙනෙක් වූහ.

2328. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පානධිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පානධිදායක ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 213. සච්චසඤ්ඤකත්ථෙරාපදානං

2329. වෙස්සභූ තම්හි සමයෙ භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
දෙසෙති අරියසච්චානි නිබ්බාපෙන්තො මහාජනං.

2330. පරමකාරුඤ්ඤපත්තොම්හි සමිතිං අගමාසහං,
සොහං නිසින්නකො සන්තො ධම්මමස්සොසිං සත්ථුනො.

2331. තස්සාහං ධම්මං සුත්වාන දෙවලොකමගච්ඡහං,
තිංසකප්පානි දෙවෙසු අවසිං තත්ථහං පුරෙ.

2332. එකතිංසෙ[1] ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි සච්චසඤ්ඤායිදං ඵලං.

2333. ඡබ්බීසම්හි ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො.
**එකඵුසිත**නාමෙන චක්කවත්තී මහබ්බලො.

2334. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සච්චසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සච්චසඤ්ඤකත්ථෙරස්ස අපදානං තතියං.**

## 214. එකසඤ්ඤකත්ථෙරාපදානං

2335. දුමග්ගෙ පංසුකූලිකං ලග්ගං දිස්වාන සත්ථුනො,
අඤ්ජලිං පග්ගහෙත්වාන පංසුකූලං අවන්දිහං[2].

2336. එකතිංසෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2337. පඤ්චවීසෙ ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො,
**අමිතාභො**ති නාමෙන චක්කවත්තී මහබ්බලො.

2338. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකසඤ්ඤකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

---

1. එකත්තිංසෙ මජසං. 2. අවන්දහං.

## 213. සච්චසඤ්ඤක ස්ථවිරාපදානය

2329. එසමයෙහි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද වෙස්සභූ බුදුරජ තෙම කෙලෙස් ගිනි නිවමින් මහාජනයාට ආර්‍යසත්‍යයන් දේශනා කෙරෙයි.

2330. එකල්හි මම අතිශය දුකට පත්වූයෙම් වෙමි. (ඒ බුදුරජුන් දහම් දෙසන) සමාගමයට ගියෙමි. එහි හුන් මම බුදුරජුන්ගේ ධර්මය ඇසීමි.

2331. මම උන්වහන්සේගේ ධර්මය අසා දෙව්ලොවට (උපපත්ති වශයෙන්) ගියෙමි. මම පෙර දෙව්ලොවෙහි තිස්කපක් විසීමි.

2332. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් ධර්මසංඥාවක් ලැබූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. චතුරාර්‍යසත්‍ය සංඥාවෙහි මේ විපාකය යි.

2333. මෙයින් සවිසිවැනි කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති එකඵුසිත නම් වූ එක් සක්විති රජෙක් වීමි.

2334. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සච්චසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සච්චසඤ්ඤක ස්ථවිරාපදානය තෙවැනි යි.**

## 214. එකසඤ්ඤක ස්ථවිරාපදානය

2335. ගසක් මුදුනෙහි එල්ලෙන්නා වූ තථාගතයන් වහන්සේගේ පසුල් සිවුර දැක මම ඇඳිලි බැඳ ඒ පසුල් සිවුර වැන්දෙමි.

2336. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් පාංශුකූල චීවර සංඥාවක් ලැබූයෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2337. මෙයින් පස්විසිවෙනි කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **අමිතාභ** නම් සක්විති රජෙක් වීමි.

2338. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකසඤ්ඤක ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 215. රංසිසඤ්ඤකත්ථෙරාපදානං

2339. උදෙන්තං සතරංසිංව පීතරංසිංව[1] භානුමං,
ව්‍යග්ඝුසභංව පවරං සුජාතං පබ්බතන්තරෙ.

2340. බුද්ධස්ස ආනුභාවො සො ජලතෙ පබ්බතන්තරෙ,
රංසෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොදහං.

2341. අවසෙසෙසු කප්පෙසු කුසලං සුකතං[2] මයා,
තෙන චිත්තප්පසාදෙන බුද්ධානුස්සතියා පි ච.

2342. තිංසකප්පසහස්සෙතො යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං[3] ඵලං.

2343. සත්තපඤ්ඤාසකප්පම්හි එකො ආසිං ජනාධිපො,
**සුජාතො** නාම නාමෙන චක්කවත්ති මහබ්බලො.

2344. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **රංසිසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**රංසිසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 216. සණ්ඨිතත්ථෙරාපදානං

2345. අස්සත්ථෙ හරිතොභාසෙ සංවිරූළ්හම්හි පාදපෙ,
එකං බුද්ධගතං සඤ්ඤං අලභිස්ස[4] පතිස්සතො.

2346. එකතිංසෙ[5] ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
තස්සා සඤ්ඤාය වාහසා පත්තො මෙ ආසවක්ඛයො.

2347. ඉතො තෙරසකප්පම්හි **ධනිට්ඨො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2348. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සණ්ඨිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සණ්ඨිතත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

---

1. වීතරංසිංව, මජසං. 2 චරිතං, මජසං. කරිතං, සීමු.
3. බුද්ධපූජායිදං, සීමු. 4. අලභිංහං, මජසං 5. එකත්තිංසෙ, මජසං.

# 215. රංසිසඤ්ඤක ස්ථවිරාවදානය

2339. උදාවන්නා වූ හිරු මෙන් ද එසේම (උදාවී) පැතිරීගිය රැස් ඇති හිරු මෙන් ද, යහපත් ජන්ම ඇති උතුම් ව්‍යාඝ්‍රරාජයකු මෙන් ද කඳු අතුරෙහි (වැඩහුන් බුදුරජුන් දිටිමි.)

2340. කඳු අතුරෙහි ඒ බුද්ධානුභාවය බබලයි. මම බුද්ධරශ්මියෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

2341. සෙසු කල්පයන්හි මා විසින් මැනවින් කුසල් කරණ ලදී. ඒ චිත්තප්‍රසාදයෙන් ද බුද්ධානුස්සතිභාවනාවෙන් ද,

2342. මෙයින් තිස්දහස්වනු කපෙහි එදා යම් සංඥාවක් ලැබූයෙම් ද ඒ හෙතුවෙන් දුගතියක් නොම දනිමි. බුද්ධසංඥාවෙහි මේ විපාකය යි.

2343. සත්පණස්වන කපෙහි ජනාධිපති වූ නමින් **සුජාත** නම් මහත් බල ඇති සක්විතිරජෙක් වීමි.

2344. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **රංසිසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**රංසිසඤ්ඤක ස්ථවිරාවදානය පස්වැනි යි.**

# 216. සණ්ඨිත ස්ථවිරාවදානය

2345. මනාව වැඩුනු ඇසතු බෝරුක්හි හරිඳුණි (=කොළපාට) රශ්මියෙහි සිහියෙන් යුතුව හුන්නෙම් එකම (බුද්ධානුස්සති සංඥාව) ලැබීමි.

2346. මෙයින් එක්තිස්වනු කපෙහි වූ එකල්හි යම් (බුද්ධානුස්සති) සංඥාවක් ලැබූයෙම් ද, ඒ බුද්ධානුස්මෘතිසංඥා බලයෙන් මාගේ ආස්‍රවක්‍ෂය විය. (රහත් වීමි.)

2347. මෙයින් තෙලෙස්වනු කපෙහි සත්රුවනින් යුක් මහත් බල ඇති **ධනිට්ඨ** නම් ක්‍ෂත්‍රියෙක් වීමි.

2348. **සිවුපිළිසැඹියාවෝ** ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සණ්ඨිත** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සණ්ඨිත ස්ථවිරාවදානය සවැනි යි.**

## 217. තාලවණ්ටදායකත්ථෙරාපදානං

2349. තාලවණ්ටං මයා දින්නං **තිස්සස්සා**’දිච්චබන්ධුනො,
ගිම්හනිබ්බාපනත්ථාය පරිළාහොපසන්තියා.

2350. සන්නිබ්බාපෙමි රාගග්ගිං දොසග්ගිඤ්ච තදුත්තරිං,
නිබ්බාපෙමි ච මොහග්ගිං තාලවණ්ටස්සිදං ඵලං.

2351. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනං.

2352. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං[1] ඵලං.

2353. තෙසට්ඨිම්හි ඉතො කප්පෙ **මහානාම** සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2354. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තාලවණ්ටදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තාලවණ්ටදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 218. අක්කන්තසඤ්ඤකත්ථෙරාපදානං

2355. කුසාටකං ගහෙත්වාන උපජ්ඣායස්ස’හං පුරෙ,
මන්තං ච අනුසික්ඛාමි කණ්ඩභෙදස්ස[2] පත්තියා.

2356. අද්දසං විරජං බුද්ධං ආහුතීනං පටිග්ගහං,
උසභං පවරං අග්ගං **තිස්සං** බුද්ධං ගණුත්තමං.

2357. කුසාටකං පත්ථරිතං අක්කමන්තං නරුත්තමං,
සමුග්ගතං මහාවීරං ලොකජෙට්ඨං නරාසභං.

2358. දිස්වා තං ලොකපජ්ජොතං විමලං චන්දසන්නිභං,
අවන්දිං සත්ථුනො පාදෙ විප්පසන්නෙන චෙතසා.

2359. චතුනවුතෙ[3] ඉතො කප්පෙ යං අදාසිං කුසාටකං,
දුග්ගතිං නාභිජානාමි කුසාටකස්සිදං ඵලං.

2360. සත්තතිංසෙ ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො,
**සුනන්දො** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

2361. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අක්කන්තසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අක්කන්තසඤ්ඤකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. තාලවණ්ටස්සිදං, මජසං. 2. ගන්ථාදෙසස්ස, මජසං.
3. චතුන්නවුතෙ, මජසං.

## 217. තාලවණ්ටදායක ස්ථවිරාපදානය

2349. ග්‍රීෂ්මය නිවීම පිණිස ද දැවීම සන්සිඳෙනු පිණිස ද මා විසින් **තිස්ස** බුදුරජුන්හට තල්වැටක් (විජිනිපතක්) පුදන ලදී.

2350. රාගාග්නිය නිවමි. එයින් අධික වූ ද්වේෂාග්නිය ද නිවමි. එසේ ම මෝහාග්නිය ද නිවමි. විජිනිපත් දනෙහි මේ විපාකය යි.

2351. මාගේ කෙලෙස් දවන ලදී. සියලු භවයෝ නසන ලදහ. (දැන්) සම්බුදුසසුනෙහි අන්තිම ශරීරය දරමි.

2352. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2353. මෙයින් තෙසැටවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මහානාම** නම් සක්විති රජෙක් වීමි.

2354. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තාලවණ්ටදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තාලවණ්ටදායක ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 218. අක්කන්තසඤ්ඤක ස්ථවිරාපදානය

2355. මම පෙර උපාධ්‍යායයන්හට දලකඩක් ගෙණ (ගියෙමි.) (එකල මම) ගී පහර බිදී යන සේ (ජල්පනය කරණ) මන්ත්‍රයකුදු ඉගෙණ ගතිමි.

2356. ලෝකයාගේ පූජාවනට භාජන වූ කෙලෙස් රජස් විරහිත ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ ගණප්‍රධාන වූ **තිස්ස** නමැති බුදුවරයන් වහන්සේ දිටිමි.

2357. ලොව පහළ වූ ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ පදවීතිහාරය (සක්මන්) කරන්නා වූ බුදුරජාණන් වහන්සේට ඒ වස්ත්‍රය (පියවිළි කොට) අතුරණ ලදී.

2358. (ඒ මත වඩනා) ලෝකයට ප්‍රදීපයක් වැනි වූ නිර්මල චන්ද්‍රයා හා සමාන වූ බුදුරජුන් දැක පැහැදි සිතින් ඒ ශාස්තෘන් වහන්සේගේ පා වැන්දෙමි.

2359. මෙයින් සිවුඅනූවන කපෙහි යම් මහලු පිළියක් දිනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මහලු පිළියක් දීමෙහි මේ විපාකය යි.

2360. මෙයින් සත්තිස්වනු කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **සුනන්ද** නම් සක්විති රජෙක් වීමි.

2361. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අක්කන්තසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**අක්කන්තසඤ්ඤක ස්ථවිරාපදානය අටවැනි යි.**

## 219. සප්පිදායකත්ථෙරාපදානං

2362. නිසින්නො පාසාදවරෙ නාරීගණපුරක්ඛතො,
ව්‍යාධිතං සමණං දිස්වා අභිනාමෙසහං[1] ඝරං.

2363. උපවිට්ඨං මහාවීරං දෙවදෙවං නරාසභං,
සප්පිතෙලං මයා දින්නං **සිද්ධත්ථස්ස** මහෙසිනො.

2364. පස්සද්ධදරථං දිස්වා විප්පසන්නමුඛින්ද්‍රියං,
වන්දිත්වා සත්ථුනො පාදෙ අනුසංසාවයිං පුරෙ.

2365. දිස්වා මං සුප්පසන්නත්තං[2] ඉද්ධියා පාරමිඞ්ගතො,
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජාව අම්බරෙ.

2366. චතුන තෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි සප්පිතෙලස්සිදං ඵලං.

2367. ඉතො සත්තරසෙ කප්පෙ **ජුතිදෙව**[3] සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2368. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සප්පිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සප්පිදායකත්ථෙරස්ස අපදානං නවමං.**

## 220. පාපනිවාරියත්ථෙරාපදානං

2369. **පියදස්සිස්ස** භගවතො චඞ්කමං සොධිතං මයා,
නළකෙහි පටිච්ඡන්නං වාතාතපනිවාරණං.

2370. පාපං විවජ්ජනත්ථාය කුසලස්සුපසම්පදා,
කිලෙසානං පහානාය පදහිං සත්ථුසාසනෙ.

2371. ඉතො එකාදසෙ කප්පෙ **අග්ගිදෙවොති** විස්සුතො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2372. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පාපනිවාරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පාපනිවාරියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

හත්ථි පානධි සච්චඤ්ච එකසඤ්ඤී ච රංසියො
සණ්ඨිතො තාලවණ්ටී ච[4] තථා අක්කන්තසඤ්ඤකො
සප්පි පාපනිවාරී ච චතුපඤ්ඤාස ගාථකාති.

**හත්ථිවග්ගො බාවීසතිමො.**

---

1. අභිමානෙසං, සීමු.
2. සුප්පසන්නානනං, ස්‍යා.
3. දුතිදෙව, ස්‍යා තුතිදෙව. ක
4. තාලවණ්ටඤ්ච, මජ්ඣං.

## 219. සපපිදායක ස්ථවිරාපදානය

2362-2363. මම ස්ත්‍රීසමූහයා විසින් පිරිවරණ ලදුයෙම් උතුම් ප්‍රාසාද-යෙහි හුන්නෙම් රෝගී මහණකු දැක ස්වකීය ගෘහයට පමුණුවා ගතිමි. මහාවීර වූ දෙවියනට දෙවි වූ නරශ්‍රෙෂ්ඨ වූ වැඩහුන්නා වූ ඒ සිද්ධාර්ථ බුදුරජුන්හට මා විසින් ගිතෙල් දෙන ලදී.

2364. පැහැදි මුහුණු හා ඉඳුරන් ඇති සංසිඳුනු කාය - චිත්ත දරථ ඇති උත්වහන්සේ දැක ඒ ශාස්තෘන් වහන්සේගේ පා වැඳ ඉදිරියෙහි සිටගෙණ ප්‍රශංසා කෙළෙමි.

2365. අතිශයින් පහන් බැව් ඇති සෘද්ධියෙහි කෙළපැමිණි ප්‍රාඥ වූ ඒ සර්වඥතෙම අහසෙහි (යන) හස්රජකු මෙන් අහසට නැංගේය.

2366. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් (ගිතෙල්) දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ගිතෙල් දනෙහි මේ විපාකය යි.

2367. මෙයින් සතළොස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ජුතිදෙව නම් සක්විති රජෙක් වීමි.

2368. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සපපිදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**සපපිදායක ස්ථවිරාපදානය නවවැනි යි.**

## 220. පාපනිවාරිය ස්ථවිරාපදානය

2369. බටපඳුරින් වැසීගිය අව්සුලං වළහන සක්මනක් මා විසින් පියදස්සි බුදුරජුන් සඳහා පිරිසිදු කරණ ලදී.

2370. පව් වළහනු පිණිස ද කුසල් රැස් කිරීම පිණිස ද කෙලෙස් දුරුකිරීම පිණිස ද බුදුසසුනෙහි වීයඞී වැඩීමි.

2371. මෙයින් එකොළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අග්ගිදෙව යයි ප්‍රසිද්ධ සක්විති රජෙක් වීමි.

2372. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් පාපනිවාරිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**පාපනිවාරිය ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

හත්‍ථි පානධි සච්ච - එකසඤ්ඤිය රංසිය
සණ්ඨිතය තාලවණ්ටිය - අක්කන්ත සඤ්ඤක ද
සපපි පාපනිවාරිය දැයි - සිවුපණස් ගයින් බැඳියේ.

**හත්‍ථිවග්ගය දෙවිසි වැනි යි.**

## 221. ආලම්බනදායකත්ථෙරාපදානං

2373. **අත්ථදස්සිස්ස**[1] භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
ආලම්බනං මයා දින්නං දිපදින්දස්ස තාදිනො.

2374. ධරණිං පටිපජ්ජාමි විපුලං සාගරප්පරං,
පාණෙසු ච ඉස්සරියං වත්තෙමි වසුධාය ච.

2375. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

2376. ඉතො ඡසට්ඨිකප්පම්හි තයො ආසිංසු ඛත්තියා,
**එකාපස්සිත** නාමා තෙ චක්කවත්තී මහබ්බලා.

2377. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආලම්බනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආලම්බනදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 222. අජිනදායකත්ථෙරාපදානං

2378. එකතිංසෙ[2] ඉතො කප්පෙ **ගණසත්ථා** අහොසහං,
අද්දසං විරජං බුද්ධං ආහුතීනං පටිග්ගහං.

2379. චම්මඛණ්ඩං මයා දින්නං සිඛිනො ලොකබන්ධුනො,
තෙන කම්මෙන දිපදින්දෙ[3] ලොකජෙට්ඨ නරාසභෙ.

2380. සම්පත්තිං අනුභොත්වාන කිලෙසෙ ඣාපයිං අහං,
ධාරෙමි අන්තිමං දෙහං සම්මාසම්බුද්ධසාසනෙ.

2381. එකතිංසෙ ඉතො කප්පෙ අජිනං යමදාස'හං,
දුග්ගතිං නාභිජානාමි අජිනස්ස ඉදං ඵලං.

2382. ඉතො පඤ්චමකෙ කප්පෙ රාජා ආසිං **සුදායකො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2383. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අජිනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අජිනදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

1. අත්ථදස්සී, සිමු. 2. එකත්තිංසෙ, මජසං. 3. දිපදින්ද, මජසං.

## 221. ආලම්බනදායක ස්ථවිරාවදානය

2373. (අටලෝ දහමින් කම්පා නො වන බැවින්) තාදී ගුණ ඇති, ලොකජ්‍යෙෂ්ඨ වූ ද්විපදෝත්තම වූ **අත්ථදස්සී** බුදුරජුන්හට මා විසින් ආලම්බනඵලකයක් (වැතිරෙණ පුවරුවක්) පුදන ලදී.

2374. සයුර කෙළවර කොට ඇති මහත් වූ පෘථිවිය රජයෙමි. ධනය කෙරෙහි ද ප්‍රාණීන් කෙරෙහි ද ආධිපත්‍යය පවත්වමි.

2375. මා විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ත්‍රිවිද්‍යාවෝ පැමිණෙන ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරන ලදී.

2376. මෙයින් දෙසැටවනු කපෙහි මහත් බල ඇති **එකාපස්සිත** නම් ඒ තුන් සක්විති රජකෙනෙක් වූහ.

2377. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ආලම්බනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආලම්බදායක ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 222. අජිනදායක ස්ථවිරාවදානය

2378. මෙයින් එක්තිස්වන කපෙහි මම ගණාවාසී වූයෙම් වෙමි. කෙලෙස් රජස් විරහිත ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ **සිඛී** බුදුරජුන් දිටිමි.

2379. ලොකබන්ධු වූ **සිඛී** බුදුරජුන්හට මා විසින් සම්කඩක් දෙන ලදී. ද්විපදෝත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි කළ ඒ කර්මය කරණ කොට ගෙණ-

2380. මම සම්පත් අනුභව කොට කෙලෙස් ද දවීමි. සම්බුදු සසුනෙහි (මේ) අන්තිම ශරීරය ද දරමි

2381. මම මෙයින් එක්තිස්වනු කපෙහි යම් අඳුන් දිවිසමක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අඳුන් දිවිසම් දනෙහි මේ විපාක යි.

2382. මෙයින් පස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුදායක** නම් සක්විති රජෙක් වීමි.

2383. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අජිනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අජිනදායක ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 223. ද්විරතනියත්ථෙරාපදානං*

2384. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
අද්දසං විරජං බුද්ධං ආහුතීනං පටිග්ගහං.

2385. මංසපෙසි මයා දින්නා **විපස්සිස්ස** මහෙසිනො,
සදෙවකස්මිං ලොකස්මිං ඉස්සරං කාරයාමහං.

2386. ඉමිනා මංසදානෙන රතනං නිබ්බත්තතෙ මම,
දුවෙ'මෙ රතනා ලොකෙ දිට්ඨධම්මස්ස පත්තියා.

2387. තෙහං සබ්බෙ අනුභොමි මංසදානස්ස සත්තියා,
ගත්තඤ්ච මුදුකං මය්හං පඤ්ඤා නිපුණවෙදිනී[1].

2388. එකනවුතෙ ඉතො[2] කප්පෙ යං මංසමදදිං අහං,
දුග්ගතිං නාභිජානාමි මංසදානස්සිදං ඵලං.

2389. ඉතො චතුත්ථකෙ කප්පෙ එකො ආසිං ජනාධිපො,
**මහාරොහිත** නාමො සො චක්කවත්තී මහබ්බලො.

2390. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ද්විරතනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ද්විරතනියත්ථෙරස්ස අපදානං තතියං.**

## 224. ආරක්ඛදායකත්ථෙරාපදානං

2391. **සිද්ධත්ථස්ස** භගවතො වෙදි කාරාපිතා[3] මයා,
ආරක්ඛො ච මයා දින්නො සුගතස්ස මහෙසිනො.

2392. තෙන කම්මවිසෙසෙන න පස්සෙ[4] භයභෙරවං,
කුහිඤ්චි උප්පන්නස්ස තාසො මය්හං න විජ්ජති.

2393. චතුනවුතෙ ඉතො[5] කප්පෙ යං වෙදිං කාරයිං අහං,[6]
දුග්ගතිං නාභිජානාමි වෙදිකාය ඉදං ඵලං.

2394. ඉතො ඡට්ඨම්හි කප්පම්හි **අපස්සෙන** සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2395. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආරක්ඛදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආරක්ඛදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

---

* දෙවරතනියත්ථෙර, මජසං. 1. නිපුණවෙදණී, මජසං.
2. එකනවුතිතො, මජසං. 3. වෙදිකා කාරිතා, ස්‍යා
4. න පස්සිං, මජසං. 5. චතුන්නවුතිතො, මජසං. 6 පුරෙ, මජසං.

# 223. දච්චිරතනිය සථ්විරාපදානය

2384. මම පෙර මහවෙනෙහි මුව වැද්දෙක් වීමි. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ කෙලෙස් මල නැති බුදුරජුන් දිටිමි.

2385 **විපස්සී** බුදුරජුන්හට මා විසින් මස් කැබැල්ලක් පුදන ලදී. මම (ඒ හෙතුවෙන්) දෙවියන් සහිත ලොකයෙහි ආධිපත්‍යය කරමි.

2386. මෙම මස් දන කරණ කොට ගෙණ මට (කාය-චිත්ත සම්පත්ති සඞ්ඛ්‍යාත) රුවන් උපදී. මේ රුවන් දෙක ලෙව්හි නිවන් ලැබීමට උපකාර වේ.

2387. මම ඒ සියලු සම්පත් අනුභව කරමි. මස් දනෙහි ශක්තිය කරණ කොට ගෙණ මාගේ ශරීරය ද මෘදුය. සියුම් දෙය අවබොධ කරගත හැකි ප්‍රඥාව ද වේ.

2388. මෙයින් එක්අනූවන කපෙහි මම යම් මස් දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මස් දනෙහි මේ විපාකය යි.

2389. මෙයින් සිවුවනු කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **මහාරොහිත** නම් සක්විති රජෙක් වීමි.

2390. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **දච්චිරතනිය** සථ්විරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**දච්චිරතනිය සථ්විරාපදානය තෙවැනි යි.**

# 224. ආරක්ඛදායක සථ්විරාපදානය

2391. මා විසින් සිදුහත් බුදුරජුන්හට වෙදිකාවක් කරවන ලදී. මා විසින් මහර්ෂි වූ බුදුරජුන්හට ආරක්ෂාවක් ද දෙන ලදී.

2392. ඒ කර්මවිශෙෂය කරණකොට ගෙණ භයජනක අරමුණක් නො දකිමි. කොහි උපන්නේ නමුදු මට ත්‍රාසයක් විද්‍යමාන නැත.

2393. මම මෙයින් සිවුඅනූවන කපෙහි යම් වේදිකාවක් කරවීම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වේදිකා දනෙහි මේ විපාකය යි.

2394. මෙයින් සවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අපසෙසන** නම් සක්විති රජෙක් වීමි.

2395. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආරක්ඛදායක** සථ්විරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආරක්ඛදායක සථ්විරාපදානය සිවුවැනි යි.**

## 225. අව්‍යාධිකත්ථෙරාපදානං*

2396. **විපස්සිස්ස** භගවතො අග්ගිසාලමදාසහං,
ව්‍යාධිතානඤ්ච ආවාසං උණ්හොදකපටිග්ගහං.

2397. තෙන කම්මෙනයං මය්හං අත්තභාවො සුනිම්මිතො,
ව්‍යාධාහං නාභිජානාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

2398. එකනවුතෙ ඉතො කප්පෙ යං සාලමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අග්ගිසාලායිදං ඵලං.

2399. ඉතො සත්තමකෙ කප්පෙ එකො'සිං **අපරාජිතො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2400. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අව්‍යාධිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අව්‍යාධිකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 226. අඞ්කොලපුප්ඵියත්ථෙරාපදානං

2401. **නාරදො** ඉති මෙ නාමං **කස්සපො** ඉති මං විදූ,
අද්දසං සමණානග්ගං **විපස්සිං** දෙවසක්කතං.

2402. අනුබ්‍යඤ්ජනධරං බුද්ධං ආහුතීනං පටිග්ගහං,
අඞ්කොලපුප්ඵං පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

2403. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2404. චතුසත්තතිතො කප්පෙ **රොමසො** නාම ඛත්තියො,
ආමුත්තමාලාභරණො සයොග්ගබලවාහනො.

2405. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අඞ්කොලපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අඞ්කොලපුප්ඵියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

* අබ්‍යාධික, මජසං.

# 225. අව්‍යාධික ස්ථවිරාවදානය

2396. මම **විපස්සි** බුදුරජුන්හට ගිනිහල්ගෙයක් දිනිමි. රොගීන්හට නිවාස ස්ථානයක් ද, උණුදිය වත්කරන භාජනයක් ද දිනිමි.

2397. ඒ කර්මය හෙතුකොට ගෙණ මට මේ ආත්මභාවය මොනොවට මැවින. මම ව්‍යාධිය (කුමැයි) නො දනිමි. පුණ්‍යකර්මයාගේ මේ විපාකය සි.

2398. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් ශාලාවක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අග්නිශාලාදානයෙහි මේ විපාකය සි.

2399. මෙයින් සත්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අපරාජිත** නම් සක්විති රජෙක් වීමි.

2400. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අව්‍යාධික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අව්‍යාධික ස්ථවිරාවදානය පස්වැනි සි.**

# 226. අඞ්කොලපුප්ඵිය ස්ථවිරාවදානය

2401-2402. **නාරද** යනු මගේ නමයි. මට කාශ්‍යප යයි ද කියති. ශ්‍රමණයනට අග්‍ර වූ දෙවියන් විසින් සත්කාර කරණ ලද අනුව්‍යඤ්ජන දරන්නා වූ ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ **විපස්සි** බුදුරජුන් දිටිමි. මම රුකඟුන මල් ගෙණ ඒ බුදුරජුන්හට පිදීමි.

2403. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සි.

2404. මෙයින් සුසැත්තෑවනු කපෙහි ස්වර්ණ සිවිකා ආදි යානයන් ද, මහාමාත්‍ය සෙවකාදි බලයන් ද, හස්ති අශ්ව රථ සඞ්ඛ්‍යාත වාහනයන් ද, යන මොවුන්ගෙන් යුක්තවූයෙම් පැළැඳි මාලාභරණ ඇත්තෙම් **රොමස** නම් රජෙක් වීමි.

2405. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අඞ්කොලපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අඞ්කොලපුප්ඵිය ස්ථවිරාවදානය සවැනි සි.**

## 227. සොවණ්ණවටංසකියත්ථෙරාපදානං*

2406. උය්‍යානභූමිං නිය්‍යන්තො අද්දසං ලොකනායකං,
වටංසකං ගහෙත්වාන සොවණ්ණං සාධුනිම්මිතං.

2407. සීඝං තතො සමොරුය්හ[1] හත්ථික්ඛන්ධගතො අහං,
බුද්ධස්ස අභිරොපෙසිං **සිඛිනො** ලොකබන්ධුනො.

2408. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං[2],
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං[3] ඵලං.

2409. සත්තවීසෙ ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො,
**මහාපතාප** නාමෙන චක්කවත්ති මහබ්බලො.

2410. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සොවණ්ණවටංසකියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සොවණ්ණවටංසකියත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 228. මිඤ්ජවටංසකියත්ථෙරාපදානං

2411. නිබ්බුතෙ ලොකනාථම්හි **සිඛිම්හි** වදතං වරෙ,
වටංසකෙහි ආකිණ්ණං බොධිපූජමකාසහං.

2412. එකතිංසෙ ඉතො කප්පෙ යං පූජමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බොධිපූජායිදං ඵලං.

2413. ඉතො ඡබ්බීසතිකප්පෙ අහුං **මෙඝබ්භ** නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2414. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මිඤ්ජවටංසකියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මිඤ්ජවටංසකියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 229. සුකතාවෙලියත්ථෙරාපදානං

2415. **අසිතො** නාම නාමෙන මාලාකාරො අහුං[4] තදා,
ආවෙළං පග්ගහෙත්වාන රඤ්ඤො දාතුං වජාමහං.

2416. අසම්පත්තම්හි රාජානං අද්දසං **සිඛිනායකං**,
හට්ඨො හට්ඨෙන චිත්තෙන බුද්ධස්ස අභිරොපයිං.

2417. එකතිංසෙ[5] ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

---

* වටංසකියත්ථෙරාපදාන සීමු. 1. සමාරුය්හ, මජසං.
2. පුප්ඵමභිරොපයිං, මජසං. 3. පුප්ඵපූජායිදං, මජසං. 4. අහං, මජසං.
5. එකත්තිංසෙ, මජසං.

## 227. සොවණ්ණවටංසකිය ස්ථවිරාපදානය

2406. උද්යාන භූමියට නික්ම වඩනා වූ මම ලොකනායක වූ (සිඛී) බුදුරජුන් දිටිමි. මැනවින් කොට නිමවන ලද සවණ්වණ් වූ (හිස පළඳනා) **කඩාමල්කඩක්** ගෙණ,

2407. ඇතුපිට සිටි මම වහා එයින් බැස ලොකබන්ධු වූ **සිඛී** බුදුරජුන්හට (ඒ මාලාව) පිදීමි.

2408. මෙයින් එක්තිස්වනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2409. මෙයින් සත්විසිවනු කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **මහාපතාප** නම් සක්විති රජෙක් වීමි.

2410. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සොවණ්ණවටංසකිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

**සොවණ්ණවටංසකිය ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 228. මිඤ්ජවටංසකිය ස්ථවිරාපදානය

2411. වාදීන් අතුරෙහි උතුම් වූ **සිඛී** බුදුරජුන් පිරිනිවි කල්හි මම **කඩාමල්කඩින්** ගැවසීගත් බොධිපූජාවක් කෙළෙමි.

2412. මෙයින් එක්තිස්වනු කපෙහි වූ එකල්හි යම් පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බොධිපූජාවෙහි මේ විපාකය යි.

2413. මෙයින් සවිසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මෙඝබ්භ** නම් සක්විති රජෙක් වීමි.

2414. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **මිඤ්ජවටංසකිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

**මිඤ්ජවටංසකිය ස්ථවිරාපදානය අටවැනි යි.**

## 229. සුකතාවෙලිය ස්ථවිරාපදානය

2415. එකල්හි මම **අසිත** නම් මල්කරුවෙක් වීමි. හිසෙහි පලඳින මාලාවක් රජුට දීම සඳහා මම ගෙණ යමි.

2416. රජු වෙත පැමිණීමට පෙර **සිඛී** බුදුරජානන් වහන්සේ දිටිමි. **සොම්නස්වූයෙම්** සොම්නස් සිතින් එය බුදුරජුන්හට පිදීමි.

2417. මෙයින් එක්තිස්වනු කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2418. පඤ්චවීසෙ ඉතො කප්පෙ රාජාහොසිං මහබ්බලො,
**වෙභාරො** නාම නාමෙන චක්කවත්ති මහබ්බලො.

2419. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුකතාවෙලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුකතාවෙලියත්ථෙරස්ස අපදානං නවමං.**

## 230. එකවන්දියත්ථෙරාපදානං

2420. උසභං පවරං වීරං **වෙස්සභුං** විජිතාවිනං,
පසන්නචිත්තො සුමනො බුද්ධසෙට්ඨං අවන්දිහං[1].

2421. එකත්තිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි වන්දනාය ඉදං ඵලං.

2422. චතුවීසතිකප්පම්හි **විගතානන්ද**නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2423. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකවන්දියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකවන්දියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

ආලම්බනඤ්ච අජිනං මංසදා රක්ඛදායකො
අව්‍යාධි අඞ්කොලං[2] සොවණ්ණං මිඤ්ජං ආවෙළ වන්දනං
පඤ්චපඤ්ඤාස ගාථායො ගණිතා අත්ථදස්සිහි.

**ආලම්බනදායකවග්ගො තෙවීසතිමො.**

## 231. උදකාසනදායකත්ථෙරාපදානං

2424. ආරාමද්වාරා නික්ඛම්ම ඵලකං සන්ථරිං අහං,
උදකඤ්ච උපට්ඨාසිං උත්තමත්ථස්ස පත්තියා.

2425. එකත්තිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ආසනෙ චොදකෙ ඵලං.

2426. ඉතො පණ්ණරසෙ කප්පෙ **අභිසාමසමව්හයො**,
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

---

1. බුද්ධසෙට්ඨමවන්දහං, මජසං.    2. වකුලං, සහ.

2418. මෙයින් පස්විසිවනු කපෙහි මහත් බල ඇති **වෙභාර** නම් සක්විති රජෙක් වීමි.

2419. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සුකතාවෙලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සුකතාවෙලිය ස්ථවිරාවදානය නවවැනි යි.**

## 230. එකවන්දිය ස්ථවිරාවදානය

2420. ශ්‍රෙෂඨ වූ උතුම් වූ පස්මරුන් ජයගත් **වෙස්සභූ** බුදුරජුන්හට මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් වැන්දෙමි.

2421. එක්තිස්වනු කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වන්‍දනාවෙහි මේ විපාකය යි.

2422. සූවිසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **විගතානන්‍ද** නම් සක්විති රජෙක් වීමි.

2423. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **එකවන්දිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකවන්දිය ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

ආලම්බන ය අජින ය - මංසද ආරක්ඛද ය
අව්‍යාධි අඞ්කොල සහ - සොණ්ණකිඞ්කණි ආවෙලවන්‍දනය
පස්පණස් ගයකින් - මෙම තෙවිසි වනු වග වේ.

**ආලම්බනදායක වර්ගය තෙවිසිවැනි යි.**

## 231. උදකාසනදායක ස්ථවිරාවදානය

2424. මම අරම් දොරින් නික්ම උත්තමාර්ථය වූ නිවණට පැමිණීම පිණිස (වැඩහිඳීමට) පුවරුවක් ඇතිරීමි. පැන් ද එළවා තැබීමි.

2425. මෙයින් එක්තිස්වනු කපෙහි දී යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අසුන හා දිය එළවා තැබීමෙහි මේ විපාකය යි.

2426. මෙයින් පසළොස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අභිසාම** නම් සක්විති රජෙක් වීමි.

2427. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උදකාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උදකාසනදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 232. භාජනදායකත්ථෙරාපදානං[1]

2428. නගරෙ **බන්ධුමතියා** කුම්භකාරො අහං තදා,
භාජනං අනුපාලෙසිං භික්ඛුසඞ්ඝස්ස තාවදෙ.

2429. එකනවුතෙ ඉතො කප්පෙ භාජනං අනුපාලයිං,
දුග්ගතිං නාභිජානාමි භාජනස්ස ඉදං ඵලං.

2430. තෙපඤ්ඤාසෙ ඉතො කප්පෙ **අනන්තජාලි** නාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2431. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භාජනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භාජනදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 233. සාලපූපියත්ථෙරාපදානං*

2432. **අරුණවතියා** නගරෙ අහොසිං පූපිකො අහං,
මම ද්වාරෙන ගච්ඡන්තං **සිඛිනං** අද්දසං ජිනං.

2433. බුද්ධස්ස පත්තං පග්ගය්හ සාලපූපං[2] අදාසහං,
සම්මග්ගතස්ස බුද්ධස්ස විප්පසන්නෙන චෙතසා.

2434. එකතිංසෙ ඉතො කප්පෙ යං බජ්ජකමදාසහං.[3]
දුග්ගතිං නාභිජානාමි සාලපූපස්සිදං ඵලං.

2435. ඉතො චුද්දසකප්පම්හි අහොසිං **අමිතඤ්ජලො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2436. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සාලපූපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සාලපූපියත්ථෙරස්ස අපදානං තතියං.**

---

1. භාජනපාලකත්ථෙරාපදානං, මජසං. 2. සාලපුප්ඵං, මජසං.
3. යං පුප්ඵමභිදාසහං, මජසං. *. සාලපුප්ඵියත්ථෙරාපදානං, සීමු. මජසං.

2427. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උදකාසනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**උදකාසනදායක ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 232. භාජනදායක ස්ථවිරාවදානය

2428. මම එකල්හි **බන්ධුමතී** නගරයෙහි කුම්භකාරයෙක් (=කුඹලෙක්) වීමි. එකෙණෙහි භික්ෂුසඞ්ඝයාට භාජන සැපයීම කෙළෙමි.

2429. මෙයින් එක්අනූවන කපෙහි යම් භාජන සැපයීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. භාජන දානයාගේ මේ විපාකය යි.

2430. මෙයින් තෙපණස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අනන්තජාලි** නම් සක්විති රජෙක් වීමි.

2431. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **භාජනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**භාජනදායක ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 233. සාලපූපිය ස්ථවිරාවදානය

2432. මම **අරුණවතී** නගරයෙහි පූප සාදන්නෙක් වීමි. (එකල්හි) මාගේ ගෙදොරින් වඩිනා **සිඛී** බුදුරජුන් දිටිමි.

2433. මම බුදුරජුන්ගේ පාත්‍රය ගෙණ සමමගගත වූ ඒ බුදුරජානන් වහන්සේට පැහැදි සිතින් හල් පූ දිනිමි.

2434. මෙයින් **එක්තිස්වනු** කපෙහි මම යම් ඛාද්‍යයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. හල් පූ දනෙහි මේ විපාකය යි.

2435. මෙයින් තුදුස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අමිතඤ්ජල** නම් සක්විති රජෙක් වීමි.

2436. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සාලපූපිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සාලපූපිය ස්ථවිරාවදානය තෙවැනි යි**

## 234. කිලඤ්ජදායකත්ථෙරාපදානං

2437. **තිවරායං** පුරෙ රම්මෙ නළකාරො අහං තදා,
**සිද්ධත්ථෙ** ලොකපජ්ජොතෙ පසන්නා ජනතා තහිං.

2438. පූජත්ථං ලොකනාථස්ස කිලඤ්ජං පරියෙසති,
බුද්ධපූජං කරොන්තානං කිලඤ්ජං අදදිං අහං.

2439. චතුනවුතෙ ඉතො[1] කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි කිලඤ්ජස්ස ඉදං ඵලං.

2440. සත්තසත්තතිකප්පම්හි රාජා ආසිං **ජුතින්ධරො**,[2]
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2441. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කිලඤ්ජදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කිලඤ්ජදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 235. වෙදිකාරකත්ථෙරාපදානං

2442. විපස්සිනො භගවතො බොධියා පාදපුත්තමෙ,
පසන්නචිත්තො සුමනො කාරෙසිං වෙදිකං අහං.

2443. එකනවුතෙ ඉතො කප්පෙ කාරෙසිං වෙදිකං අහං,
දුග්ගතිං නාභිජානාමි වෙදිකාය ඉදං ඵලං.

2444. ඉතො එකාදසෙ කප්පෙ අහොසිං **සූරියස්සමො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2445. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වෙදිකාරකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වෙදිකාරකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 236. වණ්ණකාරත්ථෙරාපදානං

2446. නගරෙ **අරුණවතියා** වණ්ණකාරො අහං තදා,
චෙතියෙ දුස්සභණ්ඩානි නානාවණ්ණං රජෙසහං[3].

2447. එකතිංසෙ ඉතො කප්පෙ යං වණ්ණං රජයිං තදා,
දුග්ගතිං නාභිජානාමි වණ්ණදානස්සිදං ඵලං.

1. චතුන්නවුතිතො කප්පෙ, මජ්ඣං. 2. ජලද්ධරො, මජ්ඣං.
3. රජෙම්හං, සයා.

## 234. කිලඤ්ජදායක ස්ථවිරාපදානය

2437. (ප්‍රාකාරත්‍රයකින් පරික්ෂිප්ත බැවින්) **තිවරා** නම් වූ රම්‍ය නගරයෙහි මම එකල්හි නළකරුවෙක් (=කුළුපොත්තෙක්) වීමි. **සිද්ධාර්ථ** බුදුරජුන් කෙරෙහි පැහැදුනු ජනසමූහයෝ එහි වූහ.

2438. ලෝකනාථයන් වහන්සේට පිදීම සඳහා කළාලයක් සොයති. මම ඒ බුද්ධපූජාව කරනවුනට කළාලයක් දිනිමි.

2439. මෙයින් සිවූඅනූවනු කපෙහි දී යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කලාලදායකයාගේ මේ විපාකය යි.

2440. සත්සැත්තෑවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **ජුතින්ධර** නම් සක්විති රජෙක් වීමි.

2441. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද **සාක්ෂාත්** කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කිලඤ්ජදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**කිලඤ්ජදායක ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 235. වෙදිකාරක ස්ථවිරාපදානය

2442. **විපස්සී** බුදුරජුන්ගේ උතුම් බෝරුකට මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් වෙදිකාවක් කෙළෙම්.

2443. මම මෙයින් අනූවන කපෙහි වෙදිකාවක් කරවූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වෙදිකාදායකයාගේ මේ විපාකය යි.

2444. මෙයින් එකොළොස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සූරියස්සම** නම් සක්විති රජෙක් වීමි.

2445. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **වෙදිකාරක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**වෙදිකාරක ස්ථවිරාපදානය පස්වැනි යි.**

## 236. වර්ණකාර ස්ථවිරාපදානය

2446. මම එකල්හි **අරුණවතී** නගරයෙහි වර්ණකාරයෙක් (රඟ-පොවන්නෙක්) වීමි. මම සෑයෙහි වත්බඩු නන්වන් කොට පෙවීමි.

2447. මෙයින් එක්තිස්වනු කපෙහි යම් සායම් පෙවීමක් (පින් පිණිස) කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි.

2448. ඉතො තෙවීසතිකප්පෙ චන්දූපමසනාමකො[1],
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2449. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වණ්ණකාරො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වණ්ණකාරත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 237. පියාලපුප්ඵියත්ථෙරාපදානං

2450. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
පියාලං පුප්ඵිතං දිස්වා ගතමග්ගෙ බිපිං අහං.

2451. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2452. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පියාලපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පියාලපුප්ඵියත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 238. අම්බයාගදායකත්ථෙරාපදානං

2453. සකෙ සිප්පෙ අපත්ථද්ධො අගමං කානනං අහං,
සම්බුද්ධං යන්තං දිස්වාන අම්බයාගං අදාසහං.

2454. එකනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අම්බයාගස්සිදං ඵලං.

2455. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බයාගදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අම්බයාගදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. වණ්ණසමසනාමකො, මජසං. චන්දසම, සතා.

2448. මෙයින් තෙවිසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති වණ්ණූපම නම් සක්විති රජෙක් විමි.

2449. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **වණ්ණකාර** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**වණ්ණකාර ස්ථවිරාවදානය සවැනි යි.**

## 237. පියාලපුප්ඵිය ස්ථවිරාවදානය

2450. මම පෙර මහවෙනෙහි මුව වැද්දෙක් වීමි. මම පිපුණු පියල් ගසක් දුටු බුදුරජුන් වැඩිය මගෙහි (ඒ මල් ගෙණ) (පිදීම් වශයෙන්) අතුළෙමි.

2451. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2452. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පියාලපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පියාලපුප්ඵිය ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 238. අම්බයාගදායක ස්ථවිරාවදානය

2453 සවකීය (තර්කව්‍යාකරණාදි) ශිල්පයෙහි දක්ෂ වූ මම වනයට ගියෙමි. මම (මග) වඩින්නා වූ බුදුරජුන් දුටු අඹදනක් දිනිමි.

2454. මෙයින් එක්අනූවන කපෙහි යම් දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අඹදනෙහි මේ විපාකය යි.

2455. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අම්බයාගදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අම්බයාගදායක ස්ථවිරාවදානය අටවැනි යි.**

## 239. ජගතිකාරකත්ථෙරාපදානං

2456. නිබ්බුතෙ ලොකනාථම්හි **අත්ථදස්සි** නරුත්තමෙ,
ජගතී කාරිතා මය්හං බුද්ධස්ස ථූපමුත්තමෙ.

2457. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ජගතියා ඉදං ඵලං.

2458. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ජගතිකාරකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ජගතිකාරකත්ථෙරස්ස අපදානං නවමං.**

## 240. වාසිදායකත්ථෙරාපදානං

2459. කම්මාරොහං පුරෙ ආසිං තිවරායං පුරුත්තමෙ,
එකා වාසි මයා දින්නා සයම්භුං අපරාජිතං.

5460. චතුනවුතෙ[1] ඉතො කප්පෙ යං වාසිමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි වාසිදානස්සිදං ඵලං.

5461. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වාසිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**වාසිදායකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

උදකාසන භාජනං සාලපුප්ඵි[2] කිලඤ්ජකො
වෙදිකා වණ්ණකාරො ච පියාල අම්බයාගදෙ
ජගතී වාසිදාතා ච ගාථා තිංස ච අට්ඨ ච.

**උදකාසනවග්ගො චතුවීසතිමො.**

## 241. තුවරදායකත්ථෙරාපදානං

2462. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
හරිත්තා[3] තුවරමාදාය සඞ්ඝස්ස අදදිං අහං.

2463. එකනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි තුවරස්ස ඉදං ඵලං.

2464. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තුවරදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තුවරදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. චතුන්නවුතිතොකප්පෙ, මජසං. 2 සාලදුප්පී, සීමු. මජසං.
3. හරිත්වා, සීමු. මජසං

# 239. ජගතිකාරක ස්ථවිරාපදානය

2456. **අත්ථදස්සී** බුදුරජුන් පිරිනිවි කල්හි මා විසින් ඒ බුදුරජුන්ගේ උතුම් සෑයෙහි පිළිදගුම් කරවන ලදී.

2457. මෙයින් එක්සිය අටලොස්වන කපෙහි යම් කර්මයක් කරණ ලද ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පිළිදගුම් කරවීමෙහි මේ විපාකය යි.

2458. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ජගතිකාරක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදළ සේක.

**ජගතිකාරක ස්ථවිරාපදානය නවවැනි යි.**

# 240. වාසිදායක ස්ථවිරාපදානය

2459. මම පෙර උතුම් **තිවරා** පුරයෙහි කඹුරෙක් වීමි. මා විසින් සියල්ල දත් පස්මරුන් දිනූ බුදුරජුන් උදෙසා එක් වෑකැත්තක් දෙන ලදී.

2460. මෙයින් සිවුඅනූවන කපෙහි යම් වෑකැති දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වෑකැති දනෙහි මේ විපාකය යි.

2461. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **වාසිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදළ සේක.

**වාසිදායක ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

උදකාසන භාජන – සාලපුප්ඵ කිලඤ්ජක
වෙදිකා වණ්ණකාර – පියාල අම්බයාගද
ජගතී වාසිදාතා දැයි දස – අටතිස් ගයින් බැඳියේ.

**උදකාසන වර්ගය සූවිසි වැනි යි.**

# 241. තුවරදායක ස්ථවිරාපදානය

2462. මම පෙර මහවෙනෙහි මුවවැද්දෙක් වීමි. මම තුවරඇට (බඳුනකින්) ගෙණවුත් සඞ්ඝයාට දුනිමි.

2463. මෙයින් එක්අනූවන කපෙහි යම් දනක් දිනිම් ද, (ඒ හෙතු-වෙන්) දුගතියක් නො දනිමි. තුවර දනෙහි මේ විපාකය යි.

2464. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තුවරදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදළ සේක.

**තුවරදායක ස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 242. නාගකෙසරියත්ථෙරාපදානං

2465. ධනුං අද්වෙජ්ඣං කත්වාන වනමජ්ඣොගහිං අහං,
කෙසරං ඔසටං[1] දිස්වා සතපත්තං සමුට්ඨිතං.

2466. උභො හත්ථෙහි පග්ගය්හ සිරෙ කත්වාන අඤ්ජලිං,
බුද්ධස්ස අභිරොපෙසිං **තිස්සස්ස** ලොකබන්ධුනො.

2467. ද්වෙනවුතෙ ඉතො **කප්පෙ** යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2468. තෙසත්තතිම්හි කප්පම්හි සත්ත **කෙසරනාමකා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2469. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නාගකෙසරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නාගකෙසරියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 243. නළිනකෙසරියත්ථෙරාපදානං

2470. ජාතස්සරස්ස වෙමජ්ඣෙ වසාමි ජලකුක්කුටො,
අථද්දසං[2] දෙවදෙවං ගච්ඡන්තමනිලඤ්ජසෙ.

2471. තුණ්ඩෙන කෙසරිං[3] ගය්හ විප්පසන්නෙන චෙතසා,
බුද්ධස්ස අභිරොපෙසිං **තිස්සස්ස** ලොකබන්ධුනො.

2472. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2473. තෙසත්තතිම්හි කප්පම්හි **සතපත්තසනාමකො**[4],
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2474. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා **සච්ඡිකතා** කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නළිනකෙසරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නළිනකෙසරියත්ථෙරස්ස අපදානං තතියං.**

## 244. විරවිපුප්ඵියත්ථෙරාපදානං[5]

2475. ඛීණාසවසහස්සෙහි නිය්යාති ලොකනායකො,
විරවිපුප්ඵං පග්ගය්හ[6] බුද්ධස්ස අභිරොපයිං.

2476. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

---

1. ඔගතං, මජසං. 2. අද්දසාහං මජසං. 3. කෙසරං, සසා
4. සත්තකෙසරනාමකො, මජසං. 5. විරවපුප්ඵියත්ථෙරාපදානං, මජසං.
6. විරවපුප්ඵමාදාය, මජසං.

## 242. නාගකෙසරිය ස්ථවිරාවදානය

2465. මම (මුවන් මැරීම සඳහා) දුන්න තිසැක කොට **සරසාගෙණ** වනයට ඇතුළු වීමි. මතාව පිපුණු කුඩා විලක් දැක උඩට නැගුනු පියුමක්

2466. දෙඅතින් ගෙණ හිසෙහි ඇඳිලි බැඳගෙණ ලොකබන්ධු වූ **තිස්ස** බුදුරජුන්හට පිදීමි.

2467. මෙයින් දෙඅනූවනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2468. තෙසැත්තෑවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **කෙසර** නම් සක්විති රජෙක් වීමි.

2469. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **නාගකෙසරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**නාගකෙසරිය ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 243. නළිනකෙසරිය ස්ථවිරාවදානය

2470. (මම) ස්වයංජාත විලක් මැද දියකුකුළෙක්ව වසමි. ඉක්බිති (එහිදී) අහසෙහි වඩින්නා වූ බුදුරජුන් දුටුවෙමි.

2471. තුඩින් නෙළුම් මල් ගෙණ පැහැදි සිතින් ලොකබන්ධු වූ **තිස්ස** බුදුරජුන්හට පිදීමි.

2472. මෙයින් දෙයානූවන කපෙහි යම් නෙළුම්මල් පිදීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2473. තෙසැත්තෑවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සතපත්ත** නම් සක්විති රජෙක් වීමි.

2474. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **නළිනකෙසරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**නළිනකෙසරිය ස්ථවිරාවදානය තෙවැනි යි.**

## 244. විරවිපුප්ඵිය ස්ථවිරාවදානය

2475. ලොකනායක වූ (**සිද්ධාර්ථ**) බුදුරජානන් වහන්සේ මාර්ගයෙහි වඩින සේක. එකල්හි (මම) විරවිපුෂ්පයන් ගෙණ (එම) බුදුරජුන්හට පිදීමි.

2476. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2477. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **විරවිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**විරවිපුප්ඵියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 245. කුටිධූපකත්ථෙරාපදානං

2478. **සිද්ධත්ථස්ස** භගවතො අහොසිං කුටිගොපකො,
කාලෙන කාලං ධූපෙසිං පසන්නො සෙහි පාණිහි.

2479. චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං[1] ඵලං.

2480. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුටිධූපකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුටිධූපකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 246. පත්තදායකත්ථෙරාපදානං

2481. පරමෙන දමථෙන **සිද්ධත්ථස්ස** මහෙසිනො,
පත්තදානං මයා දින්නං උජුභූතස්ස තාදිනො.

2482. චතුනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පත්තදානස්සිදං ඵලං.

2483. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පත්තදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පත්තදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 247. ධාතුපූජකත්ථෙරාපදානං

2484. නිබ්බුතෙ ලොකනාථම්හි **සිද්ධත්ථම්හි** නරුත්තමෙ,
ඒකා ධාතු මයා ලද්ධා දිපදින්දස්ස[2] තාදිනො.

2485. තාහං ධාතුං ගහෙත්වාන බුද්ධස්සාදිච්චබන්ධුනො,
පඤ්චවස්සෙ පරිචරිං තිට්ඨන්තං ව නරුත්තමං.

---

1. ධූපදානස්සිදං, මජසං. 2. ද්විපදින්දස්ස, මජසං.

2477. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චිරව්පුපජිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේකි.

**චිරව්පුපජිය සථවිරාවදානය සිවුවැනි සි.**

## 245. කුටිධූපක සථවිරාවදානය

2478. මම **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේගේ ගඳකිළියෙහි වතාවත් කරන්නෙක් වීමි. කලින් කල පහන් සිතැත්තෙම් සියතින් දුම් ගැස්වීමි.

2479. මෙයින් සිවුඅනූවන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය සි.

2480. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කුටිධූපක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේකි.

**කුටිධූපක සථවිරාවදානය පස්වැනි සි.**

## 246. පත්තදායක සථවිරාවදානය

2481. (කාය-වචී-මනො වඞකතාවන්ගෙන් තොර බැවින්) සෘජු ගුණ ඇති (අටලෝ දහම්හි නො සැලෙන බැවින්) තාදී ගුණ යුත් උතුම් වූ දමථයෙන් යුත් **සිද්ධාර්ථ** බුදුරජුන්හට මා විසින් පාත්‍රදානයක් (=පාත්‍රයක්) දෙන ලදී.

2482. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් (පාත්‍ර) දානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පාත්‍රදානයාගේ මේ විපාකය සි.

2483. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පත්තදායක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේකි.

**පත්තදායක සථවිරාවදානය සවැනි සි.**

## 247. ධාතුපූජක සථවිරාවදානය

2484. ලොකනාථ වූ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ පිරිනිවි කල්හි තාදී ගුණ ඇති ද්විපදෙන්තම වූ බුදුරජුන්ගේ එක් ධාතූන් වහන්සේ නමක් මා විසින් ලබන ලදී.

2485. මම ආදිච්චබන්ධු වූ ඒ බුදුරජුන්ගේ ධාතුව රැගෙණ ජීවමාන බුදුරජුන්හට මෙන් අවුරුදු පසක් සේවය කෙළෙමි.

2486. චතුනවුතෙ ඉතො කප්පෙ යං ධාතුං පූජයිං තදා,
දුග්ගතිං නාභිජානාමි ධාතුපට්ඨහනෙ ඵලං.

2487. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ධාතුපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ධාතුපූජකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 248 සත්තලිපුප්ඵපූජකත්ථෙරාපදානං[1]

2488. සත්ත සත්තලිපුප්ඵානි සීසෙ කත්වානහං තදා,
බුද්ධස්ස අභිරොපෙසිං වෙස්සභුම්හි නරුත්තමෙ.

2489. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං[2],
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං[3] ඵලං.

2490. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සත්තලිපුප්ඵපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සත්තලිපුප්ඵපූජකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 249. බිම්බිජාලියත්ථෙරාපදානං

2491. **පදුමුත්තරො** නාම ජිනො සයම්භූ අග්ගපුග්ගලො,
චතුසච්චං පකාසෙති දීපෙති අමතං පදං.

2492. බිම්බිජාලිකපුප්ඵානි[4] පුඤ්ජ කත්වානහං තදා,
බුද්ධස්ස අභිරොපෙසිං දිපදින්දස්ස තාදිනො.

2493. අට්ඨසට්ඨිම්හිතො කප්පෙ චතුරො **කිඤ්ජකෙසරා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2494. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බිම්බිජාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බිම්බිජාලියත්ථෙරස්ස අපදානං නවමං.**

---

1. සත්තලිපුප්ඵියත්ථෙරාපදානං, මජසං. 2. යං පුප්ඵමභිපූජයිං. මජසං.
3. බුද්ධපූජායිදං, මජසං. 4. බිම්බිජාලකපුප්ඵානි, මජසං.

2486. මෙයින් සිවුඅනූවන කපෙහි යම් ධාතු පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ධාතූන්ට උවැටැන් කිරීමෙහි (පිදීමෙහි) මේ විපාකය යි

2487. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ධාතුපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ධාතුපූජක ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 248. සත්තලිපුප්ඵපූජක ස්ථවිරාපදානය

2488. වෙස්සභූ බුදුරජුන් ලොව පහළ වූ කල්හි මම සත්තලි පුෂ්ප (=පලොල් මල්) සතක් හිසෙහි කොට ගෙණවුත් ඒ බුදුරජුන්හට පිදීමි.

2489. මෙයින් එක්තිස්වනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

2490. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සත්තලිපුප්ඵපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සත්තලිපුප්ඵපූජක ස්ථවිරාපදානය අටවැනි යි.**

## 249. බිම්බිජාලිය ස්ථවිරාපදානය

2491. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ අග්‍රපුද්ගල වූ **පදුමුත්තර** බුදුරජතෙම චතුස්සත්‍යය දෙශනා කරයි. අමෘත පදය (=නිවණ) දක්වයි.

2492. එකල්හි මම රත්කරව් මල් කඩා තාදීගුණ ඇති ද්විපදෙත්තම වූ **පදුමුත්තර** බුදුරජුන්හට පිදීමි.

2493. මෙයින් අටසැටවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **කිඤ්ජකෙසර** නම් සිවු සක්විති රජකෙනෙක් වූහ.

2494. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **බිම්බිජාලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**බිම්බිජාලිය ස්ථවිරාපදානය නවවැනි යි.**

## 250. උද්දාලදායකත්ථෙරාපදානං[1]

2495. **කකුසන්ධො** නාම නාමෙන සයම්භූ අපරාජිතො,
පවනා නික්ඛමිත්වාන අනුප්පත්තො මහානදිං.

2496. උද්දාලකං ගහෙත්වාන සයම්භුස්ස අදාසහං,
සංයතස්සුජ්ජුභූතස්ස පසන්නමානසො තදා[2].

2497. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සිදං ඵලං.

2498. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උද්දාලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උද්දාලදායකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

තුවර නාග නළිනා විරවී කුටිධූපකො
පත්තො ධාතු සත්තලියො බිම්බි උද්දාලකෙන ච
සත්තතිංසති ගාථායො ගණිතායො විභාවිහි.

**තුවරදායකවග්ගො පඤ්චවීසතිමො.**

## 251. ථොමකත්ථෙරාපදානං

2499. දෙවලොකෙ ඨිතො සන්තො විපස්සිස්ස මහෙසිනො,
ධම්මං **සුණිත්වා** මුදිතො ඉමං වාචමභාසහං[3].

2500. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
බහුං ජනං[4] තාරයසි දෙසෙන්තො අමතං පදං.

2501. එකනවුතෙ ඉතො කප්පෙ යං වාචමභණිං තදා,
දුග්ගතිං නාභිජානාමි ථොමනාය ඉදං ඵලං.

2502. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ථොමකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ථොමකත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. උද්දාලකදායකත්ථෙරාපදානං, මජසං. 2. අහං, මජසං.
3. වාචං අභාසහං, මජසං. 4. බහුජ්ජනං, මජසං.

## 250. උදකාසනදායක ස්ථවිරාපදානය

2495. සියල්ල තෙමේ ම අවබෝධ කළා වූ පස්මරුන් ජයගත් **කකුසන්ධ** නම් බුදුරජ තෙමේ වැඩවසන විහාරයෙන් නික්ම මහා-නදියට වැඩියේ ය.

2496. මම එකල්හි ඇසළ (මල්) ගෙණ සන්සුන් වූ සෘජු ගුණ ඇති බුදුරජුන්හට පහන් සිත් ඇත්තෙම් පිදීමි.

2497. මෙයින් එක්තිස්වනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම්ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පදානයෙහි මේ විපාකය යි.

2498. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උදකාසනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**උදකාසනදායක ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

තුවරනාග නළින - විරවි කුටිධූපක
පතන ධාතු සතනලිය - බිම්බි උදකාසද
මෙවග වූ දසවත් - සත්තිස් ගයින් බැඳියේ.

**තුවරදායක වග්ගය පස්විසි වැනි යි.**

## 251. ථොමක ස්ථවිරාපදානය

2499. දෙව්ලොව සිටියේ ම **විපස්සී** බුදුරජුන්ගේ ධර්මය අසා සතුටු වූයෙම් මම මේ වචනය කීමි.

2500. පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමය, ඔබවහන්සේට නමස්කාර වේවා. ඔබ අමා පදය (=ධර්මය) දෙසමින් බොහෝදෙන (සසර සයුරින්) එතර කෙරෙහිය (කියා යි.)

2501. මෙයින් එක්අනූවන කපෙහිදී යම් (බුදුරජුන්හට සතුති) වචනයක් කීවෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසතුති කරණයෙහි මේ විපාකය යි.

2502. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **ථොමක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ථොමකස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 252. එකාසනදායකත්ථෙරාපදානං

2503. විජහිත්වා දෙවවණ්ණං සභරියො ඉධාගමිං,
අධිකාරං කත්තුකාමො බුද්ධසෙට්ඨස්ස සාසනෙ.

2504. **දෙවලො** නාම නාමෙන පදුමුත්තරසාවකො,
තස්ස භික්ඛා මයා දින්නා විප්පසන්නෙන චෙතසා.

2505. සතසහස්සෙ ඉතො[1] කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

2506. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකාසනදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 253. චිතකපූජකත්ථෙරාපදානං

2507. **ආනන්දො** නාම සම්බුද්ධො සයම්භූ අපරාජිතො,
අරඤ්ඤෙ පරිනිබ්බායි අමනුස්සම්හි කානනෙ.

2508. දෙවලොකා ඉධාගන්ත්වා චිතං කත්වානහං තදා,
සරීරං තත්ථ ඣාපෙසිං සක්කාරඤ්ච අකාසහං.

2509. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2510. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චිතකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චිතකපූජකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 254. තිචම්පකපුප්ඵියත්ථෙරාපදානං

2511. **හිමවන්තස්ස** අවිදූරෙ[2] **විකතො**[3] නාම පබ්බතො,
තස්ස වෙමජ්ඣෙ වසති සමණො භාවිතින්ද්‍රියො.

2512. දිස්වාන තස්සොපසමං විප්පසන්නෙන චෙතසා,
තීණි චම්පකපුප්ඵානි ගහෙත්වාන සමොකිරිං.

---

1. සතසහස්සිතො කප්පෙ, මජ්සං.
2. හිමවන්තස්සාවිදූරෙ, මජ්සං.
3. විතතො, මජ්සං.

## 252. ඒකාසනදායක ස්ථවිරාපදානය

2503. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සසුනෙහි කුසල් කරණු කැමැත්තෙම් බිරිය සහිත වූයෙම් දෙව් වෙස හැර මෙහි පැමිණියෙමි.

2504 (එකල්හි) දෙවල නම් **පදුමුත්තර** බුදුරජුන්ගේ ශ්‍රාවකයෙක් විය. මා විසින් උන්වහන්සේට පහන් සිතින් භික්ෂාවක් දෙන ලදි.

2505. මෙයින් සියක් දහස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කරණ ලද ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පිණ්ඩපාතදානයාගේ මේ විපාකය යි.

2506. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඒකාසනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ඒකාසනදායක ස්ථවිරාපදානය දෙවැනි යි.**

## 253. චිතකපූජක ස්ථවිරාපදානය

2507. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ **ආනන්ද** නම් සම්බුදු රජ තෙමේ අමනුෂ්‍ය පරිගෘහිත වනයෙහි පිරිනිවන් පා වදාළේය.

2508. මම එකල්හි දෙව්ලොවින් මෙහි පැමිණ චිතකයක් කොට (බුද්ධ) ශරීරය එහි දැවීමි. සත්කාර ද කෙළෙමි.

2509. මෙයින් එක්අනූවනු කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2510. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චිතකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**චිතකපූජක ස්ථවිරාපදානය තෙවැනි යි.**

## 254. තිචම්පකපුප්ඵිය ස්ථවිරාපදානය

2511. හිමවතට නුදුරෙහි **විකත** නම් පර්වතයක් විය. ඒ පර්වතයාගේ මධ්‍යයෙහි වඩන ලද ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙමේ වෙසෙයි.

2512. උන්වහන්සේගේ සන්හුන් බව දැක පැහැදි සිතින් සපු මල් තුණක් ගෙණ විසිරවීමි. (පිදීමි.)

2513. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2514. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිචම්පකපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිචම්පකපුප්ඵියත්ථෙරස්ස අපදානං** චතුත්ථං.

## 255. සත්තපාටලියත්ථෙරාපදානං

2515. කණිකාරංව ජොතන්තං නිසින්නං පබ්බතන්තරෙ,
සත්තපාටලිපුප්ඵානි බුද්ධස්ස අභිරොපයිං.

2516. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2517. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සත්තපාටලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සත්තපාටලියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 256. උපාහනදායකත්ථෙරාපදානං

2518. අහොසි **චන්දනො** නාම සම්බුද්ධස්සත්‍රජො තදා,
එකොපාහනො මයා දින්නො බොධිං සම්පජ්ජ මෙ තුවං.

2519. එකනවුතෙ ඉතො කප්පෙ යමුපාහනං දදිං තදා,
දුග්ගතිං නාභිජානාමි උපාහනස්සිදං ඵලං.

2520. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපාහනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපාහනදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

2513. මෙයින් එක්අනූවනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2514. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තිවම්පකපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිවම්පකපුප්ඵිය ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 255. සත්තපාටලිය ස්ථවිරාපදානය

2515. පර්වතාන්තරයෙහි වැඩහුන්නා වූ පිපුණු කිණිහිරි රුකක් මෙන් බබලන බුදුරජුන්හට පලොල් මල් සතක් පිදීමි.

2516. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2517. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සත්තපාටලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සත්තපාටලිය ස්ථවිරාපදානය පස්වැනි යි.**

## 256. උපාහනදායක ස්ථවිරාපදානය

2518 එකල්හි චන්‍දන නම් බුද්ධපුත්‍රයෙක් විය. මා විසින් උන්වහන්සේට එක් පාවහන් සඟලක් දිනිමි. (දී මෙසේ පැතීමි.) එම්බා පාවහන් සඟල "ඔබ මා (ශ්‍රාවක) බොධියට පමුණුවන්න"යි (කියායි).

2519. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් පාවහන් සඟලක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පාවහන් දනෙහි මේ විපාකය යි.

2520. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් උපාහනදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**උපාහනදායක ස්ථවිරාපදානය සවැනි යි**

## 257. මඤ්ජරිපූජකත්ථෙරාපදානං

2521. මඤ්ජරිකං කරිත්වාන රථියං පටිපජ්ජ'හං,
අද්දසං සමණානග්ගං භික්ඛුසඞ්ඝපුරක්ඛතං.

2522. පසන්නචිත්තො සුමනො පරමාය ච පීතියා,
උභො හත්ථෙහි පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

2523. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

2524. ඉතො තෙසත්තතිකප්පෙ එකො ආසිං මහීපති,
**ජොතියො** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

2525. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මඤ්ජරිපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මඤ්ජරිපූජකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 258. පණ්ණදායකත්ථෙරාපදානං

2526. පබ්බතෙ හිමවන්තම්හි වාකචීරධරො අහං,
අලොණපණ්ණභක්ඛොම්හි නියමෙසු ච සංවුතො.

2527. පාතරාසෙ අනුප්පත්තෙ **සිද්ධත්ථො** උපගච්ඡි මං,
තාහං බුද්ධස්ස පාදාසිං පසන්නො සෙහි පාණිහි.

2528. චතුනවුතෙ[1] ඉතො කප්පෙ යං පණ්ණමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පණ්ණදානස්සිදං ඵලං.

2529. සත්තවීසතිකප්පම්හි රාජා ආසිං **යදත්ථියො**[2],
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2530. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පණ්ණදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පණ්ණදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. චතුනවුතිතො, මජ්ඣං.  2. සදත්ථියො, මජ්ඣං.

## 257. මඤ්ජරිපූජක ස්ථවිරාපදානය

2521. මම මල් කලඹක් කොට ගෙණ වීථියට පිවිසියෙමි. (එහි දී) භික්ෂුසඞ්ඝයා විසින් පිරිවැරුණු ශ්‍රමණාග්‍ර වූ (බුදුරජානන් වහන්සේ) දුටිමි.

2522. පරම ප්‍රීතියෙන් පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් (මල් කලඹ) දෑතින් ගෙණ බුදුරජුන්හට පිදීමි.

2523. මෙයින් දෙයානූවන කපෙහි යම් මල් පිදුමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පපූජාවෙහි මේ විපාකය යි.

2524. මෙයින් තෙසැත්තෑවන කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති ජොතිය නම් සක්විති රජෙක් වීමි.

2525. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් මඤ්ජරිපූජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**මඤ්ජරිපූජක ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 258. පණ්ණදායක ස්ථවිරාපදානය

2526. මම හිමවතෙහි වැහැරි සිවුරු දරන ලුණු රහිතව කොළ අනුභව කරන්නා වූ ශීල සංවෘත තවුසෙක් වෙමි.

2527. පෙරබත පැමිණි කල්හි සිද්ධාර්ථ තථාගත තෙම මා වෙත වැඩියේ ය. මම පහන් වූයෙම් සියතින් (ලුණුරහිතව පිසූ කොළ) බුදුරජුන්හට පිදීමි.

2528. මෙයින් සිවුඅනූවනු කපෙහි වූ එකල්හි යම් පණ්ණදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පණ්ණදානයාගේ මේ විපාකය යි.

2529. සත්විසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සදත්තිය නම් සක්විති රජෙක් වීමි.

2530. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් පණ්ණදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පණ්ණදායක ස්ථවිරාපදානය අටවැනි යි.**

## 259. කුටිදායකත්ථෙරාපදානං

2531. විපිනචාරී සම්බුද්ධො රුක්ඛමූලෙ වසී තදා,
පණ්ණසාලං කරිත්වාන අදාසිං අපරාජිතෙ.

2532. එකනවුතෙ ඉතො[1] කප්පෙ යං පණ්ණකුටිකං අදං,
දුග්ගතිං නාභිජානාමි කුටිදානස්සිදං ඵලං.

2533. අට්ඨවීසෙ[2] ඉතො කප්පෙ සොළසාසිංසු රාජානො[3],
**සබ්බත්ථඅභිවස්සී**ති වුච්චරෙ චක්කවත්තිනො.

2534. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුටිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුටිදායකත්ථෙරස්ස අපදානං නවමං.**

## 260. අග්ගජපුප්ඵියත්ථෙරාපදානං*

2535. සුවණ්ණවණ්ණං සම්බුද්ධං නිසින්නං පබ්බතන්තරෙ,
ඔභාසයන්තං රංසියා[4] **සිඛිනං** සිඛිනං යථා.

2536. අග්ගජං පුප්ඵමාදාය උපගච්ඡිං නරුත්තමං,
පසන්නචිත්තො සුමනො බුද්ධස්ස අභිරොපයිං.

2537. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2538. පඤ්චවීසතිකප්පම්හි අහොසිං **අමිතවහයො**[5],
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2539. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතා බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අග්ගජපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අග්ගජපුප්ඵියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

ථොමකෙකාසන චිතකං චම්පකො සත්තපාටලි
පාහනො[6] මඤ්ජරී පණ්ණං කුටිදො අග්ගපුප්ඵියො
ගාථායො ගණිතා[7] චෙත්ථ එකතාළීසමෙව ච.

**ථොමකවග්ගො ඡබ්බීසතිමො.**

1. එකනවුතිතො, මජසං. 2. අට්ඨතිංසෙ, ස්‍යා. 3. රාජිනො, සීමු.
* අග්ගපුප්ඵියත්ථෙරාපදානං, මජසං. 4. රංසෙන, ස්‍යා 5 අමිතොගතො, මජසං.
6. පාහනි, මජසං. 7. භණිතා, සීමු.

## 259. කුටිදායක ස්ථවිරාපදානය

2531. වනයෙහි හැසිරෙන්නා වූ සම්භූත තෙමේ එකල්හි රුක්මූලක විසීය. මම පස්මරුන් දිනූ උන්වහන්සේට පන්සලක් කරවා දිනිමි.

2532. මෙයින් එක්අනූවනු කපෙහි යම් පණ්කුටියක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කුටිදානයාගේ මේ විපාකය යි.

2533. මෙයින් අටවිසිවනු කපෙහි **සබ්බත්ථඅභිවස්සී** නම් සොළොස් සක්විති රජකෙනෙක් වූහ.

2534. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කුටිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කුටිදායක ස්ථවිරාපදානය නවවැනි යි.**

## 260. අගගජපුප්ඵිය ස්ථවිරාපදානය

2535. කදු අතුරෙහි වැඩනුන්නා වූ සුවණ්ණවණ් වූ රශ්මිය කරණ කොට ගෙණ ගිනි කඳක් මෙන් බබලන සිඛී බුදුරජුන් (දුටිමි.)

2536. මම **අගගජ** නම් වූ මල් ගෙණ බුදුරජුන් වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් (එය) බුදුරජුන්හට පිදීමි.

2537. මෙයින් එක්තිස්වනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2538. පස්විසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අමිත** නම් සක්විති රජෙක් වීමි.

2539. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **අගගජපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**අගගජපුප්ඵිය ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

ථොමක එකාසන - චිතක චම්පක සත්තපාටලි
උපාහන මඤ්ජරී - පණ්ණ කුටිද අගගපුප්ඵිය
එක්සාළිස් ගයකින් - මේ වග නිම කරණ ලදී.

**ථොමකවග්ගය සවිසි වනු යි.**

## 261. ආකාසුක්ඛිපියත්ථෙරාපදානං

2540. සුවණ්ණවණ්ණං සිද්ධත්ථං ගච්ඡන්තං අන්තරාපණෙ,
ජලජග්ගෙ දුවෙ ගය්හ උපගච්ඡිං නරාසභං.

2541. එකඤ්ච පුප්ඵං පාදෙසු බුද්ධසෙට්ඨස්ස නික්ඛිපිං,
එකඤ්ච පුප්ඵං පග්ගය්හ ආකාසෙ උක්ඛිපිං අහං.

2542. චතුනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සිදං ඵලං.

2543. ඉතො බාත්තිංසකප්පම්හි[1] එකො ආසිං මහීපති,
අන්තලික්ඛචරො[2] නාම චක්කවත්තී මහබ්බලො.

2544. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආකාසුක්ඛිපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආකාසුක්ඛිපියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 262. තෙලමක්ඛියත්ථෙරාපදානං

2545. සිද්ධත්ථම්හි භගවති නිබ්බුතම්හි නරාසභෙ,
බොධියා වෙදිකායාහං තෙලං මක්ඛෙසිං තාවදෙ.

2546. චතුනවුතෙ ඉතො කප්පෙ යං තෙලං මක්ඛයිං තදා,
දුග්ගතිං නාභිජානාමි මක්ඛනාය ඉදං ඵලං.

2547. චතුවීසෙ ඉතො කප්පෙ සුච්ඡවී නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2548. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තෙලමක්ඛියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තෙලමක්ඛියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 263. අඩ්ඪචන්දියත්ථෙරාපදානං

2549. **තිස්සස්ස** ඛො භගවතො බොධියා පාදපුත්තමෙ,
අඩ්ඪචන්දං මයා දින්නං ධරණීරුහපාදපෙ.

2550. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බොධිපූජායිදං ඵලං.

---

1. ඡත්තිංසකප්පම්හි, මඡසං. 2. අන්තලික්ඛකරො, මඡසං.

## 261. ආකාසුක්ඛිපිය ස්ථවිරාවදානය

2540. ඇතුළු වීථියෙහි වඩනා වූ ස්වර්ණවර්ණ වූ නරශ්‍රේෂ්ඨ වූ **සිද්ධාර්ථ** බුදුරජුන් (දිටිමි). අග්‍ර ජලජපුෂ්පද්වයක් ගෙණ උන්වහන්සේ වෙත එළඹියෙමි.

2541. එක මලක් බුදුරජුන්ගේ ශ්‍රීපාදයට පිදීමි. එකක් ගෙණ අහසට දැමීමි.

2542. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පදානයාගේ මේ විපාකය යි.

2543. මෙයින් දෙතිස්වනු කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති **අන්තලික්ඛචර** නම් සක්විති රජෙක් වීමි.

2544. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආකාසුක්ඛිපිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ආකාසුක්ඛිපිය ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 262. තෙලමක්ඛිය ස්ථවිරාවදානය

2545. නරශ්‍රේෂ්ඨ වූ **සිදුහත්** බුදුරජුන් පිරිනිවි කල්හි මම (උන්-වහන්සේගේ) බොධි වෙදිකාවෙහි තෙල් ගැල්වීමි.

2546. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් තෙල් ගැල්වීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. තෙල් ගැල්වීමෙහි මේ විපාකය යි.

2547. මෙයින් සූවිසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුච්ඡවි** නම් සක්විති රජෙක් වීමි.

2548. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තෙලමක්ඛිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තෙලමක්ඛිය ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 263. අඩ්ඪචන්දිය ස්ථවිරාවදානය

2549. **තිස්ස** බුදුරජුන්ගේ උතුම් බෝරුක මුල මා විසින් අර්ධචන්ද්‍රා-කාරයෙන් නොයෙක් වර්ණයන්හි මල් පුදන ලදී.

2550. මෙයින් දෙයානූවනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2551. පඤ්චවීසෙ ඉතො කප්පෙ **දෙවලො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2552. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අඩ්ඪචන්දියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අඩ්ඪචන්දියත්ථෙරස්ස අපදානං තතියං.**

## 264. පදීපියත්ථෙරාපදානං*

2553. දෙවභූතො අහං සන්තො ඔරුය්හ පඨවිං තදා,
පදීපෙ පඤ්ච පාදාසිං පසන්නො සෙහි පාණිභි.

2554. චතුනවුතෙ ඉතො කප්පෙ යං පදීපමදං තදා,
දුග්ගතිං නාභිජානාමි දීපදානස්සිදං ඵලං.

2555. පඤ්චපඤ්ඤාසකෙ කප්පෙ එකො ආසිං මහීපති,
**සමන්තචක්ඛු** නාමෙන චක්කවත්තී මහබ්බලො.

2556. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා **පදීපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදීපියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 265. බිළාලිදායකත්ථෙරාපදානං

2557. හිමවන්තස්ස අවිදූරෙ **රොමසො** නාම පබ්බතො,
තම්හි පබ්බතපාදම්හි සමණො භාවිතින්ද්‍රියො.

2558. බිළාලිකෙ[1] ගහෙත්වාන සමණස්ස අදාසහං,
අනුමොදි මහාවීරො සයම්භූ අපරාජිතො.

2559. බිළාලි තෙ මමං[2] දින්නා විප්පසන්නෙන චෙතසා,
භවෙ නිබ්බත්තමානම්හි ඵලං නිබ්බත්තතු තව.

2560. චතුනවුතෙ ඉතො කප්පෙ යං බිළාලිමදාසහං,
දුග්ගතිං නාභිජානාමි බිළාලියා ඉදං ඵලං.

2561. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බිළාලිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බිළාලිදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

---

1. බිළාලියො, මජසං. 2. මම, මජසං.

* පදීපදායකත්ථෙරඅපදානං, මජසං. * අපණ්ණදීපියත්ථෙරාපදානං, මජසං.

2551. මෙයින් පස්විසිවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **දෙවල** නම් සක්විති රජෙක් වීමි.

2552. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **අඩ්ඪචන්දිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**අඩ්ඪචන්දිය ස්ථවිරාවදානය තෙවැනි යි.**

## 264. පදීපිය ස්ථවිරාවදානය

2553. **එකල්හි** දෙවියකු වූ මම පොළොවට බැස පහන් වූයෙම් සියතින් ම පහන් පසක් පිදීමි.

2554 මෙයින් සිවුඅනූවනු කපෙහි යම් ප්‍රදීප පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ප්‍රදීපදානයාගේ මේ විපාකය යි.

2555. පස්පණස්වනු **කපෙහි** පෘථිවීශ්වර වූ **සමන්තචක්ඛු** නම් මහත් බල ඇති සක්විති රජෙක් වීමි.

2556. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් **කරණ** ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පදීපිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පදීපිය ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 265. බිළාලිදායක ස්ථවිරාවදානය

2557. හිමවතට නුදුරෙහි **රොමස** නම් පර්වතයක් විය. ඒ පර්වත පාදයෙහි රක්නා ලද ඉඳුරන් ඇති සම්භපාපී වූ පසේබුදුවරයෙක් විය.

2558. මම බිළාලි නම් අල ගෙණ ගොස් ඒ ශ්‍රමණයන් වහන්සේට දුනිමි. සියල්ල තෙමේ ම දත් මහාවීර වූ පස්මරුන් දිනූ ඒ පසේබුදුරජ-තෙම අනුමොදනාව කෙළේය.

2559. තොප විසින් මට පැහැදි සිතින් බිළාලි අල දෙන ලද ද, (ඒ හෙතුවෙන්) භවයෙහි උපදනා කල්හි තොපට ද එහි ඵල නිපදේවා (කියායි.)

2560. මම මෙයින් සිවුඅනූවනු කපෙහි යම් බිළාලි දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බිළාලිදානයාගේ මේ විපාකය යි.

2561. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **බිළාලිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**බිළාලිදායක ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 266. මච්ඡදායකත්ථෙරාපදානං

2562. චන්දභාගානදීතීරෙ උක්කුසො ආසහං තදා,
මහන්තං මච්ඡං පග්ගය්හ **සිද්ධත්ථ**මුනිනො අදං.

2563. චතුනවුතෙ ඉතො කප්පෙ යං මච්ඡමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මච්ඡදානස්සිදං ඵලං.

2564. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මච්ඡදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මච්ඡදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 267. ජවහංසකත්ථෙරාපදානං

2565. චන්දභාගානදීතීරෙ ආසිං වනචරො තදා,
**සිද්ධත්ථ**මද්දසං බුද්ධං ගච්ඡන්තමනිලඤ්ජසෙ.

2566. අඤ්ජලිම්පග්ගහෙත්වාන උල්ලොකෙන්තො මහාමුනිං,
සකං චිත්තං පසාදෙත්වා අවන්දිං නායකං අහං.

2567. චතුනවුතෙ ඉතො කප්පෙ යම්වන්දිං නරාසභං,
දුග්ගතිං නාභිජානාමි වන්දනාය ඉදං ඵලං.

2568. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ජවහංසකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ජවහංසකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 268. සළලපුප්ඵියත්ථෙරාපදානං

2569. චන්දභාගානදීතීරෙ අහොසිං කින්නරො තදා,
**විපස්සි**මද්දසං බුද්ධං රංසිජාලසමාකුලං.

2570. පසන්නචිත්තො සුමනො පරමාය ච පීතියා,
පග්ගය්හ සලලං පුප්ඵං විපස්සිං ඔකිරිං අහං.

2571. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2572. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සලලපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සලලපුප්ඵියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 266. මච්ඡදායක ස්ථවිරාවදානය

2562. මම **එකල්හි චන්ද්‍රභාගා** නදීතීරයෙහි කබරුස්සෙක් (පක්ෂි-විශෙෂයක්) **වීමි**. මහත් මත්ස්‍යයකු ගෙණ **සිද්ධාර්ථ** බුදුරජුන්හට දුනිමි.

2563. **මෙයින් සිවුඅනූවනු කපෙහි යම් මත්ස්‍යදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි.** මත්ස්‍යදානයාගේ මේ විපාකය යි.

2564. **සිවුපිළිසිඹියාවෝ ද** අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් **කරණ** ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

**මෙහි මේ** අයුරින් ආයුෂ්මත් **මච්ඡදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**මච්ඡදායක ස්ථවිරාවදානය සවැනි යි.**

## 267. ජවහංසක ස්ථවිරාවදානය

2565. එකල්හි මම **චන්ද්‍රභාගා** නදීතීරයෙහි වැද්දෙක් වීමි. අහස්-මගෙහි වඩින්නා වූ **සිදුහත්** බුදුරජුන් දිටිමි.

2566. මම මහාමුනි වූ ඒ බුදුරජුන් බලමින් ඇඳිලි බැඳ සිය සිත පහදවා ලොකනායක වූ උන්වහන්සේට වැඳිමි.

2567. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් බුදුවරයෙකුට වැන්දෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වන්දනාවෙහි මේ විපාකය යි.

2568. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ජවහංසක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ජවහංසක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 268. සලලපුප්ඵිය ස්ථවිරාවදානය

2569. මම එකල්හි **චන්ද්‍රභාගා** නදීතීරයෙහි **කිඳුරෙක්** වීමි. (එහිදී) රශ්මිජාලාවන්ගෙන් ගැවසීගත් **විපස්සී** බුදුරජුන් දිටිමි.

2570. මම පහන් සිතැත්තෙම් සොම්නස් වූයෙම් මහත් වූ ප්‍රීතියෙන් **සලල** (=හොර) මල් ගෙණ ඒ **විපස්සි** බුදුරජුන්හට විසිරවීමි. (=පිදීමි.)

2571. මෙයින් **එක්අනූවන** කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

2572. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සලලපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සලලපුප්ඵිය ස්ථවිරාවදානය අටවැනි යි.**

## 269. උපාගතාසයත්ථෙරාපදානං

2573. හිමවන්තස්ස වෙමජ්ඣෙ සරෙ ආසි සුනිම්මිතො,
තත්ථාහං රක්ඛසො ආසිං හෙඨසීලො භයානකො.

2574. අනුකම්පකො කාරුණිකො **විපස්සී** ලොකනායකො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකෙ[1].

2575. උපාගතං මහාවීරං දෙවදෙවං නරාසභං,
ආසයා අභිනික්ඛම්ම අවන්දිං සත්ථුනො අහං.

2576. එකනවුතෙ ඉතො කප්පෙ යං වන්දිං පුරිසුත්තමං,
දුග්ගතිං නාභිජානාමි වන්දනාය ඉදං ඵලං.

2577. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපාගතාසයො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපාගතාසයත්ථෙරස්ස අපදානං නවමං.**

## 270. තරණියත්ථෙරාපදානං

2578. සුවණ්ණවණ්ණො සම්බුද්ධො **විපස්සී** දක්ඛිණාරහො,
නදීතීරෙ ඨිතො සත්ථා භික්ඛුසඞ්ඝපුරක්ඛතො.

2579. නාවා න විජ්ජතෙ තත්ථ සන්තාරණී මහණ්ණවෙ,
නදියා අභිනික්ඛම්ම තාරෙසිං ලොකනායකං.

2580. එකනවුතෙ ඉතො කප්පෙ යං තාරෙසිං නරුත්තමං,
දුග්ගතිං නාභිජානාමි තරණාය ඉදං ඵලං.

2581. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තරණියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තරණියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

උක්ඛෙපි තෙල චන්දි ච දීපදො ච බිළාලිදො
මච්ඡො ජවො සළලදො රක්ඛසො තරණො දස
ගාථායො චෙත්ථ සඞ්ඛාතා තාළීසං චෙකමෙව ච.

**ආකාසුක්ඛිපියවග්ගො සත්තවීසතිමො.**

1. සන්තිකං, මජසං.

## 269. උපාගතාසය ස්ථවිරාපදානය

2573. හිමවත මැද මැනවින් නිම කළ විලක් විය. මම එහි අනුන් වෙහෙසන සුළු භයානක රකුසෙක් වීමි.

2574. අනුකම්පාව ඇති කරුණාවත් වූ ඒ **විපස්සී** බුදුරජ තෙම මා (ඒ දරුණු ජීවිතයෙන්) ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේ ය.

2575. මම එසේ පැමිණියා වූ මහාවීර වූ දෙවියනට දෙවි වූ නර-ශ්‍රෙෂ්ඨ වූ (උන්වහන්සේ දිටිමි) (දැක) වසන තැනින් නික්ම ශාස්තෘන් වහන්සේට වැන්දෙමි.

2576. මෙයින් එක්අනූවන කපෙහි පුරුෂොත්තම වූ බුදුරජුන්හට යම් වැඳීමක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වැඳීමෙහි මේ විපාකය යි.

2577. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උපාගතාසය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි·

**උපාගතාසය ස්ථවිරාපදානය නවවැනි යි.**

## 270. තරණීය ස්ථවිරාපදානය

2578. දක්ෂිණාර්හ වූ සවර්ණවර්ණ වූ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලද ශාස්තෘ වූ **විපස්සී** බුදුරජ තෙම ගංතෙරෙහි සිටියේය.

2579. මහගඟ තරණය කරණ නැවක් එහි නො විය. මම ගඟින් නික්ම අවුත් ලොකනායක වූ ඒ බුදුරජුන් එතර කරවීමි.

2580. මෙයින් එක්අනූවනු කපෙහි බුදුරජුන් ගඟින් එතර කිරීම් සඞ්ඛ්‍යාත යම් පින්කමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුදුරජුන් එතර කිරීමෙහි මේ විපාකය යි.

2581. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තරණීය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තරණීය ස්ථවිරාපදානය දසවැනි යි.**

උද්දානය:

උක්ඛිපී තෙලචන්දී - දීපද හා බිළාලිද
මච්ඡජල සලලද - රක්ඛස තරණ යී දස
එක්සාළිස් ගයකින් - මෙම වග කියා නිම විනි.

**ආකාශොත්ක්ෂෙප වර්ගය සත්විසිවනු යි.**

## 271. සුවණ්ණබිම්බොහනියත්ථෙරාපදානං

2582. එකාසනං අහමදං පසන්නො සෙහි පාණිහි,
බිම්බොහනඤ්ච පාදාසිං උත්තමත්ථස්ස පත්තියා.

2583. එකනවුතෙ ඉතො කප්පෙ බිම්බොහනමදාසහං,
දුග්ගතිං නාභිජානාමි බිම්බොහනස්සිදං ඵලං.

2584. ඉතො තෙසට්ඨිමෙ කප්පෙ **අසමො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2585. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුවණ්ණබිම්බොහනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුවණ්ණබිම්බොහනියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 272. තිලමුට්ඨිදායකත්ථෙරාපදානං

2586. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකග්ගනායකො,
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි.

2587. සත්ථාරමුපසඞ්කන්තං වන්දිත්වා පුරිසුත්තමං,
පසන්නචිත්තො සුමනො තිලමුට්ඨිමදාසහං.

2588. එකනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි තිලමුට්ඨ්‍යා[2] ඉදං ඵලං.

2589. ඉතො සොළසකප්පම්හි **නන්දියො**[3] නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2590. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිලමුට්ඨිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිලමුට්ඨිදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 273. චඞ්ගොටකියත්ථෙරාපදානං*

2591. මහාසමුද්දං නිස්සාය වසතෙ පබ්බතන්තරෙ,
පච්චුග්ගන්ත්වාන කත්වාන චඞ්ගොටකමදාසහං.

2592. **සිද්ධත්ථස්ස** මහෙසිනො සබ්බසත්තානුකම්පිනො,
පුප්ඵචඞ්ගොටකං දත්වා කප්පං සග්ගම්හි මොදහං.

---

2. තිලමුට්ඨිසිදං, මජ්ඣං. 3. නන්දිනො, මජ්ඣං. ඛත්තියො, සී.
* චඞ්ගොටකියත්ථෙරාපදානං, මජ්ඣං.

## 271. සුවණ්ණබිම්බොහනිය ස්ථවිරාපදානය

2582. උත්තමාර්ථය වූ නිවන් ලබනු පිණිස මම සියතින් එක් අසුනක් දිනිමි. බිම්බොහන (=මෙට්ට)යක් ද දිනිමි.

2583. මෙයින් එක්අනූවන කපෙහි මම යම් බිම්බොහන දානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බිම්බොහන දානයාගේ මේ විපාකය යි.

2584. මෙයින් තෙසැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අසම නම් සක්විති රජෙක් වීමි.

2585. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් බිම්බොහනිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සුවණ්ණබිම්බොහනිය ස්ථවිරාපදානය පළමුවැනි යි.**

## 272. තිලමුට්ඨිදායක ස්ථවිරාපදානය

2586. ලොකනායක වූ ශාස්තෘ තෙමේ මාගේ අදහස දැන මනොමය වූ කයින් හෙවත් චිත්ත ගතියට හැර වූ සිරුරින් යුතුව ඍද්ධියෙන් (මා වෙත) එළඹියේ ය.

2587. මම එසේ එළඹියා වූ පුරුෂොත්තම වූ ශාස්තෘන් වහන්සේට වැඳ පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් තල මිටක් දිනිමි.

2588. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් තිලදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. තලමිටක් දීමෙහි මේ විපාකය යි.

2589. මෙයින් සොළොස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති නන්දිය නම් සක්විති රජෙක් වීමි.

2590. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් තිලමුට්ඨිදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තිලමුට්ඨිදායක ස්ථවිරාපදානය දෙවැනි යි.**

## 273. චඞ්කොටකිය ස්ථවිරාපදානය

2591. සිද්ධාර්ථ බුදුරජ තෙම මහසයුර ඇසුරු කොට ඇති කඳු අතරක වැඩ වෙසෙයි. මම (මල්) ගොටුවක් සාදා ගෙණ උන්වහන්සේට පෙර ගමන් කොට එය පිළිගැන්වීමි.

2592. මම සියලු සත්ත්වයනට හිතානුකම්පා ඇති සිදුහත් බුදුරජුන් හට මල්ගොටුව පිළිගන්වා (ඒ හෙතුවෙන්) කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටු වීමි.

2593. චතුන්නවුතෙ ඉතො කප්පෙ චඞ්කොටකමදං තදා,
දුග්ගතිං නාභිජානාමි චඞ්කොටකස්සිදං ඵලං.

2594. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චඞ්කොටකියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චඞ්කොටකියත්ථෙරස්ස අපදානං තතියං.**

## 274. අබ්භඤ්ජනදායකත්ථෙරාපදානං

2595. කොණ්ඩඤ්ඤස්ස භගවතො වීතරාගස්ස තාදිනො,
ආකාසසමචිත්තස්ස[1] නිප්පපඤ්චස්ස ඣායිනො.

2596. සබ්බමොහාතිවත්තස්ස සබ්බලොකහිතෙසිනො,
අබ්භඤ්ජනං මයා දින්නං දිපදින්දස්ස සත්ථුනො.

2597. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ අබ්භඤ්ජනමදං තදා,
දුග්ගතිං නාභිජානාමි අබ්භඤ්ජනස්සිදං ඵලං.

2598. ඉතො පණ්ණරසෙ කප්පෙ **චිරප්පො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2599. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අබ්භඤ්ජනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අබ්භඤ්ජනදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 275. එකඤ්ජලියත්ථෙරාපදානං

2600. උදුම්බරෙ වසන්තස්ස නියතෙ පණ්ණසන්ථරෙ,
වුත්ථොකාසො මයා දින්නො සමණස්ස මහෙසිනො.

2601. **තිස්සස්ස** දිපදින්දස්ස ලොකනාථස්ස තාදිනො,
අඤ්ජලිං පග්ගහෙත්වාන සන්ථරිං පුප්ඵසන්ථරං.

2602. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කරිං පුප්ඵසන්ථරං,
දුග්ගතිං නාභිජානාමි සන්ථරස්ස ඉදං ඵලං.

1. අකාසසමචිත්තස්ස, අට්ඨ.

2593. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි (එසේ) මල් ගොටුවක් පිදුයෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මල් ගොටුවක් පිදීමෙහි මේ විපාකය යි.

2594. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චඞ්ගොටකිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**චඞ්ගොටකිය ස්ථවිරාවදානය තෙවැනියි.**

## 274. අබ්භඤ්ජනදායක ස්ථවිරාවදානය

2595-2596. වීතරාගී වූ තාදී ගුණ ඇති ආකාශය සමව පැතුරුණු (මෙත්) සිත් ඇති ප්‍රමාද විහරණ නැති ධ්‍යාන කරන්නාවූ සියලු මුළා වීම් ඉක්ම වූ සකල ලොක හිතෛෂී භාවයෙන් යුත් ද්විපදොත්තම වූ භාග්‍යවත් **කොණ්ඩඤ්ඤ** බුදුරජුන්හට මා විසින් ආලෙපන තෛලයක් දෙන ලදී.

2597. මෙයින් අසඞ්ඛ්‍ය කල්පයකට පෙර වූ එකල්හි (යම්) ආලෙපන තෛලයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ආලෙපන තෛල දානයාගේ මේ විපාකය යි.

2598. මෙයින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **චිරප්ප** නම් සක්විති රජෙක් වීමි.

2599. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අබ්භඤ්ජනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අබ්භඤ්ජනදායක ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 275. එකඤ්ජලිය ස්ථවිරාවදානය

2600. දිඹුල් ගස් සෙවනෙහි නියමිත කොළ ඇතිරියක වසන්නාවූ මහර්ෂි වූ **තිස්ස** බුදුරජානන් වහන්සේට මා විසින් විසුමට තැනක් දෙන ලදී.

2601. ලොකනාථ වූ තාදී ගුණ ඇති ඒ **තිස්ස** බුදුරජානන් වහන්සේට ඇඳිලි බැඳ මල් ඇතිරියක් අතුළෙමි.

2602. මෙයින් දෙයානූවන කපෙහි යම් මල් ඇතිරියක් පූජා කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මල් ඇතිරිය දීමෙහි මේ විපාකය යි.

2603. ඉතො චුද්දසකප්පම්හි අහොසිං මනුජාධිපො,
**එකඤ්ජලිකො** නාම චක්කවත්ති මහබ්බලො.

2604. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකඤ්ජලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකඤ්ජලියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 276. පොත්ථදායකත්ථෙරාපදානං

2605. සත්ථාරං ධම්මමාරබ්භ සඞ්ඝඤ්චාපි මහෙසිනං[1],
පොත්ථදානං මයා දින්නං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ

2606. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පොත්ථදානස්සිදං ඵලං.

2607. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පොත්ථදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**පොත්ථදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 277. චිතකපූජකත්ථෙරාපදානං

2608. චන්දභාගානදීතීරෙ අනුසොතං වජාමහං,
සත්ත මාලුවපුප්ඵානි චිතමාරොපයිං[2] අහං.

2609. චතුනවුතෙ ඉතො කප්පෙ චිතකං යං අපූජයිං,
දුග්ගතිං නාභිජානාමි චිතපූජායිදං[3] ඵලං.

2610. සත්තසට්ඨිමිතො කප්පෙ **පච්ජග්ගසනාමකා**,
සත්තරතනසම්පන්නා සත්තාසුං චක්කවත්තිනො.

2611. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චිතකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චිතකපූජකත්ථෙරස්ස අපදානං සත්තමං.**

---

1. මහෙසිනො, සීමු. 2 චිතකමාරොපයිං, සීමු. 3 චිතකපූජායිදං, සීමු.

2603. මෙයින් තුදුස්වන කපෙහි මනුජාධිපති වූ මහත් බල ඇති **එකඤ්ජලික** නම් සක්විති රජෙකිම් වීමි.

2604. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකඤ්ජලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකඤ්ජලිය ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 276. පොත්ථදායක ස්ථවිරාවදානය

2605. මහර්ෂි වූ බුදුරජුන් හා ධර්මය හං සඞ්ඝයා හා ඇරබ අනුත්තර දක්‍ෂිණාගී බුදුරජුන් කෙරෙහි මං විසින් නියඳ වතක් දෙන ලදී.

2606. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි (එම වස්ත්‍රදානය කිරීම් වශයෙන්) යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (බුමුතුරුණු සඳහා දුන්) ඒ නියඳ වස්ත්‍රදානයාගේ මේ විපාක යි.

2607. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පොත්ථදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පොත්ථදායක ස්ථවිරාවදානය සවැනි යි.**

## 277. චිතකපූජක ස්ථවිරාවදානය

2608. මම **චන්ද්‍රභාගා** ගං ඉවුරෙහි යටි ගං බලා යමි. (එහි දී) මාලුව මල් සතක් ගෙණ (වැලිවලින් සෑයක් කොට එම) චිතකයට පිදීමි.

2609. මෙයින් සිවුඅනූවන කපෙහි යම් චිතක පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. චිතක පූජාවෙහි මේ විපාක යි.

2610. මෙයින් සත්සැටවන කපෙහි සත්රුවනින් යුත් **පටිජග්ග** යන නම් ඇති සත් සක්විති රජකෙනෙක් වූහ.

2611. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චිතකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**චිතකපූජක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 278. ආළුවදායකත්ථෙරාපදානං

2612. පබ්බතෙ හිමවන්තම්හි **මහාභික්ඛු** සුදස්සනො,
තත්ථද්දසං වීතරාගං සප්පභාසං **සුදස්සනං**.

2613. පරමොපසමෙ යුත්තං දිස්වා විම්හිතමානසො,
ආළුවං තස්ස පාදාසිං පසන්නො සෙහි පාණිහි.

2614. එකතිංසෙ ඉතො කප්පෙ යමාළුවමදං[1] තදා,
දුග්ගතිං නාභිජානාමි ආළුවස්ස ඉදං ඵලං.

2615. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආළුවදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආළුවදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 279. එකපුණ්ඩරීකත්ථෙරාපදානං

2616. **රෙවතො** නාම නාමෙන සයම්භූ සුබ්බතො[2] තදා,
පුණ්ඩරීකං මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

2617. චතුනවුතෙ ඉතො කප්පෙ පුණ්ඩරීකමදං තදා,
දුග්ගතිං නාභිජානාමි පුණ්ඩරීකස්සිදං ඵලං.

2618. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකපුණ්ඩරීකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකපුණ්ඩරීකත්ථෙරස්ස අපදානං නවමං.**

## 280. තරණියත්ථෙරාපදානං

2619. මහාපථම්හි විසමෙ සෙතු කාරාපිතො මයා,
තරණත්ථාය ලොකස්ස පසන්නො සෙහි පාණිහි.

2620. එකනවුතෙ ඉතො කප්පෙ සෙතු කාරාපිතො මයා,
දුග්ගතිං නාභිජානාමි සෙතුදානස්සිදං ඵලං.

2621. පඤ්චපඤ්ඤාසිතො කප්පෙ එකො ආසිං **සමොගධො**,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2622. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තරණියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තරණියත්ථෙරස්ස අපදානං දසමං.**

---

1. ඵලමදදිං, මජසං. 2. සප්පනො, ස්‍යා.

## 278. ආලුවදායක ස්ථවිරාවදානය

2612-2613. හිමවත් පර්වතෙහි සුදර්ශනීය වූ මහාසින්ධු නම් නදියකි. පැහැපත් වූ ඉතා සත්හුන් බැව්හි යෙදුනු **සුදස්සන** නම් රහතන් වහන්සේ දුක විසම්ත වූ සිත් ඇත්තෙම් පහන් සිතින් යුතුව සියතින් ම උන්වහන්සේට අල (කැබැල්ලක්) පිළිගැන් වීමි.

2614. මෙයින් එක්තිස්වන කපෙහි යම් ආලුව දානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ආලුව (=අල) දානෙහි මේ විපාක යි.

2615. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආලුවදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ආලුවදායක ස්ථවිරාවදානය අටවැනි යි.**

## 279. එකපුණ්ඩරීක ස්ථවිරාවදානය

2616. එකල්හි මනා වුත ඇති සියල්ල තෙමේ ම අවබොධ කරගත් නමින් **රොමස** නම් බුදුවරයෙක් විය. මා විසින් පැහැදි සිතින් (උන්වහන්සේට) පියුමක් දෙන ලදි.

2617. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පියුමක් දුනිම් ද, (ඒ හෙතු-වෙන්) දුගතියක් නො දනිමි. පුණ්ඩරීකදානයාගේ මේ විපාක යි.

2618. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකපුණ්ඩරීක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**එකපුණ්ඩරීක ස්ථවිරාවදානය නවවැනි යි.**

## 280. තරණිය ස්ථවිරාවදානය

2619. මා විසින් ලෝවැස්සන්ගේ ගමනාගමනය පිණිස පහන් සිත් ඇත්තේ විසම වූ මහමගෙහි සියතින් ම හෙයක් (=ඒදණ්ඩක්) කරවන ලදී.

2620. මෙයින් එක්අනූවන කපෙහි මා විසින් යම් හෙයක් කරවන ලද ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. හෙය දීමෙහි මේ විපාක යි.

2621. මෙයින් පස්පණස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සමොගධ** නම් සක්විති රජෙකිම් වීමි.

2622. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තරණිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තරණිය ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානං:

සුවණ්ණං තිලමුට්ඨී ච චඞ්ගොටබහඤ්ජ අඤ්ජලී
පොත්ථකො චිත මාලුවො එකපුණ්ඩරී සෙතුනා
ඡචත්තාළීසගාථායො ගණිතායො විභාවිහි.

**සුවණ්ණබිම්බොහනවග්ගො අට්ඨවීසතිමො.***

## 281. පණ්ණදායකත්ථෙරාපදානං

2623. පණ්ණසාලෙ නිසින්නොම්හි පණ්ණභොජනභොජනො,
උපවිට්ඨඤ්ච මං සන්තං උපාගච්ඡි මහාමුනි[1].

2624. **සිද්ධත්ථො** ලොකපජ්ජොතො සබ්බලොකතිකිච්ඡකො,
තස්ස පණ්ණං මයා දින්නං නිසින්නං[2] පණ්ණසන්ථරෙ.

2625. චතුනවුතෙ ඉතො[3] කප්පෙ යං පණ්ණමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පණ්ණදානස්සිදං ඵලං.

2626. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පණ්ණදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පණ්ණදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 282. ඵලදායකත්ථෙරාපදානං

2627. සිනෙරුසමසන්තොසො ධරණීධරසාදිසො,
වුට්ඨහිත්වා සමාධිම්හා භික්ඛාය මමුපට්ඨිතො.

2628. හරීතකං ආමලකං අම්බ ජම්බු විභීටකං,
කොලං භල්ලාතකං බිල්ලං ඵාරුසකඵලානි ච.

2629. **සිද්ධත්ථස්ස** මහෙසිස්ස සබ්බලොකානුකම්පිනො,
තඤ්ච සබ්බං මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

2630. චතුනවුතෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

2631. සත්තපඤ්ඤාසිතො කප්පෙ **එකජෙට්ඨො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2632. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඵලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඵලදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

* එකාදසමං භාණවාරං, මජසං.

1. මහාඉසි, මජසං. 2. නිසින්නස්ස, ස්‍යා. 3. චතුන්නවුතිතො, මජසං.

උද්දානය:

සුවණ්ණ තිල මුට්ඨි - චඞ්ගොටබහඤ්ජ අඤ්ජලී
පොත්ථක චිත මාලුව - එක පුණ්ඩරීක සෙතු දස
දෙසාළිස් ගයකින් - මෙම වග නිම කරණ ලදි.

**සුවණ්ණබිබ්බොහන වර්ගය අටවිසිවනු සි.**

## 281. පණ්ණදායක ස්ථවිරාපදානය

2623-2624. මම පර්ණභොජන අනුභවයෙහි (කොළ බුදීමෙහි) යෙදුනෙම් පන්සලක හුන්නෙම් වෙමි. මුළු ලොවට වෙදකු වැනි වූ ලොව බබුළුවන්නා වූ සිද්ධාර්ථ සර්වඥයන් වහන්සේ (එසේ) හුන් මා වෙත එළඹි සේක. එළඹ කොළ ඇතිරියෙහි වැඩහුන් උන්වහන්සේට (කෑම සඳහා තවන ලද) කොළයක් මා විසින් දෙන ලදි.

2625. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් (කෑමට පිළියෙල කළ) කොළයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පර්ණදානයාගේ මේ විපාක සි.

2626. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පණ්ණදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පර්ණදායක ස්ථවිරාපදානය පළමුවැනි සි.**

## 282. ඵලදායක ස්ථවිරාපදානය

2627. සිනෙරු පර්වතය මෙන් ශාන්ත වූ මහමෙර මෙන් ස්ථිර වූ ඒ සිද්ධාර්ථ භාග්‍යවත් තෙමේ සමාධියෙන් නැගිට පිඬු පිණිස මා වෙත එළඹියේ ය.

2628-2629. අරළු, නෙල්ලි, අඹ, දඹ, බුළු, ඩෙබර, බදුලු, බෙලි, බොරළු දමනු යන ගෙඩි දුසි ඒ සියල්ල මුළු ලොවට අනුකම්පා කරන්නා වූ සිදුහත් බුදුරජුන් හට පැහැදි සිතින් මා විසින් දෙන ලදි.

2630. මෙයින් සිවුඅනූවනු කපෙහි වූ එකල්හි යම් පලතුරු දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පලතුරු දනෙහි මේ විපාක සි.

2631. මෙයින් සත්පණස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **එකජඣ** නම් සක්විති රජෙකිම් වීමි.

2632. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඵලදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ඵලදායක ස්ථවිරාපදානය දෙවැනි සි.**

## 283. පච්චුග්ගමනියත්ථෙරාපදානං

2633. සීහං යථා වනචරං නිසභාජානියං යථා,
කකුධං විලසන්තංව ආගච්ඡන්තං නරාසභං.

2634. සිද්ධත්ථං ලොකපජ්ජොතං සබ්බලොකතිකිච්ඡකං,
අකාසිං පච්චුග්ගමනං විප්පසන්නෙන චෙතසා.

2635. එකනවුතෙ ඉතො කප්පෙ පච්චුග්ගච්ඡිං නරාසභං,
දුග්ගතිං නාභිජානාමි පච්චුග්ගමනෙ ඉදං ඵලං.

2636. සත්තවීසෙ ඉතො කප්පෙ එකො ආසිං ජනාධිපො,
**සපරිවාරොති** නාමෙන චක්කවත්තී මහබ්බලො.

2637. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පච්චුග්ගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පච්චුග්ගමනියත්ථෙරස්ස අපදානං තතියං.**

## 284. එකපුප්ඵියත්ථෙරාපදානං

2638. දක්ඛිණම්හි ද්වාරම්හි පිසාචො ආසහං තදා,
අද්දසං විරජං බුද්ධං පීතරංසිං'ව භාණුමං.

2639. විපස්සිස්ස නරග්ගස්ස සබ්බලොකහිතෙසිනො,
එකපුප්ඵං මයා දින්නං දිපදින්දස්ස තාදිනො.

2640. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2641. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකපුප්ඵියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 283. පච්චුග්ගමනිය ස්ථවිරාපදානය

2633-2634. වනයෙහි (එකලාව) හැසිරෙන්නා වූ සිංහයකු මෙන් ද ශ්‍රේෂ්ඨ ආජානියයකු මෙන් ද බබලන්නා වූ කුඹුක් ගසක් මෙන් ද (කෙලෙශ රොගයෙන් පෙළෙන) සකල ලොකයාට වෛද්‍යවරයකු මෙන් ද ලොව බබුළුවන්නා වූ නරශ්‍රෙෂ්ඨ වූ (ඉදිරියට) වඩින **සිද්ධාත්** බුදුරජුන් (දුක) පැහැදි සිතින් පෙර ගමන් කෙළෙමි.

2635. මෙයින් එක්අනූවනු කපෙහි බුදුරජුන්හට පෙර ගමන් කෙළෙමි ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පෙර ගමන් කිරීමෙහි මේ විපාක යි.

2636. මෙයින් සත්විසිවෙනි කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති **සපරිවාර** නම් සක්විති රජෙකිම් වීමි.

2637. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **පච්චුග්ගමනිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පච්චුග්ගමනිය ස්ථවිරාපදානය තෙවැනි යි.**

## 284. එකපුප්ඵිය ස්ථවිරාපදානය

2638. මම එකල්හි දකුණු දෙරටුවෙහි පිසාචයෙකිම් වීමි. (එහි)දී පිතවණි රස් ඇති (උදුවන) හිරු වැනි වූ කෙලෙස් රජස් නැති බුදුරජුන් දිටිමි.

2639. සබ්ලොකහිතෙෂී වූ නරශ්‍රෙෂ්ඨ වූ ද්විපදෙන්ත්තම වූ තාදී ගුණ ඇති **විපස්සී** බුදුරජුන්හට මා විසින් එක් මලක් පුදන ලදී.

2640. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් පුෂ්පදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2641. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් **එකපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකපුප්ඵිය ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 285. මඝවපුප්ඵියත්ථෙරාපදානං

2642. නම්මදානදියා තීරෙ සයම්භූ අපරාජිතො,
සමාධිං සො සමාපන්නො විප්පසන්නො අනාවිලො.

2643. දිස්වා පසන්නො සුමනො සම්බුද්ධං අපරාජිතං,
තාහං මඝවපුප්ඵෙන සයම්භුං පූජයිං තදා.

2644. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2645. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මඝවපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මඝවපුප්ඵියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 286. උපට්ඨාකදායකත්ථෙරාපදානං

2646. රථියං පටිපජ්ජන්තං ආහුතීනං පටිග්ගහං,
දිපදින්දං මහානාගං ලොකජෙට්ඨං නරාසභං.

2647. පක්කොසාපිය තස්සාහං සබ්බලොකහිතෙසිනො,
උපට්ඨාකො මයා දින්නො **සිද්ධත්ථස්ස** මහෙසිනො.

2648. පටිග්ගහෙත්වා සම්බුද්ධො නිය්‍යාතෙසි මහාමුනි,
උට්ඨාය ආසනා තම්හා පක්කාමි පාචිනාමුඛො.

2649. චතුනවුතෙ ඉතො කප්පෙ උපට්ඨාකමදං තදා,
දුග්ගතිං නාභිජානාමි උපට්ඨානස්සිදං ඵලං.

2650. සත්තපඤ්ඤාසිතො කප්පෙ **බලසෙන** සනාමකො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2651. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපට්ඨාකදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උපට්ඨාකදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨමං.**

## 285. මසවපුප්ඵිය ස්ථවිරාපදානය

2642. නම්මදා නදී තීරයෙහි පස් මරුන් දිනූ බුදුවරයෙක් විය. නො කැලඹුනා වූ පහන් සිත් ඇති හෙතෙම සමාධියට සමවැදුනේ විය.

2643. පහන් වූ සොම්නස් වූ මම අපරාජිත වූ එම සම්බුද්ධයන් වහන්සේ දැක එකල්හි එම බුදුරජුන් හට මසව නම් වූ මලින් පිදීමි.

2644. මෙයින් එක්අනූවනු කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2645. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් මසවපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**මසවපුප්ඵියස්ථවිරාපදානය පස්වැනි යි.**

## 286. උපට්ඨාකදායක ස්ථවිරාපදානය

2646. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ද්විපදෙන්තම වූ නරශ්‍රෙෂ්ඨ වූ වීථියට පිවිසෙන බුදුරජුන් (දිටිමි.)

2647. මම (උපස්ථායකයකු) කැඳවා සර්වලොක හිතෛෂී වූ ඒ සිදුහත් බුදුරජුන් හට මා විසින් (ඒ) උපස්ථායකයා දෙන ලදී.

2648. මහාමුනි වූ සම්බුද්ධ තෙමේ (උපස්ථායකයා) පිළිගෙණ (ආපසු මට පාවා දුනි) ඉක්බිති එම අසුනෙන් නැගිට ප්‍රාචීන දිශාභිමුඛව (=නැගෙනහිරට මුහුන ලා) වැඩියේ ය.

2649. මෙයින් සිවුඅනූවන කපෙහි උපස්ථායකයකු දිනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (උපස්ථායකදානයෙහි) උච්චැනෙහි මේ විපාක යි.

2650. මෙයින් සත්පණස්වනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති බලසේන නම් සක්විති රජෙකිම් වීමි.

2651. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් උපට්ඨාකදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**උපට්ඨාකදායක ස්ථවිරාපදානය සවැනි යි.**

## 287. අපදානියත්ථෙරාපදානං

2652. අපදානං සුගතානං කිත්තයිං’හං මහෙසිනං,
පාදෙ ච සිරසා වන්දිං පසන්නො සෙහි පාණිහි.

2653. ද්වෙනවුතෙ ඉතො කප්පෙ අපදානං පකිත්තයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

2654. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අපදානියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අපදානියත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 288. සත්තාහපබ්බජිතත්ථෙරාපදානං

2655. විපස්සිස්ස භගවතො සඞ්ඝො සක්කතමානිතො,
ව්‍යසනං මෙ අනුප්පත්තං ඤාතිභෙදෙ පුරෙ අහු.

2656. පබ්බජ්ජමුපගන්ත්වාන ව්‍යසනූපසමාය’හං
සත්තාහාභිරතො තත්ථ සත්ථුසාසනකම්‍යතා.

2657. එකනවුතෙ ඉතො කප්පෙ යමහං පබ්බජිං තදා,
දුග්ගතිං නාභිජානාමි පබ්බජ්ජාය ඉදං ඵලං.

2658. සත්තසට්ඨිමිතො කප්පෙ සත්ත ආසුං මහීපතී,
**සුනික්ඛමා**ති ඤායන්ති චක්කවත්තී මහබ්බලා.

2659. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සත්තාහපබ්බජිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සත්තාහපබ්බජිතත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 289. බුද්ධුපට්ඨාකත්ථෙරාපදානං

2660. **වෙටම්බරීති**[1] මෙ නාමං පිතුසන්තං මමං තදා,
මම හත්ථං ගහෙත්වාන උපානයි මහාමුනිං.

2661. ඉමෙ මං උද්දිසිස්සන්ති බුද්ධා ලොකග්ගනායකා,
තෙ’හං උපට්ඨිං සක්කච්චං පසන්නො සෙහි පාණිහි.

---

1. වොටම්භිනීති. මජසං. වෙධම්භිනීති, සයා.

## 287. අපදනීය සථවිරාවදානය

2652. මම මහර්ෂී වූ බුදුරජුන්හට තථාගතයන්ගේ අපදානය පැවසීමි. පහන් වූයෙම් සියතින් ශ්‍රීපාදයන් ද හිස නමා වැන්දෙමි.

2653. මෙයින් දෙයානූවන කපෙහි යම් සුගතාපදානයක් පැවසූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අපදාන කීර්තනයෙහි (=තථාගතචරිතය පැසසීමෙහි) මේ විපාක යි.

2654. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **අපදනීය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අපදනීය සථවිරාවදානය සත්වැනි යි.**

## 288. සතතාහපබ්බජිත සථවිරාවදානය

2655. මා විසින් **විපස්සී** බුදුරජුන්ගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සත්කාර හා බුහුමන් කරණ ලදුයේ විය. මට ආපදාවක් පැමිණියේ ය. පෙර ඤාතීන් අතර භෙදයක් ඇති විය.

2656. මම ඒ උවදුරින් සත්සිඳීම පිණිස බුදුසස්නෙහි රිසියෙන් පැවිදිව සතියක් එහි ඇලුනෙම් විසීමි.

2657. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් හෙයකින් මම් පැවිදි වූයෙම් ද (ඒ පැවිදි වීම හෙතු කොට ගෙණ) දුගතියක් නො දනිමි. පැවිද්දෙහි මේ විපාක යි.

2658. මෙයින් සත්සැටවනු කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති **සුනික්ඛම** නම් වූ සත් සක්විති රජකෙනෙක් වූහ.

2659. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සතතාහපබ්බජිත** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සතතාහපබ්බජිත සථවිරාවදානය අටවැනි යි.**

## 289. බුද්ධූපට්ඨාක සථවිරාවදානය

2660-2661. මාගේ නම **වෙටම්බරී** ය. එකල්හි මාගේ පියතෙම මේ ලොකාග්‍රනායක වූ බුදුවරු මට දහම් දෙසන්නාහු යයි කියා මාගේ අත ගෙණ බුදුරජුන් වෙත පැමිණ විය. මම පහන් වූයෙම් සියතින් උන්වහන්සේට මැනවින් උපසථාන කෙළෙමි.

2662. එකතිංසෙ ඉතො කප්පෙ බුද්ධෙ පරිචරිං තදා,
දුග්ගතිං නාභිජානාමි උපට්ඨානස්සිදං ඵලං.

2663. තෙවීසම්හි ඉතො කප්පෙ චතුරො ආසු ඛත්තියා,
**සමණුපට්ඨාකා**[1] නාම චක්කවත්තී මහබ්බලා.

2664. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බුද්ධුපට්ඨාකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**බුද්ධුපට්ඨාකත්ථෙරස්ස අපදානං නවමං.**

## 290. පුබ්බඞ්ගමියත්ථෙරාපදානං

2665. චුල්ලාසීතිසහස්සානි පබ්බජිම්හ අකිඤ්චනා,
තෙසං **පුබ්බඞ්ගමො** ආසිං උත්තමත්ථස්ස පත්තියා.

2666. සරාගා සභවා[2] චෙතෙ විප්පසන්නමනාවිලා,[3]
උපට්ඨහිංසු සක්කච්චං පසන්නා සෙහි පාණිභි.

2667. ඛීණාසවා වන්තදොසා කතකිච්චා අනාසවා
ඵරිංසු[4] මෙත්තචිත්තෙන සයම්භූ අපරාජිතා.

2668. තෙසං උපට්ඨහිත්වාන සම්බුද්ධානං පතිස්සතො,
මරණඤ්ච අනුප්පත්තො දෙවත්තඤ්ච අගම්හසෙ

2669. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං සීලමනුපාලයිං,
දුග්ගතිං නාභිජානාමි සඤ්ඤමස්ස ඉදං ඵලං.

2670. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුබ්බඞ්ගමියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුබ්බඞ්ගමියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

පණ්ණං ඵලං පච්චුග්ගමං[5] එකපුප්ඵී ච මඝවා
උපට්ඨාකා පදානඤ්ච පබ්බජ්ජා බුද්ධුපට්ඨාකො
පුබ්බඞ්ගමො ච ගාථායො අට්ඨතාලීස කිත්තිතාති.

**පණ්ණදායකවග්ගො එකූනතිංසතිමො.**

1. සමණුපට්ඨකා. සී.මු. 2 සමොහා, ස්‍යා.
3. විප්පසන්නමනාවිලං, සී.මු. 4. ඵරිසුං, සීමු. 5. උග්ගමියො, සීමු.

2662. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි බුදුරජුන්හට පරිවරණය (=වතාවත්) කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. උවටැන් කිරීමෙහි මේ විපාක යි.

2663. මෙයින් තෙවිසිවන කපෙහි මහත් බල ඇති **සමණුපට්ඨාක** නම් සිවු සක්විති රජකෙනෙක් වූහ.

2664. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **බුද්ධුපට්ඨාක** සථවිරයන් වහන්සේ මේ ගථාවන් වදාළ සේකි.

**බුද්ධුපට්ඨාක සථවිරාවදානය නවවැනි යි.**

## 290. පුබ්බඞ්ගමිය සථවිරාවදානය

2665. උත්තමාර්ථය වූ නිවන් ලැබීම පිණිස අසූහාරදහසක් දෙනා (කිසිදු වස්තුවක් නො මැති බැවින්) අකිඤ්චන වූ පැවිද්දෝ වූහ. මම ඔවුනතුරෙන් පුරොගාමියා වීමි.

2666. පැහැදුනු නො කැළඹුනු මොවුහු රාග සහිතයෝ ය. භවෝ-තපත්තිය නැති නො කොළෝය. පහන් සිත් ඇති (රහත්නට) සියතින් ම මැනවින් උවටැන් කළාහුය.

2667. ක්ෂය කළ ආශ්‍රව ඇති, දුරු කළ කෙලෙස් දොස් ඇති, රහත් බවට පත්, සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ (උන්වහන්සේ) හැමදෙන (අප කෙරෙහි) මෙත් සිත පැතිර වූහ.

2668. ඒ සියලු සම්බුදුවරයන් වහන්සේට උවටැන් කොට එළඹ සිටි සිහි ඇතිව මරණයට පැමිණියමෝ දෙවත්වයට ද ගියෙමු.

2669. මෙයින් සිවුඅනූවන කපෙහි යම් සීලයක් රැකියෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සංයමයාගේ මේ විපාක යි.

2670. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පුබ්බඞ්ගමිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පුබ්බඞ්ගමිය සථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

පණ්ණ ඵල පච්චුග්ගමිය - එකපුප්ඵි මාසව
උපට්ඨාක අපදානා - පබ්බජ්ජා බුද්ධුපට්ඨාක
පුබ්බඞ්ගම ද දසවන් - අටසාළිස් ගයෙක් වේ.

**පණ්ණදායක වග්ගය එකූන්තිස්වනු යි.**

## 291. චිතකපූජකත්ථෙරාපදානං

2671. **අජිතො** නාම නාමෙන අහොසිං බ්‍රාහ්මණො තදා,
ආහුතිං සිට්ඨුකාමො'හං නානාපුප්ඵං සමානයිං.

2672. ජලන්තං චිතකං දිස්වා සිඛිනො ලොකබන්ධුනො,
තං ච පුප්ඵං සමානෙත්වා චිතකෙ ඔකිරිං අහං.

2673. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2674. සත්තවීසෙ ඉතො කප්පෙ සත්තාසුං මනුජාධිපා,
**සුපජ්ජලිත**නාමා තෙ චක්කවත්තී මහබ්බලා.

2675. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චිතකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චිතකපූජකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 292. පුප්ඵධාරකත්ථෙරාපදානං

2676. වාකචීරධරො ආසිං අජිනුත්තරවාසනො,
අභිඤ්ඤාපඤ්චනිබ්බත්තා චන්දස්ස පරිමජ්ජකො.

2677. **විපස්සිං** ලොකපජ්ජොතං දිස්වා අභිගතං මම,
පාරිච්ඡත්තකපුප්ඵානි ධාරෙසිං සත්ථුනො අහං.

2678. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිධාරයිං,
දුග්ගතිං නාභිජානාමි ධාරණාය ඉදං ඵලං.

2679. සත්තාසීතිමහිතො කප්පෙ එකො ආසිං මහීපති,
**සමන්තධාරණො** නාම චක්කවත්තී මහබ්බලො.

2680. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුප්ඵධාරකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුප්ඵධාරකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 291. චිතකපූජක ස්ථවිරාවදානය

2671. එකල්හි මම **අජිත** නම් බමුණෙකිම් වීමි. පූජාවක් කරණු කැමැත්තෙම් නොයෙක් මල් රැස් කෙළෙමි.

2672. **සිඛී** බුදුරජානන් වහන්සේගේ සෑය දැක මම ඒ සියලු මල් ගෙණවුත් එසිත් සෑය පිදීමි.

2673. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2674. මෙයින් සත්විසිවන කපෙහි මනුජාධිපති වූ මහත් බල ඇති **සුපජ්ජලිත** නම් සත් සක්විති රජකෙනෙක් වූහ.

2675. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **චිතකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**චිතකපූජක ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 292. පුෂ්පධාරක ස්ථවිරාවදානය

2676. (මම) වැහැරි සිවුරු දරණ, එකස් කොට හැඳගත් අඳුන් දිවි සම් ඇති, ඉපද වූ පඤ්චාභිඥ ඇති, සඳ පිරිමැදීමෙහි සමත් (=ඉද්ධිමත්) තවුසෙකිම් වීමි.

2677. මා සමීපයට වැඩියා වූ මුළු ලොවට පහනක් බඳු වූ **විපස්සී** බුදුරජුන් දැක මම ඒ ශාස්තෲන් වහන්සේට පරසතු මල් (ගෙණවුත් කුඩයක් කොට) දැරීමි.

2678. මෙයින් එක්අනූවන කපෙහි යම් මල් සැතක් දැරුයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පච්ඡත්‍රය (=මල්කුඩය) ක් දැරීමෙහි මේ විපාක යි.

2679. මෙයින් සත්අනූවන කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති **සමන්තධාරණ** නම් එක් සක්විත්තෙකිම් වීමි.

2680 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පුෂ්පධාරක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පුෂ්පධාරක ස්ථවිරාවදානය දෙවනු යි.**

## 293. ඡත්තදායකත්ථෙරාපදානං

2681. පුත්තො මම පබ්බජිතො කාසායවසනො තදා,
සො ච බුද්ධත්තං සම්පත්තො නිබ්බුතො ලොකපූජිතො.

2682. විචිනන්තො සකං පුත්තං අගමං පච්ඡතො අහං,
නිබ්බුතස්ස මහන්තස්ස චිතකං අගමාසහං.

2683. පග්ගය්හ අඤ්ජලිං තත්ථ වන්දිත්වා චිතකං අහං,
සෙතච්ඡත්තඤ්ච පග්ගය්හ ආරොපෙසිං අහං තදා.

2684. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ඡත්තමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි ඡත්තදානස්සිදං ඵලං.

2685. පඤ්චවීසෙ ඉතො කප්පෙ සත්ත ආසුං ජනාධිපා,
මහාරහ සනාමා තෙ චක්කවත්තී මහබ්බලා.

2686. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඡත්තදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඡත්තදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 294. සද්දසඤ්ඤකත්ථෙරාපදානං

2687. අනුග්ගතම්හි ආදිච්චෙ පනාදො විපුලො අහු,
බුද්ධසෙට්ඨස්ස ලොකම්හි පාතුභාවො මහෙසිනො.

2688. සද්දමස්සොසහං තස්ස න ච පස්සාමි තං ජිනං,
මරණෙ ච අනුප්පත්තෙ බුද්ධසඤ්ඤමනුස්සරිං.

2689. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2690. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සද්දසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සද්දසඤ්ඤකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

# 293. ජත්තදායක ස්ථවිරාපදානය

2681. එකල්හි මාගේ පුත්‍ර තෙමේ කසාවත් හැඳගත් පැවිද්දෙක් විය. හෙතෙම ශ්‍රාවක බෝධිය (රහත් බව)ට පැමිණියේ ලෝකයා විසින් පුදනු ලැබුවෙක් ව පිරිනිවන් පෑයේ ය.

3682. මම සිය පුත්‍රා සොයමින් පසුපසින් ගියෙමි. මම පිරිනිවන් පෑ රහතන් වහන්සේගේ සෑය වෙත පැමිණියෙමි.

2633. මම එහි ඇඳිලි බැඳගෙණ සෑය වැඳ එකල්හි ශ්වෙතච්ඡත්‍රයක් ද ගෙණ (සෑයට) නැංවීමි.

2684. මෙයින් සිවුඅනූවනු කපෙහි යම් ඡත්‍රපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඡත්‍රදානයාගේ මේ විපාක යි.

2685. මෙයින් පස්විසිවෙනි කපෙහි ජනාධිපති වූ මහත් බල ඇති මහාරහ නම් තුන් සක්විති රජ කෙනෙක් වූහ.

2686. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ජත්තදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ජත්තදායක ස්ථවිරාපදානය තෙවැනි යි.**

# 29 . සද්දසඤ්ඤක ස්ථවිරාපදානය

2687. හිරු උදාවන්නටත් පෙර ප්‍රනාදය මහත් විය. (මෙය) මහර්ෂි වූ බුදුරජානන් වහන්සේගේ ලොව පහළවීම යි.

2688. (ශිලත්ව ඇදෙහි වැතිර සිටි) මම එහි ශබ්දය ඇසීමි. ඒ බුදුරජුන් නො දිටිමි. මරණය ලං වූ කල්හි ද බුද්ධ යන නාමය මෙනෙහි කෙළෙමි.

2689. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් බුද්ධ යන හැඟීමක් ලැබූයෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවගේ මේ විපාක යි.

2690. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සද්දසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සද්දසඤ්ඤක ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 295. ගොසීසනික්ඛෙපකත්ථෙරාපදානං

2691. ආරාමද්වාරා නික්ඛම්ම ගොසීසං සන්ථතං මයා,
අනුභොමි සකං කම්මං පුබ්බකම්මස්සිදං ඵලං.

2692. ආජානීයා වාතජවා සින්ධවා සීඝවාහනා,
අනුභොමි සබ්බමෙතං ගොසීසස්ස ඉදං ඵලං.

2693. අහො කාරං පරමකාරං සුඛෙත්තෙ සුකතං මයා,
සඞ්ඝෙ කතස්ස කාරස්ස න අඤ්ඤං කලමග්ඝති.

2694. චතුනවුතෙ ඉතො කප්පෙ යං සීසං සන්ථරිං අහං,
දුග්ගතිං නාභිජානාමි සන්ථරස්ස ඉදං ඵලං.

2695. පඤ්චසත්තතිකප්පම්හි **සුප්පතිට්ඨිත** නාමකො,
එකො ආසිං මහාතෙජො චක්කවත්ති මහබ්බලො.

2696. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගොසීසනික්ඛෙපකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගොසීසනික්ඛෙපකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 296. පාදපූජකත්ථෙරාපදානං

2697. පබ්බතෙ හිමවන්තම්හි අහොසිං කින්නරො තදා,
අද්දසං විරජං බුද්ධං පීතරංසිංව භානුමං.

2698. උපෙතං තමහං[1] බුද්ධං **විපස්සිං** ලොකනායකං,
චන්දනං තගරඤ්චාපි පාදෙ ඔසිඤ්චහං තදා.

2699. එකනවුතෙ ඉතො කප්පෙ යං පාදමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි පාදපූජායිදං ඵලං.

2700. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පාදපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පාදපූජකත්ථෙරාපදානං ඡට්ඨං.**

1. උපෙතොපි තදා, ස්‍යා.

# 295. ගොසීසනික්ඛෙපක ස්ථවිරාවදානය

2691. මා විසින් (භික්ෂුසඞ්ඝයා) අරම් දොරින් නික්මෙන (මඩසහිත) මගෙහි ගවහිස් කබලක් අතුරණ ලදි. (ආජානීය අශ්ව වාහනාදිය ලැබීමෙන්) එකල තමා කළ ස්වකීය කර්මයේ විපාකය විඳිමි. පූර්ව කර්මයාගේ මේ විපාකය යි.

2692. ආජානීය අශ්වයෝ ද වාතවේගයෙන් දුවන වාතජව අශ්වයෝ ද සෛන්ධව (සින්ධුදේශයේ උපන්) අශ්වයෝ ද යන මේ සියලු ශීඝ්‍රවාහන (සම්පත්) අනුභව කරමි. ගව හිස් කබල (සඞ්ඝයාගේ ගමන් පහසුව සඳහා) දැමීමෙහි මේ විපාකය යි.

2693. පුණ්‍යකර්මය ආශ්චර්යයි. මා විසින් සරු කෙතෙහි උතුම් පින්කමක් කරණ ලදි. සඞ්ඝයා විෂයයෙහි කරණ ලද උපකාරය සසඳන විට අනික් සත්කාරයක් (එයින්) කලාවකට ද නො අගී.

2694. මම මෙයින් සිවුඅනූවන කපෙහි යම් ගව හිස් කබලක් අතුලෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (ගමන් පහසුව ඇතිවන සේ සඞ්ඝයා සඳහා ගෙරි හිස් කබල) ඇතිරීමේ මේ විපාකය යි.

2695. පන්සැත්තෑවන කපෙහි මහත් බල ඇති අතිශය තෙදවත් **සුසන්තිට්ඨිත** නම් එක් සක්විති රජෙක් වීමි.

2696. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ගොසීසනික්ඛෙපක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ගොසීසනික්ඛෙපක ස්ථවිරාවදානය පස්වැනි යි.**

# 296. පාදපූජක ස්ථවිරාවදානය

2697. එකල්හි මම හිමවත් පව්වෙහි කිඳුරෙක් වීමි. එහි රත්වන් රස් ඇති උදා හිරු මෙන් බබලන බුදුරජුන් දිටිමි.

2698. (තමා සිටින තැනට) වැඩියා වූ ලොකනායක වූ ඒ **විපස්සී** බුදුරජුන් දැක මම සිරිපා මුල සඳුන් ද තුවරලා ද ඉස්සෙමි.

2699. මෙයින් එක්අනූවන කපෙහි යම් ශ්‍රීපාද පූජාවක් කෙලෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. සිරිපා පිදීමෙහි මේ විපාකය යි.

2700. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පාදපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පාදපූජක ස්ථවිරාවදානය සවැනි යි.**

## 297. දෙසකිත්තකත්ථෙරාපදානං

2701. **උපසාළ්හක** නාමො'හං අහොසිං බ්‍රාහ්මණො තදා,
කානනං වනමොගාළ්හං ලොකජෙට්ඨං නරාසභං.

2702. දිස්වාන වන්දිං පාදෙසු ලොකාහුතිපටිග්ගහං,
පසන්නචිත්තං මං ඤත්වා බුද්ධො අන්තරධායථ.

2703. කානනා අභිනික්ඛම්ම බුද්ධසෙට්ඨමනුස්සරිං,
තං දෙසං කිත්තයිත්වාන කප්පං සග්ගම්හි මොදහං.

2704. ඡන්නවුතෙ ඉතො කප්පෙ යං දෙසමභිකිත්තයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

2705. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **දෙසකිත්තකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**දෙසකිත්තකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 298. සරණගමනියත්ථෙරාපදානං

2706. පබ්බතෙ හිමවන්තම්හි අහොසිං ලුද්දකො අහං,
විපස්සිං අද්දසං බුද්ධං ලොකජෙට්ඨං නරාසභං.

2707. උපාසිත්වාන සම්බුද්ධං වෙය්‍යාවච්චමකාසහං,
සරණඤ්ච උපාගච්ඡිං දිපදින්දස්ස තාදිනො.

2708. එකනවුතෙ ඉතො කප්පෙ සරණං යමගච්ඡහං,
දුග්ගතිං නාභිජානාමි සරණගමනප්ඵලං.

2709. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සරණගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සරණගමනියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 299. අම්බපිණ්ඩියත්ථෙරාපදානං

2710. **රොමසො** නාම නාමෙන දානවො ඉති විස්සුතො,
අම්බපිණ්ඩී මයා දින්නා[1] **විපස්සිස්ස** මහෙසිනො,

2711. එකනවුතෙ ඉතො කප්පෙ යමම්බමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අම්බදානස්සිදං ඵලං.

1. අම්බපිණ්ඩො මයා දින්නො, ස්‍යා.

## 297. දෙසකිත්තක ස්ථවිරාවදානය

2701. එකල්හි මම උපසාළහක නම් බමුණෙක් වීමි. මහවනයට පිවිසි ලොකජ්‍යෙෂ්ඨ වූ පරම පුරුෂ වූ ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ

2702. බුදුරජුන් දැක සිරිපා වැන්දෙමි. පහන් සිත් ඇති මා දුන බුදුරජ තෙම අතුරුදහන් විය.

2703. වනයෙන් නික්ම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි. (බුදුරජුන් වැඩියා වූ) ඒ දෙසට පසසා මම කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටු වීමි.

2704. මෙයින් දෙයානුවන කපෙහි (බුදුරජුන් වැඩියා වූ ඒ) යම් දෙසකට පැසසුයෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පැසසීමෙහි මේ විපාකය යි.

2705. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් දෙසකිත්තක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**දෙසකිත්තක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 298. සරණගමනිය ස්ථවිරාවදානය

2706. මම හිමවත් පව්වෙහි වැද්දෙක් වීමි. ලොකජ්‍යෙෂ්ඨ වූ නර-ශ්‍රෙෂ්ඨ වූ විපස්සී බුදුරජුන් දිටිමි.

2707. මම සම්බුදුරජුන් වෙත එළඹ වතාවත් කෙළෙමි. ද්විපදෙත්තම වූ තාදී ගුණ ඇති (=අටලෝදහමින් නොසැලෙන) බුදුවරයන් වහන්සේ සරණ ද ගියෙමි.

2708. මම මෙයින් එක්අනූවන කපෙහි බුදුරජුන් සරණ කොට ගියෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මේ සරණගමනයෙහි විපාකය යි.

2709. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂමත් සරණගමනිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සරණගමනිය ස්ථවිරාවදානය අටවැනි යි.**

## 299. අම්බපිණ්ඩිය ස්ථවිරාවදානය

2710. එකල්හි නමින් රොමස නම් වූ මම දානව යයි ප්‍රකට වූයෙම් වීමි. ඒ මා විසින් විපස්සී බුදුරජුන්හට අඹකැනක් දෙන ලදී.

2711. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් අඹ දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනමි. අඹදනෙහි මේ විපාකය යි.

2712. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බපිණ්ඩියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අම්බපිණ්ඩියත්ථෙරස්ස අපදානං නවමං.**

## 300. අනුසංසාවකත්ථෙරාපදානං

2713. පිණ්ඩාය චරමානාහං **විපස්සිං** අද්දසං ජිනං,
උළුඞ්කභික්ඛං පාදාසිං දිපදින්දස්ස තාදිනො.

2714. පසන්නචිත්තො සුමනො අභිවාදෙසහං තදා,
අනුසංසාවයිං බුද්ධං උත්තමත්ථස්ස පත්තියා.

2715. එකනවුතෙ ඉතො කප්පෙ අනුසංසාවයිං අහං,
දුග්ගතිං නාභිජානාමි අනුසංසාවනාඵලං.

2716. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අනුසංසාවකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අනුසංසාවකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

චිතකං පාරිජ්ඡත්තා ච සද්ද ගොසීසසන්ථරං
පදං පදෙසං සරණං අම්බො සංසාවකො පි ච
සත්තතාළීස ගාථායො ගණිතායො විභාවිභි.

**චිතකපූජකවග්ගො තිංසතිමො.**

අථ වග්ගුද්දානං:

කණිකාරො හත්ථිදදො ආලම්බණුදකාසනං
තුවරං ථොමකො චෙව උක්ඛෙපං සීසුපධානං
පණ්ණදො චිතපූජී ච ගාථායො චෙව සබ්බසො
චත්තාරි ච සතානීහ එකපඤ්ඤාසමෙව ච.
පඤ්චවීසසතා සබ්බා ද්වාසත්තති තදුත්තරි,
තිසතං අපදානානං ගණිතා අත්ථදස්සිහි.

**තතියං සතකං[1] සමත්තං.**

1. කණිකාරවග්ගදසකං, මජසං.

2712. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අම්බපිණ්ඩිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අම්බපිණ්ඩිය ස්ථවිරාවදානය නවවැනි යි.**

## 300. අනුසංසාවක ස්ථවිරාවදානය

2713. මම පිඬු පිණිස හැසිරෙන්නා වූ **විපස්සී** බුදුරජුන් දිටිමි. ද්විපදෝත්තම වූ තාදී ගුණ ඇති (ඒ බුදුරජුන්හට) හැන්දක් පමණ වූ භික්ෂාව දිනිමි.

2714. මම එකල්හි පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් වැන්දෙමි. උත්තමාර්ථය වූ නිවණට පැමිණීම පිණිස බුදුරජුන් පැසසීමි.

2715. මෙයින් එක්අනූවන කපෙහි මම (බුදුරජුන්) පැසසීමි. (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පැසසීමෙහි මේ විපාකය යි.

2716. සිවුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥවෝද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අනුසංසාවක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අනුසංසාවක ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

චිතක පාරිච්ඡත්ත සද්ද ගොසීසසන්ථර
පද පදෙස් සරණ ද අම්බ සහ සංසාවක ද
සත්සාළිස් ගයෙක් ගැණිනී ගණන් දතුවන්

**චිතකපූජක වර්ගය තිස්වනු යි.**

යලි වර්ග උද්දානය:

කණිකාර හත්ථිදද ආලම්බනු 'දකාසන,
තුවර ථොමක සහ උක්කෙප සීසූපධාන ද.
පණ්ණද චිතකපූජ්ජයි සැම ලෙසින් ඇති මෙහි ගී,
සතරෙක් ද සියයක් එක්පණසෙක් ද යලි එහි,
පස්විසි සියක් හා දෙසැත්තෑවකි උතුරා,
අපදාන තෙසියක් මෙහි මෙතෙක් ගයින් කියන ලදී.

**තෙවෙනි සියය නිමියේ ය.**

## 301. පදුමකෙසරියත්ථෙරාපදානං

2717. ඉසිසඞ්ඝෙ අහං පුබ්බෙ ආසිං මාතඞ්ගවාරණො,
මහෙසීනං පසාදෙන පදුමකෙසරමොකිරිං.

2718. පච්චෙකජිනසෙට්ඨෙසු ධූතරාගෙසු තාදිසු,
තෙසු චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොදහං.

2719. එකනවුතෙ ඉතො කප්පෙ කෙසරං ඔකිරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2720. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදුමකෙසරියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමකෙසරියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 302. සබ්බගන්ධියත්ථෙරාපදානං

2721. ගන්ධමාලං මයා දින්නං **විපස්සිස්ස** මහෙසිනො,
අදාසිං උජුභූතස්ස කොසෙය්‍යං වත්ථමුත්තමං.

2722. එකනවුතෙ ඉතො කප්පෙ යං ගන්ධමදදිං[1] පුරෙ,
දුග්ගතිං නාභිජානාමි ගන්ධදානස්සිදං ඵලං.

2723. ඉතො පණ්ණරසෙ කප්පෙ **සුචෙළො** නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2724. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සබ්බගන්ධියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සබ්බගන්ධියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 303. පරමන්නදායකත්ථෙරාපදානං

2725. ණිකාරං'ව ජොතන්තං උදයන්තං'ව භානුමං,
විපස්සිමද්දසං බුද්ධං ලොකජෙට්ඨං නරාසභං.

2726. අඤ්ජලිම්පග්ගහෙත්වාන අභිනෙසිං[2] සකං ඝරං,
අභිනෙත්වාන[3] සම්බුද්ධං පරමන්නං අදාසහං.

---

1 වත්ථමදදිං, සීමු. 2. අතිනෙසිං, සීමු. 3. අතිනෙත්වාන, සීමු.

## 301. පදුමකෙසරිය ස්ථවිරාවදානය

2717. මම පෙර පසේබුදුවරුන් වහන්සේ මැද මාතඞ්ග හස්ති කුලයෙහි උපන් ඇතෙක් වීමි. පසේබුදුවරුන් වහන්සේ කෙරෙහි පැහැදී මෙන් පියුම් කෙසුරු විසිර වීමි.

2718. පිඹ හල රාග ඇති තාදී ගුණ යුත් (=අටලෝ දහමින් නො සැලෙන) ඒ පසේබුදුවරුන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම කල්පයක් මුළුල්ලෙහි සවගීයෙහි සතුටු වීමි.

2719. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි පියුම් කෙසුරු විසිරවීම් ද, (ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2720. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පදුමකෙසරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පදුමකෙසරිය ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 302. සබ්බගන්ධිය ස්ථවිරාවදානය

2721. **විපස්සී** බුදුරජුන්හට මා විසින් සුවඳ මල් දෙන ලදී. (=එසේ ම කායවඞ්කාදියෙන් තොර බැවින්) ඍජු වූ උත්වහන්සේට උතුම් කොසෙය්‍ය වස්ත්‍රයක් (හැම සුවඳ ගත්වා) දිනිමි.

2722. මෙයින් එක්අනූවන කපෙහි වූ ඒ අතීතයෙහි යම් ගන්ධදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි.
ගන්ධදානයෙහි මේ විපාක යි.

2723. මෙයින් පසලොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සුචෙල** නම් සක්විති රජෙක්ම් වීමි.

2724. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සබ්බගන්ධිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සබ්බගන්ධිය ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 303. පරමන්නදායක ස්ථවිරාවදානය

2725. කිණිහිරි රුකක් මෙන් ද උදාවන හිරු මෙන් ද බබලන ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **විපස්සී** බුදුරජුන් දිටිමි.

2726. මම ඇඳිලි බැඳ (ඒ බුදුරජුන්) සිය ගෙදොරට පමුණුවා සම්බුදුරජුන්හට වරබොජුන් දිනිමි.

2727. එකනවුතෙ ඉතො කප්පෙ පරමන්නං දදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පරමන්නස්සිදං ඵලං.

2728. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පරමන්නදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පරමන්නදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 304. ධම්මසඤ්ඤකත්ථෙරාපදානං

2729. **විපස්සිනො** භගවතො මහාබොධිමහො අහු,
රුක්ඛට්ඨෙ යෙව[1] සම්බුද්ධෙ ලොකජෙට්ඨෙ නරාසභෙ.

2730. භගවා තම්හි සමයෙ භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
චතුසච්චං පකාසෙති වාචාසභිමුදීරයං.

2731. සඞ්ඛිත්තෙන ච දෙසෙන්තො විත්ථාරෙන ච දෙසයං[2],
විවට්ටච්ඡදො සම්බුද්ධො නිබ්බාපෙසි මහාජනං.

2732. තස්සාහං ධම්මං සුත්වාන ලොකජෙට්ඨස්ස තාදිනො,
වන්දිත්වා සත්ථුනො පාදෙ පක්කාමිං උත්තරාමුඛො.

2733. එකනවුතෙ ඉතො කප්පෙ යං ධම්මමසුණිං තදා,
දුග්ගතිං නාභිජානාමි ධම්මසඤ්ඤායිදං ඵලං.[3]

2734. තෙත්තිංසම්හි ඉතො කප්පෙ එකො ආසිං මහීපති,
**සුතවා** නාම නාමෙන චක්කවත්තී මහබ්බලො.

2735. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ධම්මසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ධම්මසඤ්ඤකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 305. ඵලදායකත්ථෙරාපදානං

2736. භාගීරථීනදීතීරෙ අහොසි අස්සමො තදා,
තමහං අස්සමං ගච්ඡිං ඵලහත්ථො අපෙක්ඛවා[4].

2737. **විපස්සිං** තත්ථ අද්දක්ඛිං පීතරංසිං'ව භානුමං,
යං මෙ අත්ථි ඵලං සබ්බං අදාසිං සත්ථුනො අහං.

1. රුක්ඛට්ඨස්සෙව සම්බුද්ධො, මජසං. 2. දෙසයි, සයා.
3. ධම්මසවස්සිදං ඵලං, මජසං. ධම්මසවණස්සිදංඵලං, සිමු. 4. අපෙඛවං, සීමු.

2727. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි උතුම් ආහාරදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දතිමි. උතුම් ආහාරදානයාගේ මේ විපාක යි.

2728. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පරමන්නදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පරමන්නදායක ස්ථවිරාපදානය තෙවැනි යි.**

## 304. ධම්මසඤ්ඤක ස්ථවිරාපදානය

2729. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සම්බුදුරජුන් බෝරුක්මුල්හි සිටියදී ම (නොහොත් බුදුරජුන් බෝරුක්මුල සිටින කල්හි) මෙන් සිතා (සිදුකරණ) **විපස්සී** බුදුරජුන් පිළිබඳ මහාබොධි පූජාවක් විය.

2730. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද්දාහු අභීත වචනයෙන් චතුස්සත්‍යය වදාරණ සේකි.

2731. විපුල කෙලෙස් සෙවෙනි ඇති ඒ සම්බුදුරජ තෙම සැකෙවින් ද විතර විසින් ද (දහම්) දෙසමින් මහාජනයා නිවණට පැමිණ විය.

2732. මම ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ තාදි ගුණ ඇති උත්වහන්-සේගේ ධර්මය අසා (එම) ශාස්තෘන් වහන්සේගේ පා වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

2733. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් ධර්මයක් ඇසූ-යෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දතිමි. ධර්මසංඥායෙහි මේ විපාක යි.

2734. මෙයින් තෙතිස්වනු කපෙහි මහත් බල ඇති පෘථිවීශ්වර වූ **සුතවා** නම් සක්විති රජෙකිම් විමි.

2735. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **ධම්මසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ධම්මසඤ්ඤක ස්ථවිරාපදානය සිවුවැනි යි.**

## 305. ඵලදායක ස්ථවිරාපදානය

2736. එකල්හි භාගීරථී නදීතීරයෙහි අසපුවක් විය. මම පලතුරු ගත් අත් ඇත්තෙම් බලාපොරොත්තු සහිත වූයෙම් ඒ අසපුවට ගියෙමි.

2737. එහි දී රන්වන් රස් ඇති (උදාවන හිරු මෙන් බබලන්නා)වූ **විපස්සී** බුදුරජුන් දිටිමි. මා ළඟ යම් ඵල වර්ගයක් වී ද ඒ සියලු ඵල මම ඒ බුදුරජුන්හට දිනිමි.

2738. එකනවුතෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

2739. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඵලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඵලදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 306. සම්පසාදකත්ථෙරාපදානං

2740. නමො තෙ බුද්ධවීරත්ථු විප්පමුත්තොසි සබ්බධි,
ව්‍යසනංහි[1] අනුප්පත්තො තස්ස මෙ සරණං භව.

2741. **සිද්ධත්ථො** තස්ස ව්‍යාකාසි ලොකෙ අප්පටිපුග්ගලො,
මහොදධිසමො සඞ්ඝො අප්පමෙය්‍යො අනුත්තරො.

2742. තත්ථ ත්වං විරජෙ ඛෙත්තෙ අනන්තඵලදායකෙ,
සඞ්ඝෙ චිත්තං පසාදෙහි[2] සුබීජං වාපි[3] රොපය.

2743. ඉදං වත්වාන සබ්බඤ්ඤූ ලොකජෙට්ඨො නරාසභො,
මමෙවං[4] අනුසාසිත්වා වෙහාසං නභමුග්ගමි.

2744. අචිරං ගතමත්තම්හි සබ්බඤ්ඤුම්හි නරාසභෙ,
මරණං සමනුප්පත්තො තුසිතං උපපජ්ජහං.

2745. තදාහං විරජෙ ඛෙත්තෙ අනන්තඵලදායකෙ,
සඞ්ඝෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොදහං.

2746. චතුනවුතෙ ඉතො[5] කප්පෙ පසාදමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි පසාදස්ස ඉදං ඵලං.

2747. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සම්පසාදකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සම්පසාදකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

1. බ්‍යසනම්හි, මජ්සං. 2. පසාදෙත්වා, මජ්සං. 3. වාප, මජ්සං.
4. මමෙව, මජ්සං. 5 චතුන්නවුතිතො, මජ්සං.

2738. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් පලතුරු දනක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාක යි.

2739. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ඵලදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ඵලදායක ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 306. සම්පසාදක ස්ථවිරාවදානය

2740. බුද්ධවීරයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. ඔබ සියලු ස්කන්ධ ධාතු ආයතනයන්ගෙන් මිදුනේ වෙහි ය. මම දුකට පැමිණියෙම් වෙමි. ඒ මට පිහිට වනු මැනවි.

2741. ලොකයෙහි අනුපම පුද්ගල වූ සිද්ධාර්ථ බුදුරජ තෙමේ මහට මෙසේ වදාළේ ය. සඞ්ඝ තෙමේ මහසයුර මෙන් ගැඹුරු ගුණ ඇත්තේ ය. අප්‍රමාණ ගුණ ඇත්තේ ය. අනුත්තර වූ ගුණ ඇත්තේ ය.

2742. අනන්ත විපාක දෙන්නා වූ (කෙලෙස්) රජස් රහිත (පුණ්‍ය) ක්‍ෂෙත්‍රය වූ සඞ්ඝයා කෙරෙහි සිත උහදවනු මැනව. එහි කුසල් තැමැති මනා බිජුවට ද රොපනය කරණු මැනව (කියායි.)

2743. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සර්වඥ තෙමේ මෙය වදුරා මට මෙසේ අනුශාසනා කොට අහසට නැංගේ ය.

2744. නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජුන් වැඩි නො බෝ වෙලාවකින් මම මරණයට පත්වූයෙම් තුසිතයෙහි උපනිමි.

2745. එකල්හි මම (කෙලෙස්) රජස් විරහිත අනන්ත ඵලදායක වූ සඞ්ඝයා කෙරෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

2746. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි (සඞ්ඝයා කෙරෙහි) යම් ප්‍රසාදයක් ලැබූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (සඞ්ඝයා කෙරෙහි) පැහැදීමෙහි මේ විපාක යි.

2747. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සම්පසාදක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සම්පසාදක ස්ථවිරාවදානය සවැනි යි.**

## 307. ආරාමදායකත්ථෙරාපදානං

2748. **සිද්ධත්ථස්ස** භගවතො ආරාමො රොපිතො මයා,
සන්දච්ඡායෙසු රුක්ඛෙසු උපසන්තෙසු පක්ඛිසු.

2749. අද්දසං විරජං බුද්ධං ආහුතීනං පටිග්ගහං,
ආරාමං අභිනාමෙසිං ලොකජෙට්ඨං නරාසභං.

2750. හට්ඨො හට්ඨෙන චිත්තෙන ඵලං පුප්ඵඤ්චදාසහං[1],
තතො ජාතප්පසාදො ච[2] තං වනං පරිණාමයිං.

2751. බුද්ධස්ස යමිදං දාසිං විප්පසන්නෙන චෙතසා,
භවෙ නිබ්බත්තමානම්හි නිබ්බත්තති ඵලං මම.

2752. චතුනවුතෙ ඉතො කප්පෙ යමාරාමං දදිං[3] තදා,
දුග්ගතිං නාභිජානාමි ආරාමස්ස ඉදං ඵලං.

2753. සත්තතිංසෙ ඉතො කප්පෙ සත්තාසුං මුදුසීතලා,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2754. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආරාමදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආරාමදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 308. අනුලෙපදායකත්ථෙරාපදානං

2755. **අත්ථදස්සිස්ස** මුනිනො අද්දසං සාවකං අහං,
නවකම්මං කරොන්තස්ස සීමාය උපගච්ඡහං.

2756. නිට්ඨිතෙ නවකම්මෙ ච අනුලෙපමදාසහං,
පසන්නචිත්තො සුමනො පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

2757. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි අනුලෙපස්සිදං ඵලං.

2758. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අනුලෙපදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අනුලෙපදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. ඵලං පුප්ඵමදාසහං, මජ්ඣං. 2. පසාදො ච, සීමු.
3. යං ආරාමමදං තදා, මජ්ඣං.

## 307. ආරාමදායක ස්ථවිරාපදානය

2748. මා විසින් **සිද්ධත්** බුදුරජුන්හට ආරාමයක් රොපණය කරණ ලදී. ගණසා සෙවනලු රුක්හි පක්ෂීන් (කැදලිතුළට වී) සන්හුන් වන (සවස්) කල්හි

2749. ලොකයාගේ පූජාවත් පිළිගන්නා වූ (කෙලෙස්) රජස් විරහිත බුදුරජුන් දිටිමි. දැක ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජුන්හට අරම පිළිගැන්වීමි.

2750. මම සතුටු වූයෙම් සතුටු සිතින්ම ගෙඩිද මල්ද (උන්වහන්සේට) පිදීමි. ඉක්බිති හටගත් ප්‍රසාද ඇත්තෙම්ම එම වන (අරම) පිරිනැමීමි.

2751. පැහැදි සිතින් බුදුරජුන්හට යම් ඒ ආරාමදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) භවයෙහි උපදින කල්හි මට ඵලවගී නොහොත් කුශල විපාකය උපදී.

2752. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් ආරාමදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ආරාමදානයාගේ මේ විපාක යි.

2753. මෙයින් සත්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **මුදුසිතල** නම් සත් සක්විති රජකෙනෙක් වූහ.

2754. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආරාමදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආරාමදායක ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 308. අනුලෙපදායක ස්ථවිරාපදානය

2755. මම **අත්ථදස්සී** බුදුරජුන්ගේ ශ්‍රාවකයකු දිටිමි. සීමාවක නවකම් කරද්දී මම එතැනට එළඹියෙමි.

2756. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍ර සඞ්ඛ්‍යාත සඞ්ඝයා කෙරෙහි පැහැදි සිතින් නවකම් නිමි කල්හි මම එහි හුණු ආලෙප කෙලෙමි.

2757. මෙයින් එක්දහස් අටසිය කපෙහි වූ එකල්හි යම් (සුධාලෙපන) කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අනුලෙප දානයාගේ මේ විපාක යි.

2758. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **අනුලෙපදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අනුලෙපදායක ස්ථවිරාපදානය අටවැනි යි.**

## 309. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං

2759. උදෙන්තං සතරංසිං'ව පීතරංසිං'ව භානුමං,
වනන්තරගතං සන්තං ලොකජෙට්ඨං නරුසභං.

2760. අද්දසං සුපිනන්තෙන සිද්ධත්ථං ලොකනායකං,
තත්ථ චිත්තං පසාදෙත්වා සුගතිං උපපජ්ජහං.

2761. චතුනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2762. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බුද්ධසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**බුද්ධසඤ්ඤකත්ථෙරස්ස අපදානං නවමං.**

## 310. පබ්භාරදායකත්ථෙරාපදානං

2763. **පියදස්සිනො** භගවතො පබ්භාරෙ සොධිතො මයා,
ඝටකඤ්ච උපට්ඨාසිං පරිභොගාය තාදිනො.

2764. තං මෙ බුද්ධො වියාකාසි **පියදස්සී** මහාමුනි,
සහස්සකණ්ඩො සතභෙණ්ඩු ධජාලූ හරිතාමයො.

2765. නිබ්බත්තිස්සති සො යූපො රතනඤ්ච අනප්පකං,
පබ්භාරදානං දත්වාන කප්පං සග්ගම්හි මොදහං.

2766. ඉතො බත්තිංසකප්පම්හි සුසුද්ධො නාම ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2767. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පබ්භාරදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පබ්භාරදායකත්ථෙරස්ස අපදානං දසමං.**

**උද්දානං:**

කෙසරං ගන්ධ මන්නඤ්ච ධම්මසඤ්ඤී ඵලෙන ච,
පසාදාරාමදායී ච ලෙපකො බුද්ධසඤ්ඤකො,
පබ්භාරදො ච ගාථායො එකපඤ්ඤාස කිත්තිතා.

**පදුමකෙසරියවග්ගො[1] එකතිංසතිමො.**

1. පදුම කෙසරවග්ගො සීමු.

## 309. බුද්ධසඤ්ඤක ස්ථවිරාවදානය

2759-2760. සියක් රැස් ඇති රත්වන් රැසින් යුත් උදාවන හිරු වැනි වනයට පිවිසි ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **සිද්ධාර්ථ** බුදුරජුන් සිහිනෙන් දිටිමි. මම එහි (=බුද්ධාලම්බනයෙහි) සිත පහදවා සුගතියෙහි උපනිමි.

2761. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි බුද්ධාරම්මණයක් ලැබූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවෙහි (=බුද්ධාලම්බන ප්‍රීතියෙහි) මේ විපාක සි.

2762. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **බුද්ධසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**බුද්ධසඤ්ඤක ස්ථවිරාවදානය නවවැනි සි.**

## 310. පබ්භාරදායක ස්ථවිරාවදානය

2763. මා විසින් **සිදුහත්** බුදුරජුන්හට ගල්පානෙක් පිරිසිදු කරණ ලදි. තාදී ගුණ ඇති බුදුරජුන්ගේ පරිභොගය පිණිස (පැන්) කළයක් ද එලවා තැබිමි.

2764-2765. මහාමුනි වූ **පියදස්සී** බුදුරජ තෙමේ මට ඒ කරුණ මෙසේ ප්‍රකාශ කෙළේය. (කෙසේදයත් ?) "දහසක් කඬ (බෙදුම්) ඇති ගොලාකාර වූ සියයක් මුදුන් ඇති ධජයන්ගෙන් යුත් වූ කොළවත් වූ ඒ මහාප්‍රාසාදය ද අපමණ වූ රුවන් ද නිපදින්නේය" කියායි. (මෙසේ) මම පබ්භාර (=ගල්තලු) දානය දී කල්පයක් ස්වර්ගයෙහි සුව වින්දෙමි.

2766. මෙයින් දෙතිස්වන කපෙහි මහත් බල ඇති සත්රුවනින් යුත් **සුසුද්ධ** නම් සක්විති රජෙක්ම වීමි.

2767. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පබ්භාරදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පබ්භාරදායක ස්ථවිරාවදානය දසවැනි සි.**

උද්දානය:

කෙසරගන්ධ අන්නද ධම්මසඤ්ඤී ඵලද
පාසාදාරාමදායී ලෙපක බුද්ධසඤ්ඤක
පබ්භාරදායී දසවන් එක්පණස් ගසිනි බැඳියේ.

**පදුමකෙසරිය වර්ගය එක්තිස් වනු සි.**

## 311. ආරක්ඛදායකත්ථෙරාපදානං

2768. **ධම්මදස්සිස්ස** මුනිනො වති කාරපිතා මයා,
ආරක්ඛො ච මයා දින්නො දිපදින්දස්ස[1] තාදිනො.

2769. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
තෙන කම්මවිසෙසෙන පත්තො මෙ ආසවක්ඛයො.

2770. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආරක්ඛදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආරක්ඛදායකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 312. භොජනදායකත්ථෙරාපදානං

2771. **සුජාතො** සාලලට්ඨීව සොභඤ්ජනමිවුග්ගතො,
ඉන්දලට්ඨීරිවාකාසෙ විරොචති සදා ජිනො.

2772. තස්ස දෙවාතිදෙවස්ස **වෙස්සභුස්ස** මහෙසිනො,
අදාසිං භොජනමහං විප්පසන්නෙන චෙතසා.

2773. තං මෙ බුද්ධො අනුමොදි **සයම්භූ** අපරාජිතො,
'භවෙ නිබ්බත්තමානම්හි ඵලං නිබ්බත්තතු තව.'

2774. **එකතිංසෙ**[2] ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භොජනස්ස ඉදං ඵලං.

2775. පඤ්චවීසෙ ඉතො කප්පෙ එකො ආසිං **අමිත්තභො**[3],
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො.

2776. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භොජනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භොජනදායකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 313. ගතසඤ්ඤකත්ථෙරාපදානං

2777. ආකාසෙ ච[4] පදං නත්ථි අම්බරෙ අනිලඤ්ජසෙ,
**සිද්ධත්ථං** ජිනමද්දක්ඛිං ගච්ඡන්තං තිදිවඞ්ගණෙ[5].

2778. අනිලෙනෙරිතං දිස්වා සම්මාසම්බුද්ධචීවරං,
විත්ති මෙ තාවදෙ ජාතා[6] දිස්වාන ගමනං මුනෙ[7].

---

1. ද්විපදින්දස්ස, මජසං. 2. එකත්තිංසෙ, මජසං. 3. අමිත්තකො, මජසං. 4. ආකාසෙව, මජසං. 5. තිදිවඞ්ගණං, සයා. 6. විත්ති මමාහු තාවදෙ, මජසං. 7. මුනිං, මජසං.

## 311. ආරක්ඛදායක ස්ථවිරාවදානය

2768. **ධම්මදස්සී** බුදුරජුන්හට මා විසින් වැටක් කරණ ලදි. තාදී ගුණ ඇති ද්විපදෝත්තමයන් වහන්සේට මා විසින් ආරක්ෂාව ද දෙන ලදි.

2769. එක්දහස් අටසියවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, ඒ කර්මවිශෙෂය කාරණකොට ගෙණ මා විසින් රහත්බව ලබන ලදි.

2770. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආරක්ඛදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආරක්ඛදායක ස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 312. භොජනදායක ස්ථවිරාවදානය

2771. මැනවින් වැඩුන තරුණ සල්ගසක් මෙන් ද උස්ව නැගුනා වූ ශොභනකවෘක්ෂයක් මෙන් ද, අහසෙහි දේදුන්නක් මෙන් ද බුදුරජතෙම හැම කල්හි බබළයි.

2772. මහර්ෂි වූ දෙවාතිදෙව වූ ඒ **වෙස්සභූ** බුදුරජුන්හට මම පහන් සිතින් බොජුනක් දිනිමි.

2773, එය (පිළිගත්) සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් ජයගත් බුදුරජ තෙම "භවයෙහි උපදනා කල්හි ඔබහට (මෙහි) පුණ්‍ය ඵලය නිපදේවා"යි මට අනුමෙවෙනි බණ දෙසීය.

2774. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් දනක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. භොජනදානයාගේ මේ විපාක යි.

2775. මෙයින් පස්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අමිත්තාභ** නම් සක්විති රජෙක් වීමි.

2776. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **භොජනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**භොජනදායක ස්ථවිරාවදානය දෙවැනි යි.**

## 313. ගතසඤ්ඤක ස්ථවිරාවදානය

2777. ශබ්දය ඇදගන්නා බැවින් **අම්බර** නම් වූ වායුමාර්ගය වූ හෙයින් **අනිලඤ්ජස** නම් වූ දෙව්ලොවට මිදුලක් බඳු හෙයින් **ත්‍රිදිවාඞගණ** නම් වූ ගුවනෙහි වඩින්නා වූ **සිද්ධත්ථ** බුදුරජුන් දිටිමි. (එහෙත්) ඒ අහස්හි (උන්වහන්සේගේ) පියවරක් ද නැත.

2778. සුළඟින් සැළෙන සම්මාසම්බුදු සිවුර දැක උන්වහන්සේගේ ගමන ද දැක බුදුරජුන් කෙරෙහි එකෙණෙහි මට සතුට උපන.

2779. චතුනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2780. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගතසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගතසඤ්ඤකත්ථෙරස්ස අපදානං තතියං.**

## 314. සත්තපදුමියත්ථෙරාපදානං

2781. නදීකූලෙ වසාමහං **නෙසාදො** නාම බ්‍රාහ්මණො,
සතපත්තෙහි පුප්ඵෙහි සම්මජ්ජිත්වාන අස්සමං.

2782. සුවණ්ණවණ්ණං සම්බුද්ධං **සිද්ධත්ථං** ලොකනායකං,
දිස්වා වනෙන[1] ගච්ඡන්තං හාසො මෙ උපපජ්ජථ.

2783. පච්චුග්ගන්ත්වාන සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං,
අස්සමං අතිනාමෙත්වා ජලජග්ගෙහි ඔකිරිං.

2784. චතුනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2785. ඉතො තෙසත්තතෙ කප්පෙ චතුරො **පාදපාවරා**,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2786. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සත්තපදුමියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සත්තපදුමියත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 315. පුප්ඵාසනදායකත්ථෙරාපදානං

2787. සුවණ්ණවණ්ණං සම්බුද්ධං සතරංසිං'ව[2] භානුමං,
අවිදූරෙන ගච්ඡන්තං **සිද්ධත්ථං** අපරාජිතං.

2788 තස්ස පච්චුග්ගමිත්වාන පවෙසෙත්වාන අස්සමං,
පුප්ඵාසනං මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

2789. අඤ්ජලිම්පග්ගහෙත්වාන වෙදජාතො තදා අහං,
බුද්ධෙ චිත්තං පසාදෙත්වා තං කම්මං පරිණාමයිං.

2790. යං මෙ අත්ථි කතං පුඤ්ඤං සයම්භුමහපරාජිතෙ,
සබ්බෙන තෙන කුසලෙන විමලො හොමි සාසනෙ.

---

1. නභෙන, සීමු: මජසං 2. පීතරංසිංච, මජසං.

2779. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් (බුදුරජුන්ගේ ගමන පිළිබඳ) සංඥවක් ලැබීම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මේ බුද්ධසංඥවෙහි (=බුද්ධානුස්සතියෙහි) විපාක යි.

2780. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **ගතසඤ්ඤක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ගතසඤ්ඤක සථවිරාවදානය තෙවැනි යි.**

## 314. සතතපදුමිය සථවිරාවදානය

2781. මම ගං ඉවුරෙහි **නෙසාද** නම් බමුණෙක් ව පියුම්වලින් අසපුව හැමද වෙසෙමි.

2782. වනහිසින් වඩින ලොවට ගුරු වූ රත්වන් වූ **සිදුහත්** බුදුරජුන් දැක මට ප්‍රීතිය පහළ විය.

2783. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සම්බුදුරජුන් වෙත පෙරගමන් කොට අසපුව ද පිළිගන්වා **උතුම්** නෙළුම්මලින් පිදීමි.

2784. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2785. මෙයින් එක්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **පාදපාවර** නම් සිවු සක්විති රජකෙනෙක් වූහ.

2786. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **සතතපදුමිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සතතපදුමිය සථවිරාවදානය සිවුවැනි යි.**

## 315. පුෂ්පාසනදායක සථවිරාවදානය

2787. නුදුරෙන් වඩින්නා වූ රන්වන් වූ සියක් රැස් ඇති හිරු මෙන් (බබළන්නා වූ) පස්මරුන් දිනූ **සිද්ධාර්ථ** බුදුරජුන් දිටිමි.

2788. උන්වහන්සේට පෙරගමන් කොට (මාගේ) අසපුවට පමුණුවා පැහැදි සිතින් මා විසින් පුෂ්පාසනයක් දෙන ලදි.

2789. එකල්හි මම හටගත් ප්‍රීති සිත් ඇත්තෙම් ඇඳිලි බැඳ බුදුරජුන් කෙරෙහි සිත පහදවා ඒ (ප්‍රසාදමය) පුණ්‍යකර්මය මුහුකුරුවා ලීමි.

2790. පස්මරුන් දිනූ බුදුරජුන් කෙරෙහි මා විසින් කරණ ලද යම් පින්කමක් ඇද්ද, ඒ සියලු ම කුශලය හෙතු කොට ගෙණ ශාසනයෙහි **පිරිසිදු** (රහත්) වූවෙක් වෙමි.

2791. චතුනවුතෙ ඉතො කප්පෙ පුප්ඵාසනමදං තදා,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵාසනස්සිදං ඵලං.

2792. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුප්ඵාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුප්ඵාසනදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 316. ආසනත්ථවිකත්ථෙරාපදානං

2793. චෙතියං උත්තමං නාම **සිඛිනො** ලොකබන්ධුනො,
අරඤ්ඤෙ ඉරිනෙ[1] වනෙ අන්ධාහිණ්ඩාමහං තදා.

2794. පවනා නික්ඛමිත්වාන දිට්ඨං සීහාසනං මයා,
එකංසං අඤ්ජලිං කත්වා ථවිස්සං[2] ලොකනායකං.

2795. දිවසභාගං ථවිත්වාන බුද්ධං ලොකග්ගනායකං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ඉමං වාචමුදීරයිං.

2796. “නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
සබ්බඤ්ඤූසි මහාවීර ලොකජෙට්ඨ නරාසභ”.

2797. අභිත්ථවිත්වා සිඛිනං නිමිත්තකරණෙනහං,
ආසනං අභිවාදෙත්වා පක්කාමි උත්තරාමුඛො.

2798. එකතිංසෙ ඉතො කප්පෙ සන්ථවිං[3] වදතං වරං,
දුග්ගතිං නාභිජානාමි ථොමනාය ඉදං ඵලං.

2799. සත්තවීසෙ ඉතො කප්පෙ **අතුල්‍යා**[4] සත්ත අසු තෙ,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2800. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ආසනත්ථවිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ආසනත්ථවිකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

1. ඉරීනෙ, මජසං. 2. සන්ථවිං, මජසං. 3. යං ථවිං, මජසං.
4. අතුලා, මජසං.

2791. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි (යම්) පුෂ්පාසනදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුෂ්පාසනදානයාගේ මේ විපාක යි.

2792 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පුෂ්පාසනදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පුෂ්පාසනදායක ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 316. ආසනත්ථවික ස්ථවිරාවදානය

2793. ලොකබන්ධු වූ සිඛී බුදුරජුන් පිළිබඳ උත්තම නම් සෑයෙක් විය. එකල්හි මම ජනසඤ්චාර විරහිත (පාළු) මහවෙනෙහි මංමුළා වූයෙම් (ඒ මේ අත) ඇවිදිමි.

2794. වනයෙන් නික්ම (යන) මා විසින් ශ්‍රෙෂ්ඨ (=බුද්ධ) ආසනය දක්නා ලදී. (උතුරුසළුව) සකස් කොට ඇඳිලි බැඳ ලොකනායක වූ බුදුරජුන්හට ස්තුති කෙළෙමි.

2795. ලොකයෙහි අසහාය නායක වූ බුදුරජුන්හට දවහල මුළුල්ලෙහි ස්තුති කොට සොම්නස් වූයෙම් සොම්නස් වූ සිතින් ම මේ වචන කීමි:

2796. "පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, මහාවීරයන් වහන්ස, මුබන් සර්වඥ වෙහු ය" කීයා යි.

2797. මම බුද්ධාසනය නිමිති කිරීමෙන් සිඛී බුදුරජුන්හට ස්තුති කොට බුද්ධාසනය වැඳ උතුරුදිගට මුහුණ ලා නික්මුනෙමි.

2798. මෙයින් එක්තිස්වන කපෙහි බුදුරජුන්හට ස්තුති කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ස්තුති කිරීමෙහි මේ විපාක යි.

2799. මෙයින් සත්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **අතුල** නම් සත් සක්විති රජකෙනෙක් වූහ.

2800. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **ආසනත්ථවික** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**ආසනත්ථවික ස්ථවිරාවදානය සවැනි යි.**

## 317. සද්දසඤ්ඤකත්ථෙරාපදානං

2801. සුදස්සනො මහාවීරො දෙසෙන්තො අමතං පදං,
පරිවුතො සාවකෙහි වසති සරමුත්තමෙ.

2802. තාය වාචාය මධුරාය සඞ්ගණ්හාති[1] මහාජනං,
ඝොසො ච විපුලො ආසි ආසංසො[2] දෙවමානුසෙ.

2803. නිග්ඝොසසද්දං සුත්වාන සිද්ධත්ථස්ස මහෙසිනො,
සද්දෙ චිත්තං පසාදෙත්වා අවන්දිං ලොකනායකං.

2804. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2805. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සද්දසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සද්දසඤ්ඤකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 318. තිරංසියත්ථෙරාපදානං

2806. කෙසරිං අභිජාතංව අග්ගික්ඛන්ධංව පබ්බතෙ,
ඔභාසෙන්තං දිසා සබ්බා[3] සිද්ධත්ථං පබ්බතන්තරෙ.

2807. සූරියස්ස ච ආලොකං චන්දාලොකං තථෙව ච,
බුද්ධාලොකඤ්ච දිස්වාන චිත්තං මෙ උදපජ්ජථ.[4]

2808. තයො ආලොකෙ දිස්වාන බුද්ධඤ්ච[5] සාවකුත්තමං,
එකංසං අජිනං කත්වා සන්ථවිං ලොකනායකං.

2809. තයො හි ආලොකකරා ලොකෙ ලොකතමොනුදා,
චන්දො ච සූරියො චාපි බුද්ධො ච ලොකනායකො.

2810. ඔපම්මමුපදස්සෙත්වා කිත්තිතො මෙ මහාමුනි,
බුද්ධස්ස වණ්ණං කිත්තෙත්වා කප්පං සග්ගම්හි මොදහං.

2811. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං බුද්ධමභිකිත්තයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

2812. එකසට්ඨිම්හිතො කප්පෙ එකො ඤාණධරො අහු,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2813. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිරංසියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිරංසියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. සඞ්ගණ්හතෙත, සීමු. 2. ආසි ඝො, මජසං. 3. දිසාසිත්තං, සයා.
4 උපපජ්ජථං, සීමු.. 5. සම්බුද්ධං, මජසං.

## 317. සද්දසඤ්ඤක ස්ථවිරාපදානය

2801. මනා දැකීම් ඇති මහාවීර වූ **සිදුහත්** බුදුරජතෙම අමාදහම් දෙසමින් ශ්‍රාවක සඞ්ඝයා විසින් පිරිවරණලද්දේ ව උත්තම විහාරයෙහි වැඩ වෙසෙසි.

2802. ඒ මිහිරි බසින් මහාජනයාට සඞ්ග්‍රහ කෙරෙසි. දෙවි මිනිසුන් අතුරෙහි පැතිරී ගිය දෙසුම් හඬ ද මහත් විය.

2803. මෙසේ **සිදුහත්** බුදුරජුන්ගේ මහත් ශබ්දයෙහි සිත පහදවා ලොකනායක වූ බුදුරජුන් වැන්දෙමි.

2804. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි (බුදුරජුන්ගේ මිහිරි හඬෙහි) යම් ශබ්දසංඥාවක් ලැබූයෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවෙහි මේ විපාක යි.

2805. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සද්දසඤ්ඤක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සද්දසඤ්ඤක ස්ථවිරාපදානය සත්වැනි යි.**

## 318. තිරංසිය ස්ථවිරාපදානය

2806. ශ්‍රෙෂ්ඨජන්ම ඇති කෙශරසිංහයකු වැනි වූද, පර්වතයෙහි (දිලියෙන) ගිනිකඳක් වැනි වූද, සියලු දිගුන් බබුළුවන්නා වූ කඳු අතුරෙහි (වැඩහුන්) **සිදුහත්** බුදුරජුන් (දිටිමි.)

2807. බුද්ධාලොකය ද, සූර්යාලොකය ද එසේ ම චන්ද්‍රාලොකය ද, දැක මට ප්‍රීතිය පහළ විය.

2808. මේ තුන් එළිය දැක අඳුන් දිවිසම එකස් කොට ශ්‍රාවකොත්තම වූ ලොකනායක වූ බුදුරජුන්හට සතුති කෙළෙමි.

2809. ලොව්හි ලොවඳුරු දුරු කරන්නා වූ එළිය පතුරුවන්නෝ තිදෙනෙක් වෙති: චන්ද්‍රයා ද සූර්යයා ද ලොකනායක වූ බුදුරජ ද යන මේ තිදෙනා යි.

2810. මා විසින් (මෙසේ) උපමා දක්වා මහාමුනි වූ බුදුරජ පසසන ලදි. බුදුරජුන්ගේ ගුණ ප්‍රකාශ කොට කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටු වීමි.

2811. මෙයින් සිවුඅනූවන කපෙහි යම් බුදුගුණ වැණුමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුදු ගුණ පැවසීමෙහි මේ විපාක යි.

2812. මෙයින් එක්සැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ක්ෂුණ්ඩර නම් සක්විති රජෙක් වීමි.

2813 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිරංසිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිරංසිය ස්ථවිරාපදානය අටවැනි යි.**

## 319. කන්දලිපුප්ඵියත්ථෙරාපදානං

2814. සින්ධුයා නදියා තීරෙ අහොසිං කස්සකො තදා,
පරකම්මායනෙ යුත්තො පරභත්තං අපස්සිතො.

2815. සින්ධුමනුචරන්තො'හං සිද්ධත්ථං ජිනමද්දසං,
සමාධිතා නිසින්නංව සතපත්තංව පුප්ඵිතං.

2816. සත්ත කන්දලිපුප්ඵානි වණ්ටෙ ඡෙත්වානහං තදා,
මත්ථකෙ අභිරොපෙසිං බුද්ධස්සාදිච්චබන්ධුනො.

2817. සුවණ්ණවණ්ණං සම්බුද්ධං අනුකූලෙ සමාහිතං,
තිධා පභින්නමාතඞ්ගං කුඤ්ජරංව දුරාසදං.

2818. තමහං උපගන්ත්වාන නිපකං භාවිතින්ද්‍රියං,
අඤ්ජලිං පග්ගහෙත්වාන අවන්දිං සත්ථුනො අහං.

2819. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2820. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කන්දලිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කන්දලිපුප්ඵියත්ථෙරස්ස අපදානං නවමං.**

## 320. කුමුදමාලියත්ථෙරාපදානං

2821. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
**විපස්සිනං** මහාවීරං අභිජාතංව කෙසරිං.

2822. රථියං පටිපජ්ජන්තං ආහුතීනං පටිග්ගහං,
ගහෙත්වා කුමුදං මාලං බුද්ධසෙට්ඨං සමොකිරිං.

2823. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2824. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුමුදමාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**කුමුදමාලියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

ආරක්ඛදො භොජනදො ගතසඤ්ඤී පදුමියො
පුප්ඵාසනී සඤ්චවිකො සද්දසඤ්ඤී තිරංසිකො
කන්දලිකො කුමුදී ච සත්තපඤ්ඤාස ගාථකා.

**ආරක්ඛදායකවග්ගො බාත්තිංසතිමො.**

## 319. කන්දලිපුප්ඵිය ස්ථවිරාවදානය

2814-2815. එකල්හි (මම) **සින්ධුනදීතීරයෙහි** අනුත්යේ මෙහෙ කිරිමෙහි යෙදුනු ගොවියෙක් වීමි. අනුත්ගෙන් ලැබෙන බතක් නොසෙවුනෙම් වීමි. සින්ධු ගං ඉවුර දියේ ගමන් කරන්නා වූ මම පිපුණු නෙළුම් මලක් මෙන් සමාධියෙන් යුතුව හුන් **සිද්ධත්** බුදුරජුන් දිටිමි.

2816. මම එකල්හි කඳලගෙඩියමල් සතක් නවුමෙන් කඩා හිරුගොත්හි වූ බුදුරජුන්ගේ හිසමත නගාලිමි.

2817. සුදුසු තන්හි හෙවත් සුදුසු අරමුණෙහි එකඟ වූ සිත් ඇති සවණ්වණ් වූ ත්‍රිමදගලිත හස්තිරාජයකු වැනි වූ දුරාසද වූ (=ගුණයෙන් කිසිවකු විසින් ලංවිය නො හැක්කා වූ)

2818. ප්‍රඥාවත් වූ වැඩු සැදැහැ ඇ‍ති ඉඳුරන් ඇති ඒ බුදුරජුන් වෙත එළඹ මම ඒ බුදුන් ඇඳිලි බැඳ වැන්දෙමි.

2819. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2820. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කන්දලිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කන්දලිපුප්ඵිය ස්ථවිරාවදානය නවවැනි යි.**

## 320. කුමුදමාලිය ස්ථවිරාවදානය

2821-2822. ශ්‍රෙෂ්ඨ වූ උතුම් වූ වීර වූ මහර්ෂී වූ පස්මරුන් දිනූ විශිෂ්ට ජන්ම ඇති සිංහයකු වැනි වූ ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ මහමගට පිළිපන් **විපස්සී** බුදුරජුන් (දිටිමි.) දැක කුමුදුමල් ගෙණ (එයින්) බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

2823. මෙයින් එකානූවක කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2824. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **කුමුදමාලිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කුමුදමාලිය ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

ආරක්ඛ ද භොජන ද ගතසඤ්ඤී පදුමිය
පුප්ඵාසනී සන්ථවික සද්දසඤ්ඤී තිරසිංක
කන්දලික කුමුදීදැයි ගී සත්පණසෙක් වේ.

**ආරක්ඛාදායක වර්ගය දෙතිස්වනු යි.**

## 321. උම්මාපුප්ඵියත්ථෙරාපදානං*

2825. සමාහිතං සමාපන්නං සිද්ධත්ථමපරාජිතං,
සමාධිනා උපවිට්ඨං අද්දසාහං නරුත්තමං.

2826. උම්මාපුප්ඵං ගහෙත්වාන බුද්ධස්ස අභිරොපයිං,
සබ්බෙ පුප්ඵා එකසීසා උද්ධවණ්ටා[1] අධොමුඛා.

2827. සුවිතතා විය තිට්ඨන්තෙ ආකාසෙ පුප්ඵසන්ථරෙ,[2]
තෙන චිත්තප්පසාදෙන තුසිතං උපපජ්ජහං.

2828. චතුනවුතෙ ඉතො[3] කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2829. පඤ්චපඤ්ඤාසිතො කප්පෙ එකො ආසිං මහීපති,
**සමන්තච්ඡදනො** නාම චක්කවත්තී මහබ්බලො.

2830. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උම්මාපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උම්මාපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 322. පුලිනපූජකත්ථෙරාපදානං

2831. කකුධං විලසන්තංව නිසභාජානියං යථා,
ඔසධිංව විරොචන්තං ඔභාසන්තං නරාසභං.

2832. අඤ්ජලිං පග්ගහෙත්වාන අවන්දිං සත්ථුනො අහං,
සත්ථාරං පරිවණ්ණෙසිං සකකම්මෙන තොසිතො.[4]

2833. සුසුද්ධං පුලිනං ගය්හ ගතමග්ගෙ සමොකිරිං,
උච්ඡඞ්ගෙන ගහෙත්වාන **විපස්සිස්ස** මහෙසිනො.

2834. තතො උපඩ්ඪපුලිනං විප්පසන්නෙන චෙතසා,
දිවාවිහාරෙ ඔසිඤ්චිං ද්විපදින්දස්ස තාදිනො.

2835. එකනවුතෙ ඉතො කප්පෙ පුලිනං යමසිඤ්චහං,
දුග්ගතිං නාභිජානාමි පුලිනස්ස ඉදං ඵලං.

2836. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුලිනපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුලිනපූජකත්ථෙරස්ස අපදානං දුතියං.**

---

* උමාපුප්ඵියත්ථෙරාපදානං, මජසං. 1. උද්ධංවණ්ටා, මජසං.
2. පුප්ඵසන්ථරා, මජසං. 3. චතුන්නවුතිතො, මජසං. 4. තොසයිං, මජසං.

## 321. උම්මාපුප්ඵියස්ථවිරාවදානය

2825. අරමුණෙහි පිහිටු වූ සිතැති සමවතට සමවත් පස්මරුන්ගෙන් නො පැරදුනු සමාධියෙන් හුන් **සිදුහත්** බුදුරජුන් දිටිමි.

2826. (දක) දියබෙරලිය මල් ගෙණ බුදුරජුන් පිදීමි. හැම මල් සමසිස් උඩුහුරු නටු ඇති ව යටිමිණි ව සිටියේ ය.

2827. ඉතා විසිතුරුව අහසෙහි මල් ඇතිරියක් මෙන් සිටි කල්හි (ඒ පිළිබඳව ඇති වූ) එම චිත්තප්‍රසාදය හෙතු කොට ගෙණ මම තුසිත දෙව් ලොව උපනිමි.

2828. මෙයින් සිවුඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

2829. මෙයින් පස්පණස්වන කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති **සමන්තචක්ඛු** නම් සක්විති රජෙක් වීමි.

2830. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මෙ අයුරින් ආයුෂමත් **උම්මාපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**උම්මාපුප්ඵියස්ථවිරාවදානය පළමුවැනි යි.**

## 322. පුලිනපූජකස්ථවිරාවදානය

2831. බබලන කුඹුක් ගසක් වැනි වූ ද, ශ්‍රෙෂ්ඨ ආජානීයයකු බඳු වූ ද, ඔසධී තාරකාව මෙන් දිලියෙන ප්‍රභාශ්වර වූ නරශ්‍රෙෂ්ඨ බුදුරජුන් දිටිමි.

2832-2833. (දක) මම ඇඳිලි බැඳ ශාස්තෘන් වහන්සේ වැන්දෙමි. බුදුරජුන් පැසසීමි. සිය පින්කමින් තුටු වූයෙමි පිරිසිදු වැලි ගෙණ ඔඩොක්කුවෙහි ලා ගෙණ ගොස් **විපස්සි** බුදුරජුන් වැඩි මගෙහි දැමීමි.

2834. ඉක්බිති වෙසෙසින් පහන් වූ සිතින් ඉන් අඩක් වැලි බුදුරජුන් දහවල් වසන තන්හි **තාදීගුණ** ඇති තථාගතයන්හට පූජාවක් ලෙස විසුළෙමි.

2835. මෙයින් එක්අනූවන කපෙහි මම යම් වැලි ඉසීමක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වැලි ඉසීමෙහි මේ විපාක යි.

2836. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂමත් **පුලිනපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පුලිනපූජකස්ථවිරාවදානය දෙවැනි යි.**

## 323. හාසජනකත්ථෙරාපදානං

2837. දුමග්ගෙ පංසුකූලකං[1] ලග්ගං දිස්වාන සත්ථුනො,
අඤ්ජලිම්පග්ගහෙත්වාන භිය්‍යො උච්චාරිතං මයා.

2838. දූරතො පතිදිස්වාන[2] හාසො මෙ උදපජ්ජථ,[3]
අඤ්ජලිම්පග්ගහෙත්වාන භිය්‍යො චිත්තං පසාදයිං.

2839. එකනවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2840. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **හාසජනකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**හාසජනකත්ථෙරස්ස අපදානං තතියං.**

## 324. යඤ්ඤසාමිකත්ථෙරාපදානං

2841. ජාතියා සත්තවස්සොහං අහොසිං මන්තපාරගූ,
කුලවංසං[4] අධාරෙසිං යඤ්ඤ උස්සාහිතො මයා.

2842. චුල්ලාසීතිසහස්සානි පසූ හඤ්ඤන්ති මෙ තදා,
සාරත්ථම්භූපනීතානි[5] යඤ්ඤත්ථාය උපට්ඨිතා.

2843. උක්කාමුඛපහට්ඨොව ඛදිරඞ්ගාරසන්නිභො,
උදයන්තොව සූරියො පුණ්ණමාසෙව චන්දිමා.

2844. සිද්ධත්ථො සබ්බසිද්ධත්ථො තිලොකමහිතො හිතො,
උපගන්ත්වාන සම්බුද්ධො ඉදං වචනමබ්‍රවි–

2845. "අහිංසා සබ්බපාණානං කුමාර මම රුච්චති,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරති.

2846. රති ච සමචරියාය බාහුසච්චං කතඤ්ඤුතා,
දිට්ඨෙ ධම්මෙ පරත්ථ ච එතෙ ධම්මා පසංසියා.

2847. එතෙ ධම්මෙ භාවයිත්වා සබ්බසත්තහිතෙ රතො,
බුද්ධෙ චිත්තං පසාදෙත්වා භාවෙහි මග්ගමුත්තමං".

2848. ඉදං වත්වාන සබ්බඤ්ඤූ ලොකජෙට්ඨො නරාසභො,
මමෙවමනුසාසිත්වා වෙහාසමුග්ගතො ගතො.

2849. පුබ්බෙ චිත්තං විසොධෙත්වා පච්ඡා චිත්තං පසාදයිං,
තෙන චිත්තප්පසාදෙන තුසිතං උපපජ්ජහං.

1. පංසුකූලිකං, සයා. 2. පන දිස්වාන, මජ්ඣං. 3. උපපජ්ජථ, සීමු.
4. කුලවත්තං, මජ්ඣං. 5. සාරසම්, හි උපනීතානි, මජ්ඣං.

## 323. හාසජනකසථවිරාපදානය

2837. ශාස්තෘන් වහන්සේගේ පසුල් සිවුර ගස්මුදුනක එල්බෙනු දුක මා විසින් ඇඳිලි බැඳ (එය) වඩාත් ඔසවන ලදි.

2838. ආපසු හැරී නැවත එය දුක්මෙන් මට සතුට පහළ විය. (ඉක්බිති) මුදුනෙහි ඇඳිලි බැඳ වඩාත් සිත පැහැද වීමි.

2839. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි (බුදුරජුන්ගේ පසුල් සිවුර පිළිබඳ) යම් පහන් හැඟීමක් ලැබූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධචීවරය පිළිබඳ පහන් හැඟීමෙහි මේ විපාක යි.

2840. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **හාසජනක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**හාසජනකසථවිරාපදානය තෙවැනි යි.**

## 324. යඤ්ඤසාමිකසථවිරාපදානය

2841. උපයින් සත්හැවිරිදි වූ මම වෙදයෙහි පරතෙර පත්‍යෙම් කුල පරපුර දැරීමි. මා විසින් යාගයක් අරඹන ලදී.

2842. එකල්හි මා විසින් අසූසාරදහසක් සිවුපාවෝ මරණු ලැබෙත්. (ඒ සිවුපාවෝ) යාගය පිණිස යූපසථම්භය වෙත පමුණුවන ලද්දාහු පසෙක සිටියාහුය.

2843-2844. උදුන්මුවැ පහළ සවර්ණයකට බඳුවූ ද උදාවන හිරු වැනි වූ ද පසළොස්වක් දිනයෙහි සඳු වැනි වූ ද කිහිරඟුරු මෙන් බබළන පැහැපත් මුහුණු ඇත්තේ සතුටු වූ තුන්ලෝවාසීන් විසින් පුදන ලද (තිලොවට) හිත වූ මුදුන් පමුණුවා ගත් සියලු අභිමතාර්ථ ඇති **සිදුහත්** බුදුරජ තෙම (එතැනට) එළඹ මේ වචන වදාළේය:

2845-2846. "කුමර සව්සත්නට හිංසා නො කිරීම මට රිසියේ. එසේම සොරකමින් දුරාචාරයෙන් මත්පැන් පීමෙන් වැළැක්මත්, සමචරියාවෙහි ඇල්ම ද, බහුශ්‍රැත බව හා කෘතඥ බව ද, (මට රිසියේ). මේ ධර්මයෝ මෙලොව්හි ද පරලොව්හි ද ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

2847. මේ ධර්මයන් වඩා සව්සත්නට හිත වැඩෙහි ඇළුනේ බුදු-රජුන් කෙරෙහි සිත පහදවා උතුම් මග (=ප්‍රතිපත්තිය) වඩව"

2848. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සර්වඥ තෙම මෙය වදාරා මට මෙසේ අනුශාසනා කොට අහස් නැග නික්ම ගියේය.

2849. පළමු ම සිත පිරිසිදු කොට පසුව සිත පැහැද වීමි. මම ඒ චිත්තප්‍රසාදයෙන් තුසිත දෙව්ලොව උපනිමි.

2850. චතුන්නවුතෙ ඉතො කප්පෙ යදා චිත්තං පසාදයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2851. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සඤ්ඤසාමිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සඤ්ඤසාමිකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 325. නිමිත්තසඤ්ඤකත්ථෙරාපදානං

2852. චන්දභාගානදීතීරෙ වසාමි අස්සමෙ අහං,
සුවණ්ණමිග මද්දක්ඛිං චරන්තං විපිනෙ අහං.

2853. මිගෙ චිත්තං පසාදෙත්වා ලොකජෙට්ඨමනුස්සරිං,
තෙන චිත්තප්පසාදෙන අඤ්ඤෙ බුද්ධෙ අනුස්සරිං.

2854. අබ්භතීතා ච යෙ බුද්ධා වත්තමානා අනාගතා,
එවමෙව විරොචන්ති මිගරාජාව තෙ තයො.

2855. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

2856. සත්තවීසෙ ඉතො කප්පෙ එකො ආසිං මහීපති,
**අරඤ්ඤසත්තො** නාමෙන චක්කවත්තී මහබ්බලො.

2857. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නිමිත්තසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නිමිත්තසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 326. අන්නසංසාවකත්ථෙරාපදානං

2858. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
කඤ්චනග්ඝියසඞ්කාසං බාත්තිංසවරලක්ඛණං.

2859. **සිද්ධත්ථං** සබ්බසිද්ධත්ථං අනෙජමපරාජිතං,
සම්බුද්ධං අතිනාමෙත්වා භොජයිං තං මහාමුනිං.

2860. මුනි කාරුණිකො ලොකෙ ඔභාසයි මමං තදා,
බුද්ධෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොදහං.

2850. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් (බුදුරජුන් කෙරෙහි) සිත පැහැද වීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුදුන් සිහි කොට සිත පැහැදවීමෙහි මේ විපාක යි.

2851. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් යක්ඛසාමික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**යක්ඛසාමික ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 325. නිමිත්තසඤ්ඤක ස්ථවිරාවදානය

2852. මම චන්ද්‍රභාගා නදීතීරයෙහි අසපුවක වෙසෙමි. මම වනයෙහි හැසිරෙන රන්වන් මුවකු දිටිමි.

2853. ඒ රන්වන් මුවා කෙරෙහි සිත පහදවා බුදුරජුන් සිහි කෙළෙමි. ඒ සිත් පැහැදීමෙන් අන් බුදුවරුන් සිහි කෙළෙමි.

2854. "අතීතයෙහි යම් බුදුකෙනෙක් වූවාහු ද වර්තමානයෙහි හා අනාගතයෙහි යම් බුදුකෙනෙක් වෙත් ද, ඒ තෙකල්හි වූ බුදුවරු මේ ස්වර්ණමෘගරාජයා මෙන් බබලත්" යයි සිහි කෙළෙමි.

2855. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් බුදුවරයන් වහන්සේ කෙනකුන් සිතින් සිහිපත් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඒ බුදුවරුන් සිහිපත් කිරීමෙහි මේ විපාක යි.

2856. මෙයින් සත්විසිවන කපෙහි පෘථිවීශ්වර වූ මහත් බල ඇති අරඤ්ඤසත්ත නම් රජෙක්ම් වීමි.

2857. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් නිමිත්තසඤ්ඤක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**නිමිත්තසඤ්ඤක ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 326. අනුසංසාවක ස්ථවිරාවදානය

2858. අතුරු අවුණෙහි (අන්තරාපනයෙහි) වඩින්නා වූ කසුන් ඇගෑවක් මෙන් බබලන දෙතිස් මහපුරිස් ලකුණු යුත් රන්වන් බුදුරජුන් (දිටිමි).

2859. සර්වඥයන් සිදු කළ කමපාවක් නොමැති පස්මරුන් පරදවා ජය ගත් සිදුහත් බුදුරජුන් වැඩම කරවා මහාමුනි වූ සර්වඥයන් වහන්සේ වැළඳ වීමි.

2860. එකල්හි ලොව්හි කාරුණිකවූ බුදුරජ තෙම මා වෙත ආලොකය පැතිර වීය. මම බුදුරජුන් කෙරෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටූ වීමි.

2861. චතුනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භික්ඛාදානස්සිදං ඵලං.

2862. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අනන්තසංසාවකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අනන්තසංසාවකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 327. නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරාපදානං

2863. යදා දෙවො දෙවකායා චවති ආයුසඞ්ඛයා,
තයො සද්දා නිච්ඡරන්ති දෙවානං අනුමොදතං.

2864. "ඉතො භො සුගතිං ගච්ඡ මනුස්සානං සහව්‍යතං,
මනුස්සභූතො සද්ධම්මෙ ලභ සද්ධමනුත්තරං.

2865. සා තෙ සද්ධා නිවිට්ඨස්ස මූලජාතා පතිට්ඨිතා,
යාවජීවං අසංහීරා සද්ධම්මෙ සුප්පවෙදිතෙ.

2866. කායෙන කුසලං කත්වා වාචාය කුසලං බහුං,
මනසා කුසලං කත්වා අබ්‍යාපජ්ජං නිරූපධිං.

2867. තතො ඔපධිකං පුඤ්ඤං කත්වා දානෙන තං බහුං,
අඤ්ඤෙපි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසය".

2868. ඉමාය අනුකම්පාය දෙවා දෙවං යදා විදූ,
චවන්තං අනුමොදන්ති "එහි දෙවපුරං පුන".

2869. සංවෙගො මෙ[1] තදා ආසි දෙවසඞ්ඝෙ සමාගතෙ,
"කිං සු[2] නාම අහං යොනිං ගමිස්සාමි ඉතො චුතො".

2870. මම සංවෙගමඤ්ඤාය සමණො භාවිතින්ද්‍රියො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකෙ.

2871. **සුමනො** නාම නාමෙන පදුමුත්තරසාවකො,
අත්ථධම්මානුසාසිත්වා සංවෙජෙසි මමං තදා.

**[ද්වාදසමං භාණවාරං.]**

2872. තස්සාහං වචනං සුත්වා බුද්ධෙ චිත්තං පසාදයිං,
තං වීරමභිවාදෙත්වා[3] තත්ථ කාලකතො අහං.

1. සංවිග්ගොහං, මජසං. 2. කං සු, මජසං. 3. ධීරං අභිවාදෙත්වා, මජසං.

2861. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. භික්ෂාදානයාගේ මේ විපාක යි.

2862. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **අනසසංසාවක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අනසසංසාවක ස්ථවිරාවදානය සවැනි යි.**

## 327. නිගගුණ්ඩිපුප්ඵියස්ථවිරාවදානය

2863. යම් කලෙක්හි ආයු පිරිහී යැමෙන් දෙවියෙක් දෙව්ලොවින් ච්‍යුත ව යේ ද, (එකල්හි) අනුමෝදනය කරන්නා වූ දෙවියන්ගේ ත්‍රිවිධ ශබ්දකෙනෙක් නිකුත් ව යෙත්:*

2864. "පින්වත, මෙයින් සැව මනුෂ්‍යයන්ගේ සහභාවය වූ සුගතියට යනු මැනව. මිනිස් ව සසුනෙහි උතුම් වූ ශ්‍රද්ධාව ලබනු මැනව. (1)

2865-2866-2867. තාගේ ඒ ශ්‍රද්ධා තොමෝ (තථාගත) ප්‍රවිදිත වූ (කුශල)සද්ධර්මයෙහි නිශ්චය විසින් බැසගන්නා ලද්දී හටගත් මුල් ඇත්තී (තොප) දිවි ඇති තාක් නොසැලුනී වේවා. කයින් කුසල්, වචනයෙන් කුසල් බොහෝ කොට - සිතින් ව්‍යාපාද රහිත කෙලෙශොපධි රහිත කුසල් කොට - තවද දන් දීමෙන් ඒ ඖපධික (අත්බැව් සපුවට හා සම්පත් භවයට හිතවූ) පින් බොහෝ කොට - අන් මිනිසුන් ද කුශලධර්මයෙහි, බ්‍රහ්මචර්‍ය්‍යයෙහි පිහිටුවනු මැනව". (2)

2868. යම් කලෙක දෙවිවරු ච්‍යුත වන දෙවියකු දනිත් ද "දෙව්පුරයට නැවත එනු මැනවැ"යි (3) (ඔහුට) මෙබඳු අනුකම්පාවෙන් අනුමෝදනය කෙරෙත්.

2869. දිව්‍ය සමූහයා රැස් වූ එකල්හි "මම මෙයින් සැව කිනම් යොනියකට (උත්පත්ති වශයෙන්) යෙම් දැ"යි මට සංවෙගයක් ඇතිවිය.

2870. වඩන ලද (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙම මාගේ සංවෙගය දැන මා එයින් උදුරණු කැමැත්තේ මවෙත ආයේ ය.

2871. එකල්හි **සුමන** නම් වූ ඒ **පදුමුත්තර** බුදුරජානන් වහන්සේගේ ශ්‍රාවක තෙම අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කොට මා සංවිග්න (උත්සාහවත්) කෙළේය.

**[දොළොස්වන බණවර යි.]**

2872. මම උන්වහන්සේගේ වචනය අසා බුදුරජුන් කෙරෙහි සිත පැහැද වීමි. ඒ ථිරයන් වහන්සේට අභිවාදනය කොට මම එහි කලුරිය කෙළෙම් වෙමි.

---

* මෙහි (1, 2, 3) අඞ්කවලින් ත්‍රිවිධ ශබ්ද දක්වෙති

2873. උපපජ්ජිසං[1] තත්ථෙව සුක්කමූලෙන චොදිතො,
වසන්තො මාතුකුච්ඡිම්හි පුන ධාරිස[2] මාතුයා.

2874. තම්හා කායා චවිත්වාන තිදසෙ උපපජ්ජහං,
එත්ථන්තරෙ න පස්සාමි දොමනස්සමහං තදා.

2875. තාවතිංසා චවිත්වාන මාතුකුච්ඡිං සමොක්කමිං,
නික්ඛමිත්වාන කුච්ඡිම්හා කණ්හසුක්කමජානහං.

2876. ජාතියා සත්තවස්සොව[3] ආරාමං පාවිසිං අහං,
ගොතමස්ස භගවතො සක්‍යපුත්තස්ස තාදිනො.

2877. විත්ථාරිතෙ[4] පාවචනෙ බාහුජඤ්ඤම්හි සාසනෙ,
අද්දසං සාසනකරෙ භික්ඛවො තත්ථ සත්ථුනො.

2878. **සාවත්ථි** නාම නගරං රාජා තත්ථාසි **කොසලො**,
රථෙන නාගයුත්තෙන උපෙසි බොධිමුත්තමං.

2879. තස්සාහං නාගං දිස්වාන පුබ්බකම්මමනුස්සරිං,
අඤ්ජලිං පග්ගහෙත්වාන සමයං අගමාසහං.

2880. ජාතියා සත්තවස්සොව පබ්බජිං අනගාරියං,
යො සො බුද්ධං උපට්ඨාසි **ආනන්දො** නාම සාවකො.

2881. ගතිමා ධිතිමා චෙව සතිමා ච බහුස්සුතො,
රඤ්ඤො චිත්තං පසාදෙන්තො නිය්‍යාදෙසි මහාජුති.

2882. තස්සාහං ධම්මං සුත්වාන පුබ්බකම්මමනුස්සරිං,
තත්ථෙව ඨිතකො සන්තො අරහත්තමපාපුණිං.

2883. එකංසං චීවරං කත්වා සිරෙ කත්වාන අඤ්ජලිං,
සම්බුද්ධමභිවාදෙත්වා ඉමං වාචමුදීරයිං:

2884. **පදුමුත්තරබුද්ධස්ස** දිපදින්දස්ස[5] සත්ථුනො,
නිග්ගුණ්ඩිපුප්ඵං පග්ගය්හ සීහාසනෙ ඨපෙසහං.

2885. තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

1. උපපජ්ජිං, මජ්සං. උපපජ්ජිස්සං, සී. සබ්බත්ථ.
2. ධාරෙති, සබ්බත්ථ 'ධාරිසං' කම්මත්ථවසෙන ගහෙතබ්බං.
3. ජාතියා සත්තවස්සෙන, ස්‍යා. 4. විත්ථාරිකෙ, මජ්සං.
5. ද්විපදින්දස්ස, මජ්සං.

2873. (එකී) කුශල මූලයෙන් මෙහෙයන ලද මම ඒ දෙව්ලොව ම උපන්මි. නැවත මවුකුසෙහි වසනෙම් මවු විසින් දරණ ලදිමි.

2874. මම ඒ මිනිසත් බැවින් සැව තව්තිසා දෙව්ලොව උපන්මි. එකල්හි මම මෙදැතුරෙහි දෞර්මනස්‍යක් නො දක්මි.

2875. තව්තිසා දෙව්ලොවින් සැව මවුකුසක උපන්මි. මවුකුසින් බිහිව මම කලු-සුදු හෙවත් පව්-පින් දැනගතිමි.

2876. මම උපතින් සත්හැවිරිදි වයස් ඇත්තෙම් ම අරමට පිවිසියෙමි. තාදී ගුණ ඇති භාග්‍යවත් වූ ගෞතම ශාක්‍යපුත්‍රයන් වහන්සේගේ -

2877. පැතුරුනාවූ බොහෝ දෙනාට අයත් වූ ප්‍රවචන සඞ්ඛ්‍යාත ඒ ශාසනයෙහි ශාස්තෘහුගේ ශාසනය පිළිපදින භික්ෂූන් දිටිමි.

2878. එහි **සැවැත්** නම් නුවර **කොසොල්** නම් රජෙක් විය. හේ ඇතු යෙදූ රියෙන් උතුම් බොධිය වෙත එළඹියේ ය.

2879. මම ඒ රජුගේ ඇතා දැක පූර්වකර්මය සිහි කෙළෙමි. මම ද ඇඳිලි බැඳ සංහාරුස්වීමට ගියෙමි.

2880. උපතින් සත්හැවිරිදි වූයෙම් ම සසුන් වන්මි. (එකල) යමෙක් බුදුරජුන්හට උවටැන් කෙළේ ද ඒ මේ **ආනන්ද** නම් ශ්‍රාවක තෙමේ යි.

2881. (සිටි පියෙහි ම සිට පද සැටදහසක් වුව ද බුදුරජුන් වදාළ නියායෙන් ම දන ගැණුමෙහි සමත් බැවින්) ගතිමත් වූ ද, (බුද්ධ වචනය ඉගෙණ ගැණුම්හි වීර්‍ය්‍යය ද, සජ්ඣායනය කිරීමෙහි වීර්‍ය්‍යය ද, සිත්හි ලා දැරුම්හි වීර්‍ය්‍යය ද, ශාස්තෘන් වහන්සේට උවටන්හි වීර්‍ය්‍යය ද, අන් හැම දෙනට ම වඩා අධිකව ඇති බැවින්) ධෘතිමත් වූ ද, (අන් හැම දෙනට ම වඩා බුදුවදන් සිත්හි ලා දැරීමෙහි සිහි ඇති බැවින්) ස්මෘතිමත් වූ ද, (මෙම සසුනෙහි භාණ්ඩාගාරික පර්‍ය්‍යාප්තියෙහි ම සිට බුදුවදන් උගත් බැවින්) බහුශ්‍රැත වූ ද, ඒ මහානුභාව ඇති ආනන්ද ස්ථවිර තෙම රජුගේ සිත පහදවමින් දම් දෙසීය.

2882. මම උන්වහන්සේගේ ධර්මය අසා පූර්වකර්මය සිහි කෙළෙමි. එහි ම සිටියේ රහත් බවට ද පැමිණියෙමි.

2883. (ඉක්බිති) සිවුර එකස් කොට හිසෙහි ඇඳිලි බැඳ සම්බුදුරජුන් වැඳ මේ වචනය කීමි:

2884. මම ශාස්තෘ වූ ද්විපදෝත්තම වූ **පදුමුත්තර** බුදුරජුන්ගේ සිහසුනෙහි (බුද්ධාසනයෙහි) සිඳුවරමල් ගෙණ තැබීමි.

2885. ද්විපදෝත්තම වූ, ලොකජ්‍යෙෂ්ඨ වූ, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඒ (කුශල) කර්මය කාරණකොට ගෙණ ජය-පරාජය දෙක හැර නිශ්චල ස්ථානය වූ නිවණට පැමිණියෙම් වෙමි.

2886. පඤ්චවීසසහස්සම්හි කප්පානං මනුජාධිපා,
අබ්බුදනිරබ්බුදනි අට්ඨ'ට්ඨා'සිංසු ඛත්තියා.

2887. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නිග්ගුණ්ඩිපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නිග්ගුණ්ඩිපුප්ඵියත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 328. සුමනාවෙළියත්ථෙරාපදානං

2888. **වෙස්සභුස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
සබ්බෙ ජනා සමාගම්ම මහාපූජං කරොන්ති තෙ.

2889. සුධාය පිණ්ඩං කත්වාන ආවෙළං සුමනායහං,
සීහාසනස්ස පුරතො අභිරොපෙසහං තදා.

2890. සබ්බෙ ජනා සමාගම්ම පෙක්ඛන්ති පුප්ඵමුත්තමං,
කෙනි'දං පූජිතං පුප්ඵං බුද්ධසෙට්ඨස්ස තාදිනො.

2891. තෙන චිත්තප්පසාදෙන නිම්මාණං උපපජ්ජහං,
අනුභොසිං[1] සකං කම්මං පුබ්බෙ සුකතමත්තනො.

2892. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙසානං පියො හොමි පුප්ඵපූජායි'දං ඵලං.

2893. නාභිජානාමි කායෙන වාචාය උද චෙතසා,
සංයතානං තපස්සීනං කතං අක්කොසිතං මයා.[2]

2894. තෙන සුචරිතෙනාහං චිත්තස්ස පණිධීහි ච,
සබ්බෙසං පූජිතො හොමි අනක්කොසස්සි'දං ඵලං.

2895. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායි'දං ඵලං.[2]

2896. ඉතො එකාදසෙ කප්පෙ **සහස්සාරො**'සි ඛත්තියො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2897. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුමනාවෙළියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුමනාවෙළියත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. අනුභොමි, මජසං. 2. එසා ගාථා 'මජසං' පොත්ථකෙ නත්ථි.

2886. පස්විසිදහස් කපෙක අබ්බුද-නිරබ්බුද වූ ගණන් විසින් මහා ආයු ඇති ව කපකට අට අට බැගින් මනුජාධිපති වූ ක්ෂත්‍රිය රජහු වූහ.

2887. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **නිග්ගුණ්ඩිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**නිග්ගුණ්ඩිපුප්ඵිය ස්ථවිරාවදානය සත්වැනි සි.**

## 328. සුමනාවෙළියස්ථවිරාවදානය

2888. තාදී ගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ **වෙස්සභූ** භාග්‍යවතුන් වහන්සේට ඒ සියලු ජනයෝ එක්ව මහා පූජාවක් කෙරෙත්.

2889. මම එකල්හි සුණු පිඩක් සමන් මල්දම් සහිත කොට බුද්ධාසනය ඉදිරියෙහි නගා ලිමි.

2890. "තාදී ගුණ ඇති බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට කවරකු විසින් මේ මල් පුදන ලදද"යි සියලු දෙනා එක්ව උතුම් මල් දෙස බලත්.

2891. මම ඒ චිත්තප්‍රසාදය හෙතු කොට ගෙණ නිර්මාණරතී දිව්‍යලොකයෙහි උපන්මි. පෙර තමා විසින් කරණ ලද පුණ්‍යකර්මය (පිළිබඳ විපාකය) අනුභව කෙළෙමි.

2892. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද (ඒ හැම තන්හි ම) සියලු දෙනාට ප්‍රිය වෙමි. පුෂ්පපූජාවෙහි මේ විපාක සි.

2893. සත්හුත් ඉදුරන් ඇති තවුසනට කයින් හෝ වචනයෙන් හෝ වැලි සිතින් හෝ මා විසින් කළ නින්දාවක් නො දනිමි.

2894. මම එම සුචරිතයෙන් ද, චිත්තප්‍රණිධි හෙතුයෙන් සියලු දෙනා විසින් පුදන ලද්දෙම් වෙමි. (තවුසනට) ආක්‍රොශ නො කිරීමෙහි මේ විපාක සි.

2895. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක සි.

2896. මෙයින් එකොළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **සහස්සාර** නම් සක්විති රජෙකිම් වීමි.

2897. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සුමනාවෙළිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සුමනාවෙළිය ස්ථවිරාවදානය අටවැනි සි.**

## 329. පුප්ඵච්ඡත්තියත්ථෙරාපදානං

2898. **සිද්ධත්ථස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
සබ්බං පකාසයන්තස්ස නිබ්බාපෙන්තස්ස පාණිනො.

2899. ජලජං ආහරිත්වාන සතපත්තං මනොරමං,
පුප්ඵස්ස ඡත්තං කත්වාන බුද්ධස්ස අභිරොපයිං.

2900. සිද්ධත්ථො ච ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසඞ්ඝෙ ඨිතො සත්ථා ඉමං ගාථං[1] අභාසථ:

2901. "යො මෙ චිත්තං පසාදෙත්වා පුප්ඵච්ඡත්තං අධාරයි[2]
තෙන චිත්තප්පසාදෙන දුග්ගතිං සො න ගච්ඡති."

2902. ඉදං වත්වාන සම්බුද්ධො සිද්ධත්ථො ලොකනායකො,
උය්යොජෙත්වාන පරිසං වෙහාසං නභමුග්ගමි.

2903. වුට්ඨිතෙ නරදෙවම්හි සෙතච්ඡත්තම්පි වුට්ඨහි,
පුරතො බුද්ධසෙට්ඨස්ස ගච්ඡති ඡත්තමුත්තමං.

2904. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ඡත්තමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵච්ඡත්තස්සි'දං ඵලං.

2905. චතුසත්තතිකප්පම්හි අට්ඨ **ජලසිඛා** අහූ,
සත්තරතනසම්පන්නා චක්කවත්තී මහබ්බලා.

2906. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුප්ඵච්ඡත්තියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුප්ඵච්ඡත්තියත්ථෙරස්ස අපදානං** නවමං.

## 330. සපරිවාරච්ඡත්තදායකත්ථෙරාපදානං

2907. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
ආකාසෙ ජලවුට්ඨී'ව වස්සති ධම්මවුට්ඨියා.

2908. තමද්දසාසිං සම්බුද්ධං දෙසෙන්තං අමතං පදං,
සකං චිත්තං පසාදෙත්වා අගමාසිං සකං ඝරං.

2909. ඡත්තං අලඞ්කතං ගය්හ උපගච්ඡිං නරුත්තමං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන ආකාසෙ උක්ඛිපිං අහං.

2910. සුසඞ්ගහිතයානං'ව දන්තොව සාවකුත්තමො,
උපගන්ත්වාන සම්බුද්ධං මත්ථකෙ සම්පතිට්ඨහි.

2911. අනුකම්පකො කාරුණිකො බුද්ධො ලොකග්ගනායකො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

---

1. ඉමා ගාථා සීමු.
2. ආධාරයිං, මජසං. අකාරයිං, සීමු.

## 329. පුප්ඵජ්ඡත්තියසථ්විරාවදානය

2898-2899. තාදී ගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ සත්‍වයන් නිවණට පමුණුවන්නා වූ සත්‍යය දෙශනා කරන්නා වූ භාග්‍යවත් වූ **සිද්ධාර්ථ** බුදුරජුන්හට දියෙහි හටගත් මනරම් නෙළුම් මල් ගෙණවුත් පුෂ්ප-ච්ඡත්‍රයක් (=මල්කුඩයක්) තගා ලීමි.

2900. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ත්‍රිවිධ ලොකය ම අව-බොධ කළ ශාස්තෘ වූ සිද්ධාර්ථ බුදුරජ තෙමේ භික්ෂු සඞ්ඝයා මැද වැඩ හුන්නේ මේ ගාථාව වදාළේය:

2901. "යමෙක් මා කෙරෙහි සිත පහදවා මල් කුඩයක් දැරී ද, හෙතෙම ඒ සිත පැහැදවීම කරණ කොට ගෙණ දුගතියකට නො යයි."

2902. ලොකනායක වූ සිද්ධාර්ථ සම්බුදුරජ තෙමේ මෙය වදාරා පිරිස යවා අහසට නැංගේය.

2903. නරදෙව වූ බුදුරජුන් අහස් නැඟි කල්හි සේසත ද නැංගේය. බුදුරජුන්ගේ ඉදිරියෙහි මහගු ඡත්‍රය ද යෙයි.

2904. මෙයින් සිවූ අනූවන කපෙහි යම් ඡත්‍රයක් පිදූයෙම් ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. පුෂ්පච්ඡත්‍ර පූජාවෙහි මේ විපාක යි.

2905. සූසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති **'ජලසිඛ'** නම් අට සක්විති රජකෙනෙක් වූහ.

2906. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.
මෙසේ මේ අයුරින් **පුෂ්පඡත්තිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**පුප්ඵජ්ඡත්තිය ස්ථවිරාවදානය නවවැනි යි.**

## 320 සපරිවාරඡත්තදායක සථ්විරාවදානය.

2907. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ **පදුමුත්තර** බුදුරජ තෙමේ අහස් ජලමෙඝයක් මෙන් දහම් වහරේ (වැසි) වස්වයි.

2908. අමාපදය (නිවණ) දෙසන්නා වූ සම්බුදුරජුන් දිටිමි. දැක තම සිත පහදවා සිය ගෙට ගියෙමි.

2909. සැරසූ ඡත්‍රයක් ගෙණ නරොත්තම වූ බුදුරජුන් වෙත එළඹියෙමි. සතුටු වූයෙම් සොම්නස් සිතින් මම එය අහස්හි තගා ලීමි.

2910. එය මැනවින් සකස් කළ යානයක් මෙන් ද, උතුම් ශ්‍රාවකයකු මෙන් ද සම්බුදුන් වෙත එළඹ හිස මතුයෙහි උඩ පිහිටියේ ය.

2911. ලොවට අනුකම්පා කරන්නා වූ කාරුණික වූ ලොකාග්‍රනායක බුදුරජ තෙමේ භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේය:

2912. “යෙන ඡත්තමිදං දින්නං අලඞ්කතං මනොරමං,
තෙන චිත්තප්පසාදෙන දුග්ගතිං සො න ගච්ඡති.

2913. සත්තක්ඛත්තුඤ්ච දෙවෙසු දෙවරජ්ජං කරිස්සති,
බත්තිංසක්ඛත්තුං රාජා ච[1] චක්කවත්තී භවිස්සති.

2914. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

2915. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.”

2916. බුද්ධස්ස ගිරමඤ්ඤාය වාචාසභිමුදීරිතං,
පසන්නචිත්තො සුමනො භිය්‍යො හාසං ජනෙසහං.

2917. ජහිත්වා මානුසිං යොනිං දෙවයොනිං[2] සමජ්ඣගං,
විමානමුත්තමං මය්හං අබ්භුග්ගතං මනොරමං.

2918. විමානා නික්ඛමන්තස්ස සෙතච්ඡත්තං ධාරීයති,
තදා සඤ්ඤං පටිලභිං පුබ්බකම්මස්සි'දං ඵලං.

2919. දෙවලොකා චවිත්වාන මනුස්සත්තඤ්ච ආගමිං,
ඡත්තිංසක්ඛත්තුං චක්කවත්තී සත්තකප්පසතම්හි' තො.

2920. තම්හා කායා චවිත්වාන ආගඤ්ඡිං තිදසං පුරං,
සංසරිත්වා' නුපුබ්බෙන මානුස්සං පුනරාගමිං.

2921. ඔක්කන්තං මාතුකුච්ඡිං මං සෙතච්ඡත්තමධාරයුං,
ජාතියා සත්තවස්සො' හං පබ්බජිං අනගාරියං.

2922. සුනන්දො නාම නාමෙන බ්‍රාහ්මණො මන්තපාරගූ,
ඵලිකං ඡත්තමාදාය සාවකග්ගස්ස සො අදා.[3]

2923. අනුමොදි මහාවීරො සාරිපුත්තො මහාකපී,
සුත්වා' නුමොදනං තස්ස පුබ්බකම්මමනුස්සරිං.

2924. අඤ්ජලිම්පග්ගහෙත්වාන සකං චිත්තං පසාදයිං,
සරිත්වා පුරිමං කම්මං අරහත්තමපාපුණිං.

2925. උට්ඨාය ආසනා තම්හා සිරෙ කත්වාන අඤ්ජලිං,
සම්බුද්ධමභිවාදෙත්වා ඉමං වාචමුදීරයිං:

2926. සතසහස්සෙ ඉතො කප්පෙ බුද්ධො ලොකෙ අනුත්තරො,
පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො.

1. බත්තිංසක්ඛත්තුඤ්ච රාජා, මජසං, 2. දිබ්බං යොනිං, මජසං. දිබ්බයොනිං, සයා.
3. තදා, මජසං.

2912. "යමකු විසින් අලඞ්කාර කරණ ලද මනරම් වූ මේ ඡත්‍රය දෙන ලද ද, ඒ චිත්තප්‍රසාදයෙන් හෙතෙම දුගතියට නො යයි.

2913. හේ දෙව්ලොවෙහි සත්වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. දෙතිස් වරක් සක්විති රජ වන්නේ ය.

2914. කල්පලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

2915. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් ම කොට නිම කළාක් වැනි ඖරස බුද්ධපුත්‍රයෙක් ව සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥා වශයෙන් දැන රහත් ව පිරිනිවෙන්නේ ය."

2916. වදාරණ ලද ඒ අසීත වචන බුදුරජුන්ගේ හඬ යයි දැන මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් වැඩියක් ම සතුට ඉපද වීමි.

2917. මිනිස් අත්බව හැර දෙව් අත්බවට පැමිණියෙමි. මට මනරම් වූ උතුම් විමනෙක් පහළ විය.

2918 විමානයෙන් නික්මෙන්නා වූ මට සේසතක් දැරෙයි. එකල්හි (පෙරකළපිළිවෙළ)සිහි ලැබීමි. පූර්වකර්මයාගේ මේ විපාක යි.

2919. දෙව්ලොවින් සැවැ මිනිසත්බවට ද පැමිණියෙමි. මින් සත්සිය වන කපෙහි සවරක් සක්විති රජ වීමි.

2920. ඒ මිනිසත්බැවින් සැවැ දෙව්ලොවට පැමිණියෙමි. පිළිවෙළින් (එහි) හැසිරැ නැවත මිනිසත්බවට පැමිණියෙමි.

2921. මවුකුස්හි පිළිසඳ ගත් මට සේසතක් දැරුණ. මම උපතින් සත්හැවිරිදි වූයෙම් සසුන් වත්මි.

2922. වෙදපාරප්‍රාප්ත වූ ඒ සුනන්ද නම් බමුණු තෙමේ පළිහු ඡත්‍රයක් ගෙණ අග්‍රශ්‍රාවකයන් වහන්සේට දුන්නේ ය.

2923. මහාවීර වූ ද මහාකථික වූ ද ශාරීපුත්‍රස්ථවිර තෙමේ අනුමෝදනා කෙළේය. උන්වහන්සේගේ අනුමෝදනාව අසා පූර්ව කර්මය සිහි කෙළෙමි.

2924. ඇඳිලි බැඳගෙණ සිය සිත පැහැදවීමි. පූර්ව (කුශල) කර්මය සිහි කොට රහත් බවට පැමිණියෙමි.

2925. මම ඒ අස්නෙන් නැගිට දෙහොත් මුදුනේ තබා ආදරයෙන් බුදුරජුන් වැඳ මෙම වචන කීමි:

2926. මෙයින් සියක් දහස් වන කපෙහි ලොව්හි හැමට ම උතුම් වූ චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළා වූ (ත්‍රිවිධ) ලොකය මැනවින් දත් ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජතෙම (ලොව පහළ විය.)

2927. තස්ස ඡත්තං මයා දින්නං විචිත්තං සමලඞ්කතං,
උභො හත්ථෙහි පග්ගණ්හි සයම්භූ අග්ගපුග්ගලො.

2928. අහො බුද්ධො අහො ධම්මො අහො නො සත්ථු සම්පදා,
එකච්ඡත්තස්ස දානෙන දුග්ගතිං නූපපජ්ජ' හං.

2929. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවෙ පරික්ඛය විහරාමි අනාසවො.

2930. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සපරිවාරඡත්තදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සපරිවාරඡත්තදායකත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

උම්මාපුප්ඵඤ්ච පුලිනං හාසො යඤ්ඤො නිමිත්තකො,
සංසාවකො නිග්ගුණ්ඩි ච සුමනං පුප්ඵඡත්තකො,
සපරිවාරඡත්තො ච ගාථා සත්තසත්තුත්තරා.

**උම්මාපුප්ඵියවග්ගො තෙත්තිංසතිමො.**

## 331. ගන්ධධූපියත්ථෙරාපදානං

3931. **සිද්ධත්ථස්ස** භගවතො ගන්ධධූපමදාසහං,
සුමනෙහි පටිච්ඡන්නං බුද්ධානුච්ඡවිකඤ්ච තං.

2932. කඤ්චනග්ඝියසඞ්කාසං සම්බුද්ධං ලොකනායකං,[1]
ඉන්දීවරංව ජලිතං ආදිත්තංව හුතාසනං.

2933. ව්‍යග්ඝූසභංව පවරං අභිජාතංව කෙසරිං,
නිසින්නං සමණානග්ගං භික්ඛුසඞ්ඝපුරක්ඛතං.

2934. දිස්වා චිත්තං පසාදෙත්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
වන්දිත්වා සත්ථුනො පාදෙ පක්කාමිං උත්තරමුඛො.

2935. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ගන්ධමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ගන්ධපූජායිදං ඵලං.

2936. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගන්ධධූපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ගන්ධධූපියත්ථෙරස්ස අපදානං පඨමං.**

1. බුද්ධං ලොකග්ගනායකං, මජසං.

2927 මා විසින් විසිතුරු වූ මනාව අලඞ්කාර කරණ ලද ඡත්‍රයක් උත්- වහන්සේට දෙන ලදී. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ අග්‍රපුද්ගල වූ සර්‍වඥතෙම දෙහොතින් එය පිළිගත්තේ ය.

2928. බුදුරජතෙම ආශ්චර්‍ය්‍ය යී සි. ධර්‍මය ආශ්චර්‍ය්‍ය යී සි. අපගේ ශාස්තෘ සම්පත්තිය ද ආශ්චර්‍ය්‍ය යී සි. මම එක ඡත්‍රයක් දීම හෙතුකොට ගෙණ දුගතියක නො උපන්මි.

2929. මවිසින් කෙලෙස් දැවින. සියලු භව නැසින. සියලු ආස්‍රව පරිඥනයෙන් දන රහත් ව වෙසෙමි.

2930 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **සපරිවාරඡත්තදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**සපරිවාරඡත්තදායක ස්ථවිරාවදානය දසවැනි සී**

උද්දානය:

උම්මාපුප්ඵිය පුලින හාස යඤ්ඤ නිම්මිතක.
සංසාවක නිග්ගුණ්ඩි සුමන පුප්ඵචඞ්ගේරික
සපරිවාරඡත්ත දැයි එක්සියසතෙක් ගී වෙයි.

**උම්මාපුප්ඵියවර්ගය තෙතිස් වනු සී.**

# 331. ගන්ධධූපිය ස්ථවිරාවදානය

2931. මම **සිදුහත්** බුදුරජුන්හට සුවඳ දුම් දිනිමි. සමත් මලින් මුසු එය බුදුරජුන්හට නිසි ද වෙයි.

2932. කසුන් ඇගැවක් මෙන් බබලන තිලුපුල් මලක් මෙන් දිලියෙන ඇවිලෙන ගින්නක් වැනි වූ-

2933. ව්‍යාඝ්‍රර්ෂභයකු මෙන් ද අභිජාත කෙශරසිංහයකු මෙන් ද ශ්‍රෙෂ්ඨ වූ ශ්‍රමණයනට අග්‍ර වූ භික්ෂුසඞ්ඝයා පිරිවරාගෙණ හුන්නා වූ (එම සිදුහත් බුදුරජුන්)-

2934. දැක සිත පහදවා ඇඳිලි බැඳ ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ උත්තරදිශාභිමුඛ ව (උතුරු දෙසට හැරී) ගියෙමි.

2935. සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් සුවඳ දුමක් දිනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ගන්ධධූප පිදීමෙහි මේ විපාකය සී.

2936. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් **ගන්ධධූපිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

**ගන්ධධූපියස්ථවිරාවදානය පළමු වැනි සී.**

## 332. උදකපූජකත්ථෙරාපදානං

2937. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අනිලඤ්ජසෙ,
ඝතාසනංව ජලිතං ආදිත්තංව හුතාසනං.

2938. පාණිනා උදකං ගය්හ ආකාසෙ උක්ඛිපිං අහං,
සම්පටිච්ඡි මහාවීරො බුද්ධො කාරුණිකො ඉසි.

2939. අන්තලික්ඛෙ ඨිතො සත්ථා පදුමුත්තරනාමකො,
මම සඞ්කප්පමඤ්ඤාය ඉමං ගාථමභාසථ:

2940. "ඉමිනා දකදානෙන පීතිඋප්පාදනෙන ච,
කප්පසතසහස්සම්පි දුග්ගතිං නුපපජ්ජසි."

2941. තෙන කම්මෙන ද්විපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

2942. සහස්සරාජනාමෙන තයො ච චක්කවත්තිනො,
පඤ්චසට්ඨිකප්පසතෙ චාතුරන්තා ජනාධිපා.

2943. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උදකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උදකපූජකත්ථෙරස්ස අපදානං දුතියං.**

## 333. පුන්නාගපුප්ඵියත්ථෙරාපදානං

2944. කානනං වනමොගය්හ වසාමි ලුද්දකො අහං,
පුන්නාගං පුප්ඵිතං දිස්වා බුද්ධසෙට්ඨං අනුස්සරිං.

2945. තං පුප්ඵං ඔචිනිත්වාන සුගන්ධං ගන්ධිතං සුභං,
ථූපං කරිත්වා[1] පුලිනෙ බුද්ධස්ස අභිරොපයිං.

2946. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

2947. එකම්හි නවුතෙ කප්පෙ එකො ආසිං තමොනුදො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො.

2948. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පුන්නාගපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පුන්නාගපුප්ඵියත්ථෙරස්ස අපදානං තතියං.**

---

1. කත්වාන, මජසං.

## 332. උදකපූජක ස්ථවිරාපදානය

2937. දිලියෙන ගින්න බඳුවූ ද ඇවිලගත් අග්නිය වැනිවූ ද අහසෙහි වඩින්නා වූ රන්වන් වූ සම්බුදු රජුන් දුටිමි.

2938 (දැක) මම අතින් දිය ගෙණ අහසෙහි ඉසීමි. මහාවීර වූ කාරුණික වූ සර්වඥ ස්වාමි තෙමේ එය පිළිගත්තේ ය.

2939. අහසෙහි වැඩසිටියා වූ **පදුමුත්තර** නම් ශාස්තෘ තෙමේ මාගේ අදහස දැන මේ ගාථාව වදාළේය:

2940. "මේ ජලදානය හේතුකොට ගෙණ ද මා කෙරෙහි ප්‍රීතිය උපදවීම හේතුකොට ගෙණ ද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදනෙහි ය".

2941. ද්විපදෝත්තම වූ, ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨයන් වහන්ස, එම කර්මය හේතුකොට ගෙණ ජය පරාජය හැර අචලස්ථානය වූ නිවණට පැමිණියෙම් වෙමි.

2942. එක්සිය හැටපස් වන කපෙහි සිවුසයුර හා (සිවුමහ දිවයින් කෙළවර කොට ඇති) පෘථිවියෙහි අධිපති වූ ජනාධිපති වූ **සහස්සරාජ** නම් වූ තුන් සක්විති රජකෙනෙක් වූහ.

2943. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උදකපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**උදකපූජක ස්ථවිරාපදානය දෙවැනි සි.**

## 333. පුන්නාගපුප්ඵිය ස්ථවිරාපදානය

2944. වැද්දෙක් වූ මම මහවනයට පිවිස වෙසෙමි. පිපුණු දොඹ ගසක් දැක බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි.

2945. වර්ණ යුතු (එහෙයින්ම) සුවඳැති ඒ මල් නෙලා වැල්ලෙහි සෑයක් කොට බුදුරජුන්හට පිදීමි.

2946. මෙයින් දෙඅනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක සි.

2947. මෙයින් එක්අනූවන කපෙහි අඳුරු දුරුකරන්නා වූ සත්රුවනින් යුත් මහත් බල ඇති එක් සක්විති රජෙකිම් වීමි.

2948. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පුන්නාගපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

**පුන්නාගපුප්ඵිය ස්ථවිරාපදානය තෙවැනි සි.**

# 334. එකදුස්සදායකත්ථෙරාපදානං

2949. නගරෙ හංසවතියා අහොසිං තිණහාරකො,
තිණහාරෙන ජීවාමි තෙන පොසෙමි දාරකෙ.

2950. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
තමන්ධකාරං නාසෙත්වා උප්පජ්ජි ලොකනායකො.

2951. සකෙ ඝරෙ නිසීදිත්වා එවං චින්තෙසහං තදා,
බුද්ධො ලොකෙ සමුප්පන්නො දෙය්‍යධම්මො ච නත්ථි මෙ.

2952. ඉදං මෙ සාටකං එකං නත්ථි මෙ කොචි දායකො,
දුක්ඛො නිරයසම්ඵස්සො රොපයිස්සාමි දක්ඛිණං.

2953. එවා'හං චින්තයිත්වාන සකං චිත්තං පසාදයිං,
එකං දුස්සං ගහෙත්වාන බුද්ධසෙට්ඨස්සදාසහං.

2954. එකං දුස්සං දදිත්වාන උක්කුට්ඨිං සම්පවත්තයිං,
යදි බුද්ධො තුවං වීර තාරෙහි මං මහාමුනි.

2955. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම දානං පකිත්තෙන්තො අකා මෙ අනුමොදනං:

2956. "ඉමිනා එකදුස්සෙන චෙතනාපණිධීහි ච,
කප්පසතසහස්සානි විනිපාතං න ගච්ඡති.

2957. ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
තෙත්තිංසක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති.

2958. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
දෙවලොකෙ මනුස්සෙ වා සංසරන්තො තුවං භවෙ.

2959. රූපවා ගුණසම්පන්නො අනවක්කන්තදෙහවා,
අක්ඛොභං අමිතං දුස්සං ලභිස්සසි යදිච්ඡකං."

2960. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනාමකො,
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජාව අම්බරෙ.

2961. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
භොගෙ මෙ ඌනතා නත්ථි එකදුස්සස්සිදං ඵලං.

2962. පදුද්ධාරෙ පදුද්ධාරෙ දුස්සං නිබ්බත්තතෙ මම,
හෙට්ඨාදුස්සම්හි තිට්ඨාමි උපරිච්ඡදනං මම.

2963. චක්කවාළමුපාදාය සකානනං සපබ්බතං,
ඉච්ඡමානො ච'හං අජ්ජ දුස්සෙහි ඡාදයෙය්‍ය'හං.

## 334. එකදුස්සදායක ස්ථවිරාපදානය

2949. (එකල්හි) මම හංසවතී නගරයෙහි තෘණහාරකයෙක් (තණ වෙළෙඳෙක්) වීමි. තෘණහාරක කර්මයෙන් ජීවත් වෙමි. එයින් ම අඹුදරුවන් පෝෂණය කරමි.

2950. සියලු ධර්මයන්ගේ පරතෙරට ගියා වූ ලොකනායක වූ පදුමුත්තර බුදුරජතෙම (මොහ නමැති) ගණඳුර නසා ලොව පහළ විය.

2951. එකල්හි ස්වකීය ගෘහයෙහි හිඳ මෙසේ සිතීමි. "බුදුරජතෙම ලොව පහළ විය. මට (උන්වහන්සේහට) දියයුතු දෙයක් ද නැත.

2952. මේ මාගේ එක ම සළුව යි. මට කිසි දායකයෙක් (දෙන කෙනෙක්) නැත. නිරයෙහි ස්පර්ශය (අපාගතවීම) දුකය. දක්ෂිණාවක් (දාන චෙතනාමය කුසල් බිජුවටක්) රෝපනය කරන්නෙමි."

2953. මම මෙසේ සිතා සිය සිත පැහැදවීමි. (මා සතු) එක ම වස්ත්‍රය ගෙණ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට පිදීමි.

2954. මම එක ම වස්ත්‍රය දී අත්පොළසන් හඬ පැවැත්වීමි "ඉදින් වීරයන් වහන්ස ඔබ වහන්සේ බුදුවරයෙක් වනසේක් නම් මහාමුනීන් වහන්ස මා සසර සයුරින් එතර කරණු මැන වැ" යි කීමි.

2955. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙමේ මාගේ දානය පසසමින් මට අනුමෝදනාවක් කෙළේය:

2956. "මේ එකම වස්ත්‍රදානය හෙතු කොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොයයි.

2957. ශක්‍රදෙවෙන්ද්‍ර ව සතිස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. තෙතිස් වරක් සක්විති රජ වන්නේ ය.

2958-2959. කරණු ලබන ප්‍රදෙශරාජ්‍ය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නො හැකිය. ඔබ භවයෙහි මිනිස් ලොව හෝ දෙව්ලොව හෝ සැරි සරන්නෙහි තම් රූපසම්පන්න වූ ගුණවත් නො මැඩලියහෙන සිරුරු ඇති (අනුන් විසින්) ගෙණ අවසන් කොට නොලිය හැකි අපමණ වූ වස්ත්‍ර සම්පත් සිත් වූ පරිදි ලබන්නෙහිය."

2960. ධීර වූ පදුමුත්තර නම් බුදුරජ තෙම මෙම වචනය වදැරා ආකාශයෙහි යන හංසරජයකු මෙන් අහස් නැගුනේය.

2961. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යෝනියක උපදිම් ද, එකල්හි මාගේ භොග සම්පත්තියෙහි අඩුබවක් නැති. එක වස්ත්‍රයක් දීමෙහි මේ විපාක යි.

2962. පියවරක් පාසා (පියවිළි අයුරින්) මට වස්ත්‍ර පහළ වේ. වස්ත්‍රය (වියන්) යට සිටිමි. මාගේ හිස මතුයෙහි නිරතුරුව ම වියනක් වේ.

2963. වන සහිත වූ ද, පර්වත සහිත වූ ද චක්‍රවාට පෘථිවිය පටන් කොට ඇති ඒ සියල්ල මම කැමැති වන්නෙම් නම් වස්ත්‍රයෙන් වසන්නෙමි.

2964. තෙනෙව එකදුස්සෙන සංසරන්තො භවාභවෙ,
සුවණ්ණවණ්ණො හුත්වාන සංසරාමි භවාභවෙ.

2965. විපාකං එකදුස්සස්ස නාජ්ඣගං කත්ථචික්ඛයං,
අයං මෙ අන්තිමා ජාති විපච්චති ඉධාපි මෙ.

2966. සතසහස්සෙ ඉතො කප්පෙ යං දුස්සමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි එකදුස්සස්සිදං ඵලං.

2967. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

2968. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකදුස්සදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකදුස්සදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං**

## 335. ඵුසිතකම්පියත්ථෙරාපදානං

2969. **විපස්සී** නාම සම්බුද්ධො ලොකජෙට්ඨො නරාසභො,
ඛීණාසවෙහි සහිතො සඞ්ඝාරාමෙ වසී තදා.

2970. ආරාමද්වාරා නික්ඛම්ම විපස්සී ලොකනායකො,
සහ සතසහස්සෙහි අට්ඨඛීණාසවෙහි තු[1].

2971. අජිනෙන නිවත්ථො’හං වාකචීරධරො’ පි ච,
කුසුම්භොදකමාදාය[2] සම්බුද්ධං උපසඞ්කමිං.

2972. සකං චිත්තං පසාදෙත්වා වෙදජාතො කතඤ්ජලී,
කුසුම්භොදකමාදාය[2] බුද්ධමබ්භුක්කිරිං අහං.

2973. තෙන කම්මෙන සම්බුද්ධො ජලජුත්තමනාමකො,
මම කම්මං පකිත්තෙත්වා අගමා යෙන පත්ථිතං.

2974. ඵුසිතා පඤ්චසහස්සා යෙහි පූජෙසහං තදා,[3]
අඩ්ඪතෙය්‍යසහස්සෙ හි දෙවරජ්ජං අකාරයිං.

2975. අඩ්ඪතෙය්‍යසහස්සස්ස හි චක්කවත්තී අහොසහං,
අවසෙසෙන කම්මෙන අරහත්තමපාපුණිං.

2976. දෙවරාජා යදා හොමි මනුජාධිපතී යදා,
තමෙව නාමධෙය්‍යං මෙ ඵුසිතො නාම හොම’හං.

1. සො, මජසං. 2. කුසුමොදක, මජසං 3. ජිතං, මජසං.

2964. ඒ එක් වස්ත්‍රයක් පිදීමෙහි විපාකය වශයෙන් කුදු මහත් භවයන්හි සැරිසරන්නෙම් ඒ කුදු මහත් භවයන්හි සුවර්ණවර්ණව ම සැරිසරමි.

2965. එක වස්ත්‍රයක් දීමෙන් ලද ඒ විපාකය කිසි තැනෙක්හි අවසන් බවට නො යයි. මේ මාගේ අන්තිම ජාතියයි. මෙහිදු ඒ කුසලය මට විපාක දෙයි.

2966. මෙයින් කල්ප ලක්ෂයකට පෙර වූ එකල්හි යම් වස්ත්‍රදානයක් දුනිම් ද ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. එක් වස්ත්‍රයක් දීමෙහි මේ විපාක යි.

2967. මවිසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. බැම් සිඳ ගත් හස්තිරාජයකු මෙන් ආශ්‍රව රහිතවූයෙම් වෙසෙමි.

2968. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකදුස්සදායක** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේකි යි.

**එකදුස්සදායක ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 335 ඵුසිතකම්පියස්ථවිරාවදානය

2969. එකල්හි ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ **විපස්සී** බුදුරජ තෙම රහතුන් විසින් පිරිවරන ලදුයේ සඞ්ඝාරාමයෙහි විසීය.

2970. ලොකනායක වූ **විපස්සී** බුදුරජ තෙමේ අටලක්ෂයක් රහතුන් සමග අරම්දොරින් නික්මෙයි.

2971. (එකල) අඳුන්දිවිසම් පෙරෙවි වැහැරි සිවුරු දරන්නා වූ මම වනුක්මල් (තම්බා ගත් වර්ණවත්) දිය ගෙණ සම්බුදුරජුන් වෙත එළඹියෙමි.

2972. මම තුටු වූයෙම් සිය සිත පහදවා කළ ඇඳිලි ඇත්තෙම් වනුක්මල් (තම්බා ගත් වර්ණවත්) ජලය ගෙණ බුදුරජුන් (උදෙසා) උඩ ඉසීමි.

2973. ඒ කර්මයෙන් **පදුමුත්තර** නම් සර්වඥයන් වහන්සේ මාගේ කුශල කර්මය පසසා අභිමත තන්හි වැඩි සේක.

2974-2975. මම එකල්හි යම් සුවඳ දියකින් බිඳු පන්දහසක් පිදුයෙම් ද (ඒ හෙතුවෙන්) මම දෙදහස් පන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරවිමි. දෙදහස් පන්සිය වරක් සක්විති රජ වීමි. ශෙෂ වූ කර්මයෙන් රහත්බවට පැමිණියෙමි.

2976. යම් කලෙක්හි ශක්‍රදෙවෙන්ද්‍රයා වෙම් ද, යම් කලෙක්හි මිනිස්-ලොව රජ වෙම් ද, මට ඒ නම ම විය. මම '**ඵුසිත**' නම් වෙමි.

2977. දෙවභූතස්ස සන්තස්ස අථාපි මානුසස්ස වා,
සමන්තා ව්‍යාමතො මය්හං ධූපිතංව පවස්සති.

2978. භවා උග්ඝාටිතා මය්හං කිලෙසා ඣාපිතා මම,
සබ්බාසවපරික්ඛීණො ධූපිතස්ස ඉදං ඵලං.

2979. චන්දනස්සෙව මෙ කායා තථා ගන්ධො පවායති,
සාරීරිකො මමං[1] ගන්ධො අඩ්ඪකොසෙ පවායති.

2980. දිබ්බගන්ධං සම්පවන්තං පුඤ්ඤකම්මසමඞ්ගිනං,
ගන්ධං ඝත්වාන ජානන්ති **ධූපිතො** ආගතො ඉධ.

2981. සාඛාපලාස කට්ඨානි තිණානිපි ච සබ්බසො,
මම සඞ්කප්පමඤ්ඤාය ගන්ධො සම්පජ්ජතෙ ඛණෙ.

2982. සතසහස්සෙ ඉතො කප්පෙ චන්දනං අභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි ධූපිතස්ස ඉදං ඵලං.

2983. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ධූපිතකම්පියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ධූපිතකම්පියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 336. පභඞ්කරත්ථෙරාපදානං

2984. **පදුමුත්තරස්ස** භගවතො[2] ලොකජෙට්ඨස්ස තාදිනො,
විපිනෙ චෙතියං ආසි වාළමිගසමාකුලෙ.

2985. න කොචි විසහි ගන්තුං චෙතියං අභිවන්දිතුං,
තිණකට්ඨලතොනද්ධං පලුග්ගං ආසි චෙතියං.

2986. වනකම්මිකො තදා ආසිං පිතුපෙතාමහෙන’හං[3],
අද්දසං විපිනෙ ථූපං ලුග්ගං තිණලතාකුලං.

2987. දිස්වානාහං බුද්ධථූපං ගරුචිත්තං උපට්ඨහිං,
“බුද්ධසෙට්ඨස්ස ථූපො’යං පලුග්ගො අච්ඡතී වනෙ.

2988. නච්ඡන්නං නප්පතිරූපං ජානන්තස්ස ගුණාගුණං,
බුද්ධථූපමසොධෙත්වා අඤ්ඤං කම්මං පයොජයෙ.”

2989. තිණං කට්ඨඤ්ච[4] වල්ලිඤ්ච සොධයිත්වාන චෙතියෙ,
වන්දිත්වා අට්ඨවාරානි පටිකුටිකො අගච්ඡහං.

---

1. සාරීරිකො මම, මජසං.
2. පදුමුත්තර භගවතො, මජසං.
3. පිතුමාතුමතෙනහං, මජසං.
4. තිණකට්ඨඤ්ච, මජසං.

2977. දෙවි වූ ද මනුෂ්‍ය වූ ද මාගේ හාත්පස බඹයක් පමණ තැන (සුවඳ) වැසි බිඳු වස්නේයි.

2978. මා විසින් භවයෝ නසන ලදහ. මාගේ කෙලෙශයෝ දවන ලදහ. සියලු ආස්‍රවයන් ප්‍රහීණ කොළෙම් වෙමි. (සුවඳ) බිඳු ඉසීමෙහි මේ විපාකයි.

2979. මාගේ සිරුරින් සඳුන් සුවඳට බඳු සුවඳ පැතිරෙයි. මාගේ සිරුරින් විහිදෙන සුවඳ අඩහඩසනක් (දුනු දෙසියපණසක්) තන්හි පැතිරේ.

2980. පුණ්‍යකර්මයට අනුකූල ව මා සිරුරින් හමන දිව්‍යසුවඳ ආඝ්‍රාණය කොට "ඵුසිත තෙම මෙහි පැමිණියේ ය"යි ජනයෝ දනිති.

2981. අතු කොළ දර තණ යන මේ දෑ හැම ලෙසින් ම මාගේ අදහස දැනගෙණ (මෙන් මා ගත්) කෙණෙහි සුවඳ විහිදුවයි.

2982. මෙයින් කල්පලක්ෂයකට පෙර සඳුන් දිය පිඳුයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (සුවඳ) බිඳු ඉසීමෙහි මේ විපාක යි.

2983. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් ඵුසිතකම්පිය ස්ථවිරයන් වහන්සේ මෙ ගාථාවන් වදාළ සේක් යි.

**ඵුසිතකම්පිය ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 336. පභඞ්කර ස්ථවිරාවදානය

2984. තාදී ගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ පදුමුත්තර බුදුරජුන්ගේ ස්තූපයක් වණ්ඩමෘගයන්ගෙන් ගැවසීගත් මහවනයෙහි විය.

2985. සෑය වඳිනු සඳහා යාමට කිසිවෙක් සමත් නො විය. චෛත්‍යය තණ දර ලිය යන මෙයින් ගැවසී ගත් බිඳීගිය එකක් විය.

2986. එකල්හි මම පියමුතුන් පරපුරෙහි ආ සිරිත අනුව වනකාර්මිකයෙක් (වනයෙහි මෙහෙ කරන්නෙක්) වීමි. වනයෙහි තෘණ ලතාවන්ගෙන් ගැවසී ගත් බිඳ වැටුණු එම සෑය ද දිටිමි.

2987. මම බුදුරජුන්ගේ (දෘ තිදත් කළ) ඒ සෑය දැක ගරු සිතක් ඉපද වීමි: "බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ මේ සෑය වෙනෙහි බිඳ වැටුනේ සිටුනා වෙයි.

2988. බුද්ධස්තූපය නො සොඩා අන්‍යකර්ම කරන්නේ තම හොඳ නොහොඳ දන්නවුනට ඒ නොමැනව, නුසුදුසුය"(යි සිතීමි.)

2989. මම චෛත්‍යයෙහි වූ තණ ද දර ද වැල් ද පිරිසිඳු කොට අටවරක් වැඳ (පිටුනොපා) ඇකිළී ගියෙමි.

2990. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

2991. තත්ථ මෙ සුකතං ව්‍යම්හං සොවණ්ණං සප්පභස්සරං,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

2992. තිසතානි ච වාරානි දෙවරජ්ජමකාරයිං,
පඤ්චවීසතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොස'හං.

2993. භවාභවෙ සංසරන්තො මහාභොගං ලභාමිහං,
භොගෙ මෙ ඌනතා නත්ථි සොධනාය ඉදං ඵලං.

2994. සිවිකා හත්ථික්ඛන්ධෙන විපිනෙ ගච්ඡතො මම,
යං යං දිසාහං ගච්ඡාමි සරණං සම්පජ්ජතෙ[1] වනං.

2995. ඛාණුං වා කණ්ටකං වාපි නාහං පස්සාමි චක්ඛුනා,
පුඤ්ඤකම්මෙන සංයුත්තො සයමෙවාපනීයරෙ.

2996. කුට්ඨං ගණ්ඩො කිලාසො ච අපමාරො විතච්ඡිකා,
දද්දු කච්ඡු ච මෙ නත්ථි සොධනාය ඉදං ඵලං.

2997. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,[2]
නාභිජානාමි මෙ කායෙ ජාතං පිළකබින්දුකං.

2998. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,
දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ.

2999. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,
සුවණ්ණවණ්ණො සබ්බත්ථ සප්පභාසො භවාමහං.

3000. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,
අමනාපං විවජ්ජති මනාපං උපතිට්ඨති.

3001. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,
විසුද්ධං හොති මෙ චිත්තං එකග්ගං සුසමාහිතං.

3002. අඤ්ඤම්පි මෙ අච්ඡරියං බුද්ධථූපම්හි සොධිතෙ,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

3003. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි සොධනාය ඉදං ඵලං.

3004. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පභඞ්කරො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පභඞ්කරත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

1. සම්පතෙ, මජසං. 2 බුද්ධථූපස්ස සොධිතෙ, සීමු.

2990 මැනවින් කළ එම කර්මය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් (සිතින් කළ පැතුම්) හේතු කොටගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

2991· එහි මට මැනවින් කරණ ලද විමානය රුවන්මුවා ය. පැහැ විහිදෙන්නේය. සැට යොදුන් උසය. තිස් යොදුන් පුළුල් ය.

2992. මම තෙසිය වරක් දෙව්රජය කරවීමි. පස්විසි වරක් සක්විති රජ වීමි.

2993. මම කුදු මහත් භවයන්හි සැරිසරමින් මහත් භොග ලැබීමි. මාගේ භොග සම්පත්තියෙහි අඩුබවෙක් නම් නැත. (චෛත්‍ය) පිරිසිදු කිරීමෙහි මේ විපාක යි.

2994. සිවිකාව (දෝලාව)කින් හෝ ඇතු පිටින් හෝ වනයෙහි ගමන් කරන්නා වූ මම යම් යම් දිශාවකට යෙම් ද වනය ම මට පිහිට සලසයි.

2995. එහි මම කණු හෝ කටු හෝ ඇසින් නො දකිමි. පුණ්‍ය-කර්මයාගේ විපාකය හා යෙදුනෝ (එම කණු කටු) තුමූ ම ඉවත් වෙති.

2996. කුෂ්ට ගණ්ඩ කිලාස ද, අපස්මාර (=මීමැස්මොර) විතච්ඡිකා නම් කුෂ්ට විශෙෂය ද, දද කැසිලි ද මට නැත. (චෛත්‍ය) පිරිසිදු කිරීමෙහි මේ විපාක යි.

2997. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කිරීමෙහි මට (ලැබුනු) අනෙකුදු ආශ්චර්‍යයක් වෙයි: මාගේ සිරුරෙහි හටගන්නා වූ ස්වල්පමාත්‍ර පිළිකා බිඳකුදු නො දනිමි.

2998. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කළ කල්හි (ලද) අනෙකුදු ආශ්චර්‍ය-යක් වෙයි: දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද භව දෙකෙහි පමණක් සැරි සරමි.

2999. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කිරීමෙහි අනෙකුදු ආශ්චර්‍යයක් වෙයි: මම හැම තන්හි රන්වන් වූයෙම් ද පැහැවත් වූයෙම් ද වෙමි.

3000. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කිරීමෙහි අනෙකුදු ආශ්චර්‍යයක් වෙයි: නො කැමැති දෑ බැහැර වේ. කැමැති දෑ එළඹ සිටී.

3001. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කිරීමෙහි අනෙකුදු ආශ්චර්‍යයක් වෙයි: මාගේ සිත එකඟ වූ මැනවින් සමාධියට පත් වූ පිරිසිදු එකක් වේ.

3002. බුදුරජුන්ගේ සෑය පිරිසිදු කිරීමෙහි අනෙකුදු ආශ්චර්‍යයක් වෙයි: එක අසුනෙහි ම හිඳ රහත් බවට පැමිණියෙමි.

3003. මෙයින් සියක් දහස් වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. සෑය පිරිසිදු කිරීමෙහි මේ විපාක යි.

3004. ප්‍රතිසම්භිදාවෝ -පෙ- සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් පභඞ්කර ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යි.

**පභඞ්කර ස්ථවිරාපදානය සවැනි යි.**

## 337. තිණකුටිදායකත්ථෙරාපදානං

3005. නගරෙ බන්ධුමතියා අහොසිං පරකම්මිකො,
පරකම්මායනෙ යුත්තො පරභත්තං අපස්සිතො.

3006. රහොගතො නිසීදිත්වා එවං චින්තෙසහං තදා,
“බුද්ධො ලොකෙ සමුප්පන්නො අධිකාරො ච නත්ථි මෙ.

3007. කාලො ගතිං[1] සොධෙතුං ඛණො මෙ පටිපාදිතො,
දුක්ඛො නිරයසම්ඵස්සො අපුඤ්ඤානං හි පාණිනං”.

3008. එවාහං චින්තයිත්වාන කම්මසාමිං උපාගමිං,
එකාහං කම්මං යාචිත්වා විපිනං පාවිසිං අහං.

3009. තිණකට්ඨඤ්ච වල්ලිඤ්ච ආහරිත්වාන’හං තදා,
තිදණ්ඩකෙ ඨපෙත්වාන අකං තිණකුටිං අහං.

3010. සඞ්ඝස්සත්ථාය කුටිකං නිය්‍යාතෙත්වාන තං අහං,
තදහෙයෙව ආගන්ත්වා කම්මසාමිං උපාගමිං.

3011. තෙන කම්මෙන සුකතෙන තාවතිංසමගච්ඡහං,
තත්ථ මෙ සුකතං ව්‍යම්හං තිණකුටිකාය නිම්මිතං.[2]

3012. සහස්සකණ්ඩං සතභෙණ්ඩු ධජාලු හරිතාමයං,[3]
සතසහස්සනිය්‍යූහා ව්‍යම්හෙ පාතුභවිංසු මෙ.

3013. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
මම සඞ්කප්පමඤ්ඤාය පාසාදො උපතිට්ඨති.

3014. භයං වා ඡම්භිතත්තං ලොමහංසො න විජ්ජති,
තාසං මම න ජානාමි තිණකුටිකායි’දං ඵලං.

3015. සීහව්‍යග්ඝා ච දීපී ච අච්ඡකොකතරච්ඡකා,
සබ්බෙ මං පරිවජ්ජෙන්ති තිණකුටිකායි’ දං ඵලං.

3016. සිරිංසපා[4] ච භූතා ච අහිකුම්භණ්ඩරක්ඛසා,
තෙ පි මං පරිවජ්ජෙන්ති තිණකුටිකායි’ දං ඵලං.

3017. න පාපසුපිනස්සා’ හං[5] සරාමි දස්සනං මම,
උපට්ඨිතා සති මය්හං තිණකුටිකායි’ දං ඵලං.

3018. තායෙව තිණකුටිකාය අනුභොත්වාන සම්පදා,
ගොතමස්ස භගවතො ධම්මං සච්ඡිකරිං අහං.

---

1. කාලො මෙ ගතිං, මජසං. 2. කුටිකාය සුනිම්මිතං, මජසං.
3. සහස්සකණ්ඩා සතභෙණ්ඩු ධජාලූහරිතාමයො, සීමු. 4. සරීසපා, මජසං.
5. න පාපසුපිනස්සාති, මජසං.

# 337. තිණකුටිදායක ස්ථවිරාපදානය

3005. මම බන්ධුමතී නගරයෙහි අනුන්ගේ බැල මෙහෙ කිරීමෙහි යෙදුනෙම් අනුන්ගේ බත් වැටුප් බලාපොරොත්තු වන්නෙම් අනුන්ගේ බැලමෙහෙකරුවෙක් වීමි.

3006. මම එකල්හි රහසිගතව හිඳ මෙසේ සිතීමි. "බුදුරජතෙම ලොව පහළ විය, මට පිණක් ද නැත:

3007. මාගේ ගතිය පිරිසිදු කර ගන්නට මේ කාලය යි. මට (අෂ්ටදුෂ්ටක්ෂණ විනිර්මුක්ත) සුදුසු මොහොත පිළියෙල විය. පින් නො කළ සතුනට නිරයෙහි පහස දුකය" කියා යි.

3008. මම මෙසේ සිතා මට වැඩ දෙන ස්වාමියා වෙත එළඹියෙමි. මම එක දිනක වැඩ ඉල්වා ගෙණ වනයට පිවිසියෙමි.

3009. මම එකල්හි තණ ලී වැල් ද ගෙණවුත් ත්‍රිදණ්ඩකයෙහි (=කතිර සිටින සේ එකට බැඳි දඬු තුනෙහි) තබා තෘණකුටියක් කෙළෙමි.

3010. මම සඞ්ඝයා පිණිස කළ තෙල කුටිය පිළිගන්වා එදවස්හි ම කම්ස්වාමියා වෙත එළඹියෙමි.

3011. මම මැනවින් කළ ඒ කර්මය හෙතු කොට ගෙණ තව්තිසා දෙව්ලොවට ගියෙමි. එහි මට (සඞ්ඝයාට පිළිගැන්වූ) තෘණකුටිය වෙනුවට මැනවින් කළ විමානයක් මැවුනේ විය.

3012. එහි කොටස් දහසකි. ගොලාකාර මුදුන් සියයකි. ධජ බහුලය. නිල්වන්ය. ඒ මාගේ විමානයෙහි සියක් දහසක් ශිඛර පහළ වූහ.

3013. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද, (ඒ සියලු තන්හි) මාගේ අදහසට අනුව ප්‍රාසාදයක් එළඹ සිටී.

3014. භයක් හෝ තැති ගැණීමක් ලොමුදහ ගැණුමක් හෝ නො වේ. ඔවුන් (භයාදිය) මම නො දනිමි. මෙය තෘණකුටි දානයෙහි විපාක යි.

3015. සිංහයෝ ද ව්‍යාඝ්‍රයෝ ද වලස්සු ද වෘකයෝ ද කළුහිස් වලස්සු ද මේ සියලු වනමෘගයෝ මා කෙරෙන් ඉවත් වෙත්. තෘණකුටි-දානයෙහි මේ විපාක යි.

3016. සර්පයෝ ද භූතයෝ ද නාගයෝ ද කුම්භාණ්ඩයෝ ද රකුසෝ ද යන ඔහු ද මා කෙරෙන් ඉවත් වෙත්. තෘණකුටි දානයෙහි මේ විපාක යි.

3017. මට පවිටු සිහින පෙණුමක් ගැණ මම නො දනිමි. මාගේ සිහිය එළඹ සිටියා ය. තෘණකුටිදානයෙහි මේ විපාක යි.

3018. ඒ තෘණකුටිදානය හෙතු කොට ගෙණ ම සම්පත් අනුභව කොට මම ගෞතම බුදුරජානන් වහන්සේගේ ධර්මය ද ප්‍රත්‍යක්ෂ කෙළෙමි.

3019. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි තිණකුටිකායි’ දං ඵලං.

3020. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිණකුටිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිණකුටිදායකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 338. උත්තරෙය්‍යදායකත්ථෙරාපදානං

3021. නගරෙ හංසවතියා අහොසිං බ්‍රාහ්මණො තදා,
අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ.

3022. පුරක්ඛතො සසිස්සෙහි ජාතිමා ච සුසික්ඛිතො,
තොයාභිසෙචනත්ථාය නගරා නික්ඛමිං තදා.

3023. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
ඛීණාසවසහස්සෙහි නගරං පාවිසී ජිනො.

3024. සුචාරුරූපං දිස්වාන අනෙජකාරිතං[1] විය,
පරිවුතමරහන්තෙහි දිස්වා චිත්තං පසාදයිං.

3025. සිරසි[2] අඤ්ජලිං කත්වා නමස්සිත්වාන සුබ්බතං,
පසන්නචිත්තො සුමනො උත්තරීයමදාසහං.

3026. උභො හත්ථෙහි පග්ගය්හ සාටකං උක්ඛිපිං අහං,
යාවතා බුද්ධපරිසා තාව ඡාදෙසි සාටකො.

3027. පිණ්ඩචාරං චරන්තස්ස මහාභික්ඛුගණාදිනො,
ඡදං කරොන්තො අට්ඨාසි හාසයන්තො මමං තදා.

3028. සරතො නික්ඛමන්තස්ස සයම්භූ අග්ගපුග්ගලො,
වීථියංව ඨිතො සත්ථා අකා මෙ[3] අනුමොදනං.

3029. “පසන්නචිත්තො සුමනො යො මෙ පාදාසි සාටකං,
තමහං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො:

3030. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

3031. දෙවලොකෙ වසන්තස්ස පුඤ්ඤකම්මසමඞ්ගිනො,
සමන්තා යොජනසතං දුස්සච්ඡන්නං භවිස්සති.

3032. ඡත්තිංසක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

1. ආනෙඤ්ජකාරිතං, මජසං. 2. සිරසිං, මජසං.
3. අකාසි අනුමොදනං, සයා.

3019. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. තෘණකුටිදානයෙහි මේ විපාක යි.

3020. ප්‍රතිසම්භිදාවෝ ... සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තිණකුටිදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක් යී.

**තිණකුටිදායක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 338. උත්තරෙය්‍යදායක ස්ථවිරාවදානය

3021. එකල්හි (මම) හංසවතී නගරයෙහි වෙදහදාරන්නා වූ මන්ත්‍ර දරන්නා වූ වෙදත්‍රයෙහි පරතෙරට ගිය බමුණෙක් වීමි.

3022. මැනවින් හික්මුනු ජාතිමත් (=කුලවත්) වූ මම ස්වකීය ශිෂ්‍යයන් විසින් පෙරටු කරණ ලදුයෙම් ජලස්නානය පිණිස නුවරින් නික්මුනෙමි.

3023. සියලු (දතයුතු) ධර්මයන්ගේ පරතෙරට ගියා වූ පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජ තෙමෙ රහතුන් සමග නගරයට පිවිසියේ ය.

3024. රහතුන් විසින් පිරිවරන ලද විරාගයෙන් කරණ ලද්දක් බඳු මනොඥ රූප ඇති (බුදුරජුන්) දැක සිත පැහැදවීමි.

3025. හිසෙහි ඇඳිලි බැඳ මනා ව්‍රත ඇති (බුදුරජුන්හට) වැඳ පහන් සිත් ඇත්තෙම්-සොම්නස් සහිත වූයෙම් මම උතුරුසළුව පිදීමි.

3026. මම සළුව දෙහොතින් ගෙණ උඩට දැමීමි. සළුව බුදුපිරිස යම්තාක් ද ඒ තාක් (පැතිරී වියනකින් මෙන් බුදුපිරිස) වැසීය.

3027-3028. එකල්හි පිඩු පිණිස හැසිරෙන්නා වූ ගෘහයෙන් නික්මෙන්නා වූ මහා භික්‍ෂුසඞ්ඝයාගේ ආදිම වූ බුදුරජුන්හට සෙවෙනියක් (=වියනක්) කරමින් මා සතුටු කරවමින් (ඒ සළුව) අහසෙහි සිටියේය. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ අග්‍රපුද්ගල වූ ශාස්තෘ තෙමේ වීථියෙහි සිටියේ ම මට අනුමොදනා කෙළේය:

3029. "පහන් සිත් ඇත්තේ සොම්නස් සහිත වූයේ යමෙක් මට සළුවක් පිළිගැන්වූයේ ද මම හේ කවරෙක්දැ යි කියන්නෙමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු.

3030. මෙතෙම කප් තිස් දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. පණස් වරක් ශක්‍රදෙවෙන්ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

3031. පුණ්‍යකර්මයාගේ විපාකයෙන් යුතු වූයේ දෙව්ලොව වසන්නහුට හාත්පස සියක් යොදුන් වස්ත්‍ර සෙවෙනියක් (=වියනක්) වන්නේ ය.

3032. සතිස් වරක් සක්විතිරජ වන්නේ ය. (ලබන්නා වූ) මහත් ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකිය.

3033. භවෙ සංසරමානස්ස පුඤ්ඤකම්මසමඞ්ගිනො,
මනසා පත්ථිතං සබ්බං නිබ්බත්තිස්සති තාවදෙ.

3034. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
මහග්ඝානි ච දුස්සානි පටිලච්ඡතයං නරො.[1]

3035. මනසා පත්ථිතං සබ්බං පටිලච්ඡතයං නරො,
එකදුස්සස්ස විපාකං අනුභොස්සති සබ්බදා.

3036. සො පච්ඡා පබ්බජිත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො ධම්මං සච්ඡිකරිස්සති."

3037. අහො මෙ සුකතං කම්මං සබ්බඤ්ඤුස්ස මහෙසිනො,
එකාහං සාටකං දත්වා පත්තොම්හි අමතං පදං.

3038. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා වසතො සුඤ්ඤකෙ ඝරෙ,
ධාරෙති දුස්සච්ඡදනං සමන්තා ව්‍යාමතො මම.

3039. අවිඤ්ඤත්තං නිවාසෙමි චීවරං පච්චයඤ්ච' හං,
ලාභී[2] අන්නස්ස පානස්ස උත්තරෙය්‍යස්සිදං ඵලං.

3040. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි වත්ථදානස්සිදං ඵලං.

3041. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උත්තරෙය්‍යදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උත්තරෙය්‍යදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 339. ධම්මසවණියත්ථෙරාපදානං

3042. **පදුමුත්තරො** නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
චතුසච්චං පකාසෙන්තො සන්තාරෙසි බහුං ජනං.

3043. අහං තෙන සමයෙන ජටිලො උග්ගතාපනො,
ධුනන්තො වාකචීරානි ගච්ඡාමි අම්බරෙ තදා.

3044. බුද්ධසෙට්ඨස්ස උපරි ගන්තුං න විසහාමහං,
පක්ඛීව සෙලමාසජ්ජ[3] ගමනං නාලභිං[4] තදා.

3045. න මෙ ඉදං භූතපුබ්බං ඉරියස්ස විකොපනං,
දකෙ යථා උම්මුජ්ජිත්වා එවං ගච්ඡාමි අම්බරෙ.

1. පටිලච්ඡතියං නරො, මජ්ඣසං. 2. ලාභිම්හි, ස්‍යා. 3. සෙලමාපජ්ජ, 4. න ලභාමහං, මජ්ඣසං.

3033. පුණ්‍යකර්මවිපාකයෙන් යුක්ත ව භවයෙහි සැරිසරන්නා වූ මොහුට සිතින් පතන සියල්ල එතෙණෙහි නිපැදෙන්නේ ය.

3034. කෞසෙය්‍ය ද, කම්බිලි ද, කොමුපිළී ද, කපුපිළී ද, යන අනගි වස්ත්‍ර මේ මිනිස් තෙම ලබන්නේ ය.

3035. මේ මිනිස් තෙම සිතින් පතන සියල්ල ලබන්නේ ය. එක වස්ත්‍රයක් පිදීමේ විපාකය හැම කල්හි අනුභව කරන්නේ ය.

3036. කුශල මූලයෙන් මෙහෙයන ලද හෙතෙම පසුව පැවිදිව ගෞතම බුදුරජානන් වහන්සේගේ ධර්මය අවබෝධ කරන්නේ ය" කියායි.

3037. මහර්ෂි වූ බුදුරජුන් සඳහා මා විසින් මැනවින් කරණ ලද කර්මය ආශ්චර්යයෙකි. මම එක සළුවක් පුදා (ඒ හෙතුවෙන්) නිවණට පැමිණියෙම් වෙමි.

3038. මඩුවක හෝ රුක්මුලක හෝ හිස්ගෙයක හෝ වසන්නා වූ මට හාත්පස බඹයක් තන්හි රෙදි වියනක් දරයි.

3039. මම නො විතවන (=වචනයෙන් පිළියෙල නො කරවන) ලද සිවුරු හඳිමි. ප්‍රත්‍යය ද (ලබමි.) ආහාර පාන ද ලබන්නෙක් වෙමි. උතුරුසළුදනෙහි මේ විපාක යි.

3040. මෙයින් සියක් දහස් වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වස්ත්‍රදායකයාගේ මේ විපාක යි.

3041. ප්‍රතිසම්භිදාවෝ ද... සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් උත්තරෙය්‍යදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

**උත්තරෙය්‍යදායක ස්ථවිරාපදානය අටවැනි යි.**

## 339. ධම්මසවණිය ස්ථවිරාපදානය

3042. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර බුදුරජ තෙම චතුස්සත්‍යය දෙශනා කරමින් බොහෝ දෙන (සසරසයුරින්) එතර කෙළේ ය.

3043. මම එකල්හි උග්‍ර තපස් ඇති ජටිලයෙක් (ජටාධර තවුසෙක්) වූයෙම් වැහැරි සිවුරු සලමින් අහසෙහි යමි.

3044. මම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ මතුයෙහි යන්නට නො හැකි වෙමි. එකල්හි පර්වතයක හැපුනු පක්ෂියකු මෙන් ගමන නො ලැබීමි.

3045. මාගේ ගමනට මෙබඳු අවහිර වීමක් පෙර නො වූ විරූ ය. (පෙර) ජලයෙහි කිමිදගෙණ මෙන් මෙසේ අහසෙහි යමි.

3046. උළාරභූතො මනුජො හෙට්ඨාසීනො භවිස්සති,
හන්දමෙතං ගවෙසිස්සං අපි අත්ථං ලභෙය්‍යහං.

3047. ඔරොහන්තො අන්තලික්ඛා සද්දමස්සොසිං සත්ථුනො,
අනිච්චතං කථෙන්තස්ස තමහං උග්ගහිං තදා.

3048. අනිච්චසඤ්ඤමුග්ගය්හ අගමාසිං මමස්සමං,
යාවතායුං වසිත්වාන තත්ථ කාලකතො අහං.

3049. චරිමෙ වත්තමානම්හි තං ධම්මසවණං සරිං,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසමගච්ඡහං.

3050. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිං අහං,
එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

3051. එකසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

3052. පිතු ගෙහෙ[1] නිසීදිත්වා සමණො භාවිතින්ද්‍රියො,
ගාථාය පරිදීපෙන්තො අනිච්චතමුදාහරි.[2]

3053. අනුස්සරාමි තං සඤ්ඤං සංසරන්තො භවාභවෙ,
න කොටිං පටිවිජ්ඣාමි නිබ්බාණං අච්චුතං පදං.

3054. අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

3055. සහ ගාථං සුණිත්වාන පුබ්බකම්මං අනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

3056. ජාතියා සත්තවස්සාහං අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා.

3057. දාරකොව අහං සන්තො කරණීයං සමාපයිං,
කිං මෙ කරණීයං[3] අජ්ජ සක්‍යපුත්තස්ස සාසනෙ.

3058. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි සද්ධම්මසවණෙ ඵලං.

3059. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං අායස්මා **ධම්මසවණියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ධම්මසවණියත්ථෙරස්සාපදානං නවමං.**

1. ඝරෙ, සීමු 2. අනිච්චවත්තුදාහරි, ස්‍යා. 3. කරණීයං, මජසං.

3046 "උදාර වූ මනුෂ්‍යයෙක් යට (පොළොවෙහි) හුන්නේ වන්නේ ය. ඒකාන්තයෙන් හේ කවරෙක් දැයි සොයන්නෙමි. මම එයින් අභිවෘද්ධියක් ලබන්නෙම් නම් මැනවි" (යයි සිතීමි.)

3047. මම අහසින් බස්නෙමි අනිත්‍යය දෙශනා කරන්නා වූ බුදු-රජුන්ගේ ශබ්දය ඇසීමි. එකල්හි මම එය උගතිමි.

3048. අනිත්‍යසංඥව ඉගෙණ මාගේ අසපුවට ගියෙමි. එහි ආයු ඇතිතාක් වැස මම කලුරිය කෙළේ වෙමි.

3049. චුතිය වන්නා වූ අවසථාවෙහි ඒ ධම්ශ්‍රවණය සිහි කෙළෙමි. මැනවින් කරණ ලද එම කම්ය හෙතුකොට ගෙණ මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

3050. මම කල්ප තිස් දහසක් දෙව්ලොව සිත් අලවා විසීමි. එක් පණස් වරක් දිව්‍යරාජ්‍යය ද කෙළෙමි.

3051 මම එක්සැත්තෑ වරක් සක්විතිරජ වීමි. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණින් විසින් ගිණිය නො හැකිය.

3052. පියාගේ ගෘහයෙහි වැඩ හිඳ වැඩූ ඉඳුරන් ඇති ශ්‍රමණ තෙම ගාථායෙකින් අනිස බව (අනිත්‍යතාව) දක්වමින් වදාළේය.

3053. කුදු මහත් භවයෙහි සැරිසරමින් එම අනිත්‍යසංඥව සිහි කරමි. (එහෙත් සසර) කෙළවර වූ අමෘත පදය වූ නිවණ නො පිළිවිදිමි.

3054. "ඒකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යයහ. ඇතිවීම හා නැති වීම සවභාවය කොට ඇත්තාහ. උපද නිරුද්ධ වෙත්. ඒ සංස්කාරයන්ගේ සන්සිඳීම (අනුත්පාදනිරොධය) සැප යි"

3055. මේ ගාථාව අසන්නා හා ම පූර්වකම්ය සිහි කෙළෙමි. එම අසුනෙහි ම හිඳ රහත් බවට පැමිණියෙමි.

3056. මම උත්පත්තියෙන් සත්හැවිරිදි වූයෙම් රහත් බවට පැමිණියෙමි. පසැස් ඇති සම්බුද තෙම මාගේ ගුණ දැන මා උපසම්පදා කෙළේය.

3057. ළදරු වියෙහි ම වූ මම කටයුතු දෑ අවසන් කෙළෙමි. ශාක්‍ය-පුත්‍ර වූ බුදුරජානන් වහන්සේගේ සස්නෙහි අද මා විසින් කටයුතු කිම?

3058. මෙයින් සියදහස් වන කපෙහි වූ එකල්හි යම් කම්යක් කෙළෙම් ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. සද්ධම්ශ්‍රවණයෙහි මේ විපාක යි.

3059. ප්‍රතිසම්භිදාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කෘතයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් ධම්මසවණිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක්සි.

**ධම්මසවණීය ස්ථවිරාවදානය නවවැනි යි**

## 340. උක්ඛිත්තපදුමියත්ථෙරාපදානං

3060. නගරෙ හංසවතියා අහොසිං මාලිකො තදා,
ඔගාහිත්වා[1] පදුමසරං සතපත්තෙ[2] ඔචිනාමහං.

3061. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
සහ සතසහස්සෙහි සන්තචිත්තෙහි තාදිහි.

3062. ඛීණාසවෙහි සුද්ධෙහි ඡළභිඤ්ඤෙහි සො තදා,[3]
මම වුද්ධිං සමන්වෙසං ආගච්ඡි මම සන්තිකෙ.[4]

3063. දිස්වානහං දෙවදෙවං සයම්භුං ලොකනායකං,
වණ්ටෙ ඡෙත්වා සතපත්තං උක්ඛිපිං අම්බරෙ තදා.

3064. යදි බුද්ධො තුවං වීර ලොකජෙට්ඨො නරාසභො,
සයං ගන්ත්වා සතපත්තා මත්ථකෙ ධාරයන්තු තෙ.

3065. අධිට්ඨසි මහාවීරො ලොකජෙට්ඨො නරසභො,
බුද්ධස්ස ආනුභාවෙන මත්ථකෙ ධාරයිංසු තෙ.

3066. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං,

3067. තත්ථ මෙ සුකතං ව්‍යම්හං සතපත්තන්ති වුච්චති,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

3068. සහස්සක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං අකාරයිං,
පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං.

3069. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
අනුභොමි සකං කම්මං පුබ්බෙ සුකතමත්තනො.

3070. තෙනෙවෙකපදුමෙන අනුභොත්වාන සම්පදා,
ගොතමස්ස භගවතො ධම්මං සච්ඡිකරිං අහං.

3071. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3072. සතසහස්සෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි එකපදුමස්සිදං ඵලං.

3073. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උක්ඛිත්තපදුමියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**උක්ඛිත්තපදුමියත්ථෙරස්ස අපදානං දසමං.**

---

1. ඔගාහෙත්වා, මජසං. 2. සතපත්තං, මජසං.
3. ඡළභිඤ්ඤෙහි ඣායීහි, මජසං. 4. සන්තිකං, මජසං.

## 340. උක්ඛිත්තපදුමිය ස්ථවිරාවදානය

3060. මම හංසවතී නගරයෙහි මල්කරුවෙක් වීමි. එකල්හි පියුම් විලකට බැස පියුම් නෙළමි.

3061-3062. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර නම් සම්බුද්ධ තෙම තාදී ගුණ ඇති සන්හුන් සිත් ඇති ශුද්ධ වූ ෂඩභිඥ ඇති සිය දහසක් ක්ෂීණාශ්‍රවයන් සමග මාගේ අභිවෘද්ධිය ගැණ සොයමින් මා සමීපයට පැමිණියේ ය.

3063. මම දෙවියනට දෙවි වූ තමා ම සියල්ල අවබොධ කළ ලොකනායක වූ බුදුරජුන් දැක එකල්හි පියුම නටුයෙන් කඩා අහසෙහි දැමීමි:

3064. “වීරයන්වහන්ස, ඉදින් ඔබ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සම්බුද්ධ වෙහි නම් පද්මයෝ තුමූ ම ගොස් ඔබ වහන්සේගේ මස්තකයෙහි දරත්වා යි” (කියායි).

3065. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ මහාවීර වූ බුදුරජ තෙමේ (එසේ වීමට) ඉටීය. බුද්ධානුභාවයෙන් ඒ පද්මයෝ උන්වහන්සේගේ මුදුනෙහි දැරූහ.

3066. මම මැනැවින් කරණ ලද කර්මය හා චිත්තප්‍රණිධීන් හෙතු-කොට ගෙණ මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට ගියෙමි.

3067. එම දෙව්ලොවෙහි මට කරණ ලද විමානය “**සතපත්ත**” යයි කියනු ලැබේ. එය සැටයොදුන් පුළුල්ය. තිස්යොදුන් උසය.

3068. ශක්‍ර දෙවෙන්ද්‍ර ව දහස් වරක් දිව්‍යරාජ්‍යය කෙළෙමි. මම පන්-සැත්තෑ වරක් සක්විතිරජ වීමි.

3069. කරවන ලද මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් විසින් ගිණිය නො හැකිය. පෙර තමා විසින් මැනැවින් කරණ ලද ස්වකීය කර්ම(විපාක)ය අනුභව කරමි.

3070. ඒ එක පියුම පිදීමෙන් (එහි විපාක) සමපත් අනුභව කොට මම ගෞතම බුදුරජානන් වහන්සේගේ ධර්මය සාක්ෂාත් කෙළෙමි.

3071. මාගේ කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. බැඳුම් සිඳී ඇතකු මෙන් ආශ්‍රව රහිත ව වෙසෙමි.

3072. මෙයින් ලක්ෂයක් වන කපෙහි පුෂ්ප (පද්ම) පූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුර්ගතියක් නො දනිමි. එක පියුමක් පිදීමෙහි මේ විපාකයි.

3073. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **උක්ඛිත්තපදුමිය** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක.

**උක්ඛිත්තපදුමිය ස්ථවිරාවදානය දසවැනි යි.**

උද්දානං:

ගන්ධධූපො ච උදකං[1] පුන්නාගඑකදුස්සිකො,
ඵුසිතො ච පභඞ්කරො කුටිදො උත්තරීයකො.
සවණ්ණී එකපදුමී ගාථායො තත්ථ පිණ්ඩිතා,
එකං ගාථාසතඤ්චෙව චතුතාළීසමෙව ච.

**ගන්ධධූපියවග්ගො[2] චතුත්තිංසතිමො.**

## 341. එකපදුමියත්ථෙරාපදානං

3074. **පදුමුත්තරො** නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
භවාභවෙ විභාවෙන්තො තාරෙසි ජනතං බහුං.

3075. හංසරාජා තදා හොමි දිජානං පවරො අහං,
ජාතස්සරං සමොගය්හ කීළාමි හංසකීළිතං.

3076. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
ජාතස්සරස්ස උපරි ආගච්ඡි තාවදෙ ජිනො.

3077. දිස්වානහං දෙවදෙවං සයම්භුං ලොකනායකං,
වණ්ට ඡෙත්වාන පදුමං සතපත්තං මනොරමං.

3078. මුඛතුණ්ඩෙන පග්ගය්හ පසන්නො ලොකනායකෙ,
උක්ඛිපිත්වාන ගගනෙ බුද්ධසෙට්ඨමපූජයිං.

3079. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
අන්තලික්ඛෙ ඨිතො සත්ථා අකා මෙ අනුමොදනං:

3080. "ඉමිනා එකපදුමෙන චෙතනාපණිධීහි ච,
කප්පානං සතසහස්සං විනිපාතං න ගච්ඡසි."

3081. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනාමකො,
මම කම්මං පකිත්තෙත්වා අගමා යෙන පත්ථිතං.

3082. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3083. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකපදුමියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකපදුමියත්ථෙරස්ස අපදානං පඨමං.**

1. ගන්ධොදකපූජනී ච, PTS. සෙ.
2. ගන්ධොදකවග්ගො, PTS. ම. සෙ.

උද්දානය:

ගන්ධධූප උදක පුන්නාග එකදුස්සික
ඵුසිත පභඞ්කර කුටිද උත්තරීයක
සවණී එකපදුමී එහි පිඬුකල ගී
එක්සිය සූසාළිසැසි දත්තේ.

**ගන්ධධූපිය වර්ගය සූතිස් වැනි යි.**

# 341. එකපදුමියසථවිරාපදානය

3074. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය **පදුමුත්තර** සර්වඥ තෙමේ කුදු මහත් භවයන් ප්‍රකාශ කරණුයේ බොහෝ ජනයා සසර සයුරින් එතෙර කෙළේය.

3075. එකල්හි මම පක්ෂීන්හට උත්තම වූ හංසරාජයෙක් වෙමි. සවයංජාත විලකට බැස හංසක්‍රීඩා කරමි.

3076. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ත්‍රිවිධලොකයන් මැනැවින් දැනවදාළ පදුමුත්තර බුදුරජ තෙම එකෙණෙහි එම සවයංජාත විල මතුයෙහි (අහසින් එතැනට) වැඩියේ ය.

3077. මම දෙවියනට දෙවි වූ සවයම්භූ වූ ඒ බුදුරජුන් දැක මනරම් වූ සියපත් පියුමක් නටුවෙන් කඩා-

3078. බුදුරජුන් කෙරෙහි පහන් වූයෙම් තුඬින් ගෙණ ඔසවා අහසෙහි වැඩ සිටි එම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට පිදීමි.

3079. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ශාස්තෘ වූ පදුමුත්තර බුදුරජ තෙම අහසෙහි වැඩ සිටියේ මාහට මේ අනුමොදනාව කෙළේය:

3080. "මේ එක ම පියුම පිදීම හෙතුවෙන් ද, චිත්ත ප්‍රණිධි හෙතුවෙන් ද කල්පලක්ෂයක් මුළුල්ලෙහි විනිපාත සඞ්ඛ්‍යාත දුගතියකට නොයන්නෙහි ය".

3081. පදුමුත්තර නම් වූ සර්වඥ තෙමේ මේ අනුමොදනා වදාරා මාගේ කර්මය පිළිබඳ තොරතුරු පවසා වැඩියේය.

3082. මෙයින් පෙර ලක්ෂයක් වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙලෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3083. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකපදුමිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකපදුමිය සථවිරාපදානය පළමු වැනි යි.**

## 342. තිඋප්පලමාලියත්ථෙරාපදානං*

3084. චන්දභාගානදීතීරෙ අහොසිං වානරො තදා,
අද්දසං විරජං බුද්ධං නිසින්නං පබ්බතන්තරෙ.

3085. ඔභාසෙන්තං දිසා සබ්බා සාලරාජංව ඵුල්ලිතං,
ලක්ඛණබ්‍යඤ්ජනූපෙතං දිස්වා අත්තමනො අහුං.

3086. උදග්ගචිත්තො සුමනො පීතියා හට්ඨමානසො,
තීණි උප්පලපුප්ඵානි මත්ථකෙ අභිරොපයිං.

3087. පුප්ඵානි අභිරොපෙත්වා **විපස්සිස්ස** මහෙසිනො,
සගාරවො ගමිත්වාන[1] පක්කාමිං[2] උත්තරාමුඛො.

3088. ගච්ඡන්තො පටිකුටිකො විප්පසන්නෙන චෙතසා,
සෙලන්තරෙ පතිත්වාන[3] පාපුණිං ජීවිතක්ඛයං.

3089. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

3090. සතානං තීණික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං.

3091. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3092. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිඋප්පලමාලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිඋප්පලමාලියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 343. ධජදායකත්ථෙරාපදානං

3093. **තිස්සො** නාම අහු සත්ථා ලොකජෙට්ඨො නරාසභො,
තස්සාපතික්ඛයෙ දිස්වා ධජමාරොපිතං මයා.

3094. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

3095. සතානං තීණික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං.

* තිණුප්පලමාලියත්ථෙරාපදාන, මජ්ඣං.
1. භවිත්වාන, මජ්ඣං.
2. පක්කාමිං, මජ්ඣං.
3. පපතිත්වා, ස්‍යා.

## 342. තිලපපලමාලිය ස්ථවිරාපදානය

3084. මම එකල්හි චන්ද්‍රභාගා නදීතීරයෙහි වඳුරෙක් වීමි. කඳු අතුරෙහි වැඩහුන් කෙලෙස් රජස් නැති බුදුරජුන් දිටිමි.

3085. දස දික් බබුළුවන පිපී ගිය උතුම් සල්රුකක් වැනි (දෙතිස් මහා පුරිස්) ලකුණින් අසූ අනුව්‍යඤ්ජනයන්ගෙන් යුත් බුදුරජුන් දැක තුටු වීමි.

3086. ඔද වැඩි සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ප්‍රීතියෙන් පිනාගියෙමි. උපුල් මල් තුණක් මතුයෙහි නගා සිදීමි.

3087. විපස්සී බුදුරජුන්හට මේ මල් පුදා ගෞරව සහිතව ගොස් උතුරුදිග බලා ගියෙමි.

3088. පැහැදි සිතින් හැකිළි යන්නෙම් ගලතුර වැටී ජීවිතක්ෂයට පැමිණියෙමි.

3089. මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මිනිස් සිරුර හැර මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

3090. මම තුන්සියක් වර දිව්‍යරාජ්‍යය කෙළෙමි. පන්සියක් වර සක්විති රජ වීමි.

3091. මෙයින් අනූඑක්වන කපෙහි යම් පුෂ්පපූජාවක් කරණ ලද ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයි.

3092. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් තිලපපලමාලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිලපපලමාලිය ස්ථවිරාපදානය දෙවැනි යි.**

## 343. ධජදායකස්ථවිරාපදානය

3093. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ තිස්ස නම් ශාස්තෘ තෙමේ ලොව පහළ විය. උන්වහන්සේගේ උපධික්ෂය (=ස්කන්ධොපධි සඞ්ඛ්‍යාත පඤ්ච ස්කන්ධයාගේ නිරොධය වූ නිරුපධිශෙෂ පරිනිර්වාණය) දැක මා විසින් ධජයක් නගන ලදී.

3094. මැනැවින් කළ ඒ කර්මය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මම මිනිස් සිරුර හැර තව්තිසාවට ගියෙමි.

3095. මම තුන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. පන්සිය වරක් සක්විති රජ වීමි.

3096. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
අනුභොමි සකං කම්මං පුබ්බෙ සුකතමත්තනො.

3097. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඛජ්ජදානස්සිදං ඵලං.

3098. ඉච්ඡමානො'වහං අජ්ජ සකානනං සපබ්බතං,
ඛොමදුස්සෙන ඡාදෙය්‍යං තදා මය්හං කතෙ ඵලං.

3099. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඛජ්ජදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඛජ්ජදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 344. තිකිඞ්කිණිපූජකත්ථෙරාපදානං

3100. හිමවන්තස්සාවිදූරෙ **භූතගණො** නාම පබ්බතො,
තත්ථද්දසං පංසුකූලං දුමග්ගම්හි විලග්ගිතං.

3101. **තීණි** කිඞ්කිණිපුප්ඵානි ඔචිනිත්වා අහං තදා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පංසුකූලමපූජයිං.

3102. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි තිණ්ණං පුප්ඵානිදං ඵලං.

3103. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිකිඞ්කිණිපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිකිඞ්කිණිපූජකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 345. නළාගාරිකත්ථෙරාපදානං

3104. හිමවන්තස්ස අවිදූරෙ **හාරිතො** නාම පබ්බතො,
සයම්භූ **නාරදො** නාම රුක්ඛමූලෙ වසී තදා.

3105. නළාගාරං කරිත්වාන තිණෙන ඡාදයිං අහං,
චඞ්කමං සොධයිත්වාන සයම්භුස්ස අදාසහං.

3106. චතුද්දසසු කප්පෙසු දෙවලොකෙ රමිං අහං,
චතුසත්තතික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

3096. මා ලත් ප්‍රදේශ රාජ්‍යය (මෙ පමණයයි) ගිණිය නො හැකිය. පෙර තමා විසින් මොනොවට කළ ස්වකීය කර්මඵලය අනුභව කරමි.

3097. මෙයින් දෙයානුවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. ඛජ්ජදානයාගේ මේ විපාක යි.

3098. අද මම කැමැත්තෙම් නම් කඳු වන සහිත වූ ලෝකය කොමුපිළියෙන් වසන්නෙමි. මේ එදා මා විසින් කළ කමෙ විපාක යි.

3099. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් ඛජ්ජදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**ඛජ්ජදායක ස්ථවිරාවදානය තෙවැනි යි.**

## 344. තිකිඞකිණිපූජක ස්ථවිරාවදානය

3100. හිමවතට නුදුරෙහි **භූතගණ** නම් පර්වතයෙක් ඇත. එහි දී ගස් මුදුනක එල්බුනු පවුල් සිවුරක් (පාංශුකූල චීවරයක්) දිටිමි.

3101. මම එකල්හි සතුටු වූයෙම් කටුකිහිරි මල් තුණක් කඩා සොම්නස් සිතින් පවුල් සිවුර පිදීමි.

3102. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. කටුකිහිරි මල් තුණක් පිදීමෙහි මේ විපාක යි.

3103. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **තිකිඞකිණිපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**තිකිඞකිණිපූජක ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 345. නළාගාරිකස්ථවිරාවදානය

3104. හිමවතට නුදුරෙහි **හාරිත** නම් පර්වතයෙක් ඇත. එකල්හි **නාරද** නම් බුදුරජ තෙම රුක්මුලක වැඩවිසීය.

3105. මම බටකිළියක් කොට එහි තණ (=බටකොළ) සෙවිලි කෙළෙමි. මම **සක්මණක්** ද පිරිසිදු කොට තථාගතයන් වහන්සේට දිනිමි.

3106. මම තුදුස් කපක් දෙව්ලොව සිත් අලවා විසීමි. සුසැත්තෑ වරක් දිව්‍යරාජ්‍යය කරවීමි.

3107. සත්තසත්තතික්ඛත්තුඤ්ච[1] චක්කවත්තී අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

3108. උබ්බිද්ධං භවනං මය්හං ඉන්දලට්ඨීව උග්ගතං,
සහස්සථම්භං අතුලං විමානං සප්පභස්සරං.

3109. ද්වෙ සම්පත්ති අනුභොත්වා සුක්කමූලෙන චොදිතො,
**ගොතමස්ස** භගවතො සාසනෙ පබ්බජිං අහං.

3110. පධානපහිතත්තොම්හි උපසන්තො නිරූපධි,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3111. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නළාගාරිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**නළාගාරිකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 346. චම්පකපුප්ඵියත්ථෙරාපදානං

3112. හිමවන්තස්ස අවිදූරෙ චාපලො[2] නාම පබ්බතො,
බුද්ධො **සුදස්සනො** නාම විහාසි පබ්බතන්තරෙ.

3113. පුප්ඵං හෙමවතං[3] ගය්හ ගච්ඡං වෙහාසෙනහං,
අද්දසං විරජං බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

3114. සත්ත චම්පකපුප්ඵානි සීසෙ කත්වානහං තදා,
බුද්ධස්ස අභිරොපෙසිං සයම්භුස්ස මහෙසිනො.

3115. එකතිංසෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,[4]
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3116. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **චම්පකපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**චම්පකපුප්ඵියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 347. පදුමපූජකත්ථෙරාපදානං

3117. හිමවන්තස්ස අවිදූරෙ **රොමසො** නාම පබ්බතො,
බුද්ධොපි **සම්භවො** නාම අබ්භොකාසෙ වසී තදා.

3118. භවනා නික්ඛමිත්වාන පදුමං ධාරයිං අහං,
එකාහං ධාරයිත්වාන පුන භවනමුපාගමිං.

---

1. චතුසත්තතික්ඛත්තුඤ්ච, මජසං 2. ජාපලො, සසා. ජාපලො, මජසං.
3. හෙමවන්තං, මජසං. 4. පුප්ඵමභිරොපයිං, මජසං.

3107. මම සත්සැත්තෑවරක් සක්විති රජ වීමි. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණනින් ගිණිය නො හැකි ය.

3108. පැනතැංගා වූ මාගේ භවනය දේදුන්නක් මෙන් උස් ව නැගුනේ ය. දහසක් වැමි ඇති අනුපම වූ ඒ විමානය පැහැ විහිදුවන්නේ ය.

3109. කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙමි ද්විවිධ (දිව්‍ය-මනුෂ්‍ය) සම්පත් අනුභව කොට මම ගෞතම බුදුරජුන්ගේ සසුනෙහි පැවිදි වීමි.

3110. වීර්‍ය්‍යයෙහි මෙහෙයන ලද සිත් ඇත්තෙම් වෙමි. එසේ ම උපශාන්තයෙමි. උපධි රහිතයෙමි. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

3111. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් නළාගාරික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**නළාගාරික ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 346. චම්පකපුප්ඵියස්ථවිරාවදානය

3112. හිමවතට නුදුරෙහි චාපල නම් පර්වතයෙක් ඇත. සුදස්සන නම් බුදුරජ තෙම එහි පර්වත අතුරෙහි විසී ය.

3113. හිමවත්හි හටගත් මල් ගෙණ අහසින් යන්නා වූ මම කෙලෙස් රජස් නැති ඔඝයන් තරණය කළ ආස්‍රව විරහිත බුදුරජුන් දිටිමි.

3114. එකල්හි මම සපුමල් සතක් හිසෙහි තබා සියල්ල තෙමේ ම අවබොධ කළ බුදුරජුන්හට පිදීමි.

3115. මෙයින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3116. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් චම්පකපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**චම්පකපුප්ඵිය ස්ථවිරාවදානය සවැනි යි.**

## 347. පදුමපූජකස්ථවිරාවදානය

3117. හිමවතට නුදුරෙහි රොමස නම් පර්වතයෙක් ඇත. එකල්හි සම්භව නම් පසේබුදුරජ තෙමේ ද අභ්‍යවකාශයෙහි (එළිමහනෙහි) වැඩ විසීය.

3118. මම භවනයෙන් නික්ම අවුත් උන්වහන්සේට පියුමක් දුරිමි. එක් දිනක් එය දරමින් සිට යළි භවනයට එළඹියෙමි.

3119. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3120. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පදුමපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමපූජකත්ථෙරස්ස අපදානං සත්තමං.**

## 348. තිණමුට්ඨිදායකත්ථෙරාපදානං

3121. හිමවන්තස්ස අවිදූරෙ **ලම්බකො** නාම පබ්බතො,
**උපතිස්සො** නාම සම්බුද්ධො අබ්භොකාසම්හි චඞ්කමි.

3122. මිගලුද්දො තදා ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
දිස්වාන තං දෙවදෙවං සයම්භුං අපරාජිතං.

3123. විප්පසන්නෙන චිත්තෙන තදා තස්ස මහෙසිනො,
නිසීදනත්ථං බුද්ධස්ස තිණමුට්ඨිමදාසහං.

3124. දත්වාන දෙවදෙවස්ස භිය්‍යො චිත්තං පසාදයිං,
සම්බුද්ධමභිවාදෙත්වා පක්කාමිං උත්තරාමුඛො.

3125. අචිරං ගතමත්තං මං මිගරාජා අහෙඨයී,[1]
සීහෙන පාතිතො[2] සන්තො තත්ථ කාලකතො අහං.

3126. ආසන්නෙ මෙ කතං කම්මං බුද්ධසෙට්ඨෙ අනාසවෙ,
සුමුත්තො සරවෙගොව දෙවලොකමගච්ඡහං.

3127. යූපො තත්ථ සුභො ආසි පුඤ්ඤකම්මාභිනිම්මිතො,
සහස්සකණ්ඩො සතභෙණ්ඩු ධජාලු හරිතාමයො.

3128. පභා නිද්ධාවතෙ තස්ස සතරංසීව උග්ගතො,
ආකිණ්ණො දෙවකඤ්ඤාහි ආමොදිං කාමකාමහං.

3129. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
ආගන්ත්වාන මනුස්සත්තං පත්තොම්හි ආසවක්ඛයං.

3130. චතුනවුතෙ ඉතො කප්පෙ නිසීදනමදාසහං,
දුග්ගතිං නාභිජානාමි තිණමුට්ඨිස්සිදං ඵලං.

3131. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිණමුට්ඨිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිණමුට්ඨිදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

---

1. අපොථයි, මජසං. 2. පොථිතො, මජසං.

3119. මෙයින් එක් අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3120. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පදුමපූජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පදුමපූජක ස්ථවිරාවදානය සත්වැනි යි.**

## 348. තිණමුට්ඨිදායකස්ථවිරාවදානය

3121. හිමවතට නුදුරෙහි **ලම්බක** නම් පර්වතයෙක් ඇත. එහි **උපතිස්ස** නම් බුදුරජතෙම එළිමහන්හි සක්මන් කෙළේය.

3122. එකල්හි මම මහවනයෙහි මුවවැද්දෙක් වීමි. දෙවියනට දෙවි වූ සියල්ල තෙමේ ම අවබොධ කළ පස්මරුන් දිනූ ඒ බුදුරජුන් දුක-

3123. එකල්හි මම පැහැදි සිතින් ඒ බුදුරජුන්හට වැඩ හිඳීම පිණිස තණ මිටක් දිනිමි.

3124. දෙවාතිදෙව වූ බුදුරජුන්හට එය දී බෙහෙවින් සිත පැහැදවීමි. ඉක්බිති සම්බුදුරජුන් වැඳ උතුරු දෙස බලා ගියෙමි.

3125. එසේ ගිය නොබෝ වෙලාවකින් සිංහයෙක් මා පෙළී ය. සිංහයා විසින් බිම හෙළන ලද මම එහි කලුරිය කෙළෙම්.

3126. ආස්‍රව රහිත වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ විෂයෙහි මරණාසන්නයෙහි ම මා විසින් කළ කර්මය (හෙතුකොට ගෙණ) මම දුනුයෙන් මුදන ලද වෙගවත් හීයක් මෙන් දෙව්ලොව ගියෙමි.

3127. එහි (මාගේ) පුණ්‍යකර්මයෙන් නිර්මිත ශොභන ප්‍රාසාදයක් විය. එහි සහස්‍ර භාග ඇත්තේය. සියයක් ගොලාකාර මුදුන් ඇත්තේය. (මුදුන්වල එල්ලෙන) ධජ බහුල ය. නිල්මුවා පැහැ ඇත්තේ ය.

3128. උදා වූ හිරු මෙන් ඒ ප්‍රාසාදයාගේ රශ්මිය ද පැතිරෙයි. මම එහි දිව්‍යකන්‍යාවන් විසින් පිරිවරන ලදුයෙම් කාමකාමීව සතුටු වීමි.

3129. ඒ කුශල කර්මයෙන් මෙහෙයන ලදුයෙම් දෙව්ලොවින් සැවැ මිනිසත්බවට පැමිණ ආස්‍රවක්ෂයට (=රහත්බවට) පැමිණියෙම් වෙමි.

3130. මම මින් සිවුඅනූවන කපෙහි නිසීදනයක් දුනිමි. ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. තණමිටෙහි මේ විපාක යි.

3131. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **තිණමුට්ඨිදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තිණමුට්ඨිදායක ස්ථවිරාවදානය අටවැනි යි.**

## 349. තින්දුකඵලදායකත්ථෙරාපදානං

3132. කණිකාරංව ජොතන්තං නිසින්නං පබ්බතන්තරෙ,
අද්දසං විරජං බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

3133. තින්දුකං සඵලං දිස්වා භින්දිත්වාන සකොටකං,[1]
පසන්නචිත්තො සුමනො වෙස්සභුස්ස අදාසහං.

3134. ඒකනවුතෙ ඉතො කප්පෙ යං ඵලමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

3135. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තින්දුකඵලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තින්දුකඵලදායකත්ථෙරස්ස අපදානං නවමං.**

## 350. ඒකඤ්ජලියත්ථෙරාපදානං

3136. රෙවතො[2] නාම සම්බුද්ධො නදීකූලෙ වසී තදා,
අද්දසං විරජං බුද්ධං පීතරංසිංව භානුමං.

3137. උක්කාමුඛපහට්ඨංව ඛදිරඞ්ගාරසන්නිභං,
ඔසධිංව විරොචන්තං ඒකඤ්ජලිමකාසහං.

3138. චතුනවුතෙ ඉතො කප්පෙ යමඤ්ජලිමකාසහං,
දුග්ගතිං නාභිජානාමි අඤ්ජලියා ඉදං ඵලං.

3139. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ඒකඤ්ජලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**ඒකඤ්ජලියත්ථෙරස්ස අපදානං දසමං.**

උද්දානං:

පදුමී උප්පලමාලී ධජො කිඞ්කිණිකො නලො
චම්පකො පදුමො මුට්ඨි තින්දුකෙකඤ්ජලී තථා
ඡ ච සට්ඨි ච ගාථායො ගණිතායො විභාවිභි

**ඒකපදුමියවග්ගො පඤ්චතිංසතිමො.**

---

1. සකොසකං, මජසං. 2. රොමසො, මජසං.

## 349. තින්දුකඵලදායකසථවිරාවදානය

3132. පර්වත අතුරෙහි වැඩහුන්නා වූ කිණිකිරි රුකක් මෙන් බබලන කෙලෙස් රජස් නැති ඔඝ තරණය කළ ආස්‍රව රහිත වූ **වෙස්සභූ** බුදුරජුන් දිටිමි.

3133. පල ගත් **තිඹිරි** ගසක් දැක පල කිණිති සහිත ව කඩා පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් මම **වෙස්සභූ** බුදුරජුන්හට දිනිමි.

3134. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් තිඹිරිපල දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාක යි.

3135 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තින්දුකඵලදායක** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**තින්දුකඵලදායක සථවිරවදානය නවවැනි යි.**

## 350. එකඤ්ජලියසථවිරාවදානය

3136. එකල්හි **රෙවත** නම් සම්බුද්ධ තෙම ගඞ්ගානීරයෙහි වැඩ විසීය. කෙලෙස් රජස් විරහිත වූ පීතවර්ණ රස් ඇති උදා හිරු බඳු වූ ඒ බුදුරජුන් දිටිමි.

3137. කඹුරුඋදුන ලා පිරිසිදු කළ සුවණ්ණයක් මෙන් ද, ඇවිළෙන කිහිරඟුරු මෙන් ද ඔසධී තාරකාව මෙන් ද බබලන (ඒ බුදුරජුන් දැක) මම එක් වරක් ඇඳිලි කෙළෙමි.

3138. මෙයින් සිවු අනූවන කපෙහි මම යම් ඇඳිලි බැඳීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඇඳිලි බැඳීමෙහි මේ විපාක යි.

3139. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **එකඤ්ජලිය** සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**එකඤ්ජලිය සථවිරාවදානය දසවැනි යි.**

උද්දානය:

පදුම් උප්පල මාලි ධජ කිඞ්කිණික නළ
චම්පක පදුම මුට්ඨි තින්දුක එකඤ්ජලි
ගී සසැටකැයි ගිණුවෝ
ගැණුම් දත් නුවණැත්තෝ.

**එකපදුමියවග්ගය පන්තිස් වැනි යි.**

## 351. සද්දසඤ්ඤකත්ථෙරාපදානං

3140. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
තත්ථද්දසාසිං සම්බුද්ධං දෙවසඞ්ඝපුරක්ඛතං.

3141. චතුසච්චං පකාසෙන්තං උද්ධරන්තං මහාජනං,
අස්සොසිං මධුරං වාචං කරවීකරුතොපමං.*

3142. බ්‍රහ්මස්සරස්ස මුනිනො සිඛිනො ලොකබන්ධුනො,
ඝොසෙ චිත්තං පසාදෙත්වා පත්තොම්හි ආසවක්ඛයං.

3143. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පසාදස්ස ඉදං ඵලං.

3144. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සද්දසඤ්ඤකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සද්දසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඨමං.**

## 352. යවකලාපියත්ථෙරාපදානං

3145. නගරෙ **අරුණවතියා** ආසිං යාවසිකො[1] තදා,
පන්ථෙ දිස්වාන සම්බුද්ධං යවකලාපමවත්ථරිං.

3146. අනුකම්පකො කාරුණිකො **සිඛී** ලොකග්ගනායකො,
මම සඞ්කප්පමඤ්ඤාය නිසීදි යවසත්ථරෙ.

3147. දිස්වා නිසින්නං විමලං මහාඣායිං විනායකං,
පාමුජ්ජං[2] ජනයිත්වාන තත්ථ කාලකතො අහං.

3148. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි යවත්ථරෙ ඉදං ඵලං.

3149. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **යවකලාපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**යවකලාපියත්ථෙරස්ස අපදානං දුතියං.**

---

1. යවසිකො, සබ්බත්ථ. 2. පාමොජ්ජං, මජසං. * කරවීකරුදෙපමං, මජසං.

# 351. සද්දසඤ්ඤකස්ථවිරාපදානය

3140-3141. මම පෙර මහාවනයෙහි මුවවැද්දෙක් වීමි. එහි දී දිව්‍යසමූහයා විසින් පිරිවරන ලද චතුසත්‍යය දෙශනා කරමින් මහාජනයා සසර සයුරින් ගොඩ නඟන සම්බුදු රජුන් දිටිමි. කොවුල් හඬට බඳු මිහිරි වචන ඇසීමි.

3142. බ්‍රහ්මස්වරය ඇති ලොකබන්ධු වූ සිඛී බුදුරජාණන් වහන්සේගේ ශබ්දයෙහි සිත පහදවා ආස්‍රවක්ෂයට පැමිණියෙම් වෙමි.

3143. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (බුද්ධස්වරයෙහි) පැහැදීමෙහි මේ විපාක යි.

3144. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සද්දසඤ්ඤක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සද්දසඤ්ඤක ස්ථවිරාපදානය පළමුවැනි යි.**

# 352. යවකලාපියස්ථවිරාපදානය

3145. එකල්හි මම අරුණවතී නගරයෙහි යව (තණ) වෙළෙඳෙක් වීමි. මඟ දී බුදුරජුන් දැක (උන්වහන්සේට වැඩ හිඳීම සඳහා) යව මිටියක් ඇතිරීමි.

3146. අනුකම්පා ඇති කාරුණික වූ සිඛී බුදුරජ තෙම මාගේ අදහස දැන යව ඇතිරියෙහි වැඩ හුන්නේ ය.

3147. එසේ වැඩ හුන්නා වූ නිර්මල වූ මහාධ්‍යාන ඇති අසහාය නායක වූ (බුදුරජුන්) දැක සතුට උපදවා මම එහි කලුරිය කෙළෙමි.

3148. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. යවඇතිරි දනෙහි මේ විපාක යි.

3149. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් යවකලාපිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**යවකලාපිය ස්ථවිරාපදානය දෙවැනි යි.**

## 353. කිංසුකපූජකත්ථෙරාපදානං

3150. කිංසුකං පුප්ඵිතං දිස්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
බුද්ධං සරිත්වා **සිද්ධත්ථං** ආකාසෙ අභිපූජයිං.

3151. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3152. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං,

ඉත්ථං සුදං ආයස්මා **කිංසුකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති,

**කිංසුකපූජකත්ථෙරස්ස අපදානං තතියං.**

## 354. සකොටකකොරණ්ඩදායකත්ථෙරාපදානං

3153. අක්කන්තඤ්ච පදං දිස්වා **සිඛිනො** ලොකබන්ධුනො,
එකංසං අජිනං කත්වා පදසෙට්ඨං අවන්දහං.

3154. කොරණ්ඩං පුප්ඵිතං දිස්වා පාදපං ධරණීරුහං,
සකොටකං ගහෙත්වාන පදෙ චක්කමපූජයිං.[1]

3155. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පදපූජායිදං ඵලං.

3156. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සකොටකකොරණ්ඩදායකො**[2] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සකොටකකොරණ්ඩදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.**

## 355. දණ්ඩදායකත්ථෙරාපදානං

3157. කානනං වනමොග්ගය්හ වෙළුං ඡෙත්වානහං තදා,
ආලම්බනං ගහෙත්වාන[3] සඞ්ඝස්ස අදදිං අහං.

3158. තෙන චිත්තප්පසාදෙන සුබ්බතෙ අභිවාදිය,
ආලම්බනම්පි දත්වාන පක්කමිං උත්තරාමුඛො.

1. පදචක්කං අපූජයිං, මජසං. 2. සකොසකකොරණ්ඩදායකො, මජසං.
3. කරිත්වාන, මජසං.

## 353. කිංසුකපූජකසථවිරාවදානය

3150. පිපුනු කෑල ගසක් දැක ඇඳිලි බැඳගෙණ සිද්ධාණ බුදුරජුන් සිහිපත් කොට ඒ මල් අහසෙහි (ගසේ තිබියදී ම බුදුරජුන්හට) පිදීමි.

3151. මෙයින් සිවු අනුවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3152. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් කිංසුකපූජක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කිංසුකපූජක සථවිරාවදානය තෙවැනි යි.**

## 354. සකොටකකොරණ්ඩදායකසථවිරාවදානය

3153. සිඛී බුදුරජානන් වහන්සේගේ තබන ලද පියවර දැක මම අඳුන්දිවිසම එකස් කොට ශ්‍රෙෂ්ඨ ශ්‍රීපාදය වැන්දෙමි.

3154. පිපුනු කටුකරඬු රුකක් දැක කිණිහි සහිතව මල් ගෙණ පියවරෙහි (ශ්‍රීපාදයෙහි) චක්‍රලක්ෂණය පිදීමි.

3155. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ශ්‍රීපාදය පිදීමෙහි මේ විපාක යි.

3156. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සකොටකකොරණ්ඩදායක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සකොටකකොරණ්ඩදායක සථවිරාවදානය සිවුවැනි යි.**

## 355. දණ්ඩදායකසථවිරාවදානය

3157. එකල්හි මම වනයට වැද හුණලියක් කපා එල්බගන්නා දණ්ඩක් (සැරයටියක්) සංඝයාට දුනිමි.

3158. ඒ චිත්තප්‍රසාදය හෙතුකොට ගෙණ මනා ව්‍රත ඇති සංඝයා වැඳ සැරයටිය ද දී උතුරු දිගට මුහුණ ලා ගියෙමි.

3159. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං **දණ්ඩ**මදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි දණ්ඩදානස්සිදං ඵලං.

3160. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ.
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **දණ්ඩදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**දණ්ඩදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 356. අම්බයාගුදායකත්ථෙරාපදානං

3161. **සතරංසි** නාම **සම්බුද්ධො** සයම්භූ අපරාජිතො,
වුට්ඨහිත්වා සමාධිම්හා භික්ඛාය මං උපාගමි.

3162. **පච්චෙකබුද්ධං** දිස්වාන අම්බයාගුං අදාසහං,
විප්පසන්නමනං තස්ස විප්පසන්නෙන චෙතසා.

3163. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි අම්බයාගුස්සිදං ඵලං.

3164. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බයාගුදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අම්බයාගුදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 357. සුපුටකපූජකත්ථෙරාපදානං

3165. දිවාවිහාරා නික්ඛන්තො **විපස්සී** ලොකනායකො,
භික්ඛාය විචරන්තො සො මම සන්තිකමුපාගමි.

3166. තතො පතීතො සුමනො බුද්ධසෙට්ඨස්ස තාදිනො,
ලොණසුපුටකං දත්වා කප්පං සග්ගම්හි මොදහං.

3167. එකනවුතෙ ඉතො කප්පෙ යං සුපුටකමදාසහං,
දුග්ගතිං නාභිජානාමි පුටකස්ස ඉදං ඵලං.

3168. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සුපුටකපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සුපුටකපූජකත්ථෙරස්ස අපදානං සත්තමං.**

3159. මෙයින් සිවු අනූවන කපෙහි වූ එකල්හි යම් සැරයටි දතක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. සැරයටි දතෙහි මේ විපාක යි.

3160. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් දණ්ඩදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**දණ්ඩදායකස්ථවිරාපදානය පස්වැනියි.**

## 356. අම්බයාගුදායකස්ථවිරාපදානය

3161. සියල්ල තෙමේ ම අවබොධ කොටගත් පස්මරුන් දිනූ සතරංසි නම් පසේබුදුනතමේ සමාධියෙන් නැගිට මා වෙත පිඩුපිණිස එළඹියේ ය.

3162. මම පිරිසිදු සිත් ඇති ඒ පසේබුදුරජුන් දක උන්වහන්සේට පැහැදි සිතින් ම අඹ කැඳක් දුනිමි.

3163. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් කම්යක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අඹකැඳ පිදීමෙහි මේ විපාක යි.

3164. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් අම්බයාගුදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**අම්බයාගුදායකස්ථවිරාපදානය සවැනියි.**

## 357. සුපුටකපූජකස්ථවිරාපදානය

3165. දිවාවිහරණයෙන් නික්මුනු ඒ විපස්සී බුදුරජානන් වහන්සේ පිඩුපිණිස හැසිරෙන සේක් මාගේ සමීපයට එළඹි සේක.

3166. ඉක්බිති සතුටු වූ සොම්නස් වූ මම තාදී ගුණ ඇති බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ලුණුපලාවක් දී කල්පයක් සවර්ගයෙහි සතුටු වීමි.

3167. මෙයින් එක්අනූවන කපෙහි මම (යම්) ලුණුපලා දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (ලුණු) පලාදනෙහි මේ විපාක යි.

3168. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් සුපුටකපූජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**සුපුටකපූජකස්ථවිරාපදානය සත්වැනියි.**

## 358. මණ්ඩවදායකත්ථෙරාපදානං

3169. **විපස්සිනො** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
එකං මණ්ඩවං මයා දින්නං පසන්නෙන සපාණිනා.

3170. හත්ථියානං අස්සයානං දිබ්බයානං සමජ්ඣගං,
තෙන මණ්ඩවකදානෙන පත්තොම්හි ආසවක්ඛයං.

3171. එකනවුතෙ ඉතො කප්පෙ යං මණ්ඩවමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මණ්ඩවදානස්සිදං ඵලං.

3172. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මණ්ඩවදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**මණ්ඩවදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.**

## 359. සරණගමනියත්ථෙරාපදානං

3173. ආරුහිම්හ තදා නාවං භික්ඛු චාජීවකො චහං,
නාවාය භිජ්ජමානාය භික්ඛු මෙ සරණං අදා.

3174. එකතිංසෙ ඉතො කප්පෙ යං ච මෙ සරණං අදා,
දුග්ගතිං නාභිජානාමි සරණගමනෙ ඵලං.

3175. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සරණගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**සරණගමනියත්ථෙරස්ස අපදානං නවමං.**

## 360. පිණ්ඩපාතිකත්ථෙරාපදානං

3176. **තිස්සො** නාමාසි සම්බුද්ධො විහාසි විපිනෙ තදා,
තුසිතා හි ඉධාගන්ත්වා පිණ්ඩපාතමදාසහං.

3177. සම්බුද්ධමභිවාදෙත්වා තිස්සං නාම මහායසං,
සකං චිත්තං පසාදෙත්වා තුසිතං අගමාසහං.

3178. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

3179. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පිණ්ඩපාතිකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පිණ්ඩපාතිකත්ථෙරස්ස අපදානං දසමං.**

## 358. මඤ්චදායකසථවිරාපදානය

3169. ලොවට දෙටු වූ තාදී ගුණ ඇති විපස්සී බුදුරජුන්හට පහන් සිතින් සියතින් ම මා විසින් එක් මඤ්චකයෙක් දෙන ලදී.

3170. (එසින්) හස්තියානයන් ද, අශ්වයානයන් ද, දිව්‍යමය යානයන් ද ලැබීමි. ඒ මඤ්චදානයෙන් ම ආශ්‍රවක්ෂයට ද පැමිණියෙම් වෙමි.

3171. මෙයින් එක්අනූවන කපෙහි වූ එකල්හි යම් මඤ්චදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මඤ්චදානයාගේ මේ විපාක යි.

3172. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් මඤ්චදායක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**මඤ්චදායකසථවිරාපදානය අටවැනියි.**

## 359. සරණගමනියසථවිරාපදානය

3173. එකල්හි ආජීවකයෙක් වූ මම ද භික්ෂුනමක් ද නැවකට නැගුනෙමු. නැව බිදෙන කල්හි භික්ෂුතෙම මට සරණ දුන්නේ ය.

3174. මෙයින් එක්තිස්වන කපෙහි මට යම් සරණයක් දුන්නේ ද (ඒ සරණගතවීම් හෙතුවෙන්) දුගතියක් නො දනිමි. සරණගමනයෙහි මේ විපාක යි.

3175. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් සරණගමනිය සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සරණගමනියසථවිරාපදානය නවවැනියි.**

## 360. පිණ්ඩපාතිකසථවිරාපදානය

3176. තිස්ස නම් සම්බුදු වරයෙක් විය. එකල්හි උන්වහන්සේ වනයෙහි විසූ සේක. මම තුසිතයෙන් මෙහි පැමිණ (උන්වහන්සේට) පිණ්ඩපාතදානයක් දුනිමි.

3177. මහත් වූ ගුණ ඝොෂ ඇති තිස්ස නම් බුදුරජුන්හට සිය සිත පහදවා වැඳ මම (ආපසු) තුසිත දෙව්ලොවට ගියෙමි.

3178. මෙයින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් පිණ්ඩදානයක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පිණ්ඩපාතදානයාගේ මේ විපාක යි.

3179. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් පිණ්ඩපාතික සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**පිණ්ඩපාතිකසථවිරාපදානය දසවැනියි.**

උද්දානං:

සද්දසඤ්ඤී යවසිකො කිංසු කොරණ්ඩපුප්ඵියො
ආලම්බණො අම්බයාගු සුපුටී මඤ්චදායකො
සරණං පිණ්ඩපාතො ච ගාථා තාළීසමෙව ච.

**සද්දසඤ්ඤකවග්ගො ඡත්තිංසතිමො.**

## 361. මන්දාරවපුප්ඵියත්ථෙරාපදානං

3180. තාවතිංසා ඉධාගන්ත්වා මඞ්ගලො නාම මාණවො,
මන්දාරවං ගහෙත්වාන විපස්සිස්ස මහෙසිනො.

3181. සමාහිතං නිසින්නස්ස මත්ථකෙ ධාරයිං අහං,
සත්තාහං ධාරයිත්වාන දෙවලොකං පුනාගමිං.

3182. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3183. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මන්දාරවපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො **අභාසිත්ථාති.**

**මන්දාරවපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.**

## 362. කක්කාරුපුප්ඵියත්ථෙරාපදානං

3184. යාමා දෙවා ඉධාගන්ත්වා ගොතමං සිරිවච්ඡසං,
කක්කාරුපුප්ඵං[1] පග්ගය්හ බුද්ධස්ස අභිරොපයිං.

3185. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

3186. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කක්කාරුපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො **අභාසිත්ථාති.**

**කක්කාරුපුප්ඵියත්ථෙරස්ස අපදානං දුතියං.**

## 363. භිසමුළාලදායකත්ථෙරාපදානං

3187. ඵුස්සො නාමාසි සම්බුද්ධො සබ්බධම්මාන පාරගූ,
විවෙකකාමො සප්පඤ්ඤො ආගච්ඡි මම සන්තිකෙ.

3188. තස්මිං චිත්තං පසාදෙත්වා මහාකාරුණිකෙ ජිනෙ,
භිසං මුළාලං පග්ගය්හ බුද්ධසෙට්ඨස්සදාසහං.

1. කක්කාරුමාලං, මජසං.

උද්දානය:

සද්දසඤ්ඤි යවසික කිංසුක කොරණ්ඩපුප්ඵිය
ආලම්බන අම්බයාගු සුපුරි මඤ්චදායක
සරණ පිණ්ඩපාත ද යි ගාථාසෙක් මෙහි වේ.

**සද්දසඤ්ඤකවර්ගය සතිස්වැනිසි.**

## 361. මන්දාරවපුප්ඵියස්ථවිරාවදානය

3180-3181. **මඞ්ගල** නම් මානවක වූ මම මදාරා මල් ගෙණ තව්තිසා දෙව්ලොව සිට මෙහි පැමිණ සමාධියෙන් වැඩ හුන් **විපස්සි** බුදුරජුන්ගේ මස්තකයෙහි දැරීමි. (එය බුදුරජුන්හට මල්කුඩයක් මෙන්) සතියක් දරා සිට නැවත දෙව්ලොව ගියෙමි.

3182. මෙයින් එක්අනූවන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3183. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **මන්දාරවපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේකි.

**මන්දාරවපුප්ඵියස්ථවිරාවදානය පළමුවැනිසි.**

## 362. කක්කාරුපුප්ඵියස්ථවිරාවදානය

3184. (මම) යාම දෙව්ලොව සිට මෙහි පැමිණ ශ්‍රීමත් වූ **ගෞතම**යන් වහන්සේ දැක) කැකිරිමල් ගෙණ ඒ බුදුරජුන්හට පිදීමි.

3185. මෙයින් දෙයානූවන කපෙහි යම් බුද්ධපූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3186. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **කක්කාරුපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**කක්කාරුපුප්ඵියස්ථවිරාවදානය දෙවැනිසි.**

## 363. භිසමුළාලදායකස්ථවිරාවදානය

3187. සියලු ධර්මයන්ගේ තෙරපත් **ඵුස්ස** නම් සර්වඥවරයෙක් විය. විවෙකය කැමැති සප්‍රාඥ වූ උන්වහන්සේ මාගේ සමීපයට පැමිණිසේක.

3188. පත්මරුත් ජයගත් මහාකාරුණික වූ ඒ බුදුරජානන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම නෙළුම්අල හා දඹු ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දිනිමි.

3189. ඡන්නවුතෙ ඉතො කප්පෙ යං භිසමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භිසදානස්සිදං ඵලං.

3190. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භිසමුළාලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**භිසමුළාලදායකත්ථෙරස්ස අපදානං තතියං.**

## 364. කෙසරපුප්ඵියත්ථෙරාපදානං*

3191. විජ්ජාධරො තදා ආසිං හිමවන්තම්හි පබ්බතෙ,
මෙහි ගී එක් අනූවක් පඹුවන් ගණන ලද වේ.

**අවණ්ටඵල වර්ගය එකුන්සාළිස්වැනි යි.**

## 391. පිළිතුදිවච්ඡ ස්ථවිරාපදානය

3374. මම **හංසවතී** නගරයෙහි දෙරටුපාලයෙක් වීමි. මාගේ ගෘහයෙහි නිරවුල් වූ අප්‍රමාණ භොග සම්පත් ද විය.

3375. මම එකල්හි පහයෙහි විවෙකව හිඳ සිත පහදවා මෙසේ සිතීමි.

3376. මා විසින් බොහෝ භොගසම්පත්තීහු ලබන ලද්හ. මාගේ ඇතුළුනුවර සමෘද්ධය. පෘථිවීශ්වර වූ **ආනන්ද** රජතෙමේ ද (බුදුරජුන් ප්‍රධාන සඞ්ඝයාට දානය සඳහා) ආරාධනය කෙළේය.

3377. අයඤ්ච බුද්ධො උප්පන්නො අධිච්චුප්පත්තිකො මුනි,
සංවිජ්ජන්ති ච මෙ භොගා දානං දස්සාමි සත්ථුනො.

3378. **පදුමෙන** රාජපුත්තෙන දින්නං දානවරං ජිනෙ,
හත්ථිනාගෙ ච පල්ලඞ්කෙ අපස්සෙනඤ්ච'නප්පකං.

3379. අහම්පි දානං දස්සාමි සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අදින්නපුබ්බමඤ්ඤෙසං භවිස්සං ආදිකම්මිකො.

3380. චින්තෙත්වාහං බහුවිධං යාගෙ යස්ස සුඛං ඵලං,
පරික්ඛාරදානමද්දක්ඛිං මම සඞ්කප්පපූරණං.

3381. පරික්ඛාරානි දස්සාමි සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අදින්නපුබ්බමඤ්ඤෙසං භවිස්සං ආදිකම්මිකො.

3382. නළකාරෙ උපාගම්ම ඡත්තං කාරෙසිං තාවදෙ,
ඡත්තසතසහස්සානි එකතො සන්නිපාතයිං.

3383. දුස්සසතසහස්සානි එකතො සන්නිපාතයිං,
පත්තසතසහස්සානි එකතො සන්නිපාතයිං.

3384. වාසියො සත්ථකෙ චාපි සූචියො නඛඡෙදකෙ[1],
හෙට්ඨා ඡත්තෙ ලග්ගාපෙසිං[2] කාරෙත්වා තදනුච්ඡවෙ.

3385. විධූපනෙ තාලවණ්ටෙ මොරහත්ථෙ ච චාමරෙ,
පරිස්සාවනෙ තෙලධරෙ[3] කාරයිං තදනුච්ඡවෙ.

3386. සූචිඝරෙ අංසබද්ධෙ අථොපි කායබන්ධනෙ,
ආධාරකෙ ච සුකතෙ කාරයිං තදනුච්ඡවෙ.

3387. පරිභොගභාජනෙ ච අථොපි ලොහථාලකෙ,
භෙසජ්ජෙ පූරයිත්වාන හෙට්ඨාඡත්තෙ ඨපෙසහං.

3388. වචං උසීරං ලට්ඨිමධුං පිප්ඵලී මරිචානි ච,
හරීතකිං සිඞ්ගිවෙරං[4] සබ්බං පූරෙසිං භාජනෙ.

3389. උපාහනෙ[5] පාදුකායො අථො උදකපුඤ්ඡනෙ,
කත්තරදණ්ඩෙ සුකතෙ කාරයිං තදනුච්ඡවෙ.

3390. ඔසධඤ්ජනනාළී ච[6] සලාකා ධම්මකුත්තරා,
කුඤ්චිකා පඤ්චවණ්ණෙහි සිබ්බිතෙ කුඤ්චිකාඝරෙ.

3391. ආයොගෙ ධූමනෙත්තෙ ච අථොපි දීපධාරකෙ,
තුම්බකෙ ච කරණ්ඩෙ ච කාරයිං තදනුච්ඡවෙ.

1. නඛච්ඡෙදනෙ, මජසං 2. ඨපාපෙසිං, මජසං. 3. තෙලධාරෙ, මජසං.
4. සිඞ්ගීවෙරං, මජසං 5 උපාහනා, මජසං. 6. ඔසධං අඤ්ජනාපි ච, සයා.

3377. සචීන්ද්‍ර තෙමේ ලෝ වැඩ සඳහා පහළ වන්නේ වේ. මේ ඒ සචීන්ද්‍රතෙම ලොව පහළ විය. මාගේ භොගයෝ ද විද්‍යමාන වෙත්. ශාස්තෘන් වහන්සේට දනක් දෙන්නෙමි.

3378. පදුම නම් රාජපුත්‍රයා විසින් බුදුරජානන් වහන්සේ කෙරෙහි උතුම් වූ දනයක් දෙන ලදී. (ඒ දනෙහි) හස්තිරාජයන් ද, පයඞ්ඛකයන් ද හේත්තු වන පුවරු ද යන බොහෝ දේ වෙයි.

3379. මම ද උතුම් වූ සඞ්ඝයා කෙරෙහි දනක් දෙන්නෙමි. අනුන් විසින් නො දුන් විරූ (දෑ දීමෙහි) ආදිකර්මිකයෙක් වන්නෙමියි-

3380. යම් යම් දෑ දීමෙහි සුඛවිපාක නම් අයුරින් සිතා මාගේ අදහස් පුරා ලන පරිෂ්කාරදානය දිටිමි.

3381. ගණවරොත්තම වූ සඞ්ඝයා කෙරෙහි පිරිකර දෙන්නෙමි. අනුන් විසින් නො දුන් විරූ (දෑ දීමෙහි) ආදිකර්මිකයෙක් වන්නෙමියි-

3382. එකෙණෙහි කුලුපොත්තන් (=බටවලින් කම්මාන්ත කරන්නන්) වෙත එළඹ ඡත්‍ර කරවීමි. ඡත්‍ර ලක්‍ෂයක් එක්රැස් කෙළෙමි.

3383. වස්ත්‍ර ලක්‍ෂයක් ද එක්රැස් කෙළෙමි. පාත්‍ර ලක්‍ෂයක් ද එක්රැස් කෙළෙමි.

3384. වෑ ද කූඩා පිහි ද, හිදි ද, නියකපන සැත් ද, ඊට සුදුසු ලෙස කරවා ඡත්‍රයෙහි එල්බවීමි.

3385. පවන්අතු ද, විජිනිපත් ද, මොණරපියාපත් ද, සෙමරවල් ද, පෙරහන්කඩ ද, තෙල්බඳුන් ද, එයට සුදුසු ලෙස කරවීමි.

3386. හිදිගුලා ද, අස්බහන් ද, යලි කාබහන් ද, (පාත්‍රාධාරාදී) මැනවින් කළ ආධාරක ද එයට සුදුසු ලෙස කරවීමි.

3387. පරිභොගයට ගන්නා බඳුන් ද, එසේ ම ලොහොතලි ද බෙහෙත් පුරවා ඡත්‍ර යට තැබීමි.

3388. වදකසාය, සැවැන්න (විෂ්ණුක්‍රාන්ති) මුල් ය, වැල්මී ය, තිප්පිලි ය, ගම්මිරිස් ය, අරළු ය, හිඟුරු ය යන මේ සියල්ල බඳුන්හි පිරවීමි.

3389. වහන් ද, මිරිවැඩි ද, එසේ ම දිය පිස්නාවන් ද, මැනවින් කළ සැරයටි ද, එයට සුදුසු ලෙස කරවීමි.

3390. බෙහෙත් අඳුන් නාළිකා ද (බෙහෙත් ගෑම් ආදිය සඳහා ගන්නා) ලහ ද, දම්කොතුරු (=ඛබරු) ද කෙසි (යතුරු) ද පස්වණින් මසා කළ කෙසිගුලා හෙවත් යතුරු කොපු ද,

3391. ආයොගපට්ට ද, දුම් (බොන) කෝව ද පහන් එල්ලන කොකු ද තිඹ නම් මානපාත්‍ර ද කරඬු ද එයට සුදුසු ලෙස කරවීමි.

3392. සණ්ඩාසෙ පිප්ඵලෙ චෙව අථොපි මලහාරකෙ,
භෙසජ්ජථවිකෙ චෙව කාරයිං තදනුච්ඡවෙ.

3393. ආසන්දියො පීඨකෙ ච පල්ලඞ්කෙ චතුරොමයෙ,
තදනුච්ඡවෙ කාරයිත්වා හෙට්ඨාමඤ්චෙ ඨපෙසහං.

3394. උණ්ණාභිසී තූලභිසී අථොපි පීඨිකාභිසී[1],
බිම්බොහනෙ[2] ච සුකතෙ කාරයිං තදනුච්ඡවෙ.

3395. කුරුවින්දෙ මධුසිත්ථෙ තෙලං හත්ථප්පතාපකං,
සිපාටී ථලකෙ සූචි මඤ්චමත්ථරණෙන ච.

3396. සෙනාසනෙ පාදපුඤ්ඡෙ සයනාසනදණ්ඩකෙ,
දන්තපොණෙ ච ආටලී සීසාලෙපනගන්ධකෙ.

3397. අරණී පලාලපිණ්ඩෙ[3] ච පත්තපිධානථාලකෙ,
උදකස්ස කටච්ඡු ච චුණ්ණකා රජනම්මණං[4].

3398. සම්මජ්ජනං[5] උදපත්තං තථා වස්සිකසාටිකං,
නිසීදනං කණ්ඩුච්ඡාදී අථ අන්තරවාසකං.

3399. උත්තරාසඞ්ගසඞ්ඝාටී නත්ථුකං මුඛසොධනං,
බිලඞ්ගලොණං පහූතං ච මධුඤ්ච දධිපානකං.

3400. ධූපං සිත්ථං පිලොතිඤ්ච මුඛපුඤ්ඡනසුත්තකං,
දාතබ්බං නාම යං අත්ථි යං ච කප්පති සත්ථුනො.

3401. සබ්බමෙතං සමානෙත්වා ආනන්දං උපසඞ්කමිං,
උපසඞ්කම්ම රාජානං ජනෙතාරං මහෙසිනො[6],
සිරසා අභිවාදෙත්වා ඉදං වචනමබ්‍රවිං:

3402 එකතො ජාතසංවද්ධා උභින්නං එකතො මනං[7],
සාධාරණා සුඛදුක්ඛෙ උභො ච අනුවත්තකා.

3403. අත්ථි චෙතසිකං දුක්ඛං තවාධෙය්‍යං අරින්දම,
යදි සක්කොසි තං දුක්ඛං විනොදෙය්‍යාසි ඛත්තිය.

3404. තව දුක්ඛං මමං[8] දුක්ඛං උභින්නං එකතො මනං[9],
නිට්ඨිතන්ති විජානාහි මමාධෙය්‍යං සචෙ තුවං.

3405. ජානාහි මෙ මහාරජ දුක්ඛං මෙ දුබ්බිනොදයං,
පහූ සමානො ගජ්ජස්සු එකං තෙ දුච්චජං වරං.

---

1. පිඨකාභිසී, සයා. 2 බිබ්බොහනෙ, සයා. 3. ථලපිණ්ඩෙ, මජසං.
4. රජනම්බණං, මජසං. 5. සම්මුඤ්ජනං, සය. 6. මහෙසිනං, සීමු. මහායසං, සයා.
7. යසො, සයා. 8. මම 9 මනො, මජසං.

3392. අඹු ද, කතුරු ද, යළිදු මල හරනා හඹු (=කත්තැදි) ද බෙහෙත් පහි ද එයට සුදුසු ලෙස කරවීමි.

3393. දික්හඟලා පුටු ද, කුඩා පුටු ද, පලඟ ද මම එයට සුදුසු ලෙස කරවා ඡත්‍රයයට තැබීමි.

3394. එළලොම් පිර වූ බිසි ද, පුලුන් පිර වූ බිසි ද, යළිදු පුටු බිසි ද මැතවිත් කරණ ලද මෙට්ට ද එයට සුදුසු ලෙස කරවීමි.

3395. (ඇඟ ඉලීමට ගන්නා) කුරුඳුගල් ද, මීඉටි ද (තල) තෙල් ද එසේ ම ඇඟ ඉලීමට ගන්නා (ඉරි ඇඳ කොරොස් කළ) අත්වන අගුරු කබල ද (මට කළ) ගල්පතුරු ද, පුවරු ද, හිදි ද, ඇඳ අතුරුණු ද,

3396. සෙනසුන් ද, පාබිසි ද, යහන්දඬු ද, දැහැටි ද, දත් කටු ද හිසෙහි ගල්වන ගඳ (තෛලාදිය) ද,

3397. ගිනිගානා දඬු ද, පිදුරු පුටු ද, පාත්‍රයත් වහන පියන් හා තලි ද, දිය ගන්නා පිණිස යොදන කිණිසි ද, සුණුවගී ද පඬුබරු ද,

3398. මුසුන් ද, දියබඳුන් ද, එසේ ම වැසිසළු ද, හිඳිනා ඇතිරි ද, කස්පිළිසත් පටි ද, යලි හඳනාකඩ ද,

3399. උතුරුසඟසිවුරු හා සඟලසිවුරු ද, නශ්‍ය කරණ ශුගතැදි ද, මුවදේනා බඳුන් ද, ඇඹුල් කාඩි ද, ලුණු ද, බොහෝ වූ මී ද, දීහියෙන් කළ පානවගී ද,

3400. දුම් නඟනා ද්‍රව්‍ය ද, ඉටි ද, මහලුපිළි ද, මුව පිස්නා හා හූ දැයි (මෙසේ) දිය යුතු යමක් ඇත් ද, යමක් ශාස්තෲන් වහන්සේටත් කැප ද.

3401. මේ සියල්ල රැස් කරවා මහර්ෂි වූ බුදුරජුන්ගේ පියා වූ ආනන්ද රජු වෙත එළඹියෙමි. එළඹ හිස නමා වැඳ මේ වචනය කීමි.

3402. (අප දෙදෙන) එක්ව ඉපද එක්ව ම වැඩුනෝ වෙමු. දෙදෙ-නාගේ සිත ද එක්ව ම පවතී. (දෙදෙනා පිළිබඳ සුවදුක් දෙක) දෙදෙනාට ම සාධාරණ ය. (දෙදෙනා ම ඔවුනොවුනට) අනුව පවතින්නෝ වෙමු.

3403. සතුරන් මඬින්නා වූ රජතුමනි, මාගේ සිතෙහි තොප අයත් හෙවත් තොප විසින් මැඩලිය යුතු දුකක් ඇත. ක්ෂත්‍රියයානෙනි, ඉදින් හැකිවෙහි නම් ඒ දුක දුරු කරන්නෙහිය කියා යි.

3404. ඔබගේ දුක මාගේ දුකය, දෙදෙනාගේ ම සිත එක්බඳුය, ඉදින් තාගේ දුක මා අයත් නම් හෙවත් මා විසින් මැඩලිය හැක්කක් නම් එය අවසන් විය යි දැන ගණුව.

3405. මහරජතුමනි, මාගේ දුරු කළ නො හැකි දුක දැනගණු මැනව, එය ඔබවහන්සේගේ බැහැර කළ නො හැකි එක් වරයක් වෙයි. එය කිරීමෙහි පොහොසත් වන්නේ නම් කියනු මැනව.

3406. යාවතා විජිතං අත්ථි යාවතා මම ජීවිතං,
එතෙහි යදි තෙ අත්ථො දස්සාමි අවිකම්පිතො.

3407. ගජ්ජිතං ඛො තයා දෙව මිච්ඡා තං බහුගජ්ජිතං,
ජානිස්සාමි තුවං අජ්ජ සබ්බධම්මෙ පතිට්ඨිතං.

3408. අතිබාළ්හං නිපීළෙසි දදමානස්ස මෙ සතො,
කිනෙත මෙ පීළිතෙනත්ථො පත්ථිතං තෙ කථෙහි මෙ.

3409. ඉච්ඡාමහං මහාරාජ බුද්ධසෙට්ඨමනුත්තරං,
භොජයිස්සාමි සම්බුද්ධං වජ්ජං මෙ මාහු ජීවිතං.

3410. අඤ්ඤං තෙහං වරං දම්මි මා යාචිත්ථො තථාගතං,[1]
අදෙය්‍යො කස්සචි බුද්ධො මණිජොතිරසො යථා.

3411. නනු තෙ ගජ්ජිතං දෙව යාව ජීවිතමත්තනො,[2]
ජීවිතං දදමානෙන යුත්තං දාතුං තථාගතං.

3412. ඨපනීයො මහාවීරො අදෙය්‍යො කස්සචි ජිනො,
න මෙ පටිස්සුතො බුද්ධො වරස්සු අමිතං ධනං.

3413. විනිච්ඡයං පාපුණාම පුච්ඡිස්සාම විනිච්ඡයෙ,
යථාසන්තං[3] කථෙස්සන්ති පටිපුච්ඡාම තං තථා.

3414. රඤ්ඤො හත්ථෙ ගහෙත්වාන අගමාසිං විනිච්ඡයං,
පරතො අක්ඛදස්සානං ඉදං වචනමබ්‍රවිං.

3415. සුණන්තු මෙ අක්ඛදස්සා ජීවිතම්පි පවාරයී[4],
න කිඤ්චි ඨපයිත්වාන රාජා වරමදාසි මෙ[5].

3416. තස්ස මෙ වරදින්නස්ස බුද්ධසෙට්ඨං වරිං අහං,
සුදින්නො හොති මෙ බුද්ධො අත්ථවා[6] සංසයං මම.

3417. සොස්සාම තව වචනං භූමිපාලස්ස රාජිනො,
උභින්නං වචනං සුත්වා ඡින්දිස්සාමෙත්ථ සංසයං.

3418. සබ්බං දෙව තයා දින්නං ඉමස්ස සබ්බගාහිකං[7],
න කිඤ්චි ඨපයිත්වාන ජීවිතම්පි පවාරයී.

---

1. අයාචිතො තථාගතො, ස්‍යා.
2. ජීවිතමත්තිකං, ස්‍යා.
3. යථාසණ්ඨං, මජසං.
4. රාජා වරමදාසි මෙ, මජසං.
5. ජීවිතම්පි පවාරයී, මජසං.
6. ඡින්දථ, මජසං.
7. සබ්බගාහිතං, ස්‍යා.

3406. විජිතය යම් තාක් ඇද්ද, මාගේ ජීවිතය යම් තාක් ඇද්ද, ඉදින් මෙකී දෙයින් ඔබට ප්‍රයොජන නම් කමපා නො වූයෙම් ම (එය) දෙන්නෙමි.

3407. දෙවයන් වහන්ස, ඔබ විසින් මෙසේ ගජිනා කරණ ලදී. එබඳු බොහෝ ගර්ජිතයන් (ඇතැම් විට) බොරු වන්නේය. අද ඔබ සියලු බම්යන්හි පිහිටියෙක් දැයි දත්මි.

3408. (ඇති) යමක් දෙන්නා වූ මා (ඔබ) දැඩි ලෙස පෙළනෙහිය. මා පෙළීමෙන් ඔබට ඇති ප්‍රයොජනය කිම? ඔබ විසින් පතන ලද්ද මට කියව.

3409. මහරජතුමනි, මම අනුත්තර වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ කැමැත්තෙමි. සම්බුදුරජුන් වළඳවන්නෙමි. මෙය වැරදුනහොත් මාගේ ජීවිතය නහමක් වේවා.

3410. මම ඔබට අනික් වරයක් දෙමි. තථාගතයන් වහන්සේ නො ඉල්ලනු මැනව. දුරඟම්ණක් බඳු බුදුරජ තෙම කිසිවෙකුට නො දිය යුත්තෙකි.

3411. දෙවයන් වහන්ස, ඔබ විසින් තමාගේ දිවි වුව ද දෙමැයි ගජිනා කරණ ලදුයේ නො වේ ද? ජීවිතය දෙන්නහු විසින් බුදුරජුන් දීම සුදුසුය.

3412. බුදුරජ තෙම (වෙන් කොට) තැබිය යුතු ය. සම්ඳ තෙම කිසිවකුට නො දිය යුතු වේ. මා විසින් බුදුරදුන් දෙමැයි පිළිවදන් නො දෙන ලදී. අපමණ වූ ධනය ඉල්ලනු මැනව.

3413. අධිකරණයට පැමිණෙමු. අධිකරණයෙහි දී විචාරන්නෙමු. (එවිට අධිකරණ නායකයෝ) ඇති පරිදි (කරුණු) කියන්නාහුය. එය එසේ (අධිකරණයෙන් ම) විචාරමු.

3414. රජුගේ අත ගෙණ විනිශ්චයට ගියෙමි. විනිසකරුවන් ඉදිරියෙහි මේ වචනය කීමි:

3415. විනිසකරුවෝ මබන අසත්වා, කිසිවක් නො තබා මට රජ තෙම වරයක් දුන්නේය. ජීවිතය පවා පැවරීය.

3416. මට වර දුන් ඔහුගෙන් මම බුදුරජුන් ඉල්ලීමි. මට බුදුරජ තෙම මැනවින් දෙන ලදී. නො එසේ නම් මාගේ සැකයෙකි.

3417. තාගේ වචනය ද පෘථිවිපාලක වූ රජුගේ වචනය ද අසමු. දෙදෙනාගේ ම වචන අසා මෙකී සැක දුරු කරමු.

3418. දෙවයන් වහන්ස, කිසිවක් තබා නො ගෙණ සියල්ල ම ගතයුතු සේ කොට සියල්ල ඔබවහන්සේ විසින් මොහුට දෙනලද ද? ජීවිතය ද පැවරී ද?

3419. කිච්ඡප්පත්තෙනාව භුඤ්ජාන යාචි වරමනුත්තරං[1],
ඉමං සුදුක්ඛිතං ඤත්වා අදාසිං සබ්බගාහිකං.

3420. පරාජයො තවං[2] දෙව, අස්ස දෙය්‍යො තථාගතො,
උභින්නං සංසයො ජීතො යථාසන්තමහි[3] තිට්ඨථ.

3421. රාජා තථෙව ඨත්වාන අක්ඛදස්සෙතදබ්‍රවි,
සම්මා මයාහම්පි දෙය්‍යාථ පුන බුද්ධං ලභාමහං.

3422. පූරෙත්වා තව සඞ්කප්පං භොජයිත්වා තථාගතං,
පුන දෙය්‍යාසි සම්බුද්ධං ආනන්දස්ස යසස්සිනො.

3423. අක්ඛදස්සො'භිවාදෙත්වා ආනන්දඤ්චාපි ඛත්තියං,
තුට්ඨො පමුදිතො හුත්වා සම්බුද්ධමුපසඞ්කමිං.

3424. උපසඞ්කම්ම සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං,
සිරසා අභිවාදෙත්වා ඉදං වචනමබ්‍රවිං.

3425. වස්සසතසහස්සානි අධිවාසෙහි චක්ඛුම,
හාසයන්තො මමං[4] චිත්තං නිවෙසනමුපෙහි මෙ.

3426. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම සඞ්කප්පමඤ්ඤාය අධිවාසෙසි චක්ඛුමා,

3427. අධිවාසනමඤ්ඤාය අභිවාදිය සත්ථුනො,
හට්ඨො උදග්ගචිත්තොහං නිවෙසනමුපාගමිං.

3428. මිත්තාමච්චෙ සමානෙත්වා ඉදං වචනමබ්‍රවිං,
සුදුල්ලභො මයා ලද්ධො මණි ජොතිරසො යථා.

3429. කෙන තං පූජයිස්සාම අප්පමෙය්‍යො අනූපමො,
අතුලො අසමො ධීරො ජිනො අප්පටිපුග්ගලො.

3430. තථා සමසමො චෙව අදුතියො නරාසභො,
දුක්කරං අධිකාරං හි බුද්ධානුච්ඡවිකං මයා.

3431. නානාපුප්ඵෙ සමානෙත්වා කරොම පුප්ඵමණ්ඩපං,
බුද්ධානුච්ඡවිකං එතං සබ්බපූජා භවිස්සති.

---

1. යාවජීවමනුත්තරං, සයා. 2. තුවං, මජ්සං. 3. යථාසණ්ඩමහි, මජ්සං.
4. මම චිත්තං, මජ්සං.

3419. (මෙ තෙම) දූකට පැමිණියෙක් ව උතුම් වරයක් ඉල්ලීය. අතිශයින් දූකට පත් මොහු දූත (කැමති සියල්ලක් ම දෙමැයි) සම්ග්‍රාහික කොට (වරයක්) දුනිමි.

3420. දෙවයන් වහන්ස, පරාජය ඔබවහන්සේට ය. බුදුරජ තෙම ඔහුට දිය යුතුය. දෙදෙනාගේ ම සැක පසිඳින ලදි. සත්පුරුෂධර්මය වූ පරිදි ධර්මයෙහි පිහිටුව.

3421. රජ තෙම එහි ම සිටගෙණ විනිසකරුවනට මෙය කීය. සගයෙනි, මට ද තෙපි (වරයක්) දෙන්නහු නම් නැවත මම බුදුරජුන් ලබමි.

3422. තාගේ අදහස් සම්පූර්ණ කොට ගෙණ තථාගතයන් වළඳවා ආනන්ද රජුහට නැවත බුදුරජුන් දෙන්නෙහි ය.

3423. විනිසකරුවනට ද රජතුමාට ද වැඳ සතුටු වූයෙම් ප්‍රමුදිත වූයෙම් බුදුරජුන් වෙත එළඹියෙමි.

3424. චතුරෞඝයන් තරණය කළා වූ ආස්‍රව රහිත වූ සම්බුදුරජුන් වෙත එළඹ හිස නමා වැඳ මේ වචනය කීමි.

3425. පසැස් ඇතියාණන් වහන්ස, රහතුන් ලක්ෂයක් දෙනා වහන්සේ සමග (මාගේ දානය) ඉවසා වදාළ මැනව. මාගේ සිත සතුටු කරමින් මාගේ නිවසට වඩිනු මැනව.

3426 ලෝවැස්සන්ගේ පූජාසත්කාරයන් පිළිගත්තා වූ තුන්ලොව ම මැනවින් දතුවා වූ පසැස් ඇත්තා වූ පදුමුත්තර බුදුරජ තෙම මාගේ අදහස දූන (ඒ ආරාධනය) ඉවසීය.

3427. මම ආරාධනය පිළිගත් බව දූන ශාස්තෘන් වහන්සේ වැඳ සතුටුව ඔදවැඩි සිත් ඇත්තෙම් සිය නිවසට එළඹියෙමි.

3428. මම මිත්‍රාමාත්‍යයන් රැස් කරවා මේ වචන කීමි. දුරහ මිණිරුවන වැනි අතිදුර්ලභ වස්තුවක් මා විසින් ලබන ලදි.

3429. බුදුරජාණන් වහන්සේ පමණ කළ නොහැකි ගුණ ඇති සේක. උපමාරහිත වූ ගුණ ඇති සේක. අතුල්‍ය වූ සම වූ අතිකකු නොමැති බැවින් අසම නම් වන සේක. මහ නුවණැති සේක. පස්මරුන් දිනූ සේක. අප්‍රතිපුද්ගල වන සේක. ඒ බුදුරජුන්හට කුමකින් පුදන්නෙමු ද?

3430. එසේ ම ඒ බුදුරජාණන් වහන්සේ අසම සමය හ. අද්‍විතීය හ. නරශ්‍රෙෂ්ඨය හ. මා විසින් ඒ බුදුරජුන්හට සුදුසු වූ පූජාවක් කිරීම දුෂ්කරය.

3431. නොයෙක් මල් රැස් කොට පුෂ්පමණ්ඩපයක් කරමු. මේ සියලු පූජා බුදුරජුන්හට සුදුසු වන්නීය.

3432. උප්පලං පදුමං වාපි වස්සිකං අධිමුත්තකං,
චම්පකං නාගපුප්ඵඤ්ච මණ්ඩපං කාරයිං අහං.

3433. සතාසනසහස්සානි ඡත්තච්ඡායාය පඤ්ඤපිං,
පච්ඡිමං ආසනං මය්හං අධිකං සතමග්ඝති.

3434. සතාසනසහස්සානි ඡත්තච්ඡායාය පඤ්ඤපිං,
පටියාදෙත්වා අන්නපානං කාලමාරොචයිං අහං.

3435. ආරොචිතම්හි කාලම්හි පදුමුත්තරො මහාමුනි,
වසී සතසහස්සෙහි නිවෙසනමුපෙසි මෙ.

3436. ධාරෙන්තමුපරිච්ඡත්තෙ[1] සුඵුල්ලපුප්ඵමණ්ඩපෙ,
වසීසතසහස්සෙහි නිසීදි පුරිසුත්තමො.

3437. ඡත්තසතසහස්සානි සතසහස්සමාසනං,
කප්පියං අනවජ්ජඤ්ච පටිග්ගණ්හාහි චක්ඛුම.

3438. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මමං තාරෙතුකාමො සො සම්පටිච්ඡි මහාමුනි.

3439. භික්ඛුනො එකමෙකස්ස පච්චෙකං පත්තදුස්සකං,
ජහිංසු පුබ්බකං[2] පත්තං ලොහපත්තමධාරයුං.

3440. සත්තරත්තින්දිවං බුද්ධො නිසීදි පුප්ඵමණ්ඩපෙ,
බොධයන්තො බහූ සත්තෙ ධම්මචක්කං පවත්තයි.

3441. ධම්මචක්කං පවත්තෙන්තො[3] හෙට්ඨතො පුප්ඵමණ්ඩපෙ,
චුල්ලාසීතිසහස්සානං ධම්මාභිසමයො අහු.

3442. සත්තමෙ දිවසෙ පත්තෙ පදුමුත්තරො මහාමුනි,
ඡත්තච්ඡායාය මාසීනො ඉමා ගාථා අභාසථ:

3443. අනූනකං දානවරං යො මෙ පාදාසි මාණවො,
තමහං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො.

3444. හත්ථී අස්සා රථා පත්තී සෙනා ච චතුරඞ්ගිනී,
පරිවාරෙස්සන්ති'මං[4] නිච්චං සබ්බදානස්සිදං ඵලං.

3445. හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකා,
උපට්ඨිස්සන්ති'මං නිච්චං සබ්බදානස්සිදං ඵලං.

3446. සට්ඨිරථසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
පරිවාරෙස්සන්ති'මං නිච්චං සබ්බදානස්සිදං ඵලං.

3447. සට්ඨිතුරියසහස්සානි[5] භෙරියො සමලඞ්කතා,
වජ්ජයිස්සන්ති'මං නිච්චං සබ්බදානස්සිදං ඵලං.

1. ධාරෙන්තං උපරිච්ඡත්තං. මජසං. 2. සුම්භකං, මජසං. සම්භතං, ස්‍යා.
3. පවත්තෙන්තො, මජසං. 4. තං, ස්‍යා 5. සට්ඨිතුරියසහස්සානි, මජසං.

3432. උපුල්, පියුම්, දෑසමන්, යොහොඹු (=කෝඹු), සපු, නා යන මලින් මම මණ්ඩපයක් කරවීමි.

3433. ඡත්‍රයන්ගේ සෙවනෙහි ලක්ෂයක් අසුන් පැණවීමි. මාගේ අනතිම ආසනය අසිරාසියක් අගනේ ය.

3434. මම සත්සෙවනෙහි ලක්ෂයක් අසුන් පණවා තිමවීමි. ආහාර-පාන ද පිළියෙල කරවා (සුදුසු) කලැයි දැන්වීමි.

3435. කාලය ආරෝචනය කළ කල්හි පදුමුත්තර බුදුරජ තෙමේ ලක්ෂයක් රහතුන් සමග මාගේ නිවසට එළඹියේ ය.

3436. මුදුන් සත් දරණ සුපුල් මල්මුවාමඩුවෙහි පුරුෂොත්තම වූ බුදුරජ තෙම ලක්ෂයක් රහතුන් සමග වැඩහුන්නේ ය.

3437. ඡත්‍ර ලක්ෂයකි. අසුන් ලක්ෂයකි. බුදුරජානන් වහන්ස, මේ කැපය, නිවරදය. පිළිගණු මැනව.

3438. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ඒ මහාමුනි වූ පදුමුත්තර බුදුරජ තෙම මා (සසර සයුරින්) එතෙර කරණු කැමැත්තේ එය පිළි-ගත්තේ ය.

3439. මම එක එක භික්ෂුහට වෙන වෙන ම පාත්‍ර දුනිමි. පළමුවෙන් තුබුනු පාත්‍ර ඉවත් කොට හළහ. (හැමදෙනා වහන්සේ ම) ලෝහපාත්‍ර දුරුවානු ය.

3440. බුදුරජ තෙම දිවරු සතක් පුෂ්පමණ්ඩපයෙහි වැඩහුන්නේ ය. බොහෝ සත්නට දහම් අවබොධ කරවමින් දම්සක් පැවැත්වී ය.

3441. පුෂ්පමණ්ඩපය තුල දම්සක් පවත්වන කල්හි සුවාසූදහසක් ප්‍රාණීන්හට ධර්මාභිසමය වී ය.

3442. සත්වැනි දින පැමිණි කල්හි පදුමුත්තර බුදුරජ තෙම ඡත්‍රච්ඡායායෙහි වැඩහුන්නේ මේ ගාථාවන් වදාළේ ය:

3443. "යම් මාණවකයෙක් මට කිසිවකින් නො අඩු වූ උතුම් දානයක් දුන්නේ ද, මම හේ කවරෙක් දැයි කියන්නෙමි. කියන්නා වූ මාගේ (වචනය) අසවු.

3444. ඇත්තු ද අශ්වයෝ ද රිය ද පාබල සෙනඟ ද යන සිවුරඟ සෙනඟ මොහු නිතර පිරිවරන්නාහුය. සම්දානයාගේ මේ විපාක යි.

3445. හස්තියානය අශ්වයානය ඩෝලාය පල්ලැක්කිය යන මෙකී යානයෝ නිරතුරුව මොහු වෙත එළඹ සිටිත්. සම්දානයාගේ මේ විපාක යි.

3446. සියලු ආභරණයන්ගෙන් සරසන ලද සැටදහසක් රථයෝ නිරතුරුව මොහු පිරිවරන්නාහුය. සම්දානයාගේ මේ විපාක යි.

3447. සැටදහසක් තූර්‍යයෝ ද මැනැවින් අලඞ්කාර කරණ ලද බෙරිහු ද මොහුට නිරතුරුව ම වැයුම් කරන්නාහුය. සම්දානයාගේ මේ විපාක යි.

3448. ඡළාසීතිසහස්සානි නාරියො සමලඞ්කතා,
විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා[1].

3449. අළාරපම්හා හසුලා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
පරිවාරෙස්සන්ති'මං නිච්චං දානස්සිදං ඵලං.

3450. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

3451. සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

3452. දෙවලොකෙ වසන්තස්ස පුඤ්ඤකම්මසමඞ්ගිනො,
දෙවලොකපරියන්තං රතනච්ඡත්තං ධරීයති[2].

3453. ඉච්ඡිස්සති යදා ඡායං[3] ඡදනං දුස්සපුප්ඵජං,
ඉමස්ස චිත්තමඤ්ඤාය නිබද්ධං ඡාදයිස්සති.

3454. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
පුඤ්ඤකම්මෙන සංයුත්තො බ්‍රහ්මබන්ධු භවිස්සති.

3455. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

3456. සබ්බමෙතං අභිඤ්ඤාය ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙස්සති.

3457. පිලින්දිවච්ඡො[5] නාමෙන හෙස්සති සත්ථුසාවකො,
දෙවානං අසුරානඤ්ච ගන්ධබ්බානං ච සක්කතො.

3458. භික්ඛූනං භික්ඛුනීනං ච ගිහීනං ච තථෙව සො,
පියො හුත්වාන සබ්බෙසං විහරිස්සතනාසවො."

3459. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයී මම[6].

3460. අහො මෙ සුකතං කම්මං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
යත්ථ කාරං කරිත්වාන පත්තොම්හි අචලං පදං.

3461. අනුත්තරං දානවරං අදාසි යො හි මාණවො,
ආදි පුබ්බඞ්ගමො ආසි තස්ස දානස්සිදං ඵලං.

3462. ජනෙත සුගතෙ දත්වාන[7] සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3463. සීතං උණ්හං න ජානාමි රජොජල්ලං න ලිම්පති,
අනුපද්දවො අනීතී ච හොමි අපචිතො සදා.

1. ආමුක්කමණිකුණ්ඩලා, මජසං. 2. ධරිස්සති, මජසං. 3. යදුච්ඡායං, සතා. 4. ගොත්තෙන, මජසං. 5. පිලින්දවච්ඡ, මජසං. 6. ඣාපයිස්සති, සීමු. 7. ජනෙත ච සුගතෙ දත්වා, මජසං.

3448-3449. මැනැවින් අලඞ්කාර කරණ ලද සයාසූදහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු පළඳින ලද මිණිකොඬොල් ඇත්තාහු දිග ඇසිපිය ඇත්තාහු සිනා සහිත වූවාහු මැනවැයි හැඳින්විය යුතු ශරීරාවයව ඇත්තාහු සිහින් කටිප්‍රදෙශ ඇත්තාහු නිරතුරුව ම මොහු පිරිවරන්නාහු ය. සච්ඡදානයාගේ මේ විපාක යි.

3450. තෙත්තිස්දහසක් කල් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. දහස්වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

3451. දහස්වරක් සක්විති රජ වන්නේ ය. (කරවනු ලබන) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙපමණය යි) ගිණිය නො හැකිය.

3452. පුණ්‍යකර්මයාගේ (විපාකය හා) යෙදී දෙව්ලොව වසන්නා වූ මොහුට දෙව්ලොව කෙලවර කොට රුවන්සැතක් (=සුවර්ණමයකුඩයක්) දරේ.

3453. යම් කලෙක පිළිපුප්මුවා සෙවෙනි සේයාවක් ඉස්නේ නම් (එකල්හි) මොහුගේ සිත දැන (මෙන්) නිරතුරුව ම සෙවන කරන්නේ ය.

3454. කුශලමූලයෙන් මෙහෙයන ලද්දේ දෙව්ලොවින් සැව පුණ්‍යකර්මවිපාකය හා යෙදුනේ බ්‍රාහ්මණයෙක් වන්නේ ය.

3455. මෙයින් කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

3456. ශාක්‍යකුලයෙහි වූ ගෞතම බුදුරජ තෙමේ සියල්ල දැන භික්ෂුසඞ්ඝයා මැද වැඩහිඳ (මොහු) එතදග්‍රස්ථානයෙහි තබන්නේ ය.

3457. දෙවියන් විසින් ද අසුරයන් විසින් ද ගන්ධර්වයන් විසින් ද සත්කාර කරණ ලද පිළින්දිවච්ඡ නම් බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

3458. එසේ ම හෙතෙමේ මහණුන් හට ද මෙහෙණින් හට ද ගිහියන් හට ද යන සියල්ලනට ප්‍රිය ව ආස්‍රව රහිතව වාසය කරන්නේය'' යි.

3459. මෙයින් සියක්දහස් වන කපෙහි කරණ ලද කර්මයාගේ විපාකය මට මෙහි දී දක්විය. දුනුදියෙන් මිදුනු හීවෙගය මෙන් මාගේ කෙලෙස් දැවී ය.

3460. නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි මා විසින් මැනැවින් කරණ ලද පුණ්‍යකර්මය ආශ්චර්ය යි. යම් පින්කෙතක පින්කම් කොට අචල වූ නිර්වාණපදයට පැමිණියෙම් වෙම් ද එහෙයිනි.

3461. යම් මාණවකයෙක් තෙම කිසිවක් නො අඩු වූ උතුම් දනක් දුන්නේ ද, (එහි) පලමු ප්‍රමුඛයා විය. ඒ දානයාගේ මේ විපාක යි.

3462. බුදුරජුන් කෙරෙහි ද ගණප්‍රධාන වූ සඞ්ඝයා කෙරෙහි ද ඡත්‍රයක් පුදා මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් අටක් අනුභව කරමි.

3463. ශීතොෂ්ණයන් නො දනිමි. දූලිකුණු නො තැවරේ. උවදුරු විපත් නැති වේ. හැමකල්හි පුදන ලද්දෙක් වෙමි.

3464. සුඛුමච්ඡවිකො හොමි විසදං හොති මානසං,
ඡත්තසතසහස්සානි භවෙ සංසරතො මම.

3465. සබ්බාලඞ්කාරයුත්තානි තස්ස කම්මස්ස වාහසා,
ඉමං ජාතිං ඨපෙත්වාන මත්ථකෙ ධාරයන්ති මෙ.

3466. කස්මා[1] ඉමාය ජාතියා නත්ථි මෙ ඡත්තධාරණා,
මම සබ්බං කතං කම්මං විමුත්තිඡත්තපත්තියා.

3467. දුස්සානි සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3468. සුවණ්ණවණ්ණො විරජො සප්පභාසො පතාපවා,
සිනිද්ධං හොති මෙ ගත්තං භවෙ සංසරතො මම.

3469. දුස්සසතසහස්සානි සෙතා පීතා ච ලොහිතා,
ධාරෙන්ති මත්ථකෙ මය්හං දුස්සදානස්සිදං ඵලං.

3470. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
සබ්බත්ථ පටිලභාමි තෙසං නිස්සන්දතො අහං.

3471. පත්තෙ සුගතෙ දත්වාන සඞ්ඝෙ ගණවරුත්තමෙ,
දසානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3472. සුවණ්ණථාලෙ මණිථාලෙ රජතෙ පි ච ථාලකෙ,
ලොහිතඞ්කමයෙ ථාලෙ පරිභුඤ්ජාමි සබ්බදා.

3473. අනුපද්දවො අනීති ච හොමි අපචිතො සදා,
ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස සයනස්ස ච.

3474. න විනස්සන්ති මෙ භොගා ඨිතචිත්තො භවාමහං,
ධම්මකාමො සදා හොමි අප්පක්ලෙසො අනාසවො.

3475. දෙවලොකෙ මනුස්සෙ වා අනුබන්ධා ඉමෙ ගුණා,
ඡායා යථාපි රුක්ඛස්ස සබ්බත්ථ න ජහන්ති මං.

3476. චිත්තබන්ධනසම්බද්ධා සුකතා වාසියො බහූ,
දත්වාන බුද්ධසෙට්ඨස්ස සඞ්ඝස්ස ච තථෙවහං,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3477. සූරො හොම'විසාරී ච වෙසාරජ්ජෙසු පාරමී,
ධිති විරියවා හොමි පග්ගහීතමනො සදා.

3478. කිලෙසච්ඡෙදනං ඤාණං සුඛුමං අතුලං සුචිං,
සබ්බත්ථ පටිලභාමි තස්ස නිස්සන්දතො අහං.

1. තස්මා, සයා.

3464-3465. සියුම් සිත් ඇත්තෙම් වෙමි. සිත පිරිසිදු වේ. භවයෙහි සැරිසරන්නා වූ මට මේ ජාතිය හැර (අනෙක් හැම ජාතියක දී ම) ඒ කර්මයාගේ බලයෙන් සියලු අලඞ්කාරයන්ගෙන් යුක්ත වූ සියක්දහසක් ඡත්‍ර මාගේ හිසට දරත්.

3466. ඉහාත්මයෙහි මාගේ ඡත්‍රධාරණයක් නැත්තේ මන්ද? මා විසින් කරණ ලද කර්ම සියල්ල විමුක්තිඡත්‍රලාභයට (=නිවන් ලැබීමට) හෙතු වූ බැවිනි.

3467. බුදුරජුන් කෙරෙහි ද ගණප්‍රධාන වූ සඞ්ඝයා කෙරෙහි ද වස්ත්‍ර දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් අටක් අනුභව කරමි.

3468. සුවණ්ණවණ්ණ වූයෙම් රජස් රහිත වූයෙම් ප්‍රභා සහිත වූයෙම් ප්‍රතාපවත් වූයෙම් වෙමි. භවයෙහි සැරිසරන්නා වූ මාගේ සිරුර සිනිඳු වේ.

3469. සුදුවත් වූ ද සහවත් වූ ද ලෙහෙවත් වූ ද සියක්දහසක් වස්ත්‍ර මාගේ මස්තකයෙහි දරත්. වස්ත්‍රදායකයාගේ මේ විපාක යි.

3470. කොසෙය්‍යවස්ත්‍රය කම්බල වස්ත්‍රය කොමුපිළිය කපුපිළිය යන මේ වස්ත්‍ර ඒ කර්මයාගේ ඵලයෙන් මම සියලු තන්හි දී ම ලබමි.

3471. බුදුරජුන් කෙරෙහි ද ගණප්‍රධාන වූ සඞ්ඝයා කෙරෙහි ද පාත්‍ර දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් දසයක් අනුභව කරමි.

3472. රන්තලි ද මිණිතලි ද රිදීතලි ද පියුම්රාමිණිමුවාතලි ද හැම කල්හි පරිභොග කරමි.

3473. උවදුරු රහිත වූයෙම් විපත් රහිත වූයෙම් හැම කල්හි (සියල්ලන් විසින්) පුදන ලදුයෙම් වෙමි. ආහාරපාන වස්ත්‍ර සයනාසන ලබන්නෙක් ද වෙමි.

3474. මාගේ භොගයෝ විනාශ නො වෙත්. මම නැවතුනා වූ සිත් ඇත්තෙම් වෙමි. හැම කල්හි ධර්මය කැමැති වෙමි. කෙලෙස් නැති වූයෙම් ආශ්‍රව රහිත වෙමි.

3475. දෙව්ලොව්හි ද මිනිස්ලොව්හි ද මෙකී ගුණයෝ මා අනුව ම ගියාහු ගසේ සෙවන (ගස නොහරින්නාක්) මෙන් සියලු තන්හි දී මා අතහැර නො දමන්නාහුය.

3476. මම විසිතුරු බන්ධනයන්ගෙන් බැඳුනු මැනවින් කළ බොහෝ පිහිය ද බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට හා එසේ ම සඞ්ඝයාට ද පුදා,

3477. සූර වූයෙම් සසල නො වූයෙම් විසාරදබැව්හි කෙළ පැමිණියෙම් වෙමි. හැම කල්හි (කෙලෙස් වසඟව යා නො දී) දැඩි කොට ගත් සිත් ඇත්තෙම් නුවණ හා වීර්‍ය්‍ය ඇත්තෙම් ද වෙමි.

3478. මම සියුම් වූ අතුල පිරිසිදු වූ කෙලෙස් සිඳීමේ නුවණ ද ඒ පුණ්‍යකර්ම බලයෙන් සියලු තන්හි දී ලබමි.

3479. අකක්කසෙ අඵරුසෙ සුඛොතෙ සන්ථකෙ බහූ,
පසන්නචිත්තො දත්වාන බුද්ධෙ සඞ්ඝෙ තථෙව ච.

3480. පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම,
කල්‍යාණචිත්තං විරියං ඛන්තිඤ්ච මෙත්තසත්ථකං.

3481. තණ්හාසල්ලස්ස ජිණ්ණත්තා පඤ්ඤාසත්ථං අනුත්තරං,
වජිරෙන සමං ඤාණං තෙසං නිස්සන්දතො ලභෙ.

3482. සූචියො සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3483. න සංසයො කඞ්ඛච්ඡෙදෙ අභිරූපො ච භොගවා,
තික්ඛපඤ්ඤො සදා හොමි සංසරන්තො භවාභවෙ.

3484. ගම්භීරං නිපුණං ඨානං අත්ථං ඤාණෙන පස්සයිං,
වජිරග්ගසමං ඤාණං හොති මෙ තමඝාතනං.

3485. නඛච්ඡෙදනෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3486. දාසිදාසෙ ගවස්සෙ ච භතකෙ ආරක්ඛකෙ බහූ[1],
නහාපිතෙ භත්තකෙ සූදෙ සබ්බත්ථෙව ලභාමහං.

3487. විධූපනෙ සුගතෙ දත්වා තාලවණ්ටෙ ච සොභනෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3488. සීතං උණ්හං න ජානාමි පරිළාහො න විජ්ජති,
දරථං නාභිජානාමි චිත්තසන්තාපනං මම.

3489. රාගග්ගි දොසමොහග්ගි මානග්ගි දිට්ඨිඅග්ගි ච,
සබ්බග්ගී නිබ්බුතා මය්හං තස්ස නිස්සන්දතො මම.

3490. මොරහත්ථෙ චාමරියො දත්වා සඞ්ඝෙ ගණුත්තමෙ,
උපසන්තකිලෙසො'හං විහරාමි අනඞ්ගණො.

3491. පරිස්සාවනෙ සුගතෙ දත්වා ධම්මකරුත්තමෙ[2],
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3492. සබ්බෙසං සමතික්කම්ම දිබ්බං ආයුං ලභාමහං,
අප්පසය්හො සදා හොමි චොරපච්චත්ථිකෙහි වා.

1. නාටකෙ බහූ, මජ්සං.    2. දත්වා සුගතෙ ධම්මකුත්තරෙ, ස්‍යා.

3479. බුදුරජුන් කෙරෙහි ද සඞ්ඝයා කෙරෙහි ද පහන්සිත් ඇත්තෙම් කොරොස් නො වූ රළු නො වූ තියුණු කළ බොහෝ අවි මැතැවින් දී,

3480-3481. මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි: කල්‍යාණ චිත්තය ද, වීර්‍ය්‍යය ද, ක්ෂාන්තිය ද, මෛත්‍රී අවිය ද, තණ්හානමැති හුල සිදුනා ලද බැවින් අනුත්තර වූ ප්‍රඥාශස්ත්‍රය වූ විදුරුසම නුවණ ද ඒ කුශලකර්ම බලයෙන් ලබමි.

3482. බුදුරජුන් කෙරෙහි ද සඞ්ඝයා කෙරෙහි ද හිදි (කටු) දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි:

3483. කුදුමහත් භවයෙහි සැරිසරන්නෙම් හැම කල්හි සැක නැත්තෙම් කුකුස් සිඳුනෙම් මනා රූ ඇත්තෙම් භොගසම්පත් ඇත්තෙම් තියුණු පැණවත් වූයෙම් ද වෙමි.

3484. ගැඹුරු වූ ද සියුම් වූ ද තැන් හා අරුත් නුවණින් දුටුවෙමි. මාගේ මොහඳුර නසන්නා වූ විදුරු අගක් මෙන් සියුම් නුවණ වේ.

3485. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද නියසැත් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි:

3486. බොහෝ දාසිදාස්සන් ද ගවයන් හා අශ්වයන් ද බැලයන් ද ආරක්ෂකයන් ද නැවැම්යන් ද මේවඩුවන් ද සූදයන් ද මම (භවයෙහි) සියලු තන්හිදී ම ලබමි.

3487. ශොභන වූ විජිනිපත් ද (තල්පතින් කළ) වටාපත් ද බුදුරජුන් කෙරෙහි ද (උතුම් සඟගණ කෙරෙහි ද දී) මාගේ කර්මයට සුදුසු වූ අනුසස් අටක් අනුභව කරමි:

3488. ශීතොෂ්ණයන් නො දනිමි. (සිරුරෙහි හෝ සිතෙහි) දාහයක් නැත. මාගේ කාය චිත්ත සන්තාපකර දරථයක් නො දනිමි.

3489. මාගේ ඒ කුශලකර්මයාගේ විපාකයෙන් රාගාග්නිය ද්වෙෂා-ග්නිය මොහාග්නිය මානාග්නිය දෘෂ්ට්‍යග්නිය යන සියලු අග්නීහු නිවී ගියහ.

3490. මොණරපියාපත් ද, සෙමෙරවලිග ද, බුදුරජුන් කෙරෙහි හා උතුම් සඟගණ කෙරෙහි දී මම සන්හිඳුනු කෙලෙස් ඇත්තෙම් කෙලෙස් රහිත ව වෙසෙමි.

3491. බුදුරජුන් කෙරෙහි හා උතුම් සඟගණ කෙරෙහි පෙරහන් දී මාගේ කර්මයට සුදුසු වූ පඤ්චාංසංසයක් අනුභව කරමි:

3492. මම සෙසු සියල්ලන්ගේ ආයුෂ ඉක්මවා දිව්‍යමය ආයුෂ ලබමි. හැමකල්හි සොරුන් විසින් හෝ පසමිතුරන් විසින් හෝ බලයෙන් මැඩලිය නොහෙන්නේ වෙමි.

3493. සත්ථෙන වා විසෙන වා විහෙසම්පි න කුබ්බතෙ,
අන්තරා මරණං නත්ථි තෙසං නිස්සන්දතො මම.

3494. තෙලධරෙ[1] සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3495. සුචාරුරූපො සුගන්ධො[2] සුසමුග්ගතමානසො,
අවික්ඛිත්තමනො හොමි සබ්බාරක්ඛෙහි රක්ඛිතො.

3496. සූචිඝරෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3497. චෙතොසුඛං කායසුඛං ඉරියාපථජං සුඛං,
ඉමෙ ගුණෙ පටිලභාමි[3] තස්ස නිස්සන්දතො අහං.

3498. අංසබද්ධෙ[4] ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3499. චෙතොඤ්ඤාණඤ්ච විඤ්ඤුම් සරාමි දුතියං භවං,
සබ්බත්ථ සුවච්ඡවී හොමි තස්ස නිස්සන්දතො අහං.

3500. කායබද්ධෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3501. සමාධීසු න කම්පාමි වසී හොමි සමාධිසු,
අභෙජ්ජපරිසො හොමි ආදෙය්‍යවචනො සදා.

3502. උපට්ඨිතසතී හොමි තාසො මය්හං න විජ්ජති,
දෙවලොකෙ මනුස්සෙ වා අනුබන්ධා ඉමෙ ගුණා.

3503. ආධාරකෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චවණ්ණෙහි දයාදෙ[5] අචලො හොමි කෙනචි.

3504. යෙ කෙචි මෙ සුතා ධම්මා සතිඤාණප්පබොධනා,
ධතා මෙ න විනස්සන්ති භවන්ති සුවිනිච්ඡිතා.

3505. භාජනෙ පරිභොගෙ ච දත්වා බුද්ධෙ ගණුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3506. සොණ්ණමයෙ මණීමයෙ අථො පි ඵලිකාමයෙ,
ලොහිතඞ්කමයෙ චෙව ලභාමි භාජනෙ අහා.

---

1. තෙලධාරෙ, මජසං. 2. සුභද්දො, මජසං 3. පටිලභෙ, මජසං.
4. අංසබන්ධෙ, මජසං. 5. පඤ්චවණ්ණෙ භයාභාවෙ, මජසං.

3493. අවියකින් හෝ විසකින් හෝ වෙහෙසකුදු නො කෙරේ. ඒ පුණ්‍යවිපාකයෙන් මාගේ (නියමිත ආයුෂ නො ගෙවී) අතරතුර මරණයකුදු නැත.

3494. බුදුරජුන් කෙරෙහි ද, උතුම් සඟගණ කෙරෙහි ද තෙල්ගුලා දී මාගේ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි.

3495. මනහර රූ ඇත්තෙම් මනොඥ හඬ ඇත්තෙම් මැනවින් සමාහිගත සිත් ඇත්තෙම් නො කැළඹුනු සිත් ඇත්තෙම් සියලු ආරක්ෂාවන්ගෙන් රැකුනෙම් ද වෙමි.

3496. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද කිදිගුලාවක් දී මාගේ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි.

3497. චිත්තසුඛය ද කායසුඛය ද ඉරියාපථ සුඛය ද යන මේ ත්‍රිවිධගුණයන් ඒ පුණ්‍යඵලයෙන් මම ලබමි.

3498. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද අස් (=අංස)කඩ දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි.

3499. චෙතොපරියඥාණය (පරසිත් දන්නා නුවණ) ලබමි. දෙවෙනි භවය ද සිහි කෙරෙමි. මම ඒ පුණ්‍යඵලයෙන් හැම භවයෙහි ම මනා ජිවි ඇත්තෙම් වෙමි.

3500. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද කාබාන් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් සයක් ලබමි.

3501. සමාධීන්හි කම්පා නො වෙමි. (එසේ ම) සමාධීන්හි වශී වෙමි. නො බෙදුනු පිරිස් ඇත්තෙම් වෙමි. හැමකල් අනුන් විසින් පිළිගත යුතු වචන ඇත්තෙම් වෙමි.

3502. එළඹ සිටි සිහි ඇත්තෙම් වෙමි. මට තැති ගැන්මක් නැත. මේ ගුණයෝ දෙව්ලොව හෝ මිනිස්ලොව හෝ මා අනුව ම එති.

3503-3504. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද (පාත්‍ර තබන) ආධාරකයන් දී පස්අඟුරකින් ලත් දෘඪද ඇත්තෙම් හෙවත් අනුසස් පසක් ලද්දෙම් වෙමි: කිසිවකින් කම්පා නො වෙමි. මා විසින් අසන ලද යම් කිසි ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයෝ සිහිය හා නුවණ පොබයන්නෝ වෙති. සිත්හි ලා දරණ ලද්දේ නො නැසෙත්. මැනවින් නිශ්චිත වූවාහු වෙත්.

3505. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද පරිභොග භාජනයන් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි.

3506. මම රන්මුවා වූ ද මිණිමුවා වූ ද යලි පිළිමිණිමුවා වූ ද පියුම්රාමිණිමුවා වූ ද බඳුන් ලබමි.

3507. භරියා දාසදාසී ච හත්ථස්සරථපත්තිකා,
ඉත්ථී පතිබ්බතා චෙව පරිභොගානි සබ්බදා.

3508. විජ්ජා මන්තපදෙ චෙව විවිධෙ ආගමෙ බහූ,
සබ්බං සිප්පං නිසාමෙමි පරිභොගානි සබ්බදා.

3509. ථාලකෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3510. සොවණ්ණමයෙ මණිමයෙ අථොපි ඵලිකාමයෙ,
ලොහිතඞ්කමයෙ චෙව ලභාමි ථාලකෙ අහං.

3511. අසත්ථකෙ[1] ඵලමයෙ අථො පොක්ඛරපත්තකෙ,
මධුපානකසංඛෙ ච ලභාමි ථාලකෙ අහං.

3512. වත්තෙ ගුණෙ පටිපත්ති ආචාරකිරියාසු ච,
ඉමෙ ගුණෙ පටිලභෙ තස්ස නිස්සන්දතො අහං.

3513. භෙසජ්ජං සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
දසානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3514. ආයුවා බලවා වීරො වණ්ණවා යසවා සුඛී,
අනුපද්දවො අනීති ච හොමි චාපචිතො[2] සදා,
න මෙ පියවියොගත්ථි තස්ස නිස්සන්දතො මම.

3515. උපාහනෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3516. හත්ථියානං අස්සයානං සිවිකා සන්දමානිකා,
සට්ඨිසතසහස්සානි පරිවාරෙන්ති මං සදා.

3517. මණිමයා කම්බලිකා[3] සොවණ්ණරජතපාදුකා,
නිබ්බත්තන්ති පදුද්ධාරෙ භවෙ සංසරතො මම.

3518. නියාමං පතිධාවන්ති ආගුආචාරසොධනං,[4]
ඉමෙ ගුණෙ පටිලභෙ තස්ස නිස්සන්දතො අහං.

3519. පාදුකෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ඉද්ධිපාදුකමාරුය්හ විහරාමි යදිච්ඡකං.

3520. උදපුඤ්ඡනකෙ චොළෙ[5] දත්වා බුද්ධෙ ගණුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3521. සුවණ්ණවණ්ණො විරජො සප්පභාසො පතාපවා,
සිනිද්ධං හොති මෙ ගත්තං රජොජල්ලං න ලිම්පති,
ඉමෙ ගුණෙ පටිලභෙ තස්ස නිස්සන්දතො අහං.

---

1. අසත්ථකෙ, මජසං. අස්සට්ඨකෙ, සයා. 2 අපචිතො, මජසං.
3. තම්බමයා, මජසං. 4. නියමං පටිධාවන්ති ආචාරගුණසොධනං, සීමු.
5. උදකපුඤ්ඡනචොළෙ, මජසං.

3507. භාජනීයවෝ ද දුසිදූසයෝ ද හස්ති අශ්ව රථ පාබල සේනාග ද පතිව්‍රතාස්ත්‍රීහු ද හැම කල්හි පරිභොග වස්තූහු වෙත්.

3508. විද්‍යාවන්ට ද මන්ත්‍රපදයනට ද විවිධ වූ ආගමධර්මයනට ද සියලු ශිල්පයනට ද කන් යොමු කරමි. එ සිප්හු හැම කල්හි පරිභොගයෝ වෙත්.

3509. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද තලි දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි:

3510. රුවන්මුවා වූ ද මිණිමුවා වූ ද යළි පිළිමිණිමුවා වූ ද පියුම්-රාමිණිමුවා වූ ද තලි මම ලබමි.

3511. ලබුපලමුවා තලි ද යළි පොකුරුපත් ද මිහි බොන සක් ද යන තලි මම ලබමි.

3512. වතාවත් ගුණෙහි ද ආචාරක්‍රියාවන්හි ද පිළිපැදුම යන මේ ගුණ ඒ පුණ්‍යකර්ම බලයෙන් මම ලබමි.

3513. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද බෙහෙත් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් දසයක් ලබමි.

3514. ආයු ඇත්තෙමි බල ඇත්තෙමි වීරගුණ ඇත්තෙමි සිව්පැහැ ඇත්තෙමි කීර්තිමත් වූයෙමි සැප ඇත්තෙමි උවදුරු රහිතයෙමි විපත් රහිතයෙමි හැම කල්හි (අනුන් විසින්) පුදනු ලදුයෙමි වෙමි. ඒ පුණ්‍යකර්මයාගේ ඵලයෙන් මට ප්‍රියවිප්‍රයොග දුකෙක් නැත.

3515. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද පාවහන් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි:

3516. හස්ති අශ්ව යාන ද දෝලා ද පල්ලැක්කි දූසි මේ යානයෝ සැටලක්ෂයක් මා හැම කල්හි පිරිවරත්.

3517. භවයෙහි සැරිසරන්නා වූ මට පියවරක් පාසා මිණියෙන් කරණ ලද්දු වූ ද කම්බිලි යෙන් කරණ ලද්දු වූ ද රනින් කරණ ලද්දු වූ ද රිදියෙන් කරණ ලද්දු වූ ද පාදුකාවෝ (=පාවහන්) නිපදිත්.

3518. ඔහු කර්මනියාමය අනුව පවිටු ආචාරයන්ගේ ශොධන සඳහා පවතිත්. ඒ පුණ්‍යබලයෙන් මම මේ ගුණ ලබමි.

3519. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද මිරිවැඩි දී කැමැති තාක් සෘද්ධිමය මිරිවැඩි නැඟී වෙසෙමි.

3520. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද දියපිස්නා දී මාගේ කර්මයට සුදුසු වූ අනුසස්පසක් ලබමි.

3521. සවර්ණවර්ණ වූ රජස් රහිත වූ ප්‍රභාසහිත වූ ප්‍රතාපවත් වූ මාගේ සිරුර සිනිඳු ද වේ. දූලිකුණු ද නො තැවරේ. ඒ පුණ්‍යඵලයෙන් මම මේ ගුණ ලබමි.

3522. කත්තරදණ්ඩෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණුත්තමෙ,
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3523. පුත්තා මය්හං බහූ හොන්ති තාසො මය්හං න විජ්ජති,
අප්පසය්හො සදා හොමි සබ්බාරක්ඛෙහි රක්ඛිතො,
ඛලිතම්පි[1] න ජානාමි අභන්තං මානසං මම.

3524. ඔසධං අඤ්ජනං දත්වා බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3525. විසාලනයනො හොමි සෙතපීතො ච ලොහිතො,[2]
අනාවිලපසන්නක්ඛො සබ්බරොගවිවජ්ජිතො.

3526. ලභාමි දිබ්බනයනං පඤ්ඤචක්ඛුං අනුත්තරං,
ඉමෙ ගුණෙ පටිලභෙ තස්ස නිස්සන්දතො අහං.

3527. කුඤ්චිකෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ධම්මද්වාරවිවරණං ලභාමි ඤාණකුඤ්චිකං.

3528. කුඤ්චිකානං ඝරෙ දත්වා බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
ද්වානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම,
අප්පකොධො අනායාසො සංසරන්තො භවෙ අහං.

3529. ආයොගෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3530. සමාධිසු න කම්පාමි වසී හොමි සමාධිසු,
අභෙජ්ජපරිසො හොමි ආදෙය්‍යවචනො සදා,
ජායන්ති භොගසම්පත්ති භවෙ සංසරතො මම.

3531. ධූමනෙත්තෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3532. සති මෙ උජුකා හොති සුසම්බන්ධා නහාරවො,[3]
ලභාමි දිබ්බනයනං[4] තස්ස නිස්සන්දතො අහං.

3533. දීපට්ඨානෙ[5] ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
තීණානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3534. ජාතිමා අඞ්ගසම්පන්නො පඤ්ඤවා බුද්ධිසම්මතො,[6]
ඉමෙ ගුණෙ පටිලභෙ තස්ස නිස්සන්දතො අහං.

3535. තුම්බකෙ ච කරණ්ඩෙ ච දත්වා බුද්ධෙ ගණුත්තමෙ,
දසානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3536. සදා ගුත්තො[7] සුඛසමඞ්ගී මහායසවා තථා ගතී,
විපත්තිවිගතො[8] සුඛුමාලො සබ්බීතිපරිවජ්ජිතො.

---

1. ඛලිතං මං, සීමු. 2. සෙතපීතසලොහිතො, සීමු. 3. නහාරවො, මජසං.
4. දිබ්බසයනං, ස්‍යා. 5. දීපධාරෙ, මජසං. 6. බුද්ධසම්මතො, මජසං.
7. සුපුත්තො, මජසං. 8 විහතත්තිගතො, ස්‍යා.

3522. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද සැරයටි දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් සයක් ලබමි.

3523. මට බොහෝ පුත්‍රයෝ වෙත්. මාගේ තැති ගැන්මෙක් නැත. සියලු ආරක්ෂාවන්ගෙන් රැකුනෙමි හැම කල්හි බලාත්කාරයෙන් නො මැඩලිය හැක්කෙක් වෙමි. පැකිලීමකුත් නො දනිමි. මාගේ සිත භ්‍රාන්ත නො වෙයි.

3524. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ඔසු අඳුන් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් අටක් අනුභව කරමි.

3525. සුදුවන් වූ ද කහවන් වූ ද ලෙහෙවන් වූ ද මහත් ඇස් ඇත්තෙම් වෙමි. සියලු රෝගයන්ගෙන් වෙන් වූ නො කැලැඹුනු පහන් ඇස් ඇත්තෙම් වෙමි.

3526. අනුත්තර වූ දිවැස ද පැණැස ද ලබමි. මම ඒ පුණ්‍යඵලයෙන් මේ ගුණ ලබමි.

3527. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද යතුරු දී දහම් දොර හරණා නුවණ නැමැති කෙසිදු ලබමි.

3528. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද කෙසිගුලා දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් දෙකක් අනුභව කරමි. මම භවයෙහි සැරිසරන්නෙම් ක්‍රොධ රහිතයෙම් ආයාස රහිතයෙම් ද වෙමි.

3529. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ආයොගපට්ට (එලි සිපිත පුවරු හෝ පටි) දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි.

3530. සමාධීන්හි කම්පා නො වෙමි. සමාධීන්හි වසඟව වෙසෙමි. නො බිඳෙන පිරිස් ඇත්තෙම් වෙමි. හැම කල්හි පිළිගත යුතු වචන ඇත්තෙම් ද වෙමි. භවයෙහි සැරිසරන්නා වූ මට භොගසම්පත් උපදී.

3531. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද දුම්නල දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි.

3532. මාගේ සිහිය සෘජු වේ. මැනවින් සම්බන්ධ වූ නහර ඇත්තේ ඒ පුණ්‍යඵලයෙන් මම දිවැස් ලබමි.

3533. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද පහන්මලා දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් තුණක් අනුභව කරමි.

3534. ජාතිමත් වෙමි. සම්පූර්ණ වූ ශරීරාවයව ඇත්තෙම් වෙමි. බුද්ධිසම්මත ප්‍රඥාඇත්තෙම් වෙමි. ඒ පින්බෙලෙන් මේ ගුණ ලබමි.

3535. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද (ධාන්‍යමාන) ලාස්බඳුන් ද කරඬු ද දී මාගේ ඒ කර්මයට සුදුසු දසඅනුසසක් ලබමි.

3536. හැම කල්හි ආරක්ෂා සහිත යෙමි සැපයෙන් යුක්තයෙමි මහත් වූ කීර්ති ඇත්තෙම් එසේ ම මනා වූ ගති ඇත්තෙම් විපත්තීන්ගෙන් වෙන් වූයෙමි සියුමැලි වූයෙමි සියලු උවදුරු බැහැර කරණ ලදුයෙමි.

3537. විපුලෙ ච ගුණෙ ලාභී සමාචවරණං[1] මම,
සුවිවජ්ජිතඋබ්බෙගො තුම්බකෙ ච කරණ්ඩකෙ.

3538. ලභාමි චතුරො වණ්ණෙ හත්ථස්සරතනානි ච,[2]
තානි මෙ න විනස්සන්ති තුම්බදානෙ ඉදං ඵලං.

3539. අඤ්ජනනාළියො[3] දත්වා බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3540. සබ්බලක්ඛණසම්පන්නො ආයුපඤ්ඤාසමාහිතො,
සබ්බායාසවිනිමුත්තො කායො මෙ හොති සබ්බදා.

3541. තනුධාරෙ සුනිසිතෙ සඞ්ඝෙ දත්වාන පිප්ඵලෙ,
කිලෙසකන්තනං ඤාණං ලභාමි අතුලං සුචිං.

3542. සණ්ඩාසෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
කිලෙසලුඤ්චනං[4] ඤාණං ලභාමි අතුලං සුචිං.

3543. නත්ථුකෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3544. සද්ධං සීලං හිරිඤ්චාපි අථො ඔත්තප්පියං ගුණං,
සුතං චාගඤ්ච ඛන්තී ච පඤ්ඤං මෙ අට්ඨමං ගුණං.

3545. පීඨකෙ සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3546. උච්චෙ කුලෙ පජායාමි මහාභොගො භවාමහං,
සබ්බෙ මං අපචායන්ති කිත්ති අබ්භුග්ගතා මම.

3547. කප්පසතසහස්සානි පල්ලඞ්කා චතුරස්සකා,
පරිවාරෙන්ති මං නිච්චං සංවිභාගරතො අහං.

3548. භිසියො සුගතෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3549. සමගත්තො අපචිතො[5] මුදුකො චාරුදස්සනො,
ලභාමි ඤාණපරිවාරං භිසිදානස්සිදං ඵලං.

3550. තූලිකා විකතිකායො කට්ටිස්සා චිත්තකා බහූ,
වරපොත්ථකෙ කම්බලෙ ච ලභාමි විවිධෙ අහං.

3551. පාවාරිකෙ ච මුදුකෙ මුදුකාජිනවෙණියො,
ලභාමි විවිධත්ථාරෙ භිසිදානස්සිදං ඵලං.

1. සමාචචලනා, මජසං. 2. හත්ථිස්සරතනානි ච, මජසං.
3. මලහරණියො, මජසං. හත්ථිලිඞ්ගකෙ, සතා. PTS.
4. කිලෙසභඤ්ජනං, මජසං. 5. සමත්තගත්තොපචිතො, මජසං.

3537-3538. මහත් ගුණලාභී වූයෙම් සම වූ පා ඇත්තෙම් මාගේ මැනවින් බැහැර කළ සසල ගති ද වෙයි. මිණුම් බඳුන් ද කරඬු ද වර්ණ සතරකින් යුත් ශස්ත්‍රශ්වරත්නයන් ද ලබමි. මාගේ ඒ සම්පත් විනාශ නො වේ. තුම්බ නම් වූ ධාන්‍යමාණභාජනදානයෙහි මේ විපාක යි.

3539. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද අඳුන්ගුලා දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි.

3540. සියලු ලක්ෂණයන්ගෙන් යුක්තයෙම් ආයුෂයෙන් හා ප්‍රඥාවෙන් ද සමන්විතයෙම්, සියලු ආයාසයන්ගෙන් වෙන් වූ කයක් හැම කල්හි මට ඇත්තේ ය.

3541. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද සියුම් දහර ඇති මුවහත් වූ කතුරු දී කෙලෙස් සිඳුනා වූ පිරිසිදු වූ අතුල්‍ය නුවණ ලබමි.

3542. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද හඬු දී අතුල්‍ය වූ පිරිසිදු වූ කෙලෙස් සිඳුනා නුවණ ලබමි.

3543. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද තශ්‍යද්‍රව්‍ය දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අටඅනුසසක් ලබමි.

3544. ශ්‍රද්ධාව ද ශීලය ද ලජ්ජාව ද භය ද ශ්‍රැතය ද ත්‍යාගය ද ක්ෂාන්තිය ද අටවැනි වූ ප්‍රඥාව ද යන මොහු යි.

3545. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද පුටු දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් ලබමි.

3546. මම උසස් කුලයෙහි උපදිමි. මහත් භොග ඇත්තෙම් වෙමි. සියල්ලෝ මට ගරුබුහුමන් කෙරෙත්. මාගේ කීර්ති තොමෝ උස්ව පැන නැංගා ය.

3547. කල්ප සියදහසක් මුළුල්ලෙහි චතුරශ්‍රක පයඞ්කයෝ නිතර මා පිරිවරත්. මම දානසංවිභාගයෙහි යෙදුනෙම් ද වෙමි.

3548. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද බිසි දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් අනුභව කරමි.

3549. සම වූ සිරුරු ඇත්තෙම් වෙමි. (බොහෝ දෙනා විසින්) පුදන ලද්දෙම් වෙමි. මෘදු සිරුරු ඇත්තෙම් වෙමි. මනහර දකුම් ඇත්තෙම් වෙමි. නැණවත් පිරිවර ද ලබමි. බිසිදානෙහි මේ විපාක යි.

3550. මම පුලුන් පිරවූ මෙට්ට ද සිංහාදීන්ගේ රූ ඇති පලස් ද මැණික් ඇල්ලූ පටවස්ත්‍ර ද වියමනෙන් විසිතුරු එළලොම් ඇතිරි ද නියඳින් කළ උතුම් වස්ත්‍ර ද නානාවිධකම්බල ද ලබමි.

3551. මොලොක් උතුරුසළු ද මෘදු අඳුන්දිවිසම් ද නොයෙක් ඇතුරුණු ද ලබමි. භිසිදානයෙහි මේ විපාක යි.

3552. යතො සරාමි අත්තානං යතො පත්තො'ස්මි විඤ්ඤුතං
අතුච්ඡො ඛාණමක්ඛො'ම්හි භිසිදානස්සිදං ඵලං.

3553. බිම්බොහනෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3554. උණ්ණිකෙ පදුමකෙ ච අථො ලොහිතචන්දනෙ,
බිම්බොහනෙ උපධෙමි[1] උත්තමඞ්ගං සදා මම.

3555. අට්ඨඞ්ගිකෙ මග්ගවරෙ සාමඤ්ඤෙ චතුරො ඵලෙ,
තෙසු ඤාණං උපනෙත්වා[2] විහරෙ සබ්බකාලිකං.

3556. දානෙ දමෙ සඤ්ඤමෙ ච අප්පමඤ්ඤාසු රූපිසු,
තෙසු ඤාණං උපනෙත්වා[3] විහරෙ සබ්බකාලිකං.

3557. වත්තෙ ගුණෙ පටිපත්තිආචාරකිරියාසු ච,
ඤාණං උපදහිත්වාන විහරෙ සබ්බදා අහං.

3558. චඞ්කමෙ වා පධානෙ වා විරියෙ බොධිපක්ඛියෙ,
තෙසු ඤාණං උපනෙත්වා විහරාමි යථිච්ඡකං.

3559. සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා,
තෙසු ඤාණං උපනෙත්වා විහරාමි සුඛං අහං.

3560. ඵලපීඨෙ[4] ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3561. සොණ්ණමයෙ මණිමයෙ දන්තසාරමයෙ බහූ,
පල්ලඞ්කසෙට්ඨෙ වින්දාමි ඵලපීඨස්සිදං ඵලං.

3562. පාදපීඨෙ ජිනෙ දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
ඡානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3563. ලභාමි බහුකෙ යානෙ පාදපීඨස්සිදං ඵලං,
දාසිදාසා ච භරියා යෙ චඤ්ඤෙ අනුජීවිනො,
සම්මා පරිචරන්ති මං පාදපීඨස්සිදං ඵලං.

3564. තෙලාබ්භඤ්ජනෙ[5] දත්වා සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3565. අබ්‍යාධිතා රූපවතා ඛිප්පං ධම්මනිසන්තිතා,
ලාභිතා අන්නපානස්ස ආයුපඤ්චමකං මම.

3566. සප්පිතෙලඤ්ච දත්වාන සඞ්ඝෙ ගණවරුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

---

1. බිම්බොහනෙ උපාධෙමි, මජසං.
2. තෙසු ඤාණං උපපාදෙත්වා, මජසං.
3. උපපාදෙත්වා, මජසං.
4. පලාලපීඨෙ, සීමු.
5. තෙලඅබ්භඤ්ජනෙ, මජසං.

3552. යම් කලක පටන් තමා සිහි කෙරෙම් ද, යම් කලක පටන් නුවණැති බවට පැමිණියෙම් ද (එතැන් පටන් ම) නො සිස් වූයෙම් ධ්‍යාන නමැති මඤ්චය ඇත්තෙම් හෙවත් ධ්‍යානලාභී වෙමි. භිසිදානයාගේ මේ විපාක යි.

3553. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද කත්වසිත් (=කොට්ට) දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් සයක් අනුභව කරමි.

3554. ලොම් පිරවූ ද පියුම්රොන් පිරවූ ද රත්සඳුන් පුඹුළු පිරවූ ද බිම්බොහන (=කොට්ට) හැම ද මා හිස තබමි.

3555. අෂ්ටාඞ්ගික වූ උතුම් මාර්ගයනට ද සතර ශ්‍රාමණ්‍යඵලයනට ද (පැමිණ) එහි හැමකල්හි ප්‍රත්‍යවෙක්‍ෂාඥානය එලවා වෙසෙමි.

3556. දීමෙහි ද (කායචිත්ත) දමථයෙහි ද සංයමයෙහි හෙවත් සංහුන්බව්හි ද අප්‍රමාණ්‍යධර්ම(සිවුබඹවිහරණ)යන්හි ද රූපාවචර ධ්‍යාන-යන්හි ද යන තෙල ධර්මයන්හි හැමකල් නුවණ මෙහෙයා වෙසෙමි.

3557. මම ව්‍රතාවත්හි ද ගුණයන්හි ද පිළිවෙත්හි ද ආචාරක්‍රියාවන්හි ද හැමකල් නුවණ පිහිටුවා වෙසෙමි.

3558. සක්මන්හි ද පදහන්වැරෙහි ද බෝපැකිදහම්හි ද යන මෙහි නුවණ එලවා කැමැති සේ වෙසෙමි.

3559. ශීල සමාධි ප්‍රඥ අනුත්තරවිමුක්ති යන තෙල දහම්හි නුවණ මෙහෙයා මම සුවසේ වෙසෙමි.

3560. ඵලකපීඨ බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් දෙකක් ලබමි.

3561. රත්මුවා මිණිමුවා වූ ද දළමුවා හරමුවා වූ ද බොහෝ උතුම් පයර්‍යඞ්කයන් ලබමි. ඵලපීඨදානයාගේ මේ විපාක යි.

3562. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද පාපුටු දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් දෙකක් ලබමි.

3563. බොහෝ යානයන් ලබමි. පාපුටු දනෙහි මේ ද විපාකයෙකි. දාසිදස්සෝ ද බිරියෝ ද තදන්‍ය අනුජීවීහු ද මට මැනවින් පරිචරණය කෙරෙත්. මේ ද පාපුටු දනෙහි විපාකයෙකි.

3564. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ඇඟ ගල්වන තෙල් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් ලබමි.

3565. මාගේ නීරොග බව ද රූමත් බව ද වහා ධර්මය වැටහෙන බව ද ආහාරපානලාභී බව ද ආයුපඤ්චමකය (ආයු-වර්ණ-සැප-බල-ප්‍රඥ) ද වෙයි.

3566. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ගිතෙල් ද තලතෙල් ද දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් ලබමි.

3567. ථාමවා රූපසම්පන්නො පහට්ඨතනුජො සදා,
අබ්‍යාධි විසදො හොමි සප්පිතෙලස්සිදං ඵලං.

3568. මුඛසොධනකං දත්වා බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
පඤ්චානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3569. විසුද්ධකණ්ඨො මධුරස්සරො කාසසාසවිවජ්ජිතො,
උප්පලගන්ධො මුඛතො උපවායති මෙ සදා.

3570. දධිං දත්වාන සම්පන්නං බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
භුඤ්ජාමි අමතං විතතං[1] වරං කායගතාසතිං.

3571 වණ්ණගන්ධරසොපෙතං මධුං දත්වා ජිනෙ ගණෙ,
අනූපමං අතුලියං පිවෙ මුත්තිරසං අහං.

3572. යථාභූතං රසං දත්වා බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
චතුරො ඵලෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3573. අන්නං පානඤ්ච දත්වාන බුද්ධෙ සඞ්ඝෙ ගණුත්තමෙ,
දසානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3574. ආයුමා බලවා ධීරො වණ්ණවා යසවා සුඛී,
ලාභී අන්නස්ස පානස්ස සූරො පඤ්ඤාණවා සදා,
ඉමෙ ගුණෙ පටිලභෙ සංසරන්තො භවෙ අහං.

3575. ධූපං දත්වාන සුගතෙ සඞ්ඝෙ ගණවරුත්තමෙ,
දසානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම.

3576. සුගන්ධදෙහො යසවා සීඝපඤ්ඤො ච කිත්තිමා,
තික්ඛපඤ්ඤො භූරිපඤ්ඤො හාසගම්භීරපඤ්ඤවා.

3577. වෙපුල්ලජවනපඤ්ඤො සංසරන්තො භවාභවෙ,
තස්සෙව වාහසා'දානි පත්තො සන්තිසුඛං සිවං.

3578. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3579. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3580. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පිළින්දිවච්ඡො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පිළින්දිවච්ඡත්ථෙරස්ස අපදානං පඨමං.**

---

1. භත්තං, මජසං.

3567. හැම කල්හි බල ඇත්තෙම් රූමත් වූයෙම් ඔදවැඩිසිරුර ඇත්තෙම් නීරෝග ද පැහැපත් ද වෙමි. ගිතෙල් හා තලතෙල් දීමෙහි මේ විපාක යි.

3568. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද මුවදෝනා ඔසුවක් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් පසක් ලබමි.

3569. පිරිසිදු කණ්ඨය (=උගුර) ඇත්තෙම් මිහිරි සවර ඇත්තෙම් කාශශ්වාසාදියෙන් තොර වෙමි. හැමකල්හි මාගේ මුවින් උපුල්මල් සුවඳ විහිදේ.

3570. බුදුරජුන් කෙරෙහි ද ගණපාමොක් සඟගණ කෙරෙහි ද සමෘද්ධ වූ දිහි දී උතුම් වූ කායගතාසති සඞ්ඛ්‍යාත අමෘත ධනය අනුභව කරමි.

3571. බුදුරජුන් කෙරෙහි ද සඟගණ කෙරෙහි ද වර්ණගන්ධරසයෙන් යුත් මී දී මම අනුපම වූ අතුල්‍ය වූ විමුක්තිරසය බොමි.

3572. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ඵලයුෂාදි-ප්‍රකෘති රසයක් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ (සෝවත් ආදි) සිව් ඵලයන් අනුභව කරමි.

3573. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද ආහාර පාන දී මාගේ ඒ කර්මයට සුදුසු වූ දස අනුසසක් අනුභව කරමි.

3574. මම ආයු ඇත්තෙම් බල ඇත්තෙම් නුවණැත්තෙම් සිවිපැහැ ඇත්තෙම් යසස් ඇත්තෙම් සැප ඇත්තෙම් අංහාරපාන ලබන්නෙම් පැණ ඇත්තෙම් ශූරයෙම් ද වෙමි. හැමකල්හි භවයෙහි සැරි සරන්නෙම් මේ ගුණ ලබමි.

3575. බුදුරජුන් කෙරෙහි ද උතුම් සඟගණ කෙරෙහි ද (සුවඳ) දුම් දී මාගේ ඒ කර්මයට සුදුසු වූ දසඅනුසසක් ලබමි.

3576-3577. මම කුදුමහත් භවයෙහි සැරි සරන්නෙම් සුවඳවත් සිරුරු ඇත්තෙම් කීර්තිමත් වූයෙම් යශස් ඇත්තෙම් ශීඝ්‍ර තීක්ෂණ භූරි හාසු ගම්භීර ප්‍රඥ ඇත්තෙම් විපුල ජවන ප්‍රඥ ඇත්තෙම් ඒ පුණ්‍යකර්ම බලයෙන් ම දූන් නිර්වාණසඞ්ඛ්‍යාත ශාන්තිසුඛයට පැමිණියෙම් ද වෙමි.

3578. ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේගේ සමීපයට මාගේ යහපත් පැමිණීමෙක් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. මා විසින් බුදුරජාණන් වහන්සේගේ සස්න කරණ ලදි.

3579. මා විසින් ක්ලේශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. හස්තිරාජයකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

3580. සිව්පිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද මා විසින් සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේ ආයුෂ්මත් පිළින්දිවච්ඡ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

**පිළින්දිවච්ඡස්ථවිරාවදානය පළමුවැනි යි.**

# 391. සෙලත්ථෙරාපදානං

3581. නගරෙ හංසවතියා වීථිසාමි අහොසහං,
මමං[1] ඤාතී සමානෙත්වා ඉදං වචනමබ්‍රවිං.

3582. බුද්ධො ලොකෙ සමුප්පන්නො පුඤ්ඤක්ඛෙත්තමනුත්තරං,[2]
ආසි සො[3] සබ්බලොකස්ස ආහුතීනං පටිග්ගහො.

3583. ඛත්තියා නෙගමා චෙව මහාසාලා ච බ්‍රාහ්මණා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3584. හත්ථාරොහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3585. උග්ගා ච රාජපුත්තා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3586. ආළාරිකා කප්පකා ච[4] න්හාපකා මාලකාරකා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3587. රජකා පෙසකාරා ච චම්මකාරා ච න්හාපිකා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3588. උසුකාරා භමකාරා චම්මිකා චෙව[5] තච්ඡකා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3589. කම්මාරා සොණ්ණකාරා ච තිපුලොහකරා තථා,
පසන්නචිත්තා සුමනා පූගධම්මං අකංසු තෙ.

3590. භතකා චෙටකා චෙව දාසකම්මකරා බහූ'
යථාසකෙන ථාමෙන පූගධම්මං අකංසු තෙ.

3591. උදහාරා කට්ඨහාරා කස්සකා තිණහාරකා,
යථාසකෙන ථාමෙන පූගධම්මං අකංසු තෙ.

3592. පුප්ඵිකා මාලිකා චෙව පණ්ණිකා ඵලහාරකා,
යථාසකෙන ථාමෙන පූගධම්මං අකංසු තෙ.

3593. ගණිකා කුම්භදාසී ච පූවිකා මච්ඡිකාපි ච,
යථාසකෙන ථාමෙන පූගධම්මං අකංසු තෙ.

3594. එථ සබ්බෙ සමාගන්ත්වා ගණං බන්ධාම එකතො,
අධිකාරං කරිස්සාම පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

1. මම, මජසං. 2. පුඤ්ඤක්ඛෙත්තො අනුත්තරො, මජසං.
3. ආසිසො, සීමු. ආධාරො PTS. 4. ආළාරකා ච සූද, සයා
5. චම්මකාරා ච, මජසං

# 391. සෙලසථවිරාපදානය

3581. මම හංසවතී නගරයෙහි වීථිස්වාමියෙක් (වීදියක ප්‍රධානයෙක්) වීමි. මාගේ ඥාතීන් කැඳවා මේ වචනය කීමි.

3582. අනුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍ර වූ බුදුරජ තෙම ලොව පහළ විය. හේ සකල ලොකයාගේ සත්කාරපූජාවට භාජන විය.

3583. කැත්හු ද නියම්ගම්වැස්සෝ ද බමුණුමහසල්හු ද පහන්සිත් ඇත්තාහු මුළුව අධිකාර කළහ.

3584. ඇතරුවෝ ද බලඇණිවල නියුක්තයෝ ද රිය පදවන්නෝ ද පයින් ගමන් කරන්නෝ ද යන මොහු පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3585. (ක්ෂත්‍රියනට දාව ශූද්‍රස්ත්‍රීන්ගේ කුසින් උපන්) උග්‍රයෝ ද ක්ෂත්‍රියයෝ (=රාජපුත්‍රයෝ) ද වෛශ්‍යයෝ ද බ්‍රාහ්මණයෝ ද පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3586. අරක්කැමියෝ ද සළුවඩන්නෝ ද දියවඩන්නෝ ද මල්කරුවෝ ද යන මොහු පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3587. රජකයෝ ද පෙසෙරු ද සොම්මරු ද කරණැවැමියෝ ද යන ඔහු පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3588. හීවඩුවෝ ද ලියනවඩුවෝ ද සොම්මරු ද ලීවඩුවෝ ද යන ඔහු පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3589. එසේම කඹුරෝ ද රන්කරුවෝ ද ඊයම්වැඩ කරන්නෝ ද ලෝකරුවෝ ද යන ඔහු පහන්සිත් ඇත්තාහු සොම්නස් වූවාහු මුළුව අධිකාර කළහ.

3590. බැලයෝ ද ගැත්තෝ ද යන බොහෝ දස් කම්කරුවෝ තමන්ගේ බලපමණින් මුළුව අධිකාර කළහ.

3591. දිය ගෙණෙන්නෝ ද දර ගෙණෙන්නෝ ද ගොවියෝ ද තණ-ගෙණෙන්නෝ ද තමතමන්ගේ බලපමණින් මුළුව අධිකාර කළහ.

3592. මල් ගෙණ එන්නෝ ද මල් ගොතන්නෝ ද කොළ එකතු කරන්නෝ ද ගෙඩිවර්ග ගෙණ එන්නෝ ද යන ඔහු තමතමන්ගේ බල පමණින් මුළුව අධිකාර කළහ.

3593. ගණිකාවෝ ද කළදාස්සෝ ද පූවෙලෙඳියෝ ද මාළුවෙලෙඳි-යෝ ද යන ඔහු තමතමන්ගේ බලපමණින් මුළුව අධිකාර කළහ.

3594. "එවු, සියල්ලෝ එක්රැස් ව එකට ගනබන්ධනය කරමු. නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි පින්කමක් කරන්නෙමු (යයි මම ඔවුනට කීමි.

3595\. තෙ මෙ සුත්වාන වචනං ගණං බන්ධිංසු තාවදෙ,
උපට්ඨානසාලං සුකතං භික්ඛුසඞ්ඝස්ස කාරයුං.

3596\. නිට්ඨාපෙත්වාන තං සාලං උදග්ගො තුට්ඨමානසො,
පරෙතො තෙහි සබ්බෙහි සම්බුද්ධං උපසඞ්කමිං.

3597\. උපසඞ්කම්ම සම්බුද්ධං ලොකනාථං නරාසභං,
වන්දිත්වා සත්ථුනො පාදෙ ඉදං වචනමබ්‍රවිං.

3598\. ඉමෙ තීණි සතා වීර පුරිසා එකතො ගණා,
උපට්ඨානසාලං සුකතං නිය්‍යාතෙන්ති[1] තවං[2] මුනි.

3599\. භික්ඛුසඞ්ඝස්ස පුරතො සම්පටිච්ඡත්ව චක්ඛුමා,
තිණ්ණං සතානං පුරතො ඉමා ගාථා අභාසථ:

3600\. "තිසතං පි ච ජෙට්ඨො ච අනුවත්තිංසු එකතො,
සම්පත්තිං හි[3] කරිත්වාන සබ්බෙ අනුභවිස්සථ.

3601\. පච්ඡිමභවෙ[4] සම්පත්තෙ සීතිභාවමනුත්තරං,
අජරං අමතං සන්තං නිබ්බාණං ඵස්සයිස්සථ."

3602\. එවං බුද්ධො වියාකාසි සබ්බඤ්ඤූ සමණුත්තරෙ,
බුද්ධස්ස වචනං සුත්වා සොමනස්සං පවෙදයිං.

3603\. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිං අහං,
දෙවාධිපො පඤ්චසතං දෙවරජ්ජමකාරයිං.

3604\. සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති අහොසහං,
දෙවරජ්ජං කරෙන්තස්ස මහාදෙවා අවන්දිසුං.

3605\. ඉධ මානුසකෙ රජ්ජෙ[5] පරිසා හොන්ති බන්ධවා,
පච්ඡිමභවෙ සම්පත්තෙ වාසෙට්ඨො නාම බ්‍රාහ්මණො.

3606\. අසීතිකොටිනිචයො තස්ස පුත්තො අහොසහං,
සෙලො ඉති මමං නාමං ඡළඞ්ග පාරමිඞ්ගතො.

3607\. ජඞ්ඝාවිහාරං විචරං සසිස්සෙහි පුරක්ඛතො,
ජටාභාරිකභරිතං කෙණියං නාම තාපසං.

3608\. පටියත්තාහුතිං දිස්වා ඉදං වචනමබ්‍රවිං:
ආවාහො වා විවාහො වා රාජා වා තෙ නිමන්තිතො.

3609\. ආහුතිං යිට්ඨුකාමො'හං බ්‍රාහ්මණෙ දෙවසම්මතෙ,
න නිමන්තෙමි රාජානං ආහුති මෙ න විජ්ජති

1. නිය්‍යාදෙන්ති, මජසං. 2. තුවං, මජසං. 3. සම්පත්ති හි, සයා.
4. පච්ඡිම භවෙ, මජසං. 5. රජ්ජං, මජසං.

3595. එසෙණෙහි ඔහු මාගේ වචනය අසා සමූහ වශයෙන් රැස් වූහ හෙවත් ගණවශයෙන් බැඳුනාහුය. භික්සඝනට උවටන්හලක් ද මැනවින් කරවූහ.

3596. ඔද වැඩි සිතැත්තෙම් සතුටු සිතැත්තෙම් ඒ ශාලාව නිමවා එකී හැම දෙනා සමග බුදුරජුන් වෙත එළඹියෙමි.

3597. ලොකනාථ වූ නරශ්‍රෙෂ්ඨ වූ සම්බුදුරජුන් වෙත එළඹ, ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ මේ වචන කීමි:

3598. වීරයන් වහන්ස, මුනීන් වහන්ස, මේ තෙසියක් පමණ වූ පුරුෂයෝ එක්රැස් ව මොනොවට කරණලද උවටන්හල ඔබවහන්සේට පිළිගන්වත්.

3599. පසැස් ඇති බුදුහු භික්සඝනට පෙරටුවැ සිට (එය) පිළිගෙණ තෙසියක් දෙනා ඉදිරියෙහි මේ ගාථාවන් වදාළහ:

3600. "මේ තෙසියදෙන ද එහි ප්‍රධාන තෙමේ ද (එක් ව ඔවු-නොවුනට) අනුවර්තී වූහ. එසේ ම තෙපි සියල්ලෝ (මේ පුණ්‍යය) කොට සමපත් අනුභව කරත්තාහුය.

3601. අන්තිම භවය පැමිණි කල්හි නිරුත්තර ශීතිභාවය වූ අජර වූ අමර වූ ශාන්ත වූ නිවණ ද සාක්ෂාත් කරත්තාහු ය".

3602. ශ්‍රමණයන් අතුරෙහි උතුම් වූ සම්ඳු වූ බුදුරජහු මේ දැක්වූ අයුරින් වදාළහ. මම බුදුරජුන්ගේ වචනය අසා සොම්නස පැවසීමි.

3603. මම කල්ප තිස්දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා විසීමි. දෙවාධිපති ව පන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරවීමි.

3604. මම දහස්වරක් සක්විතිරජ වීමි. දිව්‍යරාජ්‍යය කරන්නා වූ මට මහදෙව්වරු ද වැන්දහු ය.

3605-3606. මේ මිනිස්රජයෙහි පිරිස සබඳකම් ඇත්තෝ ම වූහ. අන්තිම භවය පැමිණි කල්හි අසූකෝටියක් තැන්පත් ධනය ඇති වාසෙට්ඨ නම් බමුණෙක් විය. මම ඒ වාසෙට්ඨ බමුණාගේ පුත්‍ර වීමි. සෙල යනු මගේ නම යි. ෂඩ්විධ වෙදඞ්ගයෙහි පරතෙරට ගියෙම් ද වෙමි.

3607-3608. සවකීය ශිෂ්‍යයන් විසින් පෙරටු කරණ ලදු ව ජඞ්ඝාවිහාරය කරන්නා වූ (=සක්මන් කරණ) මම් දලමඬුළු හා තවුස්පිරිකර බරින් යුත් පිළියෙල කරණ ලද පූජෝපහාර ඇති කෙණිය නම් තවුසා දැක "ආවාහයෙක් හෝ වේ ද, විවාහයෙක්හෝ වේ ද, තා විසින් රජතෙමේ හෝ නිමන්ත්‍රණය කරණ ලදුයේ වේ දැ"යි මේ වචන කීමි.

3609. මම දෙවියන් ය යි සම්මත බමුණන් කෙරෙහි පූජාවක් කරණු කැමැත්තෙමි. රජුට නිමන්ත්‍රණය නො කෙළෙමි. මාගේ යාගයෙක් ද නැත.

3610. න වත්ථි මය්හං ආවාහො විවාහො මෙ න විජ්ජති,
සඞ්ඛ්‍යානං නන්දිජනනො සෙට්ඨො ලොකෙ සදෙවකෙ.

3611. සබ්බලොකහිතත්ථාය සබ්බසත්තසුඛාවහො,
සො මෙ නිමන්තිතො අජ්ජ තසෙසතං පටියාදතං.

3612. තිම්බරූසකවණ්ණාභො අප්පමෙය්‍යො අනූපමො,
රූපෙනාසදිසො බුද්ධො ස්වාතනාය නිමන්තිතො.

3613. උක්කාමුඛපහට්ඨො'ව ඛදිරඞ්ගාරසන්නිභො,
විජ්ජූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3614. පබ්බතග්ගෙ යථා අච්චි පුණ්ණමායෙව චන්දිමා,
නළග්ගිවණ්ණසඞ්කාසො සො මෙ බුද්ධො නිමන්තිතො.

3615. අසම්භීතො භයාතීතො භවන්තකරණො මුනි,
සීහූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3616. කුසලො බුද්ධධම්මෙහි අප්පසය්හො පරෙහි සො,
නාගූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3617. සද්ධම්මාචාරකුසලො බුද්ධනාගො අසාදිසො,
උසභූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3618. අනන්තවණ්ණො අමිතයසො විචිත්තසබ්බලක්ඛණො,
සක්කූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3619. වසී ගණී පතාපී ච තෙජස්සී ච දුරාසදො,
බ්‍රහ්මූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3620. පත්තධම්මො දසබලො බලාතිබලපාරගූ,
ධරණූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3621. සීලවීචිසමාකිණ්ණො ධම්මවිඤ්ඤාණඛොභිතො,
උදධූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3622. දුරාසදො දුප්පසහො අචලො උග්ගතො බ්‍රහා,
නෙරූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3623. අනන්තඤාණො අසමසමො අතුලො අග්ගතං ගතො,
ගගනූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

*

* පණ්ණරසමං භාණවාරං නිට්ඨිතං.

3610-3611. මාගේ ආවාහයෙක් ද නැත. (එසේ ම) මාගේ විවාහයෙක් ද නැත. ශාක්‍යයනට සතුට ඇති කරන්නා වූ, දෙවියන් සහිත ලොකයෙහි ශ්‍රෙෂ්ඨ වූ, සියලු ලෝවැස්සනට හිත පිණිස (හැසිරෙන්නා වූ) හැම සත්නට සුව එලවන්නා වූ ඒ බුදුහු අද මා විසින් නිමන්ත්‍රණය කරණ ලදහ. මේ පිළියෙල කිරීම උත්වහන්සේ සඳහා ය.

3612. තිඹිරි පල බඳු පැහැ ඇති, පමණ නො කල හැකි ගුණ ඇති, උපමාවිෂයාතික්‍රාන්ත වූ රූපයෙන් අසදෘශ වූ බුදුරජහු සෙට දවසට පවරණ ලදහ.

3613. උදුන් මුවෙහි ලා තැවූ සවණියක් මෙන් (පැහැපත්) කිහිරඟුරු මෙන් (දිලියෙන) විදුලියක් වැනි වූ මහාවීර වූ ඒ බුදුරජුහු මා විසින් පවරණ ලදහ.

3614. කඳුමුදුනක පෙනෙන ගිනිසිලක් වැනි වූ පුණුරසිදිනයෙහි සඳු වැනි වූ බටගසින් හටගත් ගින්නක බඳු පැහැ ඒ බුදුරජුහු මා විසින් පවරණ ලදහ.

3615. බිය නැති බිය ඉක්මවූ හවයා කෙලවර කරන්නා වූ මොනෙයය ගුණ ඇති සිහරජකු වැනි මහාවීර වූ ඒ බුදුරජුහු මා විසින් පවරණ ලදහ.

3616. දක්‍ෂ වූ බුද්ධගුණහෙතුයෙන් අනුන් විසින් මැඩලිය නොහෙන හස්තිරාජයකු වැනි වූ මහාවීර වූ ඒ බුදුරජුහු මා විසින් පවරණ ලදහ.

3617. සද්ධර්මාචාරයෙහි දක්‍ෂ වූ අසදෘශ වූ වෘෂභොපම වූ මහාවීර වූ ඒ බුද්ධශ්‍රෙෂ්ඨයාණෝ මා විසින් පවරණ ලදහ.

3518. අප්‍රමාණ වර්ණ ඇති අපරිමිත යශස් ඇති විචිත්‍ර වූ සකල ලක්‍ෂණ යුක්ත ශක්‍රයා වැනි වූ ඒ බුදුරජුහු මා විසින් පවරණ ලදහ.

3619. (ධ්‍යානයන්හි) වශී වූ ශ්‍රාවක සමූහයා ඇති ප්‍රතාපවත් වූ තෙජස් ඇති (ගුණයෙන් කිසිවකුටත්) ලංවිය නො හැක්කා වූ මහාවීර වූ බ්‍රහ්මොපම වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදහ.

3620. පැමිණියා වූ නිර්මාණ ධර්මය ඇති දශබලධාරී වූ බලයන් ඉක්ම වූ මහත් බලයන්ගේ පවා පරතෙරට ගිය මහපොළොව වැනි වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදහ.

3621, සිල්නැමැති රල යුත් ධර්මඥනයෙන් කැලඹුනු සයුර වැනි මහාවීර වූ ඒ බුදුජරතෙම මා විසින් පවරණ ලදහ.

3622. නො ලං විය හැකි, බලයෙන් මැඩලිය නො හෙන, නිශ්චල වූ උස්ව නැංගා වූ, වැඩෙන මහමෙර වැනි, මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදි.

3623. අනන්තඥාන ඇත්තා වූ අසමසම වූ අතුල්‍ය වූ ශ්‍රෙෂ්ඨත්වයට ගියා වූ ආකාශය වැනි වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදහ.

3624. පතිට්ඨා භයභීතානං තාණො සරණගාමිනං,
අස්සාසකො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3625. ආසයො බුද්ධිමන්තානං පුඤ්ඤක්ඛෙත්තං සුඛෙසිනං,
රතනාකරො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3626. අස්සාසකො වෙදකරො සාමඤ්ඤඵලදායකො,
මෙඝූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3627. ලොකචක්ඛු මහාතෙජො සබ්බතමවිනොදනො,
සූරියූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3628. ආරම්මණවිමුත්තීසු සභාවදස්සනො මුනි,
චන්දූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3629. වුද්ධො[1] සමුස්සිතො ලොකෙ ලක්ඛණෙහි අලඞ්කතො,
අප්පමෙය්‍යො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3630. යස්ස ඤාණං අප්පමෙය්‍යං සීලං යස්ස අනූපමං,
විමුත්ති අසදිසා යස්ස සො මෙ බුද්ධො නිමන්තිතො.

3631. යස්ස ධිති අසදිසා ථාමො යස්ස අචින්තියො,
යස්ස පරක්කමො ජෙට්ඨො සො මෙ බුද්ධො නිමන්තිතො.

3632. රාගො දොසො ච මොහො ච විසා සබ්බෙ සමූහතා,
අගදූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3633. කිලෙසබ්‍යාධි[2] බහුදුක්ඛසබ්බතමවිනොදනො[3],
වෙජ්ජූපමො මහාවීරො සො මෙ බුද්ධො නිමන්තිතො.

3634. බුද්ධො'ති භො යං වදෙසි ඝොසොපෙසො සුදුල්ලභො,
බුද්ධො බුද්ධො'ති සුත්වාන පීති මෙ උපපජ්ජථ.

3635. අබ්භන්තරමගණ්හන්තී පීති මෙ බහි නිච්ඡරෙ,
සො'හං පීතිමනො සන්තො ඉදං වචනමබ්‍රවිං:

3636. "කහං නු ඛො සො භගවා ලොකජෙට්ඨො නරාසභො,
තත්ථ ගන්ත්වා නමස්සිස්සං සාමඤ්ඤඵලදායකං."

3637. පග්ගය්හ දක්ඛිණං බාහුං වෙදජාතො කතඤ්ජලී,
ආචික්ඛි මෙ ධම්මරාජං සොකසල්ලවිනොදනං.

1. බුද්ධො, මජසං. 2. කෙලසබ්‍යාධි, මජසං.
3. සබ්බතමවිනොදකො, සීමු.

3624. බියෙන් තැති ගත්තවුනට පිහිට වූ, සරණයන්තවුනට ආරක්‍ෂා ස්ථාන වූ (සත්ත්වලෝකයට) අස්වැසිල්ලක් වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරන ලදහ.

3625. බුද්ධිමත්නට වාසස්ථානයක් වූ සුව සොයන්නවුනට පින්කෙතක් වූ (ගුණරුවන් පිරුණු) රත්නාකරයක් වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3626. (කෙලෙස් තැවුල් නැති කොට) ලොව අස්වසන්නා වූ (දුක් දෙම්නස් නසා) සතුට ඇති කරන්නා වූ (සොවන් ආදි) ශ්‍රාමණ්‍යඵලදායක වූ (අමාවැසි වස්වන) මහාමෙඝයක් වැනි වූ ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3627. ලොවට ඇසක් වැනි වූ මහාතෙජස් ඇති සියලු අඳුරු දුරු කරණ සූර්‍ය්‍යයා වැනි වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදහ.

3628. ආලම්බනවිමුක්තිවිෂයයෙහි ස්වභාව කෘත්‍ය මේ මේ ය යි දක්නා වූ චන්ද්‍රයා වැනි වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3629. (ලොකයෙහි ගුණයෙන්) වැඩී සිටි (යශසින්) උස් ව නැඟි (මහපුරිස්) ලකුණින් අලඞ්කාර වූ අපමණ ගුණ ඇති මහාවීර වූ ඒ බුදුරජුහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3630. යමකුගේ ඥානය පමණ කළ නො හැකි ද, යමකුගේ ශීලය උපමා විෂයාතික්‍රාන්ත ද, යමකුගේ විමුක්තිය අසදෘශ ද, ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3631. යම් කෙනෙකුන්ගේ නුවණ අසදෘශ ද, යම්කෙනෙකුන්ගේ බලය අචින්ත්‍ය ද, යම් කෙනෙකුන්ගේ පරාක්‍රමය ජ්‍යෙෂ්ඨ ද, ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3632. යම් කෙනෙකුන් විසින් රාගය ද ද්වෙෂය ද මොහය ද යන සියලු විෂයෝ නසන ලදහු ද, ඖෂධයක් වැනි වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් නිමන්ත්‍රණ කරණ ලදහ.

3633. කෙලෙස්ලෙඩ ද බොහෝ දුක් ද සියලු (මොහො) අඳුරු ද දුරුකරන්නා වූ වෙදකු වැනි වූ මහාවීර වූ ඒ බුදුරජහු මා විසින් පවරණ ලදහ.

3634. පින්වත, බුද්ධ යන යම් වචනයක් කියහි ද, තෙල ශබ්දය පවා අතිශයින් දුර්ලභ ය. බුද්ධය බුද්ධය යන මේ වචන අසා මට ප්‍රීතිය හටගත්තේ ය.

3635. සිතින් නො දැරිය හැක්කා වූ මාගේ ප්‍රීතිය පිටත පැතිරෙයි. ප්‍රීතිසිත් ඇති ඒ (සෙල නම් වූ) මම මේ වචනය කීමි:

3636. "ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ කොහි ද ? සතර ශ්‍රාමණ්‍යඵලදායක වූ උන්වහන්සේට එහි ගොස් නමස්කාර කරන්නෙමි" යි.

3637. කොණ්ඩ තවුස්තෙමේ මාගේ දකුණු අත ගෙණ හටගත් සොම්නස් ඇත්තේ කරණ ලද ඇඳිලි ඇත්තේ සෝතුල් පහ කරණ බුදුරජුන් අරබයා මෙසේ කීය:

3638. "උද්දෙන්තං'ව මහාමෙඝං නීලං අඤ්ජනසන්නිභං,
සාගරං විය දිස්සන්තං පස්සෙතං මහාවනං.

3639. එත්ථ සො වසතෙ බුද්ධො අදන්තදමකො මුනි,
විනයන්තො ච වෙනෙය්‍යෙ බොධෙන්තො බොධිපක්ඛියෙ.

3640. පිපාසිතො'ව උදකං භොජනං'ව ජිඝච්ඡිතො,
ගාවී යථා වච්ඡගිද්ධා එවාහං විචිනිං ජිනං.

3641. ආචාරඋපචාරඤ්ඤූ ධම්මානුච්ඡවිසංවරං[1].
සික්ඛාපෙසිං සකෙ සිස්සෙ ගච්ඡන්තෙ ජිනසන්තිකං.

3642. දුරාසදා භගවන්තො සීහා'ව එකචාරිනො,
පදෙ පදං නික්ඛිපන්තා ආගච්ඡෙය්‍යාථ මාණවා.

3643. ආසීවිසො යථා ඝොරො මිගරාජා'ව කෙසරී,
මත්තො'ව කුඤ්ජරො දන්තී එවං බුද්ධා දුරාසදා.

3644. උක්කාසිතඤ්ච ඛිපිතං අජ්ඣුපෙක්ඛිය මාණවා,
පදෙ පදං නික්ඛිපන්තා උපෙථ බුද්ධසන්තිකං.

3645. පටිසල්ලානගරුකා අප්පසද්දා දුරාසදා,
දුරූපසඞ්කමා බුද්ධා ගරූ හොන්ති සදෙවකෙ.

3646. යදා'හං පඤ්හං පුච්ඡාමි පටිසම්මොදයාමි වා,
අප්පසද්දා තදා හොථ මුනිභූතා'ව තිට්ඨථ.

3647. යං සො දෙසෙති සද්ධම්මං[2] ඛෙමං නිබ්බාණපත්තියා,
තමෙවත්ථං නිසාමෙථ සද්ධම්මසවණං සුඛං."

3648. උපසඞ්කම්ම සම්බුද්ධං සම්මොදිං මුනිනා අහං,
තං කථං වීතිසාරෙත්වා ලක්ඛණෙ උපධාරයිං.

3649. ලක්ඛණෙ ද්වෙව[3] කඞ්ඛාමි පස්සාමි තිංසලක්ඛණෙ,
කොසොහිතවත්ථගුය්හං ඉද්ධියා දස්සයී මුනි.

3650. ජිව්හං නින්නාමයිත්වාන කණ්ණසොතෙ ච නාසිකෙ,
පටිමසි නලාටන්තං කෙවලං ඡාදයී ජිනො.

1. ධම්මානුච්ඡවසංවරං, සීමු. 2. සම්බුද්ධො, මජසං. 3. ද්වෙ ච, මජසං.

3638. "නැග එන්නා වූ මහවලාවක් වැනි, අඳුනක් බඳු නිල් වූ සයුරක් සේ පැනෙන තෙල මහවනය දක්නෙහි ද?

3639. මෙහි නො දැමුනවුන් දමනය කරන්නා වූ, මොනෙය්‍ය ගුණ ඇති, විනෙය ජනයන් හික්මවන, බෝපැකිදම් (බොධිපාක්ෂික ධර්ම) පිළිවිදුවන (=ප්‍රතිවෙධ කරවන) ඒ බුදුරජහු වැඩ වෙසෙති.

3640. මම, පැන් පවස ඇත්තකු දිය සොයන්නාක් මෙන් ද, සාදුකින් පෙළුනකු බොජුන් සොයන්නාක් මෙන් ද, වස්සා කෙරෙහි ගිජු වූ දෙනක ඒ වස්සා සොයන්නාක් මෙන් ද මෙසේ බුදුරජුන් සෙවීමි.

3641. ආචාර උපාචාර දන්නා මම බුදුන් හමුවට යන සිය සිසුන් දහමට නිසි සංවරයෙහි ලා හික්මවීමි.

3642. එකලාව හැසිරෙන සිහරජුන් මෙන් බුදුවරු නො ලං විය හැකි සැහැවි ඇත්තාහ. මාණවකයිනි, (තෙපි) පියෙහි පිය තබන්නාහු (පියවර මනිමින්) එවු.

3643. ඝොර වූ ආසීවිසයකු මෙන් ද කෙශරසිංහරාජයකු මෙන් ද දළ ඇති මත් වූ ඇත්රජකු මෙන් ද මෙසේ බුදුවරු ලං විය නො හැක්කෝ ය.

3644. මාණවකවරුනි, (තෙපි) කසින්නා වූ ද කිවිසින්නා වූ ද, (ශබ්ද) නවතා පියෙහි පිය තබන්නාහු බුදුරජුන් වෙත එළඹෙවු.

3645. (බුදුවරු) විවෙකය ගරුකරන්නෝ ද, නිශ්ශබ්දතාව කැමැත්තෝ ද, නො ලංවිය හැක්කෝ ද, දෙවියන් සහිත ලොකයෙහි ගුරු වූ උතුමෝ ද වෙත්.

3646. යම් කලෙක්හි මම ප්‍රශ්න විචාරම් ද, පිළිසඳර හෝ කථා කෙරෙම් ද, එකල්හි නිශ්ශබ්ද වවු. මොනෙය්‍යගුණ ඇතියන් මෙන් ව සිටිවු.

3647. ඒ බුදුරජුහු නිවන් පැමිණීම පිණිස පවත්නා වූ ඝෙම (=නිර්භය) වූ යම් ධර්මයක් දෙශනා කෙරෙත් ද ඒ ධර්මාර්ථය ම අසවු. සද්ධර්ම-ශ්‍රවණය සැප ය."

3648. මම බුදුරජුන් වෙත එළඹ ඒ මුනීන්ද්‍රයන් වහන්සේ හා පිළි-සඳරෙහි යෙදුනෙමි. ඒ පිළිසඳර කථාව නිමවා (උන්වහන්සේගේ) මහ-පුරිස් ලකුණු පරීක්ෂා කෙළෙමි.

3649. (එසේ පරීක්ෂා කරන්නා වූ මම) මහාපුරුෂ ලක්ෂණ තිසක් දකිමි. මහාපුරුෂ ලක්ෂණ දෙකක් පමණක් (නොපෙණෙනා බැවින්) සැක කරමි. (එසින්) කොසොහිතවත්ථගුය්හය බුදුහු ඍද්ධිබලයෙන් පෙන්වූහ.

3650. (දෙවෙනි නො පෙණෙන ලක්ෂණය දක්වන්නාහු) දිව පිටතට ඇද කන් නැහැසිදුරු පිරිමැද්දහ. බුදුරජුහු සම්පූර්ණ නළල් තල දිවෙන් වැසූහ.

3651. තස්සාහං ලක්ඛණෙ දිස්වා පරිපුණ්ණෙ සබ්‍යඤ්ජනෙ,
බුද්ධො'ති නිට්ඨං ගන්ත්වාන සහ සිස්සෙහි පබ්බජිං.

3652. සත්තෙහි තීහි සහිතො පබ්බජිං අනගාරියං,
අඩ්ඪමාසෙ අසම්පත්තෙ සබ්බෙ පත්තා'ම්හ නිබ්බුතිං.

3653. එකතො කම්මං කත්වාන පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
එකතො සංසරිත්වාන එකතො විනිවත්තයුං.

3654. ගොපානසියො දත්වාන පූගධම්මෙ වසී[1] අහං,
තෙන කම්මෙන සුකතෙන අට්ඨහෙතූ ලභාමහං.

3655. දිසාසු පූජිතො හොමි භොගා ච අමිතා මම,
පතිට්ඨා හොමි සබ්බෙසං තාසො මම න විජ්ජති.

3656. ව්‍යාධයො මෙ න විජ්ජන්ති දීඝායුං පාලයාමි ච,
සුඛුමච්ඡවිකො හොමි ආවාසෙ පත්ථිතෙ[2] වසෙ.

3657. අට්ඨ ගොපානසී දත්වා පූගධම්මෙ වසී අහං,
පටිසම්භිදා'රහත්තඤ්ච එතං මෙ අපරට්ඨමං.

3658. සබ්බවොසිතවොසානො කතකිච්චො අනාසවො,
අට්ඨගොපානසී නාම තව පුත්තො මහාමුනි.

3659. පඤ්චථම්භානි දත්වාන පූගධම්මෙ වසී අහං,
තෙන කම්මෙන සුකතෙන පඤ්චහෙතූ ලභාමහං.

3660. අචලො හොමි මෙත්තාය අනූනඞ්ගො භවාමහං,
ආදෙය්‍යවචනො හොමි න ධංසෙමි යථා අහං.

3661 අභන්තං හොති මෙ චිත්තං අචලො හොමි කස්සචි,
තෙන කම්මෙන සුකතෙන විමලො හොමි සාසනෙ.

3662. සගාරවො සප්පතිස්සො කතකිච්චො අනාසවො,
සාවකො තෙ මහාවීර භික්ඛු තං වන්දතෙ මුනි.

3663. කත්වා සුකතපල්ලඞ්කං සාලායං පඤ්ඤපෙසහං,
තෙන කම්මෙන සුකතෙන පඤ්ච හෙතූ ලභාමහං.

3664. උච්චෙ කුලෙ පජායිත්වා මහාභොගො භවාමහං,
සබ්බසම්පත්තිකො හොමි මච්ඡරං මෙ න විජ්ජති.

3665. ගමනෙ පත්ථිතෙ මය්හං පල්ලඞ්කා උපතිට්ඨන්ති,
සහ පල්ලඞ්කසෙට්ඨෙන ගච්ඡාමි මම පත්ථිතං.

1. වසිං, මජ්ඣං. 2. ආවාසෙ පත්තෙ වසෙ, ස්‍යා.

3651. මම උත්වහන්සේගේ (අසූවක්) අනුව්‍යඤ්ජන සහිත වූ සම්පූර්ණ දෙතිස්මහපුරිස් ලකුණු දැක සර්වඥයහ යි තීරණය කොට සිසුන් සමග පැවිදි වීමි.

3652. තුන්සියක් (සිසුන්) සමග සපුන් වතිමි. අඩමසක් නො පැමිණි කල්හි ම අපි හැම නිවණට පැමිණියම්හ.

3653. (සියල්ලෝ) නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි එක් ව පින්කම් කොට සමග ව සසරෙහි හැසිර සමගව ම සසරගමන නැවැත් වූහ.

3654. සහයොගතා ධර්මයෙහි වශී වූ මම ගොතැසි දී මැනවින් කළ ඒ කර්මය කරණකොට ගෙණ අනුසස් අටක් ලබමි.

3655. දිශාවන්හි පුදනු ලබන්නෙම් වෙමි. මාගේ භොගයෝ ද අප–මණයහ. සියලුදෙනාහට ම පිහිට වෙමි. මට තැති ගැන්මෙක් නැත.

3656. මට රොගයෝ නො වෙති. දීර්ඝායු රකිමි. (=බොහෝකල් ජීවත් වෙමි.) සියුම් සිවි ඇත්තෙම් වෙමි. කැමැති නිවාසයෙහි ම වසමි.

3657. සහයොගතා ධර්මයෙහි වශී වූ මම ගොතැසි දී (මෙසේ) අට–අනුසසක් ලැබීමි. මාගේ මේ අටවන අනුසසින් බැහැරි වූ අනෙක් අනුසස සිවුපිළිසිඹියාවන් සහිත රහත්බව යි.

3658. මහමුනීන් වහන්ස, සියලු වැස නිමවූ බඹසරවස් ඇත්තා වූ සිවුමගින් කරණ ලද කටයුතු ඇත්තා වූ ආස්‍රව රහිත වූ මුබවහන්සේගේ පුත්‍ර තෙමේ **අට්ඨගොපානසී** නම් ද වේ.

3659. සමූහධර්මයෙහි වශී වූ මම ටැම් පසක් දී මැනවින් කරණ ලද ඒ කර්මය හෙතුකොට ගෙණ හෙතු (අනුසස්) පසක් ලබමි.

3660. මම මෛත්‍රියෙන් නො සැලෙමි. පිරිපුන් අඟපසඟ ඇත්තෙම් වෙමි. පිළිගතයුතු වචන ඇත්තෙම් වෙමි. මම (ටැම් බඳු ව) නො සැලෙමි.

3661. මාගේ සිත භ්‍රාන්ත නො වේ. කුමකට වුව ද නිශ්චල වෙමි. මැනවින් කරණ ලද ඒ කර්මය හෙතුකොට ගෙණ සසුනෙහි නිර්මල වූවෙකිම් වෙමි.

3662. බුදුරජානන් වහන්ස, ගෞරව සහිත වූ (ස්වාමියකු ඇතැයි) යටත් පැවතුම් ඇති, කරණ ලද කටයුතු ඇති, ආස්‍රව රහිත වූ, මුබ වහන්සේගේ ශ්‍රාවක වූ, මහණ ඒ මුබවහන්සේ වඳියි.

3663. මම මනා ව නිමි කිය ඇති පලඟක් ශාලායෙහි පැණවීමි. මැනවින් කළ ඒ කර්මහෙතුවෙන් මම හෙතු (අනුසස්) පසක් ලබමි.

3664. මම උසස් කුලයෙහි ඉපිද මහත් භොගසම්පත් ඇත්තෙම් වෙමි. සියලු සම්පත්තීන් ආඪ්‍ය වෙමි. මාගේ මසුරුකමෙක් නො මැත.

3665. ගමනක් (යැමට) සිතූ කල්හි පලඟෙක් එළඹ සිටී. ඒ උතුම් පලඟ සමග මම් කැමති තැනට යෙමි.

3666. තෙන පල්ලඞ්කදානෙන තමං සබ්බං විනොදයිං,
සබ්බාභිඤ්ඤාබලප්පත්තො ථෙරෙ වන්දති තං මුනි.

3667. පරකිච්චත්තකිච්චානි සබ්බකිච්චානි සාධයිං,
තෙන කම්මෙන සුකතෙන පාවිසිං අභයං පුරං.

3668. පරිනිට්ඨිතසාලං හි’ පරිභොගමදාසහං,
තෙන කම්මෙන සුකතෙන සෙට්ඨත්තං අජ්ඣුපාගතො.

3669. යෙ කෙචි දමකා ලොකෙ හත්ථී අස්සෙ දමෙන්ති යෙ,
කරිත්වා කාරණා නානා දාරුණෙන දමෙන්ති තෙ.

3670. තථෙවං ත්වං මහාවීර දමෙසි නරනාරියො,
අදණ්ඩෙන අසත්ථෙන දමෙසි උත්තමෙ දමෙ.

3671. දානස්ස වණ්ණෙ කිත්තෙන්තො දෙසනාකුසලො මුනි,
එකං පඤ්හං[1] කථෙන්තොව බොධෙසි තිසතෙ මුනී.

2672. දන්තා මයං සාරථිනා සුවිමුත්තා අනාසවා,
සබ්බාභිඤ්ඤාබලප්පත්තා නිබ්බුතා උපධික්ඛයෙ.

3673. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
අතික්කන්තා භයා සබ්බෙ සාලාදානස්සි’දං ඵලං.

3674. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3675. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3676. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සෙලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

**සෙලත්ථෙරාපදානං දුතියං.**

1. එකපඤ්හං, මජසං.

3666. ඒ පයස්ඛන්‍දානය හේතු කොට ගෙණ සියලු අඳුර දුරු කෙළෙමි. සියලු අභිඥාබලයනට පත් ඒ සථවිර තෙමේ, මුනීන්‍ද්‍රයන් වහන්සෙ, ඔබවහන්සේ වඳී.

3667. මෙරමා පිළිබඳ කටයුතු ද, තමා පිළිබඳ කටයුතු ද සියලු කිස සිදු කෙළෙමි. මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ අභයපුරය. (=නිවණ) ට පිවිසියෙමි.

3668. මම නිමහම් කිස ඇති ශාලාව (බුදුරජුන්හට) පරිභොගයට දුනිමි. මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ශ්‍රෙෂ්ඨ බවට පැමිණියෙම් වෙමි.

3669. යම් (ඇත් - අස් ආදි සතුන්) දමනය කරණ කෙනෙක් කිසියම් ඇත් අස් කෙනකුන් දමනය කෙරෙත්. නොයෙක් හිරිහැර කොට දරුණු ගුණයෙන් ඔවුන් (එසේ) දමනය කෙරෙත්.

3670. මහාවීරයාණෙනි, මුබ සත්පුරුෂයන් මෙසේ දමනය නො කෙරෙහි ය. දඬු නො ගැණීමෙන් අවි නො ගැණීමෙන් ඔවුන් උත්තම දමථයෙහි (=රහත්බැව්හි) දමනය කෙරෙහි ය.

3671. දෙශනාවෙහි දක්ෂ වූ බුදුරජතෙමේ දානයාගේ අනුසස් පව-සන්නේ එක් පැණයක් දෙසන්නේ ම තෙසිය තවුසන් ධර්මාවබොධය කරවී ය.

3672. සාරථි වූ බුදුරජුන් විසින් අපි දමනය කරණ ලද්දෝ වෙමු. (කෙලෙසුන්ගෙන්) මැනවින් මිදුනෝ වෙමු. ආස්‍රව රහිතයෝ වෙමු. සියලු අභිඥාබලයනට පැමිණියාහු උපධික්ෂයෙහි පිරිනිවියෝ වෙමු.

3673. මෙයින් සියක් දහස්වන කපෙහි වූ එකල්හි යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) සියලු භීතීහු ඉක්මවන ලද්දාහුය. ශාලාදානයාගේ මේ විපාක යි.

3674. බුදුරජුන් වෙත එළඹීම එකාන්තයෙන් මට යහපත් පැමිණීමෙක් විය. මා විසින් පැමිණෙනලද ත්‍රිවිද්‍යාවෝ වෙති. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණලදී.

3675. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. හස්තිරාජයකු මෙන් කෙලෙස් බැඳුම් සිඳ. ආස්‍රව රහිතව වෙසෙමි.

3676. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් සෙල සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක් යි.

**සෙලසථවිරාවදානය දෙවැනි යි.**

## 393. සබ්බකිත්තිකත්ථෙරාපදානං

3677. කණිකාරංව ජොතන්තං[1] දීපරුක්ඛංව උජ්ජලං[2],
ඔසධිංව විරොචන්තං විජ්ජුතං ගගනෙ යථා.

3678. අසම්භීතං අනුත්‍රාසිං[3] මිගරාජංව කෙසරිං,
ඤාණාලොකං පකාසෙන්තං මද්දන්තං තිත්ථියෙ ගණෙ.

3679. උද්ධරන්තං ඉමං ලොකං ඡින්දන්තං සබ්බසංසයං,
ගජ්ජන්තං[4] මිගරාජංව අද්දසං ලොකනායකං.

3680. ජටාජිනධරො ආසිං බ්‍රහා උජු පතාපවා,
වාකචීරං ගහෙත්වාන පාදමූලෙ අපත්ථරිං.

3681. කාළානුසාරියං ගය්හ අනුලිම්පිං තථාගතං,
සම්බුද්ධමනුලිම්පෙත්වා සන්ථවිං ලොකනායකං

3682. සමුද්ධරසි'මං ලොකං ඔඝතිණ්ණ[5], මහාමුනි,
ඤාණාලොකෙන ජොතෙසි නාවටං[6] ඤාණමුත්තමං.

3683. ධම්මචක්කං පවත්තෙසි මද්දසෙ පරතිත්ථියෙ,
උසභො ජිතසඞ්ගාමො සම්පකම්පෙසි මෙදිනිං.

3684. මහාසමුද්දෙ ඌමියො වෙලන්තම්හි පභිජ්ජරෙ,
තථෙව තව ඤාණම්හි සබ්බදිට්ඨී පභිජ්ජරෙ.

3685. සුඛුමච්ඡිකජාලෙන සරම්හි සම්පතානිතෙ,
අන්තොජාලගතා පාණා පීළිතා හොන්ති තාවදෙ.

3686. තථෙව තිත්ථියා ලොකෙ පුථුපාසණ්ඩනිස්සිතා,
අන්තොඤාණවරෙ තුය්හං පරිවත්තන්ති මාරිස.

3687. පතිට්ඨා වුය්හතං ඔඝෙ ත්වං හි නාථො අබන්ධුනං,
භයට්ටිතානං සරණං මුත්තත්ථීනං[7] පරායණං.

3688. එකවීරො අසදිසො කරුණාමෙත්තසඤ්චයො[8],
සුසීලො අසමො[9] සන්තො වසී තාදී ජිතඤ්ජයො.

3689. ධීරො විගතසම්මොහො අනෙජො අකථංකථී,
වුසිතො[10] වන්තදොසො'සි නිම්මලො පයතො[11] සුචි.

---

1. ජලිතං, මජ්සං. 2. ජොතිතං, ස්‍යා 3. අනුත්තාසිං, මජ්සං.
4. අසම්භීතං, ස්‍යා. 5. ඔඝතිණ්ණො, ස්‍යා. 6. පවරං, ස්‍යා. වජිර, PTS.
7. මුත්තත්ථිකං, මජ්සං. 8. මෙත්තාකරුණාසඤ්චයො, මජ්සං. සඤ්ඤුතත්තා, ස්‍යා.
9. අසමො සුසමො සන්තො, මජ්සං. 10. තුසිතො, මජ්සං.
11 සංයතො, මජ්සං.

# 393. සබ්බකිත්තිකස්ථවිරාපදානය

3677. පිපුණු කිණිකිරිරුකක් මෙන් බබලන්නා වූ ප්‍රදීපවෘක්‍ෂයක් මෙන් දිලියෙන්නා වූ ඔසධී තාරකාවක් මෙන් ආලොකවත් වූ අහසෙහි විදුලියක් බඳු වූ-

3678. බිය නොමැති තැතිගැණුම් නොමැති කෙශරසිංහරාජයකු වැනි වූ තීර්ථකසමූහයා මඩින්නා වූ ඤාණාලොකය ප්‍රකට කරන්නා වූ-

3679. මෙම ලොකයා (දුකින්) ගොඩලන සියලු සැක සිඳලන සිංහ රාජයකු මෙන් ගුගුරන ලොකනායක වූ බුදුරජුන් දිටිමි.

3680. (එකල්හි) මම ජටා සහ අඳුන් දිවිසම් දරන්නෙකිම් විමි. වැඩෙන්නා වූ සෘජු වූ ප්‍රතාපවත් දුවෙකිම් විමි. වැහැරි සිවුර ගෙණ ඒ (බුදුරජුන්ගේ) පාමුල අතුළෙමි.

3681. කසාවන් කළුවැල් හෙවත් කසාවන් අගිල් ගෙණ බුදුරජුන් ආලෙප කෙළෙමි. තථාගතයන් (එසින්) අලෙව් කොට ලොකනායක වූ උන්වහන්සේට සතුති කෙළෙමි.

3682. චතුරොඝතරණය කළ උතුමාණෙනි, මහාමුනීන්ද්‍රයාණෙනි, මුබ මේ ලොකයා (සසරදුකින්) ගොඩ ලන්නහුය. ඤාණාලොකයෙන් ආලොක කරන්නහුය. ඔබගේ උත්තමඥානය ද අනාවෘතයි.

3683. දම්සක් පවත්වහු ය. අන්‍යතීර්ථකයන් මඩනහු ය. දිනන ලද සඞ්ග්‍රාම ඇති ශ්‍රෙෂ්ඨ වූ ඔබ පෘථිවිය කම්පා කෙරහු ය.

3684. මහසමුදුරෙහි තරඞ්ගයෝ වෙරළෙහි (ගැටී) බිඳෙති. එසේ ම දෘෂ්ටීහු මුබගේ නුවණෙහි (ගැටී) බිඳෙති.

3685. විලක් සියුම් ඇස් ඇති දලකෙින් අතුල කල්හි එකෙණෙහි දලතුලට ගිය ප්‍රාණීහු (මත්ස්‍යයෝ) පෙළුනාහු වෙත් ද,

3686. එසේ ම ලොකයෙහි අන්‍යපාෂණ්ඩ ධර්මයන් ඇසුරු කළ තීර්ථකයෝ නිදුකානන් වහන්ස, මුබවහන්සේගේ උතුම් නුවණ ඇතුළත පෙරළෙත්.

3687. චතුරොඝ නම් වූ සැඩපහරෙහි ගසාගෙණ යන්නවුනට පිහිට වූ මුබ වනාහි තො නැයනට ද පිහිට (වහු)ය. හයින් පීඩිතයනට ද පිහිට (වහු) ය. (ලොකයා විසින්) අත්හැර දමන ලද අනාථයනට ද පිහිට (වහු) ය.

3688. අසහාය වීර වූ අසදෘශ වූ කරුණා මෛත්‍රී සඞ්ඛ්‍යය ඇති උතුම් සිල් ඇති අසම වූ ශාන්ත වූ (ධ්‍යාන) වශී වූ තාදීගුණ ඇති දිනන ලද මාර්ගය ඇති-

3689. ප්‍රාඥ වූ, පහ කළ මොහො ඇති, නිදෙස් වූ, සැක (=විචිකිච්ඡා) දුරුකළ, වැස නිම වූ බඹසර ඇති, නිර්මල වූ, අගුවින් දෙවා හළ, එහෙයින් ම පිරිසිදු ඔබ චමාරා හළ දෙස් ඇත්තනු ය.

3690. සඞ්ඝාතිගො හතමදො[1] තෙවිජ්ජො තිභවන්තගො,
සීමාතිගො ධම්මගරු කතත්ථො හිතවප්පථො[2].

3691. තාරකො ත්වං යථා නාවා නිධීවස්සාසකාරකො,
අසම්භීතො යථා සීහො ගජරාජාව දප්පිතො.

3692. ථොමෙත්වා දසගාථාහි **පදුමුත්තරං** මහායසං,
වන්දිත්වා සත්ථුනො පාදෙ තුණ්හී අට්ඨාසහං තදා.

3693. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසඞ්ඝෙ ඨිතො සත්ථා ඉමා ගාථා අභාසථ.

3694. "යො මෙ සීලඤ්ච ඤාණඤ්ච ධම්මඤ්චාපි පකිත්තයි[3],
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3695. සට්ඨිකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
අඤ්ඤෙ දෙවෙ අභිභොත්වා[4] ඉස්සරං කාරයිස්සති.

3696. සො පච්ඡා පබ්බජිත්වාන සුක්කමූලෙන චොදිතො,
**ගොතමස්ස** භගවතො සාසනෙ පබ්බජිස්සති.

3697. පබ්බජිත්වාන කායෙන පාපකම්මං විවජ්ජිය,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො[5].

3698. යථාපි මෙඝො ථනයං තප්පෙති මෙදිනිං ඉමං,
තථෙව ත්වං මහාවීර ධම්මෙන තප්පසී මමං.

3699. සීලං පඤ්ඤඤ්ච ධම්මඤ්ච ථවිත්වා ලොකනායකං,
පත්තොම්හි පරමං සන්තිං නිබ්බාණං පදමච්චුතං.

3700. අහො නූන ස භගවා චිරං තිට්ඨෙය්‍ය චක්ඛුමා,
අඤ්ඤාතඤ්ච විජානෙය්‍යුං ඵුසෙය්‍යුං අමතං පදං.

3701. අයං මෙ පච්ඡිමා ජාති භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

3702. සතසහස්සෙ ඉතො කප්පෙ යං බුද්ධමභිථොමයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

1. ගතමදො, සෲ. 2. ගතත්ථොහිතවබ්භුතො, මජසං.
3. සද්ධම්මඤ්චාපි වණ්ණයී, මජසං. 4. අඤ්ඤෙ දෙවෙ’භිභවිත්වා, මජසං.
5. නිබ්බායිස්සතිනාසවො, මජසං.

3690. කෙලෙස් ඇලුම් ඉක්ම වූ තැසුවා වූ මද ඇති ත්‍රිවිද්‍යා ඇති තුන්ලෝමුදුන් පත් (ලෞකික) සීමාව ඉක්ම ගිය ධර්මගරුක වූ කෘතඥ වූ ඔබ (සත්වලොකයාට) හිතමාගී ඇත්තෙහි ය.

3691. ඔබ නැවකට (ගමන්මග පෙන්වන) තරුවක් මෙන් වෙහි ය. අස්වැසිලි කරණ නිධානයක් බඳු වෙහි ය. සිංහයකු මෙන් බිය රහිත වෙහි ය. හස්තිරාජයකු මෙන් ගර්විත වෙහි ය.

3692. මම එකල්හි (මෙසේ) දසගයකින් මහායශස් ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට සතුති කොට (ඒ) ශාස්තෘන් වහන්සේගේ පා වැඳ තුෂ්ණීම්භූතව සිටියෙමි.

3693. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ ශාස්තෘ වූ පදුමුත්තර බුදුරජ තෙම භික්සඟන මැද හිඳ මේ ගාථාවන් වදාළේ සී:

3694. "යමෙක් මාගේ ශීලය ද ඥානය ද ධර්මය ද පැසසී ද, හේ (කවරෙක් දැයි) මම ප්‍රකාශ කරන්නෙමි. (එය) පවසන්නා වූ මාගේ (වචනය) අසවු.

3695. (හෙතෙම)කල්ප සැටදහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය අනෙක් දෙවියන් මැඩගෙණ ආධිපත්‍යය කරවන්නේ ය.

3696. හෙතෙම පසුව පැවිදිව ඒ කුශලමූලයෙන් මෙහෙයන ලද්දේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි ද පැවිදි වන්නේ ය.

3697. පැවිදිව, කයින් පව්කම් දුරු කොට සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥවශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය"

3698. යම් සේ වැසිවලාවක් ගුගුරා වස්මින් මේ පොළොව තෘප්තියට පත් කෙරේ ද, එසේ ම මහාවීරයන් වහන්ස, ඔබවහන්සේ ධර්මයෙන් මා තුටු කළ සේක.

3699. මම ශීලය ද ප්‍රඥව ද ධර්මය ද ලොකනායකයන් වහන්සේ ද පසසා අමෘතපදය වූ උතුම් වූ නිර්වාණ නමැති ශාන්තියට පැමිණියෙම් වෙමි.

3700. පසැස් ඇති ඒ භාග්‍යවත් තෙමේ බොහෝ කල් වැඩ සිටින්නේ නම් එකාන්තයෙන් ඉතා යෙහෙකි. (එවිට සියල්ලෝ) නො දත් දෙය දැනගන්නාහු ය. අමෘතපදය (නිවණ) සපර්ශ කරන්නාහු ය. (= ලබන්නාහුය)

3701. මේ මාගේ පශ්චිම ජාතිය සී. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥවශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

3702. මෙයින් සියක්දහස් වන කපෙහි බුදුරජාණන් වහන්සේට යම් පැසසීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. (බුදුරජුන් පැසසීමෙහි මේ විපාක සී.

3703. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3704. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3705. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සබ්බකිත්තිකො ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

**සබ්බකිත්තිකත්ථෙරස්ස අපදානං තතියං.**

## 394. මධුදායකත්ථෙරාපදානං

3706. **සින්ධුයා** නදියා තීරෙ සුකතො අස්සමො මම,
තත්ථ වාචෙමහං සිස්සෙ ඉතිහාසං සලක්ඛණං.

3707. ධම්මකාමා විනීතා තෙ සොතුකාමා සුසාසනං,
ඡළඞ්ග පාරමිප්පත්තා සින්ධුකූලෙ වසන්ති තෙ.

3708. උප්පාතගමනෙ චෙව ලක්ඛණෙසු ච කොවිදා,
උත්තමත්ථං ගවෙසන්තා වසන්ති පවනෙ[1] තදා.

3709. **සුමෙධො** නාම සම්බුද්ධො ලොකෙ උප්පජ්ජි තාවදෙ,
අම්හාකං අනුකම්පන්තො උපගච්ඡි විනායකො.

3710. උපාගතං මහාවීරං සුමෙධං ලොකනායකං,
තිණසන්ථාරකං කත්වා ලොකජෙට්ඨස්ස'දාසහං.

3711. පවනාතො[2] මධුං ගය්හ බුද්ධසෙට්ඨස්ස'දාසහං,
සම්බුද්ධො පරිභුඤ්ජිත්වා ඉදං වචනමබ්‍රවි:

3712. "යො තං අදාසි මධුං මෙ පසන්නො සෙහි පාණිහි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3713. ඉමිනා මධුදානෙන තිණසන්ථාරකෙන ච,
තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති.

3714. තිංසකප්පසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන[3] සත්ථා ලොකෙ භවිස්සති.

1. විපිනෙ, මජසං. 2. විපිනාතො මජසං 3. ගොත්තෙන, මජසං.

3703. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආශ්‍රවයෝ ක්‍ෂය කරණ ලදහ. දැන් නැවත ඉපදීමෙක් නැත.

3704. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට එකාන්තයෙන් මාගේ පැමිණීම යහපත් පැමිණීමෙක් විය. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

3705. සිවුපිළිසැඹියාවෝ අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂමත් **'සබ්බකිත්තික'** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

**සබ්බකිත්තිකස්ථවිරාවදානය නිමැණි සි.**

# 394. මධුදායක ස්ථවිරාවදානය

3706. **සින්ධුනදීතීරයෙහි** මැනවින් කරණ ලද මාගේ අසපුවෙක් විය. එහි දී මම ලක්‍ෂණශාස්ත්‍රය සහිත ඉතිහාසය සිසුනට උගන්වමි.

3707. ධර්මකාමී වූ විනීත වූ අනුශාසනය අසනු කැමැත්තා වූ ෂඩඞ්ග වෙදයෙහි පරතෙරට ගියා වූ ඒ ශිෂ්‍යයෝ සින්ධුගංඉවුරෙහි වෙසෙති.

3708. (භූතයන් පිළිබඳ අස්වාභාවික වෙනස්වීම් බලා ශුභාශුභ ප්‍රකා-ශකරණ) උත්පාතශාස්ත්‍රයෙහි ද (අඞ්ග) ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි ද දක්‍ෂ වූ උත්තමාර්ථය සොයන්නා වූ ඔහු එකල්හි වෙනෙහි වෙසෙත්.

3709. **සුමෙධ** නම් සම්බුදුරජ තෙම ලොව පහළ විය. අපට අනුකම්පා කරන්නා වූ ඒ බුදුරජ තෙම් එකෙණෙහි ම (අප වෙත) එළඹියේ ය.

3710. එසේ එළෙඹියා වූ මහාවීර වූ සුමෙධ නම් ලොකනායකයන් වහන්සේ (දිටිමි). දැක මම තණඇතිරියක් කොට ලොකජ්‍යෙෂ්ඨ වූ බුදුරජුන්හට දුනිමි.

3711. මම වනයෙන් මී ගෙණ (අවුත්) බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි. සම්බුදුරජ තෙම එය වළඳා මේ වචනය වදාළේය:

3712. "යමෙක් තෙම පැහැදුනේ සියතින් මට ඒ මධු (=මීපැණි) දානයක් දුන්නේ ද, මම හේ (කවරෙක්දැයි) පවසන්නෙමි. එසේ පවසන්නා වූ මාගේ වචනය අසවු.

3713. මේ මධුදානය හෙතු කොට ගෙණ ද තිණසන්ථාර (=තණඇතිරි) දානය හෙතු කොට ගෙණ ද කප්තිස්දහසක් මුළුල්លෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය.

3714. මෙයින් කල්ප තිස්දහසෙකින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උප-දනා වූ නමින් **ගෞතම** වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

3715. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත’නාසවො.

3716. දෙවලොකා ඉධාගන්ත්වා මාතුකුච්ඡිං උපාගතෙ,
මධුවස්සං පවස්සිත්ථ ඡාදයං මධුනා මහිං[1].

3717. මයි නික්ඛන්තමත්තම්හි කුච්ඡියා ච සුදුත්තරං,
තත්‍රාපි මධුවස්සං මෙ වස්සතෙ නිච්චකාලිකං.

3718. අගාරා අභිනික්ඛම්ම පබ්බජිං අනගාරියං,
ලාභී අන්නස්ස පානස්ස මධුදානස්සි’දං ඵලං.

3719. සබ්බකාමසමිද්ධො’හං භවිත්වා දෙවමානුසෙ,
තෙනෙව මධුදානෙන පත්තොම්හි ආසවක්ඛයං.

3720. වුට්ඨම්හි දෙවෙ චතුරඞ්ගුලෙ තිණෙ
සම්පුප්ඵිතෙ[1] ධරණීරුහෙ සඤ්ඡන්නෙ,[2]
සුඤ්ඤෙ ඝරෙ මණ්ඩපරුක්ඛමූලෙ[3]
වසාමි නිච්චං සුඛිතො අනාසවො.

3721. මජ්ඣෙ මහන්තෙ හීනෙ ච[4] භවෙ සබ්බෙ අතික්කමිං,[5]
අජ්ජ මෙ ආසවා ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3722. තිංසකප්පසහස්සම්හි යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මධුදාන’ස්සිදං ඵලං.

3723. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3724. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3725. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මධුදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මධුදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.

---

1 සුසම්පුප්ඵිතෙ, සයා. 2. චප්පදෙසෙ, සයා. 3. මණ්ඩපරුක්ඛමූලකෙ, මජසං.
4. මජ්ඣෙ මය්හං භවා අස්සු, සයා. PTS. 5. යෙ භවෙ සමතික්කමිං, සයා. PTS.

3715. (මෙතෙම) උන්වහන්සේගේ ධර්මයෙහි දායාදී (අසිතිකරුවෙක්)ව ධර්මයෙන් නිර්මිත කලාක් වැනි ඖරස බුද්ධපුත්‍රයෙක් ව සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥ වශයෙන් පිරිසිඳ) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පානේ ය'' යි.

3716. දෙව්ලොවින් (පෙරළා) මෙහි පැමිණ මවුකුසට (පිළිසිඳීම් වශයෙන්) පැමිණි කල්හි මිහියෙන් පොළොව වසමින් මිහි වැස්සක් වැස්සේ ය.

3717. මා ඉතා දුකසේ බිහි විය යුතු මවුකුසින් නික්මුණු කෙණෙහි එහි දී ද නිරතුරු ව මීවැසි වසිති.

3718. ගිහිගෙන් නික්ම (අනගාරයයි සඞ්ඛ්‍යාත) සසුනෙහි පැවිදි වීමි. ආහාර පාන සුලභ වූවෙක් ද වීමි. මධුදානයාගේ මේ විපාක යි.

3719. මම දෙව්මිනිස් දෙගතියෙහි සියලු කාමසම්පත්තීන්ගෙන් සමෘද්ධයෙක් ව ඒ මධුදානබලයෙන් ම ආස්‍රවක්ෂයසඞ්ඛ්‍යාත නිවණට ද පැමිණියෙම් වෙමි.

3720. වැසි වස්නා කල්හි ද, සිවුඅඟුල් (උස් ව වැඩුනු) තණබිම්හි ද, සුපුෂ්පිත වෘක්ෂයෙන් වැසුනා වූ තන්හි ද, ජන ශෘහය, මණ්ඩපය, වෘක්ෂමූලය, යන මේ තන්හි ද නිතර ආස්‍රව රහිතව සුඛිත යෙම් වෙසෙමි.

3721. මහත් වූ හෙවත් ප්‍රණීත වූ ද මධ්‍යම වූ ද හීන වූ ද සියලු භවයන් ඉක්ම වීමි. අද මාගේ ආස්‍රවයෝ ක්ෂය වූහ. දැන් නැවත ඉප-දීමෙක් නැත.

3722. මෙයින් තිස්දහස් කපකින් පෙර වූ එකල්හි යම් දානක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මධුදානයාගේ මේ විපාක යි.

3723. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ ද ක්ෂය කරණ ලදහ. දැන් නැවත ඉපදීමෙක් නැත.

3724. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට එකාන්තයෙන් මාගේ යහපත් පැමිණීමෙක් විය. ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

3725. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් මධුදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**මධුදායක ස්ථවිරාවදානය සිවුවැනි යි.**

# 395. පදුමකූටාගාරියත්ථෙරාපදානං

3726. පියදස්සී නාම භගවා සයම්භූ ලොකනායකො,
විවෙකකාමො සම්බුද්ධො සමාධිකුසලො මුනි.

3727. වනසණ්ඩං සමොගය්හ පියදස්සී මහාමුනි,
පංසුකූලං පත්ථරිත්වා නිසීදි පුරිසුත්තමො.

3728. මිගලුද්දො පුරෙ ආසිං විපිනෙ[1] කානනෙ අහං,
පසදං මිගමෙසන්තො ආහිණ්ඩාමි අහං තදා.

3729. තත්ථ'ද්දසාසිං සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං,
පුප්ඵිතං සාලරාජංව සතරංසිංව උග්ගතං.

3730. දිස්වාන'හං දෙවදෙවං පියදස්සිං මහායසං,
ජාතස්සරං සමොගය්හ පදුමං ආහරිං තදා.

3731. ආහරිත්වාන පදුමං සතපත්තං මනොරමං,
කූටාගාරං කරිත්වාන ඡාදයිං පදුමෙන'හං.

3732. අනුකම්පකො කාරුණිකො පියදස්සී මහාමුනි,
සත්තරත්තින්දිවං බුද්ධො කූටාගාරෙ වසී ජිනො.

3733. පුරාණං ඡඩ්ඩයිත්වාන නවෙන ඡාදයිං අහං,
අඤ්ජලිං පග්ගහෙත්වාන අට්ඨාසිං තාවදෙ අහං.

3734. වුට්ඨහිත්වා සමාධිම්හා පියදස්සී මහාමුනි,
දිසා අනුවිලොකෙන්තො නිසීදි ලොකනායකො.

3735. තදා සුදස්සනො නාම උපට්ඨාකො මහිද්ධිකො,
චිත්තමඤ්ඤාය බුද්ධස්ස පියදස්සිස්ස සත්ථුනො.

3736. අසීතියා සහස්සෙහි භික්ඛූහි පරිවාරිතො,
වනන්තෙ සුඛමාසීනං උපෙසි ලොකනායකං.

3737. යාවතා වනසණ්ඩම්හි අධිවත්ථා ච දෙවතා,
බුද්ධස්ස චිත්තමඤ්ඤාය සබ්බෙ සන්නිපතුං තදා.

3738. සමාගතෙසු යක්ඛෙසු කුම්භණ්ඩෙ සහ රක්ඛසෙ,
භික්ඛුසඞ්ඝෙ ච සම්පත්තෙ ගාථා'මා බ්‍යාහරී[2] ජිනො:

3739. "යො මං සත්තාහං පූජෙසි ආවාසඤ්ච අකාසි මෙ,
තමහං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො.

1. අරඤ්ඤෙ, මජසං. 2. ගාථා පබ්‍යාහරී, මජසං. ගාථා සබ්‍යාහරී, ස්‍යා.

# 395. පදුමකුටාගාරියස්ථවිරාවදානය

3726. තෙමේ ම සියල්ල අවබොධ කළා වූ ලොකනායක වූ සර්වඥ වූ මොහෙය්‍යගුණ යුත් වූ සමාධියෙහි දක්ෂ වූ පියදස්සී භාග්‍යවත් තෙමේ විවෙක කැමැත්තේ (විය)

3727. මහාමුනි වූ පුරුෂොත්තම වූ ඒ පියදස්සී බුදුරජ තෙම වන ලැහැබට පිවිස පවුල්සිවුර අතුට වැඩහුන්නේ ය.

3728. මම පෙර මහවෙනෙහි මුවවැද්දෙකිම් වීමි. මම එකල්හි පසද මෘගයකු (= තිත්මුවකු) සොයන්නෙම් ඇවිදිමි.

3729. එහි දී චතුරොඝයන් තරණය කළ ආස්‍රව රහිත වූ පිපියා වූ ශාලවෘක්ෂරජයකු වැනි වූ උඩට නැගී ආ හිරු වැනි වූ සම්බුදුරජුන් දිටිමි.

3730. මම දෙවාතිදෙව වූ මහත් යශස් ඇති ඒ පියදස්සී බුදුරජුන් දුක එකල්හි ස්වයංජාත විලකට බැස පියුම් ගෙණ ආමි.

3731. මම සියක් පත් ඇති මනරම් වූ පියුම් ගෙණවුත් කුළුගෙයක් කොට (එය) පියුමෙන් වැසීමි. (සෙවිලි කෙළෙමි.)

3732. පස්මරුන් ජයගත් (සර්වසත්නට) අනුකම්පා කරන්නා වූ කාරුණික වූ මහාමුනි වූ පියදස්සී බුදුරජ තෙම දවරු සතක් ඒ කුළුගෙයි විසීය.

3733. මම පරණ (පියුම්) අස් කොට අලුත් පියුමින් (ඒ කුළුගෙය නැවත) වැසීමි (=සෙවිලි කෙළෙමි). එකෙණෙහි මම ඇඳිලි බැඳ ගෙණ සිටියෙමි.

3734. ලොකනායක වූ පියදස්සී බුදුරජ තෙම සමාධියෙන් නැගිට දස දිගුත් පිළිවෙළින් බලමින් වැඩහුන්නේ ය.

3735 එකල්හි පියදස්සී බුදුරජුන්ගේ සුදස්සන නම් උපස්ථායක තෙමේ ඒ බුදුරජුන් සිත දැන,

3736. අසූදහසක් භික්ෂූන් විසින් පිරිවරණ ලදුයේ වනයෙහි සුවසේ වැඩහුන් ලොකනායක වූ බුදුරජුන් වෙත එළඹියේ ය.

3737 එකල්හි වනලැහැබෙහි අධිගෘහීත වූ යම් තාක් දෙවිවරු වෙත් නම් ඒ සියලු දෙවිවරු ද බුදුරජානන් වහන්සේගේ සිත දැන එහි රැස් වූහ.

3738. කුම්භාණ්ඩයන් ද, රකුසන් සහිත වූ යකුන් ද රැස් වූ කල්හි, භික්සඟන ද පැමිණි කල්හි බුදුරජ තෙම මේ ගාථාවන් වදාළේය:

3739. "යමෙක් තෙම සතියක් මුළුල්ලෙහි මා පිදී ද, (එසේ ම) මට ආවාසයක් කරවී ද, හේ (කවරෙක්දැයි) මම පවසන්නෙමි. එය පවසන්නා වූ මාගේ වචනය අසවු.

3740. සුදුද්දසං සුනිපුණං ගම්භීරං සුප්පකාසිතං,
ඤාණෙන කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3741. චතුද්දසානි කප්පානි දෙවරජ්ජං කරිස්සති,
කූටාගාරං බ්‍රහං තස්ස[1] පදුමපුප්ඵෙහි[2] ඡාදිතං,
ආකාසෙ ධාරයිස්සති පුප්ඵකම්මස්සි'දං ඵලං.

3742. චතුබ්බීසෙ කප්පසතෙ වොකිණ්ණං සංසරිස්සති,
තත්ථ පුප්ඵමයං ව්‍යම්හං ආකාසෙ ධාරයිස්සති.

3743. යථා පදුමපත්තම්හි තොයං න උපලිම්පති,
තථෙවිමස්ස ඤාණම්හි කිලෙසා නොපලිම්පරෙ.

3744. මනසා විනිවට්ටෙත්වා පඤ්චනීවරණෙ අයං,
චිත්තං ජනෙත්වා නෙක්ඛම්මෙ අගාරා පබ්බජිස්සති,
තතො පුප්ඵමයෙ ව්‍යම්හෙ ධාරෙන්තෙ නික්ඛමිස්සති.

3745. රුක්ඛමූලෙ වසන්තස්ස නිපකස්ස සතීමතො,
තත්ථ පුප්ඵමයං ව්‍යම්හං[3] මත්ථකෙ ධාරයිස්සති.

3746. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
දත්වාන භික්ඛුසඞ්ඝස්ස නිබ්බායිස්සත'නාසවො.

3747. කූටාගාරෙන චරතා[4] පබ්බජ්ජං අභිනික්ඛමිං,
රුක්ඛමූලෙ වසන්තම්හි[5] කූටාගාරං ධරීයති.

3748. චීවරෙ පිණ්ඩපාතෙ ච චෙතනා මෙ න විජ්ජති,
පුඤ්ඤකම්මෙන සංයුත්තො ලභාමි පරිනිට්ඨිතං.

3749. ගණනාතො අසංඛෙය්‍යා කප්පකොටී බහූ මම,
රිත්තකා තෙ අතික්කන්තා පමුත්තා ලොකනායකා.

3750. අට්ඨාරසෙ කප්පසතෙ පියදස්සී විනායකො,
තමහං පයිරුපාසිත්වා ඉමං යොනිං උපාගතො.

3751. ඉධද්දසාසිං සම්බුද්ධං[6] අනොමං නාම චක්ඛුමං,
තමහං උපගන්ත්වාන පබ්බජිං අනගාරියං.

3752. දුක්ඛස්සන්තකරො බුද්ධො මග්ගං මෙ දෙසයී ජිනො,
තස්ස ධම්මං සුණිත්වාන පත්තොම්හි අචලං පදං.

3753. තොසයිත්වාන සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

---

1. මහන්ත'ස්ස, මජසං. 2 පදුමපුප්ඵෙහි, මජසං.
3. පුප්ඵමයං ව්‍යම්හං ධාරෙන්තං, මජසං 4. චරණා, සීමු. PTS. චරිතෙ ස්‍යා.
5. වසන්තම්පි, මජසං. 6. ඉධ පස්සාමි, මජසං.

3740. ඉතා දුකසේ (කලාතුරකින්) දැකිය හැකි වූ ඉතා සියුම් වූ ද ගැඹුරු වූ ද ඒ පුණ්‍යකර්මය මැනවින් ප්‍රකාශිත ය. එය නුවණින් (බලා) පවසන්නෙමි. (එසේ) පවසන්නා වූ මාගේ වචනය අසවු.

3741. "(මෙ තෙම) තුදුස්කපක් (මුළුල්ලෙහි) දිව්‍යරාජ්‍යය කරන්නේ ය. ඔහු පියුමක් මෙන් වැසුනු මහත් වූ කුළුගෙයක් අහස්හි දරන්නේ ය. පුෂ්පකර්මයාගේ මේ විපාක සි.

3742. සුවිසිකප් සියයක් (කල් මුළුල්ලෙහි) දෙව්මිනිස් දෙගතියෙහි ඔබ මොබ සැරිසරන්නේ ය. ඒ සියලු තන්හි දී (මට) මල්මුවා විමනක් අහසෙහි පහලවන්නේ ය.

3743. යම්සේ පියුම්පතෙහි දිය නො වැකේ ද, එසේ ම මොහුගේ නුවණෙහි කෙලෙශයෝ නො තැවරෙත්.

3744. මෙ තෙම පඤ්චනීවරණයන් සිතින් නගා හැර (= බැහැර කොට) සසුන්ගතවීමෙහි සිත් උපදවා ගිහිගෙන් (නික්ම) පැවිදි වන්නේ ය. ඉක්බිති මල්මුවා විමනක් දරමින් නික්මෙන්නේ ය.

3745. ප්‍රාඥ වූ සිහියෙන් යුත් වූ රුක්මුල්හි වසන්නා වූ (මොහුට) එහිදී මල්මුවා විමනක් මුදුනෙහි දරන්නේ ය.

3746. මෙතෙම චීවර පිණ්ඩපාත (ගිලංක) ප්‍රත්‍යය සෙනාසන යන සිවුපසය භික්සඟනට දී ආස්‍රව රහිතව පිරිනිවන් පානේ ය සි.

3747. කුළුගෙයකින් පැවිද්දට නික්මුනෙමි. රුක්මුල්හි වසන කල්හි කුළුගෙය (ද) දැරේ.

3748. චීවරයෙහි ද පිණ්ඩපාතයෙහි ද මාගේ චේතනාවක් නැත. (කරණලද) පින්කම හා යෙදුනෙම් (ඒ චීවර ආදිය) අනුභව ලබමි.

3749. මා විසින් ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නො හැකි බොහෝ කෙලගණන් කල්පයෝ ඉක්මවන ලදහ. මා විසින් හිස් ලෙස ඒ කල්පයෝ ඉක්මවන ලදහ. බුදුවරු අතහැර දමන ලදහ.

3750. අටළොස් සිය වැනි කපෙහි හෙවත් (මෙයින්) එක්දහස් අටසිය වන කපෙහි පියදස්සී නම් බුදුරජ තෙම ලොව පහළ විය. මම උන්වහන්සේ ඇසුරු කොට මේ යොනිය (=ජන්මය) ම එළඹියෙම් වෙමි.

3751. මෙහි දී පසැස් ඇති අනොම නම් වූ සම්බුදුරජුන් දිටිමි. මම උන්වහන්සේ වෙත එළඹ අනගාරික සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදිවිමි.

3752. පස්මරුන් ජය ගත් දුක් කෙළවර කරන්නා වූ බුදුරජ තෙම මට (ප්‍රතිපත්ති) මාර්ගය දෙශනා කෙළේ ය. උන්වහන්සේගේ ධර්මය අසා නිවණට පැමිණියෙමි.

3753. සැකිකුලතිලක වූ ගොයුම් සම්බුදුන් තුටු කොට සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥ වශයෙන්) දැන ආස්‍රව රහිතව වෙසෙමි.

3754. අට්ඨාරසෙ කප්පසතෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායි'දං ඵලං.

3755. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3756. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3757. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පදුමකූටාගාරියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**පදුමකූටාගාරියත්ථෙරස්ස අපදානං පඤ්චමං.**

## 366. බක්කුලත්ථෙරාපදානං*

3758. හිමවන්තස්ස අවිදූරෙ සොභිතො නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං සකසිස්සෙහි මාපිතො.

3759. මණ්ඩපා ච බහූ තත්ථ පුප්ඵිතා සින්දුවාරකා,
කපිත්ථා ච බහූ තත්ථ පුප්ඵිතා ජීවජීවකා[1].

3760 නිගුණ්ඩියො බහූ තත්ථ බදරාමලකානි ච,
ඵාරුසකා අලාබූ ච පුණ්ඩරීකා ච පුප්ඵිතා.

3761. ආලකා[2] බෙලුවා තත්ථ කදලී මාතුලුඞ්ගකා,
මහානාමා බහූ තත්ථ අජ්ජුනා ච පියඞ්ගුකා.

3762. කොසම්බා සලලා නීපා නිග්‍රොධා ච කපිත්ථනා,
එදිසො අස්සමො මය්හං සසිස්සොහං තහිං වසිං.

3763. අනොමදස්සී භගවා සයම්භූ ලොකනායකො,
ගවෙසං පටිසල්ලානං මමස්සමමුපාගමි.

3764. උපෙතම්හි මහාවීරෙ අනොමදස්සිමහායසෙ,
ඛණෙන ලොකනාථස්ස වාතාබාධො සමුට්ඨහි.

3765. විචරන්තො අරඤ්ඤම්හි අද්දසං ලොකනායකං,
උපගන්ත්වාන සම්බුද්ධං චක්ඛුමන්තං මහායසං.

3766. ඉරියඤ්චාපි දිස්වාන උපලක්ඛෙස'හං තදා,
අසංසයං හි බුද්ධස්ස ව්‍යාධි නො උපපජ්ජථ[3]

1. චම්පකා නාම කෙතකා, ස්‍යා. 2. ආලකා, මජ්සං. අලකකා, ස්‍යා.
3. උදපජ්ජථ, මජ්සං.
* බාකුලත්ථෙරාපදාන, මජ්සං.

3754. එක්දහස් අටසිය වැනි කපෙහි බුදුරජුන්හට යම් පූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

3755. කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ ක්‍ෂය කරණ ලදහ. දැන් නැවත ඉපදීමක් නැත.

3756. (බුදුරජුන් වෙතට) මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

3757. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **පදුමකූටාගාරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**පදුමකූටාගාරිය ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 366. බකකුලස්ථවිරාවදානය

3758–3759 හිමවතට නුදුරෙහි **සොභිත** නම් පර්වතයක් විය. එහි මාහට මැනවින් කරණ ලද අසපුවෙක් විය. ඒ අසපුව ස්වකීය ශිෂ්‍යයන් විසින් මවන ලද්දකි. එහි මණ්ඩපයෝ ද බොහෝ වූහ. එහි පිපුණු සින්දුවාර වෘක්‍ෂයෝ ද එසේ ම පිපුණු ජීවජීවක වෘක්‍ෂයෝ ද කපිත්ථ (= දිවුල්) වෘක්‍ෂයෝ ද බොහෝ වූහ.

3760. තිකගස් ද බෙබර හා නෙල්ලිගස් ද බොරළුදමනු (=උගුරැස්ස) ගස් ද ලබු ද පිපුණු සුදුනෙළුම් ද එහි බොහෝ ය.

3761. ආලක නම් ගස් ද බෙලි කෙසෙල් නාරන් උක් කුඹුක් පුවඟු ගස් ද එහි බොහෝ ය.

3762. කොහොඹ ය, සලල (=හොර) ය, කොලොම් ය, නුග ය, හිවුළු ය යන මේ වෘක්‍ෂයෝ ද එහි බොහෝ වෙති. මාගේ අසපුව මෙබඳු ය. ශිෂ්‍යයන් සහිතව මම එහි විසීමි.

3763. සියල්ල තෙමේ ම අවබොධ කර ගත් ලොකනායක වූ **අනොමදස්සි** භාග්‍යවත් තෙමේ සැහැල්ලු පැවැත්ම (= විවෙකය) සොයන්නේ මාගේ අසපුවට එළඹියේ ය.

3764. මහත් යශස් ඇති අනොමදස්සි බුදුරජුන් එළඹි කල්හි **ක්‍ෂණයකින්** ඒ ලොකනායක වූ බුදුරජුන්ගේ (සිරුරෙහි) වාතාබාධයක් හටගැණිත.

3765 – 3766. මම අරණෙහි හැසිරෙන්නෙම් ලොකනායකයන් වහන්සේ දැක මහත් යශස් ඇත්තා වූ ද පසැස් ඇත්තා වූ ද ඒ සම්බුදු රජුන් වෙත එළඹ උන්වහන්සේගේ පැවැත්ම දැක එකල්හි සියල්ල ස්වයම්භූඥනයෙන් දත් අපගේ බුදුරජුන්හට නිසැකයෙන් ම ව්‍යාධියෙක් උපනැයි සැලකීමි.

3767. ඛිප්පං අස්සමමාගච්ඡිං මම සිස්සාන සන්තිකෙ,
භෙසජ්ජං කත්තුකාමො'හං සිස්සෙ ආමන්තයිං තදා.

3768. පටිස්සුණිත්වා මෙ වාක්‍යං සිස්සා සබ්බෙ සගාරවා,
එකජ්ඣං සන්නිපතිංසු සත්ථුනාරවතා මම.

3769. ඛිප්පං පබ්බතමාරුය්හ සබ්බොසධමහාසහං
පානීයයොගං' කත්වාන[1] බුද්ධසෙට්ඨස්ස'දාසහං.

3770. පරිභුත්තෙ මහාවීරෙ සබ්බඤ්ඤුලොකනායකෙ,
ඛිප්පං වාතො වූපසමි සුගතස්ස මහෙසිනො.

3771. පස්සද්ධං දරථං දිස්වා අනොමදස්සී මහායසො.
සකාසනෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

3772. "යො මෙ පාදාසි භෙසජ්ජං ව්‍යාධිඤ්ච සමයී මම,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3773. කප්පසතසහස්සානි දෙවලොකෙ රමිස්සති,
වාදිතෙ තූරියෙ තත්ථ මොදිස්සති සදා අයං.

3774. මනුස්සලොකමාගන්ත්වා සුක්කමූලෙන චොදිතො,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති.

3775. පඤ්චපඤ්ඤාසකප්පම්හි **අනොමො** නාම ඛත්තියො,
චාතුරන්තො විජිතාවී ජම්බුමණ්ඩස්ස[2] ඉස්සරො.

3776. සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො,
තාවතිංසෙපි ඛොභෙත්වා ඉස්සරං කාරයිස්සති.

3777. දෙවභූතො මනුස්සො වා අප්පාබාධො භවිස්සති,
පරිග්ගහං විවජ්ජෙත්වා ව්‍යාධිං ලොකෙ තරිස්සති.

3778. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
**ගොතමො** නාම නාමෙන[3] සත්ථා ලොකෙ භවිස්සති.

3779. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

3780. කිලෙසෙ ඣාපයිත්වාන තණ්හාසොතං තරිස්සති,
**බක්කුලො**[4] නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

3781. ඉදං සබ්බං අභිඤ්ඤාය ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙස්සති."

1. පානීයයොගං කත්වා, සීමු. 2. ජම්බුදීපස්ස, ස්‍යා.
3. ගොත්තෙන, මජසං 4. බාකුලො, මජසං.

3767. (ඉක්බිති) වහා අසපුවට පැමිණියෙමි. එකල්හි මම මාගේ සිසුන් සමීපයෙහි දී බෙහෙදක් කරණු කැමැත්තෙම් සිසුන් ඇමතීමි.

3768. සියලු ශිෂ්‍යයෝ ගෞරව සහිත වූවාහු මාගේ වචනයට පිළි-වදන් දී එක් රැස් වූහ. මාගේ ශාස්තෘගෞරවය හේතු කොට ගෙණ-

3769. මම වහා පර්වතයට නැග සියලු ඖෂධ සෙවීමි. මම ඒ ඔසු බීමට සුදුසු කොට බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

3770. මහාවීර වූ සර්වඥ වූ ලොකනායක බුදුරජාණන් වහන්සේ ඖෂධය වැලඳූ කල්හි මහර්ෂී බුදුරජුන්ගේ වාතාබාධය වහා සන්හිඳුනේ ය.

3771. මහත් යශස් ඇති අනොමදස්සී බුදුරජ තෙම කාය දරථය (=කලාන්තය) සන්හිඳුනා දැක සිය අසුනෙහි හිඳ මේ ගාථාවන් වදාළ සේක:

3772. "යමෙක් මට බෙහෙත් දුන්නේ ද, මාගේ රොගය සන්හිඳුවී ද, හේ (කවරෙක්දැයි) මම පවසන්නෙමි. පවසන්නා වූ මාගේ වචනය අසවු.

3773. (හේ මේ හෙතුවෙන්) කල්පලක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. ඒ දෙව්ලොවෙහි වාද්‍යයෙහි ද තූර්‍ය්‍යයෙහි ද මෙතෙම හැමකල්හි සතුටු වන්නේ ය.

3774. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ මිනිස්ලොවට (උත්පත්ති වශයෙන්) අවුත් දහස් වරක් සක්විතිරජ වන්නේ ය.

3775 - 3776. පස්පණස්වන කපෙහි සිවුමහදිවයින් හා සිවුසයුරු කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූ (සතුරු රජවරුන්) ජයගත්තා සුලු වූ ජම්බුද්වීපයට අධිපති වූ සත්රුවනින් යුත් මහත් බල ඇති අනොම නම් ක්ෂත්‍රියයෙක් වූයේ තව්තිසාව ද කළඹා ආධිපත්‍යය කරවන්නේ ය.

3777. දෙව් වූයේ ද මිනිස් වූයේ ද ආබාධ රහිත (නීරොග)වූ වෙක් වන්නේ ය. ගිහිගෙය හැර දමා ලොව්හි වූ ව්‍යාධි (දුඃඛ) ය ඉක්මවන්නේ ය.

3778. මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි (කල්පලක්ෂයකින් මතුයෙහි) ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන සේක.

3779. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ඖරස (බුද්ධපුත්‍ර) වූ ධර්මයෙන් නිර්මිත කලෙක් වැනි වූ (හෙතෙම) සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය

3780. කෙලෙස් දවා තෘෂ්ණාව නමැති සැඩපහර ද තරණය කරන්-නේ ය. නමින් 'බක්කුල' නම් වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් ද වන්නේ ය.

3781. ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජ තෙම මේ සියල්ල දැන භික්ෂුසඞ්ඝයා මැද වැඩහිඳ (මොහු) එතදග්‍රස්ථානයෙහි තබන්නේ ය."

3782. **අනොමදස්සී** භගවා සයම්භූ ලොකනායකො,
විවෙකානුවිලොකෙන්තො මම'ස්සමමුපාගමි.

3783. උපාගතං මහාවීරං සබ්බඤ්ඤුං ලොකනායකං,
සබ්බොසධෙන තප්පෙසිං පසන්නො සෙහි පාණිහි.

3784. තස්ස මෙ සුකතං කම්මං සුඛෙත්තෙ බීජසම්පදා,
ඛෙපෙතුං නෙව සක්කොමි තදා හි සුකතං මම.

3785. ලාභා මම සුලද්ධං මෙ යො'හං අද්දක්ඛි නායකං,
තෙන කම්මාවසෙසෙන පත්තොම්හි අචලං පදං.

3786. සබ්බමෙතං අභිඤ්ඤාය ගොතමො සක්‍යපුඞ්ගවො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා එතදග්ගෙ ඨපෙසි මං.

3787. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි භෙසජ්ජස්ස ඉදං ඵලං.

3788. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3789. ස්වාගතං වත මෙ ආසි මම බුද්ධස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3790. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

**ඉත්ථං සුදං ආයස්මා බක්කුලො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.**

**බක්කුලත්ථෙරස්ස අපදානං ඡට්ඨං.**

## 397. ගිරිමානන්දත්ථෙරාපදානං

3791. භරියා මෙ කාලකතා පුත්තො සිවථිකං ගතො,
මාතා පිතා ච භාතා ච එකචිතකම්හි ඩය්හරෙ.

3792. තෙන සොකෙන සන්තත්තො කිසො පණ්ඩු අහොසහං,
චිත්තක්ඛෙපො ච මෙ ආසි තෙන සොකෙන අට්ටිතො.

3793. සොකසල්ලපරෙතො'හං වනන්තමුපසඞ්කමිං,
පවත්තඵලං භුඤ්ජිත්වා රුක්ඛමූලෙ වසාමහං.

3794. **සුමෙධො** නාම සම්බුද්ධො දුක්ඛස්ස'න්තකරො ජිනො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකෙ.

3782. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ ලොකනායක වූ අනොමදස්සී භාග්‍යවත් තෙමේ විවෙකසුවය බලාපොරොත්තු වන්නේ මාගේ අසපුවට එළඹියේ ය.

3783. එළඹියා වූ මහාවීර වූ ලොකනායක වූ සර්‍වඥයන් වහන්සේ පහන් සිතැත්තෙම් සියතින් සියලු ඖෂධයෙන් සන්තර්පණය කෙළෙමි.

3784. ඒ මාගේ මැනවින් කළ කර්‍මය සාරවත් කෙතක (ඇති වූ) බීජසම්පත්තිය (අස්වැන්න) මෙන් (සරුය) අවසන් කරන්නට නො හැක්කෙමි.

3785. යම්බඳු වූ මම ලොකනායකයන් වහන්සේ දුටුයෙම් ද එය මට ලාභයෙකි. මාගේ යහපත් ලැබීමෙකි. ඒ කර්‍මයාගේ අවශෙෂ විපාක-යෙන් අචලපදය වූ නිවණට පැමිණියෙම් වෙමි.

3786. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජ තෙමේ මේ සියල්ල දැන භික්සඟන මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

3787. මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි හෙවත් කල්පලක්ෂයකින් පෙර වූ එකල්හි යම් කර්‍මයක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බෙහෙසත් දන්හි මේ විපාක යි.

3788. (මා විසින්) කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ ක්ෂය කරණ ලදහ. දැන් නැවත ඉපදීමෙක් නැත.

3789. බුදුරජුන් වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ පැමිණෙන ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

3790. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

බක්කුලස්ථවිරාවදානය සවැනි යි.

## 397. ගිරිමානන්ද ස්ථවිරාවදානය

3791. මාගේ භාර්‍ය්‍යාව කළුරිය කළා ය. පුත්‍ර තෙමේ ද සොහොනට ගියේ ය (=මළේ ය). මව ද පියා ද සොහොයුරා ද (තිදෙන) එක ම චිතකයෙහි (=දරසෑයෙහි) දැවෙත්.

3792. මම ඒ ශොකයෙන් තැවුනෙම් කෘශවූයෙම් වෙමි. ඒ ශොකයෙන් පෙළුනෙම් මාගේ චිත්තක්ෂෙපය (=සිත්පෙරළීම) ද විය.

3793. මම ඒ සෝහුලින් පෙළුනෙම් වනයට එළඹියෙමි. ස්වයං-පතිත ඵල අනුභව කොට මම රුක්මුල්හි වසමි.

3794. පස්මරුන් ජය ගත්තා වූ දුක් කෙළවර කරන්නා වූ සුමෙධ නම් ඒ බුදුරජතෙම මා (සසරසයුරෙන්) ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේ ය.

3795. පදසද්දං සුණිත්වාන සුමෙධස්ස මහෙසිනො,
පග්ගහෙත්වාන'හං සීසං උල්ලොකෙසිං මහාමුනිං.

3796. උපගච්ඡි මහාවීරෙ[1] පීති මෙ උපපජ්ජථ,
තද'සි මෙකග්ගමනො දිස්වා තං ලොකනායකං.

3797. සතිං පටිලභිත්වාන පණ්ණමුට්ඨිමදාසහං,
නිසීදි භගවා තත්ථ අනුකම්පාය චක්ඛුමා.

3798. නිසජ්ජ තත්ථ භගවා සුමෙධො ලොකනායකො,
ධම්මං මෙ කථයී බුද්ධො සොකසල්ලවිනොදනං.

3799. "අනව්හිතා තතො ආගුං අනනුඤ්ඤාතා ඉතො ගතා,
යථා'ගතා තථා ගතා තත්ථ කා පරිදෙවනා.

3800. යථාපි පථිකා සත්තා වස්සමානාය වුට්ඨියා,
සභණ්ඩා උපගච්ඡන්ති වස්සස්සාපතනාය තෙ.

3801. වස්සෙ ච තෙ ඔරමිතෙ සම්පයන්ති යදිච්ඡකං,
එවං මාතා පිතා තුය්හං තත්ථ කා පරිදෙවනා.

3802. ආගන්තුකා පාහුණකා චලිතෙරිතකම්පිතා,
එවං මාතා පිතා තුය්හං තත්ථ කා පරිදෙවනා.

3803. යථාපි උරගො ජිණ්ණං හිත්වා ගච්ඡති සන්තචං,
එවං මාතා පිතා තුය්හං සන්තනුං ඉධ හීයරෙ."

3804. බුද්ධස්ස ගිරමඤ්ඤාය සොකසල්ලං විවජ්ජයිං,
පාමොජ්ජං ජනයිත්වාන බුද්ධසෙට්ඨමවන්දිහං[2].

3805. වන්දිත්වාන මහානාගං ගිරිමඤ්ජරිමපූජයිං[3],
දිබ්බගන්ධෙන සම්පන්නං[4] සුමෙධං ලොකනායකං.

3806. පූජයිත්වාන සම්බුද්ධං සිරෙ කත්වාන අඤ්ජලිං,
අනුස්සරං ගුණග්ගානි සන්ථවිං ලොකනායකං.

3807. නිත්තිණ්ණොසි[5] මහාවීර සබ්බඤ්ඤූ ලොකනායක,
සබ්බෙ සත්තෙ උද්ධරසි ඤාණෙන ත්වං මහාමුනෙ.

3808. විමතිං ද්වෙළ්හකං වාපි සඤ්ඡින්දසි මහාමුනි,
පටිපාදෙසි මෙ මග්ගං තව ඤාණෙන චක්ඛුම.

3809. අරහා සිද්ධිපත්තා ච[6] ඡළභිඤ්ඤා මහිද්ධිකා,
අන්තලික්ඛචරා ධීරා පරිවාරෙන්ති තාවදෙ.

1. උපාගතෙ මහාවීරෙ, මජසං.
2. බුද්ධසෙට්ඨං අවන්දහං, මජසං.
3. පූජයිං ගිරිමඤ්ජරිං, මජසං.
4. දිබ්බගන්ධං සම්පවත්තං, මජසං.
5. නිත්ථිණ්ණොහාසි, සථවි.
6. වසිප්පත්තා ච, මජසං.

